# පූජනීය දළදා සංස්කෘතිය
# විශේෂ කලාපය

දළදා සංස්කෘතිය පිළිබඳ පර්යේෂණාත්මක
ලේඛන සංග්‍රහය

**සංස්කාරක**
මහාචාර්ය එච්. එම්. ඩී. ආර්. හේරත්

**ප්‍රකාශනය**
මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම සහ පරිසර කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය

# පිදුම

නිවා සනහන සියලු දනහද
උතුම් දළදා නැමද බැතියෙන
සොබා සිරියෙන් සපිරි මැදරට
මිහිර විඳිමින්  සදා නිතියෙන

මෙත්සිතින්  මුළු රටම සනහා
සසිරි බර වූ  දැයක් තැනුමට
නවමු යුගයක මං විවර කළ
මැතිඳු ජනපති නමට පුදදෙමි

එම්.රමේෂ්වරන්
මධ්‍යම පළාත් කෘෂිකර්ම හා පරිසර අමාත්‍යාංශය

## පෙරවදන.

ශ්‍රී දළඳා මාලිගාවේ වාර්ෂික ඇසළ මංගල්‍යයෙන් පසු නිකුත්වන, පූජනීය දළදා සංස්කෘතිය, වාර්ෂික පර්යේෂණ ග්‍රන්ථයට අමතරව මෙවර අති සුවිශේෂ ග්‍රන්ථයක් නිකුත් වෙයි. මෙය දළදා සංස්කෘතිය පිළිබඳව මෙතෙක් පළකල වෙළුම් හයක අන්තර්ගත ශාස්ත්‍රීය ලිපි 25 ක එකතුවකි.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල මහජනතාව මෙන්ම රාජ්‍ය ආයතන විසින් කරනු ලැබූ ඉල්ලීමට අනුව මධ්‍යම පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, වතු යටිතල පහසුකම් හා හින්දු සංස්කෘතික කටයුතුඅමාත්‍යාංශය විසින් මෙම පුළුල් ශාස්ත්‍රීය සංග්‍රහය සංස්කරණය කිරීමට තීරණය කරනු ලැබිණි. මෙම පර්යේෂණ ලිපිවල එකතුව ප්‍රධාන තේමාවන් පහක් ඔස්සේ අන්තර්ග්‍රහණය කොට ඇත.

පළමුවන තේමාව, කන්ද උඩරට සහ ශ්‍රී දළදා වහන්සේ, යන තේමාවයි. මේ යටතේ ප්‍රධාන ලිපි හයක් අන්තර්ගතකොට තිබේ. 2006 වර්ෂයේ, පූජනීය දළදා සංස්කෘතිය, පර්යේෂණ සංග්‍රහයේ ආරම්භක ලේඛකයෙකු වූ හිටපු සම්මානිත මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න මහතා විසින් රචිත, දළදා සමිඳු හා කන්ද උඩරට, යන ලිපියත්, මහාචාර්ය හඟුරන්කෙත ධීරානන්ද හිමියන් විසින් ලියනු ලැබූ,,දළදා වහන්සේගෙන් අභිමානනීයත්වයට පත් ශ්‍රී ලාංකේය රාජ්‍යත්වය, යන ලිපියත්, රජරට විශ්ව විද්‍යාලයේ කථිකාචාර්‍යවරයෙකු වූ අජිත් තලවත්ත මහතා විසින් රචිත "ශ්‍රී ලංකාවේ අග නගරය තුළ වැඩ සිටි දළදා වහන්සේ " නැමැති ලිපියත්, මහාචාර්ය එච්.එම්. එම්. ඩී. ආර්. හේරත් මහතා විසින් රචිත "දළදා සතර මහා මංගල්‍යය, දළදා සංස්කෘතිය සහ ජන සමාජය" යන ලිපියත් "මහනුවර ඇසළ පෙරහැරේ උපත" යනුවෙන් ලලිත කලා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්‍යවරයෙකු වූ අතුල සමරකෝන් මහතා විසින් රචිත ලිපියත්, කථිකාචාර්ය සුදර්ශන බණ්ඩාර මහතා ලියූ මහනුවර දළදා පෙරහැර හා

සමාජය යන ලිපියත් අඩංගුකොට තිබේ.

මෙම ග්‍රන්ථයේ දෙවන තේමාව වශයෙන් තෝරාගෙන ඇත්තේ "ශ්‍රී දළදා වහන්සේ සහ පුද සත්කාර, යන තේමාවයි. මේ යටතේ පළමුවන ශාස්ත්‍රීය ලිපිය අපවත් වී වදාළ මහාචාර්ය වරකාවේ ධම්මාලෝක හිමියන් "පූජනීය දළදා සංස්කෘතිය" ග්‍රන්ථයට 2006 වර්ෂයේදී සපයන ලද්දකි. දළඳ පුද සත්කාර පිළිබඳව විශිෂ්ට දැනුම් සම්භාරයක් උන් වහන්සේට තිබිණි. මෙම ලිපිය තුළ"දළදා තේවාව හා ඊට සම්බන්ධ සිරිත් විරිත්, පිළිබඳව දැනුම් සම්භාරයක් අන්තර්ගත වේ. මේ යටතේ දෙවන ලිපිය පූජ්‍ය මහාචාර්ය මුවඇටගම ඥාණානන්ද හිමියන් විසින් "දළදා සංස්කෘතිය සහ මල්වතු-අස්ගිරි සංඝ පරම්පරා යනුවෙන් ඉදිරිපත් කොට තිබෙන අතර මල්වතු - අස්ගිරි පරම්පරාවල දළදා තේවාව පිළිබඳව මෙම ලිපිය ඉදිරිපත්කොට තිබේ. එසේම මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා විසින් රචිත "දළදා වහන්සේ, දළදා පෙරහැර සහ එහි සාරධර්ම පද්ධතිය" පිළිබඳ ලිපිය මෙහි තෙවන ලිපිය ලෙස ඉදිරිපත් කෙරේ.

මෙම ලේඛන සංග්‍රහයේ තුන්වන අංශය "දළදා වහන්සේ හා කලාව" වෙනුවෙන් වෙන් කොට තිබේ. මෙහිදී දළදා සංස්කෘතිය හා සබැඳි කලාත්මක අංශයන් කිහිපයක් පිළිබඳව ලියවුණු පර්යේෂණාත්මක ලේඛන කිහිපයක් අඩංගු කොට තිබේ. ඒවා අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ කථිකාචාර්ය මහින්ද රත්නායක මහතාගේ "නූතන ගීතය සහ දළදා වහන්සේ" යන ලිපියත් "මහනුවර දළදා පෙරහැර හා සබැඳි නර්තන හා වාදන සම්ප්‍රදාය" පිළිබඳව විශ්‍රාමලත් සංස්කෘතික සහකාර අධ්‍යක්ෂකවරයෙකු වූ කේ.ඩී.ජී. සුමනදාස මහතාගේ ලිපියත්, "දළදා පෙරහැර හා සන්නිවේදනය" යනුවෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ලලිතකලා අංශාධිපති ආචාර්ය මනෝජ් අලවතුකොටුව මහතාගේ ලිපියත්, එම අංශයේම සුදර්ශන බණ්ඩාර කථිකාචාර්යවරයාගේ "මහනුවර දළදා මාලිගයේ බිතු සිතුවම් කලාව" නමැති ලිපියත් අඩංගු කොට තිබේ. මීට අමතරව දළදා මංගල්‍යයේ කලාත්මක අංශය පිළිබඳව විශ්ලේෂණයක් සිදු

කෙරෙන ආචාර්ය නාමලී හඳගම මහත්මියගේ "සිත් සතන් නිවා සනහාලන හෙළයේ මහා සංස්කෘතික මංගල්‍යය" නමැති ලිපියක් අඩංගු කොට තිබේ.තවද "උඩරට නර්තනයේ දේශපාලනය" නමැති ලලිත කලා අංශයේ කථිකාචාර්ය සුදේශ් මන්තිලක මහතාගේ විවාදාත්මක ලිපියක් මෙම කෘතියේ කලාත්මක අංශයට ආලෝකයක් සපයයි. එසේම මහාචාර්ය මහින්ද සෝමතිලක මහතාගේ දළදා සංස්කෘතිය, දළදා මන්දිර අලංකාර කිරීමේ ලාංකික සම්ප්‍රදාය නමින් රචිත ලිපියත්, කථිකාචාර්ය අලවතුකොටුව මහතා ලියූ දළදා පෙරහැර හා සංගීතය යන ලිපියත්, මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා විසින් රචිත මහනුවර දළදා සංස්කෘතිය සහ කාර්තික උත්සව යන ලිපියත් මෙහි අන්තර්ගත වේ.

මෙම පර්යේෂණ ග්‍රන්ථයේ සිව්වැනි අංශය වෙන් වී ඇත්තේ ණිවිදේශීන් දුටු දළදා පෙරහැර෴ යනුවෙන් සපයා ඇති ශාස්ත්‍රීය ලිපි දෙකකටය. මෙයින් එක් ලිපියක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ අංශයේ ආචාර්ය රෝහිත දසනායක මහතා විසින් රචනා කර ඇති අතර "විදේශිකයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ ශ්‍රී දළදා වහන්සේ" නම් ලිපිය ලලිත කලා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුදේශ් මන්තිලක මහතා විසින් රචනා කොට තිබේ. මෙම ලිපි දෙක මගින් දළදා සංස්කෘතියේ තවත් පැතිකඩක් නිරූපණය කරයි.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයේ පස්වැනි අංශය වෙන් වී ඇත්තේ "දළදා සංස්කෘතියේ විවිධ පැතිකඩවල්" පිළිබඳව ලියූ ශාස්ත්‍රීය ලේඛනයන් කෙරෙහිය. මෙහිදී මහාචාර්ය හඟුරන්කෙත ධීරානන්ද හිමියන් විසින් ලියූ "පුරාතන ශ්‍රී ලංකාවේ නීතිය හා සදාචාරය තහවුරු කළ සිරි දළදා වහන්සේ" ශාස්ත්‍රීය වශයෙන් ඉහළ අගයක් ගත් ලිපියකි. එමෙන්ම මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා විසින් ලියනු ලැබූ "පාරම්පරික ශුද්ධත්වය, පූජනීයත්වය සහ දළදා පෙරහැර" යන ලිපියත්, ඔහු විසින්ම සපයනු ලැබූ "දළදා සංස්කෘතියේ දක්නට ලැබෙන කොඩි පිළිබඳ ලේඛනයක් වූ "දළදා පෙරහැර සහ එහි ගමන්ගන්නා දිසාවනින්ට අයත් කොඩි සහ රට සභාවට අයත් කොඩි" යන ලිපියත් ශාස්ත්‍රීය වශයෙන් අතිශය වැදගත් වේ. එසේම

දේශාටන වාර්තාවක් ඔස්සේ රචිත ආසියානු පෙරහැර සංකල්පයේ සෞන්දර්යාත්මක වටිනාකම නමැති ආචාර්ය ලීනා සෙනෙහිවීර මහත්මියගේ ලිපිය මගින් හා රජරට භික්ෂු විශ්ව විද්‍යාලයේ වැඩබලන පුස්තකාලයාධිපතිවරයා වූ තිස්ස බණ්ඩාර මහතාගේ "දළදා රාජකාරියේ සේවය හා සම්බන්ධව ශ්‍රී දළදා මන්දිරයේ කටයුතු වලින් බිඳක්" යන ලිපිය මගින්ද දළදා සංස්කෘතියේ එක් පැතිකඩක් විවරණය කරනු ලබයි.

මේ හැරුණු විට ගැටඹේ, මහින්ද රාජපක්ෂ තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ මධ්‍යස්ථානය හා මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ හිටපු සභාපතිනිය වූ දයා රත්නායක මහත්මිය විසින් සැකසූ මෙතෙක් දළදා වහන්සේ පිළිබඳව පළකොට තිබෙන පුස්තකාල පොත් පත් නාමාවලියක් මෙම ලේඛන සමුච්ඡයෙහි අගය තව දුරටත් වැඩිකොට තිබේ.

සමස්ත වශයෙන් ගත් කළ මෙම ලේඛන සංග්‍රහයේ අඩංගු ශාස්ත්‍රීය ලිපි 25 ම කාලීන අවශ්‍යතාවය පරිදි කෙරෙන නැවත ප්‍රකාශනයකි. මෙහි පර්යේෂණාත්මක හා ශාස්ත්‍රීය වටිනාකම අවබෝධ කරගත් වර්තමාන, මධ්‍යම පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, ගොවිජන සංවර්ධන, මිරිදිය ධීවර, පරිසර කටයුතු, වතු යටිතල පහසුකම් හා හින්දු සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය මරදපාණ්ඩි රමේෂ්වරන් මහතාටත්, එම අමාත්‍යාංශයේ ලේකම් තැන්පත් ආර්.එම්.පී.එස්.රත්නායක මහතාටත්, ප්‍රධාන ගණකාධිකාරි ජී.එම්.කේ. ඒකනායක මහතාටත්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්. මැණිකේ මහත්මියටත්, සහකාර ලේකම් එච්.කේ. අබේසිංහ මහත්මියටත්, මෙම කෘතිය එළිදකින තුරු නොතිත් බලාපොරොත්තුවෙන් අති විශාල කාර්යභාරයක් ඉටු කරනු ලැබූ චන්ද්‍රා දිසානායක මහත්මියටත්, කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් මගේ හද පිරි ස්තුතිය මෙයින් පුද කරමි.

මෙයට,
සංස්කාරක.

# මධ්‍යම පළාත් කෘෂිකර්ම හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවුඩය

මධ්‍යම පළාත් කෘෂිකර්ම, සුළු වාරි මාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන මිරිදිය ධීවර, පරිසර කටයුතු, හින්දු සංස්කෘතික සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය මගින් වසරක් පාසා සම්පාදනය කෙරෙන "පූජනීය දළදා සංස්කෘතිය " ග්‍රන්ථයට සමගාමීව මෙවර පූජනීය දළදා සංස්කෘතිය ග්‍රන්ථයේ පසුගිය කලාප 4 ක එකතුවක් විශේෂ කලාපයක් ලෙස සම්පාදන කොට ඉදිරිපත් කිරීමට හැකිවීම සතුටට කරුණකි. පූජනීය දළදා සංස්කෘතිය ග්‍රන්ථය 2006 වසරේ සිට අඛණ්ඩව සෑම වසරකම සම්පාදනය කෙරෙන නමුදු මුල් කලාප වල හිඟතාවය හා බලවත් පාඨක ඉල්ලීම මත මෙම විශේෂ කලාපය සම්පාදන කෙරෙන බව සඳහන් කරනු කැමැත්තෙමි.

සිංහල ජාතියේ අනන්‍යතාවය තහවුරු කෙරෙන දළදා වහන්සේ අප රටට ලැබුණු උතුම් දායදයකි. මිහිදු හිමියන්ගේ පැමිණීමත් සමග ඇතිවූ දේශපාලනමය හා සංස්කෘතිකමය සමාජ පෙරළිය තීව්‍ර කරන්නට දළදා වහන්සේගේ වැඩමවීම හේතුවූ බව පැහැදිලිය. දළදා වහන්සේ, දළදා පෙරහැර හා රාජ්‍යත්වය පිළිබඳ ඉතිහාස තොරතුරු රැගත් පූජනීය දළදා සංස්කෘතිය ග්‍රන්ථය මෙරට දළදා ඉතිහාසය සම්බන්ධව ලියැවුණු තවත් අගනා කෘතියකි. මෙරට රාජ්‍යත්වයේ සංකේතය දළදා වහන්සේගේ භාරකාරත්වය ලබාගැනීම යැයි පැවති විශ්වාසය නිසා සෑම රජකෙනෙකුම දළදා වහන්සේ හිමිකර ගැනීමටත් දළදා වහන්සේ දිවිහිමියෙන් ආරක්ෂා කිරීමටත් කියාකළ ආකාරය දළදා ඉතිහාසයෙන් මොනවට පැහැදිලි වේ. එසේම දළදා වහන්සේ වෙනුවෙන් කෙරෙන පුදපූජා සතර දේවාල පෙරටු කරගත් දළදා පෙරහැර හා දළදා වහන්සේගේ පිළිබඟ සුවිශේෂ තොරතුරු ඇතුළත් මෙම පර්යේෂණ ග්‍රන්ථය වර්තමානයට පමණක් නොව අනාගත පරපුර සඟහා ලබාදිය හැකි උතුම් තිළිණයකි.

පූජනීය දළදා සංස්කෘතිය ග්‍රන්ථය සම්පාදනය ඇරඹීමෙන් පසු

වාර්ෂිකව මධ්‍යම පළාතේ පාසැල් පුස්තකාල විශ්ව විද්‍යාල පුස්තකාල මධ්‍යම පළාතේ සියලුම මහජන පුස්තකාල පිරිවෙන් පුස්තකාල පළාත් ආණ්ඩුකාරවරුන් පළාත් ලේකම්වරුන්, විද්වත් පිරිස් සඳහා බෙදා දෙනු ලැබූවද මුල්කලාප 04 පිළිබඟනිබද සිදුකෙරෙන විමසීම් නිසා මෙසේ නැවත මුද්‍රණයක් කිරීමට ඉඩකඩ සැලසිණි. එසේම 2014 වර්ෂයේ විද්වත් ලේඛක මඬුල්ලට උපහාර පිරිනැමෙන අවස්ථාවේ මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යතුමන්ද මෙවැනි අග්‍රගණ්‍ය කෘතියක නැවත මුද්‍රණය කිරීමේ අවශ්‍යතාවය සිහිපත් කරන ලදී.. සැබවින්ම මධ්‍යම පළාත් කෘෂිකර්ම හා පරිසර අමාත්‍යාංශය මගින් මෙලෙස පූජනීය දළදා සංස්කෘතිය ග්‍රන්ථයේ විශේෂ එකතුවක් එළිදැක්වීම කාලීන අවශ්‍යතාවයක් මෙන්ම අනාගත ආයෝජනයක්ද වේයැයි මාගේ හැඟීමයි.

2006 වසරේ මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ සංකල්පයකට අනුව ඹිපරිසරය පූජනීයයි වැඩසටහනඏයටතේ ආරම්භ කරන ලද පූජනීය දළදා සංස්කෘතියේ පසුගිය කලාප හතරක එකතුවක් නැවත එළිදැක්වීම සඳහා මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර සුරංගනී එල්ලාවල මැතිතුමිය හා මධ්‍යම පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය සරත් ඒකනායක මැතිතුමා ලබාදුන් සහයෝගය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. එසේම මධ්‍යම පළාත් කෘෂිකර්ම හා පරිසර කටයුතු ගරු අමාත්‍ය එම්. රාම් මැතිතුමන් විසින් ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීම පමණක් නොව ඊට අවශ්‍ය පසුබිම සලසා දීම වෙනුවෙන්ද මධ්‍යම පළාත් කෘෂිකර්ම හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් ගෞරවණීය ස්තුතිය පුදකර සිටිමි.

පූජනීය දළදා සංස්කෘතිය ග්‍රන්ථය නැවත මුද්‍රණය වෙනුවෙන් ප්‍රධාන සංස්කාරක වශයෙන් කටයුතු කරන පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය එච්.එම්.ඩී.ආර්.හේරත් මහත්මා ගේ සේවය කෘතවේදීව සිහිපත් කරන අතර එම කලාප සඳහා ලිපි සැපයූ විද්වත් ලේඛක මඬුල්ලද ගෞරවයෙන් සිහිපත් කරනු කැමැත්තෙමි.එසේම මධ්‍යම පළාත් සභාවේ ගරු මැති ඇමතිතුමන්ලා මෙන්ම ප්‍රධාන ලේකම් එම්.එස්. ප්‍රේමවංශ මහත්මාද මෙම විශේෂ එකතුව ප්‍රකාශනය කිරීම වෙනුවෙන් අප දිරිමත්

කිරීම සතුටට කරුණකි.

එමෙන්ම මෙවැනි කර්තව්‍යක් සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා මුල්කලාප මැනවින් සම්පාදනයට උරදුන් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම හා පරිසර අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරු හා කාර්ය මණ්ඩල ගෞරවයෙන් සිහිපත් කරන අතර මෙම විශේෂ කෘති එකතුව මුද්‍රණයට දායක වන ඔමැක්ස් ප්‍රින්ටර්ස් අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ද සිහිපත් කරනු කැමැත්තෙමි.

එසේම මෙම පූජනීය දළදා සංස්කෘතිය විශේෂ කලාපය සම්පාදනය සඳහා නිරන්තර කැපවීමෙන් කටයුතු කරන මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීතුමන් සහකාර ලේකම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) සහකාර අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) ඇතුළු කාර්ය මණ්ඩලයටද නන් අයුරින් සහයෝගය ලබාදුන් සැමටද මාගේ ස්තුතිය පිරි නමමි.

ආර්.එම්.පී.එස්. රත්නායක,
ලේකම්,
මධ්‍යම පළාත් කෘෂිකර්ම හා පරිසර අමාත්‍යාංශය

# උපදේශක මණ්ඩලය

- ප්‍රධාන උපදේශකත්වය හා මග පෙන්වීම
  ගරු සරත් ඒකනායක මැතිතුමා
  මධ්‍යම පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා

- ගරු එම්. රමේෂ්වරන් මැතිතුමා
  මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම හා පරිසර කටයුතු පිළිබඳ
  අමාත්‍යාංශයේ ලේකම්

- සම්බන්ධීකරණය
  පී.එම්.කේ. ඒකනායක මහතා
  ප්‍රධාන ගණකාධිකාරි

- ආර්. එම්.එස්. මැණිකේ මිය
  නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)

- ඒ.එස්. අබේගුණරත්න මිය
  සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)

- චන්ද්‍රා දිසානායක මිය
  සංවර්ධන නිලධරි (පරිසර)

- නිරෝෂා රණසිරි මිය
  සංවර්ධන නිලධාරි (පරිසර)

**විශේෂ එකතුව**

පූජනීය දළදා සංස්කෘතිය - 2006
පූජනීය දළදා සංස්කෘතිය - 2007
පූජනීය දළදා සංස්කෘතිය - 2008
පූජනීය දළදා සංස්කෘතිය - 2009

පිටකවරය සහ පරිගණක පිටු සැකසුම
ඔමැක්ස් මුද්‍රණාලය - මහනුවර

ISSN

ප්‍රකාශනය:
මධ්‍යම පළාත් සභාවේ කෘෂිකර්ම හා පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

මෙම සඟරාවේ ලිපිවල අන්තර්ගත අදහස් හා ප්‍රකාශ පිළිබඳ
වගකීම් ඒ ඒ ලේඛකයන් සතුවන අතර, ඒවා අවශ්‍යයෙන්ම මධ්‍යම
පළාත් සභාවේ කෘෂිකර්ම හා පරිසර අමාත්‍යාංශයේ අදහස් පිළිබිඹු
නොකරන බව සැලකුව මනාය. උපුටා ගැනීම්වලදී
මෙහි ප්‍රධාන සංස්කාරකවරයාගේ ලිඛිත
අවසරය ලබාගත යුතු බව කරුණාවෙන් සලකන්න.

**සංස්කාරක**

**මහාචාර්ය එච්. එම්. ඩී. ආර්. හේරත් මහතා**

අංශාධිපති

සමාජ විද්‍යා අධ්‍යනාංශය,

පේරාදෙණිය විශ්ව විද්‍යාලය

දෙවන කලාපය - 2007
තෙවන කලාපය - 2008
සිව්වන කලාපය - 2009
පස්වන කලාපය - 2010
හයවන කලාපය - 2011
හත්වන කලාපය - 2012
අටවන කලාපය - 2013
නවවන කලාපය - 2014
දහවන කලාපය - 2015

**පූජනීය දළදා සංස්කෘතිය ග්‍රන්ථයේ විශේෂ කලාපයට අයත් මාතෘකා ඒ ඒ වර්ෂ අනුව පහත සඳහන් වේ.**

2006

1. දළදා සමිඳු සහ කන්ද උඩරට
2. දළදා වහන්සේගෙන් අභිමානනීයත්වයට පත් ශ්‍රී ලාංකේය රාජ්‍යත්වය
3. දළදා සංස්කෘතිය, දළදා මන්දිර අලංකාර කිරීමේ ශ්‍රී ලාංකික සම්ප්‍රදාය
4. දළදා තේවාව සහ ඊට සම්බන්ධ සිරිත් විරිත්
5. දළදා සංස්කෘතිය සහ අස්ගිරි මල්වතු සංඝ පරම්පරා
6. දළදා සතර මහා මංගල්‍යය, දළදා සංස්කෘතිය හා ජන සමාජය

2007

1. මහනුවර දළදා පෙරහැර සහ සමාජය
2. දළදා පෙරහැර හා සන්නිවේදනය
3. පාරිසරික ශුද්ධත්වය, පූජනීයත්වය සහ දළදා පෙරහැර
4. උඩරට නර්තනයේ දේශපාලනය
5. දළදා වහන්සේ, දළදා පෙරහර සහ සාරධර්ම පද්ධතිය

2008

1. පුරාතන ශ්‍රී ලංකාවේ නීතිය සහ සදාචාරය තහවුරු කළ සිරි දළදා වහන්සේ
2. මහනුවර ඇසළ පෙරහැරේ උපත
3. ආසියානු පෙරහැර සංකල්පයේ සෞන්දර්යාත්මක වටිනාකම

(දේශාටන වාර්තා දෙකක් ඇසුරෙනි)

4. දළදා පෙරහැර හා සංගීතය

5. මහනුවර දළදා මාළිගයේ බිතුසිතුවම් කලාව

6. "විදේශීය නර්තනවේදිනියක දුටු දළදා පෙරහැර" Beryl de Zoete ගේ සටහනක ඇසුරෙන් කෙරෙන පරිවර්තනයකි

7. මහනුවර දළදා සංස්කෘතිය සහ කාර්තික උත්සවය

2009

1. නූතන ගීතය සහ සිරි දළදා වහන්සේ

2. විදේශිකයින්ගේ ගෞරවාදරයට ලක් වූ ශ්‍රී දළදා වහන්සේ

3. රාජකාරියේ සේවය හා සම්බන්ධව ශ්‍රී දළදා මන්දිරයේ කටයුතුවලින් බිඳක්

4. සිත් සතන් නිවා සනහාලන හෙළයේ මහා සංස්කෘතික මංගල්‍යය

5. මහනුවර දළදා පෙරහැර හා සබැඳි නර්තන හා වාද්‍ය සම්ප්‍රදාය

6. ශ්‍රී ලංකාවේ අගනගරය තුළ වැඩ සිටි දළදා වහන්සේ

7. දළදා සංස්කෘතිය හා සම්බන්ධව ප්‍රකාශිත ඉංග්‍රීසි සහ සිංහල පොත්පත් නාමාවලිය

8. දළදා පෙරහැර සහ එහි ගමන් ගන්නා දිසාවන්ට අයත් කොඩි සහ රට සභාවට අයත් කොඩි

## පටුන

### කන්ද උඩරට හා ශ්‍රී දළදා වහන්සේ

1. දළදා සමිඳු හා කන්ද උඩරට-
සම්මානනීය මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

2. දළදා වහන්සේගෙන් අභිමානනීයත්වයට පත්
ශ්‍රී ලාංකේය රාජ්‍යත්වය
මහාචාර්ය හඟුරන්කෙත ධීරානන්ද හිමි,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

3. ශ්‍රී ලංකාවේ අග නගරය තුළ වැඩසිටි දළදා වහන්සේ
කථිකාචාර්ය අජිත් තලවත්ත, රජරට විශ්ව විද්‍යාලය

4. දළදා සතර මහා මංගල්‍යය දළදා සංස්කෘතිය හා
ජන සමාජය
මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්, සමාජ විද්‍යා
අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

5 මහනුවර ඇසළ පෙරහැරේ උපත
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අතුල සමරකෝන්, ලලිතකලා
අධ්‍යයනාංශය,පේරාදෙණිය විශ්ව විද්‍යාලය

6 මහනුවර දළදා පෙරහැර හා සමාජය
කථිකාචාර්ය ඩබ්.එම්.පී. සුදර්ශන බණ්ඩාර, ලලිත කලා
අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

### ශ්‍රී දළදා වහන්ස් හා පූජා සත්කාර

7. දළදා තේවාව හා ඊට සම්බන්ධ සිරිත් විරිත්
අපවත් වී වදාළ මහාචාර්ය වරකාවේ ධම්මාලෝක හිමි,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

8. දළදා සංස්කෘතිය හා අස්ගිරි මල්වතු සංඝ පරම්පරා
ආචාර්ය මුවඇටගම ඥාණානන්ද හිමි, පාලි හා බෞද්ධ
අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

9. දළදා වහන්සේ, දළදා පෙරහර සහ සාරධර්ම පද්ධතිය
මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්, සමාජ විද්‍යා
අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

## දළදා වහන්සේ හා කලාව

10. නූතන ගීතය සහ සිරි දළදා වහන්සේ
කථිකාචාර්ය මහින්ද රත්නායක, සිංහල අධ්‍යයනාංශය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

11 මහනුවර දළදා පරහැර හා සබැඳි නර්තන හා
වාද්‍ය සම්ප්‍රදාය කේ.ඩී.ජී. සුමනදාස,
විශ්‍රාමලත් සංස්කෘතික සහකාර අධ්‍යක්ෂ,

12. දළදා පෙරහැර හා සන්නිවේදනය
ආචාර්ය මනෝජ් අලවතුකොටුව, අංශාධිපති,
ලලිත කලා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

13. මහනුවර දළදා මාළිගයේ බිතු සිතුවම් කලාව
කථිකාචාර්ය ඩබ්.එම්.පී. සුදර්ශන බණ්ඩාර, ලලිත කලා
අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

14. සිත්සතන් නිවා සනහාලන හෙලයේ මහා සංස්කෘතික
මංගල්‍යය ආචාර්ය නාමලී හඳගම, දර්ශන
අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

15. උඩරට නර්තනයේ දේශපාලනය
කථිකාචාර්ය සුදේශ් මන්තිලක,
ලලිත කලා අධ්‍යයනාංශය, පේරාදෙණිය
විශ්ව විද්‍යාලය.

16 දළදා සංස්කෘතිය, දළදා මන්දිර අලංකාර කිරීමේ
ශ්‍රී ලාංකික සම්ප්‍රදාය මහාචාර්ය මහින්ද සෝමතිලක,ඉතිහාස
අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

17 දළදා පෙරහැර හා සංගීතය කථිකාචාර්ය මනෝජ්
අලවතුකොටුව, ලලිත කලා අධ්‍යයනාංශය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

18 මහනුවර දළදා සංස්කෘතිය සහ කාර්තික උත්සවය
මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්, සමාජ
විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

**විදේශීන් දුටු දළඳ පෙරහැර**

19. විදේශිකයින්ග් ගෞරවාදරයට පාත්‍ර වූ ශ්‍රී දළඳා වහන්සේ
ආචාර්ය රෝහිත දසනායක, ඉතිහාස අධ්‍යයනාංශය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

20. විදේශීය නර්තනවේදියක දුටු දළඳා පෙරහැර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුදේශ් මන්තිලක, ලලිත කලා
අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

**දළඳා සංස්‍කෘතියේ විවිධ පැතිකඩ**

21. පුරාතන ශ්‍රී ලංකාවේ නීතිය හා සදාචාරය තහවුරු
කළ සිරි  දළඳා වහන්සේ
මහාචාර්ය හඟුරන්කෙත ධීරානන්ද හිමි

22. පාරිසරික ශුද්ධත්වය, පූජනීයත්වය සහ දළඳා පෙරහැර
එච්.එම්.ඩී.ආර්. හේරත් , අංශාධිපති, සමාජ විද්‍යා
අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

23. දළඳා පෙරහැර හා එහි ගමන් ගන්නා දිසාවනින්ට
අයත් කොඩි සහ රට සභාවට අයත් කොඩි
එච්.එම්.ඩී.ආර්. හේරත් , අංශාධිපති, සමාජ විද්‍යා
අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

24 ආසියානු පෙරහැර සංකල්පයේ සෞන්දර්යාත්මක වටිනාකම
(දේශාටන  වාර්තා දෙකක් ඇසුරෙනි)
ආචාර්ය ලීනා සෙනෙහිවීර, ලලිත කලා අධ්‍යයනාංශය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

25 රාජකාරියේ සේවය හා සම්බන්ධව ශ්‍රී දළඳා
මන්දිරයේ කටයුතුවලින් බිඳක් තිස්ස බණ්ඩාර,
වැඩබලන  පුස්තකාලයාධිපති, භික්ෂු  විශ්ව
විද්‍යාලය, අනුරාධපුරය

**දළඳා සංස්කෘතිය හා සම්බන්ධ ප්‍රකාශිත ඉංග්‍රීසි, සිංහල පොත් පත් නාමාවලිය**

දයා රත්නායක, හිටපු සභාපති, මහින්ද රාජපක්ෂ තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය හා පුස්තකාල සේවා මණ්ඩලය

# දළදා සමිඳු හා කන්ද උඩරට

මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න

කන්ද උඩරට රාජධානිය ආරම්භ වූයේ පේරාදෙණියේ විජේසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර පළමුවන විමලධර්මසූරිය නමින් ක්‍රි.ව. 1592 දී සෙංකඩගල පුරවරයේදි රාජපදප්‍රාප්ති වීමත් සමඟය. මේ පුවත එකල ඉතිහාසය ලියැවී ඇති හැම පොතපතක ම සඳහන් වී ඇත. **මහාවංශය** එම පුවත වාර්තා කර ඇත්තේ බුද්ධ වර්ෂ 2135 දී සිදුවූවක් ලෙසිනි. එම පුවත ම "එක්සිය පන්තිසෙක දෙදහස බුදු වසින" යනුවෙන් **මන්දාරම් පුර පුවතෙහි** සඳහන් වී ඇති අතර **අස්ගිරි තල්පත** එය වාර්තා කර ඇත්තේ "ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2135 වැන්නෙහි කොනප්පු බණ්ඩාර කුමරුට විමලධර්ම යැයි නම් තියා සෙංකඩගල නුවර රජ පමුණුවා ගත්තාහ" වශයෙනි. **රාජාවලියෙ** සඳහන් ව ඇත්තේ ද **මහාවංස** පුවතම ය. සෙංකඩගල පුරය මහනුවර (අගනුවර) වශයෙන් තබා ගනිමින් කන්ද උඩරට රාජධානිය ආරම්භ වීම ඉතිහාසයේ තවත් එක් අමරණීය සිද්ධියකි. මෙම කන්ද උඩරට රාජධානිය ඉංග්‍රීසීන් විසින් අත්පත් කොට ගනු ලැබූ ක්‍රි.ව. 1815 දක්වා ම පැතිර පැවතියේ ය. මේ නයින් බලන කල කන්ද උඩරට රාජධානිය බිහි වී 1992 වනවිට වර්ෂ හාරසීයයක් සම්පූර්ණ වෙයි.

එහෙත් සෙංකඩගල පුරවරය බිහිවූයේ රාජධානිය ආරම්භ වීමට සිය වසරකට පමණ පෙර සේනා සම්මත වික්‍රමබාහු (1469 - 1511) රජතුමන් දවස බව මෙහි දී අමතක කළ යුතු නොවේ.

කන්ද උඩරට රාජධානියේ ආරම්භය සම්බන්ධයෙන් එන ඓතිහාසික කරුණු බොහෝ සෙයින් පටලැවිලි සහගත ය. එසේ වුවත් දැනට ඉතිහාසඥයන්ගේ පිළිගැනීමට භාජනය වී ඇති කරුණු කිහිපයක් කෙරෙහි පාඨක අවධානය යොමු කරනු කැමැත්තෙමි. හයවැනි පරාක්‍රමබාහු රජතුමන් (1411 - 1467) කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුරය අගනුවර කර ගනිමින් රාජ්‍යය විචාරණය කළ ඒ රජු වෙනුවෙන් උඩරට ප්‍රදේශ පාලනය කරන ලද්දේ

ජෝතිය සිටාණන් හා ගම්පල ඇපාණන් යන දෙදෙනා විසින් බව **මඩවල සෙල්ලිපියෙන** පැහැදිලි වේ.

එහෙත් වෙන ම ප්‍රදේශයක් වශයෙන් පාලනය වූ උඩරට සඳහා එහි පාලකයන් විසින් කෝට්ටේ රජුට අවුරුදු පතා කප්පම් ගෙවීමෙන් තම අවනත භාවය ප්‍රකාශ කර සිටි බව පෙනේ. ගම්පල රජ පෙළපතට අයත් අය විසින් ම මෙහි පාලනය ගෙන යන්නට ඇතැයි සිතිය හැක. ඉහත දැක්වූ දෙදෙනා අතරින් ජෝතිය සිටාණන් විසින් කෝට්ටේ පැරකුම්බා රජුගේ පනස් දෙවැනි වර්ෂයේදී, එනම් ක්‍රි.ව. 1463 දී සිදුකරන ලද කැරැල්ල උඩරට රාජධානියේ ස්වාධීනත්වය උදෙසා සිදුකළ පරාජිත සටනක් ලෙසින් හැඳින්විය හැක. එහෙත් හයවැනි පැරකුම්බාවන්ගේ අභාවයත් සමග ම තත්ත්වය වෙනස් විය.

හයවන බුවනෙකබාහු (1470 - 1478) රාජ සමයේ දී උඩරට නිදහස් සටන යළි පණගැන්වී ගියේ ය. ගම්පල රාජකීය පවුලට අයත් වූවකු වශයෙන් සැලකෙන සේනා සම්මත වික්‍රමබාහු උඩරට රජු වශයෙන් මෙහි ප්‍රභූන් විසින් පිළිගනු ලැබීම වැදගත් සිද්ධියක් වූ අතර ඔහුගේ රාජ පදප්‍රාප්තිය ද හයවැනි බුවනෙකබාහු රජුගේ කාලයට ආසන්නව ම සිදු වූ බව විශ්වාසය යි. මේ නව රජු ස්වකීය අගනුවර වශයෙන් සෙංකඩගල පුරවරය තෝරාගත් බව පෙනේ. මෙම නගරයෙහි ඔහු අවුරුදු හතළිහක් පමණ රාජ්‍යය කරමින් කෝට්ටේ රාජධානියට අභියෝග එල්ල කළේය.

කප්පම් නොගෙවා ස්වකීය පාලනය ගෙන ගිය ඔහු දෙවරක් කෝට්ටේ රජුට පරාජය වූයේ ය. එහෙත් සෑහෙන බලයකින් යුතුව උඩරට විශාල ප්‍රදේශයක් හෙතෙම පාලනය කළේය. උඩරට රාජධානියේ ප්‍රභවයට පදනම දැමූ ප්‍රථම රජතුමන් සේනා සම්මත වික්‍රමබාහු ය යන්න අවිවාදයෙන් පිළිගත් කරුණකි. මේ රජුගෙන් පසු උඩරට රජ වූයේ ජයවීර ය. වෂී 1511 - 1551 පෘතුගීසි සටන් පැවති මේ කාලයේ දී උඩරට රජුට ද කෝට්ටේ දේශපාලන අරගලවලට මැදිහත් වීමට සිදුවිය.

අභ්‍යන්තර අරගලවලට ජයවීර මැදිහත් විය. ඔහුට එක් තර්ජනයක් එල්ල වූයේ කරල්ලියද්දේ බණ්ඩාරගෙනි. මේ සටනින් ජයවීර බණ්ඩාර ජයගෙන 1511 දී උඩරට රජවිය. ජයවීර මෙන් ම කරල්ලියද්දේ ද කෝට්ටේ ධර්මපාල ද කතෝලික ආගම වැළඳ ගත්තේ පෘතුගීසීන් යටතේ ආරක්ෂාව සලසා ගනු පිණිස යයි අනුමාන කළ හැක. උඩරට රාජධානියට දැන් තර්ජනයක් වූයේ සීතාවක රාජධානියේ පළමුවන රාජසිංහ රජුගෙන් පමණි. ජයවීර බණ්ඩාර හා කරල්ලියද්දේ යන දෙදෙනා අතර වූ බල අරගලයෙන් කරල්ලියද්දේ බණ්ඩාරට ජය අත්විණි.

මෙහි ප්‍රතිඵලය වූයේ වර්ෂ 1551 දී පමණ ඔහු උඩරට රජ වීමය. සීතාවකින් උඩරටට යළිත් තර්ජන ඇතිවිය. කතෝලික ආගමික සම්බන්ධතාව හා ඥාති සම්බන්ධතාව පදනම් වූ මිත්‍රත්වය හේතු කොටගෙන කෝට්ටේ උඩරට රාජධානිය අතර බැඳීමක් පැවතිණි. එහි පසුබිමෙහි පෘතුගීසි සහයෝගය ද පැවතියේ ය.

එහෙත් සීතාවක රාජසිංහ රජු එක් අතෙකින් කෝට්ටේ රාජධානියට ද අනෙක් අතින් උඩරට රාජධානියට ද තර්ජන එල්ල කළේ ය. කෝට්ටේ රාජධානියට වර්ෂ 1560 හා 1566 යන වර්ෂවලදී ද වර්ෂ 1574 දී හා 1578 දී උඩරටට ද ඔහුගේ ආක්‍රමණ හා තර්ජන එල්ල විණි. මේ අතර කරල්ලියද්දේ කෙරෙහි උඩරට ප්‍රධානීන්ගේ ගෞරවය හා සහයෝගය අඩුවන්නට වූයේ ඔහුගේ ආගමික භක්තිය නොරුස්නා හේතුව නිසා ය. මෙකී ප්‍රභූන් අතර වීරසුන්දර බණ්ඩාර ද වූයේ ය. මේ පසුබිමේ සිට සීතාවක රාජසිංහයන් විසින් යළිත් 1582 දී උඩරටට තුන්වන වතාවටත් පහර දෙන ලදි. සටනින් පරාජය වූ කරල්ලියද්දේ උතුරට පළාගොස් එහි කලක් නතරව ත්‍රිකුණාමලයට පැමිණ මිය ගියේ ය. කරල්ලියද්දේගේ දියණිය වූ දෝන කතිරිනා හෙවත් කුසුමාසන දේවිය පෘතුගීසි රැකවරණයෙහි පසුවූවා ය.

මෙසේ වර්ෂ 1581 දී රාජසිංහ උඩරට ජයග්‍රහණය කළ ද උඩරැටියන් රාජසිංහයන්ගේ පාලනය නොරිස්සුවේ ය. මෙයට හේතු වූයේ ඔහුගේ කෲර පාලනය හා බෞද්ධ විරෝධී ක්‍රියා පිළිවෙතයි. කෙසේ වුවද විරසුන්දර

බණ්ඩාරගේ දේශපාලන තර්ජනය වටහා ගත් රාජසිංහ රජු උපාය මාර්ගයෙන් ඔහු මරා දැමී ය. කරල්ලියද්දේගේ මරණින් පසු උඩරට රාජධානියට හිමිකම් කිව හැකි වූයේ දොන් කතිරිනා කුමරියට යි. එහෙත් පෘතුගීසි අනුග්‍රහයෙන් දොන් පිලිප් හෙවත් යමසිංහ බණ්ඩාර උඩරට පාලනය භාර ගත්තේ ය. පෘතුගීසින්ගේ වාසනාවට සීතාවක රාජසිංහ රජුගේ මරණය 1591 දී සිදු විය. මෙයින් උද්දාම වූ පෘතුගීසිහු දෝන කතිරිනා කුමරිය පෙරමුණෙහි තබා ඇය මහරැජිණ වශයෙන් ප්‍රකාශයට පත් කරමින් සෙංකඩගල පුර සිහසුනෙහි තැබූහ.

එහෙත් දොන් ජුවන් හෙවත් කොනප්පු බණ්ඩාර පෘතුගීසින්ට විරුද්ධව දන්තුරේ දී තීරණාත්මක ප්‍රහාරයක් එල්ල කරමින් ජය ලබා දෝන කතරිනා තම අගබිසව් තනතුරෙහි තබා 1582 දී විමලධර්මසූරිය නමින් උඩරට රජවිය. මෙසේ දෝන කතරිනා විවාහ කර ගැනීමෙන් විමලධර්මසූරිය රජු ස්වකීය දේශපාලන ස්ථාවර භාවය තහවුරු කර ගත්තේ ය. **මන්දාරම් පුර පුවතෙ** මෙම සිද්ධිය විස්තර කර ඇත්තේ මෙසේ ය.

පිලිප් කුමරු යමපුර හැර විගසකි නා
ප්‍රතිකල් වැසියනුදු පන්නා බිය දෙමි නා
සෙංකඩගල පුරය සරසා සුරපුර ලෙසි නා
රජවිය විමලදම් සුරිය යන නම් නා

කෙසේ වුව ද උඩරට රාජධානියේ ආරම්භක මේ වකවානුව ගැන ස්ථිර ඓතිහාසික කරුණු මත විස්තර ලිවීමට කිසිවෙකුත් මේ දක්වා සමත් වී නැත්තේ ප්‍රමාණවත් මූලාශ්‍ර මඳකම හා ඒවාහි ඇති සත්‍යතාව පිළිබඳව ඇති සැකය නිසා ද බව කිව යුතු ය. එබැවින් දළ වශයෙන් මේ කාලය පිළිබඳ ඉහත සඳහන් කළ විස්තරය ද තවත් අයෙකුට වෙනස් අයුරකින් ලිවිය හැකි බව සැලකිය යුතුය.

උඩරට රාජධානිය ස්ථිර වශයෙන් ගොඩනැංවීමට සමත් වූ විමලධර්මසූරිය රජතුමන්ට දැන් අවශ්‍ය වූයේ රාජ්‍යත්වයේ සංකේතය බවට පත් ව තිබූ ශ්‍රී දළදා වහන්සේ නව අගනුවරට වැඩමවා ලීමට ය. සිව්වැනි සියවසේ රජකළ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජතුමාගේ රාජෝද්‍යෝගයෙන් නවවැනි

වර්ෂයේ දී හෙවත් ක්‍රි.ව. 310 දී පමණ කාන්තාවක විසින් දළදා වහන්සේ කලිඟු රට සිට මෙහි ගෙනෙන ලද බව **මහාවංසය** ප්‍රකාශ කළ ද **පාලි දාඨාවංසය** එම තොරතුරු පිළිබඳ විස්තර සපයමින් දන්ත කුමරු හා හේමමාලා යන දෙදෙනා බමුණු වෙස් ගන්වා දඹදිව ශුවසීව රජතුමන් විසින් සිංහල ද්වීපයට දළදා වහන්සේ එවන ලද බව සඳහන් කරයි. එදා පටන් අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි, යාපහුව, කුරුණෑගල, ගම්පල හා කෝට්ටේ රජධානිවල රජුගේ ආරක්ෂාව හා පුදපූජා ලබමින් වැඩසිටි දළදා වහන්සේ වර්ෂ 1592 පටන් උඩරට සෙංකඩගල පුරවරයේ නව රජතුමන්ගේ ආරක්ෂාව හා පුද පූජාවට පාත්‍ර වන්නට වූයේ ය. සිංහල බෞද්ධ රජෙකු වශයෙන් ස්වකීය අනන්‍යතාව තහවුරු කරමින් සිරි දළඳා සමිඳු වෙත ඔහු යොමු විය. එකල පැවති සතුරු වියවුල් නිසා දළඳා සමිඳු සඟවා තිබුණු රත්නපුරයේ දෙල්ගමු විහාරයෙන් එය මහනුවරට වැඩම වූ සැටි **මහාවංසය** විස්තර කරන්නේ මෙසේ ය.

"ඒ නරේන්ද්‍රයා සර්වඥ දන්තධාතු තොමෝ කොතැනක දැයි විචාර දෙල්ගමු වෙහෙර යැයි අසා අතිශයින් ප්‍රසන්න සිත් ඇත්තේ සබරගමු රට දෙල්ගමුවෙහි වඩනා ලද දන්තධාතුන් වඩා ගෙන්වාගෙන තමන්ගේ යහපත් වූ උතුම් වූ භූමි භාගයෙක්හි සිත්කලු වූ දෙමහල් දාගෙයක් කරවා එහි දළඳාව තබා නිරන්තරාදර ඇත්තේ පූජා කළේ ය."[2]

කන්ද උඩරට රාජධානියේ ප්‍රාරම්භක අවධිය පිළිබඳ කරුණු හදාරන්නෙකුට ඇති ප්‍රධානතම බාධකය වන්නේ ඒ සඳහා ප්‍රමාණවත් කරුණු එක්රැස් කර ගැනීමට ඇති අවහිරතාවයයි. මේ අවධියේ ඉතිහාසය හැදෑරීමට ප්‍රමාණවත් මූලාශ්‍ර නොවීම නිසා ජනශ්‍රැති අවිධිමත් ලෙස භාවිතයට ගනිමින් ඉතිහාස කතාපුවත් විකෘති කොට ඉදිරිපත් කිරීම දැන් බොහෝ දෙනා අතින් සිදුවන කරුණකි. ඉතිහාස කතාපුවතක් සත්‍ය සිද්ධියක් ලෙස සැලකෙන්නේ එම පුවත හෝ සිද්ධිය තහවුරු කිරීමට ප්‍රබල සාධක ඉදිරිපත් කිරීමට හැකිනම් පමණකි. එසේ නොමැතිව එක් මූලාශ්‍රයක සඳහන්ව ඇති පමණින් එය ඓතිහාසික සත්‍යයක් වශයෙන් පිළිගැනීම

ඉතිහාසඥයෙකු තබා සාමාන්‍ය පුද්ගලයෙකු විසින් හෝ නොකට යුත්තකි. එසේ පිළිගතහොත් සිදුවන්නේ පුවත් විකෘති කොට ඉදිරිපත් කර පාඨකයා නොමග යැවීමකි. එබැවින් ම ඉතිහාස පුවත් ගැන ලියන කියන සැමදෙනා විසින් ම ස්වකීය මූලාශ්‍ර ඉතා කල්පනාකාරීව ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය. පරෙස්සමින් තොරව ලියන ඉතිහාසය මගින් රටක් මෙන්ම ජාතියක්ද විනාශ කළ හැකිය. ලංකාවේ පවතින වර්තමාන ජනවාර්ගික අර්බුදය හමුවේද මෙවැනි ම ලිපි ලේඛන සිංහල දෙමළ දෙපක්ෂය විසින් ම ස්වකීය වාසිය තකා දැන් ලියනු දැකීම ඛේදජනක ය.

මා විසින් ඉහත සඳහන් අදහස දැක්වූයේ කන්ද උඩරට රාජධානියේ ආරම්භ අවධිය පිළිබඳ ලියන කියන බොහෝ දෙනා විචාරයෙන් තොරව සමහර මූලාශ්‍ර විද්‍යාත්මක පරීක්ෂණයට භාජනය නොකොට ජනශ්‍රැති පරිහරණය කිරීම නිසා ඉතිහාස කරුණු දැනටමත් අවුල්කර ඇතිබව කීමටයි. මෙවැනි ලිපිලේඛන පසුකාලීන ලේඛකයන් විසින් වරින්වර උපුටා දැක්වීම හා අනුගමනය කිරීම නිසා විකෘති අදහස් සමාජයේ තහවුරු වී මහත් විනාශයකට පාත්‍රවීම නොවැළැක්විය හැකි කරුණක් වන්නේ ය. වර්ෂ 1969 දී මහාචාර්ය මැන්දිස් රෝහණධීරයන් විසින් ප්‍රකාශයට පත්කරන ලද **අස්ගිරි තල්පත** නමැති මූලාශ්‍ර ග්‍රන්ථය එබන්දකි. මහනුවර, අස්ගිරි මහාවිහාරයේ තිබී සොයාගත් පුස්කොළ පොතක් මුද්‍රණයට පමුණුවාලීමෙන් රෝහණධීර මහතා සිදුකළේ උසස් සාහිත්‍ය සේවාවකි. එසේ ද වුවත් එහි අන්තර්ගත කරුණ ඒකපාර්ශවික වශයෙන් පිළිගෙන **අස්ගිරියේ තල්පතින් අළුත්වන ලංකා ඉතිහාසය** නමින් තවත් පොතක් 1970 දී පළකිරීම ශාස්ත්‍ර පරිහානියටත්, ශාස්ත්‍රාභිලාශීන් නොමග යැවීමටත් හේතුවිණැයි සිතමි. අස්ගිරියේ තල්පොතේ එන "අරුම ඓතිහාසික තොරතුරු වලින් ලංකා ඉතිහාසයට ලැබෙන නව එළිය විමසනු සඳහා[1] එතුමන් ප්‍රසිද්ධියට පත්කළ ඉහත කෘතිය විශේෂයෙන් ම ප්‍රයෝජනවත් වූයේ අස්ගිරි මහාවිහාරයේ ඉතිහාසය ගැන ලියන කියන භික්ෂූන් වහන්සේට ම පමණකි. එම කෘතිය ගිහි උගතුන්ගේ අවධානයට හෝ පිළිගැනීමට ලක්වූයේ යයි සිතිය නොහැක. අස්ගිරි තල්පත වූ කලි අස්ගිරි මහාවිහාරයේ කතාපුවතේ ශ්‍රේෂ්ඨත්වය

ඉස්මතු කරලීමේ අරමුණ ඇතිව එක්තරා කාලයක අස්ගිරි විහාරවාසී භික්ෂුවක් විසින්ම නිපදවන ලද කතා පුවතකි. මෙබඳු ගණයේ ලේඛන බොහෝ විහාරවලින් අද දිනත් සොයාගැනීම අපහසු නැත. මෙම ලේඛනයේ විශ්වාසනීයත්වය පිළිබඳ සැකසිතු ඉතිහාසඥයන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාස කාණ්ඩයේ දෙවන කොටස වූ කන්ද උඩරට රාජධානි සමය අලලා ලියූ ලිපි පිළියෙල කල අවස්ථාවේ දී මෙම **අස්ගිරි තල්පත** කිසිසේත් භාවිතයට නොගැනීම විශේෂ සිද්ධියක් ලෙස සැලකිය යුතුය. එබැවින් පිළිගත් ඉතිහාසඥයන්ගේ නොපිළිගැනීමට හේතුවූ අස්ගිරි තල්පත ගැන විවරණයක් කරමින් මැන්දිස් රෝහණධීරයන් **අස්ගිරියේ තල්පතින් අළුත් වන ලංකා ඉතිහාසය** නමින් තවත් කෘතියක් ලිවීම ඔහු කළ වරදක් සේ මට කල්පනා වේ. අස්ගිරියේ තල්පතේ ඇති කරුණු මෙම ලිපිය ලියන ලේඛකයා මෙන් ම එම අවධිය ගැන ශාස්ත්‍රීය ලිපි සම්පාදනයෙහි යෙදුනු සී.ආර්. ද සිල්වා, ටිකිරි අබේසිංහ, කේ.ඩබ්ලිව්. ගුණවර්ධන, ලෝනා දේවාරාජා, ජී.පී.වී. සෝමරත්න වැනි මහාචාර්යවරුන් පවා අතහැර දමා ඇත. ලංකා ඉතිහාසයේ දෙවන කාණ්ඩයේ මහනුවර රාජධානිය ආරම්භය ගැන ලියන ටිකිරි අබේසිංහ මහතා මහනුවර රාජධානිය ආරම්භ කළ සේනා සම්මත වික්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය ගැන තොරතුරු දක්වමින් අස්ගිරි තල්පතේ එන කරුණු මහභේදයට මෙන් ම සැකයට ද හේතුවී ඇති අතර එහි විශ්වාසනීයත්වය හා සත්‍යතාව ගැනද සැක පහල කර තම ලිපියට මූලාශ්‍රයක් වශයෙන් එය යොදා නොගන්නා බව සඳහන් කරයි.[2] උඩරට රාජධානිය නමින් අබයසිංහ, දේවරාජා හා සෝමරත්න යන තිදෙනා ලියූ ග්‍රන්ථයක **අස්ගිරි තල්පත** පිළිබඳ මෙසේ සඳහන් වේ.

"මේ අස්ගිරියේ තල්පත එම ග්‍රන්ථයේ ම ඇති සාධක අනුව රචනා වී ඇත්තේ 18 වන ශතවර්ෂයේ අග භාගයේ ය. එහි පරමාර්ථය වී ඇත්තේ අස්ගිරි විහාරය උඩරට වැදගත් ආගමික මධ්‍යස්ථානයක් වූ පසු එහි ආචාරීන්ගේ අතීත පරම්පරාව දක්වා ඒ මගින් ඓතිහාසික වැදගත්කමක් පෙන්නුම් කිරීම ය. මේ ග්‍රන්ථයේ දක්වන කරුණු රැසක් පහළොස්වන හා දහසයවන ශතවර්ෂවල රචිත සමකාලීන ග්‍රන්ථවලින් ලැබෙන කරුණු වලට

පරස්පර විරෝධීය.[3]

මෙසේ සඳහන් කොට ඒ සඳහා නිදර්ශන දෙමින් ග්‍රන්ථයේ ඉදිරි පිටුවල එය සාකච්ඡාවට භාජනය කොට තිබේ. වර්තමාන අස්ගිරි විහාරය හා සෙංකඩගල පුර උපත පිළිබඳව ලිපි ලේඛන සපයන සමහරුන් වැරදි තොරතුරු මත පිහිටා ඉතිහාස ලිපි ලිවීම නිසා ඉතිහාසය ඉගෙන ගන්නවුනට විශාල හානියක් සිදුවී ඇත. අස්ගිරි තල්පත අනුව අස්ගිරි විහාරය හා අස්ගිරි පරපුරේ ආරම්භය සිදුවී ඇත්තේ වර්ෂ 1312 දීය. ආරම්භ කළේ යාපහුවෙන් පැමිණි පළාබත්ගල පෙළපතේ භික්ෂූන් විසිනි. තවත් ලෙසකින් කියතොත් දිඹුලාගල භික්ෂු පරම්පරාව යි.

සෙංකඩගල නුවර ආරම්භ වී ඇත්තේ ද එවක හතරවැනි පරාක්‍රමබාහු රජුගේ සේනාධිකාරී කෙනෙකු අතිනි. අභිනවයෙන් කරවූ මෙම නගරය ආශ්‍රිතව ආරණ්‍ය සේනාසනයක් ද සාදවා පළාබත්ගලින් ඒ සඳහා භික්ෂූන් ගෙන්වා ගැනීම අස්ගිරි විහාරය ආරම්භ කළ බව කියැවේ. මේ අනුව අස්ගිරි විහාරයේත් සෙංකඩගල පුරයේත් උපත සිදුවී ඇත්තේ එක්වර ය.[5] මේ පිළිබඳ විවිධ මත කෙතරම් ඇතත් අස්ගිරි පාර්ශ්විකයෝ අස්ගිරි තල්පත ම පිළිගනිති. ඒ ගැන පුදුම නොවෙමු.

කන්ද උඩරට රාජධානිය ආරම්භ වූයේ 1592/3 දීය. එනම් පෘතුගීසීන්ගේ ද අනුග්‍රහය ඇතිව කන්ද උඩරට රාජ්‍ය බලය ලැබූ යමසිංහ බණ්ඩාරගේ මරණින් පසු කොනප්පු බණ්ඩාර හෙවත් විජේසුන්දර බණ්ඩාර නමින් ප්‍රසිද්ධව සිටි සෙන්පතියෙකු පළමුවන විමලධර්මසූරිය නමින් මහනුවර රජවූ පසුව ය. ඔහු උඩරට ප්‍රාදේශීය නායකයෙකුගේ පුතෙක් වූවා විය හැකි නමුදු උඩරට කිරුළ දැරීමට තරම් ඔහුට රාජ්‍ය උරුමයක් නොවීය. පෘතුගීසින් හා සටන් කොට උඩරට බලය අල්ලා ගත් ඔහු 1580 දී සීතාවක රාජසිංහ විසින් උඩරට සිහසුනෙන් නෙරපා හරින ලද කරල්ලියද්දේ බණ්ඩාරගේ දියණියක් වූ කුසුමාසන දේවිය හෙවත් දෝන කතිරිනා ආවාහ කරගැනීමෙන් තම රාජ්‍ය බලය තහවුරු කරගත්තේය. ඉන්පසු සිද්ධිය අස්ගිරි තල්පතේ දැක්වෙන්නේ මේ අයුරිනි.

"බුද්ධ වර්ෂයෙන් දෙදහස් එකසිය සතිස් වැන්නෙහි දී (1594 දී) දෙල්ගමු විහාරයෙන් දළදා සිතුමිණි රුවන වැඩමවා දෙමහල් මාළිගාවක් කරවා එහි වඩා හිඳුවා පූජෝපහාර පවත්වමින් සෙංකඩගල නුවර ශ්‍රී ලංකාද්වීපයෙහි අග්‍ර රාජධානිය කළාහ"[6] යනුවෙනි.

මේ තොරතුරු **මහාවංසයෙ** දැක්වෙන්නේ මෙපරිද්දෙනි. "(විමලධර්මසූරිය) නරශ්‍රේෂ්ඨ තෙමේ "සර්වඥා දංෂ්ට්‍රා ධාතු තොමෝ කොතැනකදැ"යි විචාරණය කොට "දෙල්ගමු වෙහෙර" යයි අසා අතිශයින් ප්‍රසන්න සිත් ඇත්තේ සබරගමු රට දෙල්ගමුවෙහි වඩන ලද දන්තධාතුව වඩා ගෙන්වා ගෙන තමන්ගේ යහපත් වූ පුරයෙහි දවසක් දවසක් පාසා වඳිනට ද වත් පිළිවෙත් කරන්නට ද ඒ පණ්ඩිත වූ රජතෙම රජ ගේ සමීපයෙහි යහපත් උතුම්ම වූ භූමි භාගයෙක් හා සිත්කළු වූ දෙමහල් සෑ ගෙයක් කරවා එහි දළදාව තබා නිරන්තරාදර ඇත්තේ පූජා කළේය."[7] (**මහාවංසය**, 94 පරි. 11 - 14 ගාථා)

මේ අනුව අස්ගිරි තල්පතට පදනම් වී ඇත්තේ මහාවංස පුවත ම බව පෙනේ. කෙසේ වුව ද දළදා සමිඳු දෙල්ගමුවේ සිට මහනුවරට වැඩම වීම සම්බන්ධයෙන් අස්ගිරි පාර්ශවයේ හිමිවරුන්ගේ ඉතිහාස පුවත් වෙනස්ව වාර්තා වන බවක් පෙනේ. දළදා හිමි දෙල්ගමුවේ සිට මහනුවරට වැඩම කළ සැටි පෙන්වන ඉහත සඳහන් ඉතිහාස ප්‍රවෘත්ති දෙක විකෘති කරමින් අස්ගිරි මහාවිහාර ඉතිහාසය නමින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 1976 දී පළකර ඇති ග්‍රන්ථයේ මෙසේ සඳහන් වේ.

"...එතෙක් දෙල්ගමු වෙහෙර සුරක්ෂිතව වැඩ සිටි දළදා වහන්සේ සෙංකඩගල නුවරට වැඩමවා ගෙඩිගේ විහාරයේ වඩා හිඳුවා පසුව රජ මාළිගය අසල තැනවූ දෙමහල් දළදා මන්දිරයෙහි තැන්පත් කොට (ඉහත කී) මංගල මහතෙරුන් වහන්සේ දළදා තේවාව සඳහා යෙදවීය."

මෙම උද්ධෘතය මහාවංසයෙ 94 පරිච්ඡේදයෙන් උපුටාගත් බවත්[8] (32 වන

පා සටහන) එහිම දක්වා ඇත.[9] සත්‍ය වශයෙන් ම ගෙඩිගේ විහාරය පිළිබඳව හෝ තේවාව සිදුකළ මංගල හිමියන් පිළිබඳව හෝ තොරතුරක් **මහාවංසයෙ** නැත. මෙවැනි අලුත් තොරතුරු සාධක විරහිතව ලේඛනවලට ඇතුළත් කිරීමෙන් සිදුවන්නේ බරපතල හානියකි. දළදා වහන්සේ මහනුවරට වැඩම වීමත් මහනුවර ඇසළ පෙරහැරේ අවසන් දින රාත්‍රියේ දළදා කරඬුව අස්ගිරියේ ගෙඩිගේ විහාරයේ තැන්පත් කිරීම සම්බන්ධයෙනුත් විකෘති පුවත් මින් පසුව නොයෙක් ලිපිලේඛන වලට ඇතුළත් වූවා පමණක් නොව ගුවන්විදුලිය රූපවාහිනිය ඔස්සේ ද ප්‍රචාරය වන බවත් සඳහන් කළ යුතුය. අස්ගිරි විහාරයේ විසූ වාරියපොල සුමංගල හිමියන් ගැන ලියන තුඹුල්ලේ සීලක්ඛන්ධ නාහිමියෝ ද ගෙඩිගේ විහාරය ගැන සඳහන් කරමින් මෙසේ ලියා ඇත්තා හ.

"(විමලධර්මසූරිය) රජතුමා සෙංකඩගල නුවර පිහිටි තම රාජ මාළිගාවට ආසන්නයෙහි දෙමහල් විසිතුරු දළදා මන්දිරයක් ඉදිකරවීය. පසුව රජතුමා අස්ගිරි විහාරයේ වැඩ සිට සතුරු භය පැමිණි කල්හි මුල්කිරිගලට පැන ගොස් සිටි ඇල්ලේපොල මංගල තෙරුන් වහන්සේ ප්‍රධාන භික්ෂූන් වහන්සේලා පස්නමක් පිටත් කොට යවා දෙල්ගමු වෙහෙරෙන් උඩව පාර ඔස්සේ දළදා වහන්සේ සෙංකඩගල පුරයට මහ පෙරහරින් වැඩම කරවනු ලැබූහ. මේ අවස්ථාවේ දී තම රාජ පරම්පරාව සිහි කරගත් රජතුමා (උපුටා දක්වා ඇත්තේ **මහාවංසයෙ** 92 පරි. 11 - 14 ගාථාය) එම රාජ වංශයට ගෞරවයක් ලෙස සලකා ගම්පොල තෙවැනි වික්‍රමබාහු රජතුමා විසින් තම මෑණියන් වූ චන්ද්‍රාවතී දේවිය සිහිකිරීම සඳහා කරන ලද චන්ද්‍රාවතී විහාරයට දළදා වහන්සේ වැඩම කරවා එහිදී (චන්ද්‍රාවතී විහාරය හෙවත් ගෙඩිගේ විහාරය) එදින රාත්‍රී මංගල තෙරුන් ලවා පළමුවෙන් ම දළදා තේවාව රජවාසල නාමයෙන් පවත්වා ඇත. පසුදින ආහාර හා දැහැත් ආදිය ද රජ වාසල නාමයෙන් ම පූජා කරවන ලදී. මෙදින සවස අමාත්‍යවරුන් පිරිවරා ගත් රජතුමා මෙම විහාරයට පැමිණ දළදා වහන්සේට පුද සිරිත් පවත්වා අනාගතයේ බිහිවන රජවරුන් විසින් ද වර්ෂයක් පාසා මේ ආකාරයෙන් දළදා වහන්සේ මෙම ගෙඩිගේ විහාරයට වැඩම කරවා පුද සිරිත් පැවැත්විය යුතු යයි ව්‍යවස්ථා පැනවීය. අනතුරුව දළදා වහන්සේ අභිනව දළදා මන්දිරයට

වැඩමවා එහි තැන්පත් කළේය."[10]

මෙම උද්ධෘත දෙකට පිළිවෙලින් 11 හා 12 වශයෙන් පා සටහන් අංක යොදා මූලාශ්‍රය වශයෙන් 11 වැන්නට **මහාවංසයේ** 92 පරි, 11 - 14 හා 12 වැන්නට **ස්‍යාමොපසම්පදාවත** ප්‍රඥාතිෂ්‍ය සං.24 පිටුව හා **මහාවංස** 92 පරි. 1 ගාථාව දක්වා ඇත.

එහෙත් පුදුමය **මහාවංසයෙ** හෝ **ස්‍යාමෝපසම්පදාවතේ** එවැනි කිසිවක් දක්නට නොමැතිවීම ය. එකොළොස් (11) වන උද්ධෘතයට ගැළපෙන පාඨය අප විසින් මහාවංසයෙන් උපුටා ඉහත දක්වා ඇත. එහි මංගල හිමියන් ගැනවත් දළදා වහන්සේ සෙංකඩගල පුරට වැඩම වූ ආකාරය ගැනවත් සඳහන් නොවේ. එසේම දොළොස්වන උද්ධෘතය යටතේ දක්වා ඇති **ස්‍යාමොපසම්පදාවතේ** පවා එවැන්නක් නැත. **ස්‍යාමොපසම්පදාවතින්** කරුණු දක්වමු. එහි මෙසේ දැක්වේ.

"මහාවංශයෙහි කී ක්‍රමයෙන්" අප බුදුන් වහන්සේගේ දළදා සමිඳුන් දැන් කොතැන්හි දැයි විමසා "දෙල්ගමු විහාරයෙහි වඩා පවත්නා සේකැ" යි යනු අසා අතිප්‍රසන්න වූ රජතුමාණෝ මහා දළදා සාමින් එයින් වඩාගෙන සිය නුවරට ම එන ලෙස රාජාමාත්‍යාදී මහා පිරිස් යවමින් සපරග්‍රාමයෙහි දෙල්ගමුවේ සුරක්ෂිත ව තිබූ ශ්‍රී දන්තධාතුන් වහන්සේ ඌව පාරෙන් වඩා ගෙනෙමින් එපවත් පින්වත් මහ රජාණන්ට දන්වා එවූ කල්හි ඒ වචන ශ්‍රවණයෙන් චක්‍රරත්න ප්‍රතිලාභයෙන් සන්තුෂ්ට සක්විති රජක්හුගේ මහත් උදාරතර සන්තෝසයෙන් සියලඟ ලොමු දැහැගෙන ඇසූ ක්ෂණයෙහි ම අනිකක් සලකා ගත නොහී ප්‍රීතිමත්ව එකනින් සළුව දරාගත්සේ සීඝ්‍රව පෙරමඟට දිවගොස් පැමිණ දර්ශන ප්‍රතිලාභයෙන් අතිශයෙන් සතුටුව සාදරව වැඳ පුදා පෙම්බරින් පින පිනා වඩා ගෙනවුත් තමන් වසන රජගෙට නුදුරු වූ රම්‍ය භූමි භාගයෙහි දෙමහල් ප්‍රාසාදයක් කරවා විසිතුරු මහාර්ඝ විතානාස්තරණ ජවනිකාදීන් විචිත්‍ර කොට සරහා මාහැඟි බුඩාසනයක් පනවා දළදා සාමීන් එහි වඩා පෙර සිරිත් ලෙස නොයෙක් දළදා

පූජාව්‍යවස්ථා කොට පැවැත්වීමෙන් ... දෙමහල් කොට කෙරෙවූ දළදා මන්දිරයාගේ අභිමුඛයෙහි විසිතුරු තුන්මහල් ප්‍රාසාදය කරවා දළදා සාමීන් නැවත එහි වඩා බොහෝ පුද පවත්වා ....." (**සඟාමොපසම්පදාවත**, 23 - 24 පිටු)

**මහාවංසයෙ** අදාළ කොටස සම්පාදනය කරන ලද්දේ **සඟාමොපසම්පදාවත** ලියන ලද්දේත් එකම කර්තෘ වූ උපොෂිත පුස්පාරාම විහාරයේ ප්‍රථම මහානායක හිමියන් ලෙස වැඩ විසූ තිබ්බටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ෂිත හිමියන් විසින් නිසා මේ මූළාශ්‍ර දෙකෙහි වෙනසක් තිබිය නොහැක. එහෙත් අස්ගිරි විහාරයට දළඳා හිමියන් සම්බන්ධයෙන් වැඩි ප්‍රමුඛතාවක් අවශ්‍ය බැවින් මෙසේ මුල් පාඨ තමන්ට රිසි සේ වෙනස් කර ඇති බවක් පෙනී යයි. අස්ගිරි මහා විහාරය සම්බන්ධව ලිපියක් සපයන එම මහා විහාරයේ ලේඛකාධිකාරීව සිටි පූජ්‍ය පලිපාන සිරිනිවාස හිමියෝ මේ කාරණාව සම්බන්ධයෙන් කරුණු දක්වමින්,

"සුරක්ෂිතව දෙල්ගමු වෙහෙර වැඩ සිටි දළදා වහන්සේ සෙංකඩගල පුරයට වැඩමවා තාවකාලිකව අස්ගිරි විහාරස්ථ ගෙඩිගේ විහාරයේ තැන්පත් කොට තබා දළදා මන්දිරය ඉදිකළ පසු එහි වඩා හිඳුවූයේ ය. එතුමා දළඳා තේවා ධූරය පැවරුවේ අස්ගිරි විහාරයේ ඇල්ලේපොල මංගල මහ තෙරුන්ටය"[12] යයි සඳහන් කරති.

අස්ගිරි පාර්ශ්වයේ භික්ෂූන් වහන්සේලා ස්වකීය මහා විහාරය ගැනත් දළදා හිමියන් ගැනත් මෙසේ උදන් අනද්දී මල්වතු මහා විහාර පරපුර මේ කරුණ ගැන නිහඬව සිටියි.

"මහනුවර සමයෙහි ඉංග්‍රීසි පාලන අවධිය වන විට දළදා වහන්සේට භාරකාරීත්වයට පැවරී තිබුණේ අස්ගිරි මහා විහාරීය භික්ෂූන් වහන්සේට ය" යි තුඹුල්ලේ සීලක්ඛන්ධ හිමියන් පවසතත්[13] සත්‍යය එය නොවන බව ද පැහැදිලි ය. ඩොයිලිගේ වාර්තා අනුව මේ කාලයේ දී දළදාවේ භාරකාරත්වය මල්වතු

විහාරයේ අතිගරු මහානායකව වැඩ සිටි කොබ්බෑකඩුවේ හිමියන් සතු වූ බව පෙනේ. දළදා වහන්සේ සඟවා තිබූ පුසුල්පිටිය රජමහා විහාරයේ සිට එය මහනුවරට වැඩම කළ පෙරහැරේ මූලිකත්වය ගෙන උන්වහන්සේ ක්‍රියාකිරීමෙන් ම ඒ බව හෙළි වේ.[14]

දළදා සමිඳු සෙංකඩගල පුරට වැඩමවීම සම්බන්ධයෙන් වැඩි විස්තර ඓතිහාසික මූලාශ්‍රවල දක්නට නොලැබේ. දෙල්ගමුවේ සිට මහනුවර රජ මාළිගය අසල ඉදිකළ දෙමහල් මන්දිරයට දළදා සමිඳු, පළමුවන විමලධර්මසූරිය රජතුමන් විසින් වැඩම කළ බව පමණක් **මහාවංසයේ** දැක්වේ. බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ තිබී සොයා ගත් **දළදා පුවත** නම් වූ කවි 460 කින් සමන්විත ග්‍රන්ථයක් කැලණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය විමල් විජේරත්න මහතා විසින් සංස්කරණය කොට ප්‍රකාශයට පත්කොට තිබේ. පළමුවන විමලධර්මසූරිය රජුගේ කාලය දක්වා දළදා වහන්සේගේ ඉතිහාස කථාව ඇතුළත් මෙම කාව්‍ය ග්‍රන්ථය මහනුවර සමයේ ආරම්භක අවධිය පිළිබඳවත් දළදා වහන්සේ සෙංකඩගලපුරයට වැඩමවීම පිළිබඳවත් කරුණු වඩාත් විශ්වාසනීයත්වයෙන් ඉදිරිපත් කරයි.[15] එයට හේතුව මෙම ග්‍රන්ථය සම්පාදනය වී ඇත්තේ ක්‍රි.ව. 1693 දී හෙවත් විමලධර්මසූරියගේ රාජපදප්‍රාප්තියෙන් පුරා වසර සියයකට පසුව වීම යි. මෙම මූලාශ්‍රය **මහාවංසය** හා **ස්‍යාමෝපසම්පදාවත** නම් වූ මූලාශ්‍ර දෙකට ම වඩා අවුරුදු එකසිය පනහකින් (150 න්) පැරණි ය. මෙම මූලාශ්‍රය අනුව දෙල්ගමු විහාරයේ දළදා සමිඳු වැඩ වෙසෙන බවට විමලධර්මසූරිය රජු වෙත සැලකර සිටියේ ගලඋඩ මහතෙරුන් විසින් බවත් එම හිමියන් විසින් දළදාව මහනුවරට වැඩම කරන මාර්ගය කලින් විස්තර කළ බවත් ඒ අනුව ඌව හරහා සතර කෝරළය මැදින් බලන මාර්ගය ඔස්සේ ඉදල්ගස් කන්ද පසුකර දළදා සමිඳු මහනුවර අම්පිටියට වැඩමවා පසුව සඳ දක්නා ගෙයි තාවකාලිකව වඩා හිඳුවා ඉන් ඉක්බිතව දෙමහල් දළදා මැඳුරෙහි තැන්පත් කළ බවත් හෙළි වේ. අස්ගිරි විහාර පාර්ශ්වයේ භික්ෂූන් වහන්සේ කරුණු පටලවාගෙන සඳහන් කරන මංගල හිමියන් වූ කලී ගලඋඩ හිමියන් විය හැකි බවත් දළදාව තාවකාලිකව තැන්පත් කළ බව කියන චන්ද්‍රාවතී විහාරය හෙවත් ගෙඩිගේ

විහාරය සඳ දක්නා ගෙය බවත් සැලකිය හැක. පළමුවන විමලධර්මසූරිය රජුගේ එක් බිසවකු වූ සඳවතී දේවිය ගැන **සෙල්ලාවලී තඹ සන්නස** සඳහන් කරයි.[16] මේ සඳහන් කරන්නේ එකම තැනැත්තිය ගැනද යන්න තවදුරටත් සලකා බැලිය යුතු ය. මෙහි දී ගෙය යන වචනය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ඌව පාර ඔස්සේ දළදා හිමි වැඩමවා ගෙන ආ බව කීමත් අතීතයේ පැවති සත්‍ය පුවතක් කල් යාමේ දී වෙනස් වී ජනතාව අතට පත් වී ඇති අයුරු කියාපායි. ජනකතා පැතිර යාමේ දී කේන්ද්‍රීය සිද්ධිය වටා මෙසේ වෙනස්කම් ඇතිව විස්තර ගොනුවීම හා සමාන සිද්ධීන් එක්වීම හා මිශ්‍රවීම ලක්ෂණයකි. ඉහත දැක්වූ දළදා පුවත නම් කාව්‍ය ග්‍රන්ථයේ දැක්වෙන කරුණුවලට බොහෝ සමාන වූ කරුණු කුඹුරුගමුවේ වජිර හිමියන්ගේ **දළදා ඉතිහාසය හා සංස්කෘතිය** නමැති ග්‍රන්ථයේ දැක්වේ. එය මෙසේය.

"දළදා වහන්සේ මහනුවරට වැඩමවීමේ දී ගලඋඩ නම් තෙරුන් වහන්සේ නමක ගේ සහාය විමලධර්මසූරිය රජුට ලැබුණේ යයි කියනු ලැබේ. උන්වහන්සේ හිරිපිටියේ නිලමෙතුමන් ප්‍රමුඛ කිහිප දෙනෙකුගේ සහාය ඇතිව දළදා වහන්සේ සීතාවක සිට අම්පිටියට වැඩමවා ගෙනවුත් රජුට දැනුම් දුන්හ. ඉක්බිති රජතුමා එහි ගොස් පුද සත්කාර පවත්වා මහනුවරට වැඩමවා ගෙනවුත් රජමාළිගය ආසන්නයෙහි තැනවූ දෙමහල් දළදාගෙයි වඩා හිඳුවිය.

මහනුවරට දළදා සමිඳු වැඩමවීමේ කතාව දළදා පුවත කාව්‍ය ග්‍රන්ථයේ සඳහන් වන්නේ කෙසේ දැයි දැන් විමසා බලමු. අපගේ සාකච්ඡාවට භාජනය වන අදාළ කාව්‍යයන් මෙසේ ය.

**දෙල්ගමුවෙන් මහනුවරට වැඩමවීම**

| | |
|---|---|
| හිරිපිටියෙහි පසි | දූ |
| දියවඩන ඒ මැති ස | ඳූ |
| දෙල්ගොමු වෙහෙරිනු | දූ |
| වැඩමවා ගෙන දන්ත දා ස | ඳූ |

නික්මී එහි නොසි ට
යෙහෙන් සපැමිණ උෟව ට
නොවී කිසි දුකක ට
එන සඳෙහි නෙක තොසින් මෙලෙස ට

**(436 - 437)**

## අම්පිටියට වැඩමවීම හා මහනුවරට වැඩමවීම

හිමි සඳ යුතු තෙදින න
සිරි දන්ත දා සතොසින න
ඉදල්ගස් කන්දෙන න
වැඩමවා ගෙනඑ නුය මෙලෙසින න

**(339)**

එබස් අසා නිසි හඬ ගැන තොක්කම් කර වදාළ තැ න
වෙසස් සිනිදු තොප්පි සළුව ගිලිහී දෙරණතෙහි වටු න
සතොස් වඩන සක්විති රජ සිරිසැප ලත් විලසි න
නොලස්ව මහ සෙන් සමගින් අම්පිටියට වැඩ සතොසි න

(340)

එබස තමන් සිය මුදුනෙහි දරා ඇමති නික්ම එදින
සතොස එ දළදා හිමි වැඩමවනා පෙර මඟට ගොසින
වෙසෙස නොයෙක් කුඩ කොඩි නංවා පසතුරු ගොස හඬ ගෙන
මෙලෙස පසිඳු දළදා හිමි අම්පිටියට වඩා රැගෙන

(443)

වික්‍රම යුතු විමල දහම් නරනිඳු අසමින් එවද න
චක්‍ර රත්නයක් ලැබ ගත් සක්විති රජු මෙන් සතොසි න
ශක්‍ර පුරය මෙන් සරසා සෙන්කඩගල් පුර හැම තැ න
ශක්‍ර දෙවිඳු සෙ නික්මුණි දළදා හිමි වඩා රැගෙ න

(444)

පිරිස එ මහසෙන් සමගිව පසතුරු ගොස කර නොලසි න
අහස වසා කුඩ කොඩියෙන් ජය සක් නද කර සොතොසි න
වෙසෙස සඳුන් පිරි බඩලා අනගි වතින් සරා සොබ න
මෙලෙස මඟුල් පෙරහැරෙන් සඳ දක්නා ගෙට වඩිම් න

(445)

නිරිඳු සමඟ මැති ගණ සහ මහසෙන් රැස් වී සිට ගෙ න
පසිඳු මහත් දැව පේ කඩ සුසදා සුසිරෙන් බබළ න
මෙබඳු ලෙසට කරවා තුන් මහල් පැය රිසි සසොබ න
සුරිඳු විමන ලෙසට එරන් උළු සොයනා කැලුම් දිලෙ න

(447)

විපුල රුවින් නෙක විසිතුරු අස්නක් එහි සරා සොබ න
සකල සතන් රැස් කරවා නෙක පුදවත් සදා නිති න
එකල පසන් නෙක පසතුරු ගොස කර ජය සක් නදයෙ න
උදුල සිරින් දළදා හිමි එ අසුන් වඩා යෙහෙ න

(449)

දහන අගය මිණි මුතු බැඳි මහත් පදක්කම සමගි න
නිදොස අනගි වත් බරණ ද පැළඳි තමන් තොස වඩව න
සතොස වඩන ගම්බිම් සහ දැසි දස් ගව මහිස සොබ න
මෙලෙස එ නරනිඳු පුද කළ නොපමණ බැති සිතින් පෙම් න

(450)

දළදා සමිඳුන් හමුවේ අද දින සිදු කෙරෙන පුදපූජා වත් පිළිවෙත් ගැන සලකන කල ආදාහන මළුවක ඉදි වූ විහාරයකට දළදා සමිඳු වැඩම වනවා යි කිසිසේත් සිතිය නොහැක. "කිල්ල" ගැන සලකන දළදා තේවාවෙහි නිරත භික්ෂූන් මරණයකට පවා සහභාගී නොවන කල දළදා සමිඳුන් මළමිනී ආදාහනය කරන භූමියකට ගෙනේ දැයි ප්‍රශ්න කළ හැක. එබැවින් චන්ද්‍රාවතී විහාරය හෙවත් අස්ගිරියේ ගෙඩිගේ විහාරයට දළදා වහන්සේ පළමුවෙන් ම

වැඩම කළහයි යන කාරණය කරුණු දෙකක් නිසා පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. එනම් පළමුව අම්පිටියට වැඩම කිරීමේ හේතුව නිසා ය. මහනුවර පසුකර අම්පිටියට ගොස් දළදාව තැන්පත් කරන්නට ඇත්තේ අද දිනත් එහි ප්‍රසිද්ධ රජමහා විහාරයක් වූ දලුක්ගොල්ලේ පංසලේ විය යුතු ය. එය කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අවධියේත් ඉමහත් කීර්තියට පත්ව තිබූ විහාරයකි. දළදාව අම්පිටියේ සිට ඉන්පසු මහනුවරට ගෙන ආ බව කීමෙන් අදහස් වන්නේ මහනුවර පිහිටි චන්ද්‍රාවතී විහාරය හෙවත් ගෙඩිගේ විහාරයට එය වැඩම නොකළ වගයි. දෙවැන්න කිල්ල ගැන සලකන විට මළමිනී ආදාහනය කෙරෙන භූමියකට දළදා වහන්සේ වැඩම කරනවා ය යන අදහස ප්‍රතික්ෂේප කිරීමට සිදුවන නිසා ය.

මහනුවරට වැඩම වූ දළදා වහන්සේ සඳ දක්නා ගෙට වැඩම කිරීමෙන් අදහස් වන්නේ රාජ මන්දිරය අසල වූ දකින මණ්ඩපයට වැඩම කළ බවයි. සඳ යනු සරසන ලද අරුත ද ගනී. දකින මණ්ඩපය වූ කලී රජතුමන් බැහැ දැකීමට වෙන් වූ මන්දිරය යි. එය පිහිටියේ මඟුල් මඩුව අසල ය. එය චන්ද්‍ර මණ්ඩපය හෝ චන්ද්‍ර ශාලා වශයෙන් නම් වූවා ද විය හැක. එවිට එය සදැල්ල යන අරුත ගනී. චන්ද්‍ර මණ්ඩපයක් ගැන නරේන්ද්‍රසිංහ ප්‍රශස්තිවල ද සඳහන් වේ. දකින මණ්ඩපය හා ශාන්ති මණ්ඩපය යනුවෙන් රජ වාසල මණ්ඩප දෙකක් වූ බවට ද සාක්ෂි ඇත. එබැවින් දෙමහල් දළදා ගෘහය සාදා නිමවන තෙක් දළදා වහන්සේ රාජ මාළිගයට අයත් සරසන ලද දකින මණ්ඩපයේ වඩා හිඳුවන්නට ඇතැයි යන මතය පිළිගැනීමට සිදුවේ. ඉන් අනතුරුව ඒ අසල ම ඉදි වූ දළදා මැදුරෙහි අවසාන වශයෙන් දළදා සමිඳු තැන්පත් විය. දෙල්ගමුවේ සිට දළදා සමිඳු මහනුවරට වැඩමවීමේ පුවත ඉහත කී ප්‍රකාර සිදුවූවා යයි විස්තර කළ හැකි අතර ඇසළ පෙරහැරේ අවසන් දින කරඬුව අස්ගිරියට වැඩමවන චාරිත්‍රය කීර්ති ශ්‍රී රාජසිංහ අවධියේ ආරම්භ වූ නමුදු එම විහාර භූමිය තවදුරටත් ආදාහන මළුවක් වශයෙන් එකල ප්‍රයෝජනයට නොගෙන තිබූ බව ද කල්පනා කළ හැකි ය.

අවසාන වශයෙන් ඉහතින් ඉදිරිපත් වූ කරුණුවල සංක්ෂිප්තය මෙසේ ය. දළදා වහන්සේ රත්නපුර කුරුවිට දෙල්ගමුවේ සිට මහනුවරට වැඩම කළා වූ

ව්‍යවහාර වර්ෂ 1594 දී එය පළමුවෙන් ම අම්පිටියට වැඩමවා පසුව පළමුවන විමලධර්මසූරිය රජතුමන් විසින් දෙමහල් දළදා මන්දිරය ඉදිකරන තෙක් ස්වකීය රාජ මන්දිරයට සම්බන්ධ වූ චන්ද්‍රශාලාව නම් වූ දක්ෂිණ මණ්ඩපයේ තැන්පත් කර පසුව දළදා මන්දිරය ඉදි වූ පසු එහි තැන්පත් වූ බව සඳහන් කළ හැක.

දළදා සමිඳු මහනුවරට වැඩම කරවා පසුව තෙමහල් මන්දිරය තනා අවසන් වන තෙක් අස්ගිරියේ චන්ද්‍රාවතී හෙවත් අදාහන මළු විහාරයේ තැන්පත් කර තිබූ බවට ඉදිරිපත් කරන අදහස ඉතිහාස පුවත් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මහනුවර වැඩ වෙසෙන දළදා හිමියන් පිළිබඳ ඉතිහාස පුවත් විකෘති කොට ඉදිරිපත් කිරීමට සමහරුන් ගන්නා උත්සාහය ශාස්ත්‍ර උන්නතියට ඉමහත් බාධාවකි. එය හිතා මතා කරන්නේ නම් ශාස්ත්‍ර වංචාවකි.

දළදා සමිඳු මහනුවරට වැඩමවා පළමුවන විමලධර්මසූරිය රජු විසින් තැනවූ දෙමහල් දළදා ගෙහි එය තැන්පත් කළ නමුදු එම රජුගේ අභාවයෙන් පසු වර්ෂ 1604 දී රාජ පදවිප්‍රාප්ත සෙනරත් රජු සමයේ දී මහනුවරට එල්ල වූ පෘතුගීසි ආක්‍රමණ නිසා දළදා වහන්සේ මැදමහනුවරට වැඩමවා සඟවා තැබීමට සෙනරත් රජුට සිදුවිය. සෙනරත් රජුගේ මුළු රාජ්‍ය කාලය පුරා ම මෙකී සතුරු උවදුරු පැවතියෙන් ඔහු ජීවත් වූයේ මැදමහනුවර හා මහියංගනයේ ය. ඔහුගේ පුත් දෙවන රාජසිංහ සිහසුනට පත්වූයේ 1635 දීය. ඔහු දළදා වහන්සේ යළි මහනුවරට වැඩමවා පැරණි දළදා මාළිගය තිබූ තැනම නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකරවා දළදා වහන්සේ එහි වඩා හිඳුවිය. දෙවන රාජසිංහ රජුගෙන් පසු 1687 දී දෙවන විමලධර්මසූරිය රජතුමන් රාජ පදවිප්‍රාප්ත වූ පසු තුන්මහල් පහයක් ද කරවා රිදී විසිපන් දහසකින් යුත් කරඬුවක් ද කරවා එය රනින් ආලේප කොට නව රත්නයෙන්ද ඔබ්වා එම කරඬුවෙහි දළදා හිමි තැන්පත් කළ වග **චූලවංසය** සඳහන් කරයි.[17] ඔහුගේ පුත් ශ්‍රී නරේන්ද්‍රසිංහ රජු ක්‍රි.ව. 1707 දී රජකමට පත්විය. ඔහු 1739 දක්වා රජකම් කළ අතර එම කාලයේ දී දළදා සමිඳු වෙනුවෙන් බොහෝ පුණ්‍ය ක්‍රියා ද කර ඇත.

ඔහු දන්තධාතුන් වහන්සේ උදෙසා නානාවිධ විචිත්‍ර කර්මයෙන් හා මනහර ජාතක කතා ද චිත්‍රයට නගමින් දෙමහල දළදා ගෙයක් ඉදිකළේ පෙර තිබූ දළදා ගෙය ජරාජීර්ණ ව ගොස් ඇති සැටි දැකීමෙනි. වර්තමානයේ දක්නට ලැබෙන වැඩ සිටින දළදා මන්දිරය එය යි. නරේන්ද්‍රසිංහ රජුගෙන් පසු කන්ද උඩරට සිහසුනට පත්වූයේ විජය රාජසිංහ රජු යි. ඔහු දළදා හිමියන් වෙනුවෙන් පැවැත්වූ පූජා උත්සව ගැන **චූලවංශය**[18] සඳහන් කරයි. වර්ෂ 1749 දී රජකමට පත්වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු යි. ඔහු 1780 දක්වා රජකම් කළ අතර එම කාලයේ දී රජමහා විහාර ඉදිකරමින් බුද්ධ ශාසන කටයුතු සම්බන්ධයෙන් කළ මෙහෙය ඉතිහාසයේ මහ ඉහළින් වර්ණනා වෙයි.[19] මේ රජුගේ අවධියේ ඕලන්ද භට හමුදාවක් විසින් මහනුවරට එල්ල කරන ලද ප්‍රහාරයකින් මුළු දළදා මාළිගය ම විනාශ වී ගියේ ය. දළදා හිමි මැදමහනුවර කෙවුල්ගම විහාරයට වැඩමවා සඟවා තිබූ අන්දම ගැන මෑතක දී කරුණු හෙළිදරව් කර ගැනීමට අපට හැකිවී තිබේ. වර්ෂ දහයක් පමණ ගෙවා දළදා මාළිගය යළි ප්‍රතිසංස්කරණය කොට 1770 දී දළදා හිමි යළි මහනුවරට වැඩමවා එහි තැන්පත් කළ අන්දම ගැන එම තොරතුරුවලින් කරුණු අනාවරණය වේ. මේ සිද්ධිය වංශ කථාවේ සඳහන් නොවන්නේ එය රජුට සිදුවන මදිකමක් යයි සිතා විය යුතු ය. දළදාව කෙවුල්ගම සිට හඟුරන්කෙතට ද ගෙන ගිය බව කියැවේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසු 1780 දී රජකමට පත්වූයේ රාජධිරාජසිංහයි. ඔහු 1815 දක්වා කන්ද උඩරට රාජ්‍ය කළ නමුදු දළදා සමිඳු වෙනුවෙන් ඔහුගෙන් විශේෂ යමක් සිදුවූවා යයි වාර්තා කළ නොහැක. කෙසේ වුවද දළදා මැදුර පිහිටියේ රජවාසල භූමි භාගයේ ඇති ගොඩනැගිලිවලට මැදිව ය.[20]

රජතුමාගේ ආරක්ෂාව හා මල්වතු - අස්ගිරි උභය වාසයේ භික්ෂු සංඝයා වහන්සේගේ තේවා හා පුද පූජා මධ්‍යයේ දළදා වහන්සේ ගෞරව සම්මානයට භාජනය වූ අතර දළදා පෙරහැර මහනුවර සිවු දේවාලවලට එකතු වී වාර්ෂික ඇසල මංගල්‍යය ආරම්භ වූයේ ද 1753 දී සියම් උපසම්පදාව පිහිටුවීමත් සමඟ ය.

දළදා වහන්සේ පිළිබඳව ඊළඟට වැදගත් තොරතුරු හමුවන්නේ වර්ෂ 1815 මාර්තු මස 2 වන දා උඩරට ගිවිසුම මඟින් උඩරට රාජධානිය ඉංග්‍රීසින් අතට පත්වීමත් සමඟය. මේ වනවිට දළදා වහන්සේ දළදා මාළිගයින් බැහැරට ගෙන ගොස් සඟවා තබා තිබූ බව දැන සිටියේ එකල පෝයමලු (මල්වතු) මහා විහාරයේ මහානායක ධූරය දැරූ කොබ්බෑකඩුවේ නායක හිමිපාණන් පමණකි. උඩරට රාජධානිය උපක්‍රමශීලීව පවරා ගත් ඉංග්‍රීසිනට තම පාලන කටයුතු ගෙනයාමට ඉමහත් බාධකය වූයේ තමන් සතුව දළදා හිමි නොපැවතීම යි. උඩරට පළාත් පාලනය කළ ඩොයිලි විසින් පවත්වා ගෙන ගිය ඔහුගේ දිනපොතේ ඇති කරුණු අනුව පෙනී යන්නේ එවකට ඉංග්‍රීසි රජයට හිසරදයක් වූයේ, නැති වූ දළදා වහන්සේ සොයාගෙන එය දළදා මාළිගයට වැඩමවා තැන්පත් කොට කන්ද උඩරට ජනතාවගේ අනුමැතිය හා ආශිර්වාදය ඉංග්‍රීසි පාලනය සඳහා ලබා ගැනීමයි. දළදා වහන්සේ සඟවා තිබූ ස්ථානය පිළිබඳ කරුණු සොයා බැලූ ඉංග්‍රීසිනට ආරංචි වූයේ එය දුම්බර පිටිගොඩ සඟවා ඇති බව ය. මේ ආරංචිය ඔවුනට ලැබුණේ එවකට දියවඩන නිලමේ ධූරට ඉසිලූ කපුවත්තේගෙනු යි. පිටිගොඩට ගොස් දළදා වහන්සේ යළි මහනුවරට වැඩමවා ගැනීමට කටයුතු සම්පාදනය විය. එම කටයුත්ත මාර්තු 27 වැනිදාට නියම කර ගත් නමුදු අසුභ කටයුත්තක් හේතුවෙන් 1815 අප්‍රේල් මස 7 වැනිදාට නියම විය. දින ආසන්න වී ඒ පිළිබඳව ඩොයිලි විසින් කොබ්බෑකඩුවේ නායක හිමියන් සමඟ සංවිධාන කටයුතු පිළිබඳ සාකච්ඡාවක් ද පවත්වන ලදී. එම සාකච්ඡාව අනුව දුම්බරට ගොස් දළදා සමිඳු දෝලාවක වඩා හිඳුවා වඩම්මා ගෙන ඒමටත් කොබ්බෑකඩුවේ මාහිමියන් කුණ්ඩසාලයට ගොස් දළදා සමිඳු පිළිගෙන මල්වතු විහාරයට වැඩමවා පසුව පෙරහරින් දළදා මාළිගය වෙත ගෙන ඒමටත් තීරණය විය. අප්‍රේල් මස 7 වන දා ඩොයිලි විසින් තම දින පොතේ තබන ලද සටහන අනුව කොබ්බෑකඩුවේ නාහිමියන් දළදාව වැඩමවා ගෙන ඒම පිණිස කුණ්ඩසාලයට ගිය විට එහි දී හමු වූ භික්ෂුවකගෙන් දැන ගැනීමට ලැබී ඇත්තේ අපේක්ෂා කළ පරිදි දළදාව පිටිගොඩ නැති බව හා එය දැන් කොයි දැයි නොදන්නා බව ය. මැද මහනුවරට ගිය කපුවත්තේ හිස් අතින් පැමිණිය ද දළඳාව ගැන අලුත් ආරංචියක් ද ඔහු සතු විය. එනම් මීට දින 5කට හෝ 6 කට පෙර එය

කිතුල්පේට වැඩමවා ගෙන ගොස් ඇති බව ය. එහෙත් මේ කාරණය ගැන කොබ්බෑකඩුවේ නායක හිමියන් හා කපුවත්තේ දියවඩන නිළමේ යන දෙදෙනා නොදැන සිටියා විය නොහැකි යයි මොල්ලිගොඩ මහ අදිකාරම්තුමන් ද සැක කර ඇත.[21] දළඳා හිමි පිළිබඳ තොරතුරු ඕනෑකමින් ම ඉංග්‍රීසින්ගෙන් වසර කර තැබීමට දෙදෙනා උත්සාහ ගත් බව මේ කාරණාවලින් පැහැදිලි වේ.

පුසුල්පිටියේ සඟවා තිබූ දළදා වහන්සේ ඒ අනුව අප්‍රේල් මස 20 වැනිදා හිඳගල රජමහා විහාරයට වැඩම කරන බවට සාකච්ඡා වුව ද නායක හිමියන් හිඳගල විහාරයට දළඳාව වැඩම කළේ අප්‍රේල් මස 23 වැනිදා ය.[22] එදින හිඳගලට වැඩම වූ දළඳා වහන්සේ රාත්‍රියේ පෝය හේවිසි මාධ්‍යයේ එහි තැන්පත් කරවා ඇත. කොත්මලේ පුසුල්පිටියෙන් අටබාගෙට වැඩම කරවා එතැනින් හිඳගලට ගෙනෙන ලද්දේ අප්‍රේල් මස 22 වැනි දා බව ඩොයිලිගේ සටහන්වලින් පෙනේ.[23] අද එය කටුකැලේ අසළ සුදුහුම්පොල විහාරයට ගෙන යා යුතු යැයි කපුවත්තේ දියවඩන නිළමේ යෝජනා කළ නමුත් කොබ්බෑකඩුවේ නායක හිමියන් එය නුසුදුසු යැයි නිගමනය කළේ සුදුහුම්පොල පන්සල අස්ගිරි විහාරයට අයත් නිසා බව පැවසේ. වීදි පිරිසිදු කොට කටුකැලේ පෙදෙස පිරිසිදු කරන්නටත් උපදෙස් ලැබුණි.[24]

උඩරට කැරැල්ල සිදුවූ 1817/18 වර්ෂවලදී ද දළඳා වහන්සේගේ වැදගත්කම යළි ඉස්මතු වූයේ රාජ්‍ය සංකේතයක් වශයෙනි. උඩරට සිංහලයන් හා බ්‍රිතාන්‍ය රජය සමඟ ඇති වූ ගැටුම් අවස්ථාවේ ද අස්ගිරි මහා විහාරයේ වැඩ විසූ වාරියපොල සුමංගල හිමියන් දළඳාව දළඳා මාළිගයෙන් ඉවතට ගෙන ගොස් සිංහල කැරලි නායකයා අතට දඹුල්ලේ දී පත් කරන ලද්දේ ඒ මගින් රාජ්‍ය උරුමය හිමි කර ගැනීමට ඔහුට අවස්ථාව සලසමිනි. එහෙත් මෙම ප්‍රයත්නය ව්‍යර්ථ වූ බව නොරහසක් වූ අතර වාරියපොල හිමියන් ද ඒත් සමඟ ම බ්‍රිතාන්‍යයන්ගේ අත්අඩංගුවට පත්විණි.[25] මෙම සිද්ධිය ඉහතින් විස්තර කළ මල්වතු මහා විහාරයේ වැඩ විසූ කොබ්බෑකඩුවේ නායක හිමියන්ගේ ක්‍රියා කලාපය සමඟ සසඳා බලන විට පෙනී යන්නේ මල්වතු -

අස්ගිරි මහා විහාර ද්වයෙහි වැඩ විසූ ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ මාරුවෙන් මාරුවට දළදා ආරක්ෂාවෙහි හා වතාවත් සිදුකිරීම පිණිස කැපවී සිටි බව ය.

දළඳාව යළි සිය අතට පත් කරගත් ඉංග්‍රීසි පාලකයෝ එම පූජ්‍ය වස්තුව තවදුරටත් ආරක්ෂා කිරීමට යකඩ වැටක් යොදා ඉබි තහඩු දැමූහ. එය ඉවත් කොට වෙඩි නොවදින වීදුරුවක් සවිකර එම කුටියේ දළඳා හිමි තැන්පත් වූයේ පසුගිය හැත්තෑව දශකයේ දී ය. දළඳා වහන්සේගේ භාරකාරත්වය සම්බන්ධයෙන් ඉංග්‍රීසි රජය හා සිංහලයන් අතර තිබූ මතභේද උත්සන්න වූ අවස්ථාවේ දී බ්‍රිතාන්‍ය රජය විසින් මිදුනේ දළඳාව ආරක්ෂා කිරීමේ වගකීම 1853 දී මල්වතු - අස්ගිරි මහානායක හිමිවරුන් දෙදෙනාට හා දියවඩන නිළමේට ද භාර කිරීමෙනි.[26] කෙසේ වුව ද දළඳා හිමිගේ රාජ්‍ය බලය හීන වූයේ නැත. අද වුව ද රාජ්‍ය නායකයන් සිය වැඩ කටයුතු ආරම්භ කරන්නේ ද දළඳා හිමි වැඳ පුදා මල්වතු - අස්ගිරි උභය විහාරයේ මහානායක හිමිවරුන් බැහැ දැකීමෙන් අනතුරුව ය. දැන් මෙය සම්ප්‍රදායක් බවට පත් වී ඇත. දළඳාව කන්ද උඩරට වැඩ සිටීම වූ කලී උඩරට වැසියන්ගේ අභිමානයට හේතුවක් ව පවතින බව නම් සැබෑය.

ක්‍රි.ව. 1604 දී පළමුවන විමලධර්මසූරිය රජුගේ අභාවය සිද්ධවිය. එදා පටන් වර්ෂ 1815 දී මහනුවර අවසන් රජු බ්‍රිතාන්‍යයන්ගේ ග්‍රහණයට හසුවන තෙක් මහනුවර රාජධානිය අනුක්‍රමික රජුන් හත් දෙනෙකු විසින් පාලනය විය. කන්ද උඩරට මහනුවර සිට රාජ්‍ය පාලනයෙහි යෙදුණා වූ රාජ පරම්පරාව ඔවුන්ගේ රාජ්‍ය පරිපාලන වකවානුව ද සමඟ මෙසේ නම් කළ හැක.

| | |
|---|---|
| 1. සේනාසම්මත වික්‍රමබාහු | ක්‍රි.ව. 1469 - 1511 |
| 2. ජයවීර | ක්‍රි.ව. 1511 - 1551 |
| 3. කරල්ලියද්දේ බණ්ඩාර | ක්‍රි.ව. 1551 - 1581 |
| 4. පළමුවන රාජසිංහ (සීතාවක සිටි) | ක්‍රි.ව. 1581 - 1591 |
| 5. පළමුවන විමලධර්මසූරිය | ක්‍රි.ව. 1592 - 1604 |
| 6. සෙනරත් | ක්‍රි.ව. 1604 - 1635 |

| | |
|---|---|
| 7. දෙවන රාජසිංහ | ක්‍රි.ව. 1635 - 1687 |
| 8. දෙවන විමලධර්මසූරිය | ක්‍රි.ව. 1687 - 1707 |
| 9. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ | ක්‍රි.ව. 1707 - 1739 |
| 10. ශ්‍රී විජයරාජසිංහ | ක්‍රි.ව. 1739 - 1747 |
| 11. කීර්ති ශ්‍රී රාජසිංහ | ක්‍රි.ව. 1747 - 1781 |
| 12. රාජාධිරාජසිංහ | ක්‍රි.ව. 1781 - 1798 |
| 13. ශ්‍රී වික්‍රම රාජසිංහ | ක්‍රි.ව. 1798 - 1815 |

ජයවීර පටන් දෙවන රාජසිංහ රජුගේ කාලය දක්වා වූ සියවසක් පමණ කාලය තුළ පෘතුගීසි ආක්‍රමණ වලට ගොදුරු වූ කන්ද උඩරට රාජධානිය ඉන් අනතුරුව ගොදුරු වූයේ ලන්දේසි ආක්‍රමණවලට ය. ඉන් අනතුරුව ගෙවුණු එකසිය පණහක පමණ කාලය තුළ ලන්දේසි ආක්‍රමණ නිසා විපතට පත් මෙම අවාසනාවන්ත උඩරට රාජධානිය ඉන් අනතුරුව නතුවූයේ ඉංග්‍රීසි පාලනයටය. ක්‍රි.ව. 1815 දී සෘජුව ම ඉංග්‍රීසි පාලනයට යටත් වූ උඩරට රාජධානිය ස්වකීය නිදහස් රාජ්‍යය මෙන් ම එතෙක් කල් අඛණ්ඩව ආරක්‍ෂා කරගත් රාජපරම්පරාව ද අහිමිකර ගනිමින් පරාධීන භාවයට පත්වූයේ ජාතික ඉතිහාසයේ මහා ඛේදවාචකයක් ද සනිටුහන් කරමිනි.

උඩරැටියන්ගේ නිදහස් රාජ්‍යය ද, බුද්ධශාසන ප්‍රබෝධය ද අධ්‍යාපනය හා ඔවුන්ගේ අධීන සංස්කෘතිය ද විදේශ ආක්‍රමණ හමුවේ පරිහානිය කරා කෙමෙන් ගමන් ගත්තේ ය. වසර පන්සියයකට ආසන්න කාලයක් මෙසේ පරාධීනව දුක්විඳ උඩරට ජනතාවට ඉන් ගැලවීමට තවම ක්‍රමයක් උදාවී නැත. එක් අතකින් බටහිර අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයට හසු වූ උඩරට ජනයා තවත් අතකින් දකුණු ඉන්දියානු රජවරුන්ගේ රාජ්‍ය පාලනයට ගොදුරු වී ස්වකීය ජන්ම භූමියේ නිදහස් සෛවරීභාවයත් අහිමි කර ගත්හ. ඉංග්‍රීසි පාලන සමයේ දී මෙකී ඛේදජනක තත්වය කෙතරම් උග්‍රවීද යත් ඔවුහු උන්හිටි තැනද නැති වී ආර්ථික වශයෙන් අන්ත දුගී බවට පත්වී විනාශයට පත්වූ ජාතියක් බවට පත්වූහ.

පිනකට ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ රාජ්‍ය පාලන සමයේ වැලිවිට

සරණංකර සංඝරාජ මාහිමියන් වෙතින් යම් බඳු සහනයක් හා බලාපොරොත්තුවක් උදාවිය. නරේන්ද්‍රසිංහ මෙන් ම ඉන් අනතුරුව රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ හා රාජාධිරාජාසිංහ රජුන් දවසේ දී ලක්දිව බුද්ධ ශාසනයට ශුභ දායක තත්වයක් උදාවිය. මේ තිදෙනා අතරින් කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලය විශේෂයෙන්ම සඳහන් කළ යුතුය. සිංහලයන්ගේ රජු බෞද්ධයකු විය යුතුයැයි පැවැති ජනමතය අගය කළ නව රජු ජනතාවගේ ආගම කෙරෙහි උද්‍යෝගිමත් ලෙස කැප වූයේය. බුදු සමයට ඔවුන්ගෙන් ඉටු වූ සේවාවන් මේ යැයි පැවසෙන බෞද්ධ පූජනීය ස්ථාන සමූහය මහනුවර රාජධානිය තුළ අදත් විද්‍යාමාන වේ. මේ අතරින් කුරුණෑගල රිදී විහාරය ද එකකි. උඩරට රාජධානිය තුළ බෞද්ධ ඉතිහාසයේ ස්වර්ණමය යුගය උදාවූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස ය. බෞද්ධ අධ්‍යාපනයේත්, බුද්ධ ශාසනයේත් පරිහානියේ පෙනෙන තෙක් මානයේ තිබිය දී ඒවා පුනරුත්ථාපනය කිරීමට අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කළ කීර්ති ශ්‍රී රාජසිංහ රජුට අවශ්‍ය උපදේශ හා අනුශාසනා ලබාදීම වස් වැලිවිට සරණංකර මාහිමියන්ගේ ඉදිරිපත්වීම වූ කලී රජුගේත්, ජනතාවගේත් පරම භාග්‍යයක් විය. බෞද්ධ භික්ෂූන් සොයා ගැනීමටවත් අපහසු යුගයක උගත්, සිල්වත් භික්ෂු පරපුරක් බිහිකිරීම උදෙසා 1753 දී සියම් දේශයේ උපසම්පදාව ගෙන්වා බෞද්ධ අධ්‍යාපනය යළි ස්ථාපනය කොට සංවර්ධනය කිරීම පිණිස පිරුවෙන් අරඹා, පොතපත යළි සුලභ කොට ශාස්ත්‍රීය නවෝදයක් ඇති කළ වැලිවිට සංඝරාජ හිමියන් නිසා බුදු දහම යළි මෙම දිවයිනේ ස්ථාපිත විය. **මන්දාරම්පුර පුවත** මෙම සිද්ධිය මෙසේ සඳහන් වේ.

උගත් පෙළ දහම් ඈ සමතුන් හැඳින
දෙවෙහෙර පුර සතර වාසල් වෙහෙර යන
සතැන සතර සැල් සැම පසය තබමින
උගනුව වැවස්තා කළ නිරිඳු හැම දන

සුදුහුම්පොළ ද අම්පිටිය ද නිත්ත වෙල
ගංගාරාම වෙහෙර ද නුවර සිව්පල

ගම්වර දෙවා සිප්සල් වැවස්තා කල
පත්කර ඉගෙනීම අත්කළ දෙන සියල

සුදුසු රජකෙනෙකුගේ ද උදාර සංඝ පීතෘවරයෙකුගේ ද මගපෙන්වීම යටතේ භික්ෂු සමාජයේ සංවිධානය වන්නටත් සියම් නිකාය මල්වතු - අස්ගිරි යනුවෙන් මධ්‍යස්ථාන දෙකකින් යුක්තව නිල වශයෙන් පිළිගන්නටත් කීර්ති ශ්‍රී රාංසිංහ රජු විසින් වැලිවිට සරණංකර මාහිමියන් මල්වතු මහාවිහාරයේ ප්‍රථම මහානායක හා උපසංඝරාජ වශයෙන් ද සංඝරාජ වශයෙන් ද, තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත හිමියන් පත්කරනු ලදහ. කෘතවේදී රජුගේ ගෞරව බහුමානයට ද උන්වහන්සේ පාත්‍ර වූහ. දිවයිනේ සියලු පෞරාණික වෙහෙර විහාරවල පරිපාලනය මල්වතු - අස්ගිරි උභය විහාරයන්ට පැවරුණු අතර නටබුන්ව තිබූ වෙහෙර විහාර ද ප්‍රතිසංස්කරණයට පත්විය. මහනුවර දළදා පෙරහැර ද එකල ම ආරම්භ විය. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ අභාවය 1778 දී සිදුවුන ද උන්වහන්සේ දල්වාලූ ආගමික හා ශාස්ත්‍රීය පහනේ ආලෝකය ඉන් පසුව ද දිවයින පුරා විහිදෙන්නට විය.

වර්ෂ 1781 දී කීර්ති ශ්‍රී රාජසිංහ අභාවයට පත්වූ අතර හිස් වූ සිහසුනට පත්වූයේ රාජාධිරාජසිංහ ය. ඔහුගේ කෙටි රාජ්‍ය පාලන කාලය තුළ එතරම් දියුණුවක් සිදු නොවුන ද මොරතොට මාහිමියන්ගෙන් සිප්සතර හැදෑරීමේ භාග්‍ය ලද ඔහු අතින් **අසදිය දා කව** වැනි ග්‍රන්ථ බිහිවීම නිසා ශාස්ත්‍රීය පෝෂණයක් සිදුවූ බව සඳහන් කළ යුතුය. මොහුගේ අභාවයෙන් පසු වර්ෂ 1798 දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අභිෂේක ලැබූ අතර ඔහුගේ රාජ්‍ය කාලය මෙන්ම උඩරට රාජධානියේත් සිංහල රාජපරම්පරාවේත් අවසානයේ 1815 දී මුළුරටම බ්‍රිතාන්‍යයන්ට අත්පත්වීමෙන් අවසන් විය. එසේ වුවද එතෙක් සෑම රාජධානියකම අගනුවරට වැඩම වෙමින් පැවැති දළදා සමිඳු උඩරට රාජාධානිය හා අගනුවර අභාවයට ගිය කල්හිත් සෙංකඩගල මහනුවර දළදා මැඳුරෙහි වැඩමවා ආරක්ෂා කර ගැනීමට තරම් භාග්‍යසම්පන්න වීම ඉතිහාසයේ වැදගත් සිද්ධියකි.

## ආශ්‍රිත ග්‍රන්ථ

1. මන්දාරම්පුර පුවත, සංස, ලබුගම ලංකානන්ද හිමි, 78 කව, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ, 1998.
2. මහාවංශය, පරි. ගුණපාල වීරසේකර, පිටුව 990. අනුර මුද්‍රණාලය, මරදාන.
3. අස්ගිරියේ තල්පතින් අලුත් වන ලංකා ඉතිහාසය, මැන්දිස් රෝහණධීර, පෙරවන, ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය, මුද්‍රණාලය, 1970.
4. University of Peradeniya, History of Sri LAnka, Vil. II, (c. 1500 to c. 1800) ed K.M. de Silava, p. 139, Sri Devi Printers, Dehiwala, 1955.
5. උඩරට රාජධානිය (1470 - 1818) අබයසිංහ, දේවාරාජ, සෝමරත්න, 8 පිටුව, ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම, කොළඹ, 1977.
6. එම, පිටුව 13.
7. අස්ගිරියේ තල්පත, සංස්, මැන්දිස් රෝහණධීර, පිටුව 6, ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය.
8. මහාවංශය (සිංහල) ද්වීතීය භාගය, ශ්‍රී සුමංගල නායක හිමි හා බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, 4 වන මුද්‍රණය, 94 පරි. ගාථා 11 - 14, රත්නාකර මුද්‍රණාලය, 1963.
9. අස්ගිරි මහා විහාර ඉතිහාසය, පූජ්‍ය වරකාවේ ධම්මාලෝක හිමි, පිටුව 10, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, 1976.
10. මහනුවර සැඟවුණු තොරතුරු, සංස්, ශාස්ත්‍රපති ගොඩගම මංගල හිමි, එහි තුඹුල්ලේ සීලක්ඛන්ධ හිමියන් විසින් ලියන ලද "අස්ගිරි මහා විහාරය, දළඳා වහන්සේ හා වාරියපොල අනුනායක හාමුදුරුවෝ" ලිපිය, පිටු 8 - 9, බ්‍රාවි මුද්‍රණාලය, මහනුවර, 1992.
11. ස්‍යාමෝපසම්පදාවත, සංස්, ගිරිදර රත්නජෝති, පිටු 23 - 24, ග්‍රන්ථ ප්‍රකාශ මුද්‍රණශාලාව,කොළඹ, 1892.
12. සිංහල සාහිත්‍යයේ හෙළිපෙහෙළි, සංස්. ශාස්ත්‍රපති ගොඩගම මංගල

හිමි, එහි වාරියපොළ ශ්‍රී සුමංගල මාහිමි වැඩ විසූ අස්ගිරි මහා විහාර ලිපිය, පිටුව 36, ආරිය මුද්‍රණ කර්මාන්තය, මහනුවර, 1993.

13. එම
14. Diary pf Mr, Jhon D'Oyly, pp.266 - 269, JRAS, Vol. 25, Colombo, 1917.
15. දළදා පුවත, සංස්. එම්.ඩබ්ලිව්. විජේසිංහ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, 1992.
16. සෙල්ලවලී තඹ සන්නස - අනුරාධ සෙනෙවිරත්න - කලා සඟරාව, පිටු 24 - 34 (1972) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ 1972.
17. දළදා ඉතිහාසය හා සංස්කෘතිය, කුඹුරුගමුවේ වජිර හිමි, පිටුව 148, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල, 1983.
18. චූලවංශය, පරි. 97 : 1 - 7.
19. එම, පරි. 98: 33 - 41
20. එම, පරි. 99 : 43 - 65
21. වැඩි විස්තර සඳහා බලන්න, අනුරාධ සෙනෙවිරත්න, සිරි දළදා වරුණ, පිටු 58 - 86 දෙවන සංස්, කොළඹ, 2001.
22. Diary of Mr. Jhon D'Olyly pp. 256'
23. එම, පිටුව 265.
24. එම, 265 පිටුව බලන්න.
25. එම
26. අනුරාධ සෙනෙවිරත්න, සිරි දළදා වරුණ, 191 පිටුව.
27. එම, 123 පිටුව.

# දළදා වහන්සේගෙන් අභිමානනීයත්වයට පත් ශ්‍රී ලාංකේය රාජ්‍යත්වය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ
**මහාචාර්ය හඟුරන්කෙත ධීරානන්ද හිමිපාණන් විසිනි**

දළදා වහන්සේ ලක්දිවට වැඩම කිරීම ශ්‍රී ලාංකේය ඉතිහාසයේ මෙන්ම ආගමික හා සංස්කෘතික භූමිකාව තුළ ද සුවිශේෂ වූ කඩඉමක් සනිටුහන් කරයි. බුදුරදුන්ගේ අති උත්තම ශාරීරික ධාතූන්වහන්සේ ලෙසින් සැලකෙන ශ්‍රී දළදා වහන්සේ ශ්‍රී ලාංකේය බෞද්ධ ප්‍රජාව අතට පත්වීම මහත් භාග්‍යයක් ලෙසින් පුරාතන අවධියේ සිටම සැලකූ අතර දළදාව හා සම්බන්ධව පූජා, අභිචාර විධි හා චින්තන සම්ප්‍රදායක් මෙන්ම සංස්කෘතිකාංග රැසක් ද කලින් කලට ශ්‍රී ලාංකේය බොදුජන ජීවන පැවැත්ම හා ඒකාබද්ධ විය. නිසි කලට වැසි ලැබ රට සශ්‍රීකවීම ද කාල විපත්වලින් තොරව සෞභාග්‍ය ලැබීමේ මහිමයක් ද දළදාව කෙරෙහි නිසි පුදපූජා පැවැත්වීමෙන් ලැබෙන බව ලක්වැස්සෝ අතීතයේ සිටම බැතිබර සිතින් යුතුව විශ්වාස කළහ. එමෙන්ම පාලකයාගේ දැහැමි බවේ මෙන්ම පාලනයට ඇති උරුමයේ සංකේතයක් ලෙසින් ද සැලකීමේ සම්ප්‍රදාය ද අභිචාර විධි ඔස්සේ ලක්වැසි ජනවිඥානයට අතීතයේ සිට බද්ධව පවතියි. දළදාව හිමිකර ගැනීම සිය දේශපාලන අයිතිය තහවුරු කලා පමණක් නොව දළදාවට හිමිකම් කීම හා දළදා සෙවනේ විසීම ද සිය රාජ්‍යත්වයේ අභිමානනීයත්වය තීව්‍ර කිරීමට හේතුවක් ලෙසින් ද ශ්‍රී ලාංකේය පාලන ස්තරායනය තුළ මුල් බැසගනිමින්, දොළොස්වැනි සියවසින් පසු දශක ගණනාවක් මුළුල්ලේ එම අදහස ක්‍රියාත්මක මට්ටමින් පැවති බව ඓතිහාසික තොරතුරු විමර්ශනය කරන විට ඉස්මතුවන වැදගත් කරුණකි.

බුදුරදුන්ගේ පරිනිර්වාණයෙන් පසු උන්වහන්සේ වෙනුවෙන් ත්‍රිවිධ චෛත්‍ය ජීවමාන බුදුරදුන් ලෙසින් පූජෝපහාරයන් ලැබූ අතර ඒ අතරින් ද උන්වහන්සේගේ ශාරීරික ධාතූහු සුවිශේෂත්වයට පත්වූහ.[1] දෝණ බමුණාගේ

1. Papancasudani, p. 878, Manorathapurani, Vol. II, pp. 6 -7; Dhammapadatthakath, Vol. III, p.251.

නායකත්වයෙන් ආදහන සෑයෙන් ලබාගත් ධාතූන් පාලක පිරිස් වෙත එම අවධියේ දීම බෙදාදෙන ලද බව **දීඝනිකාය** සඳහන් කරයි.[2] පිප්රාවෙන් සොයාගත් ස්තූපයක මෙසේ ශාක්‍යයන් විසින් ලබාගත් ධාතූන් තැන්පත් කොට ස්තූපයක් කරවන ලද පුරාවිද්‍යාත්මක කැණීම් වලින් හා සමීක්ෂණවලින් ද තහවුරුව තිබේ.[3] පසු කාලයේ ශාරීරික ධාතු තැන්පත් කරමින් අශෝක අධිරාජයා විසින් අසුහාර දහසක් ස්තූපයන් ඉන්දීය භූමිය තුළ ගොඩනංවන ලද බව වංසකථා දක්වන අතර[4] හියුං සීයැංගේ වාර්තාවෙන් ද තමා විසින් දක්නා ලද අශෝක ස්තූප රැසක් ගැන තොරතුරු නාමිකවම දක්වා ඇත.[5] වංස කථාව මහියංගනයේ කේශ ධාතු නිධානය හා බුදුරදුන්ගේ ග්‍රිවා ධාතු නිධානය[6] ගැන සඳහන් වුවද ධාතු වන්දනය වඩාත් ප්‍රචලිත බවට පත්වූයේ මහින්දාගමනයෙන් පසු දේවානම් පියතිස්ස රජුගේ අනුග්‍රාහකත්වයෙන් ථූපාරාමය ගොඩ නැංවීමෙන් පසුවය.[7] ඒ අනුව ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේ සිටම පාලක අනුග්‍රහයෙන් මෙන්ම බෞද්ධ ජනතාවගේ දායකත්වයෙන් මහියංගනය, රුවන්වැලිසෑය, අස්ගිරිය හා ජේතවනය වැනි මහා දාගැබ් මේ දෙරණ මත ඉදි වූ අතර ඊට සමගාමීව ප්‍රාදේශීයව ජීවමාන බුදුරදුන් වෙත කෙරෙන ශාරීරික උපහාරයක් ලෙසින් ශ්‍රී ලංකාවේ අනෙකුත් සෑම විහාරස්ථානයකම පාහේ සර්වඥධාතු තැම්පත් කරමින් දාගැබ් ඉදි විය.

---

2. Digha Nikaya, Vol. II, pp. 94 - 95
3. "ඉයං සලිලනිධානෙ බුදස භගවතො සාක්‍යානසුකිතිභාතානං සභගිකාකානං සපුතකානං, FÜhrer, Annual Progress Report of the Archaeological Survey Circle, North - Western Provinces and Oudh, for the year ending 30th June 1898, 1898 p.3; Peppe, JRAS, 1898, 576 f;
4. ඌණ පූරණ සහිතො මහාවංසො (ඌපූම) සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1859, පරි. 5, ගා. 176 - 177
5. Samuel Beal, Si - Yu- Ki Buddhist Records of the Western World, Delhi: Oriental Book Reprint Corporation, 1969 (re print), part I, 1969, pp. 113, 125, 139, 144, 146, 147 - 148, 187, 200, 203, 221, 223, 224, 225, 232, 237, 240, part II, 4, 7, 13, 19, 21, 24 - 27, 29 - 32, 40, 45, 46, 61, 65, 67, 78, 80, 85, 86, 88-96, 113, 115, 117-119, 123, 146, 160, 164, 165, 167, 175, 177, 182, 184, 195, 19, 201, 204, 205, 208, 218, 227, 229, 230, 257, 267, 271, 275, 279, 281, 284, 302, 309, 310.
6. ඌපූම, පරි. 1, ගා. 33 - 40
7. L.A. De Silva, Buddhism: Beliefs and Practices in Sri Lanka. Colombo: Wesley Press, 1974, p. 25.

ලක්දිවට වැඩම කරනු ලැබූ ශාරීරික ධාතූන් අතරින් බුදුරදුන්ගේ සුවසුදහසක් ධර්මස්කන්ධයේ පහස ලද, ශාරීරික ධාතූන්වහන්සේ නමක් ලෙසින් සියවස් ගණනක් මුළුල්ලේ බෞද්ධයන්ගේ ගෞරවාදරයට හා වන්දනීයත්වයට පාත්‍ර වූ ශ්‍රී දළඳාව ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ දිගු කළක් මුළුල්ලේ වැජඹිණ. පාරිභෝගික චෛත්‍යයක් වූ ශ්‍රී මහාබෝධිය මුල් අවධියේ රාජ්‍යත්වයේ හා රාජ්‍යයේ පරම පූජනීය සංකේතයක් ලෙසින් වන්දනීයත්වයට මෙන්ම පිළිගැනීමට ද ලක්වූ අතර පාලනයට පත් අනුරාධපුර මුල් පාලක පිරිස් මහාබෝධිය වෙනුවෙන් මහත් බැතියෙන් කළ පුද පූජාවෝ අපමණය.[8] ක්‍රිස්තු වර්ෂ සිවුවැනි සියවසේදී බුදුරදුන්ගේ වාම දළදාව ශ්‍රී ලංකාවට වැඩම වීමත් සමග දේශීය සංස්කෘතියේ ප්‍රධාන පූජා වස්තුවක් බවට දළදා වහන්සේ පත්වන අතර රාජ්‍යයේ උරුමකාරීත්වයේ එක් ප්‍රධාන සංකේතයක් බවට ද පත්වේ. අනුරාධපුරය කේන්ද්‍ර කරගත් දේශපාලන නායකත්වයක් පැවති අවධියේ ශ්‍රී මහාබෝධිය හිමිකරගත් රාජ්‍යත්වයේ හා රාජ්‍යයේ සංකේතාත්මක වටිනාකම පොළොන්නරු යුගයේ දී මෙන්ම නිරිත දිගට රාජ්‍ය පාලන කේන්ද්‍රස්ථානය සංකේන්ද්‍රගතවීමත් සමඟ එහි සංකේතාත්මක වටිනාකම වඩාත් ඉස්මතුවන අතරම, රාජ්‍යත්වයේ බලය හා ශක්තිය ද දළදාව මත තීරණය වීම දක්වා වර්ධනය වූ බවට සාධක ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ අන්තර්ගතය. එබැවින් දළදාව හා රාජ්‍යත්වය අතර සුවිශේෂ සම්බන්ධයක් ක්‍රිස්තු වර්ෂ දොළොස්වැනි සියවසින් පසු පැවති බව දේශපාලන ඉතිහාසය තුළ කැපී පෙනෙන ප්‍රධාන ලක්ෂණයක් සේ පෙන්විය හැකි වේ.

## දඹදිව පාලක උපහාරය

බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු වාම දළදාවේ ගිහි භාරකාරත්වය නිරතුරුව රැදි පැවතියේ ද පාලකයන් අත බව දළදා ඉතිහාසය පරීක්ෂා කරන විට පෙනීයන කරුණකි. බුදුරජාණන් වහන්සේගේ ආදාහනය

8. දීපවංශය, (දීප) සංස්, කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1959, පරි. 222, ගා.45;ගා. 54; උෟපූම, පරි. 28, ගා.පරි.35, ගා. 89, උෟපූම පරි. 36, ගා 25-26, 31-52,55, 103-104 පරි.37, ගා.126.

සිදුවන අවස්ථාවේදීම ඛේම නම් මහරහතන්වහන්සේ නමක් විසින් දළදාව ඉන් රැගෙන දන්තපුරයේ කළිඟුරට බ්‍රහ්මදත්ත රජුට ලබාදුන් බව දාඨාවංසය සඳහන් කරයි.[9] බඹදත් රජු එසේ ලබාගත් දළදාව මහත් බැතියන් පිළිගෙන විචිත්‍රවත් වූ නොයෙක් රත්නයන්ගෙන් බබලන කුළු ගෙවල් සියගණනකින් යුතු දළදා මැඳුරක් කරවා එහි නානාවිධ රත්නවලින් බබලන අසුනක් ද කරවා දළදාව එහි තැන්පත් කරන ලද ආකාරය එහි තවදුරටත් විස්තර කරයි. පසුව ඔහු පුත් කාසි රජු ද ඔහුගේ ඇවෑමෙන් සුනන්ද රජු ආදී එම පරපුරේ පාලකයන් සමූහයක් විසින් ද ඉතා උසස් අයුරින් දළදා වහන්සේ වෙනුවෙන් අනේක විධ පූජාවන් පවත්වමින් එය ආරක්ෂා කළ බව ද එහි දැක්වේ.[10] දළදා ඉතිහාසයට අනුව කලිඟු පරපුරට අයත් ගුහසීව රජු මිථ්‍යාදෘෂ්ටික මතධාරියකු වුව ද පසුව බුදුරදුන්ගේ ගුණ අසා පැහැද දළදා වහන්සේට මහත් පුදපූජාවන් දැක්වූ පාලකයකු ලෙසින් ඉතිහාසගතය. ගුහසීව රජු දළදා වහන්සේට දක්වන ලද මහත් හරසර නිසා කෝපයට පත් ඇතැම් පිරිස් පැළලුප් නුවර පණ්ඩු රජු වෙත ගොස් ගුවසීව රජු මිනී ඇටයකට වඳින පුදන බව කියා ඔහු බිඳවිය. මෙයින් කිපුන පාණ්ඩු රජු චිත්‍රායානයන් ගෙන්වා ගුවසීව රජු ද ඔහු විසින් වදින පුදන එම මිනී ඇයට ද ගෙන එන ලෙසට අණ කළේය.[11] පාණ්ඩු රජුගේ අණ පරිදි කාළිංගයට පැමිණෙන චිත්‍රයාන රජු දළදා වහන්සේගේ ප්‍රාතිහාර්ය දැක පැහැදි බුදුන් සරණ ගිය බවත් පඩි රජුගේ ආඥාව ඉක්මවිය නොහැකි වූ හෙයින් ගුහසීව රජු හා දළදාව ද රැගෙන පැළලුප් නුවරට ගොස් ඇත.[12] දළදාවේ ප්‍රාතිහාර්යයන් දැක සතුටට පත් පාණ්ඩු රජු පෙරළා දළදාව ගුහසීවට ලබාදී තිබේ. දළදාව මුල්කොට එල්ලවන තර්ජන හමුවේ දළදාවේ ආරක්ෂාව ගැන කල්පනා කළ රජු එය ආරක්ෂාව පතා ශ්‍රී ලංකාවට එවීමට තීරණය කළ අතර සිය දියණිය වූ හේමමාලා හා දන්ත කුමරු එම කාර්යයයේ නිරත කොට ඇත.

9. දන්තධාතුං තතො ඛෙමො - අත්තනො ගහීතංඅදා දන්තපුරෙ කාලිඞ්ගස්ස බ්‍රහ්මදත්ත රාජිනො දාඨාවංස, ගා 119.
10. එම, ගා. 121 - 152
11. පූජිතං තං ඡවඨිං ච තෙන රත්තින්දිවං ඉති එම. පි. 158
12. එම. පි. 165 - 180.

## දළදාව ලංකාවට වැඩමවීම හා අනුරාධපුර පාලක අනුග්‍රහය

දළදාව ලබා ගැනීමට ප්‍රයත්නයක් දැරූ පළමු ශ්‍රී ලාංකේය රජු ලෙසට මහසෙන් රජුගේ නාමය **දාඨාවංසය** සඳහන් කරයි. දළදාවේ පහස ලද පැන් ටිකක් වුව දෙනු මනැවැයි ඔහු විසින් ඉල්වන ලද පුවතක් එහි සඳහන් වේ.[13] එම කාරුණික ආයාචනය ද සිහියේ තබාගත් ගුහසීව රජු දළදාව සම්බන්ධව එවකට කළිඟු දේශයේ ඇති වූ අරගලකාරී තත්වය හමුවේ එහි ආරක්ෂාව පතා රහසේම දළදාව ලක්දිවට එවීමට තීරණය කොට ඇත. ඒ අනුව සිය දළදාව ලක්දිවට වැඩම කිරීමේ භාරකාරත්වය සිය දියණිය වූ හේමමාලාට හා බෑණනුවන් වන දන්ත කුමරුට පවරා අදාළ ආරක්ෂාව මෙන්ම පහසුකම් ද ලබාදුන් අතර රාජ නියමය පරිදි දෙපළ සාගර තරණය කොට ආරක්ෂා සහිතව නැගෙනහිර මුහුදු සීමාවෙන් මහාපට්ටනයෙන් (වර්තමාන ඉලංකෙයිතුරෙයි නම් ස්ථානය යැයි විශ්වාස කෙරේ.) ශ්‍රී ලංකාවට ගොඩ බැස තිබේ.[14] මෙලෙසින් ලක්දිවට පැමිණි මෙම පිරිස මහත් හරසරින් පිළිගෙන අනුරාධපුරය දක්වා දළදාව සමඟ වැඩම කරවීමට අදාළ කටයුතු ලක් පාලක වූ කිත්සිරිමෙවන් රජු විසින් යොදන ලද අතර දළදාව අනුරාධපුරයට මහත් ගෞරවයකින් යුතුව වැඩම කොට නගරයට ඊශාන දෙසින් පිහිටි මේඝගිරි විහාරයේ තැන්පත් කරන ලදි. දළදා වහන්සේ ලක්දිවට වැඩම කරන ලද්දේ සිරිමෙඝවණ්ණ රජුගේ දොළොස්වැනි වර්ෂයේ දී යැයි **මහාවංසය**[15] සඳහන් කරනු ලබන අතර නව වැනි වර්ෂයේදී යැයි **දාඨාවංසය** කියයි.[16] මේඝගිරි විහාරය වෙත පැමිණි කිත්සිරිමේඝ රජු මහත් බැතියෙන් ලක් රාජ්‍යයෙන් ද දළදාව පුදා සිය භක්ත්‍යාදරය දක්වා ඇත. අනතුරුව දළදා වහන්සේ මනරම් පෙළහරකින් රජමාළිගයට වැඩමවා පසුව දෙවනපෑතිස් රජු විසින් රාජාරාමයේ කරවන ලද දම්සක් ගෙහ නම් ස්ථානයේ මණ්ඩපයක වඩා හිඳුවා මහජන ප්‍රදර්ශනයක් කරන ලද අතර

13. මම ච පියභාහො සො මහාසෙන රාජා - ජනචරණසරොංචන්‍දසොවාභියුත්තො - සලිලම්පි ච පුට්ඨං ධාතුයා පත්ථස්කතො විවිධරතනජාතං පභාතං පෙසයිත්ථ, එම, ගා. 301; රජරත්නාකරය, සංස්. සයිමන් ද සිල්වා වාසලමුදලි, කොළඹ, 107. පි. 26.
14. තෙ ජම්පති තමථ පට්ටමොතරිත්වා දෙවාලයෙ පටිවසිංසු මනොරාමෙ, එම, ගා. 340.
15. ඌපූම, ලරි. 37, ගා. 94
16. දාඨාවංසය, ගා. 355.

පසුව මෙම ගෘහය සත්රුවනින් සරසා දෙමහල් කොට සාදා දළදා වහන්සේ එහි තැන්පත් කරන ලදි. එමෙන්ම වසරක් පාසා එතැන් සිට අභයගිරි විහාරයට ද දළදා වහන්සේ රාජ අනුග්‍රහය මත වැඩම කොට මහත් හරසර දක්වන ලද අතර[17] එම පෙළහැරේ අලංකාරිත්වය ගැන මනරම් විස්තරයක් පස්වැනි සියවසේ ලක්දිවට වැඩම කළ පාහියන් හිමියන්ගේ වාර්තාව තුළ ද අන්තර්ගතය.[18] අස්ගිරියේ භාරකාරත්වයට පත්ව තිබූ දළදාව විෂයෙහි වාර්ෂිකව පැවති පෙළහර මංගල්‍ය ගැන අදහස් දක්වන පාහියන් භික්ෂුව ලංකාවේ පාලකයාගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයක් ලෙසින් පෙන්වා දෙන අතර හියුං සියැං ද දළදා මැඳුර රජ මාළිගය ආසන්නයේ පිහිටා තිබූ බව සඳහන් කරයි.[19] කිත්සිරිමෙවන් රජු දවස සිට ලක්දිවූ නිවැසි පාලක පිරිස් මෙන්ම ජනතාවත් දළදා වහන්සේ කෙරෙහි දක්වන ලද අපමණ ගෞරවය හා භක්ත්‍යාදරය හේතුවෙන් ගොඩනැගෙන දෘඪතර සම්බන්ධය මත දළදාව වනාහි දේශයේ සෞභාග්‍යමත් බවේ සංකේතය ලෙසින් ද පාලකයන්ගේ සධාර්මිකත්වය මතු කළ සංකේතයක් බවට ද දළදා වහන්සේ පත්වීමත් සමඟ රාජ්‍යයේ උරුමය සංකේතවත් කළ ආගමික පූජ්‍ය වස්තුවක් ලෙසින් පිදුම් ලැබීය. මේ නිසාම රජවරුන් දළදා වහන්ගේ මහත් බැතියෙන් යුතුව ආරක්ෂා කිරීමට පියවර ගත්හ.

අනුරාධපුර යුගයේ පසු කාලීන පාලක පිරිස් දළදා වහන්සේ වෙනුවෙන් මහත් බැතියෙන් යුතුව පූජාවන් පැවැත්වීමට ඉදිරිපත් වූ බවට සාක්ෂි මූලාශ්‍ර තුළ අන්තර්ගතය. ධාතුසේන රජු (ක්‍රි.ව. 455 - 475) දළදා මැඳුර ප්‍රතිසංස්කරණය කොට දළදා වහන්සේ වෙනුවෙන් ස්වර්ණමය කරඬුවක් ද පූජා කර සිය භක්ත්‍යාදරය දක්වා තිබෙන අතර පළමුවැනි අග්ගබෝධි (ක්‍රි.ව. 571 - 604) දළදා මැඳුර මැණික් ගලින් අලංකාරය කොට ස්වර්ණමය කරඬුවක්

17. ඌපූම, පරි.37, ගා. 92 -97, දාඨාවංසය, ගා. 351 -360 ; Beal op.cit 1969, 9.248.
18. Legge, op.cit, 1971, 99. 105 - 107
19. හියුං සියැංගේ විස්තරය තුළ ද රජ මාළිගය අසල දළදාව පිහිටා තිබූ බවත් අඩි සියගණනක් උස මෙය මාණික්‍යාලෝකයෙන් දීප්තිමත් බවත් දුර්ලභ මාණික්‍යයන්ගෙන් අලංකාර කරන ලද මන්දිරයක් බවත් විශාල පද්මරාග ඇල්ලූ යෂ්ටියක් විහාරය මුදුනේ සවිකොට තිබෙන බවත් දක්වයි. Beal, op.cit., 1969, 99 248 - 249.

ද දළදා වහන්සේට පූජා කර තිබේ.[20] තෙවැනි මොග්ගල්ලාන රජු (ක්‍රි.ව. 618 - 623) ද දළදා වහන්සේ විෂයෙහි දළදා පූජාවක් කළ බව **මහාවංශය** දක්වයි.[21] එමෙන්ම දාඨෝපතිස්ස (ක්‍රි.ව. 643 - 650)[22], දෙවැනි සේන (ක්‍රි.ව. 853 - 887)[23], සිවුවැනි සේන (954 - 956)[24] සිවුවැනි මිහිඳු (ක්‍රි.ව. 956 - 972)[25] වැනි පාලක පිරිස් දළදා වහන්සේට ආරක්ෂාව සලසා දෙමින් කළ මහත් උපහාර හා පූජාවන් ගැන තොරතුරු වංසකථාව තුළ ඇතුළත් ය. සිවුවැනි මිහිඳු රජුගේ සෙල්ලිපි දෙකක ද දළදාව ගැන තොරතුරු අන්තර්ගත ය. අනුරාධපුර පදර ලිපියේ දළදාගේ කටයුතු සඳහා වෙන් කොට තිබූ බදු කොටස් ගැන දැක්වෙන අතර[26] අස්ගිරි ලිපියේ දළදාව වෙනුවෙන් කරඬුවක් කරවා මහා නැවක ආකාරයේ මාළිගයක් ගොඩනංවනු ලැබූ බව එහි දැක්වේ.[27]

අනුරාධපුර පාලන සමයේදී ශ්‍රී මහා බෝධියට මෙන්ම දළදා වහන්සේට සමතැන් ලැබුණ මුත් රාජ්‍යත්වයේ සංකේතයක් ලෙසින් දළදාව වඩාත් ඉස්මතු නොවීය. නමුත් පාලකයාගේ සධාර්මිකත්වය දැක්වීමට දළදා මැදුර ආසන්නයේ මාළිගයක වෙසෙමින් ආගමික කටයුතුවල දී ප්‍රමුඛත්වයෙන් කටයුතු කිරීමට සෑම පාලකයෙකුම පාහේ උත්සුක වූ බවත් පෙනේ. අනුරාධපුර යුගයෙන් පසු පාලන කේන්ද්‍රස්ථානය පොළොන්නරුවට සංකේන්ද්‍රගත වීමත් සමඟම දළදාව හා සම්බන්ධිත වූ ආකල්පවල ද වර්ධනයක් දැකිය හැකි අතර රාජ්‍යත්වය හා දළදාව අතර සංකේතාත්මක සම්බන්ධතාවය ද වඩාත් සමීප වේ. දළදා වහන්සේ අදාළ ස්ථානයට වැඩමවාගෙන යාමට ඇති හැකියාව මීට එක් හේතුවක් වන්නට ඇති අතරම පාලනමය වශයෙන් බෙදුනු රටක් තුළ ප්‍රධාන පාලකයා කවරෙක් ද යන්න හා ප්‍රධාන පාලන කේන්ද්‍රය නිශ්චය කිරීමේ දී ද එක් සාධකයක් බවට දළදාව හා පාදාව පත්වන බව පැහැදිලි කරුණකි. දළදාව වැඩසිටීම තුළින් ජීවමාන

20. ඌපූම, පරි. 38, ගා. 71-72; පරි 41, ගා. 41.
21. එම, පරි. 45, ගා. 45.
22. එම, පරි. 42, ගා. 134.
23. එම, පරි. 49, ගා. 22-23.
24. එම, පරි. 52, ගා. 5.
25. එම, පරි. 45.
26. Epigrapia Zeylanica, Vol. I, p.85.
27. Ibid, Vol. I, 99. 115 -117

බුදුරදුන් වැඩ සිටීමක් ලෙස සැලකීම මෙහි ගැබ්ව ඇති යථාර්ථය වේ. පොළොන්නරුව යුගයේ සිට ම මෙම තත්වය වඩාත් පැහැදිලි වේ. දළදාව යමෙකු සතු වේ නම් ඔහුට සිංහල ඔටුන්න හා ප්‍රමුඛත්වය හිමිවේ ය යන සංකල්පය ද ක්‍රමයෙන් ජන විඥානය තුළ වර්ධනය වීමක් ද දැකිය හැකිය.[28] අස්ගිරියේ මූලිකත්වයෙන් දළදාව හා සැබැඳි පුදසිරිත් ඉටු වූ බැවින් දළදාව හා සම්බන්ධ වූ කිසිදු සඳහනක් මුල් අට්ඨකථාවන්හි දක්නට නොමැති බව වල්පොළ රාහුල හිමියෝ ප්‍රකාශ කරති.[29] අට්ඨකථාවන්හි එලෙසින් සඳහන් නොවුන ද වංසකථා සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර එළිදක්වන තොරතුරු මත සිවුවැනි සියවසින් පසු පාලක අනුග්‍රහය නිරතුරුව දළදා වහන්සේ වෙත ලැබුණු බව පැහැදිලි කරුණකි.

අනුරාධපුර යුගයේ අවසන් භාගයේ එල්ලවන දකුණු ඉන්දීය ආක්‍රමණ හමුවේ උත්තරෝල මූලයේ භික්ෂූන් විසින් දළදාව රෝහණ ප්‍රදේශයේ සඟවනු ලැබූ අතර පළමුවැනි විජයබාහුගේ නායකත්වයට පත්වීමත් සමඟ දළදාව පෙරළා පොළොන්නරුවට වැඩම කරවා ඇත.[30] දළදා වහන්සේ අසමසම ලෙසින් සම්මානනීයත්වයට පත්වූයෙත් ප්‍රමුඛත්වයට පත් වූයේත් පොළොන්නරුවට වැඩමවීමෙන් අනතුරුව බව කඹුරුගමුවේ වජිර හිමියෝ සඳහන් කරති.[31] පළමුවැනි විජයබාහු රජු (1070 - 1110) විසින් ද දළදා වහන්සේ වෙනුවෙන් අටදාගේ නම් නව මැඳුරක් ඉදිකොට දැඩි ආරක්ෂාව පතා වෙලෙක්කාර හමුදා භාරයට පත් කළ බව පොළොන්නරු වෙලෙක්කාර පුවරු ලිපියේ දැක්වේ.[32] රජුගේ අණ පරිදි නුවරකල් දේවසෙන්පති විසින් මෙම මාළිගය ගොඩනංවා ඇත.[33] විජයබාහු

28. JRAS, Vol. XIV, p.105
29. වල්පොළ රාහුල ලක්දිව බුදුසමයේ ඉතිහාසය, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. 1962, පි.164.
30. ඌපූම, පරි. 58, ගා. 15-17
31. කුඹුරුගමුවේ වජිර හිමි, ලක්දිව දන්තධාතුන් වහන්සේගෙග් ඉතිහාසය හා තදාශ්‍රිත පූජාවිධි, පී.එච්.ඩී. උපාධි නිබන්ධනය පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 1974, පි. 16
32. ලංකායම් - ජින - දන්ත - ධාතු භාවනාම් යද් දෙවසෙනාධිපො ශ්‍රී විජයාධි බාහු නර්වරාදෙන- Epigrapia Zeylancia, Vol II, London, 1928, p.252
33. Ibid

පොළොන්නරුවේ රජ වූ දළදා වහන්සේ වෙනුවෙන් රමණීය වටිනා මාළිගයක් කර උත්කර්ෂවත් අන්දමින් උත්සවයක් ද පවත්වා ඇත. දළදා වහන්සේ උදෙසා ගොඩනංවන ලද මෙම ස්ථානය රජුගේ ප්‍රථමාභිෂේකය සිදු වූ ස්ථානය ලෙසින් ද සැලකේ. විජයබාහු රජු සිය මිත්‍ර බුරුම රජු වෙත දළදා වහන්සේගේ අනුරුවක් යැවීමට තරම් භක්තිමත් විය.[34] මෙලෙසින් රාජ්‍යත්වයේ ප්‍රමුඛ සංකේතයක් බවට දළදා වහන්සේ පත් වූ අතර එතැන් පටන් ලක් පාලක පිරිස් රාජ්‍යත්වයේ ප්‍රමුඛ සංකේතය ලෙසින් දළදාව සැලකූ අතර ම දළදාවේ භාරය සියතට ගැනීමට නිරතුරුව ම උත්සුක වූ බව ද පැහැදිලිය.

පළමුවැනි විජයබාහු ගෙන් පසු ඇති වන දේශපාලන ව්‍යාකූලත්වය මත පාංශකූලික භික්ෂූන් විසින් දළදාව පොළොන්නරුවෙන් රෝහණයට ගෙන ගොස් ගල්බැද්ද උදුන්දොර තැම්පත් කර ඊට නිසා ආරක්ෂාව සලසා ඇත.[35] පළමුවැනි පරාක්‍රමබාහු නායකත්වයට පත්වන සමය තෙක් එහි භාරකාරත්වය දකුණේ ප්‍රාදේශීය නායකත්වයක් ඇතිව සිටි මනාභරණ කුමරුවන්ගේ මෑණියන් වූ සුගලා බිසව සතුවිනි. මෙහිදී රජරට ප්‍රදේශයේ බලය දෙවන ගජබාහුගෙන් සියතට ගැනීමට පරාක්‍රමබාහු සමත් වුවුද ඔහුගේ එකම අභිප්‍රාය වූයේ කෙසේ හෝ දළදා වහන්සේ සියතට ගැනීමය. රාජ්‍යත්වය සුරක්ෂිත වීම කෙරෙහි දළදාව ද අත්‍යවශ්‍ය කරුණක් ලෙසින් පළමුවැනි පරාක්‍රමබාහු සැලකීය. දෙවැනි ගජබාහු දවස මහාභාරණයන් සටන් කොට පොළොන්නරුව අල්වාගෙන දළදාව හා පාදාව හා සිය මෑණියන් ද පොළොන්නරුවට ගෙන්වා ගනිමින් තමා රටේ අගරජ බව ප්‍රකාශ කොට ඇත. මේ අවස්ථාවේදී ගජබාවන්ගේ ඉල්ලීම මත පරාක්‍රමබාහු මහාභරණ පලවා හැර ගජබාහුගේ පාලය අයිතිය ලබාදීමට කටයුතු කළ මුත් පලායන මාණාභරණ දළදාව ද පෙරළා රෝහණය වෙත ගෙන යාමට අමතක නොකළේය.[36] ඉන් ඔහු අදහස් කළේ ජනමතය තමා වෙත නතු කර ගැනීමට

34. G.E. Harrey, History of Burma, London, 1925, p.32

35. දාඨාධාතුවරං පත්තධාතුමාදාය රෝහණං ගන්ත්වා වාසමකප්පෙසුං, උ৹පූම, පරි. ගා.61.

36. දාඨාධාතුවරං පත්තධාතුං මාතරමත්තනො ඉත්ථාගාරඤ්ච ගණ්හිත්වා රත්තියං රොහණං ගතො එම, පරි. 68, ගා. 310

විය හැකිය. මාණාභරණ ගෙන් පසු දළදාවේ අයිතිය සුගලා බිසව සතු වූ අතර ඇය දළදාව ද තබා ගනිමින් පොළොන්නරුවේ නායකත්වය ද අපේක්ෂා කළාය. දළදාව සුගලා බිසව සතුව පැවතීම මත දකුණේ විසූ සාමන්තයෝ පරාක්‍රමබාහුගේ ආධිපත්‍ය පිළිනොගෙන සුගලාගේ නායකත්වය පිළිගැනීමට පෙළ ගැසුණහ. දළදාව අපේක්ෂාවෙන් පරාක්‍රමබාහුට දකුණට රක්ඛ සෙන්පති යටතේ ආක්‍රමණයක් එල්ල කිරීමට සිදුවේ. මෙහිදී ආක්‍රමණිකයන්ට මුහුණදීමට අපොහොසත් වූ සුගලාව දළදාව ද රැගෙන උරුවෙලට පලා යන අතර දළදාව ආරක්ෂා කර ගැනීම පිණිස උදුන්දොර අමරගිරියේ ඇය විසින් දළදාව සඟවා තබන ලද බව **දළදා පූජාවලිය** කියයි.[37] රක්ඛ සෙන්පති හා භූත සෙන්පති යටතේ තවත් සේනා නැගෙනහිර දිසාවෙන් ද යවමින් සුගලාගේ බලයෙන් මර්ධනය කොට උද්ධනද්වාරයේ දී කළ මහසටන්වලින් පසු දළදාව අත්පත් කර ගැනීමට පරාක්‍රමබාහුට හැකිවිය. පරාක්‍රමබාහු රජුගේ අණපරිදි මඤ්ජු අධිකාරී විසින් අත්පත් කරගත් දළදාව සුරක්ෂිතව අඤ්ජන කම්මනාථ භාරයේ මහත් පෙළහැරකින් පොළොන්නරුව නගරයට වැඩමවා අගනා මහා මාණික්‍යයකින් සරහන ලද සුවඳසුණු ගල්වන ලද මනාව සෝභාසම්පන්නව ගොඩනංවන ලද ධාතු සරයක තැම්පත් කරවීමට ද කටයුතු යෙදීය.[38] පරාක්‍රමබාහු නායකත්වයට පත්ව සිවුවැනි වසරේදී ලත් ප්‍රධාන ජයග්‍රහණ ලෙසින් දළදාව තමා නතු කර ගැනීමම දැක්වේ. මහින්ද නම් ඇමතියකු විසින් පොළොන්නරුවේ ගොඩනංවන ලද විජයෝත්පාය නම් මාළිගය දළදාව තැම්පත් කර පුදපූජාවන් පවත්වා ඇත. පරාක්‍රමබාහු දවස දළදා වහන්සේ වෙනුවෙන් මාළිගා තුනක් පමණ කළ බවද දැක්වේ.[39]

නිශ්ශංකමල්ලයන් විසින් දළදා වහන්සේ වෙනුවෙන් හැටදාගේය නම් ශිලාමය මණ්ඩපයක් කළ බවත්[40] පසුව මනරම් ප්‍රාසාදයක් වූ නිශ්ශංක ලතා

37. දළදා පූජාවලිය, සංස්. සුගතපාල, කොළඹ, 1929, පි.42.
38. අඤ්ජනකම්මනාථං සො ධාතුරක්ඛාය යොජිය පෙසෙත්වා ධාතු යුගලං මහාරාජස්ස සන්තිකං, චූළවංස, පරි.72, ගා. 168 - 169
39. එම, පරි 72, ගා 299 - 300
40. එම, පරි 78, ගා 19

මණ්ඩපයට වැඩමවා මහජන ප්‍රදර්ශනයක් ද පවත්වන ලදී.[41] එමෙන් ම සිය පුත් වූ වීරබාහු මහාදීපාදයන් හා දූ කුමරිය වූ සර්වාංග සුන්දරිය ද දළදා වහන්සේ විෂයෙහි පූජාකරන ලද බව හා ඔවුන් මුදවා ගැනීම පිණිස ස්වර්ණමය දාගැබක් බඳවන ලද බව ද **රාජාවලිය** මෙන් ම නිශ්ශංක මල්ලගේ අභිලේඛනවල සඳහන්ව ඇත.[42] ඉන්පසු එළඹි අවධිය තුළ දුර්වල පාලක පිරිස් නායකත්වයට පත්වීම හා කාලිංග මාඝගේ ආක්‍රමණයත් නිසා දළදාව පොළොන්නරුවෙන් බැහැර ප්‍රදේශයකට වැඩම කරවීමට භික්ෂූන් කටයුතු යෙදීය. පරාක්‍රමපණ්ඩු නම් රජු සතුව පැවති දළදාව උත්තරමූල නිවැසි වාචිස්සර නම් භික්ෂුවක් මෙම අවස්ථාවේ දළදාව හා පාදාව ගෙන කොත්මලේ ප්‍රදේශයේ සඟවා තබා ඉන්දියාවට සරණාගතයකු ලෙසින් පලාගිය බව දැක්වේ.[43] මාඝ ආක්‍රමණ නිසා පොළොන්නරුව අතහැර පැමිණි භික්ෂුහු දළදා පාද රැගෙන මායා රටට පැමිණියද එහි ආරක්ෂාව මදව ගියෙන් කොත්මලේ එක් තැනක එම වස්තුහු නිදහස් කොට චෝළ හා පාණ්ඩ්‍ය රටවලට ගිය බව **පූජාවලියේ**[44] හා **චූලවංසයෙ**[45] දැක්වේ. **අස්ගිරි තල්පතට** අනුව පොළොන්නරුව නිවැසි මහාසාමි ප්‍රධාන භික්ෂු කණ්ඩායමක් රාමඤ්ඤ දේශයට ගිය බව කියයි.[46]

පොළොන්නරු සමයේ දී දළදා වහන්සේ පිළිබඳ විශ්වාස හා ඇදහිලි වැදගත් වූ අතර දළදා වහන්සේ පාලකයෙකුට අයත්වීම රාජ්‍යමය වශයෙන් නීතිමය උරුමයක් තිබෙන බවට සම්මතයක් ද ගොඩනැඟිණි. දළදා වහන්සේ ජීවමාන වූ බුදුරජාණන් වහන්සේ ලෙසින් සැලකූන අතර

41. කප්රුක් සේ සර හා මහදන් පවත්වා දළදා පාත්‍රා ධාතුන් වහන්සේට උරෙහි දා නිශ්ශංක දළදාගෙ කරවා අනන්ත වස්තු පරිත්‍යාග කොටැ පූජාකැවා බොහො ගම්බිම් (වෙරවැස්සන්) පුදා වදාල පරිද්දෙන මතුවන රජදරුවනුදු රක්ෂා කරනු මැනවි EZ. Vol. II p.87
42. රාජාවලිය පි.68; EZ, Vol. II p. 93
43. ගහෙත්වා පත්තධාතුං ද දාඨා ධාතුංඤ්ච සප්පුනො රී නික්ඛමිත්වා මහාථෙරා සබ්බෙ වාචිස්සරාදයො, එම, පරි 79, ගා. 17-18; පූජාවලිය, පි. 735
44. පූජා, පි. 735 Upasakajinalanka ed H. Saddatissa Thero, London: PTS, 1955, see verses in Colophon.
45. උඃපූම, පරි. 79, ගාථා 19 - 22
46. අස්ගිරි තල්පත, සංස්. මැන්දිස් රෝහණධීර, ගංගොඩවිල; විද්‍යෝදය විශ්වවිද්‍යාලය මුද්‍රණාලය, 1969, පි. 5.

බෞද්ධාගම පිළිබඳව තමාගේ ඇති දැඩි භක්තිය ප්‍රදර්ශනය කිරීමක් ද විය. එමෙන් ම අති පූජණීය වස්තුවක් වූ දළදා වහන්සේ සම්බන්ධ වූ සාම්ප්‍රදායික කටයුතු මනාව ඉටු කරමින් ඊට නිසි ආරක්ෂාව සැලසීම මත භික්ෂූන්ගේ හා මහජනතාවගෙන් පාලකයාට ලැබුණ සහාය ඔහුට බියෙන් හා සැකෙන් තොරව රට පාලනය කිරීමට මහත් ආශිර්වාදයක් මෙන්ම ශක්තියක් ද විය. මෙම අදහස පසු කාලය දක්වා ම මෙරට දේශපාලන නායකත්වය හැඩ ගැස්වීම කෙරෙහි ඍජුවම බලපාන ලද බව ඓතිහාසිකව විමර්ශනය කරන විට පෙනී යන කරුණකි.

## නිරිත දිග රාජධානි හා දළදා පූජා

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ දේශපාලනික හා ආගමික ඉතිහාසයේ වැදගත් කාල පරිච්ඡේදයක් ලෙසින් පොළොන්නරු පාලන සමය සනිටුවහන් වුව ද කාලිංග මාඝගේ ග්‍රහණයට රජරට ප්‍රදේශ නතුවීමත් සමඟ ආගමික වශයෙන් මෙන් ම ජාතික වශයෙන් ද පරිහානිය ලක්ෂණ ඉස්මතු වේ. එනමුත් මලය දේශයෙන් බිහි වූ විජයබාහු කුමරු දේශයේ නිදහස පතා ඉදිරිපත් වීමත් සමඟ සිංහලයනට මෙන්ම භික්ෂූනට ද සැනසුම් සුසුමක් හෙළීමට අවස්ථාව උදාවිය. ඇතිව පැවැති විජාතික බලය යටපත් කරමින් මලය දේශයට අයත් දඹදෙණි අගනගරය කරගත් තෙවැනි විජයබාහු කුමරු එහි නායකත්වයට පත්විය.[47] දේශීය පාලකයාගේ දුර්වලතාවයත් විදේශීය ආක්‍රමණ නිසාත් දේශපාලන ක්ෂේත්‍රයේ මෙන්ම ශාසනය තුල ද පරිහානිය ලක්ෂණ ඉස්මතු වෙමින් පැවති හෙයින් එම පාර්ශවයන්හි ඉදිරි පැවැත්ම අරබයා විශාල කාර්යයභාරයක් ඉටු කිරීමට තෙවැනි විජයබාහු රජුට සිදුවිය. කාලිංග මාඝගේ බලය මර්ධනය කොට දඹදෙණිය අගනගරය පාලන කේන්ද්‍රස්ථානය බවට පත් කරගත් තෙවැනි විජයබාහුගේ (ක්‍රි.ව. 1232 - 1236) ආරාධනය මත ඉන්දියාවට වැඩම කොට සිටි භික්ෂූන් මෙරටට වැඩම කරවා දළදාව ද දඹදෙණි පුරවරයට වැඩම කරවීමට කටයුතු යෙදීය. ආරක්ෂාව සඳහා මේ වන විට කොත්මලේ ප්‍රදේශයේ සඟවා තිබූ පාත්‍රා ධාතුව හා දළදාව පෙරළා වැඩමවා බෙලිගල ගොඩනංවන ලද මාළිගයේ තැන්පත්

47. ථූපවංශ, පරි. 79, ගාථා. 10 - 16

කරලීමට අවශ්‍ය මූලික පියවර රජු විසින් ගනු ලැබීය. මේ සම්බන්ධිතව භික්ෂූන් අතින් විචාරා උන්වහන්සේලා සමග රජු කොත්මලේ ප්‍රදේශයට ගොස් දළදා වහන්සේ සඟවා තැබූ ස්ථානයේ දී පූජාවක් පවත්වන ලද බවත් එහිදි ඔහුට දළදා වහන්සේ දැක ගැනීමට හැකි වූ බවත් චූලවංසය සඳහන් කරයි. කොත්මලේ ප්‍රදේශයේ සිට වැඩම කරනු ලැබූ දළදාව වැඩි ආරක්ෂාව පතා බෙලිගල ඉදිකළ ආරක්ෂිත මාළිගයකට තැම්පත් කරනු ලැබීය.[48]

දළදාව හා පාදාව කොත්මලේ සිට මහත් පෙළහරකින් යුතුව ගම් නියම් ගම් හා පුරවරයන් හරහා දඹදෙණියට වැඩම කරවා මතු කල්හි කිසිදු උවදුරක් ඇති නොවනු පිණිස දළදාව හා පාදාව තැම්පත් කළ යුතු යැයි කල්පනා කළ රජු බෙලිගල පර්වතය හාත්පසින්ම ප්‍රාකාර ද්වාර කොෂ්ටාදියෙන් ආරක්‍ෂා කොට එහි දෙව් විමනක් සදිසි දළදා මැඳුරක් කරවා ඒ ආශ්‍රිත නන් අයුරු ප්‍රසාද මණ්ඩපාදියත් ගොඩනංවා රාත්‍රී ස්ථාන හා දිව ස්ථාන සහිත සංඝාරාමයන් ද කරවා ධාතුසරය තුළ උත්සව ශ්‍රීයෙන් යුතුව දළදා වහන්සේ පාදාව වඩා හිඳුවා තිබේ. දළදා වහන්සේ රැක්ම සඳහා පවරනු ලද භික්ෂූන් විෂයෙහි සඟ ආරාම දානය කොට ද නිති දන්වැට තබ්බවා කළ යුතු පූජා කටයුතු ඉටු කළේය. දිනපතා දායුගල විෂයෙහි මනහර පූජාවන් පැවැත්වීම කෙරෙහි ව්‍යවස්ථාවක් ද රජු විසින් පනවන ලදි. රජ මාළිගය රැකවල් කළ හමුදාවට සමාන හමුදාවක් ද දළදාව හා පාදාව සුරකීම පිණිස පත් කළ බව ද **චූලවංශය** කියයි.[49]

ඔහුගෙන් පසු නායකත්වයට පත් දෙවැනි පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1236 - 1270) විසින් දවසට තෙවරක් දළදාව වැඳීම පිණිස බිල්ල පර්වතයෙන් ජම්බුදොණියට දළදාව වැඩමවා සිය මාළිගයේ අසල ඉදිකළ තෙමහල් මන්දිරයක දළදාව තැම්පත් කළ බව වංසකථාව කියයි.[50] මෙසේ වැඩම කරනු ලැබූ දළදා වහන්සේ මන්දිරය මධ්‍යයෙහි මහර්ඝනීය ආසනයක් කරවන ලද

48. ආකාසෙ බිල්ලසෙලං සමන්තො යථාවෙරිමනුස්සෙහි භුවි ගන්තුං න සක්කතෙ පාකාරගොපුරාදීහි කථා කත්‍වා සුරක්ඛිකං, ඌපූම, පරි 79, ගා. 30 - 34
49. එම
50. අන්තවො භවනස්සෙව සන්තිකෙ ධරණීපති දන්තධාතු සරං එම්මං කාරාපෙසි, එම, පරි. 80, 8 -9

බවත් මැණික් හා රන් රිදී කරඬු කරවා දළදාව එහි තැම්පත් කොට තිබේ. දළදා මාළිගයේ පටන් නගරය දක්වා සියළු තැන් අලංකාර කොට සිය හස්තයෙන්ම දළදාව ගෙන මහසඟන මැද සත්‍යක්‍රියාවක් ද කළ බවත් එහි දළදා වහන්සේගේ යහපත් ප්‍රාතිහාර්යයක් මට දක්නට ලැබේවා යන්න පැතූ බවත් කියවේ. ඒ ක්ෂණයෙන් රජුගේ අතින් නික්මුණු දළදා වහන්සේ ෂට්වර්ණයෙන් අලංකෘත වූ බුදුරදුන්ගේ රුව මවා සියළු නගරයම ඒකාලෝක කොට නැවතත් රජුගේ හස්තොපගත වූ බවත් ඉන් මහත් පූජාවන් දළදා වහන්සේ වෙත පැවැත්වූහ. ඉන් මහත් සතුටට පත් දෙවන පරාක්‍රමබාහු නිරිඳුන් තමාගේ ඔටුන්න ඇතුළු සිවුසැට ආභරණවලින් දළදා වහන්සේට මහත් පූජාවන් පවත්වා නැවත මිණිමුවා කරඬුවෙහි තැම්පත් කළ බවත් පසුව කරඬුව රන් කරඬුවක හා රජතමය කරඬුවක් ද බහා දළදා මළිගයේ තැම්පත් කළ බව **චූලවංශය** කියයි.[51]

දෙවැනි පරාක්‍රමබාහු තමා උපන් සිරිවර්ධන පුරයට දළදා වහන්සේ වසරක් පාසා වැඩම කරවා තෙමසක් මුළුල්ලේ මහජන ප්‍රදර්ශන ද පවත්වා ඇති අතර සිය පියා වූ තෙවැනි විජයබාහු රජු ඉදි කළ විජය සුන්දරාරාමයට ද දළදාව වැඩමවා ඇත.[52] ශ්‍රී විජයසුන්දරාරාම නැමැති විහාරය කොටු පවුරු කරවා එහි මහල් තුනකින්ද සැදි ධාතු මන්දිරයක් ද අභිනවයෙන් ඉදිකරන ලද බවත් එහි දංෂ්ට්‍රාධාතුව මහාර්ග වූ උස් පර්යංකයෙන්හි වඩා හිඳුවා සකල සම්පත් සිද්ධිදායක වූ රත්නත්‍රය කෙරෙහි මහා පූජාවන් සත්දිනක් රජු විසින් පවත්වා තිබේ. වංසකථාව දක්වන ආකාරයට තෙමහල් දළදා මන්දිරයකි. මෙම මන්දිරය ද පසුකාලයේ මහනුවර රාජසමයේ දී මීගස්තැන්නේ අදිකාරම් විසින් ප්‍රතිසංස්කරණය කොට ඇත.

විජයසුන්දරාරාමයේ ඇති චෛත්‍ය ද දළදා වහන්සේ හා සම්බන්ධය. විසිතුරු ලෙසින් රජතමය ආකාරයට නිමවන ලද චෛත්‍ය ගෘහ අභ්‍යන්තරයට දළදා වහන්සේ හා පාදාව වැඩමවා මහත් පූජාවන් පවත්වන

51. එම, පරි. 80, ගා. 11 -14 දළදා සිරිත, පි. 44
52. එම, ගා. 36 - 43

ලද බව **දඹදෙණි කතිකාවත** කියයි.[53] එමෙන්ම විජයසුන්දරාරාමයට දළදා වහන්සේ වැඩම කළ අවස්ථාවේ එහි දී දළදා වහන්සේගේ ප්‍රාතිහාර්යයන් දක්නට ලැබුණු බව වංසකථාව සඳහන් කරයි. **දඹදෙණි** අස්නට අනුව විජයසුන්දරාරාමයේ ඉදිකළ මැදුරේ දළදා වහන්සේ දොළොස් වසක් සිටි බව දැක්වේ.[54] විජයසුන්දරාරාමයේ ඇති පුරාණ නටබුන් පිරික්සන විට ද පෙනී යනුයේ එම අවධියේ සිට ඓතිහාසික ස්ථානයක් ලෙසින් මෙම ස්ථානය පැවති බවය.

සිවුවැනි විජයබාහු විසින් (ක්‍රි.ව. 1270 - 1277) දළදාව හා පාදාව සිය අභිෂේක අවස්ථාවේ දී පෙරළා පොළොන්නරුවට වැඩමවා අටදාගෙයි තැම්පත් කොට ඇත.[55] පොළොන්නරුව නැවත අත්පත් කර ගැනීම සලකුණු කිරීම අරඹයා මෙසේ කළ බව ඇතැම්හු විශ්වාස කරති. පළමුවැනි බුවනෙකබාහු (ක්‍රි.ව. 1277 - 1384) රජු විසින් සිය අගනගරය යාපහුවට මාරුකිරීමෙන් පසු දළදාව හා පාදාව ද පොළොන්නරුවේ සිට යාපහුවේ සුන්දරගිරි පර්වතයේ ඉදිකළ ශෛලමය මන්දිරයකට වැඩමවා පුද සත්කාර කළ බව **දළදා සිරිත** දක්වයි.[56] බුවනෙකබාහුගෙන් පසු එල්ල වූ පාණ්ඩ්‍ය ආක්‍රමණයේ දී ආක්‍රමණිකයන් විසින් දළදාව ඉන්දියාවට ගෙනයනු ලැබූ මුත් තෙවන පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1387 - 1393) ඉන්දියාවට ගොස් සාකච්ඡා මාර්ගයෙන් දළදාව හා පාදාව ලක්දිවට වැඩමවා ගෙනවිත් පෙරළා පොළොන්නරුවේ අටදාගෙහි තැම්පත් කොට පුද පූජා පැවැත්වීය.[57]

පාලන මධ්‍යස්ථානය කුරුණෑගල පුරයට සංකේන්ද්‍රගත වීමත් සමඟ පොළොන්නරුවේ වැඩ සිටි දළදා වහන්සේ දෙවැනි බුවනෙකබාහු රජු විසින් (ක්‍රි.ව. 1293 - 1302) කුරුණෑගලට වැඩමවා මාළිගය අසල ඉදිකරන ලද

53. දඹදෙණි කතිකාවත, කතිකාවත් හා සඟරා, සංස් ඩී.බී. ජයතිලක, කතිකාවත් සඟරා, කොළඹ. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1984 (නව මුද්‍රණය) පි. 8- 25, ඒ.බී. සුරවීර, සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1985, පි. 33 -35
54. දඹදෙණි අස්න, පි. 36
55. එම, පරි. 87, ගා. 6 -45
56. දළදා සිරිත පි. 70
57. ඌපුම. පරි. 88, ගා. 46 -56

මනරම් මැඳුරක තැම්පත් කොට ඇත.[58] සිවුවැනි පරාක්‍රමබාහු රජු විසින් පසුව මාළිගය අසල තෙමහල් ගොඩනැගිල්ලක දළදා වහන්සේ නැවත වඩාහිඳුවා මහත් පූජෝපහාර දක්වා තිබේ. එමෙන් ම දළදා වහන්සේ වෙනුවෙන් කළ යුතු පුද පූජා හා සත්කාර සංවිධානය කළ මෙම රජු ඒ සඳහා නීතිමය ව්‍යවස්ථා තිස් අටක් ද පනවන ලදී.[59]

සිවුවැනි බුවනෙකබාහු (ක්‍රි.ව. 1341 - 1351) විසින් ගම්පලට සිය පාලන මධ්‍යස්ථානය මාරු කිරීමත් සමඟ ගම්පල නියම්ගම්පාය විහාරස්ථානය වෙත දළදා වහන්සේ වැඩමවාගෙන ගොස් ඇති බව සාහිත්‍යගත තොරතුරු හා විගුලවත්ත සෙල්ලිපිය දක්වන තොරතුරුවලින් සනාථ වේ.[60] ගම්පල විසූ පස්වැනි බුවනෙකබාහු විසින් රිදී හත්දහසකින් ධාතු කරඬුවක් සාදා දළදා වහන්සේට විශේෂ පූජාවක් ද කළ බව ඉතිහාසගතය.[61] **අස්ගිරි තල්පත** දක්වන ආකාරයට ගම්පල සිට වීරබාහු කුමරු විසින් දළදා වහන්සේ කෝට්ටේ රාජධානිය වෙත ගෙන ආ බව දැක්වේ.[62] සවැනි පරාක්‍රමබාහු සමයේ දී ශ්‍රී ජයවර්ධනපුර ඉදිකළ අලංකාර මණ්ඩපයක දළදා වහන්සේ වැඩ සිටි ආකාරය සංදේශ සාහිත්‍යයෙන් සනාථවන කරුණකි.[63] කෝට්ටේ තිබූ පස් මහලින් යුත් ගොඩනැගිල්ල රජ මැඳුර වූ අතර කඳු ගැටයක් මත ඉදිකළ තෙමහල්පාය දළදා වහන්සේ වෙනුවෙන් ඉදිකොට ඇත. ආක්‍රමණික ප්‍රහාර හමුවේ විනාශයට පත්ව ඇති මෙම ගොඩනැගිල්ලේ නටඹුන් අද දක්නට නොලැබුණ ද අනුරාධපුර හා පොළොන්නරු යුගවල දක්නට ලැබෙන ආයාත චතුරස්‍රාකාරයට එම ගොඩනැගිල්ල නිමවා තිබෙන්නට ඇතැයි මේ ගැන අදහස් දක්වන ඊ.ඩබ්. පෙරේරා අදහස් කරයි.[64] දළදා මාළිගය අසල සංඝාරාමයක් තිබූ බව **පරෙවි සන්දේශයෙන්** සනාථ වේ.[65] එහි වනරතන නම්

58. දළදා සිරිත, පි. 74.
59. ඌපුම, පරි. 88, ගා. 68-75, දළදා සිරිත, පි. 74 - 77
60. ASCAR, Vol. XIX, 1892, p.97. දළදා සිරිත, පි. 43.
61. ඌපුම, පරි. 80, ගා. 12
62. අස්ගිරි තල්පත, පි. 21
63. සැළලිහිණි සංදේශය, කව 17, හංස සංදේශය, කව 46, ගිරා සංදේශය නව 50, පරවි සංදේශය, කව 43
64. E.W. Perera, "Age of Parakaramabhahu VI," JRAS (SB), Vol. XXII, No'63. p.14.
65. පරෙවි සංදේශය, කව 45

නායක භික්ෂුවක් දළදා මාළිගය අසල තිබූ විහාරයක වැඩ සිටි බව දැක්වීමෙන් ඒ බව සනාථ වේ.

පෘතුගීසින්ගේ අණසකට කෝට්ටේ රාජධානියට නතුවීමත්, ධර්මපාල වැනි රූකඩ පාලකයන් පාලනයට පත්වීමත් නිසා දළදා වහන්සේට නිසි ගරුත්වයක් නොමැතිවීම මත හිපිටියේ දිවෙනරාළ විසින් දළදා වහන්සේ සීතාවකට වැඩම කරවනු ලද අතර දෙල්ගමු විහාරයට වැඩමවා සඟවා තබන ලද බව කියැවේ.[66] පෘතුගීසි ලේඛනවල[67] මෙම කාලයේ දී දළදාව විනාශ කරන ලද බව සඳහන් වන මුත් එම තොරතුරු කිසිදු සත්‍යයෙන් තොර බව පැහැදිලිය.

කන්ද උඩරට රාජධානි සමය වන විට දළදා වහන්සේ හා දේශපාලන අධිකාරීත්වය අතර සම්බන්ධය වඩාත් සමීපව දැකිය හැකිය. එම අවධිය තුළ නායකත්වයට පත් සෑම පාලකයෙකුම පාහේ දළදා වහන්සේ වෙනුවෙන් ඉටු කොට ඇති පුද පූජාවන් තුළින් මෙම අදහස වඩාත් තහවුරු වේ. දේශිය මෙන් ම විදේශිය සම්භවයකට උරුමකම් කියූ එම අවධියේ විසූ පාලක පිරිස් මෙසේ දළදා වහන්සේ වෙනුවෙන් ජනප්‍රසාදය දිනා ගැනීම පිණිසත් දළදා වහන්සේ රැක ගැනීමත් වගකීමක් කොට සැලකූ බවය.

දළදා වහන්සේ උඩරටට ගෙන ඒම සම්බන්ධව කථා පුවත් කීපයක් ම මූලාශ්‍රවල දක්නට ලැබේ. එක් ජන කථාවක පොල්ගස්අංගේ හිමියන් කොනප්පුබණ්ඩාරට උදව් කිරීමට හා ඇතිව පැවති අප්‍රසාදය නැති කරලීමට ගත් එක් මුල් පියවරක් ලෙසින් දළදාව ඔහු ලවා මැද මහනුවරට ගෙන ආ බව දක්වයි. කොනප්පු බණ්ඩාරයන්ට ජනතා සහාය ලබාදීමට සූක්ෂම ක්‍රමයක් කල්පනා කළ මෙම හිමියන් ඒඅවධිය වන විට සීතාවක රාජසිංහ රජුට බියෙන් වනාන්තරගතව සිටි දෙවනගල රතනාලංකාර හිමියන් ද මැද මහනුවරට වැඩම කරවා උන්වහන්සේගේ උදව්වෙන් දළදා වහන්සේද

66. දළදා වංසය,36, සුළු රාජාවලිය, සංස් පී.ඩී. ඇස්. ජයවර්ධන, බුත්ගමුව, 1941, පි.21

67. Wikramasuriya, G.S. Architectural Heritage of a Lost City" "Ancient Ceylon, No.6, 1986, 99. 275 - 312" Queyroz Ferno, The Temporal and Spritual Conquest of Ceylon, trans, S.G. Perera, Colombo, 1930.

දෙල්ගමුව වෙහෙරින් මැද මහනුවරට වැඩමවාගෙන එන ලදි. මෙම කටයුතුවලදී කොනප්පු බණ්ඩාරයන්ගේ පූර්ණ සහය ලබා ගෙන තිබේ. ඒ අනුව ඔහු කෙරෙහි ජනතාවගේ පැවති අප්‍රසාදය පහව ගිය අතර උඩරට වැසියෝ කොනප්පු බණ්ඩාරයන්ගේ පැත්ත ගත් බව ජන කථාවක දැක්වේ.[68] පෘතුගීසි ජාතික ලෝපැස් ද සෞසාගේ මූලිකත්වයෙන් කොනප්පු බණ්ඩාර හා දෝන කතරිනා කුමරිය ද පෙරටු කරගෙන ක්‍රි.ව. 1594 දී උඩරට රාජ්‍යය ලබාගැනීමේ අරමුණින් පෘතුගීසි සේනාවක් ද කන්ද උඩරටට පැමිණියේ ය. එහි දී කොනප්පු බණ්ඩාරයන් වටා පෙළ ගැසුණු දේශීය බට පිරිස් දන්තුරේ සටනේ දී ද සූසා පරාජය කරන ලදී. පසුව දෝන කතරිනා කුමරිය හෙවත් කුසුමාසන දේවිය විවාහ කරගත් කොනප්පු බණ්ඩාරයන් සෙංකඩගල නුවර (මහනුවර) විමලධර්මසූරිය නමින් නායකත්වයට පත්විය. දළදා වහන්සේ ද දෙල්ගමුවේ සිට සංකඩගල නුවරට වැඩම කරවා සිය මාළිගයට සමීපයෙන් දෙමහල් මැඳුරක් කොට වඩා හිඳුවා දිනපතා පුද පූජාවන් පවත්වනු ලැබූ බව මහාවංසය කියයි.[69] දෙවන විමලධර්මසූරිය රජු මහල් තුනකින් යුතු දළදා මැඳුරක් සාදා දළදා වහන්සේට මහත් හරසර දක්වා ඇත.[70.] දෙවැනි රාජසිංහ රජුද[71] නරේන්ද්‍රසිංහ[72] විජයරාජසිංහ[73,] කීර්ති ශ්‍රී රාජසිංහ[74] රාජාධිරාජසිංහ[75] ශ්‍රී වික්‍රමරාජසිංහ[76] වැනි පාලකයන් මහත් හරසරින් හා බැතිබර සිතින් යුතුව දළදා වහන්සේ රැකගැනීමට කටයුතු කළහ. සරණංකර සඟරාජයන් වහන්සේගේ උපදෙස් මත වාර්ෂිකව දළදා වහන්සේ වෙනුවෙන් සෙංකඩගල මහනුවර පෙළහරක් පළමුවෙන් පැවැත්වීමේ ගෞරවය ද හිමිවනුයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුහටය. දළදා වහන්සේ එතැන් පටන් 1815 දක්වා උඩරට

68. තුන්දෙණිය, එම්. ගුණවංශ හිමි, මැදරට ජනකතා 1, නුගේගොඩ තරංජි ප්‍රින්ටර්ස්, 1998, පිටු. 119 - 120
69. සපරග්ගාමරට්ඨස්මිං ලබුවගාමම්හි වඩ්ඪිතං සන්තධාතුං ගාහාපේත්වා අත්තනො නගරෙ මුහෙ රාජගෙහසම්පම්හි භූමිභාගෙ වරෙ සුභෙ.... ද්විභූමකං ධාතුගෙහං කාරාපෙත්වා .... ඌපුම, පරි 93,ගා. 11-13
70. එම, පරි 95, ගා. 4 - 5
71. එම, පරි 95, ගා. 25
72. එම, පරි 95, 34, 38
73. එම, පරි 96, ගා. 38-40
74. එම, පරි 98, ගා. 38
75. එම, පරි 95, ගා. 4 , 14
76. එම, පරි 95, ගා. 20

නායකත්වයට පත් සෑම පාලකයෙක්ම දළදාව රැක ගැනීමට මහත් වෙහෙසක් ගත් අතර පරසතුරන් අතට දළදාව පත් නොවීමට වග බලාගත්හ. ඒ අනුව සතුරු උවදුරු ඇති වූ අවස්ථාවල මැදමහනුවර, හඟුරන්කෙත, අරත්තන, කිතුල්පේ වැනි ස්ථානවල දළදාව සඟවා තැබීමට උත්සාහ ගත්හ. එමෙන්ම 1815 දී ඉංග්‍රීසින් අතට උඩරට රාජධානිය පත්වීමත් සමඟ සිය බලය බෞද්ධ ජනතාව අතර තහවුරු කරගැනීම අරඹයා දළදාවේ භාරකාරත්වය ද සියතට ගැනීමට කටයුතු කළේය. ඉංග්‍රීසීන්ට එරෙහිව වර්ෂ 1818 දී දියත් වූ වෙල්ලස්ස කැරැල්ලේ දී විල්බාවේ රාළ තමා රජු හැටියට හඟුරන්කෙත දී ප්‍රකාශයට පත් කළේ ද දළදාව ප්‍රදර්ශනය කරමිනි.[77] එමෙන්ම දළදාවට නිසි සැලකුම් නොලැබෙන බව දත් වාරියපොල සුමංගල හිමියන් දළදාව පැහැරගෙන ගිය බවත් එම අවධියේ දී ඉංග්‍රීසීන් විසින් දළදාව සොයා ගැනීමට ගත් උත්සාහයෙන් පැහැදිලි වනුයේ දළදාව සිය බලය තහවුරු කර ගැනීමට කොතෙක්දුරට හේතුවී ද යන්නයි. මෙහිදී දළදාව කොතෙක් රාජ්‍ය බලය හා බැඳි තිබුණේ ද යන්න වටහා ගැනීමට ජෝන් ඩොයිලි දක්වා ඇති මේ පුවත වැදගත් ය. එනම් "ඇත්ත වශයෙන් ම ඉංග්‍රීසි පාලකයෝ දැන් රටේ පාලකයෝ වෙති. ඔවුන්ට දැන් දළදා වහන්සේගේ අයිතිය ඇති හෙයින් සතර රාජධානියම පාලනය කිරීමට අයිතියක් ද තිබේ. අවුරුදු දෙදහසක කාලයක් තුළදී දළදා වහන්සේ අපගෙන් ඉවතට ගන්නා ලද ප්‍රථම අවස්ථාව මෙය වේ යැයි මිනිස්සු කියති."[78] යන්නෙන් ගම්‍ය කරනුයේ රාජ්‍යත්වය හා දළදාව කෙතෙක් බැඳී තිබුණේ ද යන්න මෙන් ම දළදාව ආරක්ෂා කිරීම රජුගේ පරම යුතුකමක් සේ ජනතාව සැලකූ බවය. දළදා වහන්සේගේ තේවා කටයුතුවලදී රජු මූලිකත්වය ගත්ත ද වර්ෂ 1814 දී කපුවත්තේ අධිකාරම් දියවඩන නිළමේ නිලයට පත්වීමෙන් පසු එතැන් පටන් දළදා වහන්සේගේ ගිහිභාරකරු ලෙසින් දියවඩන නිළමේතුමන් සැලකිය.

මෙම තොරතුරු සලකා බලන විට ක්‍රිස්තු වර්ෂයෙන් පසු බලයට පත් සෑම

77. විමලානන්ද තෙන්නකෝන්, උඩරට කැරැල්ල II, කොළඹ, 1962, පි. 140

78. Jhon Doily, An Account of the illustrated Survey of Ancient Monument in that Island, London, 1821, pp. 368 - 369

පාලකයෙකු සිය බලය හා දේශපාලන ස්ථාවරත්වය ගොඩනගා ගැනීම පිණිසත් භික්ෂූන්ගේ හා ජනතාවගේ සහාය ලබාගැනීම පිණිසත් තමාගේ නායකත්වයේ අභිමානනීයත්වය වඩාත් තහවුරු කිරීම සඳහාත් දළදාව තමාගේ භාරයේම තබාගනිමින් දළදාව ආරක්ෂා කිරීමටත් පුදපූජා හා වතාවත් කිරීමටත් පෙළඹුන බව පැහැදිලි ලෙසින් ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ විද්‍යාමානව පවසති.

# ශ්‍රී ලංකාවේ අග නගරය තුළ වැඩ සිටි දළදා වහන්සේ

**අජිත් තලවත්ත**
කථිකාචාර්ය - රජරට විශ්වවිද්‍යාල

සිංහල බෞද්ධ ජනතාවගේ පමණක් නොව ලෝකවාසීන්ගේ ගෞරවාදරයට පත්වන පූජණීය වස්තුවක් වන්නේ දළදා වහන්සේ ය. ශ්‍රී ලංකා ද්වීපයේ වැඩ සිටින සර්වඥධාතුන් වහන්සේලා අතුරින් ශ්‍රී දන්ත ධාතුන් වහන්සේට වැදගත් තැනක් හිමි වේ. "යමෙකු ධර්මය දකීද ඔහු මා දකී" යන ගෞතම බුද්ධ වචනයට අනුව සුවාසූ දහසක් ධර්මස්කන්ධය ශ්‍රී මුඛයෙන් දේශනා කළ බැවින් දළදා වහන්සේට මෙවැනි සුවිශේෂ වැදගත්කමක් හිමිව ඇත. දළදා වහන්සේ මෙරටට ලැබුණ දින සිට වර්තමානය දක්වාම රාජ්‍ය අනුග්‍රහය මත බෞද්ධ අනන්‍යතාව ප්‍රතිමූර්තිමත් කරන්නේ එමඟින්ය.

කීර්ති ශ්‍රී මේඝවණ්ණ (ක්‍රි.ව. 301 - 328) පාලන සමයේ හේමමාලා සහ දන්ත කුමරුන් විසින් ගුහසිව රජුගේ උපදෙස් මත බ්‍රාහ්මණ වෙස් ගෙන දළදාව රැගෙන ලංකාවට පැමිණ ඇත. ඔවුන් දෙදෙනා ඉන්දියාවේ තාම්‍රලිප්ති වරායෙන් පිටත්ව ලංකාවේ නැගෙනහිර පිහිටි ලංකා පට්ටනයට පැමිණියහ. මහාවංශය, දාඨාවංශය සහ දළදා පූජාවලියේ සඳහන් කෙරෙන තොරතුරුවලට අනුව අනුරාධපුරයට දළදාව වැඩම කළ බව දැනගත් රජු ඉමහත් ප්‍රීතියට පත්ව මැඳුරක් ඉදිකර දළදා වහන්සේ එහි තැන්පත් කර ඇත. අනුරාධපුරයේ "ධම්මචක්කගේහ" නම් මන්දිරයේ සිට අස්ගිරිය දක්වා වැඩම කරවා, කරන ලද පෙරහැර ශ්‍රී ලංකාවේ ප්‍රථම ඓතිහාසික දළදා පෙරහැර බව මහා වංශයේ 37 වන පරිච්ඡේදයේ 92 - 97 ගාථාවලින් පැහැදිලි වේ. මෙසේ මුල්වරට දළදා වහන්සේ පිළිබඳ ඉමහත් වගකීමක් සහ ආරක්ෂාවක් සැලසීම මෙරට රජවරුන්ගේ පරම වගකීම වූ හෙයින් ඔවුහු දිවි දෙවැනි කොට දළදාව ආරක්ෂා කළහ. ඒ අනුව ශ්‍රී මහා බෝධියට අනතුරුව දළදාව

මෙරටට හිමිවීම සුවිශේෂී අවස්ථාවක් ලෙස සැලකීමට හැකිය.

ශ්‍රී ලංකා ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී වැදගත් මූලාශ්‍රයක් ලෙස පාහියන් ගමන් වාර්තාව සැලකීමට හැකි වේ. මහානාම රාජ කාලයේ (ක්‍රි.ව. 400 - 428) අනුරාධපුරයට පැමිණි චීන ජාතික පාහියන් භික්ෂුව දළදා වහන්සේ හා බැඳුණු ඉතිහාසයේ කරුණු පෙන්වා ඇත. නූතනයේ ථේරවාදී බෞද්ධ භික්ෂූන්ගේ භාරකාරත්වය යටතේ ආරක්ෂා වන දළදා වහන්සේ එදා වැඩ සිටියේ මහා විහාරයට විරුද්ධ අභයගිරියේය. අභයගිරියේ පැවති දළදා ප්‍රදර්ශනය මෙන්ම දළදා පෙරහැර පැවැත්වූ ආකාරය මැනවින් වාර්තා කොට ඇත.

කිත්සිරිමේඝ රාජ සමයේ දී දළදා වහන්සේ වැඩ සිටි මැඳුර අගනගරයට කේන්ද්‍රගතවීම පසු කාලීනව දක්නට ලැබේ. ධාතුසේන රජු (ක්‍රි.ව. 455 - 475) දළදා මැඳුර ප්‍රතිසංස්කරණය කර අගනා කරඬුවක්ද පළමුවන අග්‍රබෝධි රජු (ක්‍රි.ව. 571 - 604) දළදා මැඳුර අලංකාර කොට ධාතු කරඬුවක්ද පූජා කළ බවට චූලවංශයේ සඳහන් වේ. ඉන් පැහැදිලි වන්නේ පාලකයා දළදාව ආරක්ෂා කිරීම සුවිශේෂී යුතුකමක් සේ සිතා කටයුතු කළ බවකි. අනුරාධපුර අවසාන භාගයේ මෙරටට එල්ල වූ ද්‍රවිඩ ආක්‍රමණ සමඟ දළදා වහන්සේ පිළිබඳ තොරතුරු අප්‍රකටය. හතරවන මිහිඳු රජුගේ (ක්‍රි.ව. 956 - 972) ජේතවන පුවරු ලිපියේ දළදාව හා සම්බන්ධ තොරතුරු අනාවරණය වන්නේ තරමක් දුරට අඩුවෙනි.

ක්‍රි.ව. 1017 මෙම රාජධානිය බිඳ වැටීමෙන් පසු දළදාවේ ආරක්ෂාව පිණිස රුහුණු ප්‍රදේශයේ සඟවා තැබූ බව සඳහන් වේ. ද්‍රවිඩ ආධිපත්‍යයෙන් රට මුදවාගත් පළමුවන විජයබාහු (ක්‍රි.ව. 1055 - 1110) රජතුමා දළදා වහන්සේ වෙනුවෙන් මැඳුරක් ඉදිකර එහි ආරක්ෂාව සඳහා වෙලෙක්කාර භටයින් යෙදූ බවට එම ස්ථානයේ ඇති ලිපිය සාක්ෂි දරයි. එදා වේලෙක්කාර භටයින් කුලියට සේවය කළ විදේශීය පිරිසකි. අප මෙහිදී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ කවර පදනමක් මත මෙම භටයින් යෙදුවාද යන්නයි.

දළදා වහන්සේ හා සම්බන්ධ ඉතා වැදගත් තොරතුරු අපට හමුවන්නේ මහා පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1153 - 1186) රාජ්‍ය සමයේය. විවිධ දුෂ්කරතා මාධ්‍යයේ පරාක්‍රමබාහු අගරජ වූවත් ඒ වන විට දළදාව සුගලා දේවිය භාරයේ පැවිතිණ. දීර්ඝ සංග්‍රාමයක ප්‍රතිඵලයක් ලෙස දළදා වහන්සේගේ භාරකාරත්වය ලබාගත් රජු පාලනයේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගන්නා ලදි. දළදාව වැඩ හිඳුවීමට මැඳුරක්ද ඉදි කළ බවට චූලවංශය සාක්ෂි දරයි. රජමැඳුරේ සිට නගර මධ්‍යයේ වූ දළදා මන්දිරය දක්වා දළදා පෙරහැරක් පැවැත්විණි. මහා අලංකාරව සරසා විචිත්‍රවත් නැටුම් ගැයුම් ඇත් අස් සේනා, ධජ පතාක දරූ ජනතාව මෙන්ම ස්වර්ණාභරණයෙන් සරසන ලද ඇතෙකු පිටනැඟි රජතුමාද පෙරහැරේ ගමන් කර ඇත. මෙම පෙරහැර සිදුකිරීම මගින් දළදාව වෙනුවෙන් චාරිත්‍ර වතාවත් ඉටු කිරීම සිදුවා සේම එමගින් රජුගේ අණසකද පැතිරවීමට හැකිවූ බව පෙනේ.

කාලිංග වංශිකයෙකු වූ නිශ්ශංකමල්ලද (1187 - 1196) ස්වකීය ප්‍රෞඪත්වය තහවුරු කර ගැනීම සඳහා නොයෙකුත් අභියෝගයන්ට මුහුණ දුන්නේය. ජනතාව බදු බර අඩුකර තුලාභාර ලබා දෙමින් ඔවුන්ගේ සිත් දිනා ගත්තේය. බෞද්ධ ජනතාවගේ අනුකූලතාව ලබාගැනීම සඳහා නගර මධ්‍යයේ දළදා මැඳුරක් ඉදිකර ඇත. පැය 60ක් තුළ එම මැඳුර නිම කළ බැවින් "හැටදාගය" ලෙස නූතනයේදී හඳුන්වනු ලැබේ. කාලිංග වංශිකයෙකු පවා දළදාවට මෙතරම් ගෞරව කිරීමෙන් පැහැදිලි වන්නේ රාජ්‍ය බලය තහවුරු කරගැනීමට එය කොතරම් ප්‍රබල සාධකයක් වුවද යන්නයි.

රජරට සභ්‍යත්වය ක්‍රි.ව. 1215 මෙරට මාඝගේ ආක්‍රමණයත් සමඟ විනාශයට පත්වේ. ඔහුගේ කෲර පාලනය තුළින් මෙරට ජනතාව ඉමහත් අභියෝගයන්ට මුහුණ දුන්නේය. එබැවින් දළදා වහන්සේද සඟවා තැබීමට සිදුවිය. එකල දළදාව ආරක්ෂා කළ වාගීෂ්වර හිමියන් කොත්මලේ දළදාව සඟවා ඇත. මාඝ පරාජය කළ සිංහල පාලකයෝ අභිනව අගනගරය ලෙස දඹදෙණිය තෝරා ගත්හ. III වන විජයබාහු (ක්‍රි.ව. 1232 - 1236) බෙලිගල පර්වතයේ දළදා මැඳුරක් ඉදිකිරීමට ක්‍රියා කිරීම ඉතා වැදගත් අවස්ථාවකි.

බෞද්ධාගමේ චිර ජීවනයට කටයුතු කළ II වන පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1236 - 1270) බෙලිගල පැවති දළදාව දඹදෙණිය ආසන්න මැඳුරකට වැඩම කර ඇත. මෙතුමාගේ කාලයේ දළදා පෙරහැර හා ප්‍රදර්ශන පවත්වා තිබේ. විජයසුන්දරාරාමයේ සිට ශ්‍රී වර්ධනපුරය දක්වා ගමන් ගත් බව මහාවංශයේ සඳහන් වේ. පෙරහැර ගමන් ගන්නා මාර්ගය අලංකාරව සැරසූ බවට තවදුරටත් සඳහන් කර ඇත.

සිංහල රාජධානි පර්වත කේන්ද්‍රගතව ආරම්භ වීම පෙන්නුම් කරන අවස්ථාවක් ලෙස යාපහුව හෙවත් සුභ පබ්බතය සඳහන් කළ හැකිය. මෙම පර්වතය මධ්‍යයේ අලංකාර දළදා මැඳුරක් I බුවනෙකබාහු (ක්‍රිව. 1272 - 1284) රජු විසින් ඉදිකර ඇත. නමුත් මෙම යුගයේ දළදා වහන්සේ වෙනුවෙන් පෙරහැර පැවැත්වූ බවට ඓතිහාසික තොරතුරු වාර්තා හමු නොවේ. අඛණ්ඩව පැවැති පෙරහැර මෙම කාලයේද නොවෙනස්ව පවත්වන්නට ඇතැයි අනුමාන කළ හැකිය.

දළදා වහන්සේ පිළිබඳ ඉතා වැදගත් තොරතුරු අන්තර්ගත කෘතියක් වන "දළදා සිරිත" රචනා වන්නේ කුරුණෑගල යුගයේදීය. IV වන පරාක්‍රමබාහු යුගයේ (ක්‍රි.ව. 1302 - 1326) දළදා වහන්සේ වෙනුවෙන් කොත්මලේ මැඳුරක් ඉදිකර පැවැත් වූ දළදා පූජා සම්බන්ධ ව්‍යවස්ථා පද්ධතියක් දළදා සිරිතේ දක්නට ලැබේ. ඊට අනුව පෙරහැර පැවැත්වීමට සතියකට පෙර දළදා මන්දිරයේ වියන් බැඳ සරසා රජු හා මැති අමැතිවරු මල් පූජා කරති. පෙරහැර අවසානයේ දළදා ප්‍රදර්ශනයක් පවත්වා බැතිමතුන්ට වැඳ පුදා ගැනීමට අවස්ථාව සලසා දී ඇත. දළදා පෙරහැරක් විධිමත්ව පැවැත්විය යුතු ආකාරය ප්‍රථම වරට හෙළිවන්නේ දළදා සිරිතෙනි.

කුරුණෑගල යුගයෙන් පසු ගම්පොල දළදා වහන්සේ වැඩ සිටි බවට එතරම්ම තොරතුරු හමු නොවේ. ගම්පොල විචාළ II වන වික්‍රමබාහු රජු සමයේ (ක්‍රි.ව. 1357 - 1374) නිකුත් කළ විගුලවත්ත ලිපිය අනුව දළදා වහන්සේට කුඹුරක ධාන්‍ය පූජා කර ඇත. ඉන් සැක කළ හැක්කේ ගම්පොල යුගයේදී දළදා වහන්සේ වැඩ සිටින්නට ඇති බවයි.

ශ්‍රී ලංකාව අවසන් වරට එක්සේසත් කර VI වන පැරකුම් රාජ්‍ය සමයේදී (ක්‍රි.ව. 1412 - 1467) අලංකාර දළදා මැඳුරක් ඉදිකර පැවති බවට තොරතුරු ලැබේ. එහි දළදා වහන්සේ කරඬු කිහිපයක තැන්පත් කර තිබූ බවට මෙම යුගයේ රචිත සංදේශ කාව්‍යය සාක්ෂි දරයි.

ක්‍රිස්තු වර්ෂ 1505 සිදුවන පෘතුගීසි ආගමනයත් සමඟ ප්‍රචලිත වූ රෝමානු කතෝලික ආගම බෞද්ධාගමට දැඩි තර්ජනයක් එල්ල කළේය. භික්ෂූන් වහන්සේලා ඝාතනය කරමින් බෞද්ධ වෙහෙර විහාර විනාශ කිරීමට පෘතුගීසිහු පියවර ගත්තෝය. ධර්මපාල බෞතීස්ම වීමත් සමඟ මෙතෙක් අගනගරයෙන් බෞද්ධාගමට ලැබුණු රැකවරණය අහිමිවිය. රණකාමී ප්‍රබල රාජධානියක් වූ සීතාවකට දළදා වැඩම කිරීමත් සමඟ එය දෙල්ගමු විහාරයේ තැන්පත් කර ඇත. සීතාවකද බලය අල්ලා ගත් පෘතුගීසින් ස්වකීය සැහැසි බව දියත් කරමින් දළදා වහන්සේ විනාශ කළ බවට පෘතුගීසි ලේඛකයින් විසින් පෙන්වා දෙයි. නමුත් එය කොතෙක් දුරට සත්‍යයද යන්න විචාරශීලිව විමසා බැලිය යුතුය.

දළදා වහන්සේ වටා ගෙතුණු ඉතිහාසයේ ස්වර්ණමය යුගය වශයෙන් හැඳින්විය හැක්කේ ශ්‍රී ලංකාවේ අවසන් දේශපාලන බල කොටුව වූ මහනුවර යුගයය. කන්ද උඩරට නව රජ පෙළපතක් ආරම්භ කළ කොනප්පු බණ්ඩාර හෙවත් පළමුවැනි විමලධර්මසූරිය (ක්‍රි.ව. 1592 - 1604) දෝන කතිරිනා විවාහ කරගෙන රාජ්‍යත්වයේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගත්තේය. ඉන් අනතුරුව දෙල්ගමුවේ වැඩ සිටි දළදාව නුවරට ගෙන්වා මනරම් දෙමහල් මැඳුරක් ඉදිකර එහි තැන්පත් කර ඇත. දෙල්ගමුව විහාරයේ වැඩ සිටි දළදා වහන්සේ මහනුවරට වැඩමවා ගැනීමේදී කළ පෙරහැර කන්ද උඩරට පැවැත්වූ ප්‍රථම පෙරහැර විය. මෙම රජු එවකට නගරයේ ආරක්ෂාව සැලසූ නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි දෙවියන් වෙනුවෙන් ඇසළ පෙරහැර ආරම්භ කරන ලදි.

මෙම රජුගෙන් පසු බලයට පත් සෑම උඩරට පාලකයෙකුම පාහේ දළදා වහන්සේ ආරක්ෂා කරමින් කටයුතු කරන ලද බව පෙනේ. මේ අතර,

සෙනරත් (ක්‍රි.ව. 1604 - 1635) දෙවන රාජසිංහ (ක්‍රි.ව. 1635 - 1687) යනාදි පාලකයින් දළදා මැඳුරට නවාංග ඇතුළත් කරමින් වැඩි දියුණු කළ බවට ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි. පෘතුගීසින් උඩරට ආක්‍රමණය කළ අවස්ථාවන්හිදී දළදා මැඳුර ද විනාශයට පත් විය. එබැවින් දළදා මැඳුරේ මුල් ස්වභාවය විනාශ වන්නට ඇතැයි සිතිය හැකිය. ඇතැම් විචාරකයින් පවසන්නේ වර්තමානයේ අප දකින දළදා මැඳුර වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ සමයේ ඉදිකළ මැඳුර බවයි.

ශ්‍රී ලංකාවේ අවසන් රාජ්‍ය පෙළපත වූ නායක්කාර් රජුන්ගේ පාලන සමයේදී ද දළදා මැඳුරේ ඉදිවීම් සිදු වූ බවට තොරතුරු පවතී. කීර්ති ශ්‍රී රාජසිංහ රජ මැඳුර ප්‍රතිසංස්කරණය කළ අතර ශ්‍රී වික්‍රම රාජසිංහ රජ මැඳුරට නවාංගයක් ලෙස පත්තිරිප්පුව එකතු කිරීම විශේෂ අවස්ථාවකි. මොවුහු උපතින් හින්දු භක්තිකයන් වූවත් රාජ්‍ය පාලනය තහවුරු කර ගැනීමට බෞද්ධාගම වෙනුවෙන් ද පෙනී සිටියහ. එපමණක් නොව සරණංකර හිමියන්ගේ ඉල්ලීම පරිදි සිවු දේවාල පෙරහැරට දළදා පෙරහැරද එක්වන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේය. බෞද්ධ වත් පිළිවෙත් ආරක්ෂා කිරීමට නායක්කර් රජවරු ක්‍රියා කළත් සූක්ෂමව හින්දු සභ්‍යත්වයද ඔවුන් හරහා ක්‍රියාත්මක විය. එවකට ව්‍යාප්ත වූ හින්දු බලපෑම් නූතනයේ පවා විද්‍යාමානව පවතින බව පෙනේ.

ක්‍රි.ව. 1796 මෙරට ආක්‍රමණය කළ බලවත් ජාතිකයින් වූ ඉංග්‍රීසින් ඉතා කෙටි කලකින් ස්වකීය ආධිපත්‍යය ගොඩනගා ගැනීමට සමත් විය. 1815 දී මෙතෙක් ස්වාධීනව පාලන අධිකාරියක් වූ කන්ද උඩරට රාජධානිය ඉංග්‍රීසින්ට නතු විය. 1815 මාර්තු දෙවන දින අත්සන් කළ උඩරට ගිවිසුමේ පස්වන වගන්තියෙන් බෞද්ධ වත් පිළිවෙත් මෙතෙක් සිදු වූවා සේම නොකඩවාම ඉටු කිරීමට වග බලා ගනී. විශේෂයෙන්ම දළදා වහන්සේගේ භාරකාරත්වය ලබා ගැනීමට ඉංග්‍රීසින් දැඩි ප්‍රයත්නයක් දරන ලදි. විදේශීය ජාතීන් ස්වකීය පාලන බලය, අවි බලය යොදවා ආරකෂා කර ගත්තද එහි නීත්‍යානුකූලත්වය තහවුරු කර ගත්තේ දළදාව ස්වකීය භාරයට ගැනීමෙන් අනතුරුවය. දළදා වහන්සේගේ භාරකාරත්වය උඩරට නේවාසික නිලධාරි වූ

ඩොයිලි විසින් දරනු ලැබූ අතර 1847 අගෝස්තු 19 වන දින දළදා පෙරහැර සහ දේවාල පෙරහැරද පවත්වා තිබේ. බටහිර ජාතීන් වූවත් 1847 වන තුරු දළදා වහන්සේට නිසි ආරක්ෂාව බ්‍රිතාන්‍යයෙන් සපයන ලදි. උභය විහාරයන්ට සහ දියවඩන නිළමේතුමාට එහි භාරකාරත්වය 1855 දී ලබාදෙන තුරු නොයෙක් අභියෝග මැද ඉංග්‍රීසින්ගේ අනුග්‍රහයද පැවතුණෝය.

අප මෙතෙක් සිදු කළ සාකච්ඡාව මගින් අනාවරණය වන්නේ දළදා වහන්සේ ක්‍රි.ව. 4 වන සියවසේ මෙරටට ලැබුණු දා සිටම ප්‍රධාන නගරය කේන්ද්‍ර කර ගනිමින් දළදා මැඳුර ඉදිකිරීමට පාලකයා ක්‍රියා කළ බවයි. විශේෂයෙන්ම අනුරාධපුරයේ පටන්ම දළදා වහන්සේ වෙනුවෙන් පෙරහැර පැවැත්වීමේ චාරිත්‍රයද නොකඩවා සිදු කෙරුණු බවද පෙනේ. එදා දළදා වහන්සේ දිවි හිමියෙන් ආරක්ෂා කර ඊට අවශ්‍ය පුද පූජා පැවැත්වීමෙන් මහජන පක්ෂපාතීත්වය ලබා ගෙන රජුගේ තේජස මෙන්ම බල පරාක්‍රමයද මහජනයා හමුවේ ප්‍රදර්ශනය කිරීමට හැකි විය. මෙම ක්‍රියාවලිය එදාට පමණක් නොව වර්තමානයේද ඒ අයුරින්ම ක්‍රියාත්මක වන බව පෙනේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. මහාවංශය, සංස්. ගුණපාල වීරසේකර, අතුල මුද්‍රණාලය, කොළඹ, 1995.

2. දාඨාවංශ, සංස්. සීලාලංකාර හිමි, අලුත්ගම, 1914

3. දළදා සිරිත, වැලමිටියේ සෝරත, ගුණසේන සහ සමාගම, කොළඹ. 1970

4. රජය ආගම සහ අධ්‍යාපනය (බ්‍රිතාන්‍ය යුගය) ඉලංගසිංහ මංගල, කැලණි විශ්වවිද්‍යාලය, මොරටුව

5. සෙංකඩගලපුර ඉතිහාසය, කරුණාතිලක ඒ.ඩී.පී. කැන්ඩි ප්‍රින්ටර්ස්, මහනුවර, 1955

6. සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, කොඩ්රින්ටන් එච්.ඩබ්. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1939

7. ලංකාවේ බුදු සමයේ ඉතිහාසය, රාහුල වල්පොල, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1962

8. අස්ගිරි තල්පත, රෝහණධීර, මැන්දිස්, විද්‍යෝදය විශ්වවිද්‍යාලය, කොළඹ, 1969

9. දළදා ඉතිහාසය හා සංස්කෘතිය, වජිර කඹුරුගමුවේ, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල, 1983

10. සූරවීර, ඒ.වී, සිංහල කතිකාවත් සහ භික්ෂු සමාජය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1962

11. උඩරට රාජධානිය, දේවරාජ ලෝනා ශ්‍රීමතිඃ පරිඃ කුසුම් දිසානායක, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පාදුක්ක, 1997

# දළදා සතර මහා මංගල්‍යය දළදා සංස්කෘතිය හා ජන සමාජය

**මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්,**
අංශාධිපති
සමාජ විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ශ්‍රී ලංකා ඉතිහාසයේ ගමන් මඟ තීරණය කිරීමේ නිශ්චිත සාධකය ලෙස සැළකෙන දළදා වහන්සේ ක්‍රි.ව. හතරවැනි සියවසේදී අප අතට පත්විය. (එතෙක් ජීවමාන බුදුන් වහන්සේ ලෙස සලකනු ලැබුයේ ජයශ්‍රී මහා බෝධීන් වහන්සේය. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ප්‍රමුඛ අටමස්ථානය පිහිටි හෙයින් එම ප්‍රදේශය පිහිටි රට ලෙස හැඳන්විණි. රුහුණු, පිහිටි, මායා ලෙස බෙදී තිබුණු තුන් සිංහලයේ පිහිටි මේවා අයත් ප්‍රදේශය (අභයවර්ධන 1978 : 96) වන්නේ මාතලේ හෙල්වැටි වලින් විහිදී බටහිර ගලාබස්නා දැදුරු ඔයෙනුත් කටුගස්තොටදී මහවැලි ගඟට වැටෙන පිඟාඔයෙනුත්, මහවැලි ගඟේ අවසානයේ මුහුද දකින ත්‍රිකුණාමලයෙනුත් සීමාකරන උතුරු දිසාවට අයත් ත්‍රිකෝණාකාර ප්‍රදේශයයි. දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩමවීමත් සමඟම ඊට  සුවිශේෂ වූ වත් පිළිවෙත් සමුදායක් ගොඩ නැගුණා පමණක් නොව සුවිශේෂ සංස්කෘතික සම්ප්‍රදායක්ද බිහිවිය. එම සංස්කෘතික සම්ප්‍රදාය ජන වහරේත්, ජන ජීවිතයේත් ප්‍රධාන අංග වූ අතර දළදා වහන්සේගේ ඓතිහාසික ගමන් මඟ සමස්ත ශ්‍රී ලංකා ඉතිහාසයේ ගමන් මඟද සනිටුහන් කරනු ලැබීය. ජනතාවගේ ප්‍රධාන වගකීම වූයේ ශ්‍රී දළදා වහන්සේ සුරක්ෂිත කිරීමට හැකි නායකයෙකු රජෙකු බවට පත්කිරීමත් ඔහු ආරක්ෂා කරමින් රජුත් දළදා වහන්සේත් සුරක්ෂිත කිරීමයි. වරින්වර පැමිණෙන සතුරු උවදුරුවලින් දළදා වහන්සේ බේරාගැනීම සඳහා නව අගනුවරවල් සොයා රාජධානි වයඹ දිගට සංක්‍රමණය වූ අතර ඒ පසුපස දළදා සංස්කෘතියක්ද නිතැතින්ම ගමන් කළේය. අවසානයේ මහනුවර රාජධානිය හෙවත් සෙංකඩගල ශ්‍රී ජයවර්ධන පුරවරයෙහි දළදා වහන්සේ බොහෝ කාලයක් වැඩසිටිනු ලබයි. 1593 විමලධර්මසූරිය රජු සමයේ සිට (සෙනෙවිරත්න 2001 : 58) මේ දක්වා වසර 413 ක් හෙවත් සියවස් හතරකුත් වසර 13 ක් සෙංකඩගල පුරවරයෙහි වැඩසිටින දළදා වහන්සේ කන්ද උඩරට සිංහල සංස්කෘතිය

තුළින් ශ්‍රී ලාංකේය අනන්‍යතාවයක් ලබාදෙමින් සලක ලෝකවාසී බෞද්ධ ජනතාවගේ වන්දනාමානයට පාත්‍ර වෙති. මෙම ලිපියේ අරමුණු වන්නේ ඉහතින් සඳහන් කළ වසර 413 ක කාලය තුළ ශ්‍රී ලාංකික ගැමි ජන ජීවිතයට දළදා වහන්සේ සහ උන්වහන්සේ වෙනුවෙන් පවත්වන සතර මහා මංගල්‍යයන් කෙසේ බලපා තිබේද යන්නත් ඒ තුළින් නිර්මාණය වූ සමාජ ව්‍යුහයේත් ස්වභාවය කුමක්ද යන්නත් සාකච්ඡා කිරීමයි.

මහනුවර රාජධානිය ස්ථාපිත වීමත් සමඟ සතුරු බලවේග පැරදවීමත් හේතුකොට ගෙන එතෙක් ආරක්ෂාව සඳහා දෙල්ගමු විහාරයේ වැඩසිටි දළදා වහන්සේ මහනුවරට වැඩමවා නව දළදා මන්දිරයක් තුළ වැඩ හිඳුවීම විමලධර්මසූරිය රජු දවස සිදුවිය. මෙම උදාර සිදුවීමෙන් පසු දළදා සංස්කෘතියක් මහනුවර කේන්ද්‍රකොටගෙන නිර්මාණය සිදුවිය. එදා දළදා වහන්සේට එදිනෙදා කෙරෙන පුදපූජා චාරිත්‍රවලට අමතරව ප්‍රධාන මංගල්‍යයන් හතරක් ද පැවතුනි. මෙය අගනුවර රජුත්, රාජ්‍යයේ කේන්ද්‍රීය සංකල්පය වූ දළදා වහන්සේත් වෙනුවෙන් ඉටුකරන දළදා සතර මහා මංගල්‍යයන් විය. මුල් සමයේ මෙම සතර මහා මංගල්‍යයන් සිංහලයේ රජු විසින් ඉටුකළ කාර්යයන් වූ අතර පසුකාලීනව තවත් අංග එකතු වෙමින් දළදා හිමියන් වෙනුවෙන් ඉටුකරන චාරිත්‍ර බවට පත්වී තිබේ. (සෙනෙවිරත්න 2010 : 125) මෙම සිව් මහා මංගල්‍යයන් නම්

1. අලුත් අවුරුදු මංගල්‍යය (සිංහල මාස ක්‍රමයට අනුව බක් මාසයේ දී සිදුකෙරේ.)
2. ඇසළ පෙරහැර මංගල්‍යය (ඇසළ මාසයේදී)
3. කාර්තික මංගල්‍යය (ඉල් මාසයේදී)
4. අලුත් සහල් මංගල්‍යය (දුරුතු මාසයේදී)

මෙම සතර මහා මංගල්‍යයන් රාජ්‍යත්වයත්, රාජ්‍යත්වයේ පැවැත්මත් පුරවැසියන්ගේ රාජ්‍ය පාක්ෂිකභාවය ප්‍රකට කිරීමත් උදෙසා පැවැත්වුනද පසුකාලීනව දළදා වහන්සේ වෙනුවෙන් කෙරෙන උත්සව බවට පත්විය. ඉක්බිති මෙම උත්සව ජාතික උත්සව බවට පත්වී තිබේ. මෙම සතර මහා

මංගල්‍යයන් රාජ්‍යයේ එක්සත්භාවය මා පක්ෂපාතීභාවයත් ප්‍රදර්ශනය කළ අතර වර්තමානයේ විශේෂයෙන් ඇසළ මහා මංගල්‍යය ශ්‍රී ලාංකික සංස්කෘතිය ප්‍රකට කරන ප්‍රධාන අංගය බවට පත්වී තිබේ. මහනුවර සමය වනවිට දළදා වහන්සේ රාජ්‍යත්වයේ අනන්‍යතාවය වූ අතර එය සුරක්ෂිත කිරීම කිරීටයේ කාර්යය විය. මේ නිසා එවැනි රාජ්‍යයක පැවැත්ම සඳහා මිනිසුන්ගේ එක්සත් භාවය අත්‍යවශ්‍ය කරුණක් විය. මෙය මහාචාර්ය රැල්ෆ් පීරිස් මහතා මෙසේ සඳහන් කරයි.

මෙම එක්සත් භාවයේ මූර්තිය වූයේ කිරීටයයි. විවිධ ජාතික උත්සව රටවැසියන්ගේ ආගම භක්තිය සහ ශ්‍රද්ධාව වැඩිදියුණු කළ අතර ම එකී උත්සව පවත්වන ලද උත්කර්ෂවත්, උදාර ලීලාව දේශපාලන පක්ෂපාතිකම හා එකමුතුභාවය ඇතිකිරීමෙහි ලා ද සමත්විය. නිදසුනක් වශයෙන් ඇසළ පෙරහැර දක්විය හැකිය. සියලුම දිසාවල සහ රටවල ප්‍රධානීහු නියමිත දිනයේ දී තම සහ පිරිවරින් මහනුවරට සම්ප්‍රාප්තව, දිවා රෑ මුළුල්ලේ දවස් ගණනක්ම පැවති අලංකාර උළෙලට හා පෙරහැරට සහභාගි වූහ. ජාතික සමඟිය සහ දේශපාලන පක්ෂපාතකම වර්ධනය වීමට බෙහෙවින් ඉවහල් වූයේ මහත් හරසරින් අගනුවරදී පවත්වන ලද සතර මහා මංගල්‍යයේය" (පීරිස් 1964 : 117)

රාජ්‍යය සෙංකඩගල පුරවරයේ කේන්ද්‍රගතව පැවති වකවානුවේ සතර මහා මංගල්‍යයන් සහ සෙසු දළදා වහන්සේ වෙනුවෙන් පැවැත්වූ චාරිත්‍ර රජු වෙනුවෙන් පැවැත්වූ චාරිත්‍ර වූ අතර පසුකාලීනව රාජ්‍යත්වය මහනුවරින් ගිලිහී ගියද ඒ සියල්ල දළදා වහන්සේ වෙනුවෙන් පවත්වන චාරිත්‍ර බවට පත්ව තිබේ. මේ අනුව දළදා වහන්සේ වෙනුවෙන් පවත්වන ප්‍රධාන මංලගල්‍යයන් සතර විසින් දැවැන්ත සංස්කෘතියක් ගොඩනඟා ඇති අතර සෙංකඩගල රාජධානියේ සමාජ ව්‍යුහය සකස් වී ඇත්තේ ද මෙම චාරිත්‍ර වටා බව නිසැක වශයෙන්ම ප්‍රකාශ කළ යුතුය. එපමණක් නොව ශ්‍රී ලංකාව පුරා විහිදී තිබෙන විවිධ පූජා ඉඩකඩම්, ගම්වර, නිලපංගු, මුත්තෙට්ටු ගබඩා අදිය දළදා වහන්සේගේ චාරිත්‍ර වෙනුවෙන් වෙන්කළ ඉඩකඩම් වේ. මෙහි මූලික පරමාර්ථය රටේ පැවැත්වීමෙහි කේන්ද්‍රීය සංකල්පය වූ  දළදා වහන්සේගේ

පැවැත්මට අවශ්‍ය භෞතික ශක්තිය නිර්මාණය කිරීමයි.

## අලුත් අවුරුදු මංගල්‍යය

සිංහල වර්ෂ ක්‍රමයට අනුව වර්ෂය ආරම්භ වන්නේ සූර්ය සංක්‍රාන්තියෙනි. මෙය යෙදී ඇත්තේ බක් මාසයටය. භාග්‍යය පෙරටු කොටගත් මෙම මාසය සශ්‍රීකත්වය එක්රැස් වී ගහකොළ මලින් පිරුණු සමස්ත ජනතාවටම ප්‍රබෝධමත් මාසයක් වේ. එමෙන්ම මෝසම් වැස්ස ලැබීමෙන් ඉතා සාර්ථක මාස් කන්නක් වගාකරගත් ගැමියන් එහි අස්වනු බුක්ති විඳින මාසය බක් මාසය වන අතරම පවතින විශ්වාස පද්ධතිය අනුව සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට සංක්‍රමණය වී නව අවරුද්දකට ප්‍රවිෂ්ට වන මෙම කාලය සූර්ය වන්දනාව පෙරටු කොටගත් සැණකෙලි වලින් පරිපූර්ණ වූ මාසයක් ලෙස සැලකිය හැකිය. රටේ අගනගරය වූ මහනුවර වෙසෙන නරපතිතුමා ජනතාවගේ දැක්මටත්, සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙනුත් මෙම උතුම් නැකත් දිනයේදී පෙනී සිටී. මෙය 17 සියවසේදී ඉංග්‍රීසි ජාතික සිරකරුවෙකුව සිටි රොබට් නොක්ස් මෙසේ වාර්තා කරයි.

"අලුත් අවුරුදු දිනයේදී රජතුමා විසින් චිරාගතව පවත්වාගෙන එනු ලබන සිරිත් විධි විශේෂයක් වෙයි. සාමාන්‍යයෙන් අලුත් අවරුදු දිනය මාර්තු මාසයේ 26, 28 හෝ 29 වැනි දිනයක එයි. මේ දවසේ උදෑසනක් සේම අවදිවන රජතුමා නැකත්තාවන්ගේ උපදේශ පරිදි ඉස්සෝදා ස්නානය කරයි. සිංහල අවුරුදු උත්සවය වූ කලී ලක්වැසිය ඉතා වැදගත් කොට සලකන උළෙලකි. " (රොබට් නොක්ස් 1992 : 159)

නොක්ස්ගේ අත්දැකීමට අනුව මහනුවර නගරයේ ඇතුළු පුරයේ මෙන්ම රජ මාළිගයේත් තොරණ බැඳ සරසා සෙසු ප්‍රදේශද උත්සවශ්‍රීයෙන් විරාජමාන කරමින් සතුටු සාමිචියෙන් ගතකරන අවධියකි මෙම සිංහල අවුරුදු සමය. මෙම උත්සවය ජනතාවට අලුත් වර්ෂයක් ලැබීම වෙනුවෙන් සමරන උත්සවයක් මෙන්ම රජු වෙනුවෙන් වාර්ෂිකව බදු රැගෙන පැමිණෙන පුරවැසියන් බැහැදකින උත්සවයක්ද වන්නේය. විශේෂයෙන්ම රටේ

මහීකාන්තාවගේ පාලකයා වන රජතුමා වෙනුවෙන් එතුමාගේ පුරවැසියන් ඔවුන් සතු ඉඩකඩම්, දේවාලගම්, මුත්තෙට්ටු ගම් මෙන්ම වැසියන් බුක්ති විඳින තනතුරු සඳහාද පෙනුම් රැගෙන පැමිණෙති. මේ අනුව රජු බැහැ දැකීමට පැමිණෙන පුරවැසියන් අතර විවිධ දිසාවන් නියෝජනය කරන නිලධාරින්ද, දිසාපතිවරුන්ද, වෘත්තීය ශ්‍රේණිවල නායකකාරකාදීන්ද, ශ්‍රම විභජනය අනුව වෘත්තීන්වල නියැලුන නොයෙකුත් කුල නියෝජනය කරන්නවුන්ද සිටිති. මේ නිසා අලුත් අවුරුදු උත්සවය මගින් සමස්ත රාජ්‍යයේ ඒකීයභාවය සහ පක්ෂපාතීභාවය සනිටුහන් කරනු ලබයි. එමෙන්ම මෙම උත්සවය සකස් වී ඇත්තේ වාර්ෂිකව,වැඩවසම් සමාජයේ යටත්වැසියන් ස්වකීය මිහිපල් දැකීමට රැගෙන එන දැකුම් (පෙනුම්, මගින් සමාජ අන්තර් සබඳතා පවත්වන ක්‍රියාවලියකිනි)

මෙම අන්තර් සබඳතා පැවැත්වීමේදී උඩරට රජධානියට අයත්ව තිබූ ප්‍රධාන දිසාවන් (12) දොළසක් දිසාපතිවරුන් යටතේ පාලනය විය. (ඩොයිලි 1966) ඒවානම්,

| | |
|---|---|
| හතර කෝරළේ | නුවර කලාවිය |
| හත් කෝරළේ | වෙල්ලස්ස |
| ඌව | බින්තැන්න |
| සබරගමුව | තමන්කඩුව |
| මාතලේ | තුන්කෝරළේ |
| වලපනේ | උඩපළාත යන දිසාවන් දොළසයි. |

මෙම දිසාවන් දොළහ සඳහා නෛතික සහ සිවිල් බලතලවලින් යුක්ත දිසාපතිවරුන් පත්කරනු ලැබූ අතර ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාවට සරිලන පරිදි ඒ ඒ දිසාවන් සතුව කොඩියක් දක්නට ලැබුණි. උදාහරණ වශයෙන් සතර කෝරළයේ කොඩිය මහ කොඩිය හෙවත් ඉරහඳ කොඩිය ඔවුන්ගේ අනන්‍යතාව විය. එමෙන්ම ඒ ඒ ප්‍රදේශයට අයත් කොඩියේ සෙවනේ වෙසෙන විවිධ ජන කණ්ඩායම්වල නම් සහ වාසගම්ද සකස් වී තිබුණේ තමන් මහවාසලට ඉටු කරනු ලැබූ රජාකාරිය මතය. එම රාජකාරිය

වෙනුවෙන් ගෙවිය යුතු බදු වාර්ෂිකව ගෙවීම සඳහා පෙනුම් සහිතව රජු බැහැදැකීමට යාම සිංහල අවුරුදු උත්සවයේ කාර්යය විය.

මෙයට අමතරව රජුගේ සෘජු පාලනය යටතේ පාලනය කළ කන්ද උඩරට පස්රට සහිත ප්‍රධාන පාලන ප්‍රදේශ නවයක් දක්නට ලැබුණි. ඒවා නම්

| | |
|---|---|
| උඩුනුවර | කොත්මලේ |
| යටිනුවර | උඩබුලත්ගම |
| තුම්පනේ | පාතබුලත්ගම |
| හාරිස්පත්තුව | දුම්බර |
| හේවාහැට (ඩොයිලි 1966 : 7) | |

මෙම ප්‍රදේශ රටේ මහත්වරුන් මගින් රජුගේ සෘජු පාලනයට යටත් කරනු ලැබිණි. එමෙන්ම මෙම රටේ මහත්වරුන් ප්‍රධාන දිසාපතිවරුන් 12 දෙනාගේ දිසාවනින්ගේ පාලනයෙන් මිදී ස්වාධීන පිරිසක් ලෙස කල් ගෙවූහ. (පීරිස් 1964 : 22)

එපමණක් නොව රජුගේ සෘජු පාලනය යටතේ පාලනය කළ මෙම ප්‍රදේශ සුවිශේෂ පාලන කලාපයක් වන රට වශයෙන් නම්කරනු ලැබූ අතර ඔවුන් රාජධානියේ පිට මිනිසුන් හඳුන්වනු ලැබුයේ රටේ ඇත්තෝ වශයෙනි. මෙම ප්‍රදේශවල ගස් කොළන්වල හටගත් ගෙඩි වර්ගවල මුලට රට යන උපසර්ගය පවා යෙදූහ. රට ජුම්බු, රට බුලත්, රට දෙහි ආදී නම් මේවා අතර ප්‍රකට විය. එපමණක් නොව එම ප්‍රදේශයේ ඕනෑම වැදගත් පළතුරක් තිබුණොත් රටේ මහත්මයා විසින් (බණ්ඩාර) රජු වෙනුවෙන් වෙන්කරනු ලැබිණි. (නොක්ස් 1992 : 75) මේ හැර මෙම ප්‍රදේශ පාලනය කළ රටේ මහත්වරුන් සඳහා නිරන්තරයෙන්ම පෙනුම් සඳහා යැවෙන කෙසෙල් ඇවරිය පවා බණ්ඩාර ඇවරිය ලෙස නම් කෙරුණි. වර්තමානයේ වුවද කෙසෙල් කැනේ දෙවැනි ඇවරිය බණ්ඩාර ඇවරිය වශයෙන් සැලකේ. මේ නිසා රජුට අයත් දිසාවන්ගේ නිලධාරි මෙන්ම රජුගේ සෘජු පාලනය යටතේ පැවති ප්‍රදේශවල නිලධාරීන් ද ඒ ඒ කුලවල ජනයාගේ මුලාදෑනින්

(නායකයන්) ස්වකීය වගකියන ජනකොටස වෙනුවෙන් වාර්ෂිකව සමාව අයැදීමත් බදු මුදල් ඉදිරිපත් කිරීමත්, වාර්ෂිකව ස්වකීය නායකයාට විශේෂ පෙනුම් ඉදිරිපත් කොට සතුටට පත්කොට සමාජ ව්‍යුහයෙන් තමාටත් තමාගේ ප්‍රජාවට (කුලයට) හිමි ස්ථානය සහතික කිරීමටත් සිංහල අවුරුදු දිනය යොදා ගත්හ.

මේ හැර රජු විසින් සිංහල අවුරුද්ද වෙනුවෙන් සුවිශේෂ නැකතක් සකස්කර (මෙය මාළිගාවේ නැකත්කරුවා විසින් සකස් කරයි) එම නැකතට හිස් සෝදා නා පිරිසිදු වී පිරුවට හැඳ ජනතාවට හමුවීමට සමාන්තරව රජුගේ සෘජු පාලනය යටතේ ක්‍රියාත්මක වූ රටේ මහත්වරුන්ගේ නිවෙස්වලටත් ඒ හා සම්බන්ධ විහාර හා පන්සල්වලත් එම නැකතට අනුව අවුරුදු චාරිත්‍ර ක්‍රියාත්මක වූ බව පෙනේ. මේ අනුව සිංහල අවුරුදු උත්සවය යනු හුදු වාර්ෂිකව පවත්වන සූර්ය වන්දනයකට වඩා සිංහල රාජ්‍යයේ අගනුවර සිට පර්යන්ත ගම්මාන දක්වා සෑම ජන කොටසක්ම රජු සමඟ අන්තර් සම්බන්ධතා පවත්වා නව වර්ෂයට පිවිසීමේ ගැමි සංස්කෘතික ප්‍රකාශයක් වශයෙන් සැලකිය හැකිය.

සිංහල අවුරුදු සමයේ රජු බැහැදැකීමේ කාර්යය 1815 සිංහලයේ අවසාන රජු ඉංග්‍රීසින් විසින් අල්ලා ගැනීමෙන් පසු වෙනස් වූ බව පෙනේ. එනම් රජුට ඉතා සමීප සේවා ඉටුකළ දියවඩන නිළමේට රජුගේ කාර්යභාරය පැවරීමයි. මේ නිසා  රජු වෙනුවෙන් ඉටුකළ කාර්යභාරයන් පසුකාලීනව දියවඩන නිළමේ විසින් දළදා වහන්සේ වෙනුවෙන් ඉටුකළ බව පෙනේ. මේ නිසා රජු ඉටුකළ එම කාර්යය ඉටුකිරීමට හෙවත් සිංහල අවුරුද්ද වෙනුවෙන් දළදා මාළිගාවේ එම උත්සවය පැවැත්වීමටත් ඊට අදාළ නැකැත් සම්පාදනයත් දළදා මාළිගාවේ දියවඩන නිලමේගේ ප්‍රධානත්වයෙන් සිදුවූ බව පෙනේ.

## ඇසළ පෙරහැර මංගල්‍යය

දළදා වහන්සේ රාජ්‍යත්වයේ සංකේතය බවට පත්වීමත් සමඟම දළදා වහන්සේ වෙනුවෙන් ඉටුකරනු ලබන පූජෝපහාර හා රජතුමා වෙනුවෙන් කරනු ලැබූ පූජෝපහාර එකිනෙකට බද්ධ වෙමින් මහනුවර රාජ්‍ය තුළ ක්‍රියාත්මක වන්නට විය. මේ අනුව දළදා පෙරහැර ලෙස හඳුන්වනු ලැබිය හැක්කේ මහනුවර පුරවරයට දළදා වහන්සේ වැඩම කළ පසු ඒ දක්වා පැමිණි පෙරහැරේ අංග ලක්ෂණයන් සහ මහනුවර යුගයේදී සංවර්ධනය වූ අංග ලක්ෂණයෝය.

අනුරාධපුර යුගයේදී උතුම් රාජ්‍ය උත්සවයක් වූ දළදා පෙරහැර පොළොන්නරු යුගයේදී උතුම් ආගමික පූජාවක් ලෙස ක්‍රියාත්මක කෙරිණි. ශ්‍රී දළදා වහන්සේත්, පාත්‍රා ධාතුන් වහන්සේත් යන දෙනම වෙනුවෙන්ම ක්‍රි.ව. 1153 - 1186 පළමුවන පරාක්‍රමබාහු මහරජතුමා ඉතා විශිෂ්ට ලෙස දළදා පෙරහැර චාරිත්‍ර ඉටුකළ අතර රජතුමාද වාර්ෂික පෙරහැරේ සුදු ඇතෙකු පිට නැගී දළදා කරඬුව අසලින් පිටුපසින් ගමන්කළ බව මහාවංශය වාර්තා කරයි.

දඹදෙණි යුගය වනවිට ශ්‍රී දළදා පෙරහැර වඩා චමත්කාරජනක පෙරහැරක් ලෙස වර්ධනය වූ බව පෙනේ. එක් අතකින් පූජාවක් වශයෙන්ද, අනිත් අතින් රාජ්‍ය බලය ශක්තිමත් කිරීම සඳහා යොදාගන්නා ක්‍රියාමාර්ගයක් වශයෙන්ද පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා විසින් එය ක්‍රියාත්මක කළ බව පෙනේ. තවද මෙම යුගයේදී පාත්‍රා ධාතුවත්, දන්තධාතුවත් යන දෙනමම රථයක හිඳුවා පෙරහැර කළ බව සඳහන් වේ. මේ හැර දඹදෙණි යුගයේදී සිව් දේවාලවල පෙරහැර ආරම්භයත් දක්නට ලැබේ.

ඉක්බිති දළදා වහන්සේ සුරක්ෂිතභාවය සඳහා කෙටිකලකට යාපහු නුවරට වැඩම කළ අතර මේ වකවානුවේදී දළදා පෙරහැරක් පිළිබඳව වාර්තා දක්නට නොලැබේ. කුරුණෑගල අවධියේදී දළදා පෙරහැරට යම්කිසි නිතිරීති මාලාවක් සකස් වූ අතර භික්ෂූන් වහන්සේලාගේ බලය වැඩිවූ අතර උන්වහන්සේ දළදා පෙරහැරේ ගමන්කළ බවද වාර්තා වේ. ඉක්බිති දළදා

වහන්සේ ගම්පොළ රජධානියටත්, අනතුරුව කෝට්ටේ රාජධානියටත් වැඩම කොට දළදා මාළිගාවක් පිහිටුවා විවිධ ආකාරයෙන් වත් පිළිවෙත් කළ බවට ද වාර්තා දක්නට ලැබේ. 1593 දී විමලධර්මසූරිය නරේන්ද්‍රයන් විසින් නැවත තමන් මාළිගය අසල සිත්කලු මන්දිරයක් කරවා දළදා වහන්සේ එහි වැඩ හිඳුවාලීය. (සෙනෙවිරත්න 2001 ඃ 59) පසුකාලීනව ඇසළ මාසයේ පෙරහැරක් කළද එය දේව පෙරහැරක් ලෙස ක්‍රියාත්මක වූ බව පෙනේ.

පසුව දළදා වහන්සේ වෙනුවෙන් කෙරුණු පුදසත්කාර සහිත පෙරහැර පිළිබඳ අංග සම්පූර්ණ තොරතුරු කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස පටන් වඩා හොඳින් වාර්තා වේ. සියම් දේශයෙන් උපසම්පදාව ශ්‍රී ලංකාවට ගෙනඒමත් සමඟ පැමිණි උපාලි හිමිපාණන් වහන්සේ, ඇසළ පෙරහැර දෙවියන් වෙනුවෙන් පවත්වන පෙරහැරක් වෙනුවට බුද්ධ පූජා සහිත දළදා පෙරහැරක් බවට පත්කිරීමට උපදෙස් දීමෙන් වර්තමාන පෙරහැරේ ආරම්භය වූ බව ඉතා පැහැදිලිය.

දළදා පෙරහැරේ සංයුතිය එය පත්වන කාල වකවානුව ඊට සම්බන්ධ වන කලා ශිල්පීන් සහ ගැමියන්ගේ සමාජ ව්‍යුහය සමඟ සම්බන්ධ වීම පිළිබඳවත්, එයට නව අංගයන් එක්වීම පිළිබඳවත් සාකච්ඡා කිරීමේදී කරුණු කිහිපයක් වැදගත් වේ.

i. වර්ෂයේ දෙවන වතාවට ස්වකීය රාජ්‍යයේ මහජනතාවට දැකගැනීම සඳහා රජතුමා ගමන් කිරීම, ඔහුට හිමි බලපරාක්‍රමය, රාජ්‍ය පක්ෂපාතීත්වය, ප්‍රදර්ශනය කිරීමට සාමාන්‍ය ජනතාවට අවස්ථාව ලබාදී, රජුගේ ඍජු පාලන යටතේ පවතින කලාපවල රටේ මහත්වරුන් සහ දිසාවනින් වල දිසාපතිවරුන් පිරිවරා පෙරහැරේ ගමන් කිරීම.

ii. සිංහල රාජ්‍යය මෙතෙක් විදේශ රටවල් සමඟ සිදුකළ යුධවලින් ලැබූ විජයග්‍රහණයන් ප්‍රදර්ශනය කරමින් රජුගේ ප්‍රෞඪත්වය, ජනතාව තුළ පවතින එඩිතර බව නැංවීම, ජාතික මාමකත්වය, සහ සෛවරීයත්වය පිළිබඳ හැඟීම නිර්මාණය

කිරීම.

iii. කෘෂිකාර්මික රටක වැස්ස ලබාගැනීම සඳහා දෙවියන්ගෙන් සහ බුදුන්ගෙන් කෙරෙන ඉල්ලීම උදෙසා කෙරෙන වාර්ෂික ඇසළ පූජාව (සෙනෙවිරත්න 2001 : 168)

iv. සුරා - සුර යුද්ධයෙන් ජයගෙන අසුරයන් සිහිකිරීම සඳහා කෙරෙන උත්සවය (පීරිස් 1964 : 127)

## රජු මහජනතාව බැහැදැකීම, බලපරාක්‍රමය ප්‍රකට කිරීම, ඇසළ පෙරහැර උත්සවය සහ සමාජ ව්‍යුහය

ඇසළ පෙරහැර ඇසළ මාසයේ ආරම්භ කිරීමට හේතුව ලෙස සලකන්නේ විෂ්ණු දෙවියන් ඇසළ මාසයේ උපන් හෙයිනි. (පීරිස් 1964:127) එමෙන්ම අලුත්නුවර දේවාලයේ පෙරහැර අවසන් වූ වහාම මහනුවර ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම සිදුකෙරේ. අලුත් නුවර දේවාලය මහත් වූ දෙවියන් වූ විෂ්ණු දෙවියන්ගේ දේවාලයක් ලෙස සැලකේ. තවත් සමහරුන්ගේ මතය වන්නේ විෂ්ණු දෙවියන්ගේ ආරක්ෂක දෙවියා වූ දැඩිමුණ්ඩ දෙවියන්ගේ දෙවොල බවයි. කෙසේ වුවද විෂ්ණු දෙවියන් වෙනුවෙන් පවත්වන උත්සවයත්, එම උත්පත්තියත් ඇසළ ගස්වල මල් පිපීමත් මෙම කාලවකවානුව සනිටුහන් කරයි. (Aluwehare 1952) ඇසළ පෙරහැර ආරම්භ වන්නේ සිව්දේවාල සඳහා කප් සිටුවීමෙනි.

කප් සිටුවීම යනු දෙවියන්ට කැපකිරීම සඳහා වූ පොරොන්දුව විය හැකිය. පෙරහැර ආරක්ෂා කිරීමත්, පෙරහැර කිරීම පිළිබඳ පොරොන්දුවක් මෙම කප්සිටුවීම තුළ ගැබ් වී තිබේ.

මෙහිදී නියමිත නැකත් දිනයේදී නියමිත පුදසිරිත් ඉටුකොට ළපටි කොස්, (රුක්අත්තන හෝ ඇසළ) ගසක් ළගට ගොස් වැටි නවයකින් යුක්තව පහන් දල්වා, මල් නවයක් හා බුලත් කොළ නවයක් අසුනක් මත තබා එම ගස මුලට දේවාල කපුවන් විසින් පුද පූජා පැවැත්වීමෙන් පසු මනාසේ පේවූ පොරෝකාරයා පොරොවකින් ගස මුලින් කපා දමා කඳ හරස් අතට

සමකොටස් හතරකට බෙදා සිව්දේවාල වලට බෙදා දෙයි. කඳේ මුල් කොටස නාථ දෙවාලයටද, දෙවන කොටස මහ විෂ්ණු දේවාලයටද, තෙවැනි කොටස කතරමග දේවාලයටද, අග්ගිස්ස පත්තිනි දේවාලයටද භාරදෙනු ලබයි. ඉක්බිති මෙම කොටස් පංචතූර්ය නාදය සහිතව ඒ ඒ දේවාලයන්ට වැඩම කොට එදිනට යෙදෙන ඇසළ මස නව සඳ උදාවන නැකතට , නියමිත ස්ථානවල කප්සිටුවා පියස්සකින් හා රෙදි වලින් ආවරණය කොට ඒ වටා පොල් මල් සහ පොල් ගෙඩි දෙකක් තබා පූජා සත්කාර කොට අලංකාර කොට කප් සිටුවයි.

කප්සිටුවා සතර දිනක් ගතවන තුරු කපුරාළවරු ඒ ඒ දෙවියන්ට තම තමන්ගේ දේවාල කැපකොට සෑම දිනකම නියමිත පූජා සත්කාර කොට ද්වාහරණ කපුවාට ප්‍රදක්ෂිණා කරයි. මෙය දෙවියන් වැඩමවීම ලෙස සැලකේ. මෙතැන් සිට සත්වන දිනයේදී කුඹල් පෙරහැර ආරම්භ වේ. මෙය කුඹල් පෙරහැර යනුවෙන් අදහස් කරනු ලබන්නේ ඇසළ ලීයෙන් හෝ කොස් ලීයෙන් රුක් අත්තන ලීයෙන් තැනූ කප් සිටුවා ඇති මැටි භාජනය තුඹසකට සමාන වන හෙයිනි. මේ වටා දේව පෙරහැර ගමන් කරයි. (Aluwehare 1952 : 9) මෙසේ දින හතකට පසු දේවාලවලින් පිටස්තර මාළිගාවේ පෙරහැර සමඟ සම්බන්ධ වී අභ්‍යන්තර පෙරහැරට එකතු වේ. මෙවැනි පෙරහැරවල් පහකින් පසු රන්දෝලි පෙරහැර ආරම්භ වේ.

සතර මහා දේවාලවල කප් සිටුවීමත් ඒවායේ අභ්‍යන්තර චාරිත්‍ර වාරිත්‍ර සහ පුද පිළිවෙත් පිළිබඳවත් නොයෙක් දෙනා නොයෙක් විශ්ලේෂණයන් ඉදිරිපත් කොට තිබේ. එහෙත් මෙම පර්යේෂකයාගේ අදහස වන්නේ මෙම සිව්දේවාලයන්ගේ කප් සිටුවීම සඳහා යොදා ගනු ලබන කිරිවෘක්ෂය ප්‍රධාන කැබලි හතරකට කැපීම තුළින් ඒකීය රාජ්‍යයක ආරක්ෂාව නාථ, විෂ්ණු , කතරගම සහ පත්තිනි යන දෙවියන් සතර දෙනාට පැවරීම මෙන්ම සමෘධිය සංකේතවත් වේ. එසේම එය, රජුගේ ඍජු පාලනය යටතේ පවතින ප්‍රදේශ නවයේ (09) පවතින දේවාල සහ ඒවායේ ශාඛා දේවාලවල බලය තුළින් ස්වකීය රාජ්‍යයේ ප්‍රධාන කලාප 09 සුරක්ෂිතභාවයට දෙවියන්ගේ රැකවරණය ඉල්ලීමක්ද වෙයි. පහන් නවයක්, බුලත් නවයක් සහ මල් නවයක්

මෙම වෘක්ෂය කැපීමට පෙර ආසනයක තබා පූජා කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ මේ යැයි සිතිය හැකිය. එමෙන්ම කප් සිටුවීම සඳහා යොදාගනු ලබන කොස් වෘක්ෂයේ මුල් කොටස නාථ දෙවියන් වෙනුවෙනුත්, ඊළඟ කොටස විෂ්ණු දෙවියන් වෙනුවෙනුත්, තුන්වන කොටස කතරගම දෙවියන් සහ අවසාන කොටස පත්තිනි දෙවියන් වෙනුවෙනුත් වෙන්වීම තුළින් එකම රාජ්‍යයේ බලය දේවශක්තිය හරහා බෙදීයන ආකාරයක් පෙන්වාදෙයි. මේ නිසා මහනුවර රාජ්‍යයේ සමාජ ව්‍යුහයේ දේව විශ්වාස පද්ධතිය සහ රාජ්‍ය පරිපාලනය අතර ඇති සම්බන්ධතාවය මෙම පූජා සත්කාර වලින් කැපීපෙනේ.

රන්දෝලි පෙරහැරේ සංයුතිය ගතහොත් එය අනිවර්යයෙන්ම ප්‍රබල රාජ්‍යයක පුරවැසියන් ඔවුන්ගේ ප්‍රාදේශීය පාලකයන් සමඟ ස්වකීය මහරජුට පක්ෂපාතීත්වය පුදකරමින් බුදුන් වහන්සේ සහ දෙවියන් වෙනුවෙන් පවත්වන පූජෝත්සවයක් බව හෙළිවෙයි. ඇසළ පෙරහැරේ මුලින්ම ගමන් කරන්නේ කසකාරයන්ය. මහනුවර රාජ්‍යයේ අදිකාරම්වරයෙකු හෝ ඊට වඩා උසස් නිලධාරියෙකු තම පුර සංචාරයේ ඔහුගේ සම්ප්‍රාප්තිය සහ මහජනතාවට එම ගමන දැනුම්දීම සඳහා කසකරුවන්ගේ සේවය ලබාගත් බව පෙනේ. (Aluwehare 1952 : 15) මෙම අංගය පෙරහැරට එකතු කරනු ලැබුවේ පී.බී. නුගවෙල දියවඩන නිළමේතුමාගේ කාලයේය. (Aluwehare 1952 : 15)

1817 වෙල්ලස්සේ දිසාපතිවරයාගේ විස්තරයේ (පීරිස් 1964:127) කසකරුවන් පිළිබඳව සඳහන් වන්නේ නැත. මුලින්ම පෙරහැරේ ගමන් ගත්තේ ගජනායක නිළමේය. අනතරුව කොඩිතුවක්කු ලේකම් සහ ඔහු පිරිවරාගත් කොඩිතුවක්කු රැගත් කණ්ඩායමත්, තුන්වෙනුව රජුගේ අණසක යටතේ පවතින දිසාවන්ගේ සහ කන්ද උඩරට තදාසන්න ප්‍රදේශවල ප්‍රාදේශීය නායකයන්ගේ කොඩි විශේෂයනුත්ය. මෙයින් පෙනී යන්නේ රජුගේ බලපරාක්‍රමය පවතින දිසාවනීන්ගේ අනන්‍යතාවයයි.

මෙහිදී කොඩිතුවක්කු, අත්තුවක්කු හා කොඩි රැගත් සතර කෝරළයේ

දිසාවට අයත් පිරිසද දිසාවේ සහ සෙසු නිලධාරින්ද සමඟ ඉරහඳ කොඩිය හෙවත් මහකොඩිය පිරිවරාගෙන ගමන් කිරීම  මහනුවර රාජ්‍යයේ ආරක්ෂාව පිළිබඳ වගකීම පෙන්නුම් කරන්නකි. මහනුවර රාජධානියේ මුල් යුගයේ ඉරහඳ කොඩිය මාතලේ දිසාවට අයත් වූවක් වූ අතර පසුකාලීනව කොළඹින් පැමිණෙන ආක්‍රමණ වැළැක්වීම සඳහා සතර කෝරළය ප්‍රධාන යුද්ධ ආරක්ෂක කලාපයක් වූ අතර ප්‍රධාන හේවාවසම් ප්‍රමුඛ බලඇණි සහ විවිධ සන්නද්ධ කණ්ඩායම් සතර කෝරළයේ දිසාව යටතේ ස්ථානගත කර තිබූ බව පෙනේ. (ඩොයිලි 1966 : 12) මේ හැර මහනුවර රජු යටතේ පවතින ඉතිරි දිසාවන්වල නිලධාරින්ද ඔවුන්ගේ බලපරාක්‍රමය විදහා දක්වන ආකාරයට සංවිධානාත්මක පෙරහැරේ ගමන් ගත් බව කිව හැකිය. පසුකාලීන පෙරහැරේ ඒ ඒ ප්‍රදේශ නියෝජනය කරන නිලධාරීන් වෙනුවට කොඩි පමණක් රැගෙන යන බව දැක්විය හැකිය. (Aluwihare 1952 :15)

ඉක්බිති පෙරහැරේ ගමන් කරන්නේ පෙරමුණේ රාළයි. පෙරහැර පැවැත්වීමට රජුගේ නිසි අවසරය රැගත් පෙරමුණේ රාළ මාළිගාව සතු ලේකම් හෙවත් පුස්කොළ පොත්වල සටහන් තැබූ ලේකම් වාර්තා රැගෙන හස්තියෙකු පිට නැගී ගමන් කරයි. මෙම ලේකම්මිටිය තුළ, මාළිගාවේ ඉඩකඩම් පිළිබඳ විස්තර, බදුකරුවන් පිළිබඳ විස්තර, මාළිගාවේ සේවා පිළිබඳ ලේඛන ආදී විස්තර අඩංගු වේ. මෙයින් නිරූපනය වන්නේ පූජාමය පෙරහැරකට වඩා රජුගේ බල පරාක්‍රමය යටතේ ඔහුට පක්ෂපාතීව, ඔහු සතු භූමිය තුළ සිටින තමන්ගේ පුරවැසියන් පිළිබඳ විස්තරයකි. විශේෂයෙන්ම වැඩවසම් සමාජයක භූපති යටතේ ජීවත් වන වැසියන් සහ ඔවුන්ගේ රාජාකාරියත්, පෙරහැර සඳහා සහභාගී වන්නාවූ එම කුල ධූරාවලියේ ස්වරූපයත් මේ තුළින් නිරූපණය වේ.

ශ්‍රී දළදා පෙරහැරේ ඊළඟට අනුපිළිවෙලින්  දවුල්, තම්මැට්ටම්, බෙර, හොරණෑ ආදිකොට ඇති වාද්‍ය භාණ්ඩයන් වාදනය කරනු ලබන හේවිසි වාදකයෝ දළදා පෙරහැරට පමණක් ආවේණික ශබ්ද පූජා පවත්වමින් ගමන් කරති. වර්තමාන පෙරහැරේ ගජනායක නිළමේ හෙවත් සිවිරඟ සෙනගේ ඇත් හමුදාව භාරව කටයුතු කරන ප්‍රධානියා සිය අංකුශය සමඟ ගමන් කරයි.

මෙහි ඇත් පිරිවර මෙන්ම අලංකරණයෙන් එකතු වූ සාම්ප්‍රදායික සිංහල අංග රාශියක් දැකිය හැකිය. සාමාන්‍ය ජීවිතයේදී රජු හැරුණු විට ගජනායක නිළමේට පමණි ඇතෙකු පිට ගමන් කිරිමට අවසර ඇත්තේ. 1817 පෙරහැරට වඩා වෙනස් ලක්ෂණයක් ලෙස වර්තමානයේ දක්නට ලැබෙන්නේ ගජනායක නිළමේගේ ස්ථානය වෙනස් වීමයි.

ඉක්බිති දළදා මාළිගාවේ තේවා කාර්යයේදී දියවඩන නිළමේට පමණක් දෙවැනි නිලය වන කාරියකරවන රාළ ගමන් කරයි. (Aluwihare 1952 : 15) මොහු මාළිගාවේ චාරිත්‍ර විෂයෙන් ප්‍රධානියා වන අතර මාළිගාවේ පෙරහැර අනිකුත් දේවාලවලට සම්බන්ධ කිරීමේ කාර්යය සිදුකරයි.

අනතුරුව මාළිගාවේ හස්තිරාජයා පෙරහැර දළදා කරඬුව රැගෙන පෙරහැරේ ගමන් කරයි. පරිවාර හස්තීහුද ඒ සමඟ සංචාරය කරති. මෙහිදී පොළවට පාවඩද එළා ඇති අතර කරඬුව වෙනුවෙන් උඩුවියන් සවිකොට තිබේ. මෙම හස්තිරාජයා පිටුපස රජු ගමන්ගත් අතර වර්තමානයේ ඒ වෙනුවට දියවඩන නිළමේ ගමන් කරයි. පැරණි රජුගේ ආරක්ෂාමය චාරිත්‍රයන් වූ මුරායුධ, තල් අතු ආදි දෑ වලින් සමලංකෘතව මෙය සිදුවේ. මාළිගාවේ පෙරහැරේ මෙම ප්‍රධාන අංගයන්ට අමතරව නොයෙකුත් විශේෂාංගයන් දක්නට ලැබේ.

ජීවමාන බුදුන් වහන්සේ ලෙස සලකන වර්තමාන දළදා වහන්සේ නියෝජනය වන මාළිගවේ පෙරහැරින් පසු ගමන් කරන්නේ නාථ දේවාලයේ පෙරහැරයි. ආරම්භක කප් සිටුවීමේදී කිරි වෘක්ෂයේ මුල් කොටස හිමිවූයේ නාථ දෙවියන්ගේ දේවාලය වෙනුවෙනි. ජීවමාන බුද්න් වහන්සේගෙන් පසු, මතු බුදුවන හෙවත් ඊළඟට බුද්ධත්වය ලැබෙන බුදුන් වහන්සේ නියෝජනය වන නාථ දේවාල පෙරහැර කහ රන්වන් වර්ණ වලින් සමලංකෘත වේ. මෙම පෙරහැරේ බස්නායක නිළමේ ප්‍රමුඛව පිටිසර දේවාලවල බස්නායක නිළමේවරුන්ද ගමන් ගනී. ඔවුන් නම් දොඩන්වල දේවාලය බස්නායක නිළමේ පස්ගම දේවාලයේ බස්නායක නිළමේ සම වේගිරිය දේවාලයේ බස්නායක නිළමේ යන නිලමේවරුන් තිදෙනාය.

එයින් ඉක්බිති විෂ්ණු දේවාලයේ හෙවත් මහ දේවාලයේ පෙරහැර නීලවර්ණයෙන් යුක්තව ගමන් කරයි. එහි බස්නායක නිලමේ පෙරටු කොටගෙන පිටිසරබද දේවාලයන් වූ ලංකාතිලක, ගඩලාදෙණිය, අලවතුගොඩ, හඟුරන්කෙත, මොරපේ සහ මැදිරිය යන දේවාලවල බස්නායක නිළමේවරු ස්වකීය හස්තිරාජයන් සහ විවිධ ආකාරයේ නැටුම්, ගැයුම් සහ වැයුම් සහිතව ගමන් කරති. ශ්‍රී ලංකාවේ බුදුසසුනේ ආරක්ෂකයා වන්නේත් විෂ්ණු දෙවියන්ය. මෙම දෙවියන්ද නාථ දෙවියන්ගෙන් පසු බුද්ධත්වය ලැබීමට පෙරුම් පුරන බව ජනතාවගේ විෂ්වාසයයි. කප්සිටුවීමේදී කපෙහි දෙවෙනි කොටස විෂ්ණු දේවාලයට හිමිවෙමින් දේවාල පෙරහැරේ දෙවැනි ස්ථානයේ ගමන් කරයි. දෙවියන්ගේ බලපරාක්‍රමය ධූරාවලිය තුළ ශ්‍රී ලංකාවේ මහත් වූ දෙවියන් ලෙස සලකනු ලබන්නේ විෂ්ණු දෙවියන්ය.

දේවාල පෙරහැරවලින් තුන්වන ස්ථානය කතරගම දේවාලයේ පෙරහැරට හිමිවන අතර මෙය යුද්ධයට අධිපති ස්කන්ධ කුමාර දෙවියන්ගේ වර්ණය වූ රතු පැහැයෙන් යුක්තය. කතරගම දේවාලයේ බස්නායක නිළමේ සහ ඔහුගේ පිටිසර දේවාල වන ගනේගොඩ සහ ඇම්බැක්කේ දේවාලවල බස්නායක නිළමේවරු මේ සමඟ ගමන් කරති. මෙම පෙරහැර තවත් සුවිශේෂත්වයක් නිරූපනය කරනුයේ ශ්‍රී ලාංකික හින්දු පූජකවරයෙකු සහ ඔහුගේ සහපිරිවරත් මේ සමඟ ගමන් කිරීම නිසයි. විශේෂයෙන් මෙම සංයුතිය තුළ බෞද්ධ - හින්දු සහජීවන සම්බන්ධතාවත් අනාදිමත් කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන ජනවාර්ගික සමගියත් නිරූපණය වේ. තවද කතරගම දේවාලයට කප්සිටුවීමේදී කපෙහි තුන්වන ස්ථානය හිමිවන අතර දේවාල පෙරහැරේද තුන්වන ස්ථානය හිමිකරගෙන සමාජ ආකෘතියක් නියෝජනය කරයි. එපමණක් නොව කතරගම පෙරහැරේ බොහෝ විට හින්දු ආගමික නැටුම් හා කාවඩි වැනි වේගරිද්ම අංගයන්ට සම්බන්ධ භේරිවාදනයන්ද දක්නට ලැබේ.

සිව්වෙනුව සහ අවසාන දේවාල පෙරහැර වශයෙන් පත්තිනි දේවාලයේ පෙරහැර ඊට සුවිශේෂ වූ නැටුම් ගැයුම් හා වැයුම් සහිතව අලි ඇතුන් පිරිවරාගෙන පත්තිනි දේවාල බස්නායක නිළමේ සහ පිටිසර

දේවලයේ බස්නායක නිලමේ වූ ඇම්බැක්කේ දේවාලයේ බස්නායක නිළමේ සමග ගමන් කරනු ලැබේ. පැරණි පෙරහැරවලදී පත්තිනි දේවියගේ මුල් ආභරණ මෙන්ම ගජබා රජු විසින් චෝළ දේශය ආක්‍රමණය කොට ගෙන එන ලද මුල් ආභරණද රැගෙන ගිය බවට සාක්ෂි තිබේ. (Aluwihare 1952 : 15) පත්තිනි දේවිය ශ්‍රී ලාංකික සංස්කෘතිය තුළ වනිතා හා ළමා සුරක්ෂිතතාවට කැපවූ දෙවඟන වන අතර බෝවන රෝග වැළැක්වීමේ ශක්තියක් ඇයට ඇතැයි ගැමියෝ විශ්වාස කරති. පත්තිනි දේවාලයේ පෙරහැර තුළ කාන්තා නියෝජනයක් මෙන්ම කාන්තාවන්ට ආවේණික නාට්‍ය සම්ප්‍රදායක්ද දක්නට ලැබේ.

පත්තිනි දේවාලයේ පෙරහැරෙන් අනතුරුව දළදා පෙරහැරේ අගභාගයට එළඹෙන අතර මෙහි විශේෂත්වය වන්නේ දෙවිවරුන්ගේ තාවකාලික නිවාස ලෙස සැළකෙන දෝලාවන් රැගත් තේවාකාරයින් ගමන් කිරිමයි. ඉතා මටසිළුටු රෙදි වලින් සරසූ රන්, රිදී සහ යකඩ දෝලාවන් පිළිවෙලින් රැගෙන යාමක් මෙහිදී සිදුවේ. ඉහතින් සඳහන් කළ ප්‍රධාන පෙරහැර අංග පහේදීම සාම්ප්‍රදායික රාජකාරි වල නියැලුණු විවිධ කලා සම්ප්‍රදායයන්ට අයත් වෙස්, උඩැක්කි, පන්තේරු, නයිඅඩි සහ වෙනත් උඩරටට ආවේණික වූ ශිල්පීන් විසින් මෙම පෙරහැර අලංකාර කරනු ලබයි. සාම්ප්‍රදායික ලෙස ආලෝකය සැපයූ පන්දම් මගින් පෙරහැර විචිත්‍රවත් කරනු ලැබේ. සාම්ප්‍රදායික වැඩවසම් සමාජයේ කුල ධූරාවලියට අනුව සකස් වූ විවිධ ශ්‍රේණීන්ට අයත් ශිල්පීන් විසින් ඉටුකරන නොයෙකුත් ශිල්පීය සේවාවන් ඇසුරෙන් එකල සමාජ ව්‍යුහයේ පැතිකඩක් නිරූපනය කිරීමට ශ්‍රී දළදා පෙරහැර සමත් වී තිබේ.

මෙම පෙරහැරේ සංයුතිය සැබැවින්ම වැඩවසම් ධූරාවලි සමාජයක, අගනුවර කේන්ද්‍රයේ වෙසෙන රජුගේ සිට පර්යන්තයීය ගම්මානවල ගැමියන් සහ ඔහුගේ නියෝජිතයින් ඍජු ලෙස සහභාගි වන රාජකීය උත්සවයක් නිර්මාණය කරයි. මෙහි සෑම කාර්යයක්ම ඉටුවූයේ වැඩවසම් හිමිකම මත ලැබුණු දේපළ සහ ඒවාට නියමිත රාජකාරි පැවරූ ගම්වසම්වල සහ රටවසම්වල මිනිසුන් විසින් නිසිලෙස සපුරනු ලබන කාර්යයන් මගින්ය. මේ

ඉටුකිරීම වෙනුවෙන් ඔහුට හිමි ගෞරවනීය වාසගමක් රජු විසින් පිරිනමා තිබේ. උදාහරණ වශයෙන් ගතහොත් කොඩිතුවක්කු යන නාමය ආරක්ෂක හමුදාව තුළ සුවිශේෂ රෙජිමේන්තුවක් නියෝජනය කළ අතර එම රෙජිමේන්තුවේ ශ්‍රම විභජනය මත සැකසුනු වෘත්තීයමය වෙනස්කම් මගින් පමණක් පුද්ගලයාට සමාජයේ හිමි ස්ථානය නියම කරනු ලැබිණි.

කොඩිතුවක්කු මුදියන්සේ (ලේකම්)
කොඩිතුවක්කු ආරච්චි
කොඩිතුවක්කු අතපත්තු
කොඩිතුවක්කු විදානගේ
කොඩිතුවක්කු රාළ
කොඩිතුවක්කු වහුම්පුරය
කොඩිතුවක්කු රදාගේ
කොඩිතුවක්කු බෙරකාරයලාගේ
කොඩිතුවක්කු පේඩිගේ

ආදී වශයෙන් ඉහළ කුලයේ සිට පහළ කුලය දක්වා ස්වකීය නාමයේ වම්පැත්තෙන් ඔහුගේ නිලයත් දකුණු පැත්තෙන් ශ්‍රම විභජන නාමයත් හඳුන්වා දෙමින් ගැමි සමාජ ව්‍යුහයට පුද්ගලයා සම්බන්ධ කර තිබේ. රජුගේ සෘජු පාලනය යටතේ සිටින සෑම ප්‍රජාවක්ම (නිදහස් පුරවැසියන් හැර) දළදා මාළිගය වෙනුවෙන් ඉටුකරනු ලබන සේවය මත නිල පංගුවලට හිමිකමක් දක්වයි. මේ අනුව රජුගේ බලපරාක්‍රමය ගම්දනව් දක්වා විහිදීයාම වාර්ෂිකව අලුත් කෙරෙන රාජකාරියේ ප්‍රශස්ථ පක්ෂපාතීත්වය මොනවට ප්‍රකාශ කරන උත්සවයක් ලෙස දළදා පෙරහැර සඳහන් කරන්නට පිළිවන.

## කාර්තික මංගල්‍යය

ඇසළ පෙරහැර මංගල්‍යයන් තවත් මාස තුනකට පසු මහනුවර මහවාසල විසින් පවත්වනු ලබන රාජ්‍ය උත්සවයක් ලෙස කාර්තිතා මංගල්‍යය හැඳින්විය හැකිය. දෙමළ භාෂාවෙන් කාර්තික ලෙස සඳහන් කරන්නේ ඉල් මාසයටය. (දිසානායක 2000 : 32) මෙම ආලෝක පූජාවකි. නමුත් දීපාවලි

මෙන් ආලෝක පූජාවක් නොවේ. එමෙන්ම මෙම ආලෝක පූජාව සාමාන්‍ය වශයෙන් කෙරෙන්නක් නොව මහරජතුමාගේ අණසක පවතින රජමාළිගාවට (දළදා මාළිගාවට සමීප මෙන්ම දළදා පෙරහැරේදී ඊට සම්බන්ධවුණු) ප්‍රධාන දේවාල සතරට, පරිවාර පිටිසර දේවාලවලටත්, රජු මගින් ඍජු ලෙස පාලනය කරනු ලබන ප්‍රදේශවල පිහිටි ප්‍රධාන විහාරාරාම වලටත් ඉල්මස පුර පසළොස්වක දිනට පෙරදින එකම පහනකින් පහන් පනස් අටක් දැල්වීම සඳහා තෙල් බෙදා දීමයි. රජුට බලයක් ශක්තියක් ලබාදෙන දළදා වහන්සේ ප්‍රමුඛ ත්‍රිවිධ රත්නයට, විහාර වලට සහ ඒවා ආරක්ෂා කරන දෙවියන්ගේ කේන්ද්‍රීය දේවාල සහ පිටිසර පරිවාර දේවාලවලට පහන් දල්වා ආලෝකය ලබාදීමට රජුගේ ගබඩාවෙන් තෙල් බෙදාදීම මේ මගින් සිදුවේ.

රජුගේ නියෝගය පරිදි ඉල්මස පුර පසළොස්වක පොහොය දිනට පෙරදින මෙම උත්සවය පැවැත්වේ. "පහන් දැල්විය යුතු සුභ මුහුර්තිය කල්තියාම සාදාගන්නා රාජකීය දෛවඥයෝ එය නැකැත් වට්ටෝරුවල සඳහන් කර තබති. නැකත යෙදී තිබුණ පෙරවරු කාලයේ දී පහන් හා තෙල් රාජකීය ගබඩාවෙන් නාථ දේවාලයට යවනු ලැබේ. ප්‍රධානීහු නාථ දේවාල භූමියට රැස්වෙති. සතර දේවාලයේ කපුරාළවරු මංගල අෂ්ටක ගායනා කිරීමෙන් අනතුරුව උවදුරු දුරුකර රට යස ඉසුරෙන් උතුරවන ලෙසට දෙවියන්ට යාතිකා කරති." (පීරිස් 1964 : 139)

මෙහිදී තෙල් බෙදාදීම ඉහතින් සඳහන් කළ අතර ඒවා නිසි පරිදි ප්‍රධාන විහාර දේවාල වලට ගෙනයාම සිදුකෙර්. සැන්දෑ කාලයේ අලංකාර ලෙස දළදා මාළිගය හා සිව්දේවාල සරසා පෙරහැර පවත්වන අයුරින් විශාල පරිවාර ජනතාවක් සමඟ සර්වඥ ධාතු සහ දේව ප්‍රතිමා ඇතුන් පිට තැන්පත් කොට කුඩා පෙරහැරක් පවත්වනු ලබයි. මේ අවස්ථාව වනවිට බෙදා දුන් තෙල් වලින් නියමිත සිද්ධස්ථාන සියල්ලේ පහන් පත්තු වෙයි.

මෙහිදී සිංහලයේ රජු නැවතත් තමන්ගේ රාජ්‍යයේ එකම ශක්තිය වන රජුගේ බලය ප්‍රදර්ශනය කිරීමට එකම පහනක් තුළින් එකම වේලාවකට

තමන්ගේ බලප්‍රදේශය ප්‍රධාන ආගමික මධ්‍යස්ථානවල දැල්වීමෙන් වෙන කිසිදු අධිකාරී බලයකට ඉඩ නොතබන බවත් රටේ එකම රජතුමා තමා බවත් එහි අණසක ස්වකීය පාලන බලය පැවැත්වෙන ප්‍රදේශවල සපුරා තිබෙන බවත් ප්‍රකට කරයි. මෙම සියලුම පහන්වල තෙල් සපයනු ලබන්නේ රජු විසින් බවත් එය මතු බුදුවන මෛත්‍රී බුදුන් වෙනුවෙන් නාථ දේවාලයෙන් නිකුත්වන ශක්තියක් ලෙසත් ප්‍රකට වේ. (එපමණක් නොව බොහෝ විට මහනුවර රාජ්‍යයේ රජවරුන් ප්‍රථමයෙන්ම දිවුරුම් දෙන ස්ථානයක් ලෙස ද නාථ දේවාල භූමිය ප්‍රකටය) මෙම කාර්ති මංගල්‍යය ඉන්දියාවේ තිබෙන හින්දු චාරිත්‍රයක් වූ දීපවාලි උත්සවය මෙන් ලෝකය ආලෝකමත් කිරීමේ අරමුණින් නිර්මාණය කරන ලද්දක් නොව නැවතත් රජු හා පුරවැසියන් අතර ඇති සම්බන්ධය ගොඩනැංවීමට කරන ලද්දකි.

## අලුත් සහල් මංගල්‍යය

ශ්‍රී දළදා මාළිගාව පෙරටු කොටගෙන ඉටුකරන වර්ෂයේ අවසාන උත්කර්ෂවත් මෙන්ම සතරවැනි මංගල්‍යය අලුත් සහල් මංගල්‍යයි. අලුත් සහල් මංගල්‍යයන් ලෙස ලංකාවේ බොහෝ ප්‍රදේශවල සිදුවන්නේ පුරවැසියන් විසින් බුදුන් වහන්සේ වෙනුවෙන් වෙන් කළ සහල් ප්‍රථම වතාවට පූජා කිරීමයි. අනුරාධපුරයේ සහ ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල පවත්වන අලුත් සහල් මංගල්‍යයන් එකින් එක වෙනස් වුවද මූලික වශයෙන් මේ මගින් කෙරෙනුයේ අලුත් සහලින් දානය සකසා බුදුන් සහ දෙවියන් පිදීමයි.

නෝමන් සිරිපාල මහතා "දහනව වන සියවසේදී අලුත් සහල් මංගල්‍යය ජාතික උත්සවයක් හැටියට පැවැත්වුනි. එය වාර්ෂික සිදුකෙරෙන බුද්ධ පූජා උත්සවයක් විය. රජු වෙනුවෙන් කරනු ලැබූ මෙම උත්සවයේ පරමාර්ථය වූයේ පොළොවට අධිපති (භූපති) රජතුමා වෙනුවෙන් බුදුරජාණන් වහන්සේට (දළදා සම්දුන්ට) විශේෂ පූජාවක් පැවැත්වීමයි. එය දළදා මාළිගාවේ පැරණි චාරිත්‍රානුකූලව වාර්ෂිකව සිදුකෙරේ." (සිරිපාල 1990:15).

මෙය සිරිපාල මහතාගේ ශ්‍රී දළදා මාළිගාවේ අලුත් සහල් මංගල්‍යය පිළිබඳ හැඳින්වීමයි. නමුත් නූතනයේ කරනු ලැබූ පර්යේෂවලට අනුව ඃ‍යැර්එය 1994ථ3-4* ශ්‍රී දළදා මාළිගාවේ අලුත් සහල් මංගල්‍යය එසේ නොව රටේ රජතුමා වූ (භූපති) වගාකළ තමන්ගේ කුඹුරේ සහල් තමන්ගේ ඍජු පාලනය යටතේ පවතින රටේ මහත්වරුන්ගේ පරිපාලන කලාපවල සියලුම ප්‍රාදේශිය විහාර හා දේවාල සඳහා බෙදාදීමයි. දළදා මාළිගාව ප්‍රමුඛව සියලුම විහාරාරාම මෙන්ම නාථ දේවාලය ප්‍රමුඛ සිවුමහා දේවාල සහ එයින් අණසක ලබාගන්නා සියලුම පිටිසර දේවාල දක්වා නිශ්චිත නැකත් වේලාවක මෙම සහල් බෙදාදීම සිදුකෙරේ. එපමණක් නොව අතිශය ප්‍රශස්ථ කෘෂිකාර්මික චාරිත්‍රයක් වූ මෙම සහල් බෙදාදීම රජුගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරෙන අතර නිශ්චිත නැකත් දිනයේදී උත්සවාකාරයෙන් කත් මගින් සහ වෙනත් ප්‍රවාහන මාධ්‍යයන්ගෙන් පිටිසර ප්‍රදේශවලට රැගෙන යනු ලබයි. අලුත් සහල් දානය පිළියෙල කිරීම දුරුතු පසළොස්වක පොහෝ දිනයේදී සිදුවේ. මෙහි ප්‍රධාන දානය පිළියෙල කිරීමේ මංගල්‍යය දළදා මාළිගාවේදී සිදුකෙරෙන අතර හාල්සේරු 80 ක දානයක් සහ එළවළු අටක ව්‍යාංජන බුදුන් වහන්සේ වෙනුවෙන් පිළියෙල වේ. රජුගේ අණසක යටතේ පවතින ප්‍රදේශවල් නියෝජනය වනු සඳහා මෙම අවස්ථාවේදී එම විහාරාරාම, දේවාල දහ දළදා මන්දිරයේ ආවතේවකාරයින් සඳහාත් ප්‍රධාන වට තුනකදී අලුත් සහල් බෙදාදේ. නමුත් පළමු වටයට අයත් වන්නේ රටේ මහත්වරුන් නව දෙනාගේ කලාපවල පිහිටි පිළිම ගෙවල් සහ විහාර අසූවක් පමණි.

මෙම විහාර 80 නියෝජනය වීම යනු හම විහාරවල සිටින බුදුරදුන් 80 කට කෙරෙන බුද්ධ පූජාව පිළියෙල වීමයි. එම 80 වෙනුවෙන් රජතුමා විසින් දානය පිළියෙල කෙරෙන අතරම රජුගේ පාලන ප්‍රදේශයේ විහාර 80 ද අලුත් සහල් පිස බුදුන්ට පූජාකොට සමස්ත කෘෂිකාර්මික සමාජයේ පරිභෝජනය ඇරඹීම මෙහි ප්‍රධාන හරයයි. එකම දිනයක එකම වේලාවක දළදා මන්දිරය ඇතුළු ප්‍රාදේශීය විහාර 80 ක එකම කුඹුරේ සහල් බුදුන් වහන්සේ වෙනුවෙන් පූජා කිරීම කොතරම් රජුගේ දේශපාලන බලය හා රැඳී පවත්නා සංසිද්ධියක් දැයි සාකච්ඡා කළයුතු කරුණකි. අනිත් අතට රජුගේ දේශපාලන බලය හා බැඳී පවත්නා දළදා වහන්සේගේ බලයෙන් සමාජය තුළ රාජ්‍ය

පක්ෂපාතීභාවය සහ ගැමි සමාජයේ ජීවත්වන වෘත්තිය වූ ගොවීන්ගේ කාර්යය රජුගේ කාර්යය සමඟ එකට ගොනු කරනු ලබයි.

එක් අතකින් කෘෂිකාර්මික නායකයා වන භූපති තෙමේම ස්වකීය රාජ්‍යයේ ගැමියන් නියෝජනය කර මෙම උතුම් කෘෂිකාර්මික මංගල්‍යය ඉටුකරයි. මේ අනුව අලුත් සහල් මංගල්‍යය සිව්වැනි වතාවටත් මහනුවර මහරජුගේ අණසක සහ බලය ගැමියා වෙත පතුරුවන ප්‍රධාන මාධ්‍ය වූ විහාර හා දේවාල හරහා කේන්ද්‍රයේ සිට පර්යන්ත දක්වා ආධිපත්‍යය මෙන්ම සංස්කෘතික සාරය මෙහෙයවන අතරම එය දළදා මාළිගාවට සමාජය ගොනු කරන ප්‍රධාන ආකෘතිය ලෙසද ක්‍රියා කරයි.

## දළදා වහන්සේ, සතර මහා මංගල්‍යය හා ජන සමාජය

ඉහත සඳහන් සාකච්ඡාව මගින් පැහැදිලිව පෙනීයන කරුණක් නම් දළදා මාළිගාව යනු රජුගේ අණසක දේශපාලන බලය සහ දළදා වහන්සේ වෙත ඇති අසීමිත භක්තිය සහ ගෞරවය ජනතාව වෙත පතුරුවා හැරීමෙන් ජාතික අනන්‍යතාවට අවශ්‍ය සාමූහික විඥානයක් නිපදවන කේන්ද්‍රයක් බවයි.

මෙහි ඉතාමත්ම ප්‍රකට ලක්ෂණ බොහොමයක් වර්තමානයේ ඉතා පැහැදිලිව දක්නට ලැබේ. එනම් ප්‍රධාන මංගල්‍යය සතරට රජුගේ බලප්‍රදේශයේ පුරවැසියෝ වර්තමානයේ පවා අනිවාර්යයෙන්ම සහභාගි වෙති. මහනුවර තදාසන්න ප්‍රදේශවල වැසියන් අනිවාර්යයෙන්ම පෙරහැර හතක්වත් නොබලා සිටින්නේ නැත. එමෙන්ම ඔවුන් සියලු දෙනාම අවසාන මහ පෙරහැරට සහභාගි වී දවල් පෙරහැරේ අලුත් වැස්සට තෙමීමට තරම් භක්තිවන්තයෝ වෙති.

තවද දළදා මාළිගාව මගින් පතුරුවන අණසක ගම් දනව්වල ජනතාවගේ හදගැස්ම වන්නේ සෑම ගමකම තිබෙන පන්සලේ, විහාරයේ උදයේ බුද්ධ පූජාව පවත්වන විට නාද කෙරෙන අලුයම් ධූරයේ හේවිසි

නාදයත්, සවස හැන්දෑ ධූරයේ ගිලන්පස වෙනුවෙන් නැගෙන හේවිසි හඬත් දළදා මාළිගාවේ අලුයම ධූරයට සහ හැන්දෑ ධූරයට සාපේක්ෂව සිදුවන නිසාය. මේ නිසා මාළිගාවේ සණ්ඨා නාදයත් හේවිසි නාදයත් මහාවාසලින් නිකුත් වී ගැමියන් සෙංකඩගල පුරයට ඇඳ බැඳ තබාගැනීමේ දේශපාලන බලයත්, භක්තියත් ගැනීමේ ගුණයත් දළදා මාළිගාව සතුව තිබේ. පුරවාසීහු ස්වකීය පවුලට අලුත් බිළිදෙක් ලැබී පළමු මාස තුන තුළ දළදා මාළිගාවට වඩාගෙන අවුත් වැඩ සිටින මාළිගාවේ එළිපත්ත මත තබා දළදා හාමුදුරුවන් වෙනුවෙන් පූජාකොට ආශිර්වාද ලබාගනිති. එම දරුවන් දුවපැන ඇවිදින වයසේ සිටම දළදා මාළිගාව අසලින් ගමන් කරන විට පාවහන් ගලවා දමා මාළිගාව දෙසට වැඳ නමස්කාර කිරීමට පුරුදු වී සිටිති. බසයක ගමන් කරන විටපවා මෙම ගෞරව දැක්වීම අනලස්ව සිදුකරති. තවම මහනුවර ගැමියෝ සිය දරුවන්ට ඔවුන්ට වැඳ සමාව ගන්නා විට "දළදා හාමුරුවන්ගේ පිහිට" යයි ප්‍රකාශ කොට දළදා හිමියන්ගේ පිහිට සහ සරණ ප්‍රකාශ කරති.

## ගැමියන්ගේ මානසික ඒකාග්‍රතාවයට පත්කෙරෙන සංස්කෘතික කේන්ද්‍රස්ථානය

ශ්‍රී ලංකාවේ බෞද්ධයන්ගේ ජන විඥානයේ පවතිව ප්‍රධානම ජීවමාන බුදුන් වහන්සේ දළදා වහන්සේය. මෙහිදී සරල ප්‍රාදේශීය සීමාවන් ඉක්මවා යන ශක්තිය දළදා මාළිගාව සතුව තිබේ. උදාහරණ වශයෙන් ගතහොත් දළදා වහන්සේ ආරක්ෂා කරන සඟ පරපුර මල්වතු - අස්ගිරි පාර්ශවයන් ලංකාවේ දසදිග් භාගයන් නියෝජනය කරති. දකුණේ දෙවුන්දර තුඩුවත්, උතුරේ පේදුරුතුඩුවත් යා කරන පන්සල් මෙම උභය පාර්ශ්වයට අයත්ය. මේවා දළදා වහන්සේ විසින් ඒකාග්‍රතාවට පත්කරන ග්‍රාමීය කේන්ද්‍රයන්ය. එමෙන්ම දකුණේ දෙවුන්දර තුඩුවේ මුහුදු කෙළවරේ සිට කන්ද උඩරට දක්වා ගම්වල, මෙම ධර්ම කේන්ද්‍රවල සිටින ගැමියන්ගේ ප්‍රදේශවල දළදා මාළිගාව වෙත පුදකළ ඉඩකඩම්, මුත්තෙට්ටුගම්, නිලගම්. දේවාල ගම් ආදී ගම්වරයන් දක්නට ලැපෙන අතර මේවා දළදා වහන්සේ වෙනුවෙන් කැපවූ භූමි පරිභෝගයන් වේ. මේවා වාර්ෂික උත්සවවලට කෙරෙන සේවා වෙනුවෙන් රජු විසින් ගැමියන්ට පවරා ඇති දේපළ ද වේ. රාජපාක්ෂික භාවයත්, ආගමත්

අතර සම්බන්ධතාව වර්තමාන සමාජයේ ප්‍රජාතාන්ත්‍රික රාමුවට නොගැළපුනත් වැඩවසම් සාම්ප්‍රදායික සමාජයේ මේවා, සමාජ ව්‍යුහය හා දළදා වහන්සේගේ අනන්‍යතාව ගොඩනැගූ ප්‍රකට ලක්ෂණයෝ ය. මේ බව වඩාත් තහවුරු වන්නේ වර්තමානයේ පවා ලංකාවේ බොහෝ පන්සල්වල මලුවේ සීමාවන් දැක්වීම සඳහා දළදා මාළිගාවේ වැව රවුමේ දක්නට ලැබෙන වාළාකුළු බැම්ම යොදා ගැනීමෙනි. විදුලි ආලෝකය නොමැති යුගයක පෙරහැර පැවැත්වීම සහ මහවාසල රාත්‍රී කාලයේ පැවැත්වූ උත්සව සඳහා ආලෝකය සැපයීමට වළාකුළු බැම්මේ ඇති පහන් කවුළු උපකාරී විය. මාළිගාව තෙල් සපයන්නන් විසින් මේවාට පහන් යොදා දල්වනු ලැබිණි. එකල එය තෙල් පංගුව නම් විය.

නමුත් වර්තමානයේ වළාකුළු බැම්ම ජාතික සංස්කෘතික ප්‍රදර්ශනය කිරීමේ ප්‍රධාන භෞතික අංගය බවට පත්ව තිබේ. එපමණක් නොව එය විදේශ රටවල පවා ශ්‍රී ලංකාවේ රාජ්‍ය දූත කටයුතු කෙරෙන තානාපති කාර්යාලවල වැට අලංකරණය සඳහා යොදාගෙන තිබීමෙන් පෙනී යන්නේ මෙවැනි කටයුත්තක් සඳහා යොදාගත හැකි වැදගත් ම භෞතික ලාංඡනය මෙය බවයි. මේ සියල්ලම පිටුපස ඇති අදෘශ්‍යමාන ඒකායන බලවේගය ශ්‍රී දළදා මාළිගාව විසින් වාර්ෂිකව පවත්වනු ලබන සතර මහා මංගල්‍යය මගින් ජනහදවත තුළ ජනනය කොට ඇති අනුපමේය භක්තිය සහ ගෞරවයයි.

## ආශ්‍රිත ග්‍රන්ථ

1952 Aluwihare, Richard The Kandy Esala Perahara M.D. Gunasena & Co. Ltd, Colombo.

1964 පීරිස්, රැල්ෆ්, සිංහල සමාජ සංවිධානය
සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, කොළඹ.

1966 ඩොයිලි ජෝන්, සිංහලේ ආණ්ඩුක්‍රමය (එච්.එම්.සෝමරත්න පරිවර්තනය) ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

1990 සිරිපාල, නෝමන්, අලුත් සහල් මංගල්‍යය සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම, කොළඹ

1992 Herath H.M.D.R. Kingship Authority and social Srtructure with Special Reference to the Ritual of the Aluthsahal Mangallaya in Kandyan era Proceedings of the Annual Recared Sessions Daculty of Arts University Peradeniya pp,34-35.

1994 නොක්ස්, රොබට්, එදා හෙළදිව ඩේවිඩ් කරුණාරත්න පරිවර්තනය, සීමාසහිත එම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

1996 මහාවංශය (හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ සංස්කරණය, ද්විතියික භාගය, තුන්වැනි මුද්‍රණය, දීපානි ප්‍රකාශන, කොළඹ

2000 දිසානායක ජේ.බී. සිරි දළදා මාළිගාව, ගොඩගේ පොත් මැදුර, එස්. ගොඩගේ සහ සමාගම, කොළඹ

2001 සෙනෙවිරත්න, අනුරාධ සිරි දළදා වරුණ, එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ

# මහනුවර ඇසළ පෙරහැරේ උපත

**අතුල සමරකෝන්**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ලලිත කලා අධ්‍යයන අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

**(සර් රිචඩ් අලුවිහාරගේ** The Origin of the Kandy Esala Perahara **ලිපියේ පරිවර්ථනය)**

මහනුවර දළදා පෙරහැර ජූලි - අගෝස්තු මාසවල දියවඩන නිලමේතුමන් විසින් නියමකරන දිනවලදී වාර්ෂිකව පැවැත්වේ. ලංකාවේ ලේඛකයකු දළදා පෙරහැරේ ආරම්භය ගැන කළ සඳහනකදී පැවසුවේ එය "මිහිඳුම් සියවස් ගණනාවකින් සැගවී ගිය දෙයක්" ලෙසයි. ක්‍රි.ව. 303 - 331 අතර කාලයේ අනුරාධපුරයේ රාජ්‍ය කළ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ කාලයේදී දන්ත ධාතුව ලංකාවට ගෙනා බව මහා වංශයේ සඳහන් කරයි. ක්‍රි.ව. 3 වන සියවසේ දේවානම්පියතිස්ස රජු තැනූ ධර්මචක්‍ර නැමැති ගොඩනැඟිල්ලේ එය තැන්පත් කර තිබූ බවට එහි වැඩි දුරටත් විස්තර කෙරේ. දළදාවට ගෞරව දැක්වීම සඳහා පැවැත්වූ උත්සවයට කහවණු 900,000 ක් වැයකළ බව මහාවංශය කියයි. එසේම රජුගේ නියෝගය වූයේ වසරකට වරක් වසන්තයේදී, දන්ත ධාතූන් වහන්සේ නගරය වටා ගෙන යායුතු බවයි. මෙම නියෝගය ඉන්පසු පැමිණි සියළු රජවරුන් ඉතා මැනවින් අනුගමනය කළ බවට සාධක හමුවේ. කීර්තිමත් දේශාටකයකු වූ පාහියන්ගේ ලංකාව හා ඉන්දියාව පිළිබඳ වාර්තාවල ක්‍රි.ව. 5 හේ සිදුවූ දළදා උත්සවය පිළිබඳ විස්තර හමුවේ.

ඔවුහු සෑම වර්ෂයකම තුන්වන මාසයේ මැද දිනයකදී බුදුන්ගේ දන්ත ධාතුව ගෘහයෙන් එළියට වැඩමවති. මීට හරියටම දින දහයකට පෙර, රාජකීය වස්ත්‍රයෙන් සැරසුණු රජු, මනාව සැරසූ හස්ති රාජයකුගේ පිට නැඟ, වාග් චාතුර්යයෙන් පිරි මිනිසෙකු සමග, බෙරයක් වාදනය කරමින් පහත සඳහන් දේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමින් ගමන් කරයි.

"බෝධිසත්වයෝ අසංඛ්‍ය කල්ප තුනක් පෙරුම් පිරූහ" ඉතා චාම්

දිවිපෙවෙතක් ගත කළ උන්වහන්සේ, සිය රාජ්‍යයත්, බිරිඳත්, දරුවනුත් අතහැර ගිය සේක. ඔහුගේ අතපය තවත් කෙනෙකු වෙනුවෙන් දන් දුන්නේය. ඔහුගේ ශරීරයම ගිජු ලිහිණියකට ආහාර පිණිස දන්දුන්නේය. තවත් ආත්මයකදී එතුමාණෝ තම හිසත් ශරීරයත් කොටියෙකුට දන් දුන්හ. සිය ශරීරයවත් , ආත්මයවත් පිළිබඳව කිසිදු දුකකින්, අමනාපයකින් තොරව එසේ කළ සේක. සැමගේ හිතසුව පිණිස එතුමෝ ඒ සියල්ල කළ සේක. උන්හන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු ජීවත්වූයේ ද වසර හතලිස් නවයක් පමණි.

එම කාලය තුළ එතුමාණෝ තම දහම දේශනා කරමින්, මිනිසුන් දහමට හරවා ගනිමින්, ජීවිතය ගත කළ සේක. අසරණයන්ට, දුකට පත්වූවන්ට එතුමාණෝ සැනසුම ලගාකර දුන්සේක. එසේ ආත්ම ගණනාවක් පසුකර පැමිණි එතුමාණෝ අවසානයේ නිර්වාණය ලගා කරගත් සේක. දින දහයකට පසු දන්ත ධාතුන් වහන්සේ ගෘහයෙන් එළියට වැඩම කරවා අභයගිරි විහාරයට ගෙනයනු ලැබේ. මෙහිදී ගිහි පැවිදින් ඇතුළු සියලු වැසියන් මහ මග දෙපස අලංකාර කර, සුවඳ දුම් ගල්වා, මල් අතුරා, දන්ත ධාතුන් වහන්සේට ගෞරව කරත්වා෴ රජුගේ මේ ප්‍රකාශයෙන් පසු, එතුමන් ඇතුළු පිරිස බුදුන් වහන්සේගේ පන්සිය පනස් ජාතකය ඇතුළත් වර්ණවත් සිතුවම් වීදි දෙපස එල්ලා අලංකාර කරති. මේ සිතුවම්වලින් නිරූපනය වන්නේ ඊට පෙර ආත්මවලදී බුදුන්වහන්සේගේ ජීවිත තොරතුරුය. මෙලෙස සැරසූ වීදි ඔස්සේ දන්ත ධාතුන් වහන්සේ වැඩම කරවයි. මිනිසුන් මග දෙපස රැඳී එයට ගෞරව දක්වයි. එලෙස පටන්ගත් පෙරහැර දන්ත ධාතුන් වහන්සේ ද සමග අභයගිරි විහාරයට වැඩමවීමෙන් පසු මල්,පහන්, සුවඳ දුම්වලින් භික්ෂූන් හා ගිහියන් දිවා රාත්‍රියේ ගෞරව දක්වයි මෙලෙස උත්සව දින 90 ක් පවත්වා ආපසු නගරයේ ඇති විහාර ගෙයට වඩමවනු ලැබේ."

අනුරාධපුර රාජධානීය බිඳ වැටීමෙන් පසුත් මෙලෙස පාහියන් විස්තර කරන ආකාරයට දළදා උත්සවය පැවැත් වූවාද යන්න භූත සහිතය. ඒ කෙසේ වෙතත් මහනුවර ඇසළ පෙරහැරේ අද දින අප දකින දේවාල පෙරහැර දක්නට නොතිබුණ බව පැහැදිලිය. මා සොයාගත් තොරතුරුවලට

අනුව, සතර මහා දේවාල පෙරහැර සහිත අද අපි දකින පෙරහැර ක්‍රි.ව. 1775 ආරම්භ වූවක් වන අතර එය කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ ආරම්භ වූවක් යන්න පැහැදිලිය.

ඔහුගේ රජසමයේ ආරම්භ වූ පෙරහැර හින්දු දේවාල හතරට සීමාවිය. මක් නිසාද මේ වන විටත්, හින්දු ආගමේ චාරිත්‍ර වාරිත්‍ර හා වත් පිළිවෙත්, බුදු දහමට කාන්දු වී තිබුණු බැවිනි. එසේම මහායාන බුදුසමයේ බලපෑමත් රජු වටා සිටි සඟවරයන් බොහෝමයක් දකුණු ඉන්දියාවෙන් පැමිණ සිටි කුමාරවරුන් වීමත් මේ තත්වයට බලපෑ තවත් කරුණුය.

මේ කාලය තුළදී සියම් දේශයේ සිට උපසම්පදාව පිණිස පැමිණි භික්ෂුවක් මේ කීර්තිමත් බෞද්ධ රාජ්‍යයේ දක්නට තිබුණ හින්දු ආගමික වතාවත් දැක පුදුමයට පත්වී තිබේ.

මෙම නොගැලපීම පිණිබඳව සිතූ රජු සතර මහා දේවාල පෙරහැරට පෙර දන්ත ධාතුව රැගත් පෙරහැර ගමන් කරවිය යුතු බවට නියෝග කර ඇති අතර එය අද දක්වාම චාරිත්‍රයක් ලෙස සිදුවේ. කෙසේ නමුත් අද දවසේ දන්ත ධාතූන් වහන්සේ පෙරහැරේ වැඩම නොකරති. ඒ වෙනුවට මංජුසාවක බහාලූ දන්ත ධාතුවේ අනුරුවක් සීවලී රහතුන්ගේ ධාතූන්ද සමග ඉතා අලංකාරව සැරසූ, මාළිගාවේ හස්තිරාජයා මතින් වැඩම කෙරේ. දන්ත ධාතූන් වහන්සේ තිබෙන ස්ථානයෙන් ඉවත් කිරීම අසුභ දෙයක් ලෙස සැලකෙන බැවින් එය පිටතට ගෙනඒමක් සිදුනොකරයි. ධාතූන් වහන්සේගේ ආරක්ෂාව ගැන විශේෂයෙන් කටයුතු කිරීමට සිදුවීමත් දන්ත ධාතුවෙන් සමස්ථ රාජ්‍යයේ ආරක්ෂාවත් සංකේත වන බැවිනුත් එය ඉවතට ගැනීමක් සිදු නොකෙරේ. මහා වංශයට අනුව පෙරහැර පිරිසිදු ලෙසම ආගමික වූවත් ඓතිහාසික, සාම්ප්‍රදායික හා මිත්‍යා අංග සැමරීම චාරිත්‍රයක් බවට පත්වීම නිසා එය චාරිත්‍රයක් ලෙස පැවැත්විය.

රාජ්‍යයේ ආරක්ෂාවත්, සෞභාග්‍යයත් උදෙසා සතර මහා දේවාලවල ආශිර්වාදය ලබාගැනීම, පෙරහැරට විශේෂ වැදගත්කමක් ලෙස

සැලකීය. දේවාල පෙරහැර බිහිවීම හා පහත සඳහන් සම්ප්‍රදායන් අතර සම්බන්ධතාවයත් පවතියි.

කතරගම දෙවියන්ද සම්බන්ධ වූ යුද්ධයක් අසුරයන් අතර සිදුවිය. එය අවසාන වීම සිදුවූයේ ජූලි මාසයේ නව සඳට පසු දිනදීය. මෙය සැමරීම සඳහා සෑම වර්ෂයකදීම ජූලි මාසයේ එක් දිනක ඇසළ ගසක් කපා එය කපක් ලෙස සිටුවා නිශ්චිත උත්සවයක් පවත්වනු ලැබේ. (මෙම ගස මේ කාලයට හොඳින් එල දරයි) මෙම උත්සවයට හා පෙරහැරට ඇසළ ගස විසින් මෙම නාමය ලබාදුන් බව පැවසේ. වර්තමානයේදී මෙම කාර්ය සඳහා කොස්ගසක් හෝ රුක් අත්තක ගසක් යොදා ගැනේ. මේ ශාක දෙවර්ගයම කැපූ විට ක්ෂාරයක් පිටකරයි. මෙය සෞභාග්‍යයේ සංකේතය ලෙසද පිළිගැනේ.

තවත් මතයක් මෙපරිදිය. ක්‍රි.ව. 109 දී රාජ්‍යත්වයට පත් වන්කනාසික රජුගේ කාලයේදී චෝල රජෙකු ලංකාව ආක්‍රමණය කර සිරකරුවන් 12,000 ක් ආපසු රැගෙන ගොස් තිබේ. ඔහුගෙන් පසු රජ පැමිණි ගජබා රජ එයට පළිගැනීමක් ලෙස ඉන්දියාව ආක්‍රමණය කර සිරකරුවන් 24000 ක් හා වලගම්බා රජ දවස පැහැරගෙන ගිය පාත්‍රා ධාතුවත් රැගෙන ආවේය. එසේම මේ සමග පත්තිනි දේවියගේ රත්‍රන් මුදුවද රැගෙන ආ බව කියවේ. ඉහත ජයග්‍රහණය සැමරීම සඳහා පැවැත්වූ පෙරහැර වර්තමාන පෙරහැරේ ආරම්භය බව පැවසේ.

තවත් මතයක් වන්නේ ක්‍රි.පූ. 5 සියවසේ ලංකාවට පැමිණි විජය කුමරුන් ඇතුළු පිරිස හඳුන්වාදුන් "අසල්හි ක්‍රීඩා" ^කයසස ය්පි* නැමැති ක්‍රීඩාවෙන් මෙම උත්සවයට මෙම නාමය ලබුණු බවයි.

මල්වතු හා අස්ගිරි විහාරයන්හි නායක ස්වාමීන් වහන්සේලා දන්ත ධාතුවේ ආරක්ෂකයෝ වෙති. ඔවුන් එංගලන්ත සභාවට අයත්, යෝක් හා කැස්ටර්බරියට අයත් අර්ච්බිෂොප්වරුනට සමානය. දන්ත ධාතුවේ ගිහි භාරකාරතුමා වන්නේ දියවඩන නිළමෙතුමාය.

සම්ප්‍රදායට අනුව බුදුන්ගේ දන්ත ධාතූන් හතරක් තිබුණි. එක් දන්ත ධාතුවක අයිතිය ශක්‍රයාට පැවරිණි. ඔහු නිරන්තරයෙන් එයට සත්කාර කරයි. දෙවැන්න ගාන්ධාර දේශයට ප්‍රදානය කර තිබේ. (වර්තමානයේ එය ඇෆ්ගනිස්තානය ලෙස පිළිගැනේ) එහි බෞද්ධයෝ එයට සත්කාර දක්වති. තුන්වන දන්ත ධාතුවේ අයිතිය ඇත්තේ නාග රජුටය. එම ධාතුවට විවිධ ලෙස වත්පිළිවෙත් පැවැත්වේ. ක්ෂේම නම් තවුසාගේ භාරකාරත්වය තිබූ හතරවන දන්ත ධාතුව කාලිංගයේ දන්තපුරයේ බ්‍රහ්මදත්ත රජුට භාරදී තිබේ. (මෙය වර්තමාන ඔරිස්සාව ලෙස පිළිගැනේ) ඉන්දියානු සම්ප්‍රදායට අනුව, දන්තපුරය නම් වර්තමාන ඔරිස්සාව මුහුදු බඩ ප්‍රදේශයක් වන 'පූරි' නගරයයි. ඉතා ප්‍රසිද්ධ ගජනාථ දේවාලය පිහිටා ඇත්තේ මෙහිය. බ්‍රහ්ම දත්තගෙන් පසු රජවූයේ ගුහසීව රජුය. ඔහුගෙන් රාජ්‍ය උදුරා ගැනීමට සතුරෙකු පැමිණි විට, ඔහු දන්ත කුමරු කැඳවා දන්ත ධාතුවේ ආරක්ෂාව සඳහා එය ඔහු මගින් ලංකාවේ එකල රජවූ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුට භාරදී තිබේ. දන්ත කුමරු දන්ත ධාතුව පමණක් නොව තවත් වටිනා සම්පත් බොහෝමයක් ප්‍රදානය කර තිබේ.

සම්ප්‍රදායේ කියවෙන ආකාරයට දන්ත කුමරු හා කුමරිය ලංකාවට පලා ආයේ දන්ත ධාතුව හේමමාලා කුමරියගේ කෙස් වැටියේ සඟවාගෙනය. එතැන් පටන් දන්ත ධාතුව ලංකාවේ විවිධ පළාත්වලට වැඩමවා තිබේ. අවසානයේ දෙවන විමලධර්මසූරිය රජු (1689 - 1707) දන්ත ධාතුව ලබුගමින් වැඩම කරවා මහනුවර දළදා මාළිගයේ තැන්පත් කර තිබේ.

විශිෂ්ඨ කලාරසිකත්වයක් තිබූ මහනුවර අන්තිම රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (1798 - 1815) දළදා මාළිගාවට පත්තිරිප්පුවක් නිමවා දී තිබේ. මහනුවර වැව නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ ද මේ රජුටය.

# මහනුවර දළදා පෙරහැර සහ සමාජය

**ඩබ්.එම්.පී. සුදර්ශන බණ්ඩාර**
කථිකාචාර්ය
ලලිත කලා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය.

ලාංකීය බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩවන් මහනුවර වැඩවසන දළදා වහන්සේ, දේශීය මෙන්ම විදේශීය බෞද්ධ සහ අබෞද්ධ දෙපාර්ශවයේම නිබඳ ගෞරවාදරයට පාත්‍ර වේ. එමෙන්ම දළදා පෙරහැර එලෙසම සියලු ලෝකවාසී බෞද්ධ ජනයාට අති උත්කෘෂ්ඨ බෞද්ධ සංස්කෘතික මංගල්‍යයකි. ලාංකීය බෞද්ධ සංස්කෘතික උත්සවයන් අතරින් මහනුවර දළදා පෙරහැරට සුවිශේෂි වැදගත්කමක් හිමි වේ. දෙස් විදෙස් ලක්‍ෂ සංඛ්‍යාත ජනතාවගේ නිබඳ ඇගැයීමට ලක්වන මහනුවර දළදා පෙරහැර තුළ දෘශ්‍ය ගෝචර වන සෞන්දර්යය අභිබවා එහි අභ්‍යන්තරයේ සැඟවුණු පුළුල් සමාජ සංස්ථාවක ලක්ෂණ විදහාපානු ලැබේ. කාලාන්තරයක් පුරාවට ලාංකීය සංස්කෘතික මංගල්‍යයක් ලෙස අඛණ්ඩව විකාශනය වී පවතින මහනුවර දළදා පෙරහැරේ අභ්‍යන්තරික සමාජ සංස්ථාව පිළිබඳව විශ්ලේෂණය කිරීමට දළදා පෙරහැරේ ඓතිහාසික පසුබිම පිළිබඳව අවබෝධයක් ලබාගැනීම ද වැදගත් වේ.

වර්තමානයේ සාමාන්‍ය ජනයා පෙරහැර යන පදය **පෙරහැර** ලෙස භාවිත කරන අතර එය සාමාන්‍යයෙන් ජනප්‍රිය ව්‍යවහාරය ද වේ. **"පෙරහර"** පරිහාර ශබ්දයෙන් නිපන් වදනකි. පරිහාර ශබ්දය පාලි ග්‍රන්ථයන්හි නොයෙක් තැන්හි නොයෙක් අර්ථ ගම්‍ය කිරීම පිණිස යොදා ඇත. අවධානය, සැලකිල්ල, රැකබලා ගැනීම, ගෞරවය, වරප්‍රසාදය, උදාරත්වය යන විවිධ අර්ථ එයින් ප්‍රකාශ වේ. එහෙත් **"පෙරහැර"** නමින් වර්තමානයේ හැඳින්වෙන අර්ථය වනුයේ නැට්ටුවන්, ඇතුන් හා කොඩි, සේසත් ගත් මිනිසුන් පෙළට ගමන් කිරීමකි. එය පෙරහැරක් වනුයේ බුදුන් වහන්සේ හෝ වෙනත් පූජනීය උතුමෙකු හෝ වස්තුවක් විෂයෙහි ගෞරවය, සත්කාරය දක්වනු පිණිස කෙරෙන කාර්යයක් හෙයිනි. එබැවින් **දළදා පෙරහැර** හෝ

**ඇසළ පෙරහැර** හැඳින්වනුයේ දළදා වහන්සේ සඳහා කරන පුද සත්කාරයක් ලෙසය. ඇසළ පෙරහැර සහ දළදා පෙරහැර මුල් කාලීනව දෙකක් බව විවිධ ලේඛනගත තොරතුරු වලින් හෙළි වේ. ලාංකීය සමාජය තුළ පෙරහැර පැවැත්වීමේ සිරිත සිංහලයාගේ ආරම්භයේ සිටම පැවති බවට විවිධ වංශකථා සාක්ෂි දරයි. මහාවංශයට අනුව විජය රජු පඬු රජුගේ දුව මහ පෙරහරින් මෙහෙසි තනතුරෙහි අභිෂේක කළහයි සඳහන් වේ. එමෙන්ම ලක්දිවට ශ්‍රී මහා බෝධිය වැඩම කළ අවස්ථාවේ දඹකොළ පටුනේ සිට අනුරාධපුරය දක්වා මුළු මාර්ගය දෙපස අලංකාර කොට එය පෙරහැරින් වැඩම වූ බව සඳහන් වේ. මෙලෙස ලාංකීය පෙරහැර පිළිබඳ සංකල්පයට දීර්ඝ ඉතිහාසයක් පවතින බව පෙනේ. එහෙත් සෙසු පෙරහැර සහ වෙනත් පූජෝත්සවයන්ට වඩා සුවිශේෂිත්වයක් දළදා පෙරහැරට හිමි වේ. එය අද දක්වාම පාරම්පරික වත් පිළිවෙත්වලට අනුකූලව සිදුවීම එයට ප්‍රමුඛ හේතුවයි.

ක්‍රිස්තු පූර්ව යුගය තෙක් පෙරහැරේ ඉතිහාසය දිවෙන බව විවිධ විචාරකයන්ගේ මතයයි. නිදර්ශනයක් ලෙස ක්‍රි.පූ. 3 වන සියවසේ බෞද්ධ සමාජය තුළ පෙරහැර පැවති බවත් ධර්මාශෝක රජ දවස එය ඉතාම ප්‍රචලිත වූ බවටත් වංශ කතා තොරතුරු සාක්ෂි දරයි. විශේෂයෙන් බෞද්ධ සංස්කෘතියට ආවේණික අංගයක් ලෙස පෙරහැර එදා සමාජයේදී පැවති බවට සාධක පාඨලීපුත්‍ර, ඉසිපතන, ලුම්බිණි, කුසිනාරා, සාංචි ආදී බෞද්ධ පූජනීය ස්ථාන ආශ්‍රිත කලා නිර්මාණවලින් ප්‍රත්‍යක්ෂ වේ. එසේම විවිධ ඓතිහාසික ග්‍රන්ථ ගණනාවකින්ද තොරතුරු විශාල ප්‍රමාණයක් මේ පිළිබඳව ලබාගත හැකිය.

ලංකාවට බුදු දහම හඳුන්වාදීමත් සමඟම එවකට ඉන්දීය බෞද්ධ සංස්කෘතිය තුළ පැවති විවිධ සංස්කෘතිකමය අංග ද මිහිඳු හිමියන්ගේ ආගමනයත් සමඟ පැමිණ ඇති බව පෙනේ. නැවුම් ආගමික සංකල්පයන් හුදී ජනයන්ට හඳුන්වාදීම සඳහා පහසු මාර්ගයක් ලෙස ද දෘශ්‍ය ගෝචර ප්‍රපංචයක් වූ පෙරහැර හා සෙසු වත් පිළිවෙත් ක්‍රම උපයෝගි කරගන්නට ඇත. එයින් සාමාන්‍ය ජනයාගේ අධ්‍යාත්මික භක්තිය හා චරිත සංවර්ධනය

වැඩිදියුණු කිරීමට එය මහෝපකාරී වන අතරම යම් ආගන්තුක වත්පිළිවෙතක් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීමට එය විශේෂයෙන් ඉවහල් වේ. සංඝමිත්තා මෙහෙණිය විසින් ලක්දිවට ශ්‍රී මහා බෝධිය ගෙන ඒමත් සමඟම විවිධ පුදපූජා සහ පෙරහැර පැවැත්වූ අයුරින්, දළදා වහන්සේ වැඩම කිරීමත් සමඟ එම පුද පූජාවන් තවත් ක්‍රමවත් හා විධිමත් වන්නට ඇත. දළදාව රැගෙන ඒමට පෙර ශතවර්ෂ කිහිපයක් බෞද්ධ සංස්කෘතිය මෙරට හොඳින් ස්ථාපිතව පැවැතීම එයට හේතුවකි. ලක්දිව විවිධ වංශකථාවල තොරතුරුවලට අනුව දළදා පෙරහැර ආරම්භ වී ඇත්තේ ක්‍රි.පූ. 4 වන සියවසේදීය. එනම් ශ්‍රී මේඝවර්ණ (ක්‍රි.ව. 301 - 328) රජ දවසය. මෙහිදී දළදාව රාජකීය දළදා මන්දිරයේ සිට අභයගිරි විහාරයට පෙරහැරින් වැඩමවා ප්‍රදර්ශනය කොට විවිධ පුද පූජා පැවැත්වීමට ද විධිවිධාන සලසා ඇත. මේ පිළිබඳව විස්තර ෆාහියන්ගේ දේශාටක වාර්තාවලින් සනාථ වේ. මෙම වංශ කථාවල ඇති තොරතුරුවලට අනුව දළදා වහන්සේට පුදපූජා කළ විස්තර සඳහන් වුවද ඒ සඳහා පෙරහැරක් පැවැත්වූ බවට ලැබෙන සාධක ඉතාම අල්පය. එහෙත් අනුරපුර යුගයෙන් පසුව ඉතාම උත්කර්ෂවත් අයුරින් පෙරහැරක් පැවැත්වූ බවට සාධක ලැබෙනුයේ පොළොන්නරු සමයේදී පළමුවැනි පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1153 - 1186) රජ දවසය. අලංකාරාත්මක ලෙස වීදි දෙපස සරසා විවිධ පුදපූජා පවත්වමින් එය සිදුකළ බවට වංශකථාවන්හි තොරතුරු සඳහන් වේ.

පෙරහැර තුළ පැවති විචිත්‍රවත් බව සහ නැවුම් පරිවර්තනය පොළොන්නරු සමයේ පැවති පෙරහැරෙන් පසක් වේ. එහි විශේෂත්වය වූයේ ඇතැම් අය නෘත්‍ය ගීතාදියෙන් පුදපූජා කරමින් ධජ පතාකාදිය රැගෙන එහි ගමන් කිරීමයි. මෙලෙස පෙරහැර තුළ විවිධ ප්‍රදේශවලට අයිති කොඩි පතාක රැගෙන යාමෙන් හා නෘත්‍ය ගීතාදියෙන් පිළිබිඹු වන්නේ විවිධ සමාජ සංස්ථාවන්ගේ හා රජුට අයත් ප්‍රදේශයන්ගේ දායකත්වය බව කඹුරුගමුවේ වජිර හිමියන්ගේ අදහසයි. පොළොන්නරු සමයෙන් පසුව දඹදෙණි සමයේ පණ්ඩිත පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1236 - 1270) රජ දවස දළදා පෙරහැරක් පැවැත්වූ බව වංශකතාවල සඳහන් වේ. එම පෙරහැර පිළිබඳ බොහෝ විස්තරත් එහි ගමන් මාර්ගයන් පිළිබඳවත් තොරතුරු එහි සඳහන් වී ඇත. එහෙත් දළදා

වහන්සේ වැඩසිටි සෑම රාජ්‍යයකම වාගේ දළදා පෙරහැරක් පැවැත්වුවද වංශකථාවල විස්තරවලට අනුව යාපහුව රාජධානියේ දළදාව වැඩ සිටියද චාරිත්‍රානුකූලව වත් පිළිවෙත් කොට පෙරහැරක් පැවැත්වූ බවට සාධක එහි සඳහන් නොවේ. කුරුණෑගල රාජධානි සමයේදී දළදා පෙරහැරක් පැවැත්වූ බවට විස්තර වංශකථාවල සඳහන් වන අතරම 4 වන පණ්ඩිත පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1302 - 1326) විසින් රචිත "දළදා සිරිත" නම් ග්‍රන්ථයෙන් තොරතුරු රැසක් අනාවරණය කරගැනීමට හැකියාව ලැබේ. කුරුණෑගල සමයේ පැවති දළදා පෙරහැර සම්බන්ධ විශේෂ කරුණු ගණනාවක් හමු වේ. ප්‍රථමයෙන්ම නීති මාලාවක් හා අනුපිළිවෙලක් යටතේ පෙරහැර ක්‍රමවත්ව සංවිධානය කිරීමට උත්සාහ ගත් බවට සාධක ද දක්නට ලැබේ. දළදා පෙරහැර පැවැත්වෙන ආකාරයට එහිදී පිළිපැදිය යුතු නීති රීති මෙන්ම දළදා වහන්සේගේ භාරකාරත්වය පිළිබඳවත් පෙරහැරේ ගමන් ගන්නා පුද්ගලයන් සම්බන්ධවත් තොරතුරු ගණනාවක් කුරුණෑගල සමයේ පැවති පෙරහැර විස්තරවල සඳහන්ය. එයින් දළදා පෙරහැර පැවති පිළිවෙල පිළිබඳව මූලික කරුණු ගණනාවක් අවබෝධ කරගැනීමට හැකි වේ. එහෙත් මෙලෙස උත්කර්ෂවත් අන්දමින් පැවති දළදා පෙරහැර යාපහුව සමයේදී පැවැත් වූ බවට සාධක නොලැබේ. එසේම කෝට්ටේ සමයේ පැවති දළදා පෙරහැරක් පිළිබඳව සාධක නොලැබෙනමුත් දළදා වහන්සේ ඉමහත් ගෞරවයට පාත්‍රවී තිබූ බවට පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය තොරතුරු බොහෝ සොයාගත හැකිය. දළදා වහන්සේ වෙනුවෙන් ඉදිකළ විසිතුරු මාළිගා සහ විවිධ සංදේශ කාව්‍යවලදී දළදාව වන්දනා කොට යන ලෙස සඳහන් කළ තිබුණ ද දළදා පෙරහැරක් සම්බන්ධව තොරතුරු සඳහන් නොවේ. දළදා පෙරහැර සම්බන්ධව තොරතුරු ගවේෂණය කිරීමේදී හෙළිවන ප්‍රධාන කරුණක් වූයේ ලාංකීය සමාජයේ රාජ්‍යත්වයේ සංකේතය ලෙස දළදා වහන්සේ භාවිතා කර බවයි. විශේෂයෙන් රාජ්‍ය පාලනය කරන රජු සතුව දළදාව තිබිය යුතු අතර ඔහු බෞද්ධයෙකු ද විය යුතුය. ඔහු විසින් දළදාවට දෛනිකව හා වාර්ෂිකව කරනු ලබන වත් පිළිවෙත් නිසිලෙස ඉටුකළ යුතුව ද තිබිණි.

මෙලෙස දළදා පෙරහැර සම්බන්ධ වංශකථා, දේශාටන වාර්තාවලට අනුව විවිධ කරුණු සහ තොරතුරු සොයාගත හැකි වූ අතරම මහනුවර

සමයේදී දළදා පෙරහැරට සිදුවූ නව පරිවර්තනයන් පිළිබඳව ද තොරතුරු ගණනාවක් හමු වේ. මෙතෙකුදු දළදා වහන්සේ වෙනුවෙන් පුද සත්කාර ලෙස පැවති දළදා පෙරහැර **"ඇසළ පෙරහැර"** බවට පත්විය. එසේම දළදා පෙරහැරට මෙන් ඇසළ පෙරහැරට ද දීර්ඝ ඉතිහාසයක් තිබෙනු දක්නට ලැබේ. නමුත් අවසානයේ දළදා පෙරහැර හා ඇසළ පෙරහැර යන දෙකම එකතු වී ඇසළ පෙරහැර ලෙස ඉතාමත් චමත්කාරජනක සංස්කෘතිකමය මංගල්‍යයක් සැකසිණි.

ඇසළ පෙරහැර සම්බන්ධ කරුණු ගවේශණයේදී දක්නට ලැබෙන සාධක ක්‍රිස්තු පූර්ව යුගය දක්වා දිවෙන බව පෙනේ. එසේම ඇසළ පෙරහැරේ පරමාර්ථය හා දළදා පෙරහැරේ පරමාර්ථයන් දෙකක් බව ලාංකීය සමාජ සන්දර්භය තුළ සිට සාකච්ඡා කිරීමේදී අවබෝධ වේ. ඇසළ මස මෙය පවත්වන බැවින් ඇසළ පෙරහැර යන නාමය මෙයට ලැබී ඇත. එසේම විවිධ ඉතිහාසඥයන්ගේ මතවාදයන්ට අනුව ඇසළ පෙරහැර මගින් ධ්වනිත වන කරුණු ද ගණනාවකි. "එනම් ඉන්දියාවේ පුරාණ කාලයේ පටන් පැවත ආ "ආෂාඪ" උත්සවය මෙහි ආරම්භය වන්නට ඇතැයි නිගමනය කරයි. ඇසළ මස අමාවක අවසාන වූ සුරාසුර යුද්ධයෙන් සූරයන්ගේ ජයග්‍රහණය සංකේතවත් කිරීමට මෙය පැවැත් වූ බව තවත් මතයකි. එහෙත් ලාංකික සමාජය තුළ ඇසළ පෙරහැර ස්ථාපිත වීමට බලපෑ හේතුකාරකයන් ඊට මදක් වෙනස් බව පෙනේ. වංකනාසිකතිස්ස රජු ලංකාවේ රජකළ සමයේ සොළී රට රජකළ බලවත් රජකෙනෙකු ලංකාව ආක්‍රමණය කොට ලංකාවෙන් දොළොස්දාහක් තරුණයින් පැහැරගෙන ගිය පුවතක් වංශ කථාකරු සඳහන් කරයි. වංකනාසික තිස්ස රජුගෙන් පසුව රජවූයේ ඔහුගේ පුත් ගජබා රජුය. ඔහු ඉතාම දක්ෂ රණකාමියෙකු වූ බැවින් ඔහු සොළී රට ආක්‍රමණය කොට මෙරටින් පැහැරගත් තරුණයන් හා සොළීන් දොළොස්දාහක් ද රැගෙන ආවේය. ඒ සමඟම මෙරටින් පැහැරගෙන ගොස් තිබූ පාත්‍රා ධාතුව හා විෂ්ණු, කතරගම, පත්තිනි, නාථ දෙවියන්ගේ ආභරණ ද මෙරටට ගෙනාවේය. මෙලෙස ගජබා රජුගේ ජයග්‍රහණය සැමරීම වස් සෑම වර්ෂයකම ඇසළ මස පෙරහැරක් පවත්වන්නට විය. මෙහි විකාශනය ඇසළ පෙරහැර බව බොහෝ අයගේ මතය විය. මෙලෙස ඇරඹී ඇසළ පෙරහැර තුළදී සතර දේවාලවල

දෙවියන් සඳහා ද පුද සත්කාර කිරීමක් වශයෙන් එය පවත්වන ලදි. සතර දේවාල සඳහා මෙම පෙරහැර විධිමත් ලෙස සැකසුවේ හින්දු භක්තික රජෙකු වූ ශ්‍රී විජය රාජසිංහ රජුය. එබැවින් ඇසළ පෙරහැර තුළ මුඛ්‍ය අරමුණ වශයෙන් බෞද්ධ මුහුණුවරට වඩා හින්දු ආගමික නැඹුරුතාවක් දිස්වන්නට තිබේ. විශේෂයෙන් කතරගම, විෂ්ණු, පත්තිනි, නාථ දෙවියන්ට කරන්නා වූ පුද සත්කාරයක් ලෙස මෙය පැවැත් වූ බැවින් මේ සමයේ බෞද්ධාගමට වඩා හින්දු ආගම ඉදිරියට පැමිණි අතර වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර හිමියන් ඒ නිසා බලවත් සේ කණගාටු විය. එහෙත් එලෙස දීර්ඝ කාලයක් පුරා ඇසළ පෙරහැර දෙවියන් උදෙසා පවත්වන්නා වූ වත් පිළිවෙතක් ලෙස ලාංකික බෞද්ධ සමාජය තුළ නොතිබුණි. එයට නැවත බෞද්ධ මුහුණුවරක් ලැබෙන්නට වුයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවසය. එයින් ඇසළ පෙරහැරට නව අර්ථකථනයක් ලැබුණි. එවකට සිටි සරණංකර හිමියන්ගේ සහ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මැදිහත්වීමෙන් ශාසනික සංශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 1775 දී සියමයේ භික්ෂූන් වහන්සේලා සමඟ උපසම්පදා උත්සවයක් ලංකාවේ පවත්වන ලදී. එහිදී ලංකාවට වැඩම කළ උපාලි මහ ස්ථවිරයන් වහන්සේ වීථි සංචාරය කරන පෙරහැර දැක මහත් සේ කණගාටුව ප්‍රකාශ කළේය. මන්ද පිරිසිදු බුදු දහම පවතින රටක දෙවියන් වෙනුවෙන් මෙවැනි විශාල පූජෝත්සවයක් පැවැත්වීම අනුචිත බව දුටු හෙයිනි. එබැවින් උන්වහන්සේගේ උපදෙස් මත කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ඇසළ පෙරහැරේ පරමාර්ථය වෙනස්කොට එය නැවත දළදා වහන්සේ වෙනුවෙන් පවත්වන ලද පූජෝත්සවයක් ලෙස සංවිධානය කළේය. ප්‍රථමයෙන් මඟුල් ඇතු සරසා දන්ත ධාතූන් වහන්සේ ඇතුපිට වැඩම කිරිමටත් ඉන් අනතුරුව නාථ,විෂ්ණු, කතරගම, පත්තිනි පෙරහැරෙන් පසුව රන්දෝලි ගෙනයාමටත් ඔහු නියම කරන ලදී. මෙලෙස ඇසළ පෙරහැර පසුව මිනිස් ව්‍යවහාරයේදී දළදා පෙරහැර නමින් එය ප්‍රකට විය. අද දළදා පෙරහැර ලෝකයේ බෞද්ධ උත්සවයක් වන අතර ඉතාම උත්කර්ෂවත් ලෙස පවත්වන බෞද්ධ සංස්කෘතියේ කලා නිපුණත්වය පිළිබිඹු කරන කැඩපතක් බඳු උත්සවයකි. එහෙත් වර්තමානයේ ඇසළ පෙරහැර තුළින් දළදා වහන්සේ ප්‍රමුඛ සතර දේවාල සඳහා පවත්වන ලද පූජෝත්සවයක් ලෙස එය පරිවර්තනය වී ඇති බව පෙනේ.

මෙලෙස දීර්ඝ ඉතිහාසයක් දක්නට ලැබෙන දළදා පෙරහැර හෙවත් ඇසළ පෙරහැර මුඛ්‍ය අරමුණු ගණනාවක් පදනම් කොට වාර්ෂිකව පවත්වන බව පෙනේ. විශේෂයෙන් දළදා පෙරහැර සම්බන්ධව ප්‍රථමයෙන් කරුණු දැක්වීමේ දී හෙළි වනුයේ වාර්ෂිකව ඇසළ මාසයේ දළදා පෙරහැර පවත්වනුයේ දළදා වහන්සේට පුද සත්කාර කිරීමක් ලෙසය. නමුත් එයට නව අරමුණු ගණනාවක් ද එකතු වී ඇත. සතර දේවාලවලට අධිපති දෙවියන්ට පුද සත්කාර කිරීමත් මේ සමඟම සිදුවිය. එසේම මෙය වැස්සවළාහක දෙවියන්ට කරන පූජෝපහාරයක් ලෙසත් හැඳින්විය හැක. සූරයන්ගේ යුද්ධයේ ජයග්‍රහණය අනුස්මරණය කරන්නක් ලෙසද සඳහන් කළ හැක. නමුත් මේ සියලුම අරමුණුවලට වඩා ඉතාම වැදගත් අරමුණ වනුයේ ඇසළ පෙරහැර හෙවත් දළදා පෙරහැර බුදුන් වහන්සේගේ ශ්‍රී දන්ත ධාතුවට වාර්ෂිකව කරන පූජෝපහාරය නොසිඳවා පවත්වාගෙන යාමේ පූජනීය චාරිත්‍රයක් වශයෙනි.

මෙලෙස දිර්ඝ කාලයක් පුරා දළදා වහන්සේට ගෞරව කිරීම වස් පැවැත්වූ දළදා පෙරහැර පසුව සතර දේවාල දෙවියන්ට පුද සත්කාරයක් ලෙස පැවති ඇසළ පෙරහැර සමඟ සම්මිශ්‍රණය වී එය නව අරුතකින් ඇසළ පෙරහැර ලෙස දළදා වහන්සේට හා විෂ්ණු, කතරගම, නාථ, පත්තිනි දෙවියන්ටද පුද සත්කාර කරන සංස්කෘතික මංගල්‍යයක් ලෙස සකස් විය. විවිධ යුගයන්හි පැවති බෞද්ධ සංස්කෘතියේ මුදුන්මල්කඩ වන් දළදා වහන්සේ වෙනුවෙන් පවත්වන පෙරහැරට ඈත අතීතයේ පටන්ම රාජ්‍ය අනුග්‍රහය ඉහළ මට්ටමකින් ලැබුණු බව පෙනේ. නිදර්ශනයක් ලෙස දළදා වහන්සේ වෙනුවෙන්ම විවිධ මාළිගාවන් සෑදීම, පුද සත්කාර කිරීම සඳහා වෙනම පුද්ගලයන් කොටසක් රජු විසින් පත්කිරීම දැක්විය හැක. මේ සියලු ලක්ෂණයන්ට වඩා ඉතා වැදගත් වනුයේ දළදා වහන්සේ රාජ්‍යත්වයේ සංකේතය බවට පත්වීමයි. එනම් ලාංකීය සමාජයේ රජු යැයි සම්මත පුද්ගලයා සතුව සෑම විටම දළදා වහන්සේ තිබිය යුතුය. නැතිනම් එම රාජ්‍යත්වය නොපිළිගන්නා තරමට ජනයා පුරුදුව සිටියහ. රජතුමා විසින් දිවි හිමියෙන් දළදා වහන්සේ ආරක්ෂා කළයුතු අතරම ඒ සඳහා දෛනිකව හා වාර්ෂිකව කළයුතු පුද සත්කාරද නොපිරිහෙලා ඉටුකළ යුතු බව දළදා සිරිතේ

පවා සඳහන් වී ඇත. මෙලෙස දළදා වහන්සේ සම්බන්ධ සැකසුන නීතිරීති පද්ධතීන් සහ සෙසු උත්සවයන් රජු විසින් නොපිරිහෙලා ඉටුකරන ලදී. දළදා වහන්සේ සම්බන්ධව වාර්ෂිකව පවත්වනු ලබන පෙරහැර ඉතාමත් ක්‍රමවත්ව හා උත්කර්ෂවත් අන්දමින් සිදුකිරීම සඳහා රජුගේ නොමඳ ඇපකැපවීමක් තිබිය යුතුව ඇත. එනම් දළදා පෙරහැර සංවිධානය කිරීම එය නිසිලෙස පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන සැකසුම යනාදිය රජු ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයේ මූලික වගකීමක් ලෙස එවකට පිළිගෙන තිබිණි. එබැවින් රජුගේ බලය මෙහෙයවා එය ඉතාමත් ක්‍රමවත්ව පැවැත්වීමට රජ සැමවිටම උත්සුක වූ බව පෙනේ. නිදර්ශනයක් ලෙස සතියක් හෝ සති කීපයකට පෙර රජු සියලුම පිළිහුඩු ආහාර අනුභවයෙන් වැළකී, කිසිදු කිල්ලකට අහුනොවීම වැනි පේවීමේ ලක්ෂණ තුළින්ම දළදා වහන්සේ සඳහා පවත්වනු ලබන වතාවත්වල වටිනාකම අවබෝධ වේ.

පෙරහැර පැවැත්වීමට ප්‍රථම දෛනිකව දළදා මාළිගාව තුළ උදේ, දවල්, සවස පවත්වනු ලබන වතාවත් සඳහා රජු විසින්ම පත්කළ වෙනම පුද්ගලයන් කොටස් විය. දළදාව ප්‍රදර්ශනය කිරීම හෝ දළදාවේ අයිතිය පිළිබඳව වෙනම ප්‍රභූන් ගිහි පැවිදි කොටස් අතර දක්නට ලැබේ. දළදා පෙරහැර පැවැත්වීමේදී ද රජු විසින් ඔහුගේ බලය මෙහෙයවා බොහෝ දෑ ඒ ඒ සමාජ කොටස්වලට නියම කොට සිදුකළ බවද විවිධ වංශකථාවන්හි සඳහන් වේ. නිදර්ශනයක් ලෙස පෙරහැරට අවශ්‍ය සියලුම බෙර සෑදීම හා ඒවා පෙරහැරේ වාදනය කරමින් රැගෙන යාම **"බෙරවා කුලයට"** අයත් කාර්යයක් විය. එබැවින් දළදා පෙරහැර රජුගේ බලය මත ක්‍රියාත්මක වූ අතරම එවකට පැවති සමාජයේ කුල රටාවන්ට අනුව විවිධ කාර්යයන් පවරා තිබූ බව පෙනේ. දළදා පෙරහැර යනු රජතුමා ප්‍රමුඛ ඔහු වටා සිටි සියලුම සමාජ කොටස් නියෝජනය කරන කලා මංගල්‍යයක් ලෙස හැඳින්විය හැක. මෙලෙස සමාජ සන්දර්භයේ සියලුම පුද්ගලයන් සහභාගි වන ඇසළ පෙරහැර සුවිශේෂී සමාජ කෘත්‍යයක් ලෙස අර්ථ දැක්විය හැක.

එබැවින් දළදා වහන්සේ වෙනුවෙන් වාර්ෂිකව පවත්වනු ලබන දළදා පෙරහැර පිළිබඳව සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් අධ්‍යයනය කිරීම

එවකට පැවති සමාජ ධූරාවලිය හෝ සමාජ ස්වරූපය අවබෝධ කරගත හැකි මිණුම් දණ්ඩක් ලෙස භාවිතා කළ හැකිය. දෘෂ්‍යමාන, ලිඛිත මූලාශ්‍රයන්ට අනුකූල සාධක හමුවූයේ මහනුවර සමයේ හා ඉන් මෑත යුගයේදීය. එබැවින් මෙම අධ්‍යයනයේදී එම කාලපරිච්ඡේද තුළ සිදුකෙරුණු පෙරහැර පදනම් කොට මේ අධ්‍යයනය කරනු ලැබේ. ඉහත සඳහන් කළ ආකාරයට රජුගේ සිට සමාජයේ පහළම ස්ථරය නියෝජනය කරන පුද්ගලයාගේ දායකත්වයද පෙරහැරට ලැබුනු බව පෙනේ. පෙරහැර පැවති වැඩවසම් සමාජ ක්‍රමයේ ස්වරූපය ප්‍රතිනිර්මාණය කරන්නක් ලෙසට අර්ථ දැක්විය හැක. එපමණකුදු නොව දළදා පෙරහැර හා ඒ වටා ගොඩනැගී ඇති බෞද්ධ වත්පිළිවෙත් මගින් ද පැහැදිලිවම එවකට පැවති සමාජ රටාව නිරූපනය වන බව බොහෝ විචාරකයන්ගේ ද අදහස වී පවතී. දළදා පෙරහැර මගින් නිරූපනය වන එවකට පැවති වැඩවසම් සමාජ ක්‍රමය කෙලෙස ධ්වනිත වන්නේද යන්න අධ්‍යයනය කිරීමේදී ඒ සඳහා සාධකයන් ලබාගැනීම පැරණි වංශකථා විවිධ සාහිත්‍ය මූලාශ්‍ර හා දේශාටන වාර්තාවලින් ලැබෙන සාධකවලට පමණක් සීමා වීමක් සිදුවන බව පෙනේ. නමුත් පෙරහැර සම්බන්ධව ලියවී ඇති ඓතිහාසික වටිනාකමකින් යුතු විවිධ ලේඛනයන්ගෙන් ලැබෙන තොරතුරු තුළින් එවකට පැවති පෙරහැරේ ස්වභාවය හා ඒ සඳහා ජනයාගේ දායකත්වය කෙබඳු අයුරකින් පැවතියේද යන්න අවබෝධ කරගත හැකිය.

සමාජයක් යනු සංකීර්ණ ජන සබඳතා හා ආයතනික රටාවන්ගෙන් ගැවසීගත් සාර්ව ඒකකයකි. මෙලෙස සංකීර්ණ සම්බන්ධතාවලින් යුක්ත වූ සමාජයක් විවිධ දෑ පදනම් කරගෙන විවිධ අයුරින් වර්ගීකරණය කිරීමක් කළ හැකි බව සමාජ විද්‍යාඥයන් පෙන්වා දී ඇත. සමාජ ස්ථරායනය යනු එලෙස සමාජය ඉතාම සරල ලෙස විවිධ දෑ පදනම් කරගෙන වර්ගීකරණයට ලක්කිරීමක් ලෙස හඳුන්වාදිය හැක. පොළොවේ පස් තට්ටු ගණනාවක් එකිනෙක මත තැන්පත් වී තිබෙන්නාක් මෙන් සමාජය ද විවිධ වූ උස් පහත් මට්ටම් අනුව ස්ථාරගත වී ඇති බව පෙනේ. සමාජ ස්ථරායනය සම්බන්ධව කරුණු ගවේෂණය කිරීමේදී හෙළිවන ප්‍රධාන ලක්ෂණය වනුයේ ඉහත සඳහන් කලාක් මෙන් පොළෝ තලයේ දක්නට ලැබෙන පස් තට්ටු ස්ථරගත වූ ආකාරයට සමාජ කොටස් උස් පහත් ලෙස සරල රේඛීයව බණ්ඩනය

කිරීමට නොහැකිය. ස්ථරායනයෙන් තොර සමාජයක් නූතන ලෝකයේ දක්නට නොලැබීමද සුවිශේෂත්වයකි.

දකුණු ආසියාතික සංස්කෘතියේ කුලය වැදගත් සමාජ සාධකයකි. පැරණි සමාජයන්හි මෙය ඉතා ප්‍රබල ලෙස දැකගත හැකි අතර ක්‍රි.පූ. යුගයටත් එහා දීර්ඝ ඉතිහාසයකට දිවෙන බව විවිධ ලේඛන හා විවිධ මූලාශ්‍ර තොරතුරුවලින් අනාවරණය වේ. එසේම කුල විෂමතාවය පැහැදිලිව සමාජ නිර්මිතයක් වන අතර මෙය දකුණු ආසියාතික සමාජයේ මුල් බැසගත් සාධකයකි. පුද්ගලයෙකුගේ තරාතිරම, වෘත්තිය, හැසිරීම් රටාව, සමාජ තත්වය යනාදි බොහෝ දේ ජන්මයෙන්ම මෙම කුල රටාව නිසා තීරණය විය. මෙය ලාංකීක සිංහල සමාජයේ හා ඉන්දියාවේ හින්දු සමාජයේ බහුලව දැකිය හැකි ලක්ෂණයකි. ඉන්දියානු සමාජයේ කුල රටාව චතුර්වේදයට අනුව බ්‍රාහ්මණයන් විසින් ඉදිරිපත් කර ඇත.

"බ්‍රහ්මණෝ මුඛ මාසිද්
බාහු රාජණ්‍යං කෘතඃ
ඌරු තදසය වෛශ්‍යං
පාද්භියං ශූද්‍රෝ අජායත"

යනුවෙන් දක්වා ඇත. බ්‍රාහ්මණ වර්ණය හා මහා බ්‍රහ්මයාගේ වර්ණය මුඛයෙන්ද, ක්ෂත්‍රිය වර්ණය ඔහුගේ දෙවුරින්ද, වෛශ්‍ය වර්ණය දෙකලවයෙන්ද, ශුද්‍ර වර්ණය යටිපතුලෙන්ද උපන් බව ප්‍රකාශ කර ඇති අතර ඒ උපන් ස්ථාන අනුව ඒ ඒ කුලයන් පිළිවෙලින් කුල ධූරාවලියකට අනුකූලව සකස් කර ඇති බව පෙනේ. ඉහළම සිටින බ්‍රාහ්මණ කුලය සියලුම සෙසු කුල තමා යටතේ පවතින ආකාරයට සකසා ඇත. මෙම කුල ක්‍රමය මුල්කාලීන ලාංකික සමාජයේ තිබුණද පසුව එය වෙනස් වී ලාංකික සමාජ සන්දර්භයේ දී එයට නව අර්ථකථනයන්ද මුසුවීමෙන්ම වෙනස් කුල රටාවක් සැකසී ඇත. විශේෂයෙන් ලාංකික සිංහල සමාජයේ උඩරට, පහතරට යනුවෙන් දළ වර්ගීකරණයක් තිබෙන අතර කුල රටාවේ දැඩි බලපෑමකට උඩරටියන් හසුවී සිටි බව මහනුවර සමයේ සම්බන්ධ බොහෝ තොරතුරු වලින් අවබෝධ වේ. වෘත්තීමය පදනම මත කුල රටාවක් තිබූ අතර එය කුල ධූරාවලියක් ලෙස

එකිනෙකක් පිළිවෙලකට උසස් හා පහත් මට්ටම්වලට සකස් වී ඇත. විශේෂයෙන් මෙම අධ්‍යයනයේදී මහනුවර සමයේ හා ඉන් පෙර හා පසු පැවති කුල රටාව පිළිබඳ බොහෝ සාධක විවිධ සංස්කෘතිකමය අංගයන් තුළින් ද අවබෝධ කරගත හැකිය. එසේම ලාංකීක කුල ක්‍රමයේ ප්‍රභවය පිළිබඳ නිශ්චිත අදහසක් ද නැත. ලාංකික සමාජයේ කුල ධූරාවලිය තුළ කුල වර්ග නිශ්චිත ප්‍රමාණයක් ද නැත. එය බොහෝවිට වෙනස්වන අවස්ථාද ඇත. නමුත් පැහැදිලිව ජනවංශයට අනුව ලාංකික කුල රටාව වෘත්තීමය පදනම මත රජුට සේවය කිරීම සඳහා සැකසී තිබූ බව පෙනේ. විශේෂයෙන් කුල ක්‍රමය පිළිබඳ දීර්ඝ විස්තරයක් කරන ආනන්ද කේ. කුමාරස්වාමි, නන්දදේව විජේසේකර , ජෝන් ඩේවි ආදීන් බොහෝමයක් ලංකාවේ කුල රටාව පිළිබඳව අදහස් දක්වා ඇති අතර ඒ සියල්ලම සැසඳීමේදී හෙළි වනුයේ පැහැදිලිවම උසස් යැයි සම්මත කුල කිහිපයක් හා පහත් යැයි සම්මත කුල ගණනාවක් ලංකාවේ තිබූ බවයි. එය වෘත්තීමය පදනම අනුව සැකසුන බවද හොඳින් දැකගත හැක. ආනන්ද කේ. කුමාරස්වාමි **"මධ්‍යකාලීන සිංහල කලා"** පොතේ ඉදිරිපත් කළ කුල රටාව පහත සඳහන් වේ. එය ඒ ඒ කුලයන්ට හිමි තත්වය අනුව සැකසී ඇති අනුපිළිවෙලද ඒ අයුරින්ම දැක්වේ.

1. ගොවියෝ (හන්දුරුවෝ (නොක්ස්ගේ "හොන්ඩ්‍රෑස්") වෙල්ලාලයෝ, ගොවියෝ)
2. ජේසකාරයෝ (සලාගමයෝ, "හාලි", වියන්නෝ)
3. කඹුරු (නවන්දන්නෝ, ගල්ලද්දෝ)
4. වඩුවෝ (වඩුවෝ, යකඩ වැඩ කරන්නෝ ආදිහු)
5 හන්නාලි (මසන්නෝ, ගෙත්තකම් කරන්නෝ)
6. රදවු (රෙදි සෝදන්නෝ)
7. ඇම්බැට්ටයෝ (කරනවෑමියෝ)
8. සොම්සාරයෝ (හම්වැඩ කරන්නෝ, පාවහන් සාදන්නෝ)
9. දූරාවෝ (රා මදින්නෝ)
10. කුම්භකාරයෝ (බඩහැලයෝ)
11. කරාවෝ (මාලු අල්ලන්නෝ)
12. වැද්දෝ (දඩයම් කරන්නෝ)
13. බොරවායෝ (තූර්ය වාදකයෝ, රෙදි වියන්නෝ, බොහෝවිට

නැකතියෝද)

14. හකුරුවෝ (හකුරු සාදන්නෝ)
15. හුන්නෝ (හුණු පුළුස්සන්නෝ)
16. පන්නයෝ (තණ කපන්නෝ)
17. යමන්නෝ (යකඩ උණු කරන්නෝ)
18. වැල් වඩුවෝ (වේවැල් වැඩ කරන්නෝ)
19. ගහලයෝ (පහත් මෙහෙකරුවෝ)
20. පදුවෝ (දාස ගොවියෝ, පල්ලැක්කි ගෙනයන්නෝ)
21. මාලාකාරයෝ (පහත් මල්කරුවෝ, උයන්පල්ලෝ)
22. කින්නරයෝ (පැදුරු වියන්නෝ)
23. රොඩියෝ (තඹ සාදන්නෝ, හම් පදම් කරන්නෝ)
24. ඔලියෝ (නටන්නෝ)
25. ඉන්ද්‍රජාලිකයෝ (ඇස්බැන්දුම්කාරයෝ)
26. චණ්ඩාලයෝ (ගෙරි මස් කන්නෝ, කසල ශෝධකයෝ)

කුමාරස්වාමි - 1962

දේශීය කුල රටාවේ ඉහළ වැජඹෙනුයේ ගොවිගම කුලයයි. එයද කොටස් කීපයකින් සමන්විත වීම විශේෂය. එනම් රදල, ගොවි, පට්ටි ලෙසය. රදල යනු ඉඩම් හිමි අය වේ. ගොවි යනු රටේ ඇත්තෝ විය. පට්ටි යනු ගව පාලනය කරන කුලය වේ. මොවුන්ගෙන් රදල කුලය හා ගොවිගම යන කුලවල අය බොහෝ කුලවල සේවා ලබන අය විය. අනික් සියලුම කුලයන් පහත් යැයි සම්මත කුලයන් විය. එසේම ලාංකික කුල ධූරාවලියේ 2, 3, 4, 5 වැනි ස්ථාන නවන්දන්නෝ, කරාව, දූරාව, සලාගම ආදි කුලයන් අයිති වුවද විවිධ පුද්ගලයන්ගේ විශ්ලේෂණයන්ට අනුව එය වෙනස් විය හැක.

මහනුවර සමයේ ඉතාම ප්‍රබල ලෙස උඩරට සමාජයේ ද කුල රටාව ඉතාමත් ඉහළ තත්වයකින් පැවති බව පෙනේ. විශේෂයෙන් රාජ්‍යත්වයට පත්වීමේ සිට ඉතාම පහත් පෙළේ වෘත්තිය දක්වා කුල ධූරාවලියට අනුව සැකසුනු බව හොඳින් දැකගත හැක. මෙම ලක්ෂණ දළදා වහන්සේ වෙනුවෙන් පවත්වන්නට යෙදූ දළදා පෙරහැරෙන්ද නිරූපනය වේ. ලාංකීය

සමාජයේ සියලුම ක්ෂේත්‍රයන්ගේ එකතුවකින් පවත්වනු ලබන කලා මංගල්‍යයක් බඳු දළදා පෙරහැර තුළ පැහැදිලිව ඒ ඒ සමාජ කොටස්වලට හා කුලයන්ට හිමි කාර්යභාරයක් තිබූ බව පෙනේ. එබැවින් බුද්ධිගෝචර ලෙස දළදා පෙරහැර අධ්‍යයන කිරීම තුලින් එවකට පැවති කුල භේදය හා කුල ධූරාවලිය කුමක් ද යන්න අවබෝධ කරගත හැකි බව පෙනේ.

ජනවාර්ගිකත්වයද කුලය මෙන් මිනිසෙකුට උත්පත්තියෙන්ම ලැබෙන , කිසිදු ලෙසක නොවෙනස්ව පවතින අනන්‍යතාවයකි. ලාංකීය සමාජයේ පමණක් නොව යුරෝපීය බොහෝ රාජ්‍යවලද ජනවාර්ගිකත්වය ජනවාර්ගික අර්බුද රැසකට මඟ පාදා ඇත. එක් ජාතියක් තව ජාතියකින් වෙන්කොට උසස් යැයි සැලකීම මෙයට බලපෑ මූලික හේතුව වේ. විශේෂයෙන් වර්තමාන ලෝකයේ උසස් යැයි දියුණු යැයි සම්මත ජනවර්ග ලෙස සැලකෙනුයේ යුරෝපීය කේන්ද්‍රීය රටවල සුදු ජාතික මිනිස් සමාජයන්ය. මේ තත්වය රාජ්‍යයන් තුළ ද ඉතාම සීඝ්‍ර මට්ටමේ ඉහළ අනුපාතයක් ලබන්නා වූ ප්‍රශ්නයක් බවට ද පත්වී ඇත. ලාංකීය සමාජයේ සිංහල - දෙමළ ප්‍රශ්නය එයට හොඳම නිදසුනක් වේ. එක් ජාතියක් තව ජාතියකට වඩා උසස් හෝ වරප්‍රසාද වැඩි බව මත ඒ ගැටළු උද්ගත වී ඇත. ජීවන මට්ටම, ගරුත්වය, පිළිගැනීම ආදි සාධක වලින් යම් යම් ජාතීන්ට විවිධ අසාධාරණකම් ලාංකික සමාජයේ සිදුවී ඇත. වතුකරයේ කම්කරු දෙමළ ජනතාවට අධ්‍යාපනය, පිළිගැනීම්, බලය, දේශපාලනමය නියෝජනය යනාදිය සම්බන්ධයෙන් තරමක අඩු සැලකිල්ලක් යොමු වී ඇත. එබැවින් මෙම ජනවාර්ගිකත්වය ද සමාජ ස්ථරායනයේ ප්‍රබල සාධකයක් බවට පත්වී ඇත. මෙය මහනුවර සමයේද විවිධ මට්ටමේ අඩු වැඩි වශයෙන් පැවති බව පෙනේ. විශේෂයෙන් දළදා පෙරහැර සිංහල බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ වන් පූජනීය සංස්කෘතික මංගල්‍යයකි. එසේම ඒ සඳහා කරන වත් පිළිවෙතක් ලෙස වාර්ෂිකව පැවැත්වෙන ඇසළ පෙරහැරට සෙසු ජාතිකයන්ගේ සහභාගිත්වයක් තිබුණේද, පසුකාලීනව ඇසළ පෙරහැර (සතර දේවාල පෙරහැර) එකතු වීමෙන් ඒ තත්වය වෙනස් වූයේද යන්න මෙහිදී විශේෂයෙන් සාකච්ඡා කෙරේ.

පංතිය යනු දේපල හිමිකම අතින් විෂමතාව පදනම් කොට ගොඩනැගුනකි. හොඳ ආර්ථික මට්ටමක්, හොඳ අධ්‍යාපනයක් ලබා ඇති ඉහළ කුලයකට අයත්වීමම ඔහුගේ පංතිය හඳුනා ගැනීමට, යම් ඉහළ පංතියකට ඔහුව අයත්වීමට මූලික හේතුව විය හැක. ලංකාවේ පංති විග්‍රහය ඉහත ඇතිවූ ආර්ථික හා සමාජීය වෙනස්කම් මත ඉහළ, පහළ හෝ මධ්‍යම නැත්නම් ධනපති පංතිය ලෙස වර්ග කළ හැක. විශේෂයෙන් පංති සමාජයන්හිදී මේ තත්වය අඩු වැඩි වශයෙන් පවතින ප්‍රභූන් යැයි සම්මත ඉහළ කුලවලට අයත් බොහෝ පුද්ගලයන් ආර්ථිකයෙන්, බලයෙන්, වෘත්තීන් අතින් ඉහළ තත්වයක් ලබා සිටි නිසා ඔවුහු ඉහළ පංතියකට අයත් වූවෝ වූහ. ලාංකික සමාජයේ මහනුවර අවධියේ දී ද පංති විෂමතාව බොහෝවිට වෘත්තීමය කුලය තුළින්ම තීරණය විය. ඉඩම් හිමි, බලය හිමි, ඉහළ ආර්ථිකයක් හිමි සීමිත කොටසක් සිටි අතර එයින් බහුතරය රජු සතු විය. එබැවින් සියලුම සෙසු පහත් යැයි සම්මත කුලවල ජනයා රජුට සේවය කලයුතු අතර එයට රජු විසින් ඔහුගේ ඉඩම් භුක්ති විඳීමට අවස්ථාව සලසා දී ඇත. මෙලෙස පැවති පංති සහිත සමාජය දළදා පෙරහැර තුළින් කෙලෙස නිරූපනය වන්නේද යන්න මෙහිදී විශේෂයෙන් නිදර්ශනය සහිතව සාකච්ඡා කෙරේ.

දළදා වහන්සේ වෙනුවෙන් වාර්ෂිකව පවත්වනු ලබන දළදා පෙරහැරට මහනුවර සමයේදී විවිධ නවාංගයන් එකතු වූ බව මීට පෙර සඳහන් කළෙමු. මෙහිදී විශේෂයෙන් මහනුවර යුගයේ සහ ඊට ප්‍රථම දන්ත ධාතූන් වහන්සේ සඳහා පැවැත්වූ දළදා පෙරහැර සම්බන්ධ බොහෝ තොරතුරු හමු වුවද ලාංකික සමාජයේ පැවති සමාජ ස්ථරායනය පිළිබඳ ලැබෙන සාධක ඉතාම අල්පය. එහෙත් දළදා පෙරහැර තුළින් ධ්වනිත වන ලාංකීක සමාජයේ පැවති සමාජ ස්ථරායනය පිළිබඳ බොහෝ සාධක අද අඩු වැඩි වශයෙන් ඒ අයුරින්ම පවතින බව පෙනේ. විශේෂයෙන් මූලිකවම වත්පිළිවෙත් පැවැත්වීමේ සිට පෙරහැර අවසාන වීම දක්වාම මෙම වතාවත් සඳහා සහභාගිවන මිනිසුන්ගේ තත්වය, කුලය, පංතිය, ස්ත්‍රී පුරුෂ භාවය, වයස ආදිය පැහැදිලිව අවබෝධ කරගැනීමට හැකියාව ඇත. එබැවින් දළදා පෙරහැර යනු පැවති වැඩවසම් සමාජ ක්‍රමයේ ප්‍රතිනිර්මාණය කරන

කැඩපතක් බඳු පුරාවිද්‍යාත්මක සාධකයන් ලෙස ද අර්ථ දැක්විය හැක. එහෙත් මෙහිදී විශේෂයෙන් මීට පෙර ඉදිරිපත් කළ සමාජ ස්ථරායනයේ සාධක කිහිපය පදනම් කරගෙන දළදා පෙරහැරෙන් නිරූපනය වන සමාජ ස්ථරායන පිළිබඳ සාකච්ඡා කරන අතරම ඊට ප්‍රථම දළදා වහන්සේ වෙනුවෙන් දෛනිකව පවත්වනු ලබන වතාවත් තුළ ඉහත සාධකයත් කොතෙක් දුරට ධ්වනිත වන්නේද යන්නත් මෙහිදී සාකච්ඡා කෙරේ.

දළදා වහන්සේ වෙනුවෙන් දෛනිකව තෙවරක් වත්පිළිවෙත් පවත්වන බව විවිධ වංශකථාවල මෙන්ම විවිධ දේශාටක වාර්තාවලින්ද තොරතුරු ගණනාවක් හමුවේ. එපමණක් නොව වර්තමානයේ ද එම තත්ත්වය ඒ අයුරින්ම පාරම්පරික වත් පිළිවෙත්වලට අනුකූලව සිදුකරන බව පෙනේ. විශේෂයෙන් අළුයම පූජාව හෙවත් අළුයම් ධූරය, දවල් පූජාව, සන්ධ්‍යා පූජාව යනුවෙන් අවස්ථා තුනකදී පූජාව පවතී. මෙම පූජාවන් පැවැත්වීමේදී පුරුෂ පාර්ශවය පමණක් යොදාගන්නා අතර වතාවත් පැවැත්වීම හා ඒ සම්බන්ධ සියලුම කටයුතු භාරවනුයේ ඉහළ පැළැන්තියේ කුලවල අයටය. දළදා මාළිගාවේ වතාවත් සඳහා පිරිමි සහ භික්ෂූන් පමණක් යොදා ගැනීම අතීතයේ සිට සිදුවූවකි. මන්ද ස්ත්‍රීන් හෙවත් ගැහැණු පාර්ශවය කිලිටි නැතිනම් කිල්ලට හසුවිය හැකි පුද්ගලයන් ලෙස සිතූ නිසා ඔවුන්ව යොදා ගැනීමක් සිදු නොකර ඇත. අළුයම පූජාව සඳහා සංඝක්කාර මුහන්දිරම්ගේ අනුග්‍රහය ඇතිව පත්කරන ලද සිව්දෙනෙකු විසින් මෙම පූජාව පවත්වනු ඇත. වට්ටෝරුරාළට මාළිගාවේ දොරවල් විවෘත කිරීම භාරවිය. ගෙපරාල කිරි ආහාර ගෙනවිත් වට්ටෝරු රාළට භාර කරයි. මෙම වට්ටෝරුරාළ හා ගෙපරාළ සංඝක්කාර මුහන්දිරම්ද ඉඩම් හිමි ඉහළ කුලයන් නියෝජන කරන පුද්ගලයන් විය. විශේෂයෙන් ගොවිගම කුලය නියෝජනය කල අයවළුන් වේ. බොහෝ ඓතිහාසික වාර්තාවලට අනුව මහනුවර දළදා මාළිගාවේ අභ්‍යන්තරික කටයුතු භාරව වැඩකටයුතු කිරීමේදී උසස් හා පහත් අය ලෙස කොටස් දෙකක් බෙදී සිටි බවද හොකොට් මහතා පෙන්වා දී ඇත. විශේෂයෙන් භික්ෂූන් වහන්සේලා හැර සෙසු පුද්ගලයන් මේ යටතට ගැනේ. සමාජයේ වැදගත් තැනක් භික්ෂූන්ට එදා හිමි වූ අතර සෙසු පුද්ගලයන්ගේ බොහෝ විට දළදා වහන්සේගේ සමීප කටයුතු කිරීමට උසස් යැයි සම්මත

කුලීනයන් යොදා ගත් බව පෙනේ. ඉහත දැක්වූ ලෙස අළුයම් පූජාවට යොදාගත් පුද්ගලයන් දෙදෙනාත් මධ්‍යම පූජාව සඳහා යොදාගන්නා කත්තියරාළ හා වට්ටෝරුරාළ ඒ යටතට ගැනේ. ප්‍රථමයෙන් දහවල් පූජාවේදී මුළුතැන්ගේ පිසින ලද ව්‍යංජනයන් 32 ක් සහිත දානය කත්තියරාළ විසින් ඉහළ මාලයට ගෙන ගොස් ගෙපරාළට බාරදෙයි. ඔහු විසින් එය භික්ෂූන්ට පිරිනමයි. මෙලෙස පූජා සත්කාර කිරිමේදී අඛණ්ඩව බෙර වාදනයේ යෙදෙන පිරිසක්ද සිටී. සන්ධ්‍යා පූජාවද භික්ෂූන් ප්‍රමුඛ වට්ටෝරුරාළගේ ආධාරය ඇතිව සංඝයාට දොරවල් විවෘත කොට හේවිසි හඬ මධ්‍යයේ ගිලන්පස පූජා කරයි. මෙලෙස දෛනිකව පවතින පූජා විධි හරහා මුල්කාලීනව පැවති රාජකාරිය හිමිව තිබුණේ පිරිමි ගිහියන්ට හා භික්ෂූන් වහන්සේලාටය. එසේම මෙම භික්ෂූන් වහන්සේලා මල්වතු හෝ අස්ගිරි විහාරයන්ට අයත් වූ අතර සෙසු භික්ෂූන්ට වඩා තරමක් වැඩි ගෞරවයක් ඔවුන්ට හිමිව තිබුණි. නිදර්ශනයක් ලෙස දළදා වහන්සේට තේවාව කරන භික්ෂූන් වහන්සේ නමක් වයස තරමක් බාල වුවද වයසින් වැඩි නායක හිමිනමක් පවා ඒ හිමිනම පැමිණි විට නැගිට ගෞරව කිරීමක් සිදුකල බවද ඉතිහාසයේ සඳහන් වේ. මුල්කාලිනව දළදා වහන්සේ සම්බන්ධව වතාවත් කිරීමේදී සියලු කටයුතු කිරීමේ රාජකාරි කිරීමේ අයිතිය රජු සතු වූවකි. වර්තමානයේ මෙය අස්ගිරි හා මල්වතු විහාරවාසි භික්ෂූන්ට හා දියවඩන නිළමේ විසින් සිදුකරනු ලබයි. දළදා මාළිගයේ වැඩකටයුතු සියල්ලම කිරීමේ මූලික අයිතිය උසස් කුලවල අයට විය. නිදර්ශනයක් ලෙස හොකොට්ගේ විස්තරවලට අනුව මාලිගාවේ අභ්‍යන්තරික ආවතේවවල නිරත වී සිටින සියල්ලෝම ගොවි කුලයට අයත් වූවෝය. අංගනයේ සිට බෙර වාදනය කරන්නන් හීන කුලයන්ට අයත් වූවෝය. ඔවුහු බෙරවා කුලයට අයත් වෙති. එසේම ඉහළ මාලයේ කවිකාරයන් ගොවි කුලයට අයත්වීම විශේෂ වේ. මොවුන් බෙර, කිකිණි, රබන්. කයිතාලම් වයමින් ගීත ගායනාද කළහ. එබැවින් බෙර ගැසීම හින කුලයට අයත්වීමේ ලක්ෂණයක් නොවන බව පෙනේ. විශේෂයෙන් දළදා වහන්සේට පුදපූජා කිරීම සඳහා පිළියෙල කරන ව්‍යාංජන සකසන අරක්කැමියා ගොවි කුලයට අයත්වීම විශේෂ වේ. මෙලෙස දළදා මාළිගාවේ දළදා වහන්සේ වෙනුවෙන් පුද සත්කාර කිරීමේදී පැහැදිලිව එවකට පැවති සමාජ ස්ථරායනය මැනවින් ධ්වනිත වන බව පෙනේ. විශේෂයෙන් උසස්

යැයි සම්මත කුලවලට අයත් පුද්ගලයන් එම වතාවත් කිරීමත් ඒ සියල්ලටම පිරිමි යොදා ගැනීමත් ආරක්ෂාව , බෙර ගැසීම ආදිය පහත් යැයි සම්මත කුලවලට අයත් පුද්ගලයන් යොදා ගැනීමෙන් පෙනේ. තවද කිසිදු විටෙක සිංහල නොවූ පුද්ගලයෙකු ඒ සඳහා යොදාගත් බව සඳහන් නොවේ. මන්ද නීතිරීතිවල ඒ ඒ වෘත්තීය හෝ රාජකාරිය කිරීම සඳහා රජුගේ නියමයෙන්ම විවිධ කුල ඒ සඳහා වෙන් කර තිබූ බව පෙනේ. පරම්පරාගතව මෙම රාජකාරිය ක්‍රියාත්මක වූ අතර මේ සියලුම පුද්ගලයන්ට විවිධ ප්‍රදේශවල මාළිගාව සතු ඉඩකඩම් භුක්ති විඳීමේ අයිතිය රජු විසින් පවරා තිබූ බව දැකිය හැකිය. නිල පංගුව යනුවෙන් සඳහන් වන්නේ එසේ රාජකාරිය වෙනුවෙන් ගාස්තුව වශයෙන් දුන් ඉඩ කඩම්ය. විහාර හා දේවාලවල පවතින හා සේවා පවත්වාගෙන යාම සඳහා දේවාල ගම් හා විහාරගම් පූජා කළ ද රොබට් නොක්ස්ගේ වාර්තාවල සඳහන් වේ. මේ අයුරින් දළදා වහන්සේ සඳහා දෛනිකව පවත්වනු ලබන පුද සත්කාරද ක්‍රමවත් පිළිවෙලකට සිදුවූ බවත් එහිදී එවකට පැවති සමාජ ස්ථරායනයේ සැකැස්ම පැවති ආකාරය පිළිබඳවත් අවබෝධයක් ලබාගත හැකිය. විශේෂයෙන් මහනුවර සමයේ දක්නට ලැබුණු කුල ධූරාවලිය පිළිබඳව බොහෝ සාධක ඉහත කරුණු තුළින් ගම්‍යමාන වේ.

වර්තමානයේ ඇසළ මස මහත් උත්සවශ්‍රීයෙන් පවත්වනු ලබන දළදා මංගල්‍යය (දළදා පෙරහැර) සංවිධානය කිරීමේදී රජුගේ පූර්ණ දායකත්වයට අමතරව ඔහු විසින් පත්කරන ලද ප්‍රධාන පෙලේ නිලතල දැරූ පුද්ගලයන් ගණනාවක් සිටි හා සිටින බව ලේඛනගත තොරතුරුවලින් හමුවේ. මෙම නිලධාරින් ශ්‍රී දන්ත ධාතු මන්දිරයේ ඇතුළත කට්ටලේ රාජකාරියද බොහෝ විට සිදුකරන ලදි. මෙම නිලධාරින් පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පැහැදිලිවම එවකට ලාංකීය සමාජ සන්දර්භය තුළ පැවති කුල ධූරාවලිය, පංතිමය තත්වය, පුමිතිරි බව, ආදී සමාජ ස්ථරායනයට කෙලින්ම බලපාන සාධකයන් හොඳින් අවබෝධ කරගත හැකිය.

දළදා මාලිගාවේ නිලධාරින් අතර ප්‍රධානත්වය හිමිවන්නේ දියවඩන නිලමේ හටය. සිංහල රජ දවස දියවඩන නිලමේ පත්කරන ලද්දේ රජතුමා

විසිනි. **"දිය නිලමේ"** නමින් කෙටියෙන්ද මේ තනතුර හඳුන්වන ලදී. පුරාණයේ දළදා වහන්සේට පුද සත්කාර කිරීමේදී රජුට දියවඩන ලද්දේද මේ තනතුර හිමි පුද්ගලයා විසිනි. එසේම රජු විසින් මේ සඳහා පත්කරගත් පුද්ගලයා රජු හට අතිශයින් විශ්වාසදායක තැනැත්තෙක් විය. පුරාණ සිංහල රජුන් ආහාර ගැනීමේදී අත්, මුව සේදීමට හා බීමට ජලය වඩන ලද්දේ දියවඩන නිලමේය. නමුත් වර්තමානයේ මේ තනතුර සඳහා ඔහුව තෝරාගැනීමේ බලය පවතිනුයේ අස්ගිරි හා මල්වතු පාර්ශවයන්හි මහානායක හිමිවරුන්ටය. මීට අමතරව අදිකාරම්වරුන්ගේත් දිසාපතිවරුන්ගේත් රටේ මහත්වරුන්ගේත් ඡන්දයෙන් ඔහුව පත්වීමේ ක්‍රමයක් පවතී. අද එම තෝරාගැනීමේ ක්‍රමය සුළු වෙනසකට භාජනය වී ඇත. දළදා පෙරහැරේ පූර්ණ සංවිධාන කටයුතු භාරව කටයුතු කරන්නේ මොහුය. පෙරහැරේ ප්‍රධාන අංගයක් ලෙස මොහුව හැඳින්විය හැකිය. එසේම යථෝක්ත සෙසු නිලයන් පත්කරනු ලබන්නේද දියවඩන නිලමේගේ කැමැත්ත අනුවය. (1920 - 1930 අතර කාලයේ තත්වය සලකා) නමුත් මීට පෙර විශේෂයෙන් මහනුවර සමයේදී මෙම පත්කිරීම් සියල්ලම රජුගේ මූලික කැමැත්තට අනුව සිදුවිය. නමුත් වර්තමානයේ එය වෙනස්ය. දියවඩන නිලමේ පත් කර ගැනීමේදී වර්තමානයේ මෙන්ම අතීතයේ ද උසස් යැයි සම්මත කුලයට අයත් පුද්ගලයෙකු පත්කර ගැනීම අනිවාර්යය විය. එසේ ඔහු දළදා පෙරහැරේ ගමන් කිරීමෙන් ද පැවති ප්‍රභූන් යැයි සම්මත උසස් කුලයන්හි පුද්ගලයන්ගේ නියෝජනයක් සිදුවූ බව පෙනේ. විශේෂයෙන් ගොවි කුලයට අයත් පුද්ගලයෙකු මෙම තනතුර සඳහා අදත් පත්කර ගැනිම එයට හොඳම නිදර්ශනය වේ.

දළදා මාළිගයේ සියලු නිලධාරින් පත්කර ගැනීමේදී රජු විශේෂයෙන් සලකා බැලූ පවුල් වලින් ඒ අය තෝරාගත් බවද පෙනේ. මෙම සියළු නිලධාරින් ඇතුල් කට්ටලේ රාජකාරි කරවන අය ලෙස හැඳින්වේ. එච්.ඩබ්. කොඩ්රිටන් මහතා පවසන පරිදි දළදා මාළිගාවේ ඇතැම් තනතුරු සඳහා යෙදෙන රාළ යන පදය උසස්, උතුම් අරුත් දෙන වචනයක් බව පෙනේ. එබැවින් පැහැදිලි උසස් යැයි සම්මත ගොවි කුලයේ අය මේ සඳහා යොදාගත් බව පෙනේ.

දළදා මාළිගාවේ රාජකාරිය කරවන ප්‍රධානියා **"කාරිය කෝරාළ"** ලෙස හැඳින්වේ. මාලිගයේ ඇතුළත වැඩකටයුතු කිරීම, පැවරීම, හා ඒවා බැලීමේ ප්‍රධාන වගකීම මොහු සතුය. එසේම පෙරහැරේ බොහෝ කටයුතු සංවිධානය කිරීමත්, දන්ත ධාතුවට වත්පිළිවෙත් නිසි ලෙස ඉටු වුනාද යන්න බැලීමත් මොහු සතු සෙසු රාජකාරි වේ. ඔහු ද උසස් යැයි සම්මත කුලයකින් තෝරා ගැනීම විශේෂ ලක්ෂණයකි.

කත්තිරාළවරුන් දෙදෙනාද, වට්ටෝරුරාළ, ගෙපරාළ නැතහොත් ගෙබරාළ යන තනතුරද ඉතාම වැදගත්ය. මොවුන්ගේ රාජකාරිය මාළිගාවට අත්‍යවශ්‍ය සේවාවක් විය. මොවුන්ගේ ඇඳුම් ආයිත්තම් පැහැදිලිව රටේ මහත්තයාගේ ඇඳුම් කට්ටලයට සමාන බව විවිධ ලේඛනයන්හි සඳහන් වේ. එබැවින් ඔවුන් දිසාවක් පාලනය කළ බවත් නිලධාරියෙකුගේ සමතැන්ලා සැලකූ බවද පෙනේ. මේ අයුරින් දළදා මන්දිරය තුළ පැවති වෘත්තින්හි බොහෝ අය උසස් යැයි සම්මත කුලීනයෝ තෝරා ගත්තද කිසිවිටක ස්ත්‍රී පාර්ශවයන් එබඳු තනතුරකට තෝරා ගැනීම නීතියෙන් තහනම් වේ. එබැවින් එයින් ගම්‍ය වන්නේ සමාජ ස්ථරායනය තුළ ඇති පුමතිරි බව අනුව පුරුෂ පාර්ශවයට එවකට සමාජයේ වැදගත් තැනක් හිමි වූ බවයි. ස්ත්‍රීත්වය පිළිබඳව ක්‍රි.පූ. 6 වන සියවසේ තිබූ මතවාදයන් අඩු වැඩි වශයෙන් මහනුවර සමයේ, ඊට පෙර හා වර්තමානයේද පැවති බව දළදා පෙරහැර දෙස බැලීමේදී හොඳින් අවබෝධ කරගත හැක.

**හක්ගෙඩි අප්පු නොහොත් හක්ගෙඩි මුහන්දිරම්** දළදා තේවාව සඳහා ශංඛ නාදය පවත්වන නිලධාරියාය. ඔහු ද මුහන්දිරම් යන පෙළපත් නාමයෙන් උසස් යැයි සම්මත ගොවි කුලයට අයත් බව පෙනේ. මොහුද පෙරහැරට සම්බන්ධ වන අතර එහිදී දළදා පෙරහැරේ හක්ගෙඩි පිඹින්නෙකු ලෙස කටයුතු කරයි. **ආලත්ති අම්මා** දළදා මාලිගාවේ විශේෂ තනතුරක් දරන කාන්තාවකි. දළදා මාළිගාවේ කාන්තාවක් වශයෙන් සේවය කරන එකම තැතැන්තිය මැය පමණි. ඇයගේ කාරිය වනුයේ බදාදා දහවල් පූජාවට සහභාගි වීමය. එහිදී ඇය විසින් දම්වැල් පහනක් හෝ අත්ල මත තබාගන්නා පහනක් ඔබමොබ දෝලනය කරමින් තේවාවට සහභාගි වෙයි. දෙමළ බසින්

ආලත්ති යනු පහනයි.

මුළුතැන්රාළ, පල්ලේරාළ ආදිය විශේෂ වැදගත්කමක් ඇති තනතුරු වේ. එසේම ආරච්චි තනතුර , කෝරාළ තනතුර තරමක් තත්වයෙන් අඩු වුවද ඉහල කුල අය පමණක් ඒ සඳහා ගත් බව පෙනේ. පනික්කිරාල නැතහොත් බෙරකරුවන්ද සතර දෙනෙක් විය. උඩුමහලේ මොහොට්ටාල තවත් විශේෂ ධූරයකි. මොහුව තෝරා ගැනීමේදී විශේෂයෙන් පිරිසිදු ගොවිගම කුලයෙන් පුද්ගලයෙකු තෝරා ගැනීමක් සිදුවී ඇත. දළදා මාලිගාවේ වලව්වේ මොහොට්ටාල , මහ මොහොට්ටාල වන මහවාසල ලේකම්වරයා සහ හඳුන් කපුරාළ ඉතා වැදගත් තනතරු දෙකකි. මීට අමතරව ගන්නෝරුවේ සහ කළුගමුවේ කපුරාළ යන තනතුරු දෙකක් ද විය. ඔවුන් දළදා වහන්සේ වෙනුවෙන් බදාදා දින පවත්වනු ලබන පූජාවට පමණක් මාලිගාවට පැමිණි අය වූ අතර ඔවුන් තෝරා ගැනීමේදී අනිවාර්යෙන්ම ගොවිගම කුලයෙන් තෝරාගත යුතු බව **දළදා සිරිතේ** හා පසුකාලීන විවිධ ලේඛනගත තොරුතුරු වලින් හමුවේ.

මේ අයුරින් ඉහත ඉදිරිපත් කළ සියලුම තනතුරු සඳහා යොදාගත් පුද්ගලයන් වංශවත් කුලීනයන් බවත් ඔවුන් සඳහා පුරාණ රජවරු හා මහනුවර සමයේ රජවරු කුඹුරු, ගොඩ-මඩ ඉඩම් දුන් බව සඳහන් වේ. නිදර්ශනයක් ලෙස ආලත්ති අම්මාවරුන්ට වසරක් පාසා වී බුසල් පහළොවක් දීමටත් මාළිගාවේ විශේෂ තනතුරු හිමි පුද්ගලයන්ට නින්දගම් ලෙස පාරම්පරිකව භුක්ති විඳිමට රජු විසින් සන්නසකින් හෝ වෙනත් ලිඛිත හෝ වාචික ලියවිල්ලකින් දුන් බවත් විවිධ තොරතුරු තුළින් අනාවරණයවේ.

මෙලෙස දළදා මාළිගාවේ අභ්‍යන්තරික කටයුතු සඳහා මෙන්ම පෙරහැරේ පූර්ව සුදානම් කිරීම සම්බන්ධව වක්‍රව හෝ ඍජුව සහභාගිවන විවිධ තනතුරු දරන පුද්ගලයන් මගින් පැහැදිලි වන කරුණක් වනුයේ මහනුවර පැවති වැඩවසම් සමාජයේ පැවති සමාජ ස්ථරායනය අනුව දළදා පෙරහැර සම්බන්ධ පූර්ණ කටයුතු සකස් කිරීමේදී දළදා වහන්සේ වෙනුවෙන් විවිධ කටයුතු කිරීම සඳහා පත්කළ විවිධ පුද්ගලයන් , විශේෂයෙන් පුරුෂ

පක්ෂය වීමත් විවිධ කුලයන්ට අයත් පුද්ගලයන්වීමත්, ඔවුන්ද පංතිමය වශයෙන් සමාජයේ උසස් යැයි සම්මත ප්‍රභූන් වීමත්ය. එබැවින් දළදා වහන්සේ සම්බන්ධ තොරතුරු ගවේෂණය කිරීමේදී මහනුවර සමයේ පැවැති සමාජ ස්ථරායනය කෙලෙස පැවතියේද යන්න අවබෝධයක් ලබාගත හැක.

දළදා පෙරහැරේ සැකැස්ම හා එහි අන්තර්ගත විවිධ තොරතුරු මඟින් පැවති මහනුවර සමයේ සමාජ ස්ථරායනය හෙවත් සමාජ සැකැස්ම පිළිබඳව අවබෝධයක් ලබාගත හැක. එහෙත් පෙරහැර පෙළගැස්වීමේ අනුපිළිවෙල හා ඒ සම්බන්ධ සෙසු වත් පිළිවෙත් පිළිබඳව කරුණු අවබෝධ කරගැනීමේදී පැවති සමාජ කොටස් හා විවිධ තත්වයන් පිළිබඳව අවබෝධයක් ලබාගත යුතුවේ. දළදා පෙරහැර පැවැත්වීමට පෙරාතුව සාම්ප්‍රදායිකව පවත්වන වත් පිළිවෙත් කිහිපයක් දක්නට ලැබේ. මෙම වත්පිළිවෙත් පිළිබඳව **දීපවංශය, මහාබෝධිවංශය, කේශධාතුවංශය** සහ **දළදා සිරිතේ** පවා සටහන් වී ඇති අතරම, සෙසු විවිධ ලේඛනයන් තුළද සටහන් කොට ඇති බව පෙනේ. විශේෂයෙන් කප් සිටුවීමේදී **"කුඩා කොස් ගසක්"** කැපීමෙන් කප් සිටුවීමේ මංගල්‍යය ආරම්භ වේ. මෙහිදී මේ සම්බන්ධව සියලුම වත්පිළිවෙත් විෂ්ණු දේවාලයේ කපු මහතා විසින් සිදුකරන අතර මෙම කප් සිටුවීමේ මංගල්‍යය ඉතා පැරණි ආකාරයට අද ද සතර දේවාල තුළ සිදුවන බව පෙනේ. මින් පසුව පළමු දින 5 තුළ ඇතුල් පෙරහැර දේවාල ඇතුළත පවත්වා ඉන්පසු **කුඹල් හා රන්දෝළි** පෙරහැර පහ බැගින් විථි සංචාරය කරනු ලැබේ.

දළදා පෙරහැරේ මුලින්ම ගමන් කරනුයේ දළදා මාළිගයට අයත් පෙරහැර වේ. එහිදී එහි පෙළගැස්ම පිළිබඳව ඉහත සඳහන් කළ කෘතීන්හි පැහැදිලි විස්තර සටහන් වේ. නමුත් අද පවතින දළදා පෙරහැර තුළ එවැනි තත්වයන් අඩු වැඩි වශයෙන් විවිධ වෙනස්වීම් වලට භාජනය වී ඇත. දළදා පෙරහැර ආරම්භ වන්නේ ද නැකත් මොහොට්ටාලගේ උපදෙස් අනුවය. සියලුම වැඩ කටයුතු නැකතට අනුව සිදුකරන අතර දියවඩන නිලමේ එහි ප්‍රමුඛත්වය උසුලන ලදී. දළදා පෙරහැර සම්බන්ධ ඇතිවන තවත් ප්‍රමුඛ ලක්ෂණයකි. කුඹල් පෙරහැර හා රන්දෝලි පෙරහැර. කුඹල් පෙරහැර තුළදී

සතර දේවාලයන්ට අයත් රන්දෝලි ගෙන නොයන අතර රෙන්දෝලි පෙරහැරේදී ඒ ඒ දේවාලවලට අයත් රන්දෝලි ගෙනයනු ලැබේ. රන්දෝලි පෙරහැර අලංකාරාත්මක පාර්ශවයෙන් කුඹල් පෙරහැරට වඩා ඉදිරියෙන් සිටී.

දළදා පෙරහැරේ පෙළගැස්ම අනුව ප්‍රථමයෙන් කසකාරයන් ගමන් කරයි. මොවුන්ගෙන් පෙරහැර පැමිණෙන බවත්, කස පුපුරන හඬින් අහස ගෙරවීම හා විදුලි කෙටීම සංකේතවත් වන බවත් පැරැන්නන් තුළ මතයක් පැවතිණි. බොහෝ ජනයාගේ විශ්වාසය වූයේ දළදා පෙරහැර පැවැත්වූ පසු වැස්ස ලැබෙන බවයි. විශේෂයෙන් පෙරහැරේ කසකරුවන් සම්බන්ධයෙන් කරුණු ගවේෂණය කිරීමේදි හෙළිවූ ප්‍රධාන කරුණ වූයේ ඔවුන් පහත් යැයි සම්මත කුලයට අයත් බවයි. නමුත් කිසිදු තැනක කුමන කුලයට අයත්දැයි සඳහන් කොට නැත.

ඉන්පසුව කොඩි, ධජ, පතාක රැගෙන යන පුද්ගලයන් දැකගත හැක. මෙම කොඩි හා ධජ පතාක බොහෝ විට රජු විසින් පාලනය කරන විවිධ ප්‍රදේශවලට අයත් දිසා කොඩි විය. එයින් ගම්‍ය වන්නේ පෙරහැර මඟින් රාජ්‍ය පාලනයේ ශක්තිය හා ව්‍යාප්තියේ ස්වභාවය පෙන්වන බවයි. සියලුම දිසාවන්ගේ නියෝජනයක් සංකේතවත් කරන බවද මෙයින් ධ්වනිත වේ.

මින් පසුව දළදා පෙරහැරේ සුවිශේෂී අංගයක් ලෙස සලකන **පෙරමුණේ රාළ** පැමිණේ. ඔහු අත මාළිගාවේ සේවය කරන රාජකාරකාදීන්ගේ සේවාවන් හා දේපල පිලිබඳ ඉපැරණි වාර්තා ඇතුළත් **ලේකම් මිටිය** දක්නට ලැබේ. ඔහු ඇතෙකු පිට මහා තේජසින් පැමිණේ. මෙහි සඳහන් කළ යුතු විශේෂ කරුණ වුයේ ප්‍රථමයෙන් දළදා පෙරහැරේ ඇතෙකු පිට යන පුද්ගලයා ගොවිගම කුලයට අයත් මාලිගාවේ හා දළදා පෙරහැරේ ප්‍රමුඛ පෙලේ නිලධාරියෙකි. එසේම පෙරමුණේ රාළ මඟින් පෙරහැර තුළ එවකට සමාජයේ ප්‍රභූන් යැයි සම්මත කුලයන්ට අයත් පුද්ගලයන්ගේ නියෝජනයක් සිදුවන අතරම කිසි දිනක මේ තනතුරු ස්ත්‍රීයකට හිමි නොවීමද විශේෂ කරුණකි. ඇතෙකු පිට නැඟීමට පවා සාමාන්‍යයෙන්

ස්ත්‍රීයකට නොහැකි අතරම පහත් යැයි සම්මත කුලයට අයත් පුද්ගලයෙකුට ඒ සඳහා ඉඩකඩ නොමැත. එබැවින් පෙරහැරේ විවිධ අංශයන් මගින් පැවති සමාජ ස්ථරායනය පිළිබඳ බොහෝ කරුණු අවබෝධ වන බව පෙනේ.

අනතුරුව මාළිගාවේ හේවිසි කණ්ඩායම පැමිණේ. හොරණෑ, දවුල් තම්මැට්ටම්, තාලම්පට වාදනය කරමින් ඉතාමත් චමත්කාරජනක රංගන විලාශයකට පා තබමින් ඔවුහු ගමන් කරති. මෙහි විශේෂත්වය වනුයේ මාළිගාවේ ඇතුල් දළදා මාළිගයේ මාලගම්මන පනික්කියන් සිව්දෙනාය. එම පනික්කියන් තුලින්ද එවකට පැවති සමාජ ස්ථරායනය පිළිබඳ කරුණු අවබෝධ කරගත හැකිය. පනික්කියන් බොහෝ විට අයත් වුයේ ඇම්බැට්ට කුලයට, එනම් කුල ධූරාවලියේ තරමක් පහත් යැයි සම්මත කුලයකටය. විල්හෙල්ම් ගෛගර්ගේ විස්තරයට අනුව පනික්කි කුලය බෙරවා කුලයට ඉහල තත්වයකි. එබැවින් ඉහත පෙරහැර හේවිසි කණ්ඩායමේ සෙසු සාමාජිකයන් බෙරවා කුලයෙන් සැදුම්ලත් අය වුවද ඔවුන්ගේ පාලන කටයුතු පනික්කියන්ට හිමිවීමෙන් ප්‍රශ්නයක් නොවිනි. මන්ද දළදා මන්දිරයේ ඇතුළත සේවය කිරීමෙන් ඔවුන් තම කුලයේ අනිකුත් පුද්ගලයින්ට වඩා විශේෂ වරප්‍රසාදයක් ලැබිණි. එබැවින් බෙරවා කුලයන්ට අයත් බෙරවායන් පාලනය කිරීමට ඔවුන්ට එයින් අවස්ථාව උදාවිය. මෙලෙස විධිමත්ව විමර්ශනය කළ විට පැහැදිලි වනුයේ පෙරහැරේ විවිධ අංගයන් තුළ ප්‍රදානත්වය දැරීමේදී ද පහත් යැයි සම්මත කුලවලද තරමක් ඉහළ (කුල ධූරාවලියේ ඉහළ සිටින) කුලයන්ට එය පැවරූ බවයි.

පෙරහැරේ දෙවැනි ඇතා පිට ගමන් කරන්නේ රජතමය අංකුශයක් අතින් ගත් උඩරට ප්‍රභූ ඇඳුමින් සැරසුනු (තුප්පොට්ටියෙන්) රජුගේ ඇත් හමුදාවේ ප්‍රධානියා වු **ගජනාකය නිලමේය.** මොහුද එවකට පැවැති වැඩවසම් සමාජ ක්‍රමයේදී ඉහළ ගොවිගම කුලයට අයත් පුද්ගලයෙකි. එසේම ඇත් සේනාවේ ප්‍රධානියා ලෙස කිසිවිටෙක පහත් යැයි සම්මත කුලයට අයත් වුයෙක් රජු යොදා නොගත් බවත්, බොහෝ විට ඒ සඳහා ඔහුගේම ඥාතියෙකු පත්කරගත් බවත් සඳහන් වේ.

ඊට පසුව ගමන් කරනුයේ දළදා පෙරහැරේ පන්තේරු, උඩැක්කි. බෙර හා ලී කෙලි නැටුම් කණ්ඩායම් සහ අලංකාරව සරසන ලද අලි ඇතුන්ය. අලි ඇතුන් එක පෙලකට තිදෙනෙකු බැගින් ගමන් කරන අතර බොහෝ නර්තන කණ්ඩායම් සඳහා  බෙරවා කුලයේ අය යොදාගත්බව පෙනේ. බෙර සැදීමත්, බෙර වැයීමත්, නර්තනයේ යෙදීමත් ඔවුන් සතු කාර්යයන් බැවින් ඒ සඳහා රජු විසින් ලබාදෙන ලද නිලපංගු භුක්ති විදින ලදී. එසේම එම භුක්ති වීඳීමට හිලව් වශයෙන් රජුට සේවය කිරීමත්, පෙරහැරට අවශ්‍ය නම් බෙර, නර්තන කණ්ඩායම් ලබාදීමත් ඔවුන් සතුවූ ප්‍රධාන කාර්යයන් අතර විය.

මින් අනතුරුව මාළිගාවේ රාජකාරියන් හා හේවිසිකාරයන්, නැට්ටුවන් විසින් පිරිවරාගත් **කාරිය කෝරාළ** ගමන් ගනී. මොහු බොහෝවිට පයින් ගමන් කරන අතර මොහුගෙන් සියලුම කාරියන්ට අධිපති, නැතිනම් ප්‍රධානියා යන අදහස ධ්වනිත වන බව හැගේ. විශේෂයෙන් මීට පෙර සඳහන් කළාක් මෙන් මොහුද වංශවත් ගොවි කුලයට අයත් පුද්ගලයෙකි. ඔහුද බලය හා ධනය හිමි ප්‍රභූ පැලැන්තියට අයත් ඉහළ පංතිය නියෝජනය කරන්නෙක් ලෙසද හැඳින්විය හැක.

අනතුරුව ඉතාමත් ප්‍රතාපවත් ලීලාවෙන් සුදු පාවඩවල ගමන් කරන මාළිගාවේ ඇතා පැමිණේ. දෑලේ ඇතුන් විසින් පිරිවරන ලද ඔහු සර්වඥ ධාතූන් වහන්සේ සහිත ස්වර්ණමය කරඬුව වැඩමවාගෙන පෙරහැරේ ගමන් කරයි. දෙපස දෑලේ ඇතුන් පිට නැගී මාළිගාවේ  ආවතේවකාරයෝ සධාතුක කරඬුවට සුවඳති මලින් උපහාර දක්වති. මෙයින් ඉතාම වැදගත් ලක්ෂණය වනුයේ පාවාඩ එලීම, සුවඳැති මලින් උපහාර දැක්වීම සඳහා බොහෝවිට පහත් යැයි සම්මත කුලයකට අයත් පුද්ගලයන් යොදා ගැනීමයි.

ඉන් පසුව පැමිණෙන්නේ දළදා වහන්සේගේ ගිහි භාරකාරත්වය හිමි **දියවඩන නිලමේතුමාය**. ඔහු විසින් මුරායුධ සේසත් වඩනා තල් අතු දරන්නෝ හා ගම් දහයේ විදානේලා පිරිවරා පෙරහැරේ ගමන් කරයි. මෙලෙස ප්‍රභූන් සියලුම දෙනා මගින් ඒ ගම් නියෝජනය වන අතර ඔවුන් දියවඩන නිලමේ සම  ග ගමන් කිරීමෙන්ම ඔවුන්ගේ ප්‍රභූත්වය සනාථ කරයි. ඔවුන්

සියල්ලෝම ගොවිගම කුලයට අයත් කුල ධූරාවලියේ ඉහළ ස්ථරය නියෝජනය කරන පුද්ගලයන්ය. මෙලෙස දළදා මාළිගයේ පෙරහැර අවසාන වන අතර ඉන් පසු එළඹෙනුයේ සතර දේවාල පෙරහැර වේ. මේ අයුරින් මහනුවර සමයේ පැවති දළදා පෙරහැර තුළින් පැවති සමාජ ස්ථරායනය නිරූපනය වන අතර වර්තමානයේ එය කොතෙක් දුරට වෙනස්වීම් වලට ලක්වූයේද යන්න විවිධ කරුණු තුළින් අවබෝධ කරගත හැකි බව පෙනේ.

දළදා පෙරහැර පිළිබඳව මහනුවර සමයට පෙර දෘශ්‍යමාන සාධක නොමැති මුත් විවිධ ලේඛනගත තොරතුරු ඔස්සේ ලැබෙන විස්තරයන්ට අනුකූලව පෙරහැරේ ස්වභාවය යම් තරමකට හෝ අවබෝධ කරගත හැක. විශේෂයෙන් දළදාව සඳහා පවත්වනු ලබන පුද සත්කාර ක්‍රම, පෙරහැරේ ගමන් කරන පුද්ගලයන්, පෙරහැර සකස්වන ආකාරය ආදී විවිධ දෑ ඒ යටතට ගැනේ. එසේම එදා මෙදාතුර දළදා පෙරහැරේ පරිනාමය පිළිබඳ විවිධ ලක්ෂණ ඔස්සේ සාකච්ඡා කළහැකි බවත්, එලෙස එදා මෙදා තුර දළදා පෙරහැරේ පරිනාමය පිළිබඳ විවිධ ලක්ෂණ ඔස්සේ සාකච්ඡා කළ හැකි බවත්, එලෙස එදා මෙදා තුර දළදා පෙරහැරේ පරිනාමය පිළිබඳ විවිධ ලක්ෂණ ඔස්සේ සාකච්ඡා කළ හැකි බවත්, එලෙස බොහෝ විචාරකයන් ඒ පිළිබඳ මතවාද ගණනාවක් ඉදිරිපත් කර ඇති බවත්, ලැබෙන තොරතුරු මඟින් සනාථ වේ. වර්තමානයේ ඇසළ පෙරහැර හෝ දළදා පෙරහැර හෝ යන නමින් පවත්වන දළදා මංගල්‍යය සැමවිටම ඒ ඒ යුගයන්හි සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ප්‍රවාහයන්ට ලක්වෙමින් විවිධ විපර්යාසයන්ට භාජනය වන බව පෙනේ. මුල් කාලීනව පැවති දළදා පෙරහැර අද වනවිට බොහෝ අංගයන්හි වෙනස්කම් ලෙස පැහැදිලිව අවබෝධ වේ. එදා පැවති පෙරහැරේ ප්‍රෞඪත්වයත්, දේශීයත්වයත් වෙනුවට අද දක්නට ලැබෙන්නේ හුදු අලංකාරය පමණක් පදනම් කරගත් පෙරහැරක් බව පෙනේ. පැරණි පෙරහැර ජාතික, ආගමික, ඓතිහාසික හා සංස්කෘතිකමය සංදර්ශනයක් ලෙස සකස් වී තිබුණද පෙරහැර අද එම තත්ත්වයෙන් මිදී ඇත. එදා පෙරහැරට රජුගේ සිට සියලුම බිසෝවරුන්, වෙනත් කාන්තාවන් හා සියලුම සමාජ කොටස් නියෝජනය වන බවක් තිබුණ ද අද එම තත්වය හාත්පසින් වෙනස් වී ඇත. විශේෂයෙන් ස්ත්‍රීන්ගේ

නියෝජනය දළදා පෙරහැරේදී ඉතාම අඩුවීමක් දක්නට ලැබේ. රජුගේ සහභාගීත්වයද එලෙසම වේ. තවද කුරුණෑගල සමයේ දළදා පෙරහැර පිළිබඳව ලැබෙන විස්තරවලදී භික්ෂූන්ද පෙරහැරට සහභාගී වූ බව සඳහන් වන අතර වර්තමානයේ එම තත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇත.

දළදා පෙරහැර පැවති වැඩවසම් සමාජ ක්‍රමයේ ප්‍රතිනිර්මාණයක් හෝ පැවති වැඩවසම් සමාජ ක්‍රමය නිරූපනය වන කැඩපතක් බඳු සංස්කෘතික මංගල්‍යයක් ලෙස මීට පෙර සඳහන් කළ ද අද එම තත්වය සම්පූර්ණයෙන් වෙනස් වී ඇත. ප්‍රථමයෙන් ඒ සඳහා බලපෑ කරුණු වනුයේ ලක්දිව පැවති රාජාණ්ඩු පාලන ක්‍රමයයි. 1815 ඉංග්‍රීසි ආධිපත්‍යයට හසුවීම නිසා ඇතිවූ දේශපාලන, සංස්කෘතිකමය විපර්යාසය ප්‍රමුඛ විය. ලක්දිව සමාජය මුල්ම පුරුක ගිලිහීයාමෙන් ඒකරාශි වී සැකසුනු සමාජ ක්‍රම විසිරෙන්නට විය. නව නීති පද්ධති, නව පාලන ක්‍රමය, විදේශීය සංස්කෘතික අංග ක්‍රමයෙන් දේශීය සංස්කෘතියට ඇතුළත් වීම පදනම් කරගෙන පැවති සමාජ ආර්ථික දේශපාලන ක්‍රමයද විප්ලවීය වෙනසකට බඳුන් වූ අතර එහි අතුරු හා සෘජු ප්‍රතිඵල ලෙස ලක්දිව විවිධ සංස්කෘතික අංගයන්හි පැවති සාම්ප්‍රදායික රටාවක විශාල පහරක් වදින්නට විය. එනම් සාම්ප්‍රදායික වත් පිළිවෙත්වලට අනුකූලව ගොඩනැගුණු දළදා පෙරහැරද ඉන්පසුව පුළුල් ලෙස පරිවර්තනය වූ බව පෙනේ.

ලාංකීය සමාජය තුළ පැවති කුල රටාව වෘත්තීමය පදනම ඉවත්වීම නිසා දළදා පෙරහැරට මෙය විවිධ අයුරින් බලපාන්නට විය. මහනුවර සමයේ හා ඉන් පෙර ලක්දිව පැවති කුල ක්‍රමය තුළදී රාජකීය සේවාව ලෙස රජුට ඒ ඒ කුලවලට අයත් පුද්ගලයන්ට අනිවාර්යයෙන්ම විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සේවය කළ යුතුව තිබිණි. නිදර්ශනයක් ලෙස දළදා පෙරහැරට අවශ්‍ය බෙර සකස්කර දීම, නර්තනාංගයන් ලබාදීම, පෙරහැරේදී ගිනි පන්දම් රැගෙන යාම ආදිය බෙරවා කුලය ප්‍රමුඛ තවත් සෙසු කුලයන්ට හිමිවූ කාර්යයන් අතර විය. එහෙත් මෙම තත්ත්වය අද වනවිට සම්පූර්ණයෙන්ම වෙනස් වී ඇත. එදා පිය පුතු පරම්පරාව අනුව ඒ ඒ කුලවල සිටියවුන් තම පරම්පරාවේ වෘත්තීය ඉදිරියට ගෙන යා යුතුව තිබූ අතරම රජුට එලෙස සේවය කිරීමට බැඳී

සිටියේය. ඒ සඳහා රජුට අයිති විවිධ ගම්වර හෝ ඉඩම් ඔවුන්ට භුක්ති විඳීමට අවකාශ සලසා දී තිබුණි. නමුත් සමහර විපර්යාසයන් ඉතා දැඩි ලෙස සිදුවීම නිසා සාම්ප්‍රදායිකව පැවති රටාව වෙනස් විය. පියාගේ වෘත්තිය දිගටම කරගෙන නොයන දරුවන් වෙනත් වෘත්තීයන්හි නියැළීමට යොමු විය. එහි ප්‍රතිඵලය වූයේ දළදා පෙරහැරට අද ඒ ඒ කුලයන්ගෙන් ලැබෙන සේවය වෙනත් මාර්ගයන් වලින් පෙරහැර පැවැත්වීමට ලබාගන්නට සිදුවීමයි. එනම් බෙර කණ්ඩායම් නර්තන කණ්ඩායම් අද දළදා පෙරහැර තුළ බොහෝවිට සිදුකරනුයේ විවිධ පාසල් නර්තන කණ්ඩායම් හා කලායතන බෙර හා නර්තන කණ්ඩායම් විසිනි. එසේම ඔවුන්ගේ දායකත්වය ලැබෙනුයේ පැරණි දේශපාලන ව්‍යුහය තුළ සිදුවූ ආකාරයටද නොවීම විශේෂත්වයකි. එදා රජුගේ හෝ දේවාල පන්සල්වල ඉඩම් භුක්තිය ඒ ඒ කුලයන්ට ලැබුණද අද ඒ සඳහා පවතින රජයේ හා මාළිගාවේ මුදල් වලින් ඔවුන්ට සංග්‍රහ කිරීමට සිදුවී ඇත. විශේෂයෙන් දින දහයක් පුරා ඒ ඒ නර්තන කණ්ඩායම් කිසියම් මුදලකට තම සේවය ලබාදෙන බව හොඳින්ම දැකගත හැක.

පෙරහැර සඳහා ඇතුළත් ඒ ඒ දිශා කොඩි පිළිබඳව බොහෝ තොරතුරු දළදා වර්ණනාවන් හා ඊ. ඩබ්. පෙරේරාගේ කෘතියෙන් හඳුනාගත හැකිය. එදා ඒ ඒ දිශාවලට අයත් ප්‍රදේශ භාර නායකයන් දළදා පෙරහැර තුළ කොඩි ගෙන ගිය බව පෙනේ. විශේෂයෙන් සිංහල රාජකීය ධජය, සත්කෝරළේ ඉරහඳ මහ කොඩිය, හත්කෝරළේ සිංහයා මහකොඩිය, මාතලේ සුදු මහ කොඩිය, රතු මහපට කොඩිය, සබරගමුවේ පටරෙදි මහකොඩිය, දෙල්කොඩිය, සැවුළු කොඩිය, නුවරකලාවියේ ගජසිංහ මහ කොඩිය යනාදී වශයෙන් කොඩි ගණනාවක් දළදා පෙරහැරේදී භාවිත කර ඇත. අද එම කොඩි සුළු වශයෙන් හෝ රැගෙන යන මුත් ඒ අතරට ලාංකීය සමාජයේ එවකට පැවති දිශා කොඩිවලට අමතරව වෙනත් කොඩි වර්ගද ගෙන යයි. විදේශීය යුද්ධවලදී ඒ ඒ හමුදාවන්ගෙන් අත්පත් කරගත් කොඩිද අද පෙරහැරේ ගෙනයන බව හොඳින් නරඹන්නෙකුට වැටහේ. එසේම ඒ ඒ ප්‍රදේශ භාර ප්‍රධානියා අද කිසිවිටෙක එම කොඩි රැගෙන නොයන අතර අද ඒ තත්ත්වය ඉතාම පහත් මට්ටමකට පත්වී ඇත. අද බොහෝවිට දිශා කොඩි ගෙනයාමේ කාර්යය භාරව කටයුතු කරන්නේ බෝගම්බර හිරගෙදර

පුද්ගලයන් (හිරකරුවන්) ය. ඊට අමතරව මුදලට කුලියට ගත් පුද්ගලයන්ය. ගිනි පන්දම් රැගෙන යන්නන්ද මුදලට යොදාගත් නුවර තොග කඩවල බඩු ඔසවන "නාටාමි" නමින් හඳුන්වන මිනිසුන් බවද පෙනේ. මෙයින් ගම්‍ය වන්නේ එදා පැවති සංස්කෘතික මංගල්‍යය ඒ සමාජයේ සාමූහික ප්‍රයත්නයක් ලෙස කලඑළි දුටුවද අද එය ආර්ථිකය මත ඉතා අපහසුවෙන් පවත්වාගෙන යන බෞද්ධ මංගල්‍යයක් බවයි.

ඉංග්‍රීසීන්ගේ ආධිපත්‍යයට උඩරට යටත් වීමත් සමඟ දේශීය ප්‍රභූන් යැයි සම්මත පරම්පරාවල තිබූ අසීමිත ඉඩම් හිමිකම් විශාල කප්පාදුවකට ලක්විය. දේවාල හා පන්සල්වලට අයත් ඉඩම් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් අත්පත් කරගෙන විවිධ අයුරින් එය බෙදාදුන් අතර සමහර ඉඩම් ඔවුන් වගා කළේය. මෙහි ප්‍රතිඵලය වූයේ පැවති සමාජ ආර්ථික රටාවට දැඩි පහරක් වැදීමයි. පහත් කුලවල මිනිසුන් රජයට සේවය කිරීම නිසා ලැබුණු වැටුප වූයේ ඒ ඒ ඉඩම් භුක්තිය වූ අතර එය නැතිවීයාම නිසා කෙලින්ම රජුට දැක්වූ සේවය ඇණහිටි බව පෙනේ. එහි ප්‍රතිඵලය වූයේ දළදා පෙරහැර සඳහා ද ඔවුන්ගේ දායකත්වය එලෙසම අඩාල වීමයි. එහි ප්‍රතිඵලය ලෙස අද මිනිසුන් කුලියට ගෙන දළදා පෙරහැරේ විවිධ අංගයන් සකස් කරන බව පෙනේ. මෙම තත්වය 1905 වන විට ඉතා හොඳින් ලක්දිව සමාජය තුළ දුටු බව ආනන්ද කේ. කුමාරස්වාමිගේ උඩරට ප්‍රභූන් වෙත ඉදිරිපත් කළ ලියවිල්ලක සඳහන් වේ. (An open letter to the kandyan chief) එය බොහෝවිට කලා කටයුතු සම්බන්ධව යෙදූ අතර එය පෙරහැරේ විවිධ කාර්යයන් සම්බන්ධව ඉතාම උචිතව සැසඳෙන බව පෙනේ. ඔහු ලාංකීය චිත්‍ර කලාවට යටත්විජිත වාදය නිසා ඇතිවූ වෙනස හා පරිහානිය දක්වන්නේ සාම්ප්‍රදායික කුල පරම්පරාවලින් පිටස්තර පුද්ගලයන් එවකට එම කලාවන් තුළ නියැලෙන බවයි. විශේෂයෙන් නවන්දන්නා කුලයට අයත් සිතුවම් කලාව සඳහා 1905 දී වෙනත් කුලවල අය යොදාගන්නා බවත් ඔවුන් හරිහැටි සිතුවම් ඇඳීමට නොදන්නා බවත් සඳහන් කොට ඇත. විශේෂයෙන් සඳහන් කළයුතු කරුණකි දළදා මාළිගාවේ පෙරහැර තුළදී කිසිදු ස්ත්‍රී චරිතයක් හමු නොවීම. එයින් එදා සමාජයේ ස්ත්‍රියගේ තත්වය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිය. මන්දයත් ආගමික කටයුතුවලදී, විශේෂයෙන් දන්ත ධාතූන් වහන්සේට පුද

සත්කාර පැවැත්වීමේදී ස්ත්‍රී පාර්ශවයට එතරම්ම වැදගත්කමක් හිමි නොවූ බව පෙනේ. බොහෝ විට ඒ සඳහා බලපෑ හේතූන් ගණනාවකි. රොබට් නොක්ස්ට අනුව "ඔසප්වීම" හෙවත් " බැරිකම" පවතින තුරු ස්ත්‍රීහු අශුද්ධ ලෙස සලකති. මෙය කොතරම් උග්‍රවීද යතොත් ඇය සිටිනා නිවස පවා කිලිටි වූවක් සේ සලකා එතැනට යාමටද බොහෝ දෙනා පසුබට වේ. මෙවැනි වාතාවරණයක් පැවතීම නිසාම බොහෝවිට ස්ත්‍රීන් දළදා පෙරහැරට හා දළදා මාළිගයේ වත්පිළිවෙත් සඳහා යොදා නොගත් බව පෙනේ. නමුත් ඉතාම දුර්ලභ අවස්ථාවක් ලෙස ආලත්ති අම්මාවරු යොදාගැන්ම දක්විය හැක. ඇයද සතියකට බදාදා දින පමණක් දවල් තේවාවට යොදා ගැනීම මගින් එය සීමාකර ඇති බවක් පෙනේ. මෙලෙස මහනුවර සමයේ ස්ත්‍රී පාර්ශවය තරමක් පුරුෂ පාර්ශවයට වඩා අඩු තක්සේරුවකින් ඇගයීම් කළ බව දළදා මාලිගාවේ පෙරහැරේදී කිසිදු ලෙසකින් යොදා නොගැනීම මඟින් තහවුරු වේ. දළදා පෙරහැර අතිශය ශුද්ධ මංගල්‍යයක් ලෙස විවිධ පේවස් වී සිදුකරන නිසා ස්ත්‍රියක් යොදා ගතහොත් එය කිලිටි වේ යැයි පාරම්පරිකව මිනිසුන් තුළ බියක් තිබුණ බව දැකිය හැක. එසේම ස්ත්‍රියට සමාජයේ පුරුෂයාට වඩා පහළ තත්වයක් හිමිවූ බව ද මෙයින් ගම්‍යමාන වේ.

පෙරහැර සියලුම කටයුතුවලදී සිංහල බෞද්ධයන් සහභාගී වූ බව පෙනේ. කිසිදු අවස්ථාවක වෙනත් ජාතිකයෙකුට දළදා වහන්සේ සම්බන්ධ වතාවත් පැවැත්වීමට හෝ පෙරහැරට සම්බන්ධ වීමට ඉඩකඩ නොවිණි. දළදා පෙරහැර මඟින් එවකට බෞද්ධ සිංහල ජාතිය සමාජයේ කෙතරම් තත්වයක් දරුවේද යන්න පිළිබඳවද අවබෝධයක් ලබාගත හැක. විශේෂයෙන් රාජ්‍යත්වය තුළදී එම ලක්ෂණ ඉතාම හොඳින් ධ්වනිත වේ. මහනුවර සමාජයේදී බොහෝ නායක්කාර වංශික රජවරුන් රාජ්‍යත්වයට පත්වුවද ඔවුන් බුදුදහම වැළඳගත යුතු අතර දිවි හිමියෙන් දළදාව රැකබලාගත යුතුවද තිබිණි. එබැවින් බෞද්ධයෙකු වීමත් සිංහලයෙකු වීමත් පැහැදිලි වැදගත්කමක් තිබූ බව දළදා පෙරහැර සම්බන්ධ කරුණු තුළින් ගම්‍ය වේ.

කුඩා වයස්වල පුද්ගලයන් දළදා පෙරහැරේ විවිධ නර්තන හා සෙසු

අංශයන් සඳහා සහභාගී වූයේද යන්න ප්‍රශ්නයකි. මන්ද ඒ පිළිබඳව පැහැදිලි සාධක නොමැත. එහෙත් වර්තමානයේ දළදා පෙරහැර මෙන්ම සෙසු දේවාල හතරේ පෙරහැරවලදී කුඩා ළමුන් බහුල ලෙස යොදා ගන්නා බව පෙනේ. එසේම පෙරහැර සංවිධාන කටයුතුවලදී ප්‍රභූන් යැයි සම්මත විශේෂ නිලතල දරන උසස් යැයි සම්මත කුලයන්වල පුද්ගලයන් බොහෝවිට පෙරහැරේ ප්‍රමුඛ චරිත බවට පත්වූ බව පෙනේ. විශේෂයෙන් ඇතුන් පිට යාමත්, දූනට ප්‍රභූන්ට හිමි මුල් ඇඳුම් කට්ටලය ඇඟ ලෑමත් ඔවුන්ට පමණක් සීමාවූ බවත්, එය අන් පුද්ගලයන්ට ඇඳීමට අවකාශ නොවුනු බවත් දළදා පෙරහැර නැරඹීමෙන් හොඳින් අවබෝධ වේ. තවද හීන කුලයන්ට අයත් පුද්ගලයන්ට තම වෘත්තීමය දායකත්වය අනුව  පෙරහැර තුළදී ඒ ඒ කාරිය කිරීමට සිදුවූ බවත් හොඳින් දකගත හැක. බෙරවා කුලය, පනික්කි කුලය ආදිය මඟින් ඒ බව සනාථ වේ. එමෙන්ම පෙරහැරේ සියලුම විධි විධාන සකස් කිරීමත් එය ක්‍රියාත්මක කිරීමත් ඉහළ කුලයන්ට අයත් වූවන්ගේ කාර්යයක් වූ අතර පහත් කුලයන්ට ඊට අනුකූලව වැඩකටයුතු කිරීමට සිදුවූ බව පෙනේ.

පංතිමය තත්වය යටතේද වැදගත් කටයුතු ගණනාවක් දළදා පෙරහැර මඟින් තහවුරු වේ. උසස් යැයි සම්මත ප්‍රභූ පැලැන්තිය බොහෝවිට පෙරහැර තුළින් නිරූපනය වන අතර ඔවුන්ගේ බලය, තත්වය හා පංතිමය ස්වභාවයද හොඳින් ගම්‍ය වේ. ඔවුන් අඳින පළඳින අයුරු, ගමන් කරන ස්වභාවය, ඔවුන්ට පෙරහැරේ හිමි ස්ථානය යනාදිය මඟින්ද ඔවුන්ගේ තත්වය හා ඉහළ පංතිමය ස්වභාවය නිරූපනය වේ. දියවඩන නිළමේ තුමාගෙන් ඉහළ පංතිය නිරූපනය වන අතරම ඊට පසු ඇති විවිධ නිලතල දරන්නන්ගෙන්ද එහි පංතිමය තත්වය හොඳින් දකගත හැක. විශේෂයෙන් පහත් කුලයන්ට අයත් වුවන්ගේ සමාජ තත්වය හා පංතිමය ස්වභාවය ඔවුන්ට හිමි රාජකාරිය හා පෙරහැරේදී පැළඳි ඇඳුම් ආයිත්තම් මඟින් ද ප්‍රකාශ වේ.

මෙලෙස දළදා පෙරහැරේ පැවති වැඩවසම් සමාජ ක්‍රමය පිළිබඳව බොහෝ සාධක ගම්‍යවන අතරම සතර මහා දේවාලයන්හි පෙරහැර මගින්ද පැවති සමාජ සංස්ථාව තුළ යම් යම් ලක්ෂණ පිළිබඳවද අවබෝධයක් ලබාගත හැකි බව පෙනේ.  නාථ දේවාලයේ පෙරහැර, මහා විෂ්ණු

දේවාලයේ පෙරහැර, කතරගම හා පත්තිනි දේවාලයේ පෙරහැර ලෙස සතර දේවාල පෙරහැර පිළිවෙලින් ගමන් ගන්නා අතර මෙලෙස පෙලගස්වා ඇති ආකාරය මත ඒ ඒ දෙවියන් බුද්ධත්වය ලබන පිළිවෙල අනුව බවද යන්න අදහසක් ඇත. මෙම සතර දේවාල පෙරහැරේ අලංකාරාත්මක ලෙස සැරසූ ඇතෙකු පිට ඒ ඒ දෙවියන්ට අයත් රන් ආයුධය උදාර ලෙස වැඩමවන අයුරු දැකගත හැක. ඉන්පසුව ඒ ඒ දේවාලවල ගිහි භාරකරු වන බස්නායක නිළමේ ගමන් කරනු ලැබේ. මෙහිදී විශේෂයෙන් සඳහන් කළයුතු කරුණක් වනුයේ කතරගම දේවාලයේ පෙරහැර සමඟ එම දේවාලයේ ප්‍රධාන කපු මහතා මංගල හස්තියාට ප්‍රමුඛව ගමන් කරයි. ඔහු "අයියර්" ලෙස හැඳින්වේ. ඔහු හින්දු භක්තිකයෙකි. ඔහු පෙරහැර ගමන් කරන එකම හින්දු භක්තිකයෙකු වේ. එසේම පත්තිනි දේවාලයේ පමණක් ස්ත්‍රී දායකත්වය ලබාගෙන විවිධ නර්තන හා වෙනත් අංගයන් නිර්මාණය කරයි. සෙසු දේවාල කිසිවක ස්ත්‍රීන් සහභාගි වීමක් දක්නට නොලැබේ.

පෙරහැරේ පසුපසින් ගමන් කරන්නේ රන්දෝලි රැගත් පිරිසය. මෙම රන්දෝලි කර තබාගෙන යාම සාමාන්‍යයෙන් පැවරී තිබෙනුයේ පදු කුලයට අයත් මිනිසුන්ටය. එසේම ඒ ඒ දේවාලවල රන්දෝලිවලට දෙපසින් ස්ත්‍රීන් ගමන් කිරීමක් දක්නට ලැබේ. මේ අයුරින් ඇසළ පෙරහැර සැකසුනු අතර මෙහිදී ස්ත්‍රීන් යොදාගැනීමේ සීමාසහිත බව හොඳින් අවබෝධ වේ. තවද දෙමළ හෙවත් හින්දූන්ගේ නියෝජනය ද ඉතාම අල්ප බවත් එය පැවති සමාජ ස්ථරායනය පිළිබඳ හොඳ අවබෝධයක් ලබාගැනීමට ලැබෙන මහඟු සාධකයක් ලෙස සඳහන් කළ හැකිය.

දළදා පෙරහැරෙන් පසුව අවසානයේ පවත්වනු ලබන වත්පිළිවෙත්වලින් ද පැවති සමාජ ස්ථරායනය නිරූපනය වන කරුණු ගණනාවක් හෙළිදරව් වේ. විශේෂයෙන් පෙරහැර පැවති අවසාන දින අලුයම **"දිය කැපීමේ මංගල්‍යය"** සිදුවීමෙන් පසු හා පසුදින දවල් පෙරහැර පැවැත්වීමෙන් ඇසළ පෙරහැර අවසාන වේ. මෙහිදී බොහෝ සාම්ප්‍රදායික වත්පිළිවෙත් ඒ අයුරින්ම භාවිත කරන අතර එය අද එලෙසම පවතී. පසුව පෙරහැර සම්බන්ධව තොරතුරු රජුට පැවසීමට දියවඩන නිළමේ හා

දේවාලවල බස්නායක නිළමේවරුන් රජු බැහැ දකී. වර්තමානයේ ජනාධිපති මුණගැසේ. මෙම චාරිත්‍රය මුල්කාලීනව තිබුණද අද එය පවත්වන්නට යෙදෙන්නේ ඉංග්‍රීසි සමයේ පැවැත්වූ අයුරිනි. මුල්කාලීන සංඝයා වහන්සේලා මෙන්ම රජුද පෙරහැරේ ගමන් කළ බව විවිධ වංශකථා තොරතුරු සපයයි. නමුත් ඒ තත්වය එතරම්ම දීර්ඝ කාලයක් පැවති බවට සාධක නොමැත. පෙරහැර අවසාන වී දින හතක් පුරා පෙරහැර තුළ සිදුවූ යම් යම් අඩුපාඩුකම්වලට දෙවියන්ගෙන් සමාව යැදීමත්, දෙවියන්ට ගෞරව කිරීමත් සඳහා මහා විෂ්ණු දේවාලයේ **"වලියකුම මංගල්‍යය"** පැවැත්වේ. මෙම සාම්ප්‍රදායික පූජා චාරිත්‍රයක් සමඟ එම වර්ෂයේ ඇසළ පෙරහැරේ සියලුම වැඩකටයුතු අවසාන වේ. මේ අයුරින් දළදා පෙරහැර පැවැත්වූ අතර එමගින් අදද පැවති වැඩවසම් සමාජ ක්‍රමයේ සමාජ ස්ථරායනයේ විවිධ ලක්ෂණ දැකගත හැකිබව බොහෝ විචාරකයන්ගේ අදහසයි. ස්ත්‍රී පුරුෂ භාවය මත එදා සමාජයේ ඔවුන්ට හිමි තත්වය, ගෞරවය, පුරුෂ පාර්වයට නිබඳව වැඩි වගකීමක් හා වැඩි වරප්‍රසාද ලත් කොටසක් බවට පත්වීම යනාදිය දළදා පෙරහැර හා සෙසු වත්පිළිවෙත් වලින් නිරූපනය වේ.

මැදිවියේ හා තරමක වයස්ගත වූ පුද්ගලයන්ට සමාජයේ හිමි ගරුත්වය හා බලය සංකේන්ද්‍රගත වී ඇති උසස් යැයි සම්මත කුලයන්ටත්, සෙසු කුලයන්ට හිමි සමාජ තත්වයන් හා කුල ධූරාවලිය මහනුවර සමයේ පැවති ආකාරය පිළිබඳවත්, පෙරහැර සාධකයෙන් අවබෝධ කරගත හැකි බව පෙනේ. විශේෂයෙන් ජන වාර්ගිකත්වය අනුව සිංහල බෞද්ධ ජනයාට එදා සමාජයේ තිබු වැදගත් මෙන්ම බලය හා තත්වය සෙසු ජාතීන්ට වඩා තරමක් වැඩිවීමක් සමහර ජාතීන්ට කිසිදු සමාජ තත්වයක් පරිපාලනය අංශයට ඇතුල්වීමටත් අවකාශ නොලැබුණු බව පෙනේ. එසේම විවිධ පංතිමය තත්වය බොහෝවිට කුලය හා බලය මත තීරණය වූ බවත් ජාතිය අනුව පංතිමය තත්වය තීරණය වූ බවත් හොඳින් දැකගත හැකි වූ කරුණු අතර වේ.

ආනන්ද කුමාරස්වාමි රචනා කරන ලද **"උඩරට ගොඩනැගිලි ආරක්ෂා කිරීම සඳහා අදහස් කිහිපයක්"** නම් ලිපියේ යුරෝපීය සංස්කෘතික ලක්ෂණ ක්‍රමයෙන් ලාංකීක කලාවන්ට ඇතුලත් වූ අවස්ථා ඔහු එහිදී විස්තර කරයි.

එක් අවස්ථාවක ලාංකික සිතුවම් කලාවේ විප්ලවීය පරිවර්තන ඔහු දකින්නේ **"නරකට අඳින ලද නත්තල් කාඩ්පත්"** ලෙසය.

මෙම ඉහත ප්‍රකාශයෙන් සාම්ප්‍රදායික කලාවන්ට සිදුවූ පරිහානික ස්වභාවය පිළිබඳ හොඳ අවබෝධයක් ලබාගත හැක. දළදා පෙරහැරට ද එම සෝචනීය තත්වය උදාවූ බව ඉහත දක්වූ කරුණු තුළින් හොඳින් දකගත හැකි බව පෙනේ.

දළදා පෙරහැර පෙරමුණේ රාළ වැදගත් අංගයක් බව අප කවුරුත් දන්නා කරුණකි. එසේම ඔහු පුරාණයේ රැගෙන ගියේ රජු විසින් පෙරහැර පැවැත්වීම සඳහා දෙන ලද අවසර පත්‍රයයි. නමුත් දැන් ඔහු රැගෙන යන්නේ දළදා මාළිගාවට අයත් ලේකම් මිටිය නමින් හඳුන්වනු ලබන පුස්කොළ පොතකි.

පුරාණයේ දළදා පෙරහැර දර්ශනීයත්වයත් හා විනෝදයත් පිණිස විවිධ ක්‍රීඩා අංශ ඇතුළත් වී තිබිණි. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම අලංකාරාත්මක ඇඳුමින් සැරසී විවිධ ගී ගයමින් ක්‍රීඩාවල නිරත වෙමින් පෙරහැරේ ගිය බවට ඓතිහාසික සාධක බොහෝමයක් ඇත. පොළොන්නරු සමයේ පැවති පෙරහැරේ ගෙන ගිය වාද්‍ය භාණ්ඩ අතර වීණා, වස් කුළල්, මෘදංග හා බෙර විය. මහ බඹාගේ පිළිරුව පුරාණ පෙරහැරේ ගෙන ගිය වැදගත් අංගයක් විය. නමුත් අද එම ලක්ෂණ කිසිවක් පෙරහැරේ දක්නට නොලැබේ. එසේම දළදා පෙරහැරේ කසකරුවන්ට පිටුපසින් ගමන් කරන ගිණිකෙළි සංදර්ශනය ඉතාම චමත්කාරජනක සිද්ධියකි. අද මෙම ගිණිකෙළි සංදර්ශනය බොහෝවිට **"වලපොල"** ගිනිකෙලි සංදර්ශන කණ්ඩායම මගින් පවත්වනු ලැබේ. ඔවුන්ද මුදලක් මත වැඩකරන සේවක පිරිසකි. නමුත් මීට පෙර යුගයන්හි මෙම තත්වය හාත්පසින් වෙනස් වූ බව ඓතිහාසික කරුණු තුළින් අවබෝධ වේ.

වර්තමානයේ ඇසළ පෙරහැරේ ප්‍රධාන තැනක් ගන්නා **"වෙස් නැටුම"**

මෑතකදී දළදා පෙරහැරට එකතු වූ නවාංගයක් වේ. එය බොහෝ දෙනා පිළිගැනීමට අපහසු කරුණක් වුවද 1919 දී පැවති පෙරහැරට පී.බී. නුගවෙල දියවඩන නිලමේතුමා එක්කළ අංගයක් බව විවිධ විස්තරවල සඳහන් වේ. මෙය ප්‍රථමයෙන් ජාතික නැටුම් කලාවට අයත් අංගයක් නොවූ අතර එය පණ්ඩුවස්දේව රජුට ඇතිවූ අමනුෂ්‍ය උපද්‍රවයක් නැති කිරීමට වෙස් නැටුම ඇතිවූ බවට පුරාවෘත්තයන්හි සඳහන් වන බව ඇතමුන්ගේ අදහසයි. එය හඳුන්වන්නේ " **"කොහොඹ යක්කම"** නමිනි. වෙස් බඳින යක්දෙස්සා මලය රජු නිරූපනය කරන බවත් ඔහු කංකාරිය කරනු විනා පෙරහැරේ ගමන් කරන්නෙකු නොවන බවත් ගොඩකුඹුර මහතා දක්වයි. මෙලෙස විවිධ අභිචාරාත්මක විධික්‍රමයන් මත ගොඩනැගුණු නර්තනාංගයක් වුවත් එහි ඇති සෞන්දර්යාත්මක පාර්ශවය නිසා අද දළදා පෙරහැරේ සුවිශේෂ ලක්ෂණයක් බවට එය පත්වී ඇති බව පෙනේ.

එසේම කළගෙඩි නැටුම, කාවාඩි නැටුම, පන්තේරු නැටුම, ලී කෙළි, උඩැක්කි, සවරං, චාමර, රබන් ආදිය පසුකාලීන එකතු වූ නර්තන නවාංගයන්ය. එමෙන්ම අද පවතින දළදා පෙරහැරට විශේෂයෙන් එකතු වූ අංගයක් ලෙස පොලිස් යතුරු පැදියක් හා පොලිස්කාරයෙක් ගමන් කිරීම ද සුවිශේෂි ලක්ෂණයකි. මේ ආකාරයට දළදා පෙරහැර සුවිශේෂ අංගයන් ගණනාවක් එකතුවීම නිසා දළදා පෙරහැරේ පැවති සාම්ප්‍රදායික ප්‍රෞඪත්වයට ඉතා ප්‍රබල කැලලක් වී ඇති බව පෙනේ. මහනුවර සමයේ හා ඉන් පෙර පැවැත්වූ පෙරහැරෙන් පැහැදිලිවම එවක පැවති සමාජ ස්ථරායනය පිළිබඳ හොඳ අවබෝධයක් ලබාගත හැක. එසේම ප්‍රාථමික දෘශ්‍ය මූලාශ්‍රයක් ලෙස භාවිත කළ හැකිව තිබූ දළදා පෙරහැර අද ආර්ථිකය මත සියලුම කාර්යයන් තීරණය වන යුගයකට සරිලන අයුරින් සියලුම දෑ වෙනස් වී ඇති උත්සවයක් බවට පරිවර්තනය වී ඇත.

මේ අයුරින් දළදා වහන්සේ වෙනුවෙන් කරනු ලබන පුද සත්කාරයක් ලෙස දීර්ඝ ඉතිහාසයක් පුරා පැවති දළදා පෙරහැර තුළින් පැවති වැඩවසම් සමාජ ක්‍රමයේ ස්වභාවය නැතහොත් සමාජ ස්ථරායනය පිළිබඳ

අවබෝධයක් ලබාගැනීමට හැකි වුවද වර්තමාන දළදා පෙරහැර තුළින් එම සාධකයන් ග්‍රහණය කරගැනීමට කිසිදු පිටුවහලක් නොලැබෙන බවත් එය වෙනස් වූ සමාජ ආර්ථික දේශපාලන හා සංස්කෘතික ප්‍රවාහයකට නතුවූ තවත් ලාංකික කලා ප්‍රපංචයක් බවත් ප්‍රකාශ කිරීම උචිත යැයි හඟිමි. එබැවින් දළදා පෙරහැර මහනුවර සමයේ පැවති වැඩවසම් සමාජ ක්‍රමය ප්‍රතිනිර්මාණය කරන කැඩපතක් ලෙස එසමයේ පෙරහැර පදනම් කොටගෙන තොරතුරු ගොනුකළ හැකි වුවද වත්මන් දළදා පෙරහැර තුළ ඒ තත්වය ක්ෂය වෙමින් යන ස්වභාවයක් දක්නට ලැබෙන බවත් දැනට එහි බොහෝ තත්වයන් තුරන්වී ගොස් ඇති බවත් විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍ර

**දළදා සිරිත,** සංස්. වජිරා රත්නසූරිය, ප්‍රකාශනය ඇපොතිකරීස් සමාගම, 1949

**දළදා සිරිත,** සංස්. වැලිවිටියේ සෝරත ස්ථවිර, 2 වන මුද්‍රණය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1970

**දළදා වංශය හෙවත් දංෂ්ට්‍රාධාතුකථා,** සංස්. පුංචිබණ්ඩාර දොළපිහිල්ලේ, ප්‍රකාශනය ශ්‍රී භාරතී යන්ත්‍රාලය, කොළඹ 1920

**දාඨාවංසය,** සංස්. හලවේගොඩ සීලාලංකාර හිමි. ප්‍රකාශක පේද්‍රිස් ද සිල්වා විසින් අලුත්ගම සද්ධර්ම ප්‍රකාශනායතනයෙන්, 1914

**දීඝනිකාය,** සංස්. වලගෙදර සෝමාලෝකස්ස නායක ස්ථවිර, ප්‍රකාශක බී.ද ඇස්. මනතුංග, කොළඹ, 1954.

**ධාතු වංශය,** සංස්. මුනිදාස කුමාරතුංග, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 1941

**ඍග්වේද සංහිතා,** ප්‍රකාශනය අජ්මේගීය වෛදික යන්ත්‍රාලය, 1883.

**කෝකිල සංදේශය,** සංස්. අලව් ඉසි සැබ්හෙල, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 1962

**බුද්ධවංසය,** සංස්. සී.ඒ. ශ්‍රී සීලක්ඛන්ධ නායක ස්ථවිර, ප්‍රකාශක ඇන්.ජේ.කුරේ සහ පුත්‍රයෝ, කොළඹ 1912

**මහාවංශය,** සංස්. ගුණපාල වීරසේකර, ඩබ්.ජී. ජේ. රත්නායක අප්පුහාමි, අනුලා මුද්‍රණාලය, මරදාන 1960

**සැළලිහිණි සංදේශය,** සංස්. කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර ස්ථවිර, විද්‍යාලංකාර මුද්‍රණාලය, කැළණිය, 1957

**හංස සංදේශය ,** සංස්. රත්මලානේ ශ්‍රී ධර්මාරාම ස්ථවිර, 6 වැනි මුද්‍රණය, විද්‍යාලංකාර මුද්‍රණාලය, කැළණිය, 1955

## ද්විතීය මූලාශ්‍ර

අමරසේකර, දයා **සමාජ විද්‍යාව සිද්ධාන්ත හා විධික්‍රම,** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන 1995

අදිකාරම්, ඊ. ඩබ්ලිව් **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය,** ප්‍රකාශනය ජී.කේ.ජී. ජයවර්ධන සහ සමාගම, කොළඹ 1963

ආනන්ද මෛත්‍රීය, බලංගොඩ හිමි. **ෆා- හ්සියෙන් සුංයුං දෙනමගේ ගමන් විත්ති,**

සමන් ප්‍රකාශකයෝ, මහරගම 1958

ආරියපාල, ඇම්.බී.සංස්. **මහනුවර ශ්‍රී පුෂ්පදාන ස්වර්ණජයන්ති සංග්‍රහය.** "දළදා පෙරහැර පෙළගස්වන අන්දම" ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1958

කරුණාතිලක, ඒ.ඩී.පී. **සෙංකඩගලපුර ඉතිහාසය,** ප්‍රකාශක විජේරත්න රඹුක්වැල්ලේ, මහනුවර, 1955

කුමාරස්වාමි, ආනන්ද කේ. **මධ්‍යකාලීන සිංහල කලා.** පරිවර්තක එච්.එම්. සෝමරත්න, ප්‍රකාශනය සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ, 1962

කොඩ්රිංටන්, එච්. ඩබ්ලිව්. **සංක්ෂිප්ත ලංකා ඉතිහාසය,** පරිවර්තක කේ.ඇස්. සෙනෙවිරත්න, සංශෝධිත මුද්‍රණය, ප්‍රකාශනය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ, 1961

ගොඩකුඹුරේ, චාල්ස්, **සිංහල උළුවහු,** ප්‍රකාශනය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 1964

ගොඩකුඹුරේ, චාල්ස්, **ශාස්ත්‍රීය ලිපි හා කථා,** ප්‍රකාශනය ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ 1971

ජයකොඩි, සරත්චන්ද්‍ර, **සිරි දළදා පවත,** සදීපා පොත්හල, කොළඹ, 1999

දිසානායක ඇම්.බී. **කන්ද උඩරට ඇසළ පෙරහැර,** ප්‍රකාශනය සමයවර්ධන මරදාන, කොළඹ 10, 1994

ධම්මාලෝක, වරකාවේ "දළදා පුරාණය" **"සාරථී වාර්ෂික කලාපය,** මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික අමාත්‍යාංශයේ ප්‍රකාශනයකි. 1992

පීරිස්, රැල්ෆ්, **සිංහල සමාජ සංවිධානය,** ප්‍රකාශනය සීමාසහිත සමන් ප්‍රකාශකයෝ, කොළඹ 1964

රවීන්ද්‍ර, චම්පික "කුල ක්‍රමය පිළිබඳ කෙටි විග්‍රහයකි" **සමාජ නිරීක්ෂා,** සමාජවිද්‍යා අංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 2001

රාහුල හිමි, වල්පොල, **ලංකාවේ බුදුසමයෙහි ඉතිහාසය,** ප්‍රකාශනය සිමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1962

වජිර ස්ථවිර, කුඹුරුගමුවේ, **දළදා ඉතිහාසය හා සංස්කෘතිය,** ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රකාශනයකි. 1983

වාචිස්සර හිමි. කොටගම. **සරණංකර සංඝරාජ සමය,** ප්‍රකාශනය වයි. දොන් ඇඩ්වින් සහ සමාගම, කොළඹ 1960

සිංහ සහ බැනර්ජි, **ඉන්දියා ඉතිහාසය 1 කාණ්ඩය,** ප්‍රකාශනය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ 1958

සෙනෙවිරත්න, අනුරාධ, සිරි දළදා වරුණ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 2001

සෝමතිලක, එම්. "මහනුවර රාජධානි සමයේදී පැවති කුල රටාව වෘතිය කුල හා කලා ක්ෂේත්‍රය "**සිංහල සාහිත්‍ය විශේෂ කලාපය 1997**

සෝරත, වැලිවිටියේ නායක ස්ථවිර, **සුමංගල ශබ්ද කෝෂය 1 වන හා 2 වන කාණ්ඩ** ප්‍රකාශක පේමසිරි අභයවික්‍රම, කොළඹ, 1963

Codrington, H.W. A. **Short History of Ceylon,** MacMillan, London, 1926

Comaraswamy, Ananda K, **An Open letter to the Kandyan Chiefs,** Art Council of Ceylon 1957

Diary of Mr. **John D'Oyly,** JRAS (CB), Vol. xxv, No. 69,1917

Nell, Andreas, **The Annas of Tooth Relic,** Miller & Co. Ltd., Kandy 1928

Plowshare, R., **The Kandy Perahera,** M.D. Gunasena & Co. Ltd., 1952

# දළදා තේවාව හා ඊට සම්බන්ධ සිරිත් විරිත්

**මහාචාර්ය වරකාවේ ධම්මාලෝක හිමි**
මහනුවර නාථ දේවාලය විහාරාධිපති අස්ගිරි මහාවිහාර කාරක සංඝ සභාවේ
ප්‍රධාන ලේඛකාධිකාරී

ශ්‍රී දළදා මාළිගාවේ දළදා වහන්සෙස්ට පූජා වශයෙන් සිදුකෙරෙන තේවාව හා ඊට සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර රාශියක් ඇත. දළදා වහන්සේ වෙනුවෙන් සිදුකෙරෙන සියලු පූජා චාරිත්‍ර විධි ඒවා සිදුකෙරෙන කාලය අනුව ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැකිය.

1. දිනපතා සිදුකෙරෙන දෛනික තේවාව හා පූජා
2. සතියකට වරක් සිදුකෙරෙන වතාවත්
3. වසරකට වරක් බැගින් කෙරෙන උත්සව

මෙයින් දෛනික පූජාවන් ලෙස සැලකෙන්නේ දිනපතා දළදා වහන්සේ වෙනුවෙන් අලුයම හා සවස සිදුකෙරෙන තේවාව හා අලුයම හා දවල් සිදුකෙරෙන මුළුතැන් බුද්ධ පූජාව ද සවසට සිදුකෙරෙන ගිලන්පස පූජා දෙක ද වේ.

ශ්‍රී දළදා මාළිගාවේ වැඩ ඉන්න මාළිගාව හැඳින්වෙන දළදා වහන්සේ වඩා හිඳුවා, තිබෙන මන්දිරය දිනකට තෙවරක් විවෘත කොට තේවාව ආදී පූජා කටයුතු ඉටුකරනු ලැබේ. එයින් පළමු අවස්ථාව අලුයම තේවාව නමින් හැඳින්වේ. මේ සඳහා දිනපතා අලුයම පහ පසුවී විනාඩි පහලොවටද දළදා මාළිගාවේ හේවිසිකරුවෝ අලුයම දුරයේ හේවිසි වාදනය ආරම්භ කරති. තුරිත හෙවත් ඉක්මන් රිද්මයකට අනුව වාදනය කෙරෙන අලුයම් දුරයේ හේවිසි වාදනය ඇරඹෙත්ම තේවාකාරක භික්ෂූන් වහන්සේ දෙපට සිවුර මැනවින් පොරවා වම්උරය මතින් සඟල සිවුරක් දමා පළල සිවුරු පටියකින් බැඳ ගනිති. එසේ සූදානම් වීම දළදා තේවාකාරක භික්ෂූන් වහන්සේලා අනිවාර්යයෙන්ම කළයුතු වේ. පොරවාගත් සිවුර සංවර ලෙස ඇඟේ රඳවා ගැනීමටත් තේවා කටයුතු නිවැරදිව හා මැනවින් ඉටුකිරීමටත් දෙඅත්

නිදහස්ව තබා ගැනීමට මෙසේ සූදානම්වීම අවශ්‍ය වේ.

තේවා කටයුතුවලට තේවා කාරක භික්ෂූන් වහන්සේට උපකාර කරන ඇතුල් කට්ටලයේ රාජකාරී කරන ගිහි පිරිස ද සුදු තුප්පොට්ටිය හා සුදු කංචුකය ද සුදු රවුම් තොප්පිය ද පැළඳ සූදානම්ව මාළිගාවේ තේවා කාරක භික්ෂූන් වහන්සේගෙන් තේවාව භාරගෙන සිටින නායක ස්ථවිරයන්ගේ කුටියට පැමිණෙති. නායක ස්ථවරයන් වහන්සේ අවසරය ලැබ වැඩ ඉන්නා මාළිගාවේ යතුරු මිටිය වට්ටෝරුරාල විසින් යකඩ සේප්පුවෙන් එළියට ගෙන එය තම දකුණු උරහිස මත තබාගෙන ඉදිරියට ගමන් කරයි. ඒ පසුපස මාළිගාවේ නායක ස්ථවිරයන් වහන්සේ උන්වහන්සේගේ සහායක දෙවන ස්ථවිරයන් වහන්සේලා දෙනම ද පල්ලේමාලේ තේවා කාරක ස්ථවිරයන් වහන්සේ ද ඉදිරියට ගමන් කරති. උන්වහන්සේලා පිටුපසින් ගෙපරාල කත්තියරාලලා තිදෙනා හක්ගෙඩි අප්පු යන පිරිසද පිළිවෙලින් ගමන් කරති. මේ සියලු දෙනා ඉදිරියෙන් දැල්වූ අත්පන්දම් ගත් පන්දම් කරයා ගමන් කරයි. යතුරු හතක් පමණ ඇති මේ යතුරු ගෙනයන (පයිණ්ඩකරන) මේ කුඩා පෙරහැර හේවිසි මණ්ඩපයට පැමිණ දෙපා සෝදාගෙන හේවිසි මණ්ඩපයේ ඇත්දත් වාහල්කඩට පැමිණේ. එහිදි යතුරු මිටිය ලේන්සුවෙන් මුදා පල්ලේමාලේ යතුරු පල්ලේමාලේ රාලට භාරදෙයි. ඔහු එම යතුරු භාරගෙන පල්ලේමාලේ තේවාකාරක ස්ථවිරයන් වහන්සේ සමඟ ගොස් පල්ලේමාලේ දොර විවෘත කොට එහි තේවාවට සූදානම් වෙයි. ඇත්දත් වාහල්කඩේ දී වැඩඉන්නා මාළිගයේ යතුරු මිටිය ගන්නා වට්ටෝරුරාල ඉන් අරමුදලේ දොර ද දෙවනුව ඉහළ මාලේ රිදී දොර ද තෙවනුව ආරක්ෂක යකඩ වැටේ දොර ද අනතුරුව ගන්ධකුටියේ රන් දොරටුව ද විවෘත කරයි. ඒ එක්කම මාළිගාවේ දොරවල් විවෘත කළ බව හැඟවෙන ඝණ්ඨාරය නාද කෙරේ. යතුරු පයිණ්ඩ කර පෙරහැර හේවිසි මණ්ඩපයේ ඇත්දත් වාහල්කඩට පැමිණි විගස නැවතුණු හේවිසි වාදනය මේ ඝණ්ඨාර නාදයත් සමඟ නැවත ඇරඹේ.

රන් දොරටුව විවෘත වූ විගස තේවා කාරක භික්ෂූන් වහන්සේ පත්කඩය එලා දළදා වහන්සේට දණබිම ඔබා වන්දනා කරති. පත්කඩය

ඇල්ලූ නිසා දෙඅත් සෝදා ගන්නා උන්වහන්සේලා (පත්කඩය අතුගාන මුසුන්න ඇල්ලූ හැම විටම දෙඅත් සෝදා ගත යුතුවේ.) මල් ආසනයේ පරමල් ඉවත් කොට ආසනය පිරිසිදු වතුරෙන් සෝදා පිසදමා ආසනය මත ඇතිරිල්ලක් එලා එහි තේවාවට උපයෝගී කර ගන්නා උපකරණ කට්ටලය තැන්පත් කෙරේ. සිවුරු කට්ටලය, රන් අවාන රන් මිටිය සහිත චාමරය, කපුරු මලත්ත, දැහැට්ටක්, රඳවන ලද දැහැටි කූර, මිණි ගෙඩිය , තෙත මාත්තුව යන උපකරණ ඊට අයත් වේ. මේ අතර ගෙපරාල මුළුතැන්ගෙය සිට බොලපැන් (උණු වතුර) රිදී කලයකින් උඩමාලයේ රන් දොරටුව වෙත ගෙන එයි. එහි දී එදින තේවාව කරන භික්ෂූන් වහන්සේ මහරන් කෙණ්ඩියට ද (එය රජතුමා විසින් පූජා කරන ලද්දකි.) කුඩා රන් කෙණ්ඩියට ද (එය ඇහැලේපොල නිළමේතුමා විසින් පූජා කරන ලද්දකි.) බොලපැන් පුරවා එයින් මහරන් කෙණ්ඩිය අළුයම තේවාව සඳහා ගැනීමට සෙසු තේවා භාණ්ඩ සමඟ ආසනය මත තැන්පත් කෙරේ. කුඩා රන් කෙණ්ඩිය බුද්ධ පූජාවට පැන් වැඩීම සඳහා පසෙක තැන්පත් කෙරේ. අනතුරුව තේවාව කිරීමට සුදානම් වන භික්ෂූන් වහන්සේ පත්කඩය ගෙන බිම එලා වැඳ දෙඅත් සෝදාගෙන දැහැටි පිළිගැන්වීම මුහුණ සේදීමට පැන් වැඩීම, තෙතමාත්තු කිරීම, සිවුරු පිළිගැන්වීම පා දෝවනය කොට ආසනය පූජා කිරීම , කපුරු මලත්ත දල්වා පහන් එළිය පූජා කිරීම හා සුවඳ ජලය ඉසීම, මිණිගෙඩිය තෙවරක් නාද කොට ශබ්ද පූජා කිරීම ආදී උපස්ථාන සොළසක් අනුකරණයෙන් ඉටුකරනු ලැබේ. එය සොළස උපස්ථානය නමින් හැඳින්වේ. තේවා කටයුතු නිමවීමෙන් පසු එදින තේවාව කළ භික්ෂූන් වහන්සේම ස්වර්ණමය බන්දේසියක තබන ලද මල් බන්දේසිය සමඟ පූජා කරති. එය මල් දැක්වීම නමින් හැඳින්වේ. මේ සඳහා අවශ්‍ය මල් මාළිගාවේ භේවිසිකරුවන් විසින් දවල් හා සවසට සැපයිය යුතුවේ. එය මල්මුරය නමින් හැඳින්වේ. මේ කටයුතු විනාඩි 15 කින් පමණ අවසන් වේ. ඉන්පසු දළදා පුදට පැමිණි සැදැහැවතුන්ට වන්දනා කිරීමට ඉඩ සලසා දෙනු ලැබේ.

පෙ.ව. 6.30 ට අලුයම මුළුතැන් පූජාව සිදුකළ යුතුවේ. ඒ නිසා එම වේලාවට විනාඩි 5.00 කට පමණ පෙර සණ්ඨාරය නාදකරනු ලැබේ. ඒ සමඟම සැදැහැවතුන්ට දළදා වැඳීමට ඉඩදුන් කාලය තාවකාලිකව අත්හිටුවා

පිරිත් මණ්ඩපය තුළින් ගන්ධකුටියට පිවිසෙන දොර වසති. ඒ වන විට අළුයම මුළුතැන් පූජාව භාරගෙන සිටින පිරිස ගෙපලුම් බරාදයට කැඳවා එහි රඳවනු ලැබ සිටිති. එදින අළුයම දළදා තේවාව සිදුකළ ස්ථවිරයන් වහන්සේ විසින්ම අලුයම මුළුතැන් පූජාව ද සිදුකිරීම චාරිත්‍රය වන හෙයින් උන්වහන්සේ පත්කඩය බිම එලා දළදා වහන්සේ වැඳ දෙඅත් සෝදාගෙන ගඳ කිලියට පිවිසි විට ගෙපරාල විසින් රන් පාත්‍රයක් ගෙනවිත් උන්වහන්සේ අතට දෙනු ලැබේ. එය මල් ආසනයේ මල් වලට උඩින් එලන ලද ඇතිරිල්ල මත තබා බුදුන් වහන්සේගේ ශ්‍රී හස්තය සේදීම සඳහා පැන් කෙන්ඩියෙන් පැන් වත්කරනු ලැබේ. ඉන්පසුව ගෙපරාල විසින් මහරන් පාත්‍රය ගඳකිලි දොරටුවට ගෙනවුත් එදින මුළුතැන් පූජාව සිදුකරන තේවාකාරක ස්ථවිරයන් වහන්සේ අතට භාරදෙයි. උන්වහන්සේ එම පාත්‍රය මල් ආසනයේ හරි මැදින් එහි ඉහළ කෙළවරේ සුරක්ෂිතව තැන්පත් කරති. මේ මහ රන් පාත්‍රය රජතුමා වෙනුවෙන් (අද දියවඩන නිලමේ) පූජා කරනු ලබන හෙයින් එය කිසිවෙකු අතට නොදේ. අනතුරුව මුළුතැන් පූජාව භාරගත් සැදැහැවතුන් ඉතිරි පාත්‍රා හා ව්‍යාඤ්ජන භාජන ද අවුල්පත් භාජනද පිළිවෙලින් ගෙනවුත් ආසනය මත තැන්පත් කොට වැද පුජා කොට ඉවත යත්ම එම පත්‍රා සහ අවුල්පත් භාජන පිළිගත් ක්‍රමානුකූලව පිළිවෙලකට තැන්පත් කෙරේ. අනතුරුව සැදැහැවතුන් විසින් ගෙන එනු ලබන ආහාර පූජාවන් ආසනයේ ඉඩ ඇති පරිදි තබනු ලැබේ. එසේ ගෙන එනු ලබන පූජාවන් අධික වුවහොත් විශාල පිත්තල පාත්‍රයකට දමා ඒ සියල්ල එකවර පූජාවට තැබේ. අළුයම පූජාවට කැඳ පාත්‍රයක් ද කිරිබත් පාත්‍රයක් ද තැබීම විශේෂ චාරිත්‍රයකි. මේ සියල්ල සූදානම් වූ කල්හි ගන්ධකුටියේ රන් දොර ද කුටිය තුළ ඇති තිරය ද වසා පැන් වඩා බුද්ධ පූජාවේ සියලු භාජන වලට අත ගසා, මුළුතැන් පූජාව තැන්පත් කොට ඇති ආසනයට ද අතගසා වැඳ පූජා කරති. අනතුරුව පත්කඩය ගෙන බිම එලා පසඟ පිහිටුවා වැඳ පත්කඩය හකුලා වම් අත මත දකුණු අත දමාගෙන ගඳකිළියේ දොරෙන් පිටව එහි තිරය මෑත් කොට යකඩ ගරාදිය අසලට පැමිණෙති. පත්කඩය තැන්පත් කොට ඇති ආකාරයෙන් මුළුතැන් පූජාකොට අවසන් වී ඇති බව තේරුම් ගන්නා ගෙපරාල සණ්ඨාරය තෙවරක් නාද කරයි. එවිට ම කත්තියරාල හේමකඳ උරය මත තබා මුළුතැන්ගෙය දක්වා ගෙන ගොස් එහි තැන්පත් කරයි. මේ සළකුණෙන් මුළුතැන් පූජාව අවසන්

බව වටහා ගන්නා හේවිසි මණ්ඩපයේ හේවිසිකරුවෝ හේවිසිය හමාර කරති. ඒ හා සමඟ මගුල් බෙරය වයා දවුල හා තම්මැට්ටමෙන් ආලත්ති පදය වාදනය කොට උදේ තේවා හා පූජා කටයුතු අවසන් කෙරේ. මේ සමඟ තේවා කාරක භික්ෂූන් වහන්සේ පැන් වඩා වැඳ බුද්ධ පූජාව බැහැ ගනියි. (බුද්ධ පූජාව බැහැ ගැනීම නම් ඒවා ආසනයේ ඉවත් කිරීමයි.) පසුව තෙතමාත්තු කොට දළුමුර තට්ටුව පිළිගන්වා සියලු කටයුතු අවසන් කරති. අනතුරුව සැදැහැවතුන් ඇතොත් ඔවුන්ට වඳින්ට ඉඩ දී ඇතුළු කුටිය හා ගෙපලුම් බරාඳය තැන් අතු ගා පිරිසිදු කොට දොරවල් පිළිවෙලින් වසා යතුරු දමා එම යතුරු මාළිගාවේ නායක ස්ථවිරයන් වහන්සේගේ කුටියට පයිණ්ඩ කොට යකඩ සේප්පුවේ තැන්පත් කොට එහි යතුර නායක හිමියන් අතට භාරදී පිටතට පැමිණේ. එහිදී තේවාකරක භික්ෂූහු වැඩිමහළු පිළිවෙලට එකිනෙකට වැඳ අවසර ගත් කල්හි ගිහි පිරිස ද භික්ෂූන් වැඳ විසිර යති. උඩු මහලේ තේවා කටයුතු සිදුවූ ආකාරයෙන්ම පහත මාලය ද තේවාව හා බුද්ධ පූජාව සිදුකරනු ලැබේ.

දවල් පූජාව ඇරඹෙන්නේ පෙ.ව. 9.30 ටයි එම අවස්ථාවට සූදානම් වී යතුරු පයිණ්ඩ කොට ගෙන සියලු දෙනා පැමිණ වැඩ සිටින මාළිගාවේ දොරවල් විවෘත කොට උඩමාලයට පිවිසි විට එහි දොරවල් විවෘත කළ බව හැඟවීමට සණ්ඨාරය තෙවරක් නාද කෙරේ. මල් ආසනයට පැන් ඉස පරමල් හෝ වැඩිපුර මල් ඇතොත් ඒවා ඉවත් කරති. ගෙපරාල හා කන්නියනරාල මුළුතැන්ගෙට ගොස් පූජාව සඳහා පැන් ද හේමකද ද රැගෙන හේවිසි මණ්ඩපයට පැමිණෙත්ම තේවා හේවිසි වාදනය කෙරේ. ඉහළ මාලයේ දී මහරන් කෙණ්ඩියට හා කුඩාරන් කෙණ්ඩියට පැන් පුරවා ඇතුලත තැන්පත් කෙරේ. දවල් පූජාව සඳහා තේවාවක් සිදුනොවේ. පෙ.ව. 10.00 දක්වා මහජනයාට දළදා වඳින්ට ඉඩදී අලුයම සිදුකලාක් මෙන් දහවල් මුළුතැන් පූජාව සිදුකරති.

මෙම ආහාර පූජාවටද උදේ ආහාර පූජාවට ද හාල් සේරු 32 ක පිසූ බත් ද ව්‍යඤ්ජන 32 ක් ද කැවිලි වර්ග පහක් ද සූදානම් කරති. මේවා පාත්‍රා හතකට බෙදා ව්‍යඤ්ජන 32, කුඩා කුසලාන්වලට බෙදා ඒවා කුසලාන් අට

බැගින් ඇති පාත්‍ර හත පූජා කිරීමේ අයිතිය හත්දෙනෙකුට හිමිව තිබේ. ඒ පහත සඳහන් අයටය.

1. මහ රන් පාත්‍රය - පෙර රජතුමා (මෙකල දියවඩන නිළමේතුමා)
2. කුඩාරන් පාත්‍රය - කාරිය කෝරාල
3. කුඩාරන් පාත්‍රය - වට්ටෝරුරාල
4. කුඩාරන් පාත්‍රය - ගෙපරාල
5. රිදී පාත්‍රය - කත්තියනරාල
6. රිදී පාත්‍රය - දොරේ ආරච්චි (අරමුදලේ දොරටුව රකින්නා)
7. පිත්තල පාත්‍රය - හක්ගෙඩි රාල

අලුයම මුලුතැන් පූජාව කළාක් මෙන් දවල් මුළුතැන් පූජාව කොට අවසන් වූ කල්හි පුජාව බැහැගෙන දළුමුර තට්ටුව පූජාකොට අවසන් කෙරේ. අනතුරුව වන්දනාව සඳහා පැමිණි පිරිස ඇතොත් වන්දනාවට ඉඩ සලසා දී පෙරවරු 11.15 ට පමණ දොරවල් වසා යතුරු පයිණ්ඩ කොට ඒවා නායක ස්ථවිරයන්ගේ කුටියේ තැන්පත් කොට භික්ෂූන් වැඳ විසිර යයි.

සවස පූජාව ඇරඹෙන්නේ ප.ව. 6.15 ට හේවිසිකරුවන් විසින් හැන්දෑදූර හේවිසි වාදනයෙනි. ලයාන්විත මන්දගාමි රිද්මයකින් වාදනය කෙරෙන හැන්දෑදූර හේවිසිය කණට මිහිරක් ගෙන එන්නකි. මේ අවස්ථාවේදී පෙර පරිදිම සුදානම් වන තේවා කාරක භික්ෂූන් වහන්සේද ඇතුල් කට්ටයේ ගිහි රාජකාරි පිරිස යතුරු පයිණ්ඩ කොට වැඩ ඉන්නා මාළිගාවේ දොරවල් විවෘත කරති. අලුයම තේවාව සිදුකළාක් මෙන් තේවාකාරක භික්ෂුවක් තේවාව කොට නිමවු කල්හි සැදැහැවතුන්ට දළදා වඳින්නට ඉඩ ලබාදේ. ප.ව. 7.00 ට ගිලන්පස පූජාව සිදුකළ යුතුවේ. පස්වරුවේ දෙවරක් ගිලන්පස පූජාව කරනු ලැබේ. ඉන් පළමු පූජාව ප.ව. 7.00 ට ද දෙවැන්න 7.30 ට සිදු කෙරේ. මින් දෙවන ගිලන්පස පූජාව කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා වෙනුවෙන් පූජා කරති කියනු ලැබේ.

ශ්‍රී දළදා මාළිගාවේ  දී සතියකට වරක් සෑම බදාදා දිනකම නානුමුර මංගල්‍යය සිදුකෙරේ. ඉන් අදහස් වන්නේ දළදා වහන්සේ (බුදුන් වහන්සේ ) ස්නානය කරවීමයි.

නානුමුරය සිදුකෙරෙන බදාදා දිනයේ පෙරවරුව තේවාවට සම්බන්ධ සියලු දෙනාටම සුවිශේෂී අවස්ථාවකි. එදින අළුයම තේවාවෙන් හා මුළුතැන් පූජාවෙන් පසුව දළදා ගන්ධ කුටිය ද ගෙපලුන් බරාඳය ද කත්තියන බරාඳයද සෝදා පිසදමා අතුගා පිරිසිදු කෙරේ. එසේම මලසුන, තේවාවට හා පූජාවට ගන්නා භාණ්ඩ සෝදා පිරිසිදු කොට මුලසුන මත තබා සුවඳ දුම් අල්ලා තැන්පත් කරති. වෙනදාට මෙන් දොරවල් යතුරු පයිණ්ඩ කොට පිරිස විසිර ගිය කල්හි තේවා කාරක හිමිවරුන් උදේ දානය ගෙන ටික වේලාවකින් හිසකෙස් රැවුල් කපා ස්නානය කරති. ගිහි පිරිස ද දිය නා තම තමන්ගේ නිල ඇඳුමෙන් සැරසෙති. එදින නියමිත වේලාවට ටිකක් කලින් දොරවල් විවෘත කොට නානුමුරට සුදානම් වෙති. ගෙපරාල මුළුතැන්ගේ සිට බොලපැන්ද නානුමුරුවට ද ගෙනවිත් භික්ෂූන් වහන්සේට භාරදෙයි. ඒවා අතර ගලගෑ සඳුන් දියර ද තිබේ. මේ අවස්ථාවට ප්‍රධාන පණික්කයෝ හේවිසි වාදනයට සුදානම් හේවිසි වඩුවේ සිටිති. කවිකාර මඩුව දළදා ගීතිකා ගැයිමට සුදානම්ව ගොපළුන් බරාඳයේ දකුණුපස බරාඳයේ සිටිති. ආලත්ති අම්මාවරුද  දෙමළ බෙරය හා දිග නළාව වාදනය කරන පිරිස ද සුදානම් ව සිටිති. සියල්ල සම්පූර්ණ වු කල්හි ගන්ධ කුටියේ සිටින වට්ටෝරුරාල විදුලි සීනුව නාදකොට නානුමුරය ආරම්භ කිරීමේ සංඥාව ඉන් පිටත සිටින රාජාකාරිකරුවන්ට දන්වයි. ඒ සමගම හක්ගෙඩි රාළ හක්ගෙඩිය තෙවරක් පිඹියි. ඒ හඬ ඇසෙත්ම හේවිසි මණ්ඩපයේ හේවිසි වාදනය ඇරඹේ. ගන්ධකුටියේ දොර ද තිරයද පිටත තිරයද වසා නානුමුර කිරීම ආරම්භ කරයි. බුදුරජාණන් වහන්සේ වෙනුවට දළදා වහන්සේට වැඩ ඉන්නා මහ කරඬුවේ ඡායාව චාරිත්‍රානුකූලව අනුකරණයකට අනුව සුවඳතෙල් නානුමුරුවට ගල්වා පළමුව උණුවතුරෙන්ද දෙවනුව සුවඳ වතුරෙන්ද සෝදා හැරීම නානුමුරයෙන් අදහස් කෙරේ. ඒ සියල්ල ඉහළ මාලයේ සිදුවෙද්දී හේවිසිකරුවෝ වැඩ ඉන්නා මාළිගයේ වටේ තෙවරක් පැදකුණු කරමින් වට හේවිසි වාදනය කරති. වට තුන ගොස් අවසන් වත්ම ගන්ධ කුටියේ රන්

දොරත් ඊට මෙහායින් ඇති ප්‍රධාන තිරයත් මැද සුදානම්ව සිටින ආලත්ති අම්මාවරු දෙදෙනා ආලත්ති බෑම නම් චාරිත්‍රය ඉටුකරති. ඒ වේලාවේ අලත්ති පදය වාදනය කරන හේවිසිකරුවෝ එය ද අවසන් කරති. මේ සියල්ල අවසන් වන්නේ එදින අළුයම සිදුකාළාක් මෙන් දළදා තේවාව ද ඉටුකරමිනි. මේ මුළු කාලය තුළ කවිකාර මඩුව දළදා ගීතිකා ගායනා කරන අතර සිංහාරක්කාරයෝ දෙමළ බෙරය හා දිග නලාව තාලයකට අනුව හඬවති. ගන්ධ කුටියේ සිදුවූ නානුමුරය හා තේවාව ඒ ආකාරයෙන් ම පල්ලේමාලයේ දීත් සිදුකරනු ලැබේ.

ඉහළ මාලයේ නානුමුරය සඳහා උපයෝගී කොටගත් තෙල් හා නානුමුරුවට සෝදා හල බොල්පැන් හා සුවඳ පැන් මේ වනවිට කාලංචියෙහි රැස්කොට තිබේ. බෝතල් හා කුප්පි රැගෙන එන සැදැහැවත්තු ඉන් ස්වල්පය බැගින් රැගෙන ගොස් ඇගේ හිසේ ගා ගනිති. ගෙවලට ඉසිති. ඉන් නිරෝගි බවත් ආරක්ෂාවත් ලැබේ යැයි ඔවුහු විශ්වාස කරති.

වසරකට වරක් බැගින් කෙරෙන පූජා උත්සව හතරක් ශ්‍රී දළදා මාළිගාව විසින් සංවිධානය කරනු ලැබේ. ඒවා නම්

1. අලුත් සහල් මංගල්‍යය
2. අවුරුදු මංගල්‍යය
3. පෙරහැර මංගල්‍යය
4. කාර්තික මංගල්‍යය යන මේවාය.

මෙයින් අලුත් සහල් මංගල්‍යය ජනවාරි මාසයට යෙදෙන දුරුතු පෝය දින සිදුකරනු ලැබේ. මෙයින් සිදුවන්නේ කලකට පෙර ගුරුදෙණියේ දූනට කුණ්ඩසාලේ පිහිටුවා ඇති රාජකීය හාල් අටුවෙන් වී සහ සහල් පෙරහැරකින් ගෙනවුත් පෝය දිනයේ ඉන් හාල්සේරු 80 ක දානය හා ඊට සරිලන ව්‍යඤ්ජන සූදානම් කොට කිරිබොඩ පාත්‍රයට පුරවා දිනපතා පූජා කෙරෙන හාල්සේරු තිස් දෙකේ හා ව්‍යඤ්ජන තිස්දෙකේ මුළුතැන් පූජාවට අතිරේකව දළදා වහන්සේට පූජා කිරීමය. මහනුවර පිහිටි නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි දේවාලයන්හි දි පිටිසර දේවාලයන්හි රජමහා විහාරවල

ද මේ පූජාව සිදුකරනු ලැබේ. වෙනත් බොහෝ තැන්වල අලුත් සහල් මංගල්‍යයට හාල් පූජා කිරීම සිරිතක් වුව ද දළදා මාළිගාවේ අනෙක් තැන්වල සහලින් බත් පිස පූජාකිරීම පෞරාණික චාරිත්‍රයයි.

අවුරුදු මංගල්‍යය අප්‍රේල් මාසයේ සිංහල අවුරුදු දිනවල සිදුකරනු ලැබේ. ශ්‍රී දළදා මාළිගාවේ නැකත් මොහොට්ටාල විසින් සූදානම් කෙරෙන නැකත් පත්‍රයට අනුව අවුරුදු සංක්‍රාන්ති වේලාවේ කිරි ඉතිරවීම ද අවුරුදු දිනවල බදාදා දිනයක් ඇතොත් එදින නානුමුර කිරීම ද මේ අවුරුදු මංගල්‍යයට අයත් වේ. බදාදා දිනය අවුරුදු දින දෙක පසුවී දින කීපයක් ඉදිරියට ඇත්තේ නම් අවුරුදු දිනයේ දී කණ්ඨස්නානය නම් චාරිත්‍රයත් ඉටුකරනු ලැබේ. ඉන් අදහස් වන්නේ සම්පූර්ණයෙන් ස්නානය කරනු වෙනුවට බුදුන් වහන්සේගේ බෙල්ලෙන් (කණ්ඨයෙන්) පහළ කොටස සේදීමය.

සෑම වසරකම ජූලි අගෝස්තු මාසවල දී පෙරහැර මංගල්‍යය සිදුකෙරේ. එය මාළිගාව හා සිව් මහා දේවාලයන් විසින් සංවිධානය කෙරෙන අතිවිශාල ජාතික වූද ආගමික වූද සංස්කෘතිකමය වූද මහා මංගල්‍යය වේ. සතර මහා දේවාලවල කප් සිටුවීමෙන් ඇරඹෙන මේ මහා පෙරහැර මංගල්‍යයේ දී පළමු දින පහේ දී සිව්මහා දේවාලවල ඇතුළේ පෙරහැර පවත්වනු ලැබේ. ඉන් අදහස් වන්නේ ඒ ඒ දේවාලවල දෙවිවරුන්ගේ රන් ආයුධය කුඩා පෙරහැරකින් දේවාල ගොඩනැගිල්ල වටාගෙන යමින් ප්‍රදක්ෂිණා කිරීමයි. දේවාල හතරේම පුරා දින පහක් මේ ඇතුළේ පෙරහැර පවත්වනු ලබන මුත් ශ්‍රී දළදා මාළිගාවේ එවැනි පෙරහැරක් නොපැවැත්වේ.

ඊළඟ දින පහේ දී සතර මහා දේවාල දළදා මාළිගාවේ පෙරහැරට එක්වී වීථි සංචාරය කරමින් පෙරහැර පවත්වති. ඊට කුඹල් පෙරහැර යන නම ව්‍යවහාර කෙරේ. ශ්‍රී දළදා මාළිගාවේ පෙරහැර කරඬුවද සතර මහා දේවාලවල ඒ ඒ දෙවිවරුන්ගේ රන් ආයුධ ද පෙරහැරෙන් වැඩමවීම මේ පෙරහැරෙන් සිදුවේ. මෙයින් පළමු කුඹල් පෙරහැර කුඩා දරුවන්ට පෙන්වීමෙන් ශාන්තිය හා යහපත සිදුවෙතැයි අදහන මව්පියවරු සිය

දරුවන් ද සමඟ පැමිණ මේ පළමු පෙරහැර නැරඹීමට අමතක නොකරති.

ඊළඟ දින පහේ රන්දෝලි පෙරහැර පැවැත්වේ. දිනෙන් දින වඩ වඩාත් අලංකාර ලෙස සංවිධානය කෙරෙන මේ පෙරහැරට අලි ඇතුන් හේවිසිකරුවන් නැට්ටුවන් වැඩි වැඩියෙන් එකතු කරනු ලැබේ. විශාල වශයෙන් මහජනයා නුවරට පැමිණ මේ පෙරහැර නැරඹීමට පුරුදුව සිටින බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළයුතුව ඇත.

රන්දෝලි පෙරහැරේ පස්වන දින පැවැත්වෙන මහ පෙරහැරෙන් පසුව මාළිගාවේ හා සිව්මහා දේවාලවල පෙරහැර නැවතත් පිටත්ව අස්ගිරි මහා විහාරයේ ආදාහන මළුවේ ගෙඩිගේ විහාරයට පැමිණ චාම් එහෙත් විසිතුරු පෞරාණික චාරිත්‍රානුකූලව පෙරහැර කරඬුව එහි තැන්පත් කොට ආපසු පැමිණේ. පසුවදා දවල් පෙරහැරෙන් කරඬුව ආපසු වැඩමවන තෙක් එහි තැන්පත් කොට තබනු ලැබේ. දළදා වහන්සේ මහනුවරට වැඩමවා දළදා මාළිගාවේ ඉදිකිරීම් අවසන් වන තෙක් තාවකාලිකව වඩා හිඳුවා තබන ලද ස්ථානයට ගරු කිරීමක් වශයෙන් ද ලංකාවේ ඉංග්‍රීසි ආණ්ඩුව 1853 දී අස්ගිරි මල්වතු උභය මහාවිහාරයේ අතිගරු මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාට හා දියවඩන නිළමේතුමන්ට දළදා වහන්සේගේ භාරකාරත්වය පවරා දෙනතෙක් ඉතා දුෂ්කර ජාතික විපත්තිකර අවස්ථාවල දී පවා දළදා වහන්සේ ආරක්ෂා කොටගත් අස්ගිරි මහා විහාරයට ගෞරව දැක්වීමක් වශයෙන් අවසාන රන්දෝලි පෙරහැර දිනයේ පෙරහැර කරඬුව පෙරහැරෙන් වැඩමවා ගෙන අවුත් ආදාහන මළුවේ ගෙඩිගේ විහාරයේ තැන්පත් කරන බව සැලකිය යුතුය.

මෙයින් පැයකට පමණ පසු සතර මහා දේවාලවල රන් ආයුධ අතින් ගත් කපු මහත්වරු අලි සිව්දෙනෙකු මත නැඟී කුඩා පෙරහැරකින් මහවැලි ගඟේ ගැටඹේ තොටට ගොස් දිය කපති. එදින මෙතෙක් දේවාලවල සිටවා තිබූ කප් උගුලුවා ගෙන ගොස් දිය කැපීමට පෙර ගඟට දමනු ලැබේ. ගඟ පහළ රැස්ව සිටින පිරිස් මේ කප් අල්ලා ගෙන ගොස් කුඩා කැබලි වලට කපා සිය ගොවිපලවල හා කුඹුරුවල සිටවති. ඉන් අස්වැන්න වැඩිවී තමන්ට

සමෘද්ධිය සැලසෙතියි ඔවුහු විශ්වාස කරති.

දිය කපාගත් සිව්දේවාල පෙරහැර නැවත මහනුවරට පැමිණෙමින් මහනුවර පොලීසිය අසල ඇති පුල්ලේයාර් කෝවිලේ නවතී. එදින ප.ව. 2.00 ට පමණ සූදානම් වී දේවාල පෙරහැර ආදාහන මළුවේ ගෙඩිගේ විහාරය අසලට ගොස් එහි සූදානම්ව ඇති ශ්‍රී දළදා මාළිගාවේ පෙරහැර හා එක්ව ඩී. එස්. සේනානායක වීදිය ඔස්සේ පැමිණ රජමාළිගා චතුරශ්‍රය වටේ තෙවරක් පැදකුණු කොට මාළිගාවේ පෙරහැර මාළිගාවටත් සෙසු දේවාල පෙරහැර ඒ ඒ දේවාල වලටත් ගෙවදී. ඒ හා සමගම දියවඩන නිළමේතුමා පෙරහැරට සම්බන්ධ වූ දේවාලවල බස්නායක නිළමේතුමන්ලා සමඟ නිල ඇඳුමෙන් සැරසී කුඩා පෙරහැරකින් ජනාධිපති මන්දිරයට ගොස් ජනාධිපතිතුමා බැහැදක පෙරහැර හොඳින් පැවැත්වූ බව එතුමාට දන්වා සිටී. ඒ සමඟම මේ මහා පෙරහැර පැවැත්වීම සඳහා ශ්‍රී දළදා මාළිගාවට සහ සතර දේවාලවලට ඇති දුෂ්කරතා සහ අඩුපාඩු සඳහන් සංදේශයක් ද භාරදෙති.

පෙරහැර අවසන් වූ දිනයට පසුදින පෙරහැරට සම්බන්ධ වූ සියළු දෙනාට ද අලි ඇතුන්ට ද සෙත්පතා ශ්‍රී විෂ්ණු දේවාලයේ වලියක් මංගල්ලය පටන් ගනී. දින 7ක් පවත්වන මේ වලියක් මංගල්ලය අවසානයේ සියලු දෙනාට සෙත ශාන්තිය ප්‍රාර්ථනා කරනු ලැබේ. ඇසළ පෙරහැර මංගල්‍යයේ සියලු කටයුතු එයින් අවසන් වේ.

සිව්වන කාර්තික මංගල්‍යය සිදුකරනු ලබන්නේ සෑම වසරක ම නොවැම්බර් මාසයට එළඹෙන ඉල්පුර පසළොස්වක් පුන් පොහෝ දිනයේ දීය. ඊට දින කීපයකට පෙර ශ්‍රී දළදා මාළිගාවෙන් සැපයෙන පොල්තෙල් නාථ දේවාලයට ගෙන ගොස් එහි මුත්තෝලියේ දී ශ්‍රී දළදා මාළිගාව වෙත ද සතර මහා දේවාල හා පිටිසර දේවාල වලට ද රජමහා විහාරවලට ද බෙදා දෙන ලදි. මේ පොල්තෙල්වලින් ඒ ඒ ස්ථානවල රාත්‍රිය පුරා පහන් දැල්වීම කළ යුතුවේ. ශ්‍රී දළදා මාළිගාව පහන් දල්වා පෙරහැර කරඬුව වැඩමවමින් අලි ඇතුන් සහිත පෙරහැරක් ද එදින රාත්‍රියේ පවත්වනු ලැබේ. මේ සියල්ල හැර ශ්‍රී දළදා මාළිගාවේ සිදුකරන අනෙක් චාරිත්‍රමය උත්සව කීපයක් ද දක්නට

ලැබේ. වෙසක් මංගල්‍යය ඉන් එකකි. එදින ආගමික කටයුතු සියල්ල සුපුරුදු පරිදි පැවැත්වෙන අතර වෙසක් උත්සවය නිමිත්තෙන් පෙරහැර කරඬුව වැඩමවන වෙසක් පෙරහැර ද ශ්‍රී දළදා මාළිගාව විසින් සිදුකරනු ලැබේ. අස්ගිරි මල්වතු මහාවිහාරද්වයේ උපසම්පදා සමය ඇරඹෙන්නේ ද වෙසක් දිනයේ දීය. එදින සිට පොසොන් පෝය දක්වා ඇති පෝය පහට මහාවිහාර දෙකේ උපසම්පදාව ලබන වාහල නාගයන් සඳහා පෙරහැර සූදානම් කොට ඔවුන් අස්ගිරියට හා මල්වත්තට පෙරහැරෙන් කැඳවාගෙන යාම ද ශ්‍රී දළදා මාළිගාව විසින් සිදුකෙරේ. පොසොන් පෝයට පෙරහැර කිරීම ද මාළිගාවෙන් ඉටුවන තවත් එක් කාර්යයකි.

දළදා වන්සේ වැදපුදා ගැනීමට ශ්‍රී දළදා මාළිගාවට යාමේ දී විශේෂයෙන් දැනගත යුතු සිරිත් විරිත් සමූහයක් ද තිබේ. දළදා වැඳීමට යන සැදැහැවතුන් ඒ සිරිත් විරිත් ගැන දන්නේ නම් එය ඔවුන්ට ද දළදා තේවාවේ යෙදී සිටින ස්ථවිරයන් වහන්සේලාට ද ගිහි රාජකාරිවරුන්ට ද ලොකු පහසුවකි. ඒ සිරිත් විරිත් වලින් කීපයක් මෙසේය. දළදා වහන්සේ වැඳපුදා ගැනීමට මාළිගාවට යන සැදැහැවතුන් සුදුපාට වස්ත්‍රයන්ගෙන් සැරසී පැමිණිය යුතු වේ. එම ඇඳුම් සංවර ලෙස ඇද සිටිය යුතුවේ. සුදුනොවූ ඇඳුමක් ඇඳ සිටියත් මාළිගාවට පිවිසීම වලක්වන්නේ නැති වුවත් අත්කොට හැට්ට, කොට ගවුම්, කොට කලිසම් ඇද එහි පිවිසීමට ඉඩ නොලැබේ.

දළදා පුදට පිච්ච, සමන්පිච්ච, සුදු නෙළුම් ගෙන යන්නේ නම් මැනවි. පාට මල් මලසුනට භාරගන්නේ නැත. මල් අතින් ගෙන ගොස් ඒවා බන්දේසියක හෝ කූඩයක දමාගෙන ගොස් එය තේවා කාරක භික්ෂූන් වහන්සේ අතට දිය යුතුය. උන්වහන්සේ එයින් මල් ස්වල්පයක් ගෙන අතට දුන්විට එම මල් එකවර ආසනය මත තැන්පත් කොට දෙඅත් නගා වැඳ හැකි ඉක්මණින් පිටතට ආ යුතුය. මලසුන ළඟ දණ ගසා වඳින්නට කිසිවෙකුට අවසර නැත. භික්ෂූන් වහන්සේ නමක් වුව ද මීට කලින් දළදා තේවාව සිදුකොට නැත්නම් එතැන දණ ගසා වඳින්නට ඉඩ නොලබති. දළදා තේවාව සිදුකොට ඇත්නම් මලසුන මත ඇති බන්දේසියෙන් මල් ටිකක් ගෙන පූජා

කොට පත්කඩය එලා බිම දණ ඔබා දළදා වදින්නට උන්වහන්සේට ඉඩ ලැබේ. ගන්ධකුටියට පිවිසෙන සියලු භික්ෂූන් වහන්සේලා සිවුර මතුපිට

# දළදා සංස්කෘතිය හා මල්වතු - අස්ගිරි සංඝ පරම්පරා

**මහාචාර්ය මුවඇටගම ඥාණානන්ද හිමි**
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දීර්ඝ ඉතිහාසය තුළ දළදා වහන්සේ උදෙසා කළයුතු වතාවත් ඉටුකළ සංඝ පරම්පරා පිළිබඳව අවිච්ජින්න තොරතුරු සම්පූර්ණයෙන් ආරක්ෂා වී නැතත් ඇතැම් ලේඛනවලින් තරමක් විස්තර සපයාගත හැකිය. එම වාර්තාවල නියුක්තවීමට කෙනෙකු හේමමාලා හා දන්ත කුමරුගේ පුරපුරෙන් පැවැත්තෙන්නකු විය යුතු බව කියනු ලැබේ. මුල් කාලයේ සිට දළදා වහන්සේ වෙනුවෙන් ඉටුකළයුතුව තිබුණු ස්වකීය වගකීම් සම්පූර්ණ කිරීමට එහි නියුක්ත වූ සංඝ පරම්පරාවල මහාසංඝයා වහන්සේ උනන්දු වූවා මිස තොරතුරු එක්රැස්කර තබා ගැනීමේ අවශ්‍යතාවයක් පිළිබඳ කල්පනා කළ බව නොපෙනේ. කෙසේ වෙතත් මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි.ව. 1747 - 1781) රාජ්‍ය සමයේ සිට රජුගේ විශේෂ වරප්‍රසාද ලැබූ උභය මහා විහාරීය සංඝරත්නය දළදා වහන්සේගේ තේවා කටයුතුවල නිරතවෙමින් එහි ආරක්ෂාව සඳහා ක්‍රියාකළ බව දැක්වේ[1]. මේ ලිපිය එම සංඝ පරම්පරා විසින් ඉටුකරනු ලබන දළදා තේවාව පිළිබඳ සංක්ෂිප්ත විස්තරයකි.[2] එබැවින් මෙහි ඒ සම්බන්ධව කිසියම් ඌනතාවයක් වෙතොත් උභය මහා විහාරීය ගරුතර මහා සංඝරත්නයේ සමාධිය ඊට ලැබිය යුතුය.

මහනුවර ශ්‍රී දළදා මන්දිරයෙහි සාම්ප්‍රදායික ව්‍යවහාරයට අනුව ඉහළ මාලේ "වැඩ සිටින මාළිගාව' නැතහොත් 'ඇතුල් මාළිගාව' නමින් හඳුන්වන[3] ගන්ධකුටියෙහි සුවිශේෂ ආසනයක එකක් මත එකක් තබන ලද රන්කරඬු හයකින් ආවරණය කරනු ලබන සත්වැනි දඹරන් කරඬුවෙහි වඩා හිඳුවා දෛනිකව දෙවතාවක් වත් පිළිවෙත් සිදුකරමින් හා තෙවතාවක් පුදපූජා පවත්වමින් සිදුකරන වන්දනාමානාදි අපිරිමිත ගෞරවාදරයට පාත්‍ර වූ බුදුරජාණන් වහන්සේගේ වාම ශ්‍රී දළදා වහන්සේ දඹදිව කලිඟු රටින්

ලක්දිවට වැඩමවනු ලැබුවේ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ (ක්‍රි.ව. 301 - 328) රාජ්‍යෝදයෙන් නවවැනි වර්ෂයේ දි අනුරාධපුර මේඝගිරි මහාවිහාරයටය.[4] ගුහසීව රජුගේ දියණිය හා බෑණනුවන් විසින් එදා දළදා වහන්සේ ලක්දිවට වැඩමවන ලද්දේ මෙරටට ලබාදෙන දායාදයක් හෝ පරිත්‍යාගයක් වශයෙන් නොව කාලිංග දේශයේ ඇති වූ දේශපාලන නොසන්සුන් බව නිසා ඊට ආරක්ෂාව සැලසීමේ අපේක්ෂාවෙන් බව දාඨාවංශයේ සඳහන් වේ[5]. දළදා වහන්සේ මෙරටට වැඩම වු ආරම්භක අවස්ථාවේ සිට ම එහි භාරකරු වශයෙන් රජතුමාත් බුද්ධ ගෞරවයෙන් භික්ෂූන් වහන්සේලාත් ඊට කළයුතු ගෞරව සත්කාර හා පුදපූජා පැවැත්වූ බව සිතිය හැකිය. පසුකාලයේ දී රජු හා භික්ෂූන් අතර අවියෝජනීය සම්බන්ධතාවක් ඇති කළ පරම පූජනීය වස්තුව බවටත් මෙරට රාජ්‍ය උරුමයේ සංකේතය බවටත් දළදා වහන්සේ පත්විය. එපමණක් නොව දළදා වහන්සේ වැඩ සිටින නගරයට එකල රටේ අගනගරය ලෙසත් එය හිමිකරගත් පුද්ගලයා රටේ රජු ලෙසත් සලකා ක්‍රියා කිරීමට මෙරට භික්ෂූන්, ප්‍රභූන් හා සාමාන්‍ය ජනතාව නැතැනින් ම පුරුදු වී සිටිහය.

ඓතිහාසික සාධක අනුව දළදා වහන්සේ ලක්දිවට වැඩමවීම පිළිබඳව මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා මුලින් විශේෂ උනන්දුවක් දැක්වූ බවට සාක්ෂි සපයා ගැනීම අපහසු වුවත් ආරම්භයේ සිට ම අභයගිරිවාසී භික්ෂූන් එම කටයුතු හා සම්බන්ධ වී සිටි බව පෙනේ. එකල උත්තර මහාවිහාරවාසීන් (උතුරොල් ඇජරන්) නමින් ප්‍රසිද්ධියට පත් උන්වහන්සේලා රජුගේ පූර්ණ අනුග්‍රහය ඇතිව දළදා වහන්සේ උදෙසා පැවැත්වෙන සියලු පුදපූජා ඇතුළු වතාවත් හා වාර්ෂික පෙරහැර මංගල්‍යය සිදුකළ බව සිතිය හැකිය.[6] එකල දළදා වහන්සේ උදෙසා වාර්ෂිකව පැවැත්වූ පෙරහැර දළදා මන්දිරයේ සිට අභයගිරි මහාවිහාරයට ගමන් කළේය. එහි පුරා තුන් මාසයක් දන්ත ධාතුව තැන්පත් කර තබා ඒ කාලය තුළ විවිධ පුදපූජා පවත්වා අභිෂේක උත්සවය ද සිදුකර යළිත් පෙරහැරින් දළදා මන්දිරයට පැමිණීමෙන් දළදා උත්සවය නිමාවට පත්විය.[7] ඇතැම් විට වර්තමානයේ පෙරහැර අවසන් දිනයේ දිය කැපීම නමින් හඳුන්වන චාරිත්‍රය පැරණි අභිෂේක උත්සවයේ

ඇතැම් ලක්ෂණවල විකාශනය වීමක් වන්නට ද ඉඩ තිබේ. එදා දළදා පෙරහැර බුදුරජාණන් වහන්සේ උදෙසා ම මිස එය වර්තමානයේ මෙන් සතර මහා දේවාල (විෂ්ණු , කතරගම, නාථ හා පත්තිනි) පෙරහැර සමඟ බද්ධවූවක් නොවීය. එයින් ප්‍රකට වන්නේ දළදා වහන්සේ සම්බන්ධයෙන් වර්තමානයේ පැවැත්වෙන ඇතැම් පුදපූජා කාලීන අවශ්‍යතාව අනුව සකස් වූ බව ද පිළිගැනීමට බාධාවක් නොමැති බවයි. එහෙත් මෙහි දී ඉතාම වැදගත් කාරණය වන්නේ දවසේ දෙවතාවක් දළදා වහන්සේ උදෙස් භික්ෂූන් විසින් සිදුකරන වතාවත් හෙවත් තේවාව කිසිදු වෙනසකට භාජනය වී නොමැති බවයි. බුදුරජාණන් වහන්සේ ජීවමාන අවධියේ දී උන්වහන්සේගේ අග්‍රෝපස්ථායක ආනන්ද හාමුදුරුවන් වහන්සේ විසින් බුද්ධෝපස්ථානය සඳහා යම් විධික්‍රමයක් හා වතාවත් සමූහයක් භාවිත කලේ ද අදත් එම චාරිත්‍ර ඒ අයුරින්ම ඉටු කරනු ලබන්නේ අසීමිත බුද්ධ ගෞරවයෙනි. උභය මහාවිහාරීය මහා සංඝරත්නයත් ශ්‍රී දළදා වහන්සේත් අතර අවියෝජනීය සම්බන්ධතාවක් ගොඩනැගී තිබෙන මූලික කාරණය වන්නේ ජීවමාන බුදුරජාණන් වහන්සේ උදෙසා දෛනිකව ඉටුකරන මෙම වතාවත් හා පවත්වන පුදපූජා සමූහයයි.

## 1.1 ශ්‍රී දළදා මාළිගාවේ භාරකාරත්වය

ශ්‍රී දළදා මාළිගාවේ හා දන්ත ධාතුන් වහන්සේගේ භාරකාරත්වය වර්තමානයේ හිමිවී ඇත්තේ මල්වතු - අස්ගිරි උභය මහාවිහාරීය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාට හා දියවඩන නිළමේතුමාට ය. මහානායක මාහිමිපාණන් වහන්සේලා ශ්‍රාවක සංඝයා නියෝජනය කරන අතර දියවඩන නිළමේතුමා විසින් රජුගේ භාරකාරත්වය නියෝජනය කරනු ලැබේ. [8] මේ පිළිබඳව ඇති ඓතිහාසික තොරතුරු අනුව දන්ත ධාතුන් වහන්සේගේ භාරකාරත්වය සම්බන්ධයෙන් අතීතයේ පැවතියේ වර්තමානයට වඩා වෙනස් තත්වයකි. එනම් "එය රටේ පාලකයා භාරයේ පැවතිය යුතුය" යන අදහස දන්ත ධාතුන් වහන්සේ ලක්දිවට වැඩම වූ මුල් කාලයේ සිටම පිළිගෙන තිබූ අදහසකි. ඒ අනුව කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ පටන් සෑම ශ්‍රී ලංකේය රජෙකු විසින් ම දළදා වහන්සේගේ භාරකාරයා මෙන් ම ආරක්ෂකයා ද

වශයෙන් ක්‍රියාකර තිබේ. ඔවුහු දළදාව තමන් සන්තකයේ තබා ගැනීම රාජ්‍ය උරුමය ප්‍රකාශ කිරීමේ හා ජනතාවගේ අවනතභාවය දිනා ගැනීමේ සංකේතය වශයෙන් ද සලකනු ලැබූහ. මේ නිසා රජ මාළිගාව අසළ ම දළදා වහන්සේට වැඩසිටීම පිණිස මන්දිරයක් ඉදිකිරීම බොහෝ අවස්ථාවල චාරිත්‍රයක් ලෙස සලකා තිබිණි.[9] එහි සිදුකෙරෙන වත් පිළිවෙත්වල දී භික්ෂූන් වහන්සේලාට උදව් කිරීමට දියවඩන නිළමේවරයෙකු ද රජු විසින් එකල පත්කර සිටියේය.

ක්‍රි.ව. 1815 මාර්තු 02 වැනි දින ඉංග්‍රීසි ජාතිකයන් විසින් උඩරට රාජ්‍ය සභාවේ සේවය කළ නිළමේවරුන් සමඟ අත්සන් කළ ගිවිසුමකට අනුව ශ්‍රී ලංකාව යටත්කර ගන්නා තෙක් දළදා වහන්සේ වැඩමවූ දා සිට ක්‍රමානුකූලව සකස් කරගත් පිළිවෙත් සමූහයකට අනුව මෙරට රජුන් විසින් ඊට ගෞරව, පුදපූජා හා ආරක්ෂාව සැලසූහ. එහෙත් ඉංග්‍රීසින් රටේ පාලන බලය ලබාගැනීමේ උපක්‍රමයක් ලෙස දළදා වහන්සේ අයිතිකර ගැනීමට ප්‍රයත්න දැරුවා මිස සැබැවින් ම ඊට ගෞරව දැක්වීම හෝ පුදපූජා පැවැත්වීමේ වුවමනාවක් ඔවුන්ට නොතිබිණි. ඒ බව ඔවුන් විසින් සකස් කළ ලිපි ලේඛනවලින් ම තහවුරු වී ඇත.[10] මේ නිසා දළදා වහන්සේ රාජ්‍ය පාලකයාගේ වගකීමෙන් නිදහස්කර එය බෞද්ධ ප්‍රභූවරයකු වෙත පැවරීමට ඔවුහු තීරණය කළහ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එතෙක් දළදා වහන්සේ උදෙසා පැවැත්වෙන වත් පිළිවෙත් සඳහා උදව් කිරීමට රජුන් විසින් පත්කර සිටි දියවඩන නිළමේවරයාට හා එම වත් පිළිවෙත් ඉටුකළ උභය මහාවිහාරීය මහානායක මාහිමිපාණන් වහන්සේලාට එහි භාරකාරත්වය ක්‍රි.ව. 1847 ඔක්තෝබර් මස 02 වැනි දින පවරාදුන් බව ද කියැවේ.[11] කෙසේ වෙතත් කවර තත්වයක් යටතේ වුවද බුදුදහමත් බෞද්ධ පූජනීය වස්තූනුත් ආරක්ෂාකර ගැනීම බෞද්ධයන් විසින් ම කළයුතු කාර්යයක් බැවින් උභය මහාවිහාරීය මහානායක මාහිමිපාණන් වහන්සේලාත් දියවඩන නිළමේතුමාත් එම වගකීම තමන් වෙත පවරා ගැනීම අන්‍ය ලබ්ධික විදේශීය පාලකයන්ගේ කූට උපක්‍රම ඉදිරියේ සිදුවිය යුතු දෙයක් ඒ අයුරින්ම සිදුවූවා යැයි සිතිය හැකිය. ඒ අනුව මහානායක මාහිමිපාණන් වහන්සේලා හා දියවඩන නිළමේතුමා ශාසනික

වගකීමක් වශයෙන් සලකා දළදා වහන්සේට කළයුතු වත් පිළිවෙත් හා ආරක්ෂාව සලසනවා පමණක් නොව ශ්‍රී ලංකාවේ ජාතිකාභිමානය සංකේතවත් කරන අසහාය වස්තුවක් ලෙස ද සලකමින් ඒ සමඟ බැඳුණු සංස්කෘතික උරුමය රැකගැනීමට ද ක්‍රියා කරමින් සිටින බව සඳහන් කල යුතුය.

දළදා වහන්සේගේ භාරකාරත්වය අනුව එය ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාවක දී හෝ වෙනත් සුවිශේෂ කාර්යයක දී ඒ පිළිබඳ තීරණ ගැනීමට හා අවශ්‍ය විධිවිධාන සැලසීමට උභය මහාවිහාරීය මහානායක මාහිමිපාණන් වහන්සේලාගේත් දියවඩන නිළමේතුමාගේත් පූර්ණ සහයෝගය හා එකඟතාව අවශ්‍ය වේ. ඉහත සඳහන් තිදෙනාට ම දළදා වහන්සේගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වෙන වෙන ම යතුරු බාරව තිබේ. ඒ නිසා දළදා වහන්සේ වැඩ සිටින කරඬුව එක් අයෙකුගේ කැමැත්තට පමණක් විවෘත කළ නොහැකිය. එම දළදා කරඬුව දැනට වීදුරු කුඩුවකින් ආවරණය වන පරිදි වටකර තිබේ. එය මෑත කාලයේ (ක්‍රි.ව. 1973.05.05) ජපානයේ එහේජ් විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලාගෙන් පරිත්‍යාග වශයෙන් ලැබුණකි. එම වීදුරු කුඩුවේ හා ප්‍රධාන කරඬුවේ යතුරු දියවඩන නිළමේතුමාගේ බාරයේ පවති. ප්‍රධාන කරඬුව සියලු ම කරඬු ආවරණය කරගත් උඩින් ම ඇති කරඬුවයි. එය මහකරඬුව නමින් ද හැඳින්වේ. දියවඩන නිළමේතුමාගේ භාරයේ එහි යතුරු තිබුණත් වීදුරු කුඩුවේ දොරටුව හා කරඬුව විවෘත කළයුතු අවස්ථාවක දී එම කාර්ය එතුමා සිදු නොකරයි. තේවාව භාරව සිටින පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේ අතට තමා භාරයේ තිබෙන යතුරු ලබාදී උන්වහන්සේට අභිමත භික්ෂුවක් මගින් ඒවා විවෘත කරවා ගැනීමට එතුමා ඉඩ සලසා දීම චාරිත්‍රයයි. දියවඩන නිළමේතුමා අනුගමය කරන මේ සිරිත දළදා වහන්සේ උදෙසා වතාවත් කිරීමට භික්ෂූන් වහන්සේට තිබෙන පරම අයිතියට ගරු කිරීමක් වශයෙන් මෙන් ම බුද්ධ ගෞරවය සලකා පිළිපදින චාරිත්‍රයක් ලෙස ද සැලකිය හැකිය. තේවාභාර මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් බොහෝ විට මේ කටයුතුවලට යොදාගන්නේ ඒ වන විට තේවාවෙහි නිරත වී සිටින භික්ෂූන් වහන්සේලාය. මහකරඬුව විවෘත කළ විට තිබෙන කරඬුව විවෘත කිරීම එහි යතුර භාරව සිටින මල්වතු

මහාවිහාරීය මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් සිදුකෙරේ. [12] අනතුරුව දක්නට ලැබෙන කරඬුව ඇහැලේපොල නිළමේතුමාගේ කරඬුව නමින් හැදින්වේ. එහි යතුර අස්ගිරි මහාවිහාරීය මහානායක මාහිමිපාණන් වහන්සේ භාරයේ පවතී. එය විවෘත කිරීම උන්වහන්සේ අතින් සිදුවේ. එවිට දකින්නට ලැබෙන කරඬුව හා ඊට යටින් ඇති කරඬුව විවෘත කිරීම යතුරු භාවිතයකින් තොරව සිදුකෙරේ. මේ කරඬු දෙක ම පසෙකින් තැබූ විට ඇති කරඬුවෙහි දළදා වහන්සේ වැඩ සිටිති. ප්‍රදර්ශන අවස්ථාවක දී දළදා වහන්සේ එළියට වැඩම කරවන විට අස්ගිරි මහාවිහාරීය මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් එය පට ලේන්සුවකින් දවටා රැගෙන ප්‍රදර්ශන කරඬුවෙහි තැන්පත් කරනු ලැබේ. අනතුරුව මල්වතු මහාවිහාරීය මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් එය නියමිත ස්ථානයට වැඩමවා තැන්පත් කරනු ලැබේ. මේ කටයුතු සිදුකරන අතරතුර දී කවිකාර මඩුව ස්තුති ගායනා කිරීමත් හක් පිඹීම , හේවිසි හා හොරණෑ නාද කිරීමෙන් ශබ්ද පූජා පැවැත්වීමත් සිරිතයි.

## 1.2 තේවාව සිදුකරන ස්ථාන

ශ්‍රී දළදා මාළිගාවේ ඉතාමත් වැදගත් ස්ථානය වන්නේ ශ්‍රීමත් දන්තධාතූන් වහන්සේ වැඩ සිටින ගන්ධකුටියයි. මෙය වර්තමානයේ රන් වියනකින් සමන්විත මහල් දෙකකින් යුක්ත ප්‍රධාන මන්දිරයෙහි දිග්ගේ හා මහ අරමුදල නමින් හඳුන්වනු ලබන කුටි දෙකකින් යුක්ත බිම් මහලට ඉහළින් පිහිටා ඇති කොටසයි. එබැවින් එය ඉහළමාලේ යනුවෙන් ද ව්‍යවහාර කරනු ලැබේ. මේ මන්දිරය පළමු වැනි විමලධර්මසූරිය රජතුමා විසින් ඉදිකරවන ලදුව කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඇතුලු පසුකාලීන පාලකයන් විසින් හා මෑත භාගයේ දී කරන ලද ප්‍රතිසංස්කරණ වලින් සමන්විතය. ඉහළමාලේ ප්‍රධාන කුටි දෙකකින් යුක්තය. එකක් පිරිත් මණ්ඩපය නමින් හැදින්වෙන දළදා වහන්සේ ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර තබන ස්ථානයෙන් ඇතුල්වන විටම ඇති 'ඇත්දත්කුනම' නමින් හැදින්වෙන පූජාව සඳහා සහභාගිවන පිරිසට රැඳී සිටිය හැකි කුටිය යි. ඇතැම්හු මෙය ගෙපලු බරාඳ සහ "හඳුන්කුනම" (Sandalwood Room) යැයි නම් කරති.[13] අනෙක දළදා වහන්සේ වඩා හිඳුවා

තිබෙන කරඬුව තැන්පත් කර ඇති ගන්ධකුටිය යි. එය ඇතුල් මාළිගාව හෙවත් වැඩ සිටින මාළිගාව නමින් ද හැඳින්වෙන බව ඉහත ද සඳහන් විය. " දළදා වහන්සේ උදෙසා සියලු වත්පිළිවෙත් එම කුටිය තුළ පැවැත්වෙන අතර උන්වහන්සේට කෙරෙන සෑම පුදපූජාවක්ම තැන්පත් කරනු ලබන්නේ ද එම ගන්ධකුටියෙහි තිබෙන රන් කැටයමින් තනා ඇති පූජාසනය මතයි. තේවාභාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත් උන්වහන්සේගේ සහායට පත්වී සිටින අනෙක් භික්ෂූන් දෙනමත් එහි කටයුතු කරති. වට්ටෝරුරාළ හා ගෙපරාළ උන්වහන්සේලාට මේ සඳහා සහාය වෙති. තවද ඔවුන්ගේ සහායට කත්තියරාළ ඇතුළු පිරිසක් ද වෙති. ඔවුහු තේවා කට්ටලය නමින් හැඳින්වේ. මේ කටයුතු ඉහළමාලේ තේවාව නමින් හැඳින්වේ. ඇත්දත්කූනම හා ගන්ධකුටිය අතර ඇති කොටස ගෙලලු බරාද නමින් හැඳින්වේ. ගෙපරාළගේ රාජකාරි එහි සිට සිදුකෙරේ.

දෛනික තේවාව සිදුකරනු ලබන අනෙක් ස්ථානය පල්ලේමාලේ නමින් හැඳින්වෙන විහාර මන්දිරය යි. හේවිසි මණ්ඩපයට පිටුපසින් තිබෙන තරමක් උස් බිමක වැඩ සිටින මාළිගාවට අභිමුඛ වන පරිදි මේ විහාර මන්දිරය ඉදිකර ඇත. කිසියම් භික්ෂූන් වහන්සේ නමක් දළදා වහන්සේට තේවාව කිරීමට සුදුසුකම් ලබන්නේ මෙම විහාර මන්දිරයෙහි තේවාව සිදුකර ඇත්නම් පමණි. එහි තේවාව සඳහා භික්ෂූන් වහන්සේ නමක් පත් කෙරෙන අතර පල්ලේමාලේරාළ විසින් එම කටයුතු සඳහා උන්වහන්සේට සහාය දෙනු ලැබේ. දළදා මන්දිරයට අයත් ඉපැරණි පුස්කොළ පොත් ඇතුලු ධර්මග්‍රන්ථ සහිත පොත්ගුල හෙවත් පුස්තකාලය දැනට පත්තිරිප්පුවෙහි ඉදිකර විවෘතව ඇත. එබැවින් වන්දනාමාන කිරිමට පැමිණෙන සැදැහැවතුන්ට එය දැක බලාගැනිමට පහසුකම් සැලසීම සඳහා තවත් භික්ෂූන් වහන්සේ නමක් ඊට පත්කර ඇත. එහි වන්දනාමාන කටයුතු හැර තේවා කටයුතු කිසිවක් සිදුනොවේ. දළදා මාළිගාව සතු ඉතාමත් දුර්ලභ හා වටිනා ග්‍රන්ථ ඇතුළත් මෙම පොත්ගුලෙහි භාරකාරත්වය කලකට පෙර කමිටුවකට පවරා තිබිණි. එකල එය ස්වාධීනව පාලනය විය.

තේවාභාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුලු භික්ෂූන් වහන්සේ

ලැගුම් කුටිවල සිට තේවාව සිදුකෙරෙන ස්ථාන වෙතට වැඩමවීම වට්ටෝරුරාළගේ මූලිකත්වයෙන් සිදුවේ. පෙර දින තේවාව අවසන් කර තේවා කටයුතු වල යෙදෙන සැමදෙනාම තේවාභාර නායක ස්වාමින්ද්‍රයන් වහන්සේගේ ලැගුම් ගෙට පැමිණ එහි සේප්පුව තුළ සුරක්ෂිතව තැන්පත් කර තිබෙන යතුරු කට්ටලය උරහිස මත තබාගෙන මේ පිරිසේ ඉදියෙන් ම ගමන් කරන්නේ වට්ටෝරුරාළයි. අනතුරුව තේවාභාර නායක ස්වාමීන්ද්‍රයන් ඇතුළු භික්ෂූන් වහන්සේලා ද ඒ පසුපසින් ගිහි රාජකාරි නිලයන් ද පිළිවෙලින් ගමන් කිරීම චාරිත්‍රය යි. මෙය යතුර පයිණ්ඩ කිරීම නමින් හැඳින්වේ. මෙසේ යතුරු වැඩමවන අවස්ථාවේ දී මහානායක මාහිමිපාණන් වහන්සේ එහි වැඩ සිටින අවස්ථාවක නම් උන්වහන්සේ පවා අසුනෙන් නැගිට ගෞරව කිරීම චාරිත්‍රයයි. අලුයම තේවාව සඳහා යතුරු පයිණ්ඩ කරන අවස්ථාවේ දී පන්දම්කරුවෙකු විසින් වට්ටෝරුරාළට ඉදිරියෙන් ගමන් කරමින් ගමනට ආලෝකය සැපයීම චාරිත්‍රය යි. යතුරු පෙරටු කරගත් මේ පිරිස හේවිසි මණ්ඩපය අසල දී පා දෝවනය කරගෙන දිග්ගේ නමින් හඳුන්වන කුටියේ ප්‍රධාන දොරටුව අභියසට රැස්වේ. එහි දී වට්ටෝරුරාළ විසින් තේවාභාර නායක ස්වාමින්ද්‍රයන් වහන්සේගේ අනුමැතිය පරිදි පල්ලේමාලේ යතුර පල්ලේමාලේරාළට භාරදෙයි. එවිට දෙපිරිසක් වී තේවාව සඳහා තමන්ට නියමිත ස්ථාන වෙත ගමන් කරති. මෙසේ යතුරු රැගෙන පැමිණෙන අවස්ථාවක දී කෙනෙකු ඉදිරියට මුණ නොගැසෙන පරිදි පිළිපැදීම ද චාරිත්‍රයකි. එසේ පිළිපැදිම සඳහා දළදා වහන්සේට කෙරෙන ගෞරවයක් ලෙස සැලකේ.

## 1.3 තේවාව බාරගැනීම

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ඉල්ලීමට අනුව උභය මහාවිහාරීය මහානායක මාහිමිපාණන් වහන්සේලා දළදා තේවාව පැවැත්වීමෙහි නිරතවූහ. අනතුරුව ඉහතින් සඳහන් කළ පරිදි ඉංග්‍රීසි ආණ්ඩුව විසින් දළදා වහන්සේගේ ආරක්ෂාව ඇතුලු සියලු විධිවිධාන සැලසීම උන්වහන්සේලාට පැවරූහ. ඒ අනුව එක් විහාර පාර්ශවයකට අයත්ව තිබූ තේවා මුරයේ වගකීම අවසන් වී අනෙක් විහාර පාර්ශ්වයට එම වගකීම පැවරෙන්නේ ඇසළ පුර

පසළොස්වක පෝය දිනට පසුව එළඹෙන භික්ෂූන් වහන්සේලා පෙහෙවස් සමාදන්වන අවපැලවිය දිනයි. මෙදින තේවාව භාරගැනීම සඳහා ඊට නියමිත පාර්ශ්වයේ මහානායක හිමිපාණන් වහන්සේට අසවල් වේලාවට පැමිණෙන ලෙස එතෙක් තේවාව භාරව සිටි පාර්ශ්වයේ මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් පූර්ව දැනුම්දීමක් ලිඛිතව කිරීම චාරිත්‍රය යි.මෙම කටයුතු සඳහා දෙපාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේලා නියමිත දින දහවල් දානයෙන් පසු දිවා විහරණ කාලය යොදා ගනිති. ඊට දියවඩන නිළමේතුමා ද අනිවාර්යයෙන්ම සම්බන්ධ වේ. ඒ අනුව දියවඩන නිළමේතුමාගේ ලේකම්වරයා විසින් තේවාව සඳහා යොදා ගැනෙන සියලු ම බඩු බාහිරාදිය තේවා මාරුවීමේ ලේඛනයේ ඇතුළත් කරනු ලැබේ. ඉක්බිති මහානායක මාහිමිපාණන් වහන්සේලා දෙනමක් දියවඩන නිළමේතුමාත් ප්‍රථමයෙන් ඉහළ මාලයේ ගන්ධ කුටියට පැමිණෙති. ගන්ධකුටියේ පූජාසනය මත සුදු අතිරිල්ලක වට්ටෝරුරාළ විසින් තැන්පත් කර තිබෙන භාණ්ඩ ලැයිස්තුව හඬනගා කියවා එකින් එක පරීක්ෂා කර බැලීම චාරිත්‍රය යි.

දියවඩන නිළමේතුමාගේ ලේකම්වරයා විසින් සකස්කර කියවනු ලබන මේ ලැයිස්තුවට අනුව එම භාණ්ඩ එකිනෙක ඔසවා දක්වීම හා පරීක්ෂාකර නැවත තැන්පත් කිරීම වට්ටෝරුරාළ විසින් සිදුකරනු ලැබේ. ඉකුත්ව ගිය තේවා සමය තුළ අළුතින් යම් භාණ්ඩයක් තේවාව සඳහා ලැබී තිබිණි නම් ඒවා ද ලේඛනයට ඇතුල් කරනු ලැබේ. එමෙන් ම කිසියම් භාණ්ඩයක් තවදුරටත් පාවිච්චියට ගැනීමට නොහැකි තත්වයේ පවතී නම් එකඟතාව අනුව එය ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ. එහෙත් තේවාව සඳහා පෞරාණික වශයෙන් යොදා ගන්නා කිසිම භාණ්ඩයක් ඉවත් නොකිරීම ද ඒවා සුදුසු පරිදි යොදා ගැනීම ද විශේෂ කාරණයකි. එහි කටයුතු නිමවා පල්ලේමාලය වෙත පැමිණ එහි ඇති භාණ්ඩ ද පරික්ෂා කෙරේ. මෙසේ තේවාවේ දී භාරවෙන සෑම ස්ථානයක ම ඇති භාණ්ඩ අදාළ ලේඛනයට අනුව අනුපිළිවෙලින් පරික්ෂා කරනු ලැබේ. ඉනික්බිති මේ පිරිස තේවාව භාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට නේවාසිකව වැඩසිටීමට දළදා මාළිගාව තුළ ලබා දී ඇති කුටිය වෙත පැමිණේ. එහි දී තේවාවෙන් බැසයන මහනායක මාහිමිපාණන් වහන්සේ ලේඛනගත භාණ්ඩ සහිතව තේවාව

භාරදුන් බවට අත්සන් කරන අතර තේවාව භාරගත් මහානායක මාහිමිපාණන් වහන්සේ ඒ බවට අත්සන් කරනු ලැබේ.[15] අනතුරුව ගිලන්පස පිළිගන්වා උන්වහන්සේලාගේ අනුශාසනාවලින් පසුව තේවාව භාරගැනීමේ කටයුතු අවසන් කෙරේ. එදින සන්ධ්‍යා කාලයේ වස් ආරාධනා කිරිම දියවඩන නිළමේතුමා විසින් සිදුකෙරේ. අලුතින් තේවාව භාරගත් මහා සංඝරත්නයට ප්‍රථම දින වස්දානය පිරිනැමීම එතුමා විසින් ම කළයුතු අතර දෙවැනි දින දානය පිරිනැමීම කාර්යය කෝරාළ විසින් ද ඉටුකිරීම සම්මත චාරිත්‍රයයි.

මහාවිහාර දෙකෙහි මහානායක මාහිමිපාණන් වහන්සේලා දෙනම එකතැන වැඩ සිටින අවස්ථාවක දී හා එක්ව කටයුතු කිරීමේ දී වෘද්ධ පටිපාටිය අනුව පිළිපැදීම හා කාර්යය ඉටුකිරීම පිළිගත් චාරිත්‍රය යි. එහෙත් ඇතැම් අවස්ථාවක දී එළැඹි කටයුතු අනුව දෙදෙනා වහන්සේ කතිකා කරගෙන ඊට වඩාත් සුදුසු මහානායක මාහිමිපාණන් වහන්සේ ඉදිරිපත් වේ. මෙය උභය මහාවිහාරයන්හි අන්‍යෝන්‍ය සමඟියට හා සංඝ සමාජයේ පැවැත්මට බෙහෙවින් අනුබල දෙන යහපත් චාරිත්‍රයක් ලෙස ද සැලකීම වටී.

## 1.4 තේවාව හා පුදපූජා සිදුකරන වේලාවන්

දළදා වහන්සේ උදෙසා දිනකට අවස්ථා දෙකක දී තේවාව ඉටුකිරීමත් තෙවතාවක් පුදපූජා පැවැත්වීමත් සිදුවේ. තේවාව සිදුකරන්නේ අළුයම හා සන්ධ්‍යා කාලයේ දීය. දිනපතා අළුයම දොරටු විවෘත කිරිම පෙරවරු 5.30 ට සිදුවේ.

ඉක්බිතිව පෙ.ව. 5.45 සිට 6.00 අතර කාලයේ දී අළුයම තේවාවත් සන්ධ්‍යා කාලයේ දී දොරටු විවෘත කිරීම පස්වරු 6.30 ත් සන්ධ්‍යා තේවාව ප.ව. 6.45 සිට ප.ව. 7.00 දක්වාත් දෛනිකව ඉටුකෙරේ. තේවාව නිම කිරීමෙන් අනතුරුව සිදුවන්නේ දළදා වහන්සේට පුදපූජා පැවැත්වීමයි. එනම් බුද්ධ පූජාව දිනකට දෙවරක් හා ගිලන්පස පූජාවද දෙවරක් සිදුකෙරේ. ඒ

අනුව අලුයම තේවාවෙන් අනතුරුව උදෑසන බුද්ධ පූජාව පෙ.ව. 6.00 සිට 6.30 දක්වා දහවල් බුද්ධ පූජාව පෙ.ව. 10.15 සිට 10.45 අතරත් පැවැත්වේ. දහවල් බුද්ධ පූජාව සඳහා දිනපතා දොරටු විවෘත කිරීම පෙ.ව. 9.30 ට සිදුවේ. චාරිත්‍රානුකූලව උදේ හා දහවල් සිදුකෙරෙන බුද්ධ පූජාව මුළුතැන් පූජාව නමින් හැඳින්වේ. සවස පැවැත්වෙන ගිලන්පස පූජාව චාරිත්‍රානුකූලව ගිලන්පස පූජාවන් දෙකකින් යුක්ත වේ. ඒ අනුව පොදු ගිලන්පස පූජාව ප.ව. 7.00 ට පැවැත්වෙන අතර කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ නියමය පරිදි එතුමා වෙනුවෙන් දළදා වහන්සේ උදෙසා පැවැත්වෙන ගිලන්පස පූජාව පෙ.ව. 7.30 ට සිදුකෙරේ.

## 1.5 උභය මහාවිහාරයට පැවරී තිබෙන තේවාව

දළදා වහන්සේ උදෙසා කළයුතු වතාවත් ඉටුකිරීම සඳහා රජුට වඩාත් සම්බන්ධකම් ඇති භික්ෂූන් වහන්සේලා ඒ ඒ කාලවල දී පත්කර ගත් බව සිතනවාට වඩා ශාසනභාරධාරිත්වය ඉසිලීමට තරම් සුදුසුකම් තිබූ ඊට කැපවූ ගුරු - ශිෂ්‍ය පරම්පරා සම්බන්ධය ඇති කිසියම් සංඝ පරම්පරාවක් විසින් මෙම තේවා කටයුතු මෙහෙයවන්නට ඇතැයි කල්පනා කිරීම වටී. උන්වහන්සේලා සතුරු විපත් එළැඹි අවස්ථාවල දී රජුගේ ද අනුදැනුම හා ආරක්ෂාව ඇතිව දළදා වහන්සේ සුරක්ෂිත ස්ථානවල හිඳුවා සියලු පුදපූජා පවත්වන්නට ඇතැයි ද කල්පනා කළ හැකිය. කෝට්ටේ නගරයේ වඩා හිඳුවා සිටි දළදා වහන්සේට පෘතුගීසින්ගෙන් විපත් පැමිණෙන බව දැනගත් වහාම එය ආරක්ෂක ස්ථානයකට වැඩම කරවන ලදී. අනතුරුව සෙංකඩගල පුරවරයට දළදා වහන්සේ වැඩමවා රජුගේ අභිෂේක උත්සවය පැවැත්වීමෙන් පසු එය රටේ අගනුවර බවට පත්විය. ඒ වනවිටත් ආරකෂා කරමින් පවත්වාගෙන පැමිණි පෞරාණික චාරිත්‍ර විධි මෙතෙක් නොකඩවා සිදුකිරීමට එම සංඝ පරම්පරාවල භික්ෂූන් වහන්සේලාට හැකියාව ලැබී තිබෙන බව මේ කටයුතු සිදුවන ආකාරය සලකා බැලීමෙන් වටහා ගත හැකිය.

දළදා වහන්සේ වෙනුවෙන් ඉටුකරන තේවාව නමින් හැඳින්වෙන මේ වතාවත් සඳහා ඇතැම් හින්දු චාරිත්‍රවල බලපෑම මහනුවර යුගයේ දී හෝ ඊට

කලකට පෙර සිට ලැබී තිබෙන බව සත්‍යයකි. කෙසේ වෙතත් මේ වතාවත් ඉටුකිරීම භික්ෂූන්ගෙන් සිදුවිය යුතුය. රාජකාරී කට්ටලය නමින් හැඳින්වෙන ඒ ඒ කාර්යන් පැවරී ඇති ගිහි නිලයන් විසින් උන් වහන්සේලාට ඒ සඳහා සහාය වනු ලැබේ. දළදා වහන්සේ උදෙසා පැවැත්වෙන තේවාවන් හා පුදපූජා පහත සඳහන් පරිදි වර්ග කළ හැකිය. එනම්,

1. දෛනිකව සිදුකරන තේවාව හා පුදපූජා,
2. සතියකට වරක් (සතියක් වශයෙන්) පැවැත්වෙන තේවාව හා පුදපූජා
3. වාර්ෂිකව කෙරෙන පුදපූජා හා උත්සව වශයෙනි.

ශ්‍රී දළදා මන්දිරයෙහි දළදා වහන්සේ උදෙසා පවත්වනු ලබන සියලු වතාවත් හා පුදපූජා ජීවමාන බුදුරජාණන් වහන්සේට කරනු ලබන බුද්ධෝපස්ථානයක් ලෙස සලකා ක්‍රියාකාරීම අතීතයේ සිට පිළිගත් සම්ප්‍රදායයි. ඒ සඳහා ම සුවිශේෂ වූ වැඩපිළිවෙලක්, පටබැඳුණු ගාථා සමුච්චයක්, වෙන්කළ පිරිකර - භාණ්ඩ හා කැපවූ ගිහිපැවිදි පිරිසක් ද ඇත. දළදා වහන්සේට බුද්ධෝපස්ථාන වශයෙන් වතාවත් සිදුකිරීම "තේවාව" නමින් හැඳින්වෙන බව පෙනේ. උන්වහන්සේ උදෙසා සුදුසු පරිදි යම් යම් දේ කැපකිරීම හෙවත් පුදපූජා පැවැත්වීමයි. මේ කටයුතුවල සම්පූර්ණ වගකීම හා මූලිකත්වය පැවරී තිබෙන්නේ මල්වතු අස්ගිරි උභය මහාවිහාරීය මහානායක මාහිමිපාණන් වහන්සේලා වෙතය. උන්වහන්සේලා එම වගකීම ඉමහත් බුද්ධ ගෞරවයකින් හා ශ්‍රද්ධාවකින් ඉටුකරන බව ඒ වෙනුවෙන් අනුගමනය කරන චාරිත්‍ර විධි අනුව කල්පනා කළ හැකිය. තමන් භාරයේ තිබෙන දළදා වහන්සේගේ ආරක්ෂක යතුරුවලට පවා ගෞරවය ලැබෙන අයුරින් ඒවා තමන් වැඩ සිටින කුටියේ ඉහානේ උස් ස්ථායක සුරක්ෂිතව තැන්පත් කරනු ලැබේ. එම යතුරු පරිහරණය කිරීම තමන් වහන්සේ ම මිස වෙනත් අයෙකුට පවරනු නොලැබේ. එමෙන් ම එහි පිරිසිදු බව සලකා උන්වහන්සේලා මළගෙවල්වලට හා පාංශුකූලවලට සහභාගි නොවන බව ද අසන්නට ලැබේ. එපමණක් කොට උන්වහන්සේලා අපවත් වූ විටක එම පාර්ශවයේ අනුනායක මාහිමිපාණන් වහන්සේ විසින් දළදා වහන්සේගේ ආරක්ෂක යතුරු එම කුටියෙන් වහාම ඉවත් කර ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

මෙම තේවාව හා පුදපූජා පැවැත්වීමේ වගකීම මහානායක මාහිමිපාණන් වහන්සේලාට පැවරී තිබුණත් තම පාර්ශවීය සෙසු භික්ෂූන් වහන්සේලාට ද ඊට සහභාගී වී පින් රැස්කර ගැනීමට හැකිවන පරිදි සුදුසුකම් තිබෙන පිරිසක් තෝරාගනු ලැබේ.

මේ සඳහා සංඝ සභාවේ සාමාජික හා මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේලාට ප්‍රමුඛතාව ලබාදීම චාරිත්‍රය යි. ඒ පිළිබඳව උභය මහා විහාරයේ සංඝයා විසින් සම්මත කරගනු ලැබ තිබෙන පරමධම්ම කතිකාවතට හා සම්ප්‍රදායට අනුව මහානායක මාහිමිපාණන් වහන්සේලා විසින් තේවා සඳහා භික්ෂූන් තෝරා ගැනීමේ තීරණය ගනු ලැබේ. මේ අනුව එම විහාරීය භික්ෂූන් වහන්සේලා අතුරෙන් කලානුරූපීව තෝරාපත් පිරිස උන්වහන්සේලාගේ අනුශාසනා පරිදි නිරන්තරයෙන් ම එම තේවා හා පුදපූජා පැවැත්වීමේ කටයුතුවලට නියැලී සිටිති.

තේවාව භාරව කටයුතු කරන භික්ෂූන් වහන්සේලාගේ සංඛ්‍යාව කාලයෙන් කාලයට වෙනස් වී ඇත. අතීතයේ දී ඒ සඳහා එක් භික්ෂුවක් යෙදුණු බවට සාධක තිබේ. තවත් අවස්ථාවක දී භික්ෂූන් වහන්සේලා තෙනමක් ඒ සඳහා යෙදී සිටි අතර වර්තමානයේ පස්නමක් නිරන්තරයෙන් එහි නියැලෙති. ඊට හේතුව වශයෙන් සැලකිය හැක්කේ දළදා මන්දිරය පොදු ජනතාව වෙනුවෙන් වඩාත් විවෘතවීම හා වැඩි පිරිසක් පැමිණීම නිසා කාර්ය බහුලවීමයි. මෙයින් දශක දෙකකට පමණ පෙර මුළුතැන් පූජාව නමින් සිදුකරන උදෑසන හා දහවල් බුද්ධ පූජාව පවා බොහෝ විට දළදා මාළිගාවේ අරමුදලින් ම සම්පාදනය විය. එහෙත් අද ඒ සඳහා බෞද්ධ මහජනතාව දායකත්වය ලබාගෙන සහභාගී වීමේ භාග්‍යය උදාකරගෙන ඇත. එමෙන් ම මීට කලකට පෙර තේවාව වැඩම වූ භික්ෂූන් වහන්සේලා සිය ප්‍රත්‍ය පහසුව තමා විසින් ම සම්පාදනය කරගත යුතුව තිබිණි. එහෙත් දැන් මුළුතැන් පූජාව සඳහා පැමිණෙන පිරිස භික්ෂූන් වහන්සේලාගේ ප්‍රත්‍ය පහසුවද සලසති. මේ නිසා අද දළදා වහන්සේ උදෙසා දෛනිකව පුදපූජා පැවැත්වීමට විශාල පිරිසකට ඉඩ ප්‍රස්ථාව ද ලැබී තිබේ.

ඒ අතර කාලීන වශයෙන් මතුවන ආරක්ෂාව පිළිබඳ ගැටලු ද මහජනතාව සහභාගි කරගැනීම කෙරෙහි මේ ආකාරයකය බලපෑමක් ඇතිකර තිබෙන බව ද සඳහන් කළ යුතුය. නිදර්ශනයක් වශයෙන් කලකට පෙර දෛනික වතාවත් හා පුජපූජාවලින් අනතුරුව දළදා කරඬුව ප්‍රදර්ශනය කරන අවස්ථාවේ දී ඇතුල් මාළිගාවේ දොරටුව අභියසට ම ගොස් කරඬුව වන්දනා කිරීමට මහජනයාට හැකියාව ලැබී තිබිණි. එහෙත් දැන් ආරක්ෂ හේතු නිසා ඒ අවස්ථාව ලැබී තිබෙන්නේ දෛනිකව මුළුතැන් පූජාව හා ගිලන්පස පූජාව සඳහා දායකත්වය ලබන සීමිත පිරිසකට පමණි. සෙසු සියලු දෙනාට ඉහළ මාලයේ ඇත්දක්තුනමෙහි ඉදිරි දොරටුව අසල සිට දළදා කරඬුව දර්ශනය කර වන්දනා කිරීමට හා පුදපූජා පැවැත්වීමට පහසුකම් සලසා තිබේ. එම දොරටුව අභියසට පැමිණෙන ඕනෑම අයෙකුට තමා අතරැඳි පූජා ද්‍රව්‍ය එහි වැඩ සිටින තේවාභාර භික්ෂූන් වහන්සේගේ උදව් ඇතිව දළදා වහන්සේට පූජා කළ හැකිය.

තේවාව සඳහා තෝරාගත් භික්ෂූන් වහන්සේලා පස්නම අතුරෙන් ඒ කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති වයෝවෘද්ධ භික්ෂු ප්‍රධානියා ලෙස නම් කෙරේ. උන්වහන්සේ තේවා භාර නායක හාමුදුරුවන් වහන්සේ නමින් හැඳින්වේ. තේවාභාර වසර පුරා ම උන්වහන්සේ එම වගකීම දැරීම චාරිත්‍රය යි. දළදා මන්දිරය තුළ දෛනිකව තේවාව සඳහා විවෘත කරනු ලබන සියලු ම දොරටුවල යතුරු භාරව ඇත්තේ උන්වහන්සේට ය. දළදා වහන්සේ උදෙසා පැවැත්වෙන සියලු වතාවත් හා පුදපූජා ඒ සඳහා කැපවී සිටින සියලු දෙනාගේ සහයෝගය ලබාගෙන නියමිත පරිදි ඉටුකිරීම උන්වහන්සේගේ වගකීමයි. එමෙන් ම මුළුතැන් පූජාව සඳහා පැමිණෙන පිරිස්වලට හා සෙසු මහජනතාවට දළදා වහන්සේ වන්දනා කරගැනීමට සුදුසු පරිදි ඉඩ සලසා දීම ද උන්වහන්සේ විසින් කළයුතුව ඇත. තේවාවෙහි නිරත භික්ෂූන් වහන්සේලාට මුලුතැන් පූජාව සඳහා පැමිණෙන පිරිස විසින් පිරිනමන දානමය කටයුතු සඳහා ඔවුන්ගේ අභිමතය පරිදි ප්‍රමාණවත් භික්ෂූන් වැඩමවා එය ඉටුකරවා දීම ද තේවාභාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට පැවරී තිබෙන තවත් කාර්යයකි. උන්වහන්සේගේ සහායට පත්වන භික්ෂුව දෙවැනියා ලෙස සැලකේ. වර්තමානයේ තේවාභාර නාහිමියන්ගේ සහායට

දෙනමක් පත්කර ඇති බව පෙනේ. මේ කටයුතු මැනවින් ඉටුනොවන්නේ නම් දියවඩන නිළමේතුමාට ඒ පිළිබඳව අදාළ පාර්ශවයේ මහානායක මාහිමිපාණන් වහන්සේට වාර්තාකර වෙනසක් සිදුකරවා ගැනීමට ද හැකියාව තිබේ. එය මේ කටයුතු වඩාත් හොඳින් ඉටුකිරීමට කෙනෙකු ධෛර්යවත් කරන කාරණයක් ලෙස ද සැලකිය හැකිය.

තේවාව සඳහා වෙන් වූ භික්ෂූන් වහන්සේලාට එම තේවා කාලසීමාව තුළ පොදු හා පෞද්ගලික කටයුතුවලින් වෙන්ව විශේෂ කැපවීමක් කරන්නට සිදුවී තිබේ. උන්වහන්සේලා අවම තරමින් මළගෙදරකට සහභාගීවීම පවා ප්‍රතික්ෂේප කළයුත්තාහ. නොවැළැක්විය හැකි හේතුවක් නිසා හෝ උන්වහන්සේ එවැන්නකට සහභාගි වන්නේ නම් දින හතක කාලසීමාව තුළ තේවාවට සහභාගි නොවිය යුතුය.[16] භික්ෂූන් වහන්සේ සමඟ කටයුතුවලට සම්බන්ධවන රාජකාරි නිලයන් පවා පිළිපැදිය යුතු චාරිත්‍ර සමූහයක් ඇත. ඒවා ඉක්මවා ක්‍රියා කිරීමෙන් තමන්ට විපත් සිදුවන බවට ද මතයක් ගොඩනැගී තිබීමෙන් මේ කටයුතු කෙතරම් සැලකිල්ලකින් කළයුතු ද යන්න පැහැදිලි වේ.

දළදා වහන්සේ උදෙසා ඉටුකරන මෙම සියලු වතාවත් හා පුදපූජා පැවැත්වීමේ දී මහාවිහාර දෙකෙන් ම තේවාභාරව පත්වන මහාසංඝරත්නය පිළිපදින හා ඉටුකරන කටයුතුවල පිළිවෙල එක සමාන වේ. තේවාව පැවරී තිබෙන භික්ෂූන් වහන්සේලා ශුද්ධ පවිත්‍ර වී ඒ සඳහා ම වෙන්කරගත් තුන් සිවුරෙන් සැරසී බඳපටිය බැඳ තේවාව සහ පුදපූජා කාර්ය ඉටුකිරීමට දෛනිකව නියමිත වේලාව නොඉක්මවා ඒ ඒ ස්ථානවලට වැඩමවීම සම්මත චාරිත්‍රය යි. සාමාන්‍යයෙන් දෛනිකව තේවාව සිදුකරන සතියේ අනෙක් දිනවලට වඩා නානාමුර මංගල්‍යය පැවැත්වෙන සෑම බදාදා දිනක ම මේ චාරිත්‍රයෙහි සුවිශේෂ බවක් ඇත. එනම් අලුයම අනිවාර්යයෙන් ම ස්නානය කිරීමෙන් පිරිසිදු වීමත් එදිනට පමණක් භාවිත කිරීමට වෙන්කරගත් සිවුරු කට්ටලයකින් සැරසී බඳපටි බැඳ තේවාවට වැඩමවීමත් කළ යුතුය.

මේ අතර තේවාභාර මෙම විහාර පාර්ශව දෙකේ භික්ෂූන් වහන්සේලා

තේවාව සඳහා වැඩමවීමට ප්‍රථම තුන් සිවුරින් සැරසීම සඳහා සඟල සිවුර පෙරවීමේ දී පමණක් කිසියම් වෙනසක් අනුගමනය කරන බව අසන්නට ලැබේ. එනම් අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ භික්ෂූන් වහන්සේලා කම්මවාචා ප්‍රකාශ කරන අවස්ථාවක දී සඟල සිවුර පොරවන ආකාරයෙන් ම එහි දෙකොන පෙනෙන ලෙස සකස්කර තේවාව සඳහා ද සඟල සිවුර පළඳිනු ලැබේ. එහෙත් මල්වතු මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා තේවාව සඳහා සඟල සිවුර පොරවන විට එහි ඉදිරිපස කොන උත්තරාසඞ්ගයෙන් වසා පැළඳීම දක්නට ඇති වෙනසයි.[17]

## 1.5.1 දෛනිකව සිදුකරන තේවාව හා පුදපූජා

දිනපතා දළදා වහන්සේ වෙනුවෙන් පැවැත්වෙන තේවාව හා පුදපූජා දෛනික තේවා හා පුදපූජා යනුවෙන් නම්කළ හැකිය. දෛනිකව අලුයම හා සන්ධ්‍යාවේ සිදුකෙරෙන තේවාවේ දී අනුගමනය කෙරෙන සියලු ම වතාවත් එක සමානය. එමෙන් ම ඉහළමාලේ දළදා වහන්සේ උදෙසා සිදුකරන වතාවත් පල්ලේමාලේ විහාර මන්දිරයෙහි ද ඒ අයුරින් ම එක ම වේලාවක දී සිදුකෙරේ. මේ නිසා එය දළදා වහන්සේ උදෙසා තේවාව කිරීමට අපේක්ෂා කරන භික්ෂුවක් විසින් ඒ සඳහා පුහුණුව ලබාගන්නා අවස්ථාවක් වශයෙන් ද සැලකේ.

මෙහි තේවාව යන්නෙන් "සෝළස පූජාව" නමින් හැඳින්වෙන වතාවක් ඉටුකිරීම අදහස් කෙරේ. තේවාව සඳහා ඇතුල් මාළිගයේ රිදී දොරටුව විවෘතකර පිවිසි විගස ඝණ්ටාව තෙවරක් නාද කිරීමෙන් තේවාව ආරම්භ කරන බවට සංඥා කෙරේ. එවිට හේවිසිකරුවෝ ශබ්ද පූජාව පැවැත්වීම ආරම්භ කරති. ඒ අතර තේවාභාර නාහිමියන් විසින් හෝ තේවා සහාය භික්ෂුව විසින් පළමුවෙන් ම වැඩසිටින මාළිගයෙහි පහන් දල්වනු ලැබේ. ඉක්බිති පූජාසනයේ තිබෙන මල් ඉවත්කර සෝදා පිරිසිදු කර සුදු ඇතිරිල්ලක් එලා ඒ මත තේවාව සඳහා යොදා ගැනෙන භාණ්ඩ තැන්පත් කෙරේ. ඒ භාණ්ඩ නම් , ඇල්පැන් ගැනීමට භාවිත කෙරෙන (කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ) මහරන් කෙණ්ඩිය, උණුපැන් ගැනීමට භාවිත කෙරෙන (ඇහැලේපොල

අදිකාරම්ගේ) පොඩිරත් කෙණ්ඩිය, සිවුරු කට්ටලය, දැහැටි කොපුව හා දැහැට්ට, කපුරු පෙත්ත, සුවඳ පැන් කෙණ්ඩිය, ලේන්සු දෙක, විජිනිපත, චාමරය හා සීනුවයි.

අනතුරුව ගෙපරාළ විසින් ගෙපලු බරාදේ සිට පැන් කෙණ්ඩිවලට වෙන වෙන ම පැන් පිරවීම සිදුකෙරේ. එය බොලපැන් දීම යනුවෙන් හැඳින්වේ. ඒ සඳහා ගන්ධකුටිය තුළ සිටින තේවාව සිදුකරන භික්ෂුව රිදී දොරටුවෙන් එළියට අත දිගුකර පැන් කෙණ්ඩිය ගෙපරාළ දෙසට හරවයි. මෙහි දී තේවාභාර භික්ෂූන් ඇතුල් මාළිගයෙන් පිටතට නොපැමිණීම චාරිත්‍රය යි. ඇල්පැන් හා උණුපැන් වෙන වෙන ම කෙණ්ඩිවලට පුරවා නැවතත් පූජාසනය මත තබයි. එවිට හක්ගෙඩිරාළ හක් පිඹීම ආරම්භ කරයි. ඒ අනුව බෙරකරු මංගල භේරිනාදය පවත්වයි. එය අවසන් වූ විට තේවා හේවිසි වාදනය කරද්දී තේවා භික්ෂුව විසින් නියමිත ගාථා එකින් එක සජ්ඣායනා කරමින් පැන් වැඩීම, දැහැටි පිළිගැන්වීම, නැවතත් පැන් වැඩිම, තෙත මාත්තු කිරීම, සිවුරු කට්ටලය පිළිගැන්වීම, නැවත්ත පැන් වැඩීම, තෙත මාත්තු කිරීම, සිවුරු කට්ටල පිළිගැන්වීම, පා දෝවනය, පවන් සැලීම, චාමර සැලීම, කපුරු පූජාව හා සණ්ඨාර පූජාව ආදී වතාවත් සිදුකෙරේ. ජීවමාන බුදුරජාණන් වහන්සේට එදා අනඳ හිමියන් විසින් සිදුකළ වතාවත් සිහිගන්වන උපකරණ භාවිතයෙන් අභිනයෙන් ඉටුකෙරෙන මේ වතාවත් සැබවින් ම ශාස්තෘ ගෞරවය හා අසීමිත බුද්ධ භක්තිය පිළිබිඹු කරන අවස්ථාවක් ලෙස කල්පනා කළ හැකිය. තේවාව අවසාන වූ විගස ඒ බව දැන්වීමට සණ්ඨාව දෙවැනි වරටත් තෙවරක් නාද කෙරෙන අතර එම සණ්ඨා නාදයත් සමඟ තේවා හේවිසිය ද නිමාවට පත්වේ. ඉන්පසු දොරටු විවෘත කර මහජනතාවට දළදා කරඬුව වන්දනාමාන කිරීමට ඉඩ සලසා දෙනු ලැබේ.

මීළඟට ඇරඹෙන්නේ උදෑසන බුද්ධ පූජාව පැවැත්වීමේ කාර්යයයි. ඒ සඳහා ගෙපරාළ, කත්තියරාළ ඇතුළු පිරිස මුළුතැන්ගෙට ගොස් උදෑසන බුද්ධ පූජාව වැඩමවීම සිදුකරති. කලකට පෙර උදෑසන බුද්ධ පූජාව සඳහා පාත්‍ර 5ක් පමණක් යොදාගනු ලැබිණි. ඊට බත් දානය පාත්‍ර තුනකුත් කිරිබත් පාත්‍රය හා කැඳ පාත්‍රයක් අයත් විය. අද ඒ සඳහා මුළුතැන් පූජාව ම සිදුකෙරේ.

එබැවින් පාත්‍රා නවයක් සකස් කෙරේ. ඒඅනුව හාල් සේරු තිස්දෙකක බත් දානය පාත්‍රා හතකටත් ව්‍යඤ්ජන තිස්දෙකක් ඊට ම වෙන්කර ඇති භාජන තිස්දෙකකටත් වශයෙන් පිළියෙල කෙරෙති. තවද මීට කිරිබත් පාත්‍රය හා කැඳ පාත්‍රය ද අයත් වේ. ඊට අමතරව අවුල්පත් ආදියෙන් යුක්ත පාත්‍රා පිළියෙල කෙරේ. අවුල්පත් වර්ග පහක් පූජාව සඳහා පිළියෙල කිරීම චාරිත්‍රයයි. ඒවා පිළියෙල කිරීම සඳහා වෙන්වූ පිරිසක් මුළුතැන්ගෙහි කටයුතු කරති. දෛනිකව පූජාව සඳහා පාවිච්චි කරන පාත්‍රා අතරට මහාරන් පාත්‍රය හා රිදී පාත්‍රා දෙක ද අයත් වේ. පූජාව ඉහළ මාලයට වැඩමවීමෙන් ඉක්බිති පූජා හේවිසිය වාදනය කිරීම ආරම්භ වෙයි. එවිට බැතිමතුන් සඳහා විවෘත කරන ලද දොරටු වසා බුද්ධ පූජාව තැන්පත් කිරීම ශබ්ද පූජා මාධ්‍යයේ සිදුකෙරේ. වර්තමානයේ මුළුතැන් පූජාව භාරගන්නා පිරිස්වලට මේ අවස්ථාවට සහභාගි වී පූජාසනය මත පූජා පාත්‍රා තැන්පත් කිරීමට ඉඩ ලබාදී ඇත. එවිට රිදී උළුවස්සෙහි පා නොතබා ගන්ධ කුටියට ඇතුලු වී පූජාව තැන්පත් කිරීම චාරිත්‍රය යි. දෛනික බුද්ධ පූජාව සඳහා පිළියෙල කරන සියලු ම පූජා පාත්‍ර හා භාජන පූජාසනය මත තැබීමෙන් අනතුරුව බැතිමතුන් විසින් රැගෙන ආ යම් පූජාවක් වෙතොත් ඒවා තැන්පත් කරනු ලැබේ. ඉන්පසු තේවාව කරන භික්ෂූන් වහන්සේ ගාථා කියා පූජාව පවත්වයි. පූජාව පවත්වා අවසාන වූ විට ඒ බව හැඟවීමට සණ්ඩාරය තෙවැනි වරටත් තෙවරක් නාද කරනු ලැබේ. එවිට පූජා හේවිසි ද නතර කෙරේ. ඉක්බිති පූජා පාත්‍රා ඉවත් කිරීම සිදුවේ. පූජාව ඉවත් කරන්නේ එය ආසනය මත තැබූ අනුපිළිවෙලෙහි ආරෝහණ ක්‍රමයට යි. එනම් අවසානයට ම තැබූ භාජනය මුලින් ම ඉවත් කිරීම චාරිත්‍රය යි. පූජා පාත්‍රා හා භාජන ඉවත් කිරීමේ දී එය තේවාවට සම්බන්ධ පිරිස අතින් ම සිදුකිරීම චාරිත්‍රයයි යි. සියලු ම පූජාවන් ඉවත් කිරීමෙන් පසුව දැහැත් පූජාව හා මල් පූජාව සිදුකෙරේ. දහවල් මුළුතැන් පූජාවේ දී දැහැත් පූජාවට පෙර දැහැටි පූජා කිරීම විශේෂ චාරිත්‍රයකි.

අනතුරුව දළදා වහන්සේ වන්දනාමාන කිරීමට පැමිණි එතෙක් ඊට ඉඩ නොලැබුණු අයකු සිටින්නේ නම් ඔවුන්ට ද අවස්ථාව ලබාදී පිටත්කර යවා ගන්ධ කුටිය, ගෙපලු බරාදය හා අත්දත්කුනම නම් ස්ථාන තේවා කට්ටලයේ සහාය ඇතිව ශුද්ධ පවිත්‍ර කෙරේ. ඉක්බිති හක්ගෙඩිරාළ විසින් ගෙන එනු

ලබන ඇඟුරු කබලට සුවඳ ද්‍රව්‍ය දමා සුවඳදුම් අල්ලා ගන්ධ කුටිය සුවඳවත් කර සුවඳ පැන් මලකින් ඉසිමින් පස්සෙන් පස්සට රිදී පඩිය පසුකර පැමිණ දොරටුව වසා දමනු ලැබේ. ශුද්ධ පවිත්‍ර කිරීමෙන් අනතුරුව දොරටුව වැසීමට ප්‍රථම සංඛ්ධාරය සිව්වෙනි  වරටත් තෙවරක් නාදකරනු ලැබේ. එය තේවාභාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් හෝ වට්ටෝරුරාළ විසින් වසනු ලබන සියලුම දොරටු පරීක්ෂා කර බැලීම තේවා සහාය භික්ෂූන් වහන්සේ විසින් කරනු ලැබේ. ඉක්බිති සැමදෙනා ම හේවිසි මණ්ඩපය ඉදිරිපසට  පැමිණේ. එවිට පල්ලේමාලේරාළ පෙරටු කරගත් එහි තේවාව කරන භික්ෂූන් වහන්සේ ද එතැනට ළඟාවේ. ඉක්බිති පල්ලේමාලේරාළ විසින් එහි යතුරු වට්ටෝරුරාළ අතට භාරදී ඔහු පෙරටු කරගෙන තේවාව සඳහා පැමිණි පිළිවෙලට ම ආපසු තේවාභාර නාහිමියන් වැඩසිටින කුටියට ගොස් යතුරු සේප්පුවෙහි තැන්පත් කිරීමෙන් අලුයම තේවාවේ හා උදෑසන බුද්ධ පූජාව පැවැත්වීමේ කටයුතු නිමාවට පත්වෙයි.

දෛනික තේවා පුදපූජා පැවැතැවීමේ දී දහවල් කාලයේ මුළුතැන් පූජාව පැවැත්වීම මිස තේවාව සිදුකිරීමේ චාරිත්‍රයක් නොමැත. තේවාභාර පිරිස දහවල් නියමිත වේලාවට අළුයම සිදුකළ පරිදිම යතුරු ගෙනවිත් දොරටු විවෘත කර පූජාසනයේ මල් ඉවත් කර පිරිසිදු කරති. ඉක්බිති රජතුමා වෙනුවෙන් හේවිසිකරුවන් විසින් සම්පාදනය කරන මල් බන්දේසිය දළදා වහන්සේට ප්‍රථමයෙන්  ම පූජා කිරීම චාරිත්‍රය යි. ඉන්පසු පැමිණ සිටින බැතිමතුන්ට දළදා වහන්සේට වන්දනා කිරීමට ඉඩ ලබාදේ. මෙසේ වන්දනා කිරීමෙන් අනතුරුව සිදුවන්නේ දහවල් බුද්ධ පූජාව පැවැත්වීම යි. උදෑසන මුළුතැන් පූජාව පැවැත් වූ ආකාරයෙන් ම දහවල් බුද්ධ පූජාව ද හාල් සේරු තිස් දෙකක  බතින් හා ව්‍යඤ්ජන තිස්දෙකකින් යුක්තව පැවැත්වෙයි. දහවල් මුළුතැන් පූජාවෙන් අනතුරුව ද වන්දනා කිරීමට බැතිමතුන්ට අවස්ථාව ලබාදී  උදෑසන අනුගමනය කළ චාරිත්‍ර අනුව ගන්ධ කුටිය පිරිසිදු කර දොරටු වසා එම කටයුතු අවසන් කරනු ලැබේ.

සන්ධ්‍යා කාලයේ තේවාව ද අළුයම සිදුකළ තේවාවට සමානව ම සිදුකෙරෙයි. ඉන්පසුව සිදුවන්නේ ගිලන්පසු පූජාවයි. ගිලන්පස පූජාවට

පළතුරු පුෂ, පැණි වර්ග හා ඒ සඳහා ම විශේෂයෙන් ම නියමිත දෑ පිළියෙල කෙර්. පළතුරු යුෂ සඳහා අඹ, අන්නාසි හා දොඩම් වැනි පළතුරුත් විශේෂයෙන් ඇල් තෙලිජ්ජත් යොදා ගැනේ. තවද උක් යුෂ හො උක් පැණි, මීපැණි, කිතුල් හකුරු, බටර්, සීනි හා වියලි මිදි ආදිය ද ගිලන්පස පූජාවට යොදා ගනිති. පළමු ගිලන්පස පූජාව පස්වරු 7.00 ට පැවැත්වේ. දෙවැනි ගිලන්පස පළමු පූජාව තබා පැය භාගයකට පසුව පැවැත්වේ. එය කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ විශේෂ ඉල්ලීමක් අනුව පැරැණි චාරිත්‍රයක් ඉටුකිරීම වශයෙන් පැවැත්වෙන්නක් බව ඉහත ද සඳහන් විය.

මේ සෑම පූජාවක් ම පවත්වන අවස්ථාවේ දී තේවාභාර හිමිවරුන් සිය අතින් පූජා පාත්‍රා හැර පත්කඩය වැනි වෙනත් ඕනෑම භාණ්ඩයක් ඇල්ලුවේ නම් ඒ සෑම අවස්ථාවක දිම දෑත සෝදා පිරිසිදු කරගත යුතුය. පූජාසනයේ ඇති මල් බන්දේසියෙන් මල් ගැනීම ද ඇතුල් මාළිගාව තුළ දණ ගසා වැඳීම ද තේවාව කළ භික්ෂුවකට පමණක් කළහැකි චාරිත්‍ර වේ. සෑම භික්ෂූන් වහන්සේ නමක් ම බඳපටි බැඳ ඇතුල් මාළිගාවට පිවිසීම ද චාරිත්‍රයකි. මෙයින් ප්‍රකට වන්නේ ඉමහත් ගෞරවයකින් දළදා වහන්සේ සම්බන්ධ තේවා හා පුදපූජා කටයුතු සිදුකිරීම වගකීමක් ලෙස සලකන බවයි.

සන්ධ්‍යා තේවාවෙන් හා ගිලන්පස පූජාවෙන් පසුව ද පෙර පරිදි ම සෑමදෙනා හේවිසි මණ්ඩපය ඉදිරිපසට රැස්වෙති. එහි දී තේවාභාර නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ හේවිසි මණ්ඩපයේ දකුණු පාර්ශ්වයේ පළමු ගල් කුළුණ ළඟත් තේවා සහාය දෙවැනි භික්ෂූන් වහන්සේ වම් පාර්ශවයේ පළමු ගල් කුළුණ ළඟත් පල්ලේමාලේ තේවා භික්ෂූන් වහන්සේ වම් පාර්ශවයෙන් පඩියක් පහළිනුත් හේවිසි මණ්ඩපය දෙසට මුහුණලා සිට ගනිති. එවිට තේවා කට්ටලයේ උන්වහන්සේලාට මුහුණලා පිළිවෙලින් අර්ධ කවාකාරව හේවිසි මණ්ඩලයෙහි සිටගනිති. ඉක්බිති තේවාභාර නායක ස්වාමින්ද්‍රයන් විසින් එදින රාත්‍රියේ දළදා වහන්සේට මුර ආරක්ෂාව සපයන්නේ කවුරුන් දැයි විමසයි. ඊට පිළිතුරු ලැබුණු පසු පිරිස වට්ටෝරුරාළ පෙරටු කරගෙන ලැගුම් කුටිය වෙතට ගමන් කරති. විශේෂත්වය නම් සන්ධ්‍යා තේවාව අවසන් කර යන මේ පිරිසේ ගමනට වට්ටෝරුරාළට ඉදිරියෙන් යන පන්දම්කරුවකු

විසින් ආලෝකය සැපයීමයි. මෙසේ තේවාභාර නාහිමිගේ කුටියේ සේප්පුවෙහි පෙර පරිදි ම යතුරු තැන්පත් කිරීමෙන් සන්ධ්‍යා තේවාවේ හා ගිලන්පස පූජාවේ කටයුතු නිමාවේ.

## 1.5.2 සතියකට වරක් පැවැත්වෙන තේවාව හා පුදපූජා

සතියකට පූජා අතර බදාදා දිනවල සිදුකෙරෙන නානුමුර මංගල්‍යයත් මාසේ සතර පෝයට ඉටුකරන පූජාවනුත් නම්කළ හැකිය. එදින තේවා භාර හිමිවරුන් පොරවන සිවුරු හා තේවා කට්ටලය අඳින ඇඳුම් පවා එදිනට ම පමණක් පාවිච්චි කරන වෙනත් දිනක නොඅඳින ඒවා විය යුතුය. එදින පූජාව තැබීමට පමණක් විශේෂයෙන් වෙන් කළ පාත්‍රා පවා තිබේ. එදිනට සන රන් පාත්‍රා හතරක් මුළුතැන් පූජාව සඳහා යොදා ගනියි. නානුමුර යන්නෙහි වචනාර්ථය අනුව බුදුරජාණන් වහන්සේට පැන් පහසුවීමට සැලසීම හෙවත් ස්නානය කරවීම අදහස් කෙරේ. ඒ සඳහා තේවා භාර හිමිවරුන් පෙරදින සන්ධ්‍යාවේ සිට ම සූදානම්වීම චාරිත්‍රය යි. එනම් අඟහරුවාදා සන්ධ්‍යාවේ තේවාවෙන් පසුව උන්වහන්සේලා සමන්පිච්ච, රෝස වැනි මල් ගෙපරාළට දිය යුතුය. ඔහු කත්තියරාළගේ සහාය ඇතිව ඒවා මිශ්‍රණය කර සුවඳ පැන් සාදා තබයි. නානුමුර මංගල්‍යය පවත්වන්නේ දහවල් මුළුතැන් පූජාවට පළමුව බැවින් උදෑසන මුළුතැන් පූජාවෙන් අනතුරුව ගන්ධකුටිය ඇතුළු සියලුම ස්ථානත් පාත්‍රා ඇතුළු භාණ්ඩත් මැනවින් පිරිසිදු කළයුතුය. අනතුරුව ආසනය මත සුදු ඇතිරිල්ලක් එළා එහි නානුමර මංගල්‍යයට ගනු ලබන සියලු භාණ්ඩ තැන්පත් කර සුවඳ දුම් අල්ලා නැවත ඇතිරිල්ලකින් වසනු ලැබේ. ඒ අතර සාමාන්‍ය දිනවල තේවාව සඳහා භාවිතා කරනු ලබන භාණ්ඩවලට අමතරව එදිනට පමණක් විශේෂිත වූ භාණ්ඩ ද ඇත. එනම් රන් කැඩපත, හඳුන් කරඬුව, රන් මල, රිදී බන්දේසිය, සුවඳ පැන්, සිද්ධාර්ථ තෙල්, වටාපත ආදිය වේ. උදෑසන තේවාවෙන් හා පූජාවෙන් ඉක්බිති පෙර පරිදිම දොරටු වසා පැමිණ යතුරු නියමිත ස්ථානයේ තැන්පත් කරති.

මෙදින දහවල් තේවාවට පෙර සියලු දෙනා ස්නානය කර පිරිසිදු වී නියමිත අලුත් වස්ත්‍ර හැඳ වෙනත් දිනවල මෙන් ම පෙරවරු 9.30 ට දොරටු

විවෘත කරනු ලැබේ. නියමිත වේලාවට වට්ටෝරුරාළ භාණ්ඩ වසා තිබෙන ඇතිරිල්ල ඉවත් කරයි. ගෙපරාළ සුවඳ පැන් පෙරා රන් කුසලානයට දමා තේවා භික්ෂුවට භාරදෙයි.

අනතුරුව ඔහු හක්ගෙඩිරාළගේ සහාය ඇතිව මුල්තැන්ගෙයි පිළියෙල කර තබා ඇති නානු හේමකදේ තබාගෙන උඩුවියන් යටින් ඉහළමාලයට රැගෙන එයි. ඒ අතර හේවිසිකරුවෝ ශබ්දපූජා පවත්වති. හේවිසිකරුවන් වැඩසිටින මාළිගාව වටේ යමින් හේවිසි වාදනය කිරීම වෙනදා දක්නට නොලැබෙන එදිනට පමණක් විශේෂ වූ චාරිත්‍රයකි. එය වට හේවිසිය නමින් හැඳින්වේ. මේ වනවිට භික්ෂූන් වහන්සේලා තෙල් හා නානු මිශ්‍රකර නානුමුර මංගල්‍යයට සූදානම් වෙති. එවිට හක්ගෙඩිය තෙවරක් පිඹින අතර සන්ධ්‍යාරය ද නාද කෙරේ. කවිකාර මඩුව පන්තේරු වාදනය කරමින් ප්‍රශස්ති ගයති. විවිධ වාද්‍යකරුවෝ නාගසින්නම්, කයිතාලම්, තබ්බෝරුඩැක්කි ආදිය වාදනය කරති. මෙහි දී මඟුල් බෙරය වාදනය කරනවාත් සමඟ නානුමුරය අරඹයි. ඊට වට්ටෝරුරාළ සහාය වේ. ඔහු දළදා කරඬුවේ ප්‍රතිබිම්බය කැඩපතට වැටෙන පරිදි කැඩපත අල්ලයි. ඒ අනුව තේවා භික්ෂුව කැඩපතේ දිස්වන කරඬුවේ ප්‍රතිබිම්බයෙහි නානු ආලේප කර සුවඳ පැනින් තෙවරක් සෝදා හරියි. ඉක්බිති තෙත මාත්තු කර ඒ ඒ භාණ්ඩ පිළිගැන්වීම සිදුවෙයි. එය අවසන් කර මල් දැක්වීමෙන් පසු ආලත්ති බෑම සිදුකෙරේ.

ආලත්ති අම්මාවරු නමින් හැඳින්වෙන කාන්තාවෝ දෙදෙනෙක් වැඩසිටින මාළිගාවේ රිදී දොරටුව අභියස සිට දොළොස් මහේ පහනෙන් ගත් තෙල්වලින් තිර හයක් තෙමා ආලත්ති බෑම කරති. එවිට ඒ දෙස බලා නොසිටීම චාරිත්‍රයකි. එමෙන්ම වස්දොස් පහකර ගැනීමට මෙය හොඳ අවස්ථාවක් ලෙස ද පිළිගැනේ.

### 1.5.3 වාර්ෂිකව කෙරෙන පුදපූජා හා උත්සව

වර්ෂයකට වරක් සිදුකෙරෙන මංගල්‍යයන් හා පූජාවන් මීට අයත් වේ. දැනට එවැනි මංගල්‍ය හතරක් වාර්ෂිකව සිදුකෙරේ. එනම් අලුත් අවුරුදු

මංගල්‍යය, කාර්තික මංගල්‍යය, අලුත් සහල් මංගල්‍යය හා උපසම්පදා මංගල්‍යයි. ඊට අමතරව වෙසක් පෙරහැර, පොසොන් පෙරහැර හා ඇසළ පෙරහැර ද වාර්ෂිකව සිදුකෙරෙන උත්සව වේ. මේ සෑම මංගල්‍යයක් ම අඩුවැඩි වශයෙන් උභය මහාවිහාරයේ කටයුතු සමඟ සම්බන්ධ වී තිබීම විශේෂ ලක්ෂණයකි.

## අලුත් අවුරුදු මංගල්‍යය

වාර්ෂිකව එළැඹෙන සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් පැවැත්වෙන අලුත් අවුරුදු මංගල්‍යයේ දි දළදා වහන්සේට අවුරුදු චාරිත්‍ර වශයෙන් කිරි ආහාර පූජාකිරීම සුවිශේෂ කාරණයකි. ශ්‍රී දළදා මාළිගාවේ නැකත් මොහොට්ටාල විසින් සකස්කර දෙනු ලබන අවුරුදු නැකැත්වලට අනුව පරණ අවුරුද්ද සඳහා සියලු වැඩ අතහැර අලුත් අවුරුදු නැකැත්වලට සියලු වැඩ ආරම්භ කරනු ලැබේ. ලිප් බැඳීම, ගින්දර දැල්වීම, කිරි ඉතිරවීම ආදි කටයුතු නැකැත්වලට අනුව සිදුකෙරේ. නානුමුර මංගල්‍යය හා හිසතෙල් ගෑම බදාදා දිනවලට නැකත් යොදාගෙන කරනු ලැබේ. ශ්‍රී දළදා මාළිගාවේ ප්‍රධාන දොරටු අභියස නැකත් අනුව කිරි ඉතිරවීම සෞභාග්‍යය අරමුණු කරගෙන ඉටුකරන චාරිත්‍ර වේ. උභය මහාවිහාරීය සංඝයා අලුත් අවුරුදු චාරිත්‍ර වශයෙන් කිරිබත් පාත්‍රය බැගින් සකස්කර ගෙන පළමුවෙන් ම පැමිණෙන්නේ දළදා වහන්සේට පූජා කිරීමටයි. එය උන්වහන්සේලාගේ ප්‍රථම අවුරුදු චාරිත්‍රයයි. උන්වහන්සේලා වෙනත් ඕනෑම තැනකට ගමන් කරන්නේ ඉන් පසුවයි. මෙයින් ප්‍රකට වන්නේ උභය මහාවිහාරීය සංඝරත්නය හා දළදා වහන්සේ අතර තිබෙන සම්බන්ධයයි.

## කාර්තික මංගල්‍යය

කාර්තික මංගල්‍යය යනු පහන් දැල්වීම සඳහා ශ්‍රී දළදා මාළිගාවෙන් පොල්තෙල් බෙදාදීමයි. කාර්තික මංගල්‍යයේදී උභය මහාවිහාරය, විශේෂයෙන් ගෙඩිගේ විහාරය හා සතර මහාදේවාල ඇතුලු නියමිත

ස්ථානවලට ඉල් පුරපසළොස්වක පොහොය දින පහන් දැල්වීම පිණිස තෙල් බෙදාදීම සිදුකෙරේ.

## අලුත් සහල් මංගල්‍යය

අලුත් සහල් මංගල්‍යය යනු නව අස්වනු ලබාගෙන එයින් දළදා වහන්සේට ප්‍රථමයෙන් පූජා පැවැත්වීමයි. එය දුරුතු පුරපසළොස්වක පොහෝ දිනයේ දී හාල්සේරු අසූවකින් පිසින කිරිබතක් දළදා වහන්සේට උදෑසන මුළුතැන් පූජාවත් සමඟ පූජා කිරීමෙන් ඉටුකෙරේ. මේ සඳහා දළදා වහන්සේට පුජා පැවැත්වීමට වෙන්කර දී තිබෙන කුඹුරු පිහිටි ගම් දහයක පිරිස ද රැස්වේ. ඔවුහු එම කුඹුරුවල අස්වනු මාළිගාවට ලබාදීමෙන් පසුව ඒ සහල්වලින් මේ කිරිබත පිළියෙල වෙයි. ඉන්පසු උභය මහාවිහාරයේ සෑම පන්සලකට ම හාල්සේරු දෙක බැගින් බෙදාදීම දියවඩන නිලමේතුමා විසින් කරනු ලැබේ. මෙය කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ඉටුකළ චාරිත්‍රයක් පවත්වාගෙන යමින් සිදුකරනු ලබන්නකි. එබැවින් උන්වහන්සේලා එම සහල්වලින් පිළියෙල කරන දානයෙන් විශේෂයන් බුද්ධපූජා පවත්වා රජුට පිං සිදුවේවා යන චේතනාවෙන් දන් වළඳින බව අදටත් අසන්නට ලැබීම[18] නූතන ශාසනික ප්‍රබෝධය පිණිස උදාර මෙහෙවරක් ඉටුකළ එබඳු සත්පුරුෂ පාලකයකුට කෘතගුණ දැක්වීමක් පමණක් නොව දළදා වහන්සේ, රජු හා උභය මහාවිහාරීය භික්ෂුන් වහන්සේ අතර තිබෙන සම්බන්ධතාව හා චාරිත්‍ර පිළිබඳ සංකේතයකි.

## උපසම්පදා වාහල නාග පෙරහැර

ශ්‍රී දළදා මාළිගාව හා උභය මහා විහාරය අතර සම්බන්ධතාව පෙන්වන තවත් ඉතාම වැදගත් චාරිත්‍රයක් වන්නේ උපසම්පදා මංගල්‍යය හා ඒ වෙනුවෙන් පැවැත්වෙන වාහල නාග පෙරහැරයි. සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සම්බන්ධයෙන් උපසම්පදා සීලයට හා උපසපන් භික්ෂුවට ප්‍රධාන තැනක් හිමිවේ. ඒ පිළිබඳව ශාසන ඉතිහාසය පුරාම සිදුවී ඇති හා

ලේඛනගතව තිබෙන තොරතුරු විමර්ශනය කරනවිට ප්‍රකට වේ. උපසම්පන්න භික්ෂූන් දුර්ලභ වූ සෑම අවස්ථාවකම සම්බුද්ධ ශාසනය අභාවයට පත්වීමේ තර්ජනය එල්ල වී ඇති අතර ගිහි පැවිදි සෑම දෙනාගේම මැදිහත්වීමෙන් නැවත උපසම්පදාව ස්ථාපිත කිරීමෙන් ශාසනික පුනර්ජීවය සිදුවී තිබේ. දළදා මාළිගාව සමඟ සබැඳි උභය මහාවිහාරීය චාරිත්‍ර අතර උපසම්පදාපේක්ෂක සාමණේරවරුන් වෙනුවෙන් වාහල නාග නමින් වූ පෙරහැරක් එම උපසම්පදා කාලය තුළ එළැඹෙන සෑම පොහෝ දිනයකම පැවැත්වේ. මෙය කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ වුවමනාව මත සිදුවූවක් යැයි කල්පනා කළ හැකිය. එකල උපසම්පන්න භික්ෂූන් නොමැතිවීම නිසා ශාසනයට උදාවී තිබූ දුර්භාග්‍ය පිළිබඳ මෙනෙහි කළ රජු මෙවැනි උසස් ගෞරවයක් උපසම්පදාව ලබන කෙනෙකුට හිමිකරදීම යෝග්‍ය බව සිතන්නට ඇත. එම චාරිත්‍රය අනුව මහාවිහාර දෙකෙන් ම පොහොය දිනවල උපසම්පදාව අපේක්ෂා කරන සාමණේරවරුන්ගෙන් තෝරාගත් දෙදෙනෙකුට මේ විශේෂ අවස්ථාව හිමිවේ. ඒ සඳහා පැවැත්වෙන පෙරහැර සංවිධානය කිරීමත් ඒ දෙනමට උපසම්පදාව සඳහා අවශ්‍ය අටපිරිකර පූජාවත් දියවඩන නිළමේතුමා විසින් සිදුකිරීම රජතුමාගේ අභිලාෂය ඉටුකිරීමක් පමණක් නොව උභය මහාවිහාරයේත් ශ්‍රී දළදා මාළිගාවේත් සිදුකෙරෙන චාරිත්‍ර අතර තිබෙන සම්බන්ධතාව ප්‍රකට කරන්නකි.

## ඇසළ පෙරහැර

ශ්‍රී දළදා මාළිගාව විසින් සංවිධානය කෙරෙන වෙසක් පෙරහැරත් මිහිඳු පෙරහැරත් මෑත කාලයේ ඇති වූ ඒවා බැවින් උභය මහාවිහාරය සමඟ ඒවායේ පෞරාණික සම්බන්ධතාවයක් හෝ චාරිත්‍රමය සුවිශේෂත්වයක් දැක්විය නොහැකිය. එහෙත් ඇසළ පෙරහැර සම්බන්ධයෙන් සලකන විට විශේෂයෙන් අස්ගිරි මහාවිහාරය සමඟ විශාල සම්බන්ධයක් ඇත. ඇසළ පෙරහැරේ අවසන් රන්දෝලිය වීථි සංචාරයෙන් පසුව ගෙවදින්නේ ආදාහන මළුවේ ගෙඩිගේ විහාරයටයි. එවිට අස්ගිරි පාර්ශ්වයේ මහානායක මාහිමිපාණන් වහන්සේ ඇතුලු සියලු ම නේවාසික භික්ෂූන් වහන්සේලා එහි රැස්වී දළදා පෙරහැර කරඬුව පිළිගැනීම චාරිත්‍රය යි. ඉක්බිති මහානායක

මාහිමිපාණන් වහන්සේගේ සුරතින් පෙරහැර කරඬුව පිළිගෙන තැන්පත් කර ආරක්ෂක සංවිධාන සලස්වයි. පසුදින ගැටඹේ තොටේ දී දියකැපීමෙන් අනතුරුව පැවැත්වෙන දහවල් පෙරහැර සඳහා කරඬුව වැඩමවනතෙක් උන්වහන්සේගේ අණ පරිදි සියලු වතාවත් හා පුදපූජා පැවත්වේ. එදින අලුයම තේවාවට හා උදෑසන මුළුතැන් පූජාවට මහාවිහාරීය සියලුම නේවාසිකයන් සහභාගිවීම චාරිත්‍රයයි. එසේ කිරීම දළදා වහන්සේ උදෙසා ස්වකීය ගෞරවය හා භක්තිය පිළිගැන්වීම ද දළදා වහන්සේ සමඟ තිබෙන චාරිත්‍රමය සම්බන්ධතාව ප්‍රකට කිරීම ද වේ.

## 1.6 උභය මහාවිහාරය

ලක්දිව භික්ෂු සමාජය එක්තරා කාලයක දී නිකායවලට වෙන්වී තිබුණත් මහපැරකුම්බා රජුගේ කතිකාවතින් පසු නිකාය භේදය නැතිවී ගොස් උන්වහන්සේලා අනුගමනය කරන ශාසන ප්‍රතිපදාව අනුව ග්‍රාමවාසී හා ආරණ්‍යවාසී යන බෙදීම් සිදුවිය.[19] ඒ අනුව ග්‍රාමවාසී භික්ෂූහු සමාජ කටයුතුවල යෙදෙමින් ගම්බද වෙහෙර විහාරවලත් ආරණ්‍යවාසී භික්ෂූහු වනගත සෙනසුන්වලත් වාසය කළහ. එබැවින් උන්වහන්සේලා උභයවාසීන් ලෙස ද හැඳින්වූ අතර ශාසනික ප්‍රතිපත්ති වශයෙන් පොදුවේ ග්‍රන්ථධූරය හා විදර්ශනාධූරය ප්‍රගුණ කළහ. උභයවාසයෙන් පොදුවේ තෝරාගත් සම්භාවනීය තෙරුන් වහන්සේට රජතුමා විසින් මහාසාමි පදවිය හෙවත් සංඝරාජ පදවිය පිරිනැමුණු අතර එක් එක් වාසයට වෙන වෙන ම මහාතෙරවරු (මහා ස්ථවිර හෝ ගණනායක තෙරවරු) ද පත්කරනු ලැබ සිටියහ. කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමය වනවිට උභයවාසය ලෙස පිළිගැනුනේ උපෝෂිතාරාමයත් භයගිරි විහාරයත් යන දෙකයි. ඒවා උභය මහාවිහාර වශයෙන් ද හැඳින්විණි. වර්තමානයේ එම මහාවිහාර පිළිවෙලින් මල්වතු මහාවිහාර උපෝෂිත පුෂ්පාරාමය හෙවත් මල්වතු මහාවිහාරය හා අස්ගිරි විජයසුන්දරාරාම මහාවිහාරය හෙවත් අස්ගිරි මහා විහාරය නමින් හඳුන්වනු ලැබේ.

වර්තමාන පිළිවෙත් හා චාරිත්‍ර අනුව පොදු වශයෙන් සලකන විට

උභය මහාවිහාරීය නේවාසික භික්ෂූන් වහන්සේලා ස්වකීය මහාවිහාරය සඳහා මහානායක මාහිමිපාණන් වහන්සේලා පත්කර ගෙන උන්වහන්සේලාගේ අනුශාසකත්වයෙන් ශාසනික සම්ප්‍රදාය හා පිළිවෙත් පවත්වා ගැනීම සඳහා ක්‍රියාකරන බව කිව යුතු ය.

## 1.6.1 මල්වතු මහාවිහාරය

ඓතිහාසික වශයෙන් උපෝෂිතාරාමය හෙවත් පෝයමළු විහාරය දැනට තිබෙන ස්ථානයේ අස්ගිරි විහාරයට පසු කාලයේ දී ඉදිකළ බව සඳහන් වේ. එහෙත් වර්තමානයේ අස්ගිරි මහාවිහාර පරිශ්‍රය තුළ තිබෙන පන්සල් සංඛ්‍යාවට වඩා වැඩි ප්‍රමාණයක් මල්වතු මහාවිහාර පරිශ්‍රය තුළ ඉදිකර ඇත. සංඛ්‍යාව වශයෙන් දැනට මල්වතු මහාවිහාරය තුළ පන්සල් තිස්පහක් පමණ ක්‍රියාත්මක වේ. ඒවා ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවල ව්‍යාප්තිය අනුව විකාශනය වී තිබෙන බව ඒ පිළිබඳව විමර්ශනය කරන විට හඳුනාගත හැකිය.

එහි මුලින්ම තිබුණේ පෝයමලු විහාරය පමණි. එකල සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දර ගණනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ එහි අධිපතිත්වය දැරූ බව කියැවේ. උන්වහන්සේගේ ශිෂ්‍යයෙකු වශයෙන් පිණ්ඩපාතික අසරණ සරණ වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ සූරියගොඩ දී ප්‍රව්‍රජ්ජාව ලැබුහ. පසුව පෝයමලු විහාරයට පැමිණ අධ්‍යාපන කටයුතුවල නිරත වූ බව ද ඒ වනවිට පැවති ශාසනික සම්ප්‍රදාය කෙරෙහි සෑහීමකට පත්නොවී සිල්වත් සමාගම පිහිට වූ බවද ප්‍රකට කරුණකි. ශාසනික හා අධ්‍යාපනික අභිවෘද්ධිය ඇති කිරීමට උන්වහන්සේ රට පුරා සංචාරය කළ කාලයේ විශාල පැවිදි පිරිසක් උන්වහන්සේගේ ශිෂ්‍යයෝ බවට පත්වූහ. ඒ ශිෂ්‍ය පිරිස අතර උපෝෂිතාරාමයට සම්බන්ධකම් ඇති ශිෂ්‍යයන් තිදෙනෙකු පිළිබඳව අසන්නට ලැබේ. එනම්, තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත, දරමිටිපොල ධම්මරක්ඛිත හා ගිනිගත්පිටියේ සංඝරක්ඛිත යන තෙනමයි. ඊට අමතරව කොටිකාපොළ සොභිත නමින් ශිෂ්‍ය භික්ෂු නමක් සිටි බව ද කියනු ලැබේ.[19]

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහයෙන් සියම් දේශයෙන් භික්ෂූන් වැඩමවා යළි උපසම්පදාව ප්‍රතිෂ්ඨාපනය කිරීමේ දී දළදා මාළිගයට මල් සැපයූ රාජකීය උද්‍යානයෙහි සීමා සම්මත කර "ධම්මිකාරාමය" නමින් පෝය සීමාව බඳවා එහි මහාසංඝයාට ද වාසය පිණිස ආරාම කරදෙන ලදී. ඒ අනුව එය මල්වතු මහාවිහාර උපෝෂිත පුෂ්පාරාමය නම් විය. එම පරිශ්‍රයෙහි අද දක්නට ලැබෙන සියලු ම පන්සල් යථෝක්ත ආචාර්යවරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවල ව්‍යාප්තිය අනුව සිදුවූ බව පෙනේ.[20]

## 1.6.2 අස්ගිරි මහාවිහාරය

අස්ගිරි මහාවිහාරය වර්තමානයේ පවතින පරිශ්‍රයෙහි ස්ථාපනය වීම සම්බන්ධයෙන් පුරාවෘත්ත හා සාහිත්‍ය කෘති කීපයකින් ම තොරතුරු ලැබී තිබේ. මේ පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් සිදුකළ පර්යේෂණ ද වේ. ඒ අනුව වසර හත්සීයකට ආසන්න ඉතිහාසයක් අස්ගිරි මහාවිහාරයට ඇත. කන්ද උඩරට සෙංකඩගල රාජධානියේ ආරම්භයත් සමඟ ම මෙම විහාරයෙහි ආරම්භය ද සිදුවී තිබේ. ඒ අතර ඉතා වැදගත් කාරණය එහි වැඩ වාසය කිරීමට භික්ෂූන් වහන්සේලා වැඩමවා ගැනීමයි. අනුරාධපුර මහාවිහාරයට අයත් තවත් භික්ෂු ආයතනයක් වන ථූපාරාම විහාරීය සංඝ පරම්පරාවට සම්බන්ධකම් ඇති දිඹුලාගල ආරණ්‍ය සේනාසනයෙන් යාපහුවට සංක්‍රමණය වී වලස්ගල ආරණ්‍යයෙහි වැඩසිටි භික්ෂූන් අතුරෙන් පස් නමක් අස්ගිරි මහා විහාරය ඉදිකළ මුල්ම අවස්ථාවේ දී වැඩමවාගෙන පදිංචි කරවාගත් බව පෙනේ. උන්වහන්සේලාගෙන් වර්ධනය වූ ශිෂ්‍ය භික්ෂූන් පසුකාලයේ නගරය පුළුල් වන විට සෙංකඩගල නගරය පුරා ඉදිකළ විහාරස්ථානවල පදිංචි වන්නට ඇතැයි කල්පනා කළ හැකිය.

කෙසේ වෙතත් අස්ගිරි විහාරයට අනුබද්ධිතව විජයසුන්දරාරාමය ඉදිකිරීමෙන් අනතුරුව එය භයගිරි විජයසුන්දරාරාම මහාවිහාරය නමින් හැඳින්විණි. වර්තමානයේ අස්ගිරි මහාවිහාරයේ පන්සල් පාර්ශව තුනකි. කලකට පෙර පාර්ශව දෙකක් පමණක් වූ බව කියනු ලැබේ. ඒවා නම්, මැද

පන්සල් පාර්ශ්වය හා පහළ පන්සල් පාර්ශ්වයයි. පහළ පන්සල් පාර්ශ්වය මැත භාගයේ උරුලෑවත්තේ පන්සල් පාර්ශවය හා පොතුහැර පන්සල් පාර්ශ්වය නමින් දෙකකට බෙදී ඇත. මැද පන්සල් පාර්ශ්වයට පන්සල් හතකුත් උරුලෑවත්තේ පන්සල් පාර්ශ්වයට පන්සල් අටකුත් පොතුහැර පන්සල් පාර්ශ්වයට පන්සල් හතරකුත් අයත්ය. මේවායේ වාසය කරන භික්ෂූන් වහන්සේලාට අස්ගිරි මහාවිහාරයේ සංඝ සභාව නියෝජනය කිරීමේ අයිතිය මෙන්ම දළදා මාළිගාවේ කටයුතුවලට සෘජුව සම්බන්ධකම් පැවැත්වීමේ වරප්‍රසාදය ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් ම ලැබී තිබේ.

ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා වශයෙන් විහාර පාර්ශව දෙකක් ලෙස උභය මහාවිහාරය හැඳින්වේ. එමෙන් ම පරිපාලනමය වශයෙන් මහාවිහාර දෙක තම තමන්ට නියමිත වූ සම්ප්‍රදාය අනුගමනය කරනු ලැබේ.[21] එහෙත් දළදා මාළිගාව සමඟ මහාවිහාරයන්හි පවතින සම්බන්ධතාවයේ දී අනුගමනය කරන චාරිත්‍ර විධි හා ක්‍රියාපටිපාටිය තුළ ඇත්තේ සමාන බවකි.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ හෙළ රජකිරුළ දළදා වහන්සේ හා වාරියපොළ මාහිමි, 1984, විද්‍යාලංකාර ප්‍රින්ටර්ස්, කැලණිය. 88 පිටුව

2. මෙහි එන බොහෝ තොරතුරු අස්ගිරි මහාවිහාරීය ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික, බම්බාව රාජමහා විහාරාධිපති හා මඩුගල්ලේ පන්සලේ විහාරාධිපති මඩුගල්ලේ සොභිතාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් හා එම මහාවිහාරීය ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික, මුල්ලේගම පන්සලේ විහාරාධිපති ආචාර්ය ගොඩගම මංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් අසා දැනගත් බව කෘතඥතා පූර්වක සඳහන් කළ යුතුය.

3. Seneviratne, H.L. Rituals of the Kandyan State. 1978 Cambridge University Press. London p. 24
4. දාඨාවංසය, 374 - 375 ගාථා: රාහුල හිමි, වල්පොල. ලක්දිව බුදුසමයේ ඉතිහාසය. 2002 (8 මුද්‍රණය) ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 133, 292 පිටු
5. දාඨාවංසය, 298 - 300 ගාථා
6. ලක්දිව බුදුසමයේ ඉතිහාසය 292 - 293 පිටු
7. බුදුරජාණන් වහන්සේගේ ජීවමාන අවස්ථාව පිළිබඳ සලකන විට මහානායක මාහිමිපාණන් වහන්සේලා බුද්ධෝපස්ථායකයන් වහන්සේට සමාන ය. දියවඩන නිළමේතුමා ඒ සඳහා අවශ්‍ය දේ සම්පාදනය කරන කැපකරුවා ය.
8. ලක්දිව බුදුසමයේ ඉතිහාසය 292 පිටුව
9. හුළුගල්ල එච්.ඒ. ජේ. ලංකාවේ බ්‍රිතාන්‍ය අණ්ඩුකාරයෝ, කොළඹ. 78 පිටුව
10. හෙළ රජකිරුළ දළදා වහන්සේ හා වාරියපොල මාහිමි. 89 පිටුව, පරමධම්ම කතිකාවතෙහි 1845 අප්‍රේල් 23 වැනි දින ඉංග්‍රීසි ආණ්ඩුව එම වගකීමෙන් ඉවත්වීමට සාකච්ඡා කළ බව ද 1853 අප්‍රේල් 07 වැනි දින නිකුත් කළ 152 දරන මහාරාජඥා පත්‍රයෙන් එය පවරා දුන් බව ද සඳහන් වේ.
11. මහකරඬුවට යටින් තිබූ තායිලන්තයෙන් වැඩම වූ කරඬුව දැනට වීදුරු කුඩුවේ පසෙකින් තබා තිබේ.
12. Rituals of the Kandyan State p. 24
13. Rituals of the Kandyan State pp. 20. 25
14. අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අතිගරු මහානායක උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මාහිමිපාණන් වහන්සේගෙන් අසා දැනගත් තොරතුරු
15. - එම -
16. අස්ගිරි මහාවිහාරීය මඩුගල්ලේ පංසලේ විහාරාධිපති හා බම්බාව රාජමහා විහාරාධිපති ගරුතර මඩුගල්ලේ සෝභිත නාහිමියන්ගෙන් අසා දැනගත් තොරතුරු

17. අස්ගිරි මහාවිහාරීය පොතුහැර පංසලේ විහාරාධිපති ශාස්ත්‍රපති කුඹුක්කඳන්වල පුඤ්ඤරතන හිමි පවසයි.

# දළදා වහන්සේ, දළදා පෙරහර සහ සාරධර්ම පද්ධතිය

**ආචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්**
සමාජ විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය

ඕනෑම සමාජයක සංස්කෘතිය යනු අද්විතීය සාරධර්මවල පරමාදර්ශී එකතුවකි. මිනිස් ස්වභාවය පාලනය කරනු ලබන්නේ මෙම පරමාදර්ශ සහ සාරධර්මයන්ය (Values). සාරධර්මයන් සමඟ නිශ්චිත (Norm) ප්‍රතිමාන දක්නට ලැබේ. මෙම සාරධර්ම සහ ප්‍රතිමාන එක් සමාජයකින් තවත් සමාජයකට වෙනස් වේ. මෙම වෙනස්වීම හේතුකොටගෙන ඒ ඒ සමාජයේ පවතින කේන්ද්‍රීය සාරධර්ම පද්ධතිය වෙනස්වේ. සාරධර්ම යනු උපකල්පනයන්ය. විශාල වශයෙන් අවිඥානිකවම වැදගත් සහ නිවැරදි කුමක්ද යන්න තීරණය කරයි (Seshadri 1992:8). සෑම සමාජයකම සංස්කෘතියේ සාරය නිශ්චිත සාරධර්ම සමුදායක් විසින් නිර්මාණය කොට තිබේ. ඕනෑම සමාජයක සමාජ පර්යාය රඳා පවතිනුයේ එම සමාජයේ පවතින පොදුවේ පිළිගත් හවුලේ බුක්තිවිඳින සාරධර්මයන් මතය. මෙම සාරධර්ම සලකනු ලබන්නේ නිත්‍යානුකූල සහ සම්මත, එමෙන්ම සමාජය බැඳ තබනු ලබන ඒවා වශයෙනි. මෙහි අවසාන අර්ථය නම් මිනිසුන්ගේ හැසිරීම හෙවත් සමාජ ක්‍රියාව තීරණය කරනු ලබන්නේ මෙම සාරධර්මයන් මගින්ය (Seshadri 1992:13).

ප්‍රතිමාන (Norm) යනු සමූහයක හවුලේ පවතින අපේක්ෂාවන්ය (Indira 1192: 13). අපේක්ෂිත හැසිරීම් සමුදායක් සමාජයේ නිශ්චිත අවස්ථාවන් සමඟ සම්බන්ධවිය හැකි හෝ සමාජ ව්‍යුහයේ ඒ ඒ අවස්ථාවන්ට හිමි තත්වයන්ට ගැලපෙන පරිදි ක්‍රියාත්මක වේ.

මෙම ලිපියේ අරමුණ වනුයේ ශ්‍රී ලාංකික සමාජයේ යහපත් පැවැත්ම

සඳහා දළදා වහන්සේ හා දළදා පෙරහැර විසින් දායක කොට ඇති සාරධර්ම පද්ධතිය පිළිබඳව කෙටි සාකච්ඡාවක් ඉදිරිපත් කිරීමයි.

ශ්‍රී මහා බෝධීන් වහන්සේ සංඝමිත්තා තෙරණින් වහන්සේ විසින් වැඩම කිරීමත් සමග ඒකීය රාජ්‍යයක ආගම බවට බුදුදහම පත්වූ අතර ක්‍රි.ව. හතරවැනි සියවසේදී කිත්සිරි මෙවන් රජු දවස කළිඟු රටින් ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කිරීමත් සමගම බුදුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේට සැළකීම බුදුන් වහන්සේටම කෙරෙන සැලකිල්ලක් බවට පත්විය. මේ නිසා බුදුන් වහන්සේ සුරකින පරිද්දෙන් සියලු වතාවත් දළදා වහන්සේ වෙනුවෙන් ඉටු කළහ.

> "එතැන් පටන් ඒ ගෙය දඨා ධාතුඝර නම් වී ඉක්බිති සම්පූර්ණ සිත් ඇති රජතෙමේ නව ලක්ෂයක් දන විසඳා දළදා මහ පෙළහැර කළේය. අවුරුදු පතා අභයගිරි විහාරයට වඩාගෙන ගොස් ඒ දන්තධාතුවට මෙබඳු පූජා කරවයි නියෝග කළේය. "
>
> **(මහාවංශය 94, 95 ගාථා)**

මේ ස්වභාවය වඩාත් තහවුරු වන්නේ ක්‍රි.ව. පස්වැනි සියවසේ ලංකාවට වැඩම කළ චීන ජාතික පාහියන් හිමියන්ගේ වාර්තාවට අනුවය.

> "තුන්වන මැද හරියේදී බුදුරදුන්ගේ දළදාව මහජනතාවට පෙන්වනු ලැබේ. රජතෙමේ මෙයට දින දහයකට කලින් කීමෙහි බිනිමෙහි සමත් මිනිසෙකු රජ ඇඳුම් පැළඳුම් හඳවා පළඳවා මොනවට සැරසූ මහ ඇතෙක්හු පිටද නංවා නුවර හැවිද අණ බෙර ගසා මෙසේ කියන්න සලස්වයි. බෝසතාණන් වහන්සේ තුන් අසෙකි කපක් මහත් බැර වඩා පැරුම් පිරූසේක. උන්වහන්සේ සිය සැප පහසු නොතකා සිය රජයද, සිය බිසවද, දරුවන්ද දන් දූන් සේක. තමන් ඇස් උගුල්ලා එය ඉල්ලා ආවුනට දන් දුන් සේක. සියලු සතුන් උදෙසා මේසා මහ දුක්විඳ අවසනැ ලොව්තුරා බුදුවූ සේක. උන්වහන්සේගේ පිරිනිවන් හවුරුදු 1497 ගත විය. ලෝ ඇස පියවී පවතී. මේ මුළු කාලයෙහි ලෝ වැස්සෝ

නිතරම සොවින් පෙළෙති. අද සිට දස දිනෙකින් ඒ බුදුරජුන් වහන්සේ දළදාව එළියට වැඩම කරවා අබාගිරි වෙහෙරට පමුණුවනු ලැබේ. පින් කැමති ගිහි පැවිදි සියල්ලෝම මග සම කෙරෙත්වා, කොවේ මගවේ සරසත්වා, පූද පිණිස , මල් හා සුවඳ පිළියෙල කෙරෙත්වා."

**(පාහියන්ගේ දේශාටන වාර්තාව)**

පාහියන් භික්ෂූන් වහන්සේ විසින් රචිත ස්වකීය දේශාටන වාර්තාවේ දළදා පෙරහැර පිළිබඳව අනුරාධපුරයේ ක්‍රි.ව. 5 වන සියවසේ පිළියෙල වූ ආකාරයයි. ඒ එදා මෙදාතුර අනුරාධපුරයෙන් ඇරඹී පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව කුරුණෑගල, මහනුවර දක්වා ඓතිහාසික ගමන දළදා වහන්සේ සුරක්ෂිත කරගනිමින් රාජධානිය නිරිතටත් දෙවනුව කන්ද උඩරටටත් ආරක්ෂාව පතා පැමිණි බව පෙනේ. මේ ගමන ශ්‍රී ලාංකික ජනතාවට නව විශ්වාස පද්ධතියක් නිර්මාණය කළ අතර, ලොව්තුරා බුදුන් වහන්සේ වෙනුවෙන් පවත්වන සියලු විධිවිධාන සහ තේවාවන් පවත්වමින් ලොව්තුරා බුදුන් වහන්සේට ඉටුකරනු ලබන වතාවත් ඉටුකරන බව පහත සඳහන් ප්‍රකාශයෙන් පෙනේ.

> "පූජ්‍ය වස්තු, විශේෂයෙන් පිළිම පිළිබඳ වූ වත්පිළිවෙත් පදනම් වූයේ ඒවාට ජීවමාන පුද්ගලයන්ට මෙන් සැලකිය යුතුය යන අදහස මත බැව් පෙනේ. ඒ අනුව ඒවා නැහැවීම ඒවාට ඇඳුම් ඇන්දවීම හා ආහාර කැවීම කරන ලදී. දළදාව දිනකට තුන්වරක් නහවන ලදැයි හියුංත්සා වාර්තා කොට ඇත."

**(ගුණවර්ධන 1993:239)**

බුදුන් වහන්සේ වෙනුවෙන් පැවැත්වූ මෙම චාරිත්‍ර නොකඩවාම විකාශනයවී වර්තමානයේ නානුමුර මංගල්‍යය වශයෙන් සතියේ බදාදා දිනවල කෙරෙන අන්දම පහත සඳහන් ප්‍රකාශයෙන් පෙනේ.

"නානුමුර මංගල්‍යය පවත්වන්නේ දහවල් මුළුතැන් පූජාවට පළමුව බැවින් උදෑසන මුළුතැන් පූජාවෙන් අනතුරුව ගන්ධකුටිය ඇතුළු සියලුම ස්ථානයත් පාත්‍රා ඇතුළු භාණ්ඩත් මැනවින් පිරිසිදු කළ යුතුය. ....... ඔහු දළදා කරඬුවේ ප්‍රතිබිම්භය කැඩපතට වැටෙන පරිදි කැඩපත අල්ලයි. ඒ අනුව තේවා භික්ෂුව කැඩපතේ දිස්වන කරඬුවේ ප්‍රතිබිම්භයෙහි නානු ආලේප කර සුවඳ පැනින් තෙවරක් සෝදා හරියි. ඉක්බිති තෙත මාත්තුකර ඒ භාණ්ඩ පිළිගැන්වීම සිදුවෙයි. එය අවසන් කර මල් දැක්වීමෙන් පසු ආලත්ති බෑම සිදුකෙරේ."

**(ධම්මාලෝක හිමි 2006:86)**

## සමාජ ඒකාග්‍රතාවය පිළිබඳ සාරධර්ම පද්ධතියක් ගොඩනැංවීම

ඉහත සඳහන් ඓතිහාසික තොරතුරු අනාවරණය කරණු ලබන්නේ ලොව්තුරා බුදුන් වහන්සේ සහ උන්වහන්සේගේ ස්වාසූ දහසක් ධර්මස්කන්ධය සුරක්ෂිත කිරීමටත් එය රාජ්‍යත්වයේ අනන්‍යතාවය බවත් එම ජයත්වය සහ සුරක්ෂිත කිරීම රට වැසියාගේ කාර්ය භාරය බවත් පිළිගැනීමයි. මේ අනුව විවිධ ජන කොටස් එකීය සමාජ විඥ්ඤානයකින් බැඳ තබමින් සුවිශේෂ සාරධර්ම පද්ධතියක් දළදා වහන්සේ වටා ගොඩනැගී තිබේ. මේ නිසා ලංකාවේ රාජ්‍යත්වයට පත්වූ සැම රජකෙනෙක්ම පාහේ දළදා වහන්සේ වෙනුවෙන් පවත්වනු ලැබූ බුහුමන්, හරසර සහ ප්‍රදානයන් තුළින් ගම්‍ය වූයේ " දළදා වහන්සේ යමෙකු සතු වේ නම් රාජ්‍යවත්වයද ඔහු සතුවේය. " යන අදහසයි. මේ නිසා විවිධ සොර සතුරු ආක්‍රමණවලින් දළදා වහන්සේ බේරා ගැනීම සඳහා නොයෙකුත් රහස්‍ය ස්ථානවල සඟවා තබමින් චෝල, පෘතුගීසි, ලන්දේසී සහ ඉංග්‍රීසි ආදී ආක්‍රමණවලින් බේරා ගත් බව සඳහන් කළ හැකිය.

මේ අනුව 1815 දී මහනුවර අල්ලාගන්නා තුරුම මුහුදුබඩ ප්‍රදේශවල සිට ශ්‍රී ලාංකේය සංස්කෘතියේ හැඩගැස්ම සඳහා නිර්මාණයවූ ඒකාග්‍ර ජන විඥ්ඥානය දළදා වහන්සේ විසින් නිර්මාණය කරනු ලැබිණි. මෙය වඩාත් හොඳින් දක්නට ලැබෙන්නේ ලංකාවේ බොහෝ ප්‍රදේශවල අස්ගිරි මල්වතු

නිකායික පන්සල් දක්නට ලැබීම සහ දළදා මාළිගාවට පූජා කරනු ලැබූ ඉඩම් දක්නට ලැබීමයි. එපමණක් නොව දළදා වහන්සේගේ ප්‍රධාන ගිහි භාරකාරයා තේරීම සඳහා දකුණේ හිනිදුම්පත්තුවේ ප්‍රාදේශීය ලේකම්වරයාටත් වරම් ලැබීම මේ නිසා දළදා වහන්සේ සහ දළදා පෙරහැර යනු ශ්‍රී ලංකාවාසී බෞද්ධ ජනතාවගේ මෙන්ම උතුරු, දකුණු නැගෙනහිර, බටහිර සියලු ජනතාවගේ ජන විඥානයේ ප්‍රතිබිම්භයි.

## සාරධර්ම පද්ධතිය, සමාජ පර්යාය පවත්වාගෙන යාම රාජ්‍යත්වය සහ යුක්තිය පසිඳලීම

මහනුවර යුගය වන විට ශ්‍රී ලාංකික සකල ජනතාවගේ ජාතික ඒකග්‍රතාවයේ මුදුන් මල්කඩ වූ දළදා වහන්සේ සහ වාර්ෂික දළදා පෙරහැර සමාජය ගොනු කිරීමේ ප්‍රධානාංගය බවට පත්විය. එයට මූලික හේතුව වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස දක්වාම දේව පෙරහැරක් බවට පත්ව තිබූ ඇසළ පෙරහැරෙ සියම් ජාතික උපාලි මාහිමිපාණන් වහන්සේගේ අනුදැන වැදෑරිමෙන් පසු දළදා පෙරහැරක් බවට පත්වීමයි. මේ සමඟම රජතුමා , දළදා වහන්සේ සහ සිව් දේවාල සතු ආඤාය බලය යන අංශ තුනක විශ්වාස පද්ධතියක් රාජ්‍ය තුළ බලපවත්වන්නට විය. මේ අනුව,

(i) දළදා වහන්සේ අනුහස, ශුද්ධත්වය, බලය ලබාදීම සහ ජනතාව සුරක්ෂිත කිරීම හා රාජ්‍ය ආරක්ෂාව

(ii) රජු නෛතික බලය පසිඳලීම සහ දළදා වහන්සේගේ ප්‍රධාන ආරක්ෂකයා හා මහජනතාවගේ ආරක්ෂකයා වීම.

(iii) සිව් දේවාල මගින් දළදා වහන්සේ සුරක්ෂිත කිරීම, රජු සුරක්ෂිත කිරීම සහ රට වැසියා ආරක්ෂා කිරීම.

ඉහත සඳහන් ආකාර තුනක බලයේ, ශුද්ධත්වය හා අණසකේ කේන්ද්‍රස්ථානය අගනුවර වූ මහනුවර වූ අතර එය පර්යන්තය දක්වා විශ්වාස පද්ධතියක් වශයෙන් ගම්දනව් දක්වා ගලා ගිය බව පහත සඳහන් වාර්තාවෙන් පෙනේ. 1921 දී වවුනියාවේ මඩුකන්ද රටේ මහත්තයා වූ කේ. ඒ. කපුරුහාමි **වරිගසභාව** පිළිබඳව එච්. ඩබ්. කොඩ්රින්ටන්ට යැවූ වාර්තාවේ එක්තරා නඩුවක විනිශ්චය පිළිබඳ **වරිගසභාව** ගත් තීන්දුව පහත පරිදි වේ.

> "රංමැණිකාට පුංචිරාළ විසින් අඬගසා කියා තිබුණු කුල දූස්සිය වචනේ අද දවසේ ...... මොහොට්ටාල ප්‍රධාන මුලාදෑණිවරු ඇහුම් බැලුම්කර බලා නිසි දඬමුඩ අයකර (එක බොරු වචනයක් හැටියට ඔප්පු වූ නියාවට මුලින් රං මැණිකාටද, ඒ ඇත්තියගේ ලේ නෑයින්ටද දී තිබුණු අණ තහනම් උඩ නිසා අහක්කර තිබෙන වගයි. එනම් සෙංකඩගල නුවර රංකොත් පත්තිරිප්පුව පවතින තුරු තහනම නැත. අද දවසේ පටන් ඒ ඇත්තිට මේ වචනය පිරිමියෙක් හරි, ගැහැණියක් හරි කොල්ලෙක් හරි, දර දබරයකින් වත් දිය දබරයකින්වත් අඩ දබරයකින් කෙළිපෙලකදී වත් අඬගහ කියන්නඩ තහනම්. **සිංහලේ මහ රජ්ජුරුවන්ගේ රං කඩුවේ රං ඔටුන්නේ අණ දන්නවා නම් තහනම් . මේ පළාතේ මහා ඒජන්ත උන්නාන්සේගේ අණ  දන්නවානම් තහනම්. නුවර වැවේ කුමාරසිංහ මුදියන්සේගේ තොප්පිහළුවේ අණ දන්නවා නම් තහනම් මේ අනඟාව පනවාපු දිසා මහත්මයාගේ** අණ දන්නවා නම් තහනම් දෙවෙනිවත්ව, තුන්වෙනිවත්ව, තහනම්, තහනම් තහනම්
>
> (JRAS (Ceylon) Vol. XXXVIII : 1948:106)

මෙම ප්‍රකාශනය වරිග සභාව තීන්දු කරනු ලැබුවේ 1921 ඉංග්‍රීසි පාලන සමයේය. මෙහිදී විශ්වාස පද්ධතිය හා සමාජ පර්යාය පවත්වාගෙන යාමට අවශ්‍ය යුක්තිය විසිඳලීමේ බලය ධුරාවලියක් ඔස්සේ වරිග සභාවට පැවරී තිබිණි.

රන්කොත් පත්තිරිප්පුව (දළදා වහන්සේ)

↓

සිංහලේ මහ රජ්ජුරුවන්ගේ රංකඬුවේ හා ඔටුන්නේ බලය
(නෛතික බලය)

↓

මහදිසාපති (ඉංග්‍රීසි රජයේ අණසක) ඒජන්ත

↓

නුවර වැවේ කුමාරසිංහ මුදියන්සේගේ තොප්පිහළුවේ අණසක
(වරිග සභාවට බලය දුන් ප්‍රාදේශීය බලය)

↓

ආඥාව පැනවූ දිසා මහත්තයා
(ප්‍රාදේශීය බලය ක්‍රියාත්මක කරන්න)

↓

වරිග සභාව

ඉංග්‍රීසි පාලන සමයක වුවද රටවැසියාගේ යුක්තිය පසිඳලීම පිළිබඳ විශ්වාස පද්ධතිය නිර්මාණය වී ඇත්තේ සිංහලයේ රජු හා ඔහුට බලය ලබාදෙන දළදා වහන්සේ මතය. ඉන් අනතුරුව ඉංග්‍රීසින්ගේ බල පරාක්‍රමය නිසා තිල බලය පවත්වාගෙන යනු ලබන මහනුවර දිසා , මහ දිසාපතිගේ අණසක වැදගත් සේ සලකනු ලබන අතර නැවතත් ප්‍රාදේශීය පාලනයේදී රජුගේ බලයත්, දළදා වහන්සේගේ අනුහසත් රැගෙන ක්‍රියාත්මක වන නුවර වැවේ කුමාරසිංහ මුදියන්සේගේ තොප්පිහළුවේ අණසක (සාම්ප්‍රදායික වරිග සභාවට බලයදුන් රජුගේ කිරීටය යටතේ තිබෙන නුවරවැවේ කුමාරසිංහ මුදියන්සේගේ තොප්පිය හෙවත් රජු විසින් දෙවාවදාරන ලද හිස් වැස්ම) සහ අවසාන බලධාරියා වූ වරිග සභාවේ කිට්ටුම බලවතා වන දිසා මහත්තයා යන ධුරාවලියේ අවසාන පුරුක මෙයට අයත් වේ.

මෙහිදී වැදගත්ම සාධකය වන්නේ කවර බලයක් පැවතුනද ඒ සියල්ල අභිබවා යුක්තිය පසිඳලීමේ විශ්වාසය රජු සහ ඊට උඩින් ඇති දළදා මාලිගාවේ රන් පත්තිරුප්පුවෙන් බලාපොරොත්තු වූ බවයි.

මේ අනුව රජු සහ දළදා වහන්සේ පිළිබඳව අප්‍රමාණ වූ බලයක් සහ ශුද්ධත්වයෙන් ඔප්නැංවු ගෞරවයක් , සෑම පුරවැසියෙකු තුළම සවිඥානකව මනස තුළ පැලපදියම්ව තිබුණු බව පෙනේ. මෙමබලය, අණසක සහ ගෞරවනීය ශුද්ධත්වය සමඟ සතර දේවාල මගින් දේවාශිර්වාදය සහ රට ආරක්ෂා කිරීම පිණිස යොමු වුණු නාථ, විෂ්ණු, කතරගම සහ පත්තිනි යන සතර දේවාල අගනුවර වු සෙංකඩගල පුරය කේන්ද්‍රය කොටගෙන රජුගේ පාලන ප්‍රදේශවල පර්යන්තයීය වශයෙන් ස්ථාපිත වුයේ විහාර හා ආරාම ආශ්‍රිතවය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් යුක්තිය පසිඳලීම පිළිබඳ **විස්වාස පද්ධතියට** තෙයාකාරයක ත්‍රිමූර්තියක් ගොඩනැංවුණි. මේ නිසා මහනුවර යුගයේ මෑත කාලීන ඉංග්‍රීසි පරිපාලන සමයේ පවා,

දළදා වහන්සේ
සිව්දේවාල දෙවියන්
රජතුමා යන ත්‍රිමූර්තිය

පදනම් කොටගෙන දිව්රිම හෝ අවම වශයෙන් සමාජයේ නඩුහබ විසඳීමේදී දෙවියන් ඉදිරියේ දිවුරුම් දී දෙපාර්ශ්වය සමථයක පත්කිරීමටත් ඒ මගින් යුක්තිය පසිඳලීමටත් පෙළඹුණු බව පහත සඳහන් උදාරණයෙන් පෙනේ.

"1823 අප්‍රේල් මස 2 වැනි දින මහනුවර මඟුල් මඩුවේදීය." මින් මතු මේ උසාවියේ සාක්ෂි කාරයින් ලෙස පෙනී සිටින බෞද්ධ භක්තිකයෝ පහත සඳහන් ලෙස දිවුරුම් දිය යුත්තාහ. ගිහියෙකු තම සාක්ෂියේ සත්‍යතාව ගැන දිවුරුම් දියයුතු විට ලියනආරච්චි , හිරගේ කන්කානම, කටුපුල්ලේ කෝරළේ ආරච්චිල යන මොවුන් විසින් හේ මහ දේවාලයේ දැඩිමුණ්ඩ දේවතා බණ්ඩාර කෝවිලට හෝ පත්තිනි දේවාලයට කැඳවාගෙන යනු ලැබේ. දේවාලවල දොරවල් විවෘත කළ විට කපුරාළ යාතිකා කරයි. ඉන්පසු සාක්ෂිකාරයා පූජාසනයට ළංවී දේව රූප දෙසට අත් ඔසවා මෙසේ කිව යුතුය. මම අසවලා කෙරෙහි වෛරයෙන් විරුද්ධව හෝ අසවලා කෙරෙහි ප්‍රේමයෙන් පක්ෂව හෝ බෝරු සාක්ෂි දුනිම් නම් මේ එසවූ අත් කොර විය යුතුය. මම අසවලා සම්බන්ධයෙන් ඇසු දෙය හා ඇත්ත වශයෙන් දුටු දෙය ප්‍රකාශ කරමි. මම

බොරුවක් හෝ අසත්‍යයක් පැවසුවේ නම් තුන් දවසක් හෝ තුන් වරුවක් හෝ හත් දවසක් හෝ හත්වරුවක් ඇතුළත දෙවියෝ මට දඬුවම් කරත්වා."

**(සර් ජෝන් ඩොයිලි 1966:88)**

මෙම නඩු විසඳීමේ ක්‍රමය ස්වයං විනය වර්ධනය කිරීමේ ක්‍රමයක් මෙන්ම දේව භක්තිය ,රජ අණසක සහ දළදා වහන්සේ පිළිබඳව පැවති අසීමිත ගරුත්වය පදනම් වී සිදුවුන බව පෙනේ. මේ අනුව ඉතා පැහැදිලිව පෙනීයන කරුණක් වන්නේ දළදා වහන්සේ හා රාජ්‍යත්වයත් , සතර දේවාලවල දෙවියන්ගේ ආශිර්වාදයත් "දළදා වහන්සේ පිළිබඳ සාරධර්ම පද්ධතිය මගින් යුක්තිය පසිඳවාලීම සඳහාත් ඒ මගින් සමාජ පර්යාය පවත්වා ගෙනයාම සඳහාත් උදව් වූ බව පෙනේ.

## දළදා වහන්සේ වටා ගෙතී ඇති සශ්‍රීකත්වය, සමෘද්ධිය සහ වර්ෂාව ලබාදීම පිළිබඳ විශ්වාස පද්ධතිය

දළදා වහන්සේ සතු අප්‍රමාණ බල මහිමය සහ රටේ සශ්‍රීකත්වය සහ සමෘද්ධියත් වර්ෂාවත් ලබාදීමට හැකියාව ඇති බව දළදා පෙරහැර සහ දළදා වහන්සේ වෙනුවෙන් කරනු ලබන පුද පූජාවලින් පැහැදිලිව පෙනීයයි. කෘෂිකාර්මික රටක් වශයෙන් මෝසම් වැස්ස රටේ සමෘද්ධිය කෙරෙහි තීරණාත්මක සාධකයක් වී තිබේ. මේ නිසා වාර්ෂික දළදා පෙරහැර යනු වැස්ස ලබාගැනීම සඳහා දළදා වහන්සේ සහ සතර දේවාලවල දෙවියන් වෙනුවෙන් පවත්වනු ලබන පූජෝත්සවයක් ලෙස ද හැඳින්වේ. (Aluwihare 1952)

දළදා වහන්සේ සතු මෙම වර්ෂාව ලබාදීමේ බලය පිළිබඳව චූලවංශකරුවා සඳහන් කරන්නේ "දළදාව පෙරහැරින් රැගෙන යනවිට බලවත් වර්ෂාවක් පැවති නමුත් වළාකුළු පෙරහැරට ඉදිරියෙන් ගිය බැවින් පෙරහැරේ ගමන් ගත් අයට කිසිදු දුෂ්කරතාවයකට පත් නොවුන බවය. (චුලවංශය : 239-240 ) ක්‍රි.ව. 1236-1270 අතර රාජ්‍ය කළ හතරවන පැරකුම්බා

රජු විසින් පනවන ලද නීති පාඨයට අනුව " වැසි නොවස්නා කලැ මෙමැ ලෙසින් දළදා පූජා කරනුව ඉසා " යනුවෙන් දළදා සිරිතේ සඳහන් (සෙනවිරත්න 2003: 215) පාඨය තුළින් වැස්ස ලබාගැනිම සඳහා දළදා වහන්සේ වැඩමවා පෙරහැර කරවීම ලක්දිව ඉතා පැරණි යුගයේ සිටම පැවැති චාරිත්‍රයක් විය. මේ නිසා වැස්ස ලබාදීමේ නිසග හැකියාව ඇති වස්තූන් අතරට දළදා වහන්සේට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

ශ්‍රී ලංකාවට වැස්ස ලබාදීම කළ හැකි වස්තූන් අතර වැස්ස වළාහක දෙවියන්, දළදා වහන්සේ ධාර්මික රජතුමා සහ ශ්‍රී මහ බෝධීන් වහන්සේ යන වස්තූන් වැදගත්වේ (Dissanayake 1992) 1815 දී ශ්‍රී ලංකාව ඉංග්‍රීසින් විසින් අත්පත් කර ගැනීමෙන් පසු දළදා වහන්සේට නිසිපරිදි චාරිත්‍ර වාරිත්‍ර ඉටුනොකිරීමත් වාර්ෂික පෙරහැර මංගල්‍යය නොපැවැත්වීමත් නිසා දැඩි නියඟ කාල පරිච්ඡේදයක් උදාවීමත්, ආහාර හිඟය හා කෙත්වතු විනාශවීමත් හේතු කොට ගෙන උඩරට ප්‍රධානීන් සහ උභය මහා විහාරයේ භික්ෂූන් වහන්සේගේ ඉල්ලීම පරිදි 1828 දී එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරතුමාගේ කාලයෙහි දළදා වහන්සේ වැඩමවා මහ පෙරහැරක් කළ බව සඳහන් වේ. (පීරිස් 1964:131) මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මහවැසි නොකඩවා ඇද හැළී ගංගා දෙගොඩතලා වට ජලයෙන් වැව් අමුණු කැඩී බිඳී ගිය බවත් ඒ පුරාවෘත්තය කෙතරම් සුවිශේෂ වූයේ ද යත් "දළදා වතුර" නමින් සුවිශේෂ ග්‍රන්ථයක් නිර්මාණය වූ බව පෙනේ.

මේ අනුව දළදා වහන්සේ යනු ලක්වැසියනට වැස්ස ලබාදෙන ආශ්චර්යමත් වස්තුව බව බොහෝදෙනාගේ අදහසයි. වර්තමානයේදී වුවද දුර්භික්ෂ සමයක පෙර නිමිති පහළවත්ම දළදා වහන්සේ වෙනුවෙන් භාරහාරවීමත් , වැසි පිරිත සජ්ජායනා කිරීම, සති පිරිත් සජ්ජායනය වැනි වත් පිළිවෙත් සමුදායක් ක්‍රියාත්මක කරනු ලැබේ. දළදා පෙරහැරේ අවසාන දිනයේදී ගැටඹේ තොටේ දියකැපීමේ දවල් පෙරහැර මංගල්‍යය මෙම වැස්ස ලබාදීම පිළිබඳව දෙවියන්ට කෙරෙන සංකේතාත්මක ක්‍රියාවලියේ කොටසක් ලෙස සැලකේ.

## රට විපත්වලින් බේරාගැනීමේ ශක්තිය දළදා වහන්සේට ඇතැයි යන විශ්වාස පද්ධතිය සහ ඒ වටා ගෙතුණු සාරධර්ම පද්ධතිය

ලොව්තුරා බුදුන් වහන්සේ සතුව පැවති අසම සම ධර්ම ගුණය හා සර්වඥතා ඥානය හේතුකොට ගෙන මිනිසුන් විපතින් මුදවාගැනීමේ ශක්තිය උන්වහන්සේ ජීවත්ව සිටි කාලයේදී ප්‍රකට කළ ආකාරයටම දළදා වහන්සේටත්, ශ්‍රී ලංකා වැසියන්ට සිදුවන විපත්වලින් බේරාගැනීමට හැකියාවක් ඇතැයි විශ්වාස කෙරේ. මෙම විශ්වාස පද්ධතියට අනුව ක්‍රියාකිරීම අනුරාධපුර යුගයේ සිටම පැවති බවට සාක්ෂි තිබේ. මේ නිසාම රජුත් පුරවැසියනුත් බේරාගැනීමට දළදා වහන්සේ සුරක්ෂිත කළ යුතුය. යන සාරධර්මය තුළ රැඳී දළදා වහන්සේ නිරිත දිග රාජධානිය කරා ගෙනයාමත් පසුකාලීනව සෙංකඩගලපුරවයේ නිත්‍ය ලෙස තැන්පත් කිරීමටත් හේතු වූයේ මෙම සුරක්ෂිතතාවය පිළිබඳ පදනම හේතු කොටගෙනය. දළදා වහන්සේට කරනු ලබන පුද පූජා නිසි පරිදි ඉටුකිරීමෙන් රට විපත් සහ දුර්භික්ෂවලින් බේරාගත හැකි බව පාහියන් හිමියන් සිය වාර්තාවේ සඳහන් කරයි.

> "රාජධානියට දුර්භික්ෂවලින්, විපත්වලින් හෝ විප්ලව වලින් කිසිදු හානියක් සිදුනොවේයයි. පාහියන් කියා සිටී...තවද දෙවැනි පරාක්‍රමබාහු සමයේදී නපුරු ග්‍රහ අපලයක් හේතුකොට ගෙන හටගත් නියගයකින් රට වැනසීයාමට පටන්ගත් වෙලේ නගරය වටා පෙරහරින් දන්ත ධාතුව ගෙනයන ලදින් මහ වැසි ඇති විය. නියං සමයෙහි දළදාව පෙරහැරින් ගෙනයායුතු බැව් දළදා සිරිතෙන් නියම කරනු ලැබ ඇත. මේ අනුව පිරිත් ගායනා කිරිමත් , දළදාව පිළිබඳව වත් පිළිවෙත් ආදීයත් සමඟ ලෙඩ සුව කිරීම යකුන් පලවා හැරීම හා විශේෂයෙන් වැසි වැස්සවීම වැනි වැදගත් අද්භූත කාර්යයන් පිළිබඳ විශ්වාස සම්බන්ධ වී තිබූ බව පැහැදිලිය.
>
> **(ගුණවර්ධන 1993:233)**

මේ හේතුන් නිසා නිතිපතාම දළදා වහන්සේ වැඳපුදා ගැනීමට

පැමිණෙන බැතිමතුන් රෝගාබාධවලින් ගැලවීම සඳහාත් අපල උපද්‍රවලින් බේරීම සඳහාත් දළදා වහන්සේට භාරහාරවෙති. එපමණක් නොව මතු බුදුවන මෛත්‍රී බුදුන් වහන්සේ වෙනුවෙන් ශ්‍රී නාථ දේවාලයේ විවිධ පුද සත්කාර ඉටුකරනු ලබන අතර ඒ අසල පිහිටා ඇති වැල් බෝධිය අතිශය හාස්කම් ඇති ස්ථානයක් ලෙස සලකා භාරහාර පුද පූජා පවත්වති.

මේ හැර බෞද්ධයෙකු වශයෙන් ඉපදුණු ශ්‍රී ලාංකිකයෙකු ස්වකීය දරුවා පළමුවන තුන්මාසය තුළදී දළදා මාළිගාවට වඩාගෙනවුත් වැඩ සිටින මාළිගාවේ ඉදිරිපස එළිපත්ත මත දරුවා තබා දළදා වහන්සේට භාරකරති. විශේෂයෙන් දළදා වහන්සේ වටා පිහිටා ඇති සියලුම ප්‍රාදේශීය පාලනය යටතේ සිටින පුරවැසියන් මෙම පුරුද්ද ඉෂ්ට කරනු ලබන්නේ රෝග සහ ග්‍රහ දෝෂත්, අපලවලිනුත් මුදා ශාන්තිය ලගා කර දෙන ලෙස ඉල්ලා ආයාචනය කිරිමෙනි.

### ශ්‍රී ලංකාවේ සෑම රාජ්‍ය නායකයෙකුම නිල කටයුතු ආරම්භ කිරීමට පෙර දළදා වැඳපුදාගත යුතුය යන විශ්වාස පද්ධතිය

දළදා වහන්සේ යනු ජීවමාන බුදුරජාණන් වහන්සේ වන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයාගේ පරම පවිත්‍ර වගකීම වන්නේ දළදා වහන්සේ සුරක්ෂිත කිරීමත්, උන්වහන්සේගෙන් ආශිර්වාද ලබාගත යුතුය යන වගකීම සෑම ලාංකිකයෙකුම සතුව පවතී. එමෙන්ම ශ්‍රී ලාංකික සෑම භූපතිවරයෙක්ම බෞද්ධයෙකු විය යුතුයයිද විශ්වාසයක් පවතී.

"දිවයිනේ රජ දරුවන් හැමවිමට බෞද්ධයින් විය යුතු යයිද
සිංහල රාජවංශය කෙලින්ම බුදුන්ගේ පෙළපතින් පැවතඑන්නේ යයි ද"

(ගුණවර්ධන 1993:180 යන අදහස)

පවතින හෙයින් ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය පාලකයින් මෙන්ම විවිධ තනතුරු හොබවන මැති - ඇමති මන්ත්‍රී හමුදා නිලධාරින් ආදී ප්‍රභූන්ද ප්‍රථමයෙන් සිය රාජකාරි ආරම්භ කිරීමට ප්‍රථම දළදා වැඳපුදාගෙන අස්ගිරි - මල්වතු උභය පාර්ශවයේ ආශිර්වාදය ලබාගැනීමට අමතක නොකරන්නේ

මෙම විශ්වාස පද්ධතිය නිසාය. ඉහතින් දැක්වූ සංකල්පය නිසාම බොහෝ දෙමළ රජ දරුවන් පවා ස්වකීය පාලන කාලයේදී දෙමළ නම් ගම් වෙනස් කොට සිංහල බෞද්ධ නම් දරා රාජ්‍ය පාලනය කළෝය.

## ජාතික සමඟිය ඇති කිරීමට දළදා වහන්සේට හැකියාවක් ඇතැයි යන විශ්වාස පද්ධතිය

ශ්‍රී දළදා වහන්සේ සහ උන්වහන්සේ වටා ඇති බොහෝ පුද සත්කාර විධීන් බොහෝමයක් පාරම්පරික රජදරුවන් වෙනුවෙන් ඉටුකළ ඒවාවේ. විශේෂයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස එතුමාට කළයුතු සියලුම තේවාවන් දළදා වහන්සේට ඉටුකළ යුතු බවට නීතිරීති පැනවූවා පමණක් නොව එතුමාගේ හිසකේවලින් මුස්නක් සාදා වැඩ සිටින මල් ආසනය ඇමදීම සඳහා පූජාකරනු ලැබිණි. පසුකාලීන බොහෝ රජවරු ස්වකීය දකුණු ඉන්දීය සම්භවය පවත්වමින්ම බෞද්ධ වත්පිළිවෙලිවෙත් ප්‍රගුණ කරමින් ආරක්ෂා කළහ. මේ නිසා දළදා වහන්සේ වටා ඇති බොහෝ වත් පිළිවෙත් හින්දු සම්මුතීන් සමඟ සැසදේ. එමෙන්ම කතරගම දේවාලයේ සහ කටුකැලේ පුල්ලයාරේ දේවාලයේ පූජකවරුන් ප්‍රමුඛ හින්දු ජනයා දළදා මාළිගාව වෙනුවෙන් පූජා සත්කාර ඉටකරනු ලබන අතර අවසාන රන්දෝලි පෙරහැරවලදී ස්වකීය අනන්‍යතාවය ප්‍රකට කරමින් බෞද්ධයන් සමඟ සමඟියෙන් ක්‍රියා කරනවා පමණක් නොව සුවිශේෂ වත්පිළිවෙත් ද ඉටු කරති. මේ පිළිබඳ කිසිදු ගැටුමක් ඉතිහාසයේ වාර්තා වී නොමැත. මේ අනුව දළදා වහන්සේ සහ දළදා පෙරහැර යනු සිංහල දෙමළ මිත්‍රත්වය සනාථ කරන උතුම් විශ්වාස පද්ධතියක් ද නිරූපනය කොට තිබේ.

ඉහත සඳහන් කරුණු අනුව සලකා බලනවිට දළදා වහන්සේ, දළදා පෙරහැරේ ශ්‍රී ලාංකිය කේන්ද්‍රය සාරධර්ම පද්ධතියේ සුවිශේෂ විශ්වාස හා ප්‍රතිමාන පද්ධතියක් නිර්මාණය කොට තිබෙන අතර එය අනාදීමත් කාලයක් තිස්සේ මිනිසුන් තුළ ක්‍රියාත්මක වන ප්‍රත්‍යක්ෂ හැසිරීම් මෝස්තරයේ කොටසක් බවට පත්වී තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


1927 චූලවංශය (විල්හෙල්ම් ගයිගර් සංස්කරණය ලන්ඩන් PTS)

1948 JRAS (Ceylon) Vol. xxxviii:PP106

1952 Aluwihare , Richard, The Kandy Esala Perehera , Colombo . M. D. Gunasena & Co.,,

1964 පීරිස්. රැල්ෆ්, සිංහල සමාජ සංවිධානය කොළඹ සීමාරහිත සමන් ප්‍රකාශකයෝ

1966 ඩොයිලි, ජෝන් සිංහලේ ආණ්ඩුක්‍රමය , කොළඹ සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

1992 Dissanayake J.B. Water in Culture Colombo Minister of Environment

1992 Indira. R. "Socio - Cultrual Basis of Value Development " (eds) National Council of Educations Rercarch and Training. **Education in Values** New Delhi :E.R.T

1992 Seshadric, C " Values and Education :- Philosophical Perspectives" (eds) National Council of Education Research and Training **Education in Values** New Delhi :E.R.T.

1993 ගුණවර්ධන, රණවීර, සිවුර සහ නගුල, කොළඹ සමාජ විද්‍යාඥයින්ගේ සංගමය

1996 මහාවංශය (හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ සංස්කරණය, ද්විතියික භාවය, කොළඹ : දීපානි ප්‍රකාශන)

2003 සෙනෙවිරත්න අනුරාධ, ලක්දිව බුදු සසුන හා සිංහල සංස්කෘතිය කොළඹත එස්. ගොඩගේ සහ සහෝදරයෝ

2006 ධම්මලෝක හිමි වරකාවේ , පූජනීය දළදා සංස්කෘතිය , මහනුවර; මධ්‍යම පළාත් පරිසර අමාත්‍යාංශය.

# නූතන ගීතය සහ සිරි දළදා වහන්සේ

**මහින්ද රත්නායක**
කථිකාචාර්ය සිංහල අධ්‍යයන අංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

වසර දහස් ගණනක ඉතිහාසයක් ඇති දළදා වහන්සේ සිංහල බෞද්ධයාගේ මුදුන් මල්කඩ වෙයි. පන්සල් භූමියක් වන්දනාමාන කිරීමේදී ශාරීරික, පාරිභෝගික, උද්දේසික ලෙසින් ගන්නා පිළිවෙළ අනුව ප්‍රමුඛතම පූජ්‍ය වස්තුව ලෙස පූජාර්හ වනුයේ ශාරීරික ගනයට ගැනෙන වස්තූන් වේ. ඒ අතරින් වසර දහස් ගණනාවක් පුරා සිංහල බෞද්ධයාගේ නොමඳ ගෞරවාදරයට ගෝචර වූ පූජ්‍ය වස්තුව වනුයේ මහනුවර දළදා මාළිගයේ වැඩ වාසය කරන දන්ත ධාතූන් වහන්සේයි. ගෞතම බුදුන් වහන්සේගේ ශ්‍රී වාම දන්ත ධාතුව එසේ පූජාවට ලක් වන අතරේ උන් වහන්සේගේ දක්ෂිණ දන්ත ධාතුව පොළොන්නරුව සමීපයේ ඇති සෝමාවතී චෛත්‍යයේ තැන්පත්ව ඇතැයි පිළිගැනේ. එහෙත් එම ධාතූන් වහන්සේට මහනුවර දළදා මාළිගාවේ තැන්පත් කොට ඇති මෙම දළදාවට තරම් පුද සත්කාර ලැබී ඇති බවක් ඉතිහාසයෙන් සොයා ගත හැකි නොවේ. පරසතුරු උවදුරු ආදිය නිසා ජනතාවගෙන් ඈත්ව ගිය සෝමාවතියේ ධාතූන් වහන්සේගේ විද්‍යාමාන නොවීම නිසා ද මහනුවර දළදා වහන්සේට හිමි වනුයේ සුවිශේෂී ස්ථානයකි. වසර ගණනාවක් තිස්සේ මිනිසුන්ගේ සැපෙහිදී මෙන්ම දුකෙහිදීත් එක සමානව පිහිටට සිටි උන්වහන්සේ ඇසළ පෙරහැර නම් වූ බෞද්ධයාගේ අති උත්කර්ෂවත් සංස්කෘතික සංදර්ශනයේ ද හේතුපාධය වෙයි.

නිතරම තමන්ගේ අත්දැකීම් පරාසයම නිර්මාණකරණය සඳහා ගෝචර කොටගත් සාහිත්‍ය - කලා ක්ෂේත්‍රයන්හි නියුතු වූවන්ට දළදා වහන්සේත් එය ප්‍රමුඛ කොට කෙරෙන දළදා උත්සවය වැනි අගනා සංස්කෘතික සංදර්ශනයනුත් ඇස ගැටීම අරුමයක් නොවේ. එදිනෙදා දිවියේ අත්විඳින්නා වූ නේක විධ ඓශ්වර්යයන් මුඛ්‍ය කොටගත් මෙවන් වස්තු විෂයයන් දළදා වහන්සේ වෙතින් ද සාහිත්‍යකරුවාට, කලාකරුවාට හිමි

විණ. තමන්ගේ සිත නිතර ලබා දුන් ආගමික භක්තිය පෙරටු කොටගෙන සිටි කවියාගේ සිතට මෙන් ම විචාර පූර්වක කෝණයකින් ඒ දෙස බැලූ කවියාට ද දළදා වහන්සේ එක සේ වස්තු විෂය සැපයීය. අපගේ ව්‍යායාමය වනුයේ ගීත සාහිත්‍යයේ දළදා වහන්සේගේ එසේ නා නා විධ ලෙස විෂය වූ අයුරු විග්‍රහ කොට බැලීමයි.

පද්‍යයෙන් දළදා වහන්සේ පිළිබඳ ගොඩනැගුණු කතිකාවත විවිධ ක්ෂේත්‍ර ගණනාවක් යටතේ හඳුනාගත හැකි වෙයි. ඒ ජන කවි, කාව්‍ය සංග්‍රහ, නිසදැස් කාව්‍යය, කර්තෘ ඥාත සිව්පද කවි සහ ගීත ඈ ලෙසිනි.

අනුරාධපුර යුගයේ කිත්සිරි මෙවන් (ක්‍රි.ව. 301 - 328) රජ දවස දළදාව ලංකාවට වැඩමෙව් දා සිට මේ වන තෙක් එය වටා පබැඳෙන අලුත් සාහිත්‍යයක් හඳුනාගත හැකි වෙයි. සිංහල සහ පාලි යන භාෂා දෙකෙන් ම රචනා වන මෙම සාහිත්‍යයේ පළමු කැපී පෙනෙන අවස්ථාව වනුයේ සිංහල "දාඨාවංශයේ" පළ වීමයි. පොළොන්නරු සමයේ එය "දාඨාවංශ" නමින් පාලියට පරිවර්තනය වෙයි. මෙම දළදා සාහිත්‍යයේ වැදගත්ම ප්‍රකාශනයක් වනුයේ කුරුණෑගල යුගයේ, එනම් 13 වන ශතවර්ෂයේදී රචනා වන දළදා සිරිතයි. වෘත්තගන්ධී ශෛලියේ මූලික ලක්ෂණ අන්තර්ගත මෙම කෘතිය දළදාව සම්බන්ධයෙන් මුණ ගැසෙන කාව්‍යාත්මක පළමු ප්‍රවේශය වෙයි. "විරිත් සුවඳ වහනය වන" යනු විසින් අර්ථකථනය කළ හැකි "වෘත්තගන්ධි" යන්නෙහි අර්ථය ද එයයි. මෙසේ ගද්‍යයෙන් ගත් කාව්‍යාත්මක ප්‍රවේශය අපට ඊළඟට විවිධ විරිත් ගත් සිව්පදයක් ලෙස සන්දේශ කාව්‍යයේදී මුණගැසේ. ඒ ඒ රාජධානි සමයන්හි දළදා වහන්සේ වැඩ වාසය කළ ස්ථාන දූත කාර්යයේ යෙදුණ පක්ෂීන්ට මුණ ගැසුණ අවස්ථා සන්දේශ කවියා සිය වර්ණනාවට නතු කොට ගෙන ඇත.

විහිදා කැලුම් සිත ලෙව් සත නෙත තරඟ
සුසදා රඟන හෙළ දිවඹර ලසඳ රඟ
ඇමදා සතන් නද කළ සුර නර උරඟ
දළදා හිමිඳු වැඳැ පල ලබ සඟ'ප වග
(පරෙවි සන්දේශය)

ලොව විහිදා සුදු පැහැ සඳ රැසෙව් සැදී
දෙන නොමදා සිරි සගමොක් සැප නිසැදී
ළද මුනිදා දම් කඳ පහස මන බැඳී
වඳු දළදා හිමි තෙමහල් පහයැ රැඳී
(සැළලිහිණි සන්දේශය)

මුනිදා පින් පිඬුව පෙනුණා මෙන් ලොවට
විහිදා රන් රුවන් රැස් දිගත එළි කොට
ඇමදා දිළි සතන් නෙත් සිත් සතුටු කොට
දළදා මැඳුරතට වැඳ නමැද පුද කොට
(හංස සන්දේශය)

ලොව නොමදින් පිරි ගණඳුර දමා දුර
සිය කිරණින් හැරැ පැමිණෙන උදා ගිර
ලැග නිවෙසින් හැඟි තෙරුවන් මෙනේ කර
මිතුර වඩින් දළදා ගෙට මනෝහර
(සැවුල් සන්දේශය)

මෙම සියලු සන්දේශ කාව්‍යයන්හි දී සිද්ධ වූයේ දළදා වහන්සේගේ ගුණ කදම්භය වර්ණනා කරමින් එවන් ගුණයන්ගෙන් සුමූපේත දළදා වහන්සේ වැඳගෙන ගමන් කරන ලෙස දූතයාට දැනුම් දීමයි. සැළලිහිණි සන්දේශයේ එන කවියේ අරුත් පැහැරුම ගත් විට එකරුණ මොනවට සාධනය වෙයි.

"චන්ද්‍ර රශ්මිය මෙන් සැදුණු සුදු පැහැය ලෝකයෙහි විහිදුවා, නිරන්තරයෙන් නොමඳ වූ සගසිරි හා මොක් සැප දෙන, බුදුරදුන්ගේ සිත්හි බැඳුණු ධර්මස්කන්ධයෙහි ස්පර්ශ ලැබුවා වූ තුන් මහල් ප්‍රාසාදයෙහි රැඳුණා වූ

දළදා හිමියන් වඩින්න."[1]

දළදා වහන්සේ සම්බන්ධ කාව්‍ය සංග්‍රහයන් වැඩිමනත් මුණ ගැසෙනුයේ මහනුවර යුගයේදීය. චූල සම්ප්‍රදාය නියෝජනය කරන ජන කාව්‍යමය ලක්ෂණ ප්‍රකට කරන්නා වූ මෙම කාව්‍ය සංග්‍රහයන් අතර දළදා පුවත හෙවත් දළදා හටනේ කවි, දළදා වතුර, දළදා පෙන්වීම, දළදා පූජා, - විරිඳු, දළදා සින්දුව, දළදාවලිය, දළදා සරණේ (කතාව), දළදා අෂ්ටක වැනි කාව්‍ය සංග්‍රහ දක්නට ලැබේ.[2]

දන්ත ධාතුව සම්බන්ධ කොටගෙන කවි කියූවන් අතර සාමාන්‍ය ජනයා ප්‍රධාන වේ. තමන් ඇසූ, දුටුව දේ තලානුකූලව සිව්පදයකින් කීම ගැමියා උරුම කොට ගත්තේ කාලාන්තරයක් තිස්සේ සිද්ධ වූ මිනිස් සංහතියේ පරිණාමයත් සමඟිනි. සරල, සුගම බස් වහරින්, ගම්තුලානෙන් සොයාගත් උපමා රූපකාදියෙන් අලංකෘත වන මෙම කවිය අපි ජන කවි ලෙස හඳුනා ගනිමු. දළදා වහන්සේ සම්බන්ධ කොටගෙන එසේ පබැඳුණ ජන කවි අදටත් දනන් තුඩඟ රැව් පිළිරැව් දේ.

| | |
|---|---|
| මැද්ද මණ්ඩලේ විමසා | බලක්ඤං |
| බුද්ධ සාසනේ දළදා | වඩිඤ්ඤං |
| සුද්ද ලෙසට කවි සීපද | කියඤ්ඤං |
| බුද්ධ අණින් සිව්පද වස් | අරිඤ්ඤං |

| | |
|---|---|
| දන්ත කුමරු මෙහි වැඩමෙව් | දළදා |
| පින්වත් කිත්සිරි පිළිගත් | දළදා |
| සෙංකඩගල පුර දවම් | දළදා |
| සුන්දර නිවනට වඩිමුව | දළදා |

1. සුචරිත ගම්ලත්, සැළලිහිණි සන්දේශය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1995, 43 පිටුව
2. උදය ප්‍රශාන්ත මැද්දේගම, මහනුවර යුගයේ දළදා කවි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2005.

මෙලෙසින් ම කොළඹ යුගයේ කවියාට ද දන්ත ධාතුව සිය නිර්මාණ සඳහා නොමදව වස්තු විෂය සැපයීය.

ඇඳි සළුපට ගෙන සෝදා
දළදා සමිඳුන්ට පුදා
කඩුවට ගෙල දුන්නේ එදා
ගුරුකමටයි උඹට මෙදා

(දරු නැළවිල්ල, එස්. මහින්ද හිමි)

දළදා අණින් සිරිලක සැප වැඩි වේවා
දළදා රකින්නට දෙවියන් තුටු වේවා
දළදා පුදා නසන දන බල නැති වේවා
දළදා සමිඳු හට අපෙ දිවි පුද වේවා

(පියදාස සිරිසේන, ශ්‍රී දංෂ්ට්‍රා ධාතුන් වහන්සේ I)

නොනමි හිමි පුද ඉවසමින් මෙන් උදම් වැඩු බඹ සුර ගෙණේ
උතුම් දළදා සිමිඳු වැජඹී වදාරණ සිරිකර ගුණේ
හඟිමි පෙවෙණිය සැපත ඉමහත පත්තිරිප්පුව පෙරමුණේ
දැකුම්කලු පුර සිරි මහා කව මැඳුර කුලකැයි සැලකුණේ

(ආනන්ද රාජකරුණා)

මෙලෙසින් ආරබ්ධ දළදා වහන්සේ කේන්ද්‍ර කොට ගත් පද්‍යාවලිය අද වන විට යුගයේ ජනප්‍රියම කලා මාධ්‍යයක් වන ගීත මාධ්‍යයට අවතීර්ණ වී ඇත. විවිධ ගී පද රචකයින්ගේ තෙලි තුඩට හසුව, විවිධ ගායක ගායිකාවන්ගේ මධුර කටහඬින්, විවිධ සංගීතඥයන්ගේ සත්සර රටාවෙන් ඔප වැටී ගැයෙන එම ගීත, වස්තු විෂයීය වශයෙන් සුවිශාල ක්ෂේත්‍රයක විස්තාරණය වූයේ වෙයි. ඒ අතරේ,

(i) දළදා වහන්සේගේ, උන් වහන්සේ වැඩ වසන මාළිගාවේ මෙන්ම නුවර වැව ඇතුළු වටපිටාවේ සිරිය/ ඉතිහාසය පැවසෙන ගී

(ii) දළදා වහන්සේගේ ගුණ ගැයෙන ගී

(iii) ජනතාවගේ දුක - සතුට ඉත සිතින් ඉවසන, සතුට සාදා දෙනු වස් පෙළහර පාන දළදා වහන්සේ සම්බන්ධ කොට පිහිට ඉල්ලා ගැයෙන ගී

(iv) සමාජ අසාධාරණය පිටු දැකීමට රචිත ගී

ඈ විෂයය ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ලෙස විභේදනයකට නතු කළ හැක්කේ වෙයි. ඒ අතරින් දළදා වහන්සේගේ ඉතිහාස කතාව පාදක කොට ගත් ගී වැඩි ප්‍රමාණයක් සොයාගත හැකිවීම විශේෂ ලක්ෂණයකි. යුග ගණනායක් තිස්සේ ඉතාමත් ජනප්‍රිය වූ ධර්මදාස වල්පොලගේ හඬින් ගැයුණ "උත්තම මුනි දළදා" ගීතය එහි විෂයයේ මුලටම එයි.

"උත්තම මුනි දළදා වඩම්මන - මොක්පුර රන් නෞකා
බලන් සකි - සත් සමදුරු ගැඹරේ
උදේනි රජ පුත් දන්ත කුමරුවන් - උදේනි රජ දූ මාලි කුමරියන්
කෙස් කළඹේ සඟවා හිසින් ගෙන - උත්තම මුනි දළදා ....
තඹවන් වැල්ලට මල්වැහි වස්සන - නිසි කල රන් ගොයමේ කිරි වද්දන
උත්තම මුනි දළදා හිසින්ගෙන - කෙස් කළඹේ සඟවා වඩම්මන
මොක්පුර රන් නෞකා බලන් සකි - සත් සමුදුර ගැඹරේ

සත්සිය වසරක් අනුරපුරේයා - ලක්දිව පින්කෙත කිරි උතුරායා
උත්තම මුනි දළදා හිසින්ගෙන - කෙස් කළඹේ සඟවා වඩම්මන
මොක්පුර රන් නෞකා බලන් සකි - සත් සමුදුර ගැඹරේ
උත්තම මුනි දළදා ...."

දළදා පුවත වැනි ග්‍රන්ථවල මෙන්ම ශතවර්ෂ ගණනාවක් තිස්සේ දනන් තුඩඟ රැව්දුන් ජනප්‍රවාදයන්හි සඳහන් වූ පරිදි උදේනි රජුගේ පුත්‍රයා සහ ගුහසිව රජුගේ දුහිතෘ දෙදෙනාට දන්ත ධාතුවේ භාරකාරත්වය පැවරීමෙන් අනතුරුව ලක්දිවට වැඩමෙව් කතා පුවතය, දළදා වහන්සේගේ

ඉතිහාස කතාව වනුයේ. දළදාව පැහැර ගැනීමට කියා යුද්ධයට එන පිරිස සමඟ වන සටනින් තමන් මිය ගිය හොත් හේමමාලා සහ දන්ත කුමරු යන දෙදෙනා විසින් එය ලක්දිවට ගෙන යා යුතු බවට ගුහසිව රජු ප්‍රකාශයට පත් කළ අයුරු දළදා පුවත නම් කාව්‍ය සංග්‍රහය හෙළිදරව් කරනුයේ මෙලෙසය.

273 කව - සටනට ගොස් පබඳ - වී නම් පරාජය සෙද
දළදා මහිමි සඳ - රැගෙන තොපි නොසිට ලොබ බැඳ

274 කව - දද වෙසකින් සොඳට - යුක්තය තොපි දෙදෙන තුට
සිංහල දිවයිනට - යවයි පැවසූ නිරිඳු මෙලෙසට[3]

විශාරද සනත් නන්දසිරිගේ සුසත් සර එකමුතුව වූ අජන්තා රණසිංහ පද රචනය කළ යට දැක් වූ ගීතය දළදා වහන්සේ උදේනි රජුගේ පුත්‍ර දන්ත සහ යේලණියන් වූ හේමමාලා විසින් ඇගේ කෙස් කළඹේ සඟවාගෙන ලංකාවට ගෙන ආ ආකාරය දැක්වෙන ඉතිහාස කතාව විස්තර කරයි. එසේම මෙම ගීතයේ ලංකාවට ගෙනා පසු ලක්දිවදී දළදාවේ ඉතිහාසය ගැන ද කියැවෙයි. එනම්, වසර සත්සියයක් දළදා වහන්සේ අනුරපුර රාජධානියේ වැඩ සිටිමින් ලංකාව සශ්‍රීක කළ බවයි. එසේම දන්ත කුමරු හා හේමමාලා විසින් ආරක්ෂා කොට ලංකාවට ගෙන ආ දළදාව සම්බන්ධ ජනතාව තුළ කලාන්තරයක් තිස්සේ වැඩෙමින් ආ විශ්වාසයක් ගැන ද මෙම ගීතයේ දැක්වේ. එනම් "තඹවන් වැල්ලට මල්වැහි වස්සන - නිසි කල රන් ගොයමේ කිරි වද්දන" යනුවෙන් දැක්වෙන පරිදි දළදා වහන්සේ නිසි කලට වැසි වතුර දී රට සෞභාග්‍යමත් කරන බවට ජනතාව තුළ අදටද තදින් පවතින විශ්වාසය පිළිබඳ ප්‍රකාශනයයි.

"කැල්මෙන් දසදික් බබළන - ලොල් දළදා හිමිට සොබන
කල් සහදන රැස්ව එදින - මල් වර්ෂා වස්සවමින" (156 කව)

3. උදය ප්‍රශාන්ත මැද්දේගම, මහනුවර යුගයේ දළදා කවි, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2005. 108 පිටුව.

ලෙසින් දළදා පුවත ද විස්තර කරන මෙම ප්‍රාතිහාර්යපෑම වර්තමානයේදී වුව අප ඇස් පණාපිට ම ඔප්පු වන කාරණයකි. 2009 වසරේ තද නියඟයක් ආ විට දින දහයක් පුරා පැවැත් වූ දළදා ප්‍රදර්ශනයෙන් මුළු ලක්දිවට ම නොකඩවා වැසි වැටෙන්නට පටන් ගත් අයුරු කාටත් අමුතුවෙන් මතක් කොට දිය යුතු නොවේ. එසේම වහින්නට තබා වහින්නට හිතකවත් නොතිබෙන අහසේ සෑම වසරකම පෙරහැර හමාර වී දළදාව ගෙවදින විට අඩු තරමේ නුවර ප්‍රදේශයටවත් මහා වැස්සක් ඇඳ හැලීම කඩ නොවන ප්‍රාතිහාර්යකි. "දළදා වතුර" නම් කවිපොත බ්‍රිතාන්‍ය පාලකයින් දළදා වහන්සේ සතු බලය අවතක්සේරුවට ලක් කොට එල්ල කළ අභියෝගයකට පිළිතුරු වශයෙන් කළ දළදා පෙරහැර නිසා ගං වතුර ගලා මුළු නුවරක් ජලයෙන් යටවූ ආකාරය විග්‍රහ කිරීම ඒ බව තවදුරටත් සනාථ කරයි.

අරුත් විසින් එසේ වන යට දක් වූ ගීතයේ පද පිළිවෙල මෙන්ම නාද රටාව ගැනද යමක් කිව යුතුය. එනම්, තේමාව හා සම්බන්ධ කොටගෙන වැයෙන තම්මැට්ටම්, බෙරහඬ අසන්නා ඉදිරියේ පෙරහැරක් පෙන්වීමට තරම් අලංකාර සුසංයෝජනයක් වන බවයි. පද්‍යයට වඩා ගීතයේ ඇති එක් විශේෂත්වයක් වනුයේ සංගීත සංධ්වනියයි. දළදා පෙරහැරක ශ්‍රී විභූතිය මෙම ගීතය ශ්‍රවණය කරන්නා ඉදිරියේ ප්‍රාදූර්භූත කිරීමට සංගීතය කරන සම්මාදම සුළුපටු නොවේ.

මෙලෙසින්ම දළදා වහන්සේ ලංකාවට ගෙන ආ ඉතිහාස කතාව විස්තර කෙරෙන ගීතයක් ලෙස මෑත කාලයේ සාගරික ගෝමස්ගේ මුවින් ගැයුණ "තිලෝනා - මුනි රාජාගේ" ගීතය දක්විය හැකිය. හේමමාලාවන්ගේ ආත්ම ප්‍රකාශනයක් ලෙස ගැයෙන මෙම ගීතය දශක ගණනාවක් පුරා ඉතාම ජනප්‍රිය ගීතයක් ලෙස අසන්නට ලැබෙන්නකි.

"තිලෝනා - මුනි රාජාගේ - ශ්‍රී දළදා පෙන්වමි ........ //
මාගේ හිසකේ ගර්භයෙහි - සඟවාගෙන ආ සාදරෙන්
අත්ලට ස්වාමි - ගෙන වඩවමි

දාඨා දා අප දිය නාගේ ....."

දන්ත ධාතුවේ ඉතිහාස කතාව සේම දළදා මාළිගය, ඒ අවට වටපිටාව ආදී දෑ වස්තු විෂය කොටගෙන ගීත රචනා වී ඇත.

සරත් විමලවීර ලියූ චිත්‍රා සෝමපාලගේ හඬින් ගැයෙන "නුවර වැවේ" ගීතය සහ ඇගේම හඬින් ගැයෙන "නුවර අලංකාරේ" ගීතය ද මේ අතර වැදගත් වෙයි.

නුවර වැවේ - නුවර වැවේ
නුවර වැවේ සුනිල දියේ
කුමුදු පිපේ - ඇහැළ මලේ
ඇහැළ මහේ මල් බර ඇහැළ මහේ ....

හැන්දෑ යාමේ කොමල කුමරියෝ - වැවරවුමේ හැසිරේ
කුඩා ළමෝ ප්‍රීතියෙන් පිරිලා - ඇවිදිති සිරි නරඹා
මල්බර ඇහැළ මහේ ....
හේවිසි හොරණෑ ගණ්ඨා නාදේ - දළදා මැඳුරේ පැතිරෙන්නේ
සැදැහැවතුන්ගේ සාදු සාදු හඬ - ඒ සමඟම මුසු වන්නේ
මල්බර ඇහැළ මහේ .....
(ගායනය - චිත්‍රා සෝමපාල, ගීත රචනය - සරත් විමලවීර)

නුවර අලංකාරේ නුවර අලංකාරේ
මුළු ලොව පැතිරේ - රමණී නාමේ
අසදිස මහනුවරේ ......

සදහම් ආලෝකේ - පැතිරෙව් සමිඳාගේ
සිරි දළදාවන් තැන්පත් වීයේ
දළදා මන්දිරේ .....

ඒ සීගිරි කුමරියන් ලෙසේ - රංකිර මැණික් ලියෝ
මුකුළු සිනා පා සිරි නරඹන්නා
මනහර වැව රවුමේ ....

(ගායනය - චිත්‍රා සෝමපාල, ගීත රචනය - පියසේන කොස්තා)

මාළිගාව හා අවට වස්තු විෂය කොටගත් ළමා ගී කිහිපයක් ද සිංහල දළදා ගීතාවලියට ඇතුළත් වේ. ඒ අතර

"සෙංකඩගල පුර දළදා මැඳුරේ - මාළිගාවේ ඉඳලා
මේ දූන් ආවේ මම වැව අයිනට - දන්ත ධාතු වැඳලා"

යන ගීතය අද යුගයේ ද නිතර ඇසෙන ජනප්‍රිය ළමා ගීතයකි.

මෙලෙසින් ම නූතන ගීත රචකයාට වස්තු විෂය සැපයූ තවත් අලංකාර දර්ශනයක් වූයේ පෙරහැරයි. වසරක් පාසා ඇසළ මාසයේ කෙරෙන අති විචිත්‍ර දළදා පෙරහැර සිංහල බෞද්ධයාගේ සංස්කෘතික සංදර්ශන අතර ඉතාමත් උත්කර්ෂවත් වූද, පූජනීය වූද, සෞන්දර්යාත්මක වූද, පෙළහර වෙයි. සුසිල් ප්‍රේමරත්නගේ හඬින් ඒ අසිරිය ප්‍රකට වූයේ මෙලෙසිනි.

"සිංහල ජන සංගීත මැවුණා - හේවිසි ගැටබෙර නාද ඇසුණා
දළදා පෙරහැර මේ - සිරියා පා සුර ලෝකය වාගේ
දූන් පෙරහැර එනවා ......."

ඉතාමත් අලංකාර පද එකතුවකින් දළදා පෙරහැර ඇස් හමුවේ මවා පාන ගීතයක් ලෙස සුනිල් සරත් පෙරේරා විසින් පබැඳුණු 'සේසත් නංවා' ගීතය දැක්විය හැකිය. සේසත් - චාමර නංවාගෙන අති ගාම්භීර ලෙස කරඬුව වඩමාගෙන එන පෙරහැරේ තම්මැට්ටම් - ගැටබෙර හඬට ඇසෙන වන්නම් සීපද ශ්‍රාවකයා ඉදිරියේ අඩුවක් නැතිව අති උත්කර්ෂවත් දළදා පෙරහැරක් මවා පෙන්වයි.

'සේසත් නංවා චාමර සොලවා
ඇතුපිට රන්වන් කරඬුව හිඳුවා
සම්බුදු ගුණ ගී මිහිරට ගයවා
පුන්සඳ පානේ පෙරහැර එනවා

තම්මැට - ගැටබෙර නාද ඇසෙනවා
තරඟෙට සට පට කස පුපුරනවා
වන්නම් සීපද රාව නැඟෙනවා
පන්දම් එළියෙන් පෙරහැර එනවා

සාර බුලත් විට මුලටම එන්නේ
කාලා බලන්නට පාට වැටෙන්නේ
පාර දෙපස අප පෙළට සැදෙන්නේ
තාන තනම් දෙන පෙරහැර එන්නේ'
(ගායනය - නිරංජලා පීරිස්, සංගීතය - ඩබ්.ඩී. අමරදේව, ගීත රචනය - සුනිල් සරත් පෙරේරා)

මෙලෙසින් ම දළදා පෙරහැරේ අලංකාරත්වය වචනයෙන් වචනය මවා පාන අපූර්ව නිර්මාණයක් ලෙස ලීලනන්ද රත්නායක ගයන මෙම ගීතය හඳුනාගත හැකි වේ.

'සේසත්ද තෝමරද - ගී නදද තාලම්
හේවිසිද තම්මැටද - අනු වැයෙන තානම්
තානත්ත තානත්ත - තානත්ත තානම්
මේ එන්නේ පෙරහැරය - සුර සෙනඟ අන්දම්

සේසත් නැංවේ - චාමර සෙලවේ
කස පුපුරන්නේ - උඩු ගුවනේ
ගැට බෙර නාදේ - නැඟි නැඟි එන්නේ
දළදා පෙරහැර මේ එන්නේ

ගිගිරිද සොලවා - තාලම් හඬවා
සම්බුදු  ගුණ ගී පවසන්නේ
කංකිණි අනුරාවෙන් ගුම් ගන්නේ
දළදා පෙරහැර මේ එන්නේ
(ගායනය - ලීලානන්ද රත්නායක, පද රචනය - ඩබ්.ජ්. අබේසිංහ)

දළදා පෙරහැර ගැනද වර්ණනා කෙරෙන සුජාතා අත්තනායක විසින් ගැයූ 'සාධු දන්ත දා' ගීතය දළදා වහන්සේ නූතන ගීත රචකයාට ගෝචර වූ විවිධ පැතිකඩයන්හි තවත් විෂය ක්ෂේත්‍රයක් අනාවරණය කොට දෙයි. ඒ දළදා වහන්සේගේ මහාර්ඝ වූ ගුණ, තේජස පිළිබඳ ප්‍රදීපනයයි.

'සාදු දන්ත දා  - වඳිමි සාදු ශාන්ති ශ්‍රී පතාලා
සාදු දන්තා දා .......
ශාක්‍ය ලෝහිනී විරාජ - දෙසූ දහම් අමා
සාදු දන්ත දා .......
සෙංකඩගල පූජ්‍ය නගරෙ - ඇසළ පෝය පෙරහැරේ
ආදි කාලේ රජ මැතිඳුන් - සාදරෙන් වඳිමි අමා
සාදු දන්ත දා .......
දන්ත ධාතු ප්‍රාතිහාර්ය - ශෝභමාන දීපයේ
මෝක්ෂ සැපේ ශ්‍රී විහිදේ - සාදරෙන් වඳිමි අමා'

මෙලෙසින් ශ්‍රී දළදා වහන්සේගේ ගුණ කදම්බය විස්තර වන ගීත කොතෙකුත් සිංහල ගී පද රචකයා අතින් නිර්මාණය වී තිබේ. උන් වහන්සේගේ තෙද බලයෙන් ලංකාද්වීපය, සිංහල ජාතිය කිසිදු අපල උපද්‍රවයකින් තොරව විභූෂිතව පවතින බව හෝ එසේ පැවතීමට ආශිර්වාද කරන ලෙස කියා ගීත රචකයා නිරන්තරයෙන් දළදා වහන්සේගෙන් අයැද සිටිනු දක්නට ලැබේ.

මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න විසින් රචිත - සනත් මල්කාන්ති යුවළ විසින් ගැයෙන 'ඉර හඳ පායන සිංහල දීපේ - සිරි දළදා හිමි රැක

දෙන්ටයි - ජාති ජාති හෙළබිම උපදින්ටයි' ගීතය මෙන්ම අමිතා වැදිසිංහ ගයන 'සෙංකඩගල පුර දළදා බුදුරැස් විහිදෙන තුරු නැහැ වැරදින්නේ - සිංහලයන් හට සිංහල දේසෙට සරණයි දළදා සමිඳුන්නේ' යන ජනප්‍රිය ගීතය ද ඒ අතර ප්‍රමුඛ වෙයි.

ආචාර්ය දයාරත්න රණතුංග - අමරා රණතුංග යුවල ගයන 'සිරි දළදා වරුණේ ගජ කුඹු තලයේ' ගීතය ද තත් විෂය ක්ෂේත්‍රයට අදාළ කළ හැක්කකි. එසේම ශ්‍රී ලාංකීය අනන්‍යතාව සටහන් කිරීමට මෙන් ඕනෑම ජාතික උළෙලකදී අසන්නට ලැබෙන සංගීත් නිපුන් සනත් නන්දසිරිගෙන් ගීතවත් වන 'මගේ රටට' ගීතය දළදා වහන්සේගේ ගුණ වැයෙන ගීත අතරේ ප්‍රමුඛ තැනක සිටියි.

'මගේ රටට දළදා හිමි සරණයි
මගේ දූයට දළදා හිමි සෙවණයි
සැපතින් සපිරුණු නිවහල් දෙරණයි
උපතින් මා හට මේ සැම උරුමයි

දළදා මැඳුරේ රන්කොත මුදුණේ
මිණි කිරණින් මුළු රටම අවදි වේ
දෙදහස් වසරක මහරු අතීතය
සීහ තේජසින් යළි පිබිදේ

සමිඳුන් සෙවණේ ජය දද නැඟුණා
ජය ගී ගැයුණා ජය බෙර වැයුණා
මෙතනම මේ දූය එක ලෙස බැඳුණේ
සිතිවිල බිය සංකා දුරු කෙරුණේ'

රඹුක්කන සිද්ධාර්ථ හිමි විසින් රචිත දිස්නා අතපත්තු ගයන 'ශාන්ති

දායක' යන ගීතය ද එසේ දළදා වහන්සේගේ ගුණ කදම්භය ගැන කෙරෙන ගායනයකි.

'ශාන්ති දායක - ශාන්ති දායක
ශාන්තිවාදී බුදු පියාණන්
දෙසූ සඳහම් මහිම රැව්දුන්
මගේ මව්බිම වාසනාවන්

රත්නමාලි කොත් කැරැල්ලේ
බුද්ධ රශ්මිය වාසනාවන්
ජය ශ්‍රී මහ බෝ රජුන්ගේ
අනුහසින් රට වාසනාවන්

සාදු දළදා වඳිමු සැමදා
නුවර වැව පිපි මල් නෙළාගන්
එපින් අරගෙන රට රකීවා
ලෝක සාසන දෙව්රජාණන්'

බෞද්ධයාගේ මුදුන් මල්කඩ වූ දළදා වහන්සේ සිල්වත් උවැස උවැසියන්ගේ ගෞරවාදාරයට පාත්‍ර වූයේ ලෝකෝත්තර සම්පත්තිය ළඟා කොට දීමේ අප්‍රතිහත, උත්තම වූ වස්තුවක් ලෙසිනි. කෙලෙසුන් ඇසුරෙන් කෙරෙන සියලු අත් වැරදි, කට වැරදි සියල්ල පසෙක ලා කිලිටි සෝදාගෙන පරම පවිත්‍ර වූ නිර්වාණයට යාම සඳහාය දළදා වහන්සේගේ පිහිට අයැද සිටියේ. එහෙත් කාලයාගේ ඇවෑමෙන් මේ උතුම් අභිලාෂය සාමාන්‍ය පෘථග්ජනයාගේ මතකයෙන් ගිලිහී ලෞකික ආස්වාදය ප්‍රමිත කරන්නා වූ පිහිටක් ඉල්ලා ගැනීමට මිනිසා නොදැනුවත්වම මෙන් දළදා වහන්සේ යදින්නට පටන් ගත්තේය. ප්‍රේමවන්තයාට, ප්‍රේමවන්තියට දළදා වහන්සේ අමතකව නොගියේ එහෙයිනි. තමන්ගේ ප්‍රේමය සඵල කොට දෙන මෙන් කියා, තමන්ට ප්‍රේමයක් සොයා දෙන ලෙස කියා, තමන්ගේ විරහව නිවන ලෙස කියා ප්‍රේමවන්තයා, ප්‍රේමවන්තිය වසර ගණනාවක් තිස්සේ දළදා

සම්බුදුන්ගේ අභියස කන්නලව් කරන්නට පටන් ගත්තෝය. බොහෝ දෙනෙක් ප්‍රේමයේ සුන්දරත්වය විඳීමට, ප්‍රේම කිරීමට, අල්ලාප සල්ලාපයේ යෙදීමට දළදා වහන්සේ සොයාගෙන ගියෝය. ඒ ගිය ඇතැමුන්ට බලන්නට සිදු වූයේ උඩරට ගැහැනියගේ ආඩම්බරකමයි. ප්‍රියා සූරියසේන, නිරංජලා සරෝජනීගෙන් 'ගෙල වට බැන්දා වූ මුතු පොටේ' ගීතයෙන් ඇසෙන්නේ ඒ ගැනයි. මුල සිටම තමන්ගේ අදහස් ප්‍රතික්ෂේප කරන තරුණියට තරුණයා පහර ගසන්නේ ඇල්ලිය යුතු හොඳම තැනින් අල්ලාගෙනය. එනම් ගැහැණියගේ අධ්‍යාත්මික දෙවොල වූ දළදා වහන්සේ මතක් කොට දීමෙනි.

'සෙංකඩගල පුර දළදා සඳ මෙන් මේ මුතු මැණිකේලා'

එහෙත් කටකාර යුවතිය උපන් තැනම ඔහුගේ උපක්‍රමය ව්‍යර්ථ කොට දමනුයේ ඉතාමත් සූක්ෂම ලෙසිනි. ඇය තරුණයාට දළදා වහන්සේ යනු අති පාරිශුද්ධ, ලෝකොත්තර ප්‍රතිෂ්ඨාව වන බව මතක් කොට දෙනුයේ සදාචාරය පිළිබඳ සීමා මායිම් ද පෙන්වා දෙමිනි.

'දළදා සම්බුදුන් වැඩ සිටිනා බිම නෑ සුබ නෑ ඕවා'

එසේම බොහෝ අවස්ථාවල දළදා මාළිගාවට එන ලෙස කියා ප්‍රේමවන්තයා හෝ ප්‍රේමවන්තිය කරන ආරාධනා නිතරම මෙන් සිංහල ගීත සාහිත්‍යයේ දක්නට ලැබේ.

'සල් සපු මල් දෙවැට දිගේ පිපිලද දුනුකේ
පෝයට දළදා වඳින්න එනවද මැණිකේ'

කියමින් සිසර සේනාරත්න සිය පෙම්වතියට දෙවැට දිගේ පිපුණු සල්, සපු මල් නෙළාගෙන දළදා වැඳීමට එන ලෙස කියා ආරාධනා කරයි. ඒ අතරේ තවත් පෙම්වත් යුවළක් තමන් සිය පෙම්බරා හෝ පෙම්බරිය සමඟ එසේ ගොස් දළදා වැන්ද සැටි සිහි කරති.

'සහසක් පැතුමන් පිපෙනා හදවත
එකම පැතුම හදවතක දරාගෙන

ඇහැළ මහට පුන්සඳ පැයූදා
මතකද අපි සරි දළදා වැන්දා'

(සනත් නන්දසිරි සහ මල්කාන්ති නන්දසිරි)

ටී.එම් ජයරත්න, නීලා වික්‍රමසිංහ සමඟ ගයන "නිසොල්මනේ අව්රස්නේ" යන ගීතයේ පෙම්වතා පෙම්වතියට කියනුයේ දළදා සරණින් සෞභාග්‍යයේ අරුණළු තමන් දෙදෙනාගේ ජීවිතයට වැටෙන්නට කියාය.

'දළදා සරණින් පින් පල දීලා - වැස්ස වැටීයන් ගමට මගේ
සරුවට හේනම නිල් ගැහී - ලා නිල් ගැහී'

මෙතැනදී ද දළදා වහන්සේ රටට, ගමට වැසි එල ලබාදෙන බවට ඇති විශ්වාසය තවදුරටත් තහවුරු කරවයි.

කරුණාරත්න දිවුල්ගනේ ගයන "හන්තාන දෙසින් එන' ගීතයේ පෙම්වතිය වියෝ වූ පෙම්වතා මහ සෙනඟ අතරේ තම පෙම්වතිය සිටීදැයි තමන්ම රවටා ගැනීමට බොරුවක් මවාගෙන පෙරහැර දෙස බලා සිටිනුයේ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වී වසර ගණනාවකට පසුවය.

'හන්තාන දෙසින් එන
මුදු සීත සුළං රැලි
ඔබ තාම හොඳින් හඳුනනවා නම්
මේ පාන ඔබේ සුරතින් දැල්වූ
මං බෝම ප්‍රවේසම් කරගන්නම්

සංසාර පුරුද්දටදෝ මන්දා
ගංගාව ශෝකයෙන් වැළපෙනවා .....//
මං තාම මහවැලි ගං ඉවුරේ
වැලි පාර දිගේ හවසට යනවා

තනි වී අද මා මේ වැව රවුමේ

දළදා පෙරහැරෙ සිරි නරඹනවා ...... //
මහ සෙනඟ අතර ඔබ කොතැනක හෝ
එහි ඉඳිනු ඇතැයි නිකමට සිතිලා

ඇතමුන් සිය පෙම්වතිය සමඟ දළදා වන්දනා කළ ආකාරය සිහි කරන විට තවත් අයෙක් තමන්ට ගැළපෙන සහකාරිය සොයා දෙන ලෙස කියමින් දළදා වහන්සේ යදිති.

'දළදා හාමුදුරුවනේ ඇසළ පෝය දවසේ
අලුත් සහල් මංගල්ලෙට මං තනියෙන් ආවේ
තනි නොතනිය යන්ඩ එක්ක මේ දුර සංසාරේ
ආල හිතක් මට ලැබෙන්න පැතුවා එන වාරේ'

සමුද්‍ර වෙත්තසිංහ විසින් පබැඳි රෝහණ වීරසිංහ සංගීතවත් කළ සුනිල් එදිරසිංහගේ හඬින් ගැයෙන මෙම අපූරු ගීතය අද යුගයේ ඉතාමත් ජනප්‍රිය, සුගායනීය ගීතයකි. විශේෂයෙන් සාමාන්‍ය ජන සමාජයේ මෙන්ම විශ්වවිද්‍යාල වැනි බුද්ධිමත් සමාජයේදී පවා බහු ව්‍යාප්ත විශ්වාසයක් වන 'දළදා මාළිගාවට ගොස් දින හතක් නොකඩවා මල් පූජා කොට තමන්ට ගැළපෙන සහකාරිය හෝ සහකරුවා ලබාදෙන ලෙස ඉල්ලූ විට දින හතක් ඇතුළත එය අනිවාර්යෙන් සඵල වේ.' යන මතයය, මෙම මනෝහර ගීතය මගින් ප්‍රතිරාවය වනුයේ, (ඇතැමුන්ගේ විශ්වාසය අනුව ඒ මල් කඩුපුල් මල් වීම අනිවාර්ය වෙයි) මෙම ජන විශ්වාසය පණ ගන්වන ගීතය කියනුයේ අලුත් සහල් මංගල්ලෙට අනෙක් අය තම දූ දරුවන්ද, අඹුවන්ද සමඟ පැමිණ සිටින බවයි. එහෙත් මොහුට සිදුව ඇත්තේ තනිවම පැමිණීමටයි. අස්වැන්නක් ගෙට ගැනීම සන්තුෂ්ටියක් වනුයේ එය භුක්ති විඳීමට උරුමක්කාරයින් ගෙදර සිටින විටයි. ඒ සරුසාර අස්වැන්න දකින විට බිරිඳගේ, දරුවන්ගේ මුහුණේ පිපෙන සිනා මල් දකින විටයි. එහෙත් මේ සරුසාර අස්වැන්න දකින ඔහු එහි ප්‍රබෝධය නැත. ඔහු අලුත් සහල් ටික ද රැගෙනවිත් මාළිගාවේ පූජා කරන අතරේ අයදිනුයේ ඒ අඩුව පුරවා දෙන ලෙස කියාය.

'පාළු කුඹුරු අස්වද්දන රන් බිජුවට වෙන්නයි

නිල් පැල්පත කිරිවද්දන කිරිගෙන වැඩ එන්ටයි
මාත් එක්ක සංසාරේ අත්වැල බැඳ ගන්ටයි
කාත් කව්රුවත් නැති මට එළියක් වී ඉන්ටයි'

ඔහුගේ කුඹුර වී බිජුවට දුන්න ද ජීවිතය පාළු වී ඇත. ඒ පාළු කෙත අස්වද්දන රන් බිජුවට ඔහුට අවැසිය. ගොයම ඉහළ ඇදී කෙත නිල්ල ගසා සිටිය ද කිරිවැද්දීමට කෙනෙක් අවැසිය. එනම්, ශ්‍රී සෞභාග්‍යය රැගෙන, ඇය ආ යුතුය. කථිකයා ඉතාමත් අහිංසක ලෙස ඒ තමන්ගේ ජීවන සහකාරිය සොයා දෙන ලෙස දළදා හිමිගෙන් ඉල්ලයි. කාට හෝ බලපෑමක්. අඩන්තේට්ටමක් කොට ඔහු බිරිඳක් කැන්දාගෙන ආවේ නැත. ඔහු ඉතා අහිංසක ගැමි තරුණයෙකි. කාත් කව්රුවත් නැති පැලේ ඔහු ඉන්නේ තනිවමයි. ඔහු ඒ පාළුව, කාන්සිය නැති කොට ගැනීමට ඉල්ලා සිටිනුයේ අහිංසක ගැමි බිරිඳකි. බක් මාසයේ පසළොස්වක පෝය පසු වී යෙදෙන සත් වෙනි දිනට පසු කෙරෙන මංගල්‍යයක් නිසා අලුත් අවුරුද්ද හුදකලාව ගතකළ ඔහුට තම පැලේ අඩුව මෙලෙසින් තදින්ම දැනෙන්නට ඇතුවාට සැකයක් නැත. මෙම ගීතයේ නාද රටාවටම සමාන වන සමින්ද ලංකා සමරසිංහ නම් වූ මෑත කාලීන යුගයේ කවියා අතින් ප්‍රකාශ වනුයේ ද ඒ හා සමාන අත්දැකීමකි.

'කියන්න වෙන කෙනෙක් නැති නිසා
දළදා හාමුරුවනේ - ඒකයි මම ආවේ
බෝම ඉස්සරින් හමු වුණ ආල හිතක් හින්දා
ජීවත්වෙන බව දැනුණා මම සතුටින් හිටියා
ඒ හිත ළඟ නිවන, බුදුන් දෙවියන් ඇති සිතුණා
සමාවෙන්න දළදා හාමුරුවනේ -
සෙංකඩගල මාළිගාව මගේ මතකෙන් මැකුණා

මගේ නිවන වූ ආලය පිරිනිවි වුණු හින්දා
පුහුදුන් සිත දහස් වරක් මැරි මැරී දුක් වින්දා
මේ ගින්නෙන් අත් මිදෙන්න වෙන්ව යන්න හිතුණා
සමාවෙන්න දළදා හාමුදුරුවනේ -

සෙංකඩගල මාළිගාව මගේ මතකෙට නැඟුණා'

මෙහි කථකයා ප්‍රේමයෙන් හොඳටම පරාජය වී ඇත. විරහ දුකින් හෙම්බත්ව සිටින ඔහුට තමන්ගේ දුක කීමට වෙන කිසිවෙකු නොමැති නිසා දළදා හාමුදුරුවන් සොයා එයි. එහිදී කථකයා සිය අතීතය සිහි කරනුයේ සියුම් පසුතැවීමකුත් සමඟිනි. ඔහුට එදා අඩුවක් නැතිව ලැබුණ ආදරය නිසා දෙවියන්, බුදුන්, නිවන සොයා මාළිගාවට හෝ වෙනත් සිද්ධස්ථානයකට යාමට අවශ්‍ය නොවීය. සෙංකඩගල මාළිගාව ඔහුගේ සිතින් මැකී ගියේ එහෙයිනි. එහෙත් සතර දිගින් වැටුණ ආදර වැස්ස හමාර වී තද නියඟයෙන් සිත දැවෙන විට ඔහුට සෙංකඩගල මාළිගාව නැවත සිහියට නැගෙයි. පරාද වූ ප්‍රේමයෙන් පීඩා විඳින සිත සනසා ගැනීමට ඔහු දළදා සමිඳුගේ ඉදිරිපිට සමාව යදිමින් සිය දුක ප්‍රකාශ කරයි. අහිංසක පෙම්වතුන් පෙම්වතියන් මෙසේ අහිංසක ලෙස තම ප්‍රේමය  ජයගැනීමට පිහිටක් යදිනා අතරේ ඇතැමුන් තමන්ගේ මනෝරථය පූරණය කොට ගැනීමට කියා මේ උතුම් දළදා වහන්සේ ලෝකෝත්තර සංකේතය බව සිතා මතාම අමතක කොට යාතිකා කරන ආකාරයක් ද පෙනේ. නූතන ගීතයේ ඉතාමත්ම බොළඳ, රසහීන ගීතයක් වුවද දළදා වහනසේ වස්තු විෂය වන නිසා මෙතැනදී සාකච්ඡාවට ගත යුතු මතු දැක්වෙන ගීතය ඒ සඳහා කදිම උදාහරණයකි.

'සතියේ නිවාඩුවට නුවරට මං එන්නම්
දෙන්නම එකතුවෙලා දළදා වඳින්න යං ........//
ඔයාගේ මව්පියන්ට බැහැ අපි වෙන් කරන්න
හීනෙන්වත් මට බෑ වෛරය අවුල වන්න'

යනුවෙන් ශෂිකා නිසංසලා විසින් ගයන ගීතය ශ්‍රාවක සිතෙහි ආදර ආලම්බනයක් ඇති කරන්නේ නැත. මෙවන් යැදීම් සඳහා දළදා වහන්සේ යොදා ගැනීම පාපයක් බව ශ්‍රාවක සිතට හැඟීම වළකනු බැරිය. පිහිටක් වන්නේ නම් දළදා වහන්සේ කළ යුත්තේ ඔහුගේ මව්පියන් කුමන හේතු කාරණාවක් නිසා ඇයව ප්‍රතික්ෂේප කරන්නේදැයි කියා සොයා බලා කුමන

පාර්ශවයකට හෝ ඉෂ්ට විය යුතු සාධාරණය ඉෂ්ට කිරීම මිස ඇගේ යැදීම අසා ඒ පැත්ත ගැනීම නොවේ.

මෙලෙසින් ලෞකිකාස්වාදය සඳහා දළදා වහන්සේ ළඟට පැමිණ දහසකුත් පාප චේතනා පෙරදැරිව පිහිට යදින මේ පෘථග්ජන මිනිසුන් වෙනුවෙන් රඹුක්කන සිද්ධාර්ථ හාමුදුරුවෝ වරෙක සමාව යදිති. උන් වහන්සේ මේ සියලු පුහුදුන් මිනිසුන් දකිනුයේ දෙව්දතුන් ලෙසයි. දෙව්දත් අතින් අතීතයේ සිද්ධ වුණාක් මෙන් මේ වතාවේ ද වරදක් සිද්ධ වී ඇති නිසා උන්වහන්සේ සමාව ඉල්ලති.

"සිරි සම්බුද්ධ සාසනේ
වන්දනීය පූජනීය
දන්ත ධාතු රාජනේ
සමාවෙන්න දෙව්දතුන්ට යළිත් වරක්
වැරදීමක් වෙන්න ඇති අනේ

පිපුණා මල් පොකුරු පොකුරු
දිළුණා නෙත් කඳුළු කඳුළු
නැගුණා රැලි කැරලි කැරලි
දළදා මැඳුරේ
මොන පවක්ද මේ මිනිසුන්
මේ කරගත්තේ
වරද නිවා සමාවෙන්න
දන්ත ධාතු  රාජනේ

වැන්දා බිම පෙරළි පෙරළි
හැඬුවා ළය තෙරපි තෙරපි
නැගුණා රැලි කැරලි කැරලි
දළදා මැඳුරේ

මොන පවක්ද මේ මිනිසුන්
මේ කරගත්තේ
වරද නිවා සමාවෙන්න
දන්ත ධාතු රජනේ'

ප්‍රේමය ඇ ලෞකික සම්බෝගයන්ගේ සන්තුෂ්ටිය ලද අයගෙන් දළදා වහන්සේ ඉදිරියේ මල් පොකුරු පිපිණ. එසේම උන්වහන්සේ ඉදිරියේ ම ප්‍රේමයෙන් හෝ වෙනත් ලෞකික අත්පත් කොට ගැනීමකින් පරාජය වූවන්ගෙන් කඳුළු නැගිණි. තවත් අය තමන්ගේ දුක හෝ සතුට දරාගත නොහැකිව බිම පෙරළි පෙරළී දළදා හිමි ඉදිරිපිට වැන්දෝය. ලෙහි මත්තේ අත් ගසාගෙන හැඬුවෝය. සමහරු තමන්ට ආදරය කොට තමන් අතරමං කළ අයගේ, නැති නම් ප්‍රතිපාක්ෂිකයාගේ විනාශය පතා යාදිනි කියන්නට ඇත. මේ සියල්ලට රැඹුක්කන සිද්ධාර්ථ හිමියෝ සමාව යදිති. මෙම සියලු වැරදි සිද්ධ වූයේ මේ මිනිසුන්ගේ අසරණකම, පෘථග්ජනභාවය නිසා බව උන්වහන්සේ දළදා වහන්සේට පුන පුනා ඒත්තු ගන්වති. එහිමියන්ගේම "හන්තානේ දුක් කඳුළු එකතු වී" යන ගීතය සරසවි ශිෂ්‍යයාගේ වෙහෙසකර ජීවිතය ආශ්‍රයභූත කොට ගත් ඒ හා සමාන නිමිත්තක් ඇත්තකි.

'හන්තානේ දුක් කඳුළු එකතු වී
නුවරට වැවකුත් තැනුණා නම්
ඒ වැව් ජලයේ සුපිපි නෙළුම් මල්
දළදා පාමුල පිදුණා නම්
දුක් රැඳි දෑසක නැගෙන කඳුළු බිඳු
පව්කරලා යයි හිතන්නෙපා
පින් පිරුවාමයි - පින් පිරුවාමයි
හන්තානේ දුක් සුසුම් එකතු වී
නුවරට පොද පැන් පිදුවා නම්
ඒ සෙනෙහස රැඳි සීත සුළං රැලි
දළදා පෙරහැර බැලුවා නම්

දුක් රැඳි හදකින් නැඟෙන සුසුම් රැලි
පව්කරලා යයි හිතන්නෙපා
පින් පිරුවාමයි - පින් පිරුවාමයි

හන්තානේ දුක් කඳුළු එකතු වී
නුවරට හැඩරුව දුන්නා නම්
ඒ හැඩ වැඩි කළ මලේ මහන්සිය
දළදා පාමුල නිවුණා නම්
මලකින් මලකට පැමිණෙන දුක් දැක
පව්කරලා යයි හිතන්නෙපා
පින් පිරුවාමයි - පින් පිරුවාමයි'

සරසවියේ විවිධ පීඩනයන්ට ලක්ව, ඉතාමත් වෙහෙස මහන්සි වී ශිල්ප හදාරන සිසු සිසුවියන්ගේ ශෝක ප්‍රකාශ අසන්නට එදා සිටම සැදී පැහැදී සිටියේ දළදා වහන්සේය. 'නිතර දෙවේලේ උන් වහන්සේ සොයා පැමිණ තමන්ගේ දුක් ගැනවිලි කියා පාන ඒ මාණව මාණවිකාවන් එන කියාපෑම නිසා පව් කළා කියා අහිතක් හිතන්න එපා' කියාය, රඹුක්කන හිමි දළදා හිමිට කියනුයේ ඒ සරසවි ශිෂ්‍යායාගේ ශෝක කඳුළු තුළින් සැදුණ අලංකාර නුවර වැවේ උපදින නෙළුම් මල්මයි දළදා සමිඳු ඉදිරියේ පිදුණේ. ඔවුන්ගේ ශෝක සුසුම් රැඳි සුළං පොදයි දළදා පෙරහැරට සිසිල සැදුවේ. ඒ මල් කැකුළු වැනි සිසු කැළමයි නුවර හැඩ කළේ. ඉතිං ඒ මල් කියන ශෝක ගීත අසා ඔවුනට පින් පුරවා දෙන්න.

සමාජ අසාධාරණය ඉදිරියේ විරෝධය දක්වන විරෝධාකල්ප ගීත, සමාජ සංස්කරණය සඳහා ඇරයුම් කෙරෙන ගීත ලෙස ගීත සාහිත්‍යයේ නිබඳ මුණ ගැසෙන ප්‍රගතිශීලි වටිනාකම් ගත් තේමාවන් කුළු ගන්වන ගීත දළදා වහන්සේ වටා ද ගෙතී තිබේ. සමාජයේ විවිධාකාර වූ ප්‍රස්තුතයන් නිමිති කොටගත් එවන් ගීත බුද්ධිමය ශ්‍රාවකයා විෂයෙහි ඇති කරන බලපෑම සුළුපටු නොවේ. වඩා සාධාරණ වන්නා වූ පිවිතුරු සමාජයක් බිහි කිරීම උදෙසා සාහිත්‍යකරුවාගේ අභ්‍යන්තර වේගයන් සමාජය වෙත මුදා හරින්නා

වූ විරෝධාකල්ප සාහිත්‍යයේ[4] ගීතයට හිමි වනුයේ ප්‍රබල ස්ථානයකි. ජනතාවට ඉතා ඉක්මණින් මෙන් ම සදානුස්මරණීය ලෙස සමීප වන සුගෝචර මාධ්‍යය වීම නිසා ඔවුන්ගේ හද සන්තානයට කතා කොට සමාජය විමුක්තිකාමී අරගලයට පෙළ ගැස්වීමට නිර්මාණකරුවා ගීතය නමැති කලාංගය වාසියක් කොට ගනී. සම්ප්‍රදාය, සංස්කෘතිය, ආගම විෂයෙහි බලපවත්වන උදාහරණ ගෙන සමාජය සුගාමී කිරීමට යත්න දැරීම කලාකරුවා සොයා ගත් ඉතාමත් ප්‍රබල වූ සාර්ථක ප්‍රවේශයක් වෙයි. එතැනදී නූතන ගීත රචකයා ඉන්නේ පෙරමුණේය. නූතන ගීත රචකයාට එලෙස ගෙන යන අරගලය විචිත්‍ර කිරීමට මාහැඟි වස්තුවක් ලෙසය. දළදා වහන්සේ මුණ ගැසුණේ.

79 -81 අවධීන්හි දී ලාංකීය නව දිශානතියකට හැරවීමට ගිය තරුණ පිරිස් අත්වින්දා වූ ඛේදනීය ඉරණම ගැන ප්‍රශ්න කෙරුණ ගීතයකි. ගුණදාස කපුගේ විසින් ගැයෙන රත්න ශ්‍රී විජේසිංහ පබැඳුමක් වන "ධර්මපාල නම් පියරජෙකුගේ ගීතය"[5] මෙහි කථකයා වන පියා තමන්ට සිදුවූ අසාධාරණය නොහොත් තම පුතා අසාධාරණය රජයන සමාජයක් සුගාමී කිරීමට ගොස් මරණයෙන් වන්දි ගෙවූ ආකාරය ගැන ප්‍රශ්න කරනුයේ දළදා හාමුදුරුවන්ගෙන්ය. මන්ද එම පියාගේ දරුවා පැමිණියේ දළදා හෙවණේ සැනසෙන පේරාදෙණිය සරසවියටය.

'හන්තානේ කඳු දණ ඇන නමඳින - සිරි දළදා හාමුරුවන්ගේ
ඔබ වහන්සේ ළඟ ඉදගෙන ගන්න ගිය - මගේ දරුවා හාමුදුරුවනේ
පිරුවට අන්දා ඇස් දෙක පියවා - ගෙන ආවලු හාමුදුරුවනේ
දළදා නාමෙට උත්තර දෙනවද - මතු බුදුවන හාමුදුරුවනේ'

දස ධර්මය පිළිපදින්නන් අකල් මරණයකට ගොදුරු නොවන බව කියා පුතාගේ යැයි පෙන්වන ඇටසැකිලි ප්‍රතික්ෂේප කරන ධර්මපාල පිය

4. රත්න ශ්‍රී - නව කවියේ චන්ද්‍රෝදය, සංස්කරණය සමුද්‍ර වෙත්තසිංහ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2005, 212 පිටු.
5. රත්න ශ්‍රී විජේසිංහ, සුභ උදෑසන - 71 පිටුව

රජුගේ කතාවය, රත්න ශ්‍රී මෙහිදී යොදා ගන්නා පුරාණෝක්තිය වනුයේ, දහදිය වපුරා මිස අනියමින් මුදල් නොසොයන ඒ නූතන ධර්මපාල නොහොත් කම්කරු පියා සත්චර්යාව අනුයන නිසා අකල් මරණ විශ්වාස නොකරයි.[6]

'ඇදුරිඳුනේ මේ සැතපෙන දරුවා - ලෙඩට බෙහෙත් නැකි කෙනෙකුන්දෝ
වනන්තරේ වැදි සෙනඟට අහුවුණ - මරුවැල පෑගුණ කෙනෙකුන්දෝ
මේ මගේ පුතු බව අදහනු කෙලෙසද - ලෙඩකින් දුකකින් නැත පෙලුණේ
ඩාදිය විකුණන හොර හැර නැති අප - අකල් මරණ ගැන නැත දන්නේ'

සිප් සතර හදාරා ගුණ දහම් රැගෙන ආපසු ඒමට ගිය දරුවා දස ධර්මයේ බලයෙන් අද උඩුකුරුව සැතපෙයි. වනන්තරේ වැදි පිරිසකට හසු වූ කලෙක මෙන් සාධාරණය ඉල්ලා කෑ ගැසූ විශ්වවිද්‍යාල තරුණයින් පාගා පොඩි පට්ටම් කොට මරා දමා තිබිණි. හිස මුදුනෙන් පරාල ඇණ ගසා, නියපොතු ගලවා, කඳින් වෙන් කළ හිස් විශ්වවිද්‍යාල භූමියේ දිය පිරුණ පොකුණක් අසබඩ ප්‍රදර්ශණයට තබා තිබිණ. ඒ ම්ලේච්ඡ ඝාතක යුගය රටට, දැයට අහිමි කළ බුද්ධිමය මානව සම්පත් ප්‍රමාණය සීමාරහිතය. ඒඅතරේ මෙම කම්කරු පියාගේ දරුවා ද සිටියේය. ඒ දරු වියෝව දරාගත නුහුණු පියා හන්තාන කන්ද පවා දණ ඇන නමදින දළදා වහන්සේගෙන් මෙසේ ප්‍රශන කරයි. ඒ අද වන තුරුත් මුළු මහත් ජාතියක් දළදා හිමිගෙන් අසන ප්‍රශ්නයයි.

'කාලය දීපය දේශය දන්නා - මතු බුදුවන හාමුදුරුවනේ
ධර්මය දනගෙන එන්ඩ ගියේ පුතු - හමුවුණෙ නැති වග නැත දන්නේ
තුවාල සුදු රෙදි පටින් වසාගෙන - උඩුකුරු වී මේ සැතපෙන්නේ
ඒ දස ධර්මයෙ ගුණ කඳ නොවේද - කියන්න දන්වත් ඇදුරිඳුනේ'

6. රත්න ශ්‍රී - නව කවියේ චන්ද්‍රෝදය, සංස්කරණය සමුද්‍ර වෙත්තසිංහ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2005, 68 පිට

සුනිල් ආරියරත්න විසින් රචිත නන්දා මාලනී ගයන 'පානං පත්තුවේ ඩිංගිරි අම්මා'[7] ගීතය දළදා වහන්සේ මතු නොව ශ්‍රී මහා බෝධිය, කතරගම දෙවොල ආදී පූජ්‍යස්ථාන වටාද සිද්ධ වන අකටයුතු ගැන ප්‍රශ්න කරන ගීතයකි. ඩිංගිරි අම්මා නම් හිටිවන කවි කීමේ දක්ෂ, නූගත් කිවිඳිය ලවාය මහාචාර්ය ආරියරත්න එම අසාධාරණ වාර්තා කරනුයේ.

'පානම් පත්තුවේ ඩිංගිරි අම්මාය - ගමේ අයට නම් ගජමන් නෝනාය
කවිකර කියන්නේ දෑසින් දුටුදේය - වට වන්දනාවෙදි නඩයම දුටුදේය

වඳින්නට ගිය කලට නුවරට දළදාව - ගමේ චණ්ඩි ස්ටැන්ලි ද සිටියාය
යාළු නිළමෙලා දොර හැර දුන්නාය - ළඟටම ගිහින් ඔහු දළදා වැන්දාය
හම්බන්තොටින් පසුකර ලුණුලේවාය - කතරගමට අපි යහතින් ආවාය
සිටියදී පෝලිමේ අපි ගෙන පූජාව - සීයේ කොළවලට මුල්තැන ලැබුණාය

සිරිමහ බෝධියට ගියදා උදයේම - කාර් ගොඩක් ආවා එක එක පාට
තෙරපී සිටියදී අපි පඩි පෙළ ගාව - ඒ මහතුන් රන් වැට පැන වැන්දාය'

එක් අතකින් ඩිංගිරි අම්මාගේ පාඨශාලීය අධ්‍යාපනයක් නොමැතිකම නොහොත් නූගත්කම පෙන්වන ව්‍යාකරණ දෝෂයක් සේද ගත හැකි, එහෙත් 'ස්ටැන්ලි' වැනි චණ්ඩීන් කළ වැඩ ස්ත්‍රී ක්‍රියා බව ඒත්තු ගන්වන සේ 'ආය' ප්‍රත්‍ය යෝජනයෙන් සිටියාය, වැන්දාය' වැනි ස්ත්‍රී ලිංග ආඛ්‍යාත නිපදවා අවසන් කරන සිව් පද කවි දෙවියන්, බුදුන් වැඩ සිටින බිමේ පවා සිද්ධ වන අසාධාරණය ගැන කදිම නිර්භය ප්‍රකාශනයකි, කරනුයේ යාළු නිලමෙලා සිටින නිසාම හැමදාමත් දළදාව ළඟටම ගිහින් වඳින දේශපාලඥයෝ, සල්ලිකාරයෝ, චණ්ඩි නිසා සාමාන්‍ය, අහිංසක බැතිමතාට ජීවිත කාලයටම

7. සුනිල් ආරියරත්න, තුටු පඬුරු, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1994, 35 පිටුව

දළදා වහන්සේ ළඟට ගොස් වැඳීමට ඉඩක් ලැබෙනවා බොරුය.

'පාත ඉඳන් අපි ආවේ - නාමල් පූජා කරන්න
දළදා හාමුරුවනේ - පාත මාලයට වඩින්න

ශීල් හෙවණෙ ඉඳගෙන බෑ - හේන් කුඹුරු වැඩ කරන්න
ඇඟපත කළු වුණත් අපේ - කිළි කුණු නැති හිත බලන්න

මුදූ ගියා ලෙලි තැළුවා - පිළී ගඳින් බෑ මිදෙන්න
ඒත් අපේ මල් සුවඳයි - එපා බාර නොගෙන ඉන්න'

රත්නශ්‍රීගේ පදරචනයක් වන මෙම ගීතය ගායනා කරනුයේ විශාරද වික්ටර් රත්නායකයන්ය. ඉංග්‍රීසි ආණ්ඩු සමයේ සිද්ධ වූ උඩරට - පහතරට බෙදීම නිසා දළදා වන්දනය සම්බන්ධයෙන් පවා ජනතාවට සිද්ධ වූයේ නොයෙකුත් අඩන්තේට්ටම්වලට ලක්වීමටය. පහත රටින් එන වැසියාට මාළිගාවේ ඉහළ මාලයට යාමට අවසර ලැබුණේ නැත. එනිසා පහතරට බැතිමතා මේ යාඥා කරනුයේ තමන්ගේ නාමල් ටික පිදීමට දළදා වහන්සේ පහත මාලයට වඩම්මවා ගැනීමටයි. දළදා පෙරහැරට පවා පහතරට සම්ප්‍රදායේ කිසිදු නර්තනාංගයක්, වාද්‍ය භාණ්ඩයක් එකතු කොට නොගැනීම තුළින් ද මොනවට ඔප්පු වන මෙම කුඩම්මාගේ සැලකිල්ල දළදා හාමුදුරුවන් ද ඉවසා සිටීම ගැන කවියා දළදා හිමියන්ට ව්‍යංගයෙන් දොස් කියයි. ඒ දෝෂාරෝපණය ඉදිරිපත් කරනුයේ ආයාචනයක ස්වරූපයෙනි. එසේම මුදූ ගොසින් පොල් ලෙලි තළලා පිළී ගඳ ගැහැව්වාට අපේ මලුත් සුවඳ නිසා ප්‍රත්ක්ෂේප කරන්න එපා යැයි කියනුයේ අවලාදාත්මක ස්වරූපයකිනි.

'බහිරව කන්දේ සමාධි බුදු ඇස - සෙංකඩගල පුර බැලුවා
කොළඹ වීදියේ සුරාසැල් අසල - පොදිකන මිනිසුන් දුටුවා
නිසල එහිමි රුව සන්සුන් පැවතුම් - තාදී ගුණ සිහි කෙරුවා

රන් වියනේ රන් වන් එළියෙනවත් - මග නොපෙනේදැයි සිතුවා'

අසංක ප්‍රියමන්තගේ හඬින් ඇසෙන මෙම ගීතයෙන් එල්ල වන උපහාසය ලාංකීය විරෝධාකල්ප ගීතයේ කදිම සන්ධිස්ථානයක් සටහන් කරයි. ලෝක උරුම නගරයක් මෙන්ම පාරිශුද්ධ පූජනීය භූමියක් වන මහනුවර නගරයේ සිද්ධ වන පාතාල ලෝකවල සිද්ධ විය හැකි ආකාරයේ අමානුෂික ක්‍රියා ගැන කවියා ප්‍රශ්න කරනුයේ සිත යට සඟවා ගත් කෝපයක් ඇතිවය. බහිරව කන්දේ බුදුරුවේත්, සෙංකඩගල දළදා වහන්සේගේත් දෙදෙනාගේම ඇස ගැටෙන සුරා සැල් ගැනය ප්‍රශ්නය නැගෙනුයේ.

'අස්ගිරියේ ජය ඝෝෂා නාදය - බඹ ලොව දක්වා ඇසුණා
ඒ ජය හඬ මුසු දූවිලි සුළඟට රහමෙර සුවඳත් දැනෙනා
අමර බමණ ගී ගැයෙනා - කුමන අරුත දැයි නොදැනා
ඒ ගීයෙන් නැඟි අපුල සුවයට - තේවා නාදය මැකෙනා'

අරක්කු බී ගත් බේබද්දන්ගෙන් ඊළඟට නගරය පුරා දෝංකාර නැංවූයේ කිසිදු තේරුමක් නැති බයිලා ගීතයි. ඒ ගීතවල පිළිකුල් හඬට මාළිගාවේ තේවා නාදයද යට ගොස් ඇත.

'වැව රවුමේ මහ මන්දිර පසුකර - කළු දිය දහරා ගලනා
ඒ දිය මුසු වී වැව් දිය නිල් පැහැ - කොළ පැහැ ගැන් වී පෙනුණා
වැවේ මසුන් මිය ඇදුණා - දුගඳින් නගරය වැසුණා
දළදා මැඳුරේ මල් ආසනයේ - මල්වල සුවඳත් මැකුණා

වාච්‍යාර්ථයෙන් ගත් විට ඉදිරිපත් කෙරෙන අනෙක් ගැටලුව නම් නුවර වැව අවට මහා මන්දිරවලින් පිටවන අප ජලය නිසා වැවේ මාළුන් පවා මැරී ගොස් පිළී ගඳ නගරය පුරා පැතිර යාමයි. මාළිගාවේ මල් අසුන මැවූ සුගන්ධය ද ඒ පිළී ගඳට යට වී ගොසිනි. ව්‍යංගාර්ථයෙන් ගත් විට වැව රවුමේ

මහා මන්දිරවල සිටින කුහක මිනිසුන්ගේ ආධ්‍යාත්ම පිට කරන කළු දියර මුළු නගරයට ගඳ ගස්වන බව මෙම ගීතයෙන් ධ්වනිත වේ.

මේ සමාජ ව්‍යසනයන්, අසාධාරණයන් දෙස තම කුළුණු නෙත යොමා බලන ලෙස දළදා වහන්සේ යදින අතරේ අලුතින් උපදින පුත් කුමරාට, දියණියට දළදා වහන්සේගේ රක්ෂාවරණය ඉල්ලා ද ඇතැමෙක් ගී පද පබඳිති. ඒ ගී අනුසරින් ඔවුන් කරනුයේ රටට අලුතින් බිහි වන දරුවාගේ ආනාගතයත්, රටේ අනාගතයත් දළදා හාමුරුවන්ට බාර කිරීමයි. ඒ බාර කිරීම තුළින් ඔහු අපේක්ෂා කරනුයේ සාමය, සතුට, සශ්‍රීකත්වය දළදා හිමි සරණින් සිය රටට, ජාතියට ළඟා කොට දීමටයි. කුමාරදාස සපුතන්ත්‍රී විසින් රචිත සුනිල් එදිරිසිංහ විසින් ගැයෙන 'අපද ඉපදුණ නැවුම් ලොවට' ගීතය තත් විෂය රාමුවේ බිහි වූ අගනා නිර්මාණයක් වෙයි.

'අද ඉපදුණු නැවුම් ලොවට සිව් දෙවියනි වරම් දෙන්න
පතිනි මවුනි බැල්ම හෙළා හද සුව යහනට වඩින්න
උපන් බිළිඳු නහවන්නට රුවන් පිරිත් පැන් වඩිතී
සිරිමා බෝ පත් සෙලවී මෙත් සිසිලෙන් සුවය දෙතී
දහසක් දෙව් බඹුන් නිතින තුන් තිස් පැය තනි රකිතී
සඳගිරි දෙපසින් අවදිව කල්පයකට ආයු දෙති
සහසක් බුදු වදන් නිතර නැළවිලි ගීයෙන් ගැයෙති
සිරි දළදා හිමි සරණින් පිහිට ලබා නිදුක් වෙති
උපන් පුතුට ලෙවන් අතර දහසක් කිරි මවුන් ඇතී
බාල බිළිඳු පිළිගන්නට සමන් දෙවිඳු දෝත රකී'

අජන්තා රණසිංහයන් විසින් රචිත විශාරද අමරදේවයන්ගේ හඬින් ඇසෙන 'සමන්ත කූඨය - දළදා කරඬුව - දෙපසින් සෙවණ දෙවා මපුතු හට' ගීතයද එසේ අලුත උපන් දරුවෙකුට දළදා වහන්සේගේ පිහිට පතන්නකි. 'සිරි දළදා සමිඳු පිනින්, ලතෙත් ගුණය ඉතිරේවා' යනුවෙන් 'සිරිමා බෝ මැඩ' යන හිසින් විශාරද වික්ටර් රත්නායක ගයන අජන්තා රණසිංහ ලියූ ගීතය අලුත උපන් දියණියකට දළදා සමිඳුගේ පිහිට යදියි.

## ආශ්‍රිත ග්‍රන්ථ


- අබේසිංහ ඩබ්.ඒ. වනපස මලක් වෙමි, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1991
- අභයසුන්දර විමල්, රුප්පාවේ මීපොද වැහි, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1994
- ආරියරත්න සුනිල්, තුටු පඬුරු, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1994
- ආරියරත්න සුනිල්, ගාන්දර්ව ආපදාන - මොහොමඩ් ගවුස් සහ බී.ඇස්. පෙර්රා, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10. 2000
- ගම්ලත් සුචරිත, සැළලිහිණි සන්දේශය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1995
- පෙරේරා සුනිල් සරත්, මහකන්ද, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ 10, 1995
- පෙරේරා සුනිල් සරත්, මහකන්ද, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ 10, 1995
- බොරළුගොඩ ජයතිස්ස සහ කොතලාවල සිසිර, අපේ ගීත, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, කොළඹ 02 හා පානලුව, පාදුක්ක.
- මැද්දේගම උදය ප්‍රශාන්ත, මහනුවර යුගයේ දළදා කවි, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2005
- සිද්ධාර්ථ හිමි, රඹුක්කන, සසර දනව්ව, සංසාරේ අපි මිත්‍ර සමාගම, පන්නිපිටිය, 2006
- අජන්තා ගීතාවලී, සංස්කරණය - සමන්ත හේරත්, සමුද්‍ර වෙත්තසිංහ, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2002
- නව කවියෝ චන්ද්‍රෝදය, සංස්කරණය සමුද්‍ර වෙත්තසිංහ, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2005

# මහනුවර දළදා පෙරහැර හා සබැඳි නර්තන හා වාදන සම්ප්‍රදාය

**කේ.ඩී.පී. සුමනදාස**
විශ්‍රාමලත් සංස්කෘතික කටයුතු පිළිබඳ සහකාර අධ්‍යක්ෂක

මහනුවර දළදා පෙරහැර හා සබැඳි නර්තන හා වාදන සම්ප්‍රදාය විමසා බලන කල්හි එකල නර්තන හා වාදන අංග දළදා පෙරහැර සම්බන්ධ වූ පිළිවෙළ හා එහි ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම වැදගත් යැයි සිතමි.

ශ්‍රී ලංකාවට දන්තධාතුන් වහන්සේ වැඩම කළ කාලයේ රාජ්‍ය විචාළ කිත්සිරි මෙවන් රජතුමන් විශේෂ ධාතු මන්දිරයක් ඉදිකරවා වාර්ෂික පුද පූජා පැවැත්වූ බව ඓතිහාසික හා සාහිත්‍යයික ලේඛන වලින් හෙළිවේ. අනුරාධපුර රාජධානියෙන් පොළොන්නරු රාජධානියට මාරු වීමේදී දන්තධාතුන් වහන්සේද පොළොන්නරුවට වැඩම කරවන ලදී. මෙසේ ලංකා රජයට විටින් විට මුහුණපෑමට සිදුවූ පරසතුරු ආක්‍රමණ හේතුවෙන් ලංකාවේ රාජධානි ක්‍රමයෙන් ලංකාවේ කන්ද උඩරට රාජධානි දක්වා මාරු වීම සිදු විය. එහෙත් ඒ ඒ රාජධානිවල අගනගරයන්හි ධාතු මන්දිර ඉදිකරවා දන්ත ධාතු වහන්සේ උදෙසා විවිධ පූජෝත්සව පැවැත්වීම සහ වත්පිළිවෙත් ඉටු කිරීම නොපිරිහෙලා කරන ලදී. මේ අයුරින් ඒ ඒ අවධිවල දන්තධාතුන් වහන්සේ උදෙසා ඉටු කළ හා ඉටු කළයුතු වත්පිළිවෙත් මෙන්ම පවත්වන ලද පූජෝත්සව පිළිබඳ තොරතුරු මහාවංශය, චූලවංශය, දළදා සිරිත, පාහියන්ගේ භ්‍රමණ වෘත්තාන්තය, හියුන් - සියැංග්-ගේ දේශානට වාර්තා, එදා හෙළදිව, විදේශියන් දුටු පුරාණ ලංකාව, සිරි දළදා පුවත, මධ්‍යම ලංකා පුරාවෘත්ත ආදි ග්‍රන්ථ රැසකින් අනාවරණය වේ.

දන්තධාතූන් වහන්සේට පංචතූර්ය නාදය ඇතිව දළදා පූජෝත්සව පැවැත්වූ බවද[1] භේරිනාද පවත්වා දළදා උත්සව පැවැත්වූ බවද[2] විවිධ වාද්‍ය භාණ්ඩ වයමින් විවිධ වෙස් ගත් නළුමුළු පෙරහැරේ ගමන් ගත් බවටද[3], ඒ ඒ මූලාශ්‍රයන්හි තොරතුරු හමු වුවද ඊට වැඩි විස්තරයක් හමු නොවේ. විශේෂයෙන් 16 වන සියවසට පෙර වර්ෂයන්හි පවත්වන ලද දළදා උත්සව හා පෙරහැරවලට සහභාගී වූ නර්තන හා වාදන අංග හා ශිල්පීන් පිළිබඳව විස්තර ඉහත සඳහන් ග්‍රන්ථයන්හි හමු නොවීම බලවත් අඩුවකි.

කන්ද උඩරට මහනුවර රාජධානිය පිහිටුවීමත් සමඟ දළදා වහන්සේට කළයුතු පුදපූජා හා තේවා රාජකාරි ඉටු කිරීම අවශ්‍ය නර්තන හා වාදන ශිල්ප පරම්පරා කන්ද උඩරට මහනුවර අවට ගම්මානයන්හි පදිංචි කරවා ඔවුන්ගේ නඩත්තුව සඳහා රජවාසලින් ගොඩමඩ ඉඩම් ලබා දෙන ලදී. ඔවුන් විසින් ඉටු කළ යුතු රාජකාරියේ ස්වාභාවයද සඳහන් කර එම රාජකාරි ඉඩම් "හේවිසි පංගුව" "බෙර පංගුව" "හොරණෑ පංගුව" "සිංගාරක් පංගුව" "හක්ගෙඩි පංගුව" යනාදී වශයෙන් නම් කර ලබා දී තිබේ. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ (1707 - 1739), කීර්ති ශ්‍රී රාජසිංහ (1747 - 1781) යන රජවරුන්ගේ රාජ්‍ය සමයන්හි ගොඩ මඩ ඉඩම් තම තමන්ගේ පරම්පරාවල මුතුන් මිත්තන්ට ලබා දී දළදා මාළිගාවේ තේවාව හා පෙරහැර රාජකාරි පවරන ලද බව පාරම්පරික කලා ශිල්පීන් සමග කරන ලද සාකච්ඡාවලදී අනාවරණය විය.[1] මෙම තොරතුරු Service enures register 1870 - 1872 යන වාර්තාවෙන්ද සනාථ වේ.

---

1. පූජාවලිය, සංස්කරණ පණ්ඩිත කිරිඇල්ලේ ඥාණවිමල ස්ථවිරයන් වහන්සේ. 1965. පි.අංක 793-795,800
2. විදේශීයයන් දුටු පුරාණ ලංකාව, ඩී.පී. පොන්නම්පෙරුම. පි.අංක 61
3. දළදා සිරිත, වී.ඩී.ඇස්. ගුණවර්ධන, පි.අංක 74.
1. අමුණුගම සුරඹා මහතා සමඟ 1983.04.19, රාගම ගුණදාස මහතා සමඟ 1983.07.29 කහල්ල බී.පී.රත්තරනා මහතා සමඟ 1985.03.22 වේගිරය බී.ජී. කිරිපුංචා මහතා සමඟ 1984.05.03, නන්දර පරිපාන මහතා සමඟ 1986.02.17 සයිමන් මාලගම්මන මහතා සමඟ 1995.05.03 යන දිනයන්හි සාකච්ඡා කරන ලදී. විවිධ කලා ශිල්පීන් විශාල සංඛ්‍යාවක් මේ හා සම්බන්ධ විය.

රොබට් නොක්ස් ලංකාවේ විසූ කාලය තුළ ඔහු විසින් නරඹන ලද ඇසළ පෙරහැර ගැන තොරතුරු ඔහුගේ ඓතිහාසික වාර්තාවෙහි සඳහන් කර ඇත. එහි යෝධයන් මෙන් සැරසුණු යක් නළුවන් නැටූ බවද, බෙර දවුල් තම්මැට්ටන් වැයූ බවද, පුරුෂයන්ගේ නැටුම් හා කළගෙඩි නැටුම් තිබූ බවද වාර්තා වෙයි. තවද විවිධ ක්‍රීඩා කරමින් කාන්තාවන් තිදෙනා බැගින් අත් අල්ලාගෙන නටන ස්ත්‍රීන් පෙරහැරේ ගිය බවද වැඩිදුරටත් එහි සඳහන් කරනු ලබයි. දළදා කරඬුව වැඩම වීම පිළිබඳ තොරතුරු එහි සඳහන් නොවේ.[2] රොබට් නොක්ස් ලංකවේ විසූ කාල පරිච්ඡේදය පිළිබඳ සැලකීමේදී මෙම පෙරහැර විස්තරය ක්‍රි.ව. 1618 වර්ෂයට වසර කිහිපයකට පෙර ඇසළ පෙරහැරට දළදා පෙරහැර සම්බන්ධ නොකළ අතර සතර මහා දේවාලවල පෙරහැර පමණක් වීථි සංචාරය කළ අවස්ථාවක දුටු පෙරහැරක විස්තරයක් බව නිගමනය කළ හැකිය.

දළදා පෙරහැරට කාන්තා නැටුම් ඇතුළත් නොකර ගැනීමේ සම්ප්‍රදායද රොබට් නොක්ස් ලංකාවේ විසූ කාලයද (ක්‍රි.ව. 1600 - 1618) දළදා පෙරහැරට සතර දේවාලවල පෙරහැර එකතු කිරීමේ ඓතිහාසික සිද්ධිය සිදුවූ කාලයද මෙම නිගමනයනට එළඹීමට පාදක වූ කාරණා වේ.

ක්‍රි.ව. 1747 - 1780 කාලයේ රාජ්‍ය විචාළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් මුල් වරට ද, දළදා පෙරහැරට සතර දේවාලවල පෙරහැර එකතු කර දළදා පෙරහැරට පිටු පසින් එකී දේවාලවල පෙරහැර ගමන් කිරීමට නියෝග පැනවූ බව ඓතිහාසක ලේඛනයන්හි සඳහන් වේ.[3]

ක්‍රි.ව. 1815 දී කන්ද උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට යටත් වීමෙන් පසු දළදා පෙරහැර පැවැත්වීමට හා තේවාව ඉටු කිරීමට ඉමහත් බාධා එල්ල විය. කලා ශිල්පීන්ට මෙන්ම භික්ෂූන් වහන්සේලාටද ඉමහත් දුක්ගැහැටවලට මුහුණ පෑමට සිදුවිය. දළදා මාලිගාවේ තේවාව ඉටු කිරීම වෙනුවෙන් කලා ශිල්පීන්ට රජ මාළිගාවෙන් ලබා දෙන ලද ගොඩ මඩ ඉඩම්ද ඉංග්‍රීසීන් විසින්

2. එදා හෙළදිව, පරිවර්තනය ඩේවිඩ් කරුණාරත්න, පි. අංක 235 - 236
3. සෙංකඩගලපුර ඉතිහාසය, ඒ.ඩී.පී. කරුණාතිලක, පි.අංක. 86

ඔවුන්ට අහිමි කිරීම ආදී කරුණු හේතු කොටගෙන කලා ශිල්පීන්ට ජීවත්වීම සඳහා පිටිසරට පැන ගොස් වෙනත් රැකියාවන්හි නිරතවීමට සිදු විය. මෙම ව්‍යසනය පිළිබඳ රදල ප්‍රභූන් හා මල්වතු අස්ගිරි මහා නාහිමිවරුන් විසින් ඉංග්‍රීසි ආණ්ඩුවේ පාලකයන්ට කරුණු ඉදිරිපත් කරමින් විවිධ බලපෑම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 1828 වර්ෂයේ මැයි මාසයේ 29 වන දින දළදා පෙරහැර නැවත ආරම්භ කිරීමට හැකිවිය. මෙම පෙරහැර වීථි සංචාරය කිරීමේදී පෙළ ගැසුණු ආකාරය පිළිබඳ දීර්ඝ විස්තරයක් පූජ්‍ය පණ්ඩිත නාවුල්ලේ ධම්මානන්ද හිමියන්ගේ මධ්‍යම ලංකා පුරාවෘත්ත, සරච්චන්ද්‍ර ජයකොඩි මහතාගේ සිරි දළදා පුවත, ඒ.ඩී.පී. කරුණාතිලක මහතාගේ සෙංකඩගල ඉතිහාසය යනාදී වශයෙන් වූ ග්‍රන්ථ කිහිපයකම සඳහන් වේ. පූජ්‍ය පණ්ඩිත නාවුල්ලේ ධම්මානන්ද හිමියන්ගේ මධ්‍යම ලංකා පුරාවෘත්ත යන ග්‍රන්ථයෙහි සඳහන් තොරතුරු වලට අනුව නර්තන හා වාදන අංග පිළිබඳ විස්තර එහි දක්නට නොලැබේ. හේවිසි වාදනය කළ බව සඳහන් වේ. තවද දන්ත ධාතු කරඬුව පංච තූර්ය නාදයෙන් යුතුව තැන්පත් කළ බවද සඳහන් වේ. එහි එන දීර්ඝ විස්තරයෙහි,

"..................... එකළොස්වෙනුව සිංගක්කාරයෝද, දොළොස් වෙනුව නර්තනකාරයෝද, බෙරකාරයෝද, දහතුන්වෙනුව තලිස්කාරයෝද යනුවෙන් සඳහන් වේ.[1] එහෙත් එහි එන දීර්ඝ විස්තරයෙහි ගමන් ගත් අලි ඇතුන්ගේ නම් ගම් පවා සඳහන් වුවද නර්තන වාදන අංග හෝ පරම්පරා නම් පිළිබඳ සඳහන් නොවීම බලවත් පාඩුවකි.

ඒ.ඩී.පී. කරුණාතිලක මහතාගේ සෙංකඩගල ඉතිහාසය නම් කෘතියෙහි ........... නවවෙනුව උඩ පළාත දිසාවේ නෙළුම් මල් කොඩියද ඇතුළුව......... දළදා කරඬුව ලැබ ගෙන දළදා මාළිගාවේ කොඩියද හේවිසිකාරයන්ද, නැට්ටුවන්ද බෙර වයන්නන්ද, ........................." යනුවෙන් සඳහන් වේ.[2]

1. මධ්‍යම ලංකා පුරාවෘත්ත , රාජකීය පණ්ඩිත නාවුල්ලේ ධම්මානන්ද හිමි, පි.අංක. 24 - 25
2. සෙංකඩගලපුර ඉතිහාසය, ඒ.ඩී.පී. කරුණාතිලක, පි.අංක 86

සරත්චන්ද්‍ර ජයකොඩි මහතාගේ සිරි දළදා පුවත යන කෘතියෙහිද, 1828 හා 1928 යන වර්ෂයන්හි පවත්වන ලද ඇසළ පෙරහැර පිළිබඳ විස්තරයක් දක්නට ලැබේ. 1828 වර්ෂයෙහි මැයි 29 වන දින පවත්වන ලද දළදා පෙරහැරේ නැට්ටුවන් හා බෙර වාදකයන් ගමන් කළ බව සඳහන් වෙතත් වෙනත් නර්තන හා වාදන අංග ගැන තොරතුරු සඳහන් නොවේ. එහෙත් 1928 වර්ෂයෙහි පවත්වන ලද දළදා පෙරහැරේ පන්තේරු, උඩැක්කි, රබන්, සවරං, කළගෙඩි යන නැටුම් අංග තිබූ බව අනාවරණය වෙයි. [3] ඉහත සඳහන් කරන ලද විස්තරයන්ට අනුව 1818 න් පසුව පවත්වන ලද පෙරහැරවල කළගෙඩි නැටුම් නටමින් පෙරහැරේ ගමන් කළ කාන්තාවන් නිසා පෙරහැර අලංකාර වූ බව හෙළිවෙයි. දළදා පෙරහැර සහ සතර දේවාලවල පෙරහැර ආරම්භයේ පටන් කාන්තා නැටුම් ඇතුළත් කළ හැකි වන්නේ පත්තිනි දේවාලයේ පෙරහැරට පමණක් වන බැවින් එහි සඳහන් කළගෙඩි නැටුම් නටමින් ගිය කාන්තා නැටුම් පත්තිනි දේවාලයේ ගමන් කළ නැටුමක් විය යුතුය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමන් (ක්‍රි.ව. 1747 - 1780) සතර දේවාලවල පෙරහැර දළදා පෙරහැරට සම්බන්ධ කර එතෙක් පැවති ඇසළ පෙරහැර දළදා පෙරහැරක් බවට පත් කරන ලදී. ඉන් පසුව වාර්ෂිකව පවත්වන ලද දළදා පෙරහැරේ ගමන් කරන සතර මහා දේවාලවලට අයත් පත්තිනි දේවාලයේ පෙරහැරේ ගමන් කළ කළගෙඩි නැටුම් ඉදිරිපත් කළ කාන්තාවන් පිළිබඳව පෙරහැර නරඹන ලද විදේශිකයන් ඔවුන්ගේ වාර්තාවල සටහන් කරන ලදී. එකී වාර්තා පාදක කරගෙන තොරතුරු සටහන් කළ ලේඛකයන් විසින් දේවාලවල පෙරහැර වෙන් නොකළ සමස්ත පෙරහැර දළදා පෙරහැර ලෙස සලකා නර්තන හා වාදන පිළිබඳ සඳහන් කළ බැවින් මෙසේ දක්වන්නට ඇතැයි සැලකිය හැකිය.

උඩරට ප්‍රවීන නර්තන හා වාදන ශිල්පීන් සමඟ කරන ලද සාකච්ඡාවලදී ක්‍රි.ව. 1890 වර්ෂයේ පටන් දළදා පෙරුහැරේ නයියඩි,

3. සිරි දළදා පුවත, සරච්චන්ද්‍ර ජයකොඩි, පි.අංක 225

පන්තේරු, උඩැක්කි, රබන්, ලී, සවරන් වැනි නැටුම් කණ්ඩායම් ගමන් කළ බව හෙළි විය. 1983 වර්ෂයේ ඒ වන විට වයස අවුරුදු 70 - 90 අතර පසු වූ එම පාරම්පරික හේවිසි වාදන, බෙර වාදන හා නැටුම් ශිල්පීන් විසින් ඔවුන්ගේ පියා හා අත්තා මඟින් අසා දැනගත් තොරතුරු ලෙස එම සාකච්ඡාවලදී කරුණු හෙළි කරන ලදී. 1928 වර්ෂයේ දළදා පෙරහැරට සහභාගි වූ නයියඩි, පන්තේරු, උඩැක්කි, රබන් , ලී, සවරන් යන ප්‍රධාන අංගවලින් සමන්විත විය. එහෙත් 1929 වර්ෂයේ පවත්වන ලද දළදා පෙරහැරට ඊට පෙර වර්ෂයේ දකින්නට නොලැබුණු වෙස් නැටුමද එවකට දියවඩන නිළමේ ධූරන්දර පී.බී. නුගවෙල මහතා විසින් එකතු කරන ලද බව එම සාකච්ඡා තුළින් වැඩි දුරටත් හෙළි විය.[1]

එතැන් පටන් 1929 දක්වා පෙරහැරට විවිධ නර්තන හා වාදන අංග වසරින් වසර එක් වෙමින් නර්තන හා වාදන අංශවල වර්ධනය සිදු විය. විදේශිකයන්ගේ හා ඉංග්‍රීසි ආණ්ඩුකාරවරුන්ගේ පෙරහැර පිළිබඳ වූ ආකර්ෂණය වඩා වඩාත් දියුණු තියුණු කිරීමේ පරමාර්ථයෙන් කොහොඹා යක් කංකාරියට පමණක් සීමා වූ උඩරට වෙස් නැටුම එවකට විසූ ප්‍රවීන ශිල්පීන්ගේ රුචියද ලබා ගෙන දළදා පෙරහැරට එකතු කරන ලද බව ඔවුන් සමඟ කරන ලද සාකච්ඡාවලදි වැඩිදුරටත් හෙළි විය.

මෙසේ දළදා පෙරහැර වෙස්, පන්තේරු, උඩැක්කි, රබන්, ලී, සවරන් යන නැටුම් අංගවලින් සමන්විතව පෝෂණය විය. එකී පී.බී. නුගවෙල දියවඩන නිලමේතුමන් පූර්වාදර්ශයට ගත් පසුකාලයේ රාජකාරි භාරව කටයුතු කළ එහෙත් පැරණි දළදා පෙරහැරවල නැටුම් හා වාදන සම්ප්‍රදාය පිළිබඳ වැටහීමක් නොමැති දියවඩන නිළමේවරු විසින්ද තම තමන්ගේ රුචිකත්වය මත විවිධ නැටුම් හා වාද්‍ය අංග එකතු කරන ලදී. ඒ හේතුවෙන් අසූවේ දශකයේ පවා දකින්නට නොලැබුණු විදේශීය රටවල වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩ දළදා පෙරහැරට එකතු විය. මතු දැක්වෙන පරිදි දළදා

1. ඇලඔටුවේ සිරියා මයා, පලිපාන, නන්දන මයා, අමුණුගම සුරඹා මයා, රංගන ගුණදාස මයා, කහල්ල පී.බී. රත්තරනා මයා, වේගිරියේ කිරපුංචා මයා, ගලදොර රංඹරනා මයා, නාපාන ගණමලා මයා, හිත්හොඩ සුරේන්ද්‍ර මයා යන අය සමඟ සාකච්ඡා කරන ලදී.

පෙරහැර ගමන් කරන රිද්මය පවා නොහඳුනන මෙවැනි නර්තන හා වාදන ශිල්ප සිංහල රජ දවස දළදා පෙරහැරට ආවේණික වූ නැටුම් හා වාදන සම්ප්‍රදායට අනුකූල නොවන අංග එකතුවීම හේතුවෙන් නර්තන හා වාදන සම්ප්‍රදායේ අනන්‍යතාවය කෙළෙසී විවිධ නැටුම් හා වාද්‍යන්ගෙන් යුත් සංස්කෘතික සංදර්ශනයක් බවට පත්වී තිබෙන බව පාරම්පරික බොහෝ ශිල්පීන් විසින් පවසන ලදී. එම ශිල්පීන් දළදා පෙරහැර තමන්ගේ ආත්මය කොට උදාර ලෙස සලකා කටයුතු කිරීම නිසා ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන මතිමතාන්තර ඉවත දැමීමට පෙර ආපසු හැරී බැලිම අප කාගේත් යුතුකමකැයි සිතමි. තවද මෙම වෙනස්වීම පිළිබඳ ඔවුන්ගේ මුසුප්පුවීම, පෙරහැර දීර්ඝ කාලයක් නර්තන හා වාදනයෙන් අලංකාර කළ අද විශ්‍රාම සුවයෙන් පසුවන ඔවුන්ගේ චින්තනයට අනුව අසාධාරණ නොවන බවද නිගමනය කළ හැකිය.

දෙවන විමලධර්මසූරිය රජතුමන් (ක්‍රි.ව. 1687 - 1707) විසින් දළදා මාළිගාවේ තේවාව හා පෙරහැර රාජකාරිය නිසි අන්දමින් ඉටු කිරීමට පහසුවීම සඳහා සියලුම නර්තන හා වාදන ශිල්පීන් නියෝජනය වන පරිදි පණික්කධුර හතරක් පත් කරන ලදී.[1] මෙම පණික්කධූර හතර භාර ප්‍රධාන පණික්කයන් විසින් දළදා මාළිගාවේ හා පෙරහැර තේවාව හා ගොඩ මඩ ඉඩකඩම් ලබාගත් පරම්පරාවල ශිල්පීන් කැඳවාගෙන පෙරහැරට සහභාගී කරවීම හා දළදා මාළිගාවේ තේවාව මැනවින් ඉටු කිරීම කළයුතු වේ. "හේවිසි පංගුව" නමින් ඉඩම් ලත් අය විසින් හේවිසි වාදනය කිරිමද, "හොරණෑ පංගුව" නමින් රාජකාරී ඉඩම් ගත් අය හොරණෑ පිඹීමද, "නැටුම් පංගුව" නමින් රාජකාරි ඉඩම් ලත් අය නැටුම් ඉදිරිපත් කිරීමද ආදි වශයෙන් ඔවුන් වෙත පැවරී තිබෙන රාජකාරි මැනවින් ඉටු කළ යුතුය. පෙරහැර ගමන් කිරීමේ දී ද එම පණික්කධූර හොබවන ශිල්පීන් හේවිසි හා නැටුම් යන අංශයන්හි පෙරමුණේ ගමන් කළ යුතු බව පාරම්පරික ප්‍රවීණ ශිල්පීන් සමඟ කරන ලද සාකච්ඡාවලදී හෙළිවිය.[2]

1. සෙංකඩගලපුර ඉතිහාසය, ඒ.ඩී.පී. කරුණාතිලක, පි.අංක 89
2. පසු පිටුවල සඳහන් ශිල්පීන් සමඟ සාකච්ඡා කරන ලදී. තොරතුරු සැපයූ ශිල්පීය නාම ලේඛනය බලන්න.

ඉහත සඳහන් පරිදි දළදා මාළිගාවේ තේවාව හා පෙරහැර රාජකාරිය සඳහා නිල පංගු ලැබූ වැල්ලගිරිය, හොඩියාදෙණිය, මොලගොඩ, කහවත්ත, යකාවෙල, කෙවුල්ගම, අජකෙලිපිටිය, මාලගම්මන, ඉහලවෙල යන පරම්පරා ප්‍රමුඛස්ථානයක් උසුලයි. බෙරවාදන පරම්පරා අතර හිත්ගොඩ, එරමුදුගොල්ල, වැල්ලේතොට, පලිපාන, ගඩලාදෙණිය, අමුණුගම, යන පරම්පරා ප්‍රමුඛ වේ. එසේම නැටුම් පරම්පරා ලෙස විශේෂයෙන් සලකනු ලැබ ඇත්තේ වෙස් නැටුම්, නයියඩි නැටුම්, අංග ඉදිරිපත් කළ ශිල්පීන් බව පාරම්පරික ශිල්පීන් සමඟ කරන ලද සාකච්ඡා වලින් හෙළිවිය. නිත්තවෙල, අරමුණුගම, රංගම, අත්තරගම, දික්පිටිය, ගොහාගොඩ, තිත්තපජ්ජල, බූටාවත්ත, එරමිණියඅංග යන පරම්පරා එකී පරම්පරා අතර ප්‍රමුඛ වේ. උඩැක්කි, පන්තේරු, රබන් යන පරම්පරා අතර බූටාවත්ත, වළල, හීනාගම, ඌරාපොල, නාපාන, පිලවල, බටගල්ල, මීගම්මන, බටුගොඩ යන පරම්පරා 19 වන සියවස වන විට ප්‍රමුඛස්ථානය හිමිකරගෙන තිබේ.

ඉහත සඳහන් පාරම්පරික නර්තන හා වාදන ශිල්පීන් තුල කැපී පෙනෙන විශේෂත්වය ලෙස හේවිසි වාදන සහ බෙර වාදන පරම්පරා නියෝජනය කරන ශිල්පීන් අතරින් විශාල සංඛ්‍යාවක් තම්මැට්ටම් වාදනය, බෙර වාදනය, හොරණෑ වාදනය මෙන්ම උඩරට නැටුම් කලාවද මැනවින් පුරුදු පුහුණු කළ ප්‍රවීණයන් බවට පත් වූ ශිල්පීන්ද සිටින බව හෙලි විය.

වෙස් නැටුම් ශිල්පීන් හිස වෙස් නොමැතිව (හිසට වෙස් තට්ටු නොපැළඳ) ඉදිරිපත් කරන නැටුම නයි අඩු නැටුම ලෙස පෙරහැරට සහභාගී වනු ලැබේ. බෙර වාදන පරම්පරා ශිල්පීහු විශේෂයෙන් උඩරට නැටුම්ද මැනවින් පුරුදු පුහුණු වෙති. එපමණක් ද නොව එකී පරම්පරාවල ආධුනික ශිල්පීන් ප්‍රවීණ ගුරු පරම්පරා යටතේ මනාව පුහුණු වී දළදා පෙරහැරට සහභාගී වන බවද සඳහන් කරන ලදී.

ඉහත සඳහන් පරිදි ප්‍රවීන ගුරු පරම්පරා යටතේ මනාව පුහුණුවක් ලැබ කොතරම් දක්ෂ අන්දමින් නර්තන හා වාදන අංග ඉදිරිපත් කළද දළදා මාළිගාවේ පණික්කධූර හොබවන අය හා එකඟව සමඟිව ඔවුන්ගේ අනුදැනුම

ඇතිව පෙරහැරට සහභාගි විය යුතුය. වයසින් වැඩි ප්‍රවීන ශිල්පීන්ට වෙනත් කුමන උත්සවයක වුවද මුල්තැන හිමිවේ. එහෙත් පණික්කධූර ලැබූවන් වයසින් කොතරම් අඩු වුවද ශිල්පීය ඥානයෙන් කොතරම් අඩු වුවද, දළදා පෙරහැරේ ගමන් කිරීමේදී එකී පණික්කධූර හොබවන ශිල්පීන්ට මුල් තැන ලැබේ. එසේම පෙරහැරට සහභාගි වන නර්තන හා වාදන ශිල්පීන් වයසින් කොතරම් වැඩි වුවද ශිල්පීය ඥානයෙන් කොතරම් ප්‍රවීණ වුවද පණික්කධූර දරන අයට ඉදිරියෙන් පෙරහැරේ පෙරමුණේ ගමන් කිරීමට බලපෑම් කළ නොහැකිය. පණික්කධූර දරන අය යම් හෙයකින් එවැනි ශිල්පියෙකුට පෙරමුණේ ගමන් කිරීමට ඉඩ ලබා දුන හොත් පමණක් එසේ පෙරමුණේ ගමන් කළ හැකිය. පණික්කධූරවල ආයු කාලය දියවඩන නිළමේවරුන්ගේ කැමැත්ත පරිදි තීරණය වේ. රාජකාරි ඉඩම් භුක්ති විඳින ශිල්පීන්ටද ඇතැම් අවස්ථාවල පණික්කධූර හොබවන ශිල්පීන්ගේ අවසරය නොලැබීමත් පෙරහැරේ ගමන් කිරීමට නොලැබුණු අවස්ථා ගැනද අසන්නට ලැබේ.

20 වන සියවසේ අග භාගය වන විට චාරිත්‍රානුකූලව පවත්වාගෙන පැමිණි රාජකාරි ඉඩම්වලින් බදු එකතු කිරීම පණික්කධූර ලබන්නන් අතින් විවිධ හේතු මත ක්‍රමයෙන් අභාවයට පත්විය. එයින් පසු ශිල්පීන්ට වැටුප් ගෙවන තත්වයට පරිවර්තනය විය. මෙම සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස නර්තන හා වාදන ශිල්පීන් තුළ වූ බොහෝ ආචාර සමාචාර විධි හා සිරිත් විරිත් ක්‍රමයෙන් අභාවයට යන්නට වූ බව ප්‍රවීන ශිල්පීන් සමඟ කරන ලද සාකච්ඡාවලදී හෙළි විය.

නර්තන වාදන තේවාව භාර පණික්කධූර ලැබූවන්ගේ එකී ධූර පියාගෙන් පුතාට ලැබුණු අතර ඇතැම් අවස්ථාවල බෑණාවරුන්ටද එම ධූර ලැබුණි. පුතුන් නොමැති ප්‍රවීන ශිල්පීන් වෙනත් ශිල්ප පරම්පරාවක තරුණයෙකු ගෙන්වාගෙන ඔහුට තේවාව සහ සිරිත් විරිත් පුහුණු කරවා ඔහුගේ නිවසෙහි පදිංචි කරවා ගෙන තමාගෙන් පසු එකී ධූරවලට පත් කරන ලද බවද එම පරම්පරා තොරතුරු පරික්ෂා කිරීමේදි අනාවරණය විය. 1983.3.22 කහල්ල බී.ජී. රත්තරනා මහතා සමඟ කරන ලද සාකච්ඡාවේදී එම පරම්පරාවේ මී මුත්තා ක්‍රි.ව. 1840 දී පමණ දළදා මාළිගාවේ හේවිසි භාරව

කටයුතු කළ බවද, එම පරපුරේ සිරිමලා නැමැත්තෙකු නැහිනිවල ගමට ගොස් එහි පදිංචිව බින්න විවාහයට ඇතුළත් වීමෙන් නැහිනිවෙල වාදන පරපුර බිහිවූ බවද හෙළිවිය. මෙබඳු සිදුවීම් රැසක තොරතුරු එකී පාරම්පරික කලා ශිල්පීන් සමග කරන ලද සාකච්ඡාවලදී අනාවරණය විය.[1] පාරම්පරික කලා ශිල්පීන්ගේ විවාහ චාරිත්‍ර මෙසේ සිදුවීම හේතුකොට ගෙන දළදා මාළිගාවේ පණික්කධූරවලට පත් කිරීමේදී මුල් පරම්පරාවට වෙනස් වූ වෙනත් පරම්පරාවලටද කලින් කලට එම ධූරය දැරීමට අවස්ථාව උදාවිය. එසේම නර්තන හා වාදන සම්ප්‍රදායේ ඇතැම් වෙනස්කම් ඇති වීමට මෙම කරුණ බලපා තිබෙන බවද තවදුරටත් හෙළිවිය.

1990 වර්ෂයට ඉහත පෙරහැරට සහභාගීවූ නර්තන හා වාදන ශිල්පීන් ඔවුන්ගේ පියා සමඟ හෝ අත්තා සමඟ නැතහොත් සුළු පියා සමඟ කුඩා අවදියේ පටන් පෙරහැරට සම්බන්ධ වන ලදී. එසේ සම්බන්ධ වී අත්දැකීම් ලබාගෙන පෙරහැරේ පසුපෙළේ සිට ක්‍රමයෙන් මුල්පෙළ දක්වා පැමිණ මුල්පෙළේ ශිල්පියෙකු බවට පත්වන බවද තවදුරටත් හෙළිවිය.

දළදා පෙරහැර වීථි සංචාරය කිරීමට ආරම්භ කළ අවස්ථාවේ පටන් ගෙවැදීම දක්වා වූ කාලය තුළ නර්තන හා වාදන ශිල්පීන් විසින් පෙරහැර අඛණ්ඩව ගෙන යෑම සඳහා විශාල කැපකිරීමක් කරනු ලබයි. ඉහත දක්වන ලද පරිදි එම කැපකිරීම ක්‍රම ක්‍රමයෙන් පුහුණුවිය යුතු වේ. එක් ශිල්පියෙකුගේ ප්‍රමාද දෝෂයකින් පෙරහැරේ ගමන් ශෛලිය භින්න වී එහි අලංකාරයටද හානිවීමට ඉඩ තිබේ. එබැවින් ඔවුනොවුන්ගේ ශිල්පීය දක්ෂතා තමා විසින්ම අගය කර ගැනීම, පරම්පරා ගර්වය මෙන්ම තමන්ගේ වයෝවෘද්ධ බව සැලකීම, වැනි අභිමානවත් චින්තන නිසා පැණනැගි විවිධ ගැටුම්, අමනාපකම් ආදිය පෙරහැර ආරම්භ කිරීමට පෙර අමතක කළ යුතුය. මේ

1. උඩරට පාරම්පරික නර්තන හා වාදන පරම්පරා කේ.ඩී.ජී. සුමනදාස පි.අංක 82 - 241. තමාට වඩා වයසින් අඩු අය කොන්ද නමා ආචාර කරන විට වැඩිහිටි අය හිස පමණක් නමා ඔවුන්ට පෙරළා ආචාර කරනු ලැබේ. මෙසේ අනුපිළිවෙළ අනුව අනෙකුත් ශිල්පීන්ද ආචාර සමාචාර කරගනු ලැබේ. මෙම චාරිත්‍ර සම්ප්‍රදාය දළදා පෙරහැර ආරම්භ කළ මුල් අවධියේ පටන්

සඳහා ඔවුන් විසින් පහත සඳහන් පරිදි චාරිත්‍ර සම්ප්‍රදායක් පෙර සිට අනුගමනය කරන බවද හෙළිවිය.

පළමුවෙන් පෙරමුණේ ගමන් කරන පණික්කඩුර හොබවන ශිල්පීහු පෙරහැර ආරම්භක ස්ථානයේදී දළදා කරඬුව වැඳ නමස්කාර කරති. අනතුරුව දියවඩන නිළමේට ආචාර කර ඔවුනොවුන් සතර දෙනා විසින් ආචාර සමාචාර කරගනු ලැබේ. එහිදී ඔවුන් සතර දෙනාගේ වැඩිහිටි පදනම මත එය සිදුවේ. ඉන්පසු සිව්පෙළේ වාදන ශිල්පීන් විසින් පණික්කඩුර හොබවන අයට ආචාර කරනු ලැබේ. වයසින් වුවද වැඩිහිටි ශිල්ප ඥාණයෙන් උසස් වුවද සිව් පෙළේ ශිල්පීන් විසින් පණික්කඩුර හොබවන ශිල්පීන් ඉදිරියට පැමිණ ආචාර කළ යුතුය. මෙහිදී වැඩිහිටි අය තමාට වඩා වයසින් අඩු අය කොන්ද නමා ආචාර කරනවිට වැඩිහිටි අය හිස පමණක් නමා ඔවුන්ට පෙරළා ආචාර කරනු ලැබේ. මෙසේ අනුපිළිවෙළ අනුව අනෙකුත් ශිල්පීන්ද ආචාර සමාචාර කරනු ලැබේ. මෙම චාරිත්‍ර සම්ප්‍රදාය දළදා පෙරහැර ආරම්භ කළ මුල් අවදියේ පටන් පැවත එන බව ප්‍රේමසිරි මාලගම්මන, පංචනාදයා හපුගොඩ, උඩුවෙල ඕ.ජී. ලී. රංකිරා, පිටර් සූරසේන, අයි.පී. සිරිසෝම ආදි ප්‍රවීන ශිල්පීන් විසින් පවසන ලදී.

නර්තන අංශයේ ශිල්පීන් දෙපළට පෙළ ගැසෙනු ලැබේ. දෙපෙළේ මධ්‍යභාවය බෙර වාදන ශිල්පීන්ට අයත් වේ. මෙම සම්ප්‍රදාය දළදා පෙරහැරේ පමණක් දක්නට ලැබුණු විශේෂාංගයක් වුවද පසුකාලයේ ආරම්භ කරන ලද වෙනත් ප්‍රසිද්ධ පෙරහැරවලද මෙහි අනුකරණ දක්නට ලැබේ. නර්තන අංශයේ ශිල්පීන් විසින් ද ඉහත දක්වන ලද චාරිත්‍ර පරිදි සම්ප්‍රදායානුකූල චාරිත්‍ර ඉටු කරනු ලැබේ. එහෙත් එහි කිසියම් විශේෂයක් ද දක්නට ලැබේ.

පෙරහැර ආරම්භක ස්ථානයට දන්තධාතු කරඬුව වැඩමවීමෙන් අනතුරුව, පෙරහැර පිටත්වීමේ කාලය එළඹි විට බෙර වාදන ශිල්පීන් විසින් දේවපදය වාදනය කරනු ලැබේ. අනතුරුව ආලත්ති පදය වයද්දී ඊට අනුරූපව නර්තන ශිල්පීන් විසින් නර්තන පවත්වා දන්තධාතු කරඬුවට

නමස්කාර කරනු ලැබේ. පෙරහැර ආරම්භ කිරීම සඳහා මගුල් බෙර වාදනය නොකරනු ලැබේ. ඉන්පසු දියවඩන නිළමේට ආචාර කරනු ලැබේ. පසුව ඉහත දක්වන ලද පරිදි ආචාර සමාචාර කර ගනිති. එහෙත් මෙහිදී නර්තන ශිල්පීහු සමීපයට පැමිණ ආචාර කරති. එම චාරිත්‍රය මෙහි විශේෂ ලක්ෂණයක් ලෙස හැඳින්විය හැකිය. වැඩිහිටියන් හිස පමණක් නමා ආචාර කරන අතර වයසින් අඩු අය කොන්ද නමා ආචාර කරති. මෙසේ ආචාර සමාචාර කර ගැනීමෙන් පසු පෙරහැරට සහභාගීවීමට පෙර සිදුවූ කුමන හෝ අමනාපයක් අසතුටක් ආරෝවක් වී නම් ඒ සියල්ල අමතක කර මහත් සොම්නසින් පෙරහැර රාජකාරි මනාව ඉටුකරනු ලැබේ. මොවුන්ගේ වගකීම පෙරහැර රාජකාරී නිසි පරිදි ඉටු කිරීම බව මැනවින් අවබෝධකරගෙන කටයුතු කරනු ලැබේ. මෙම චාරිත්‍ර දැනට ශත වර්ෂ කිහිපයකට පෙර සිට පැවත එන්නක් බවද හෙළිවිය.[1]

## කුඹල් හා රන්දෝලි පෙරහැර

කුඹල් හා රන්දෝලි පෙරහැර දිනයන්හිද නර්තන හා වාදන ශිල්පීන්ගේ වේශනිරූපණයන්හි විවිධත්වයක් දක්නට ලැබේ. ප්‍රවීන ශිල්පීන් පවසන ලද තොරතුරු අනුව දළදා පෙරහැර ආරම්භ කළ කාලයේ පටන් 80 දශකය දක්වාම එකී සම්ප්‍රදාය නොනැසී පැවති බවද හෙළිවිය.

කුඹල් පෙරහැර සඳහා සහභාගී වන වාදන ශිල්පීන්ගේ උරමාලයට (හිසෙහි බඳින ජටාව වැනි හිස් වැසුම්) පටි බැඳීම (කතිර හැඩයට බඳින රතු පාට පටි) නොකරන බවද, විසිතුරු නොකර සාමාන්‍ය අන්දමට සුදු රෙද්දකින් ජටාව බඳින බවද, අඳින ඇඳුම (තුප්පොට්ටිය) සඳහා "නවනි රෙද්ද " ඇඳිය යුතු බවද ප්‍රේමසිරි මාලගම්මන මහතා විසින් පවසන ලදී.[2] සුදු රෙද්ද ඇඳ ඊට උඩින් පච්චවඩමබඳින බවද වැඩිදුරටත් සඳහන් කරන ලදී.

1. 2009.07.05 දින පිටර් සුරසේන, අයි.පී. සිරිසෝම සහ 2009.07.06 යන දින ප්‍රේමසිරි මාලගම්මන යන ප්‍රවීණ ශිල්පීන් විසින් පවසන ලදී.
2. 2009. 07. 06 යන දින ප්‍රේමසිරි මාලගම්මන මහතා සමග ඔවුන්ගේ නිවසේදී සාකච්ඡා කරන ලදී

දවුල් වාදන ශිල්පීන් විසින් සිය දවුලට සවරන් බැඳීමද කඩුක්කන් පැළඳීමද නොකරන බවත්, එහෙත් පණික්කඩූර හොබවන සතර දෙනාට සම්පූර්ණ උරමාලයෙන් සහ තුප්පොට්ටියෙන් සැරසී දවුලට සවරන් බැඳ කුඹල් පෙරහැරේ ගමන් කළ හැකි බවද, ප්‍රේමසිරි මාලගම්මන මහතා විසින් පැරණි ශිල්පීන්ගේ තොරතුරු ද ඉදිරිපත් කරමින් තවදුරටත් සඳහන් කරන ලදී. එහෙත් පෙරහැරට සහභාගීවන සියලුම ශිල්පීන් රන්දෝලි පෙරහැරට සම්පූර්ණ ලෙස අලංකාර කරන ලද උරමාලයෙන් හා තුප්පොට්ටියෙන් සැරසෙන ලද බව හෙළිවිය.

## පෙරහැර වීථි සංචාරය කිරීම

දළදා පෙරහැර පිටත් වීම සඳහා ධාතු කරඬුව වැඩමවීමේ සිට වීථි සංචාරක පෙරහැර ගෙවදීම තෙක් හේවිසි වාදන ශිල්පීන් විසින් විශාල කර්‍ය භාරයක් ඉටු කරනු ලබයි. පෙරහැරේ නියමුවෝ ඔවුහු වෙති. මේ කාලය තුළ හේවිසි වාදන සම්ප්‍රදායේ විවිධ ශෛලීන් දක්නට ලැබෙන බව පාරම්පරික ශිල්පීන් කරන ලද සාකච්ඡාවලින් හෙළිවිය. එම පැරණි සම්ප්‍රදාය අදත් චාරිත්‍රානුකූලව එලෙසම පවත්වාගෙන එනු ලබන බව 2009.07.05 සහ 06 යන දිනයන්හිදී පීටර් සූරසේන, අයි.ජී. සිරිසෝම, ප්‍රේමසිරි මාලගම්මන යන ප්‍රවීන ශිල්පීන් සමඟ කරන ලද සාකච්ඡාවේදී හෙළිවිය.

කරඬුව වැඩම කරවීම සඳහා හක්ගෙඩිය පිඹීමෙන් අනතුරුව හේවිසි වාදනය ආරම්භ කරනු ලැබේ. එය "පිරීමේ හේවිසිය" යනුවෙන් හඳුන්වනු ලැබේ. ඉන්පසු තේවා හේවිසි වාදනය කරමින් කරඬුව පහත මාලයට වැඩම කරවනු ලැබේ. කරඬුව ඇතා පිට තැන්පත් කිරීම සඳහා තේවා හේවිසි පදය මාරුකර වෙනත් හේවිසි පදයක් වාදනය කරනු ලැබේ. (ජෙංග ජෙඟට ජේන් ජේන් කුටකිටිතක/// යනුවෙන්) වැඩමවන ඇතා පිට කරඬුව තැන්පත් කිරීමෙන් පසු නැවතත් හේවිසි පද මාරු කර "වැඩමවීමේ හේවිසිය" වාදනය කරමින් පෙරහැර ආරම්භ කරන ස්ථානයට කරඬුව වැඩමවාගෙන පැමිණෙති. ඉන් පසු "පිරීමේ හේවිසිය" (වලිනඩ) වාදනය කර හේවිසි පුරනු ලැබේ. මෙම හේවිසි වාදනය ඇසෙත්ම සතර දේවාලවල රාජකාරි ලත් සියල්ලෝම පෙරහැර පිටත්වීමට සූදානම් වෙති. විශේෂයෙන්

සතර දේවාලවලට අයත් හේවිසි වාදන ශිල්පීන් මෙම හේවිසි නාදය කන වැකෙත්ම දළදා කරඬුව ඉහළ මාලයේ සිට පෙරහැර පටන් ගන්නා ස්ථානය දක්වා වැඩමවාගෙන එන කාලය තුළ සිදුවන සියලු කාර්යයන් ග්‍රහණය කරගනු ලැබේ.

ඉනික්බිතිව "ගමන් හේවිසිය" වාදනය කර පෙරහැර පිටත්වෙනු ලැබේ. පෙරහැර වීථි සංචාරය කරන අවස්ථාවන්හිදීද වීථියකට හැරෙන විට "හේවිසි පහේ හේවිසිය" වාදනය කරනු ලැබේ. වීථි සංචාරය හමාර කර රජවීදියට පැමිණ රජගෙදර හන්දිය අසලදී "ගෙවදීමේ හේවිසිය" පුරනු ලැබේ. එවිට දළදා පෙරහැරට පසුපසින් පැමිණෙන සතර මහා දේවාලවල හේවිසි වාදන ශිල්පීන්, බෙර වාදන ශිල්පීන්, නර්තන ශිල්පීන් සහ දීර්ඝ කාලයක් පෙරහැරේ ගමන් කළ පෙරහැර රාජකාරි පිළිබඳ මැනවින් අවබෝධයෙන් කටයුතු කරන බස්නායක නිළමේවරුන්ද පෙරහැර ගෙවදීමට ආසන්න බව හඳුනාගනු ලැබේ. දළදා පෙරහැරට ආවේණික වූ හේවිසි වාදන සම්ප්‍රදායේ විශේෂ ලක්ෂණය වන්නේ එයින් දෙන පණිවිඩය ඈත එපිට ගම්බඳ ජනයාට පවා හඳුනා ගැනීමට හැකිවීමයි. මෙම හේවිසි වාදනය ඇසෙන මානයේ විසූ පැරණි ගම්මුන්ද "ඔන්න පෙරහැර ගෙවදිනවා" යැයි කියනු අසන්නට ලැබී ඇත. දළදා පෙරහැර පොදු ජනයා අතරට ගෙනයන ලද්දේ හේවිසි වාදන ශිල්පීන් බවට මෙයම හොඳ සාධකයකි.

අනතුරුව කරඬුව මාලිගයේ වැඩවසන ස්ථානයේ තැන්පත් කිරීම පිණිස වෙනත් හේවිසි පද වාදනය කරනු ලැබේ. එය "බරාඳ හේවිසිය" යනුවෙන් හැඳින්වේ. මෙම අවස්ථාව හේවිසි වාදන ශිල්පීන්ගේ දක්ෂතා මතුකර පෙන්වීමට කදිම අවස්ථාවකි. එක් පක්ෂයකින් පටන් ගත් හේවිසි වාදනය අනෙක් පක්ෂය විසින් ගෙවමින් කරඬුව තැන්පත් කරන තුරු නොකඩවා වාදනය කරනු ලැබේ. හේවිසි පහේ හේවිසිය තුළ විවිධ අලංකාර පද වයමින් ඉතා චමත්කාරජනක දර්ශනීය වාදන සංදර්ශනයක් ලෙස මෙම අවස්ථාව කැපී පෙනෙනු ඇත. කරඬුව තැන්පත් කළ පසු ගණ්ඨාව නාද කරයි. ඉන් පසු හේවිසි වාදනය නතර කරනු ලැබේ. දළදා පෙරහැරේ හේවිසි

පහේ හේවිසිය පමණක් වාදනය කරනු ලබන බව සුගතපාල මාලගම්මන, ප්‍රේමසිරි මාලගම්මන යන ප්‍රවීන ශිල්පීන් සමග කරන ලද සාකච්ඡාව තුළින් අනාවරණය විය.[1]

එපමණක්ද නොව දළදා පෙරහැරේ ඉතා ලයාන්විතව හේවිසි වාදනය කරනු ලබයි. මංගල හස්තියාට දන්තධාතු කරඬුව වැඩමවාගෙන ලාලිත්‍යයෙන් ගමන් කිරීමට පහසුවන පරිදි හේවිසි වාදනය කිරීමට එම ශිල්පීන්ට පුහුණුවක් හා විනයක් තිබිය යුතු බවද මාලගම්මන මහතා විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදී. ඒ සඳහා "ජෙංග ජෙංගක්කිට තක්කට තක්කට//" යන පදය වාදනය කරන බවද, අනෙකුත් නැටුම් සඳහා බෙර වැයීමේදී ඊට සරිලන ලෙස ගමන් ශෛලියක් අනුගමනය කළ හැකි "කුංජී ජිංතක කුඳ කුඳ", "කුංජී කඩතක ජිංගත ජිජිගත" යන බෙර පද වයන බවද තවදුරටත් සඳහන් කරන ලදී.[2] දළදා ලාස්‍ය ගමන් ශෛලීය රැකෙන පරිදි ඊට උචිත බෙර පද පමණක් වාදනය කිරීම දළදා පෙරහැරේ සම්ප්‍රදාය බවද අනාවරණය විය.

මෙසේ දළදා පෙරහැර වීථි සංචාරය ආරම්භ කිරීමේ පටන් ගෙවදීම දක්වා වූ කාලය තුළ හේවිසි වාදන සම්ප්‍රදායෙහි "පිරීමේ හේවිසිය" , "වලිනඩ වාදනය" (ආරම්භය) "තේවා හේවිසි" වාදනය තිත් තුනට, "ගමන් හේවිසිය", "ගෙවදීමේ හේවිසිය", බරාඳ හේවිසිය" ආදි වශයෙන් විවිධ නම්වලින් හඳුන්වනු ලබන රටා කිහිපයක් වාදනය කරන බව පැහැදිලි වෙයි.

දළදා කරඬුව වැඩම වන ස්ථානයේ ගජගා වන්නම ගායනයට අනුකූල වූ ගමන් ශෛලිය රැකගනිමින් නර්තන හා වාදන ශිල්පීන් විසින් පෙරහැරේ ගමන් රිද්මය රැක ගන්නා සේම කවිකාර මඬුව නියෝජනය කළ උඩැක්කි හා පන්තේරු ශිල්පීන් විසින්ද අතින් අතට පංතේරු මාරු කරමින්

1. 2008.08.13 වන දින දළදා මාළිගාවේදී සුගතපාල මාලගම්මන මහතා සමග සහ 2009.07.06 වන දින ප්‍රේමසිරි මාලගම්මන මහතා සමග ඔහුගේ නිවසේදී සාකච්ඡා කරන ලදී
2 එම

ගමන් කර ඇත. එහෙත් අද උඩැක්කි හා පන්තේරු අතෙහි රුවාගෙන කවි කියමින් ගමන් කරනු දක්නට ලැබේ. 1929 වසරේ පවත්වන ලද දළදා පෙරහැරේ ගමන් කළ ශිල්පීන් දකුණතෙන් වමතටත්, වමතින් දකුණු අතටත් පන්තේරු මාරුකරමින්, කවි කියමින්, තාලයට අඩි තබමින් පෙරහැරේ ගිය බව විදේශිකයන් විසින් ලියන ලද වාර්තාවන්හි සඳහන් වේ. උඩැක්කි ශිල්පීන්ද ඒ අන්දමට දෙපසට නැමෙමින් එකී රිද්මයට වයමින් ගිය බව වැඩිදුරටත් අනාවරණය වේ.

ඉහත සඳහන් පරිදි දන්තධාතු කරඬුව වැඩමවාගෙන ගජගා වන්නම ගයමින් ඇත් ගමනට සරිලන පරිදි ගමන් කරන රිද්මයට අනකූලව අනෙක් නැටුම් හා වාදන ශිල්පීන්ද පෙරහැරේ ගමන් කරනු ලැබේ. එසේ නොවුණහොත් පෙරහැර ගමන් ශෛලිය ඉක්මන් වී අතරතුර කැඩි කැඩි ගමන් කිරීමට සිදුවීමෙන් එහි අලංකාරයට හානි වනු නොඅනුමානය තවද පෙරහැරේ නර්තන ඉදිරිපත් කරන ශිල්පීන්ගේ ගායනා බුදුගුණ ගායනයට පමණක් සීමා වේ. එසේම එකී ශිල්පීන්ගේ නර්තන හා වාදන රටාවද අනෙකුත් පෙරහැරවලට වඩා විශේෂත්වයක් හොබවයි. එම රටාව දළදා පෙරහැරේ නර්තන සම්ප්‍රදායට පමණක් ආවේණික වූවකි. පෙරහැරේ ගමන් කරන නැටුම් ශිල්පීන් පසුපසට නටමින් යන අතර එක් ස්ථානයක නතර වී නැටුම් ඉදිරිපත් කරන අවස්ථාවන්හිදීද පසුපසට නටනු ලැබේ. පෙරහැරේ ගමන් කරන විට දෙපසට ගමන් කරනු ලැබේ. දෙපේළියේ නර්තන ශිල්පීන් එකිනෙකාගේ ඉදිරිපස බලමින් ගමන් කරන අතර, බෙර වාදන ශිල්පීන් පසුපසට ගමන් කරනු ලබයි. මෙබඳු රටාවක් දළදා පෙරහැරේ දක්නට ලැබෙන්නේ දන්තධාතු කරඬුවට පිටුපස හැරවීමෙන් ඇතිවන අගෞරවය වැළැක්වීමට බව එම ශිල්පීන් සමඟ කරන ලද සාකච්ඡාවලදී හෙළිවිය.

එමතුද නොවේ නර්තන වාදන ශිල්පීන්ගේ ඇඳුම් පැළඳුම් පවා විවිධ වර්ණයෙන් තොර විය යුතුය. විශේෂයෙන් වෙස් නැටුම්, නයියඩි නැටුම්, පංතේරු, උඩැක්කි, රබන් වැනි නර්තතන ශිල්පීන් සහ බෙර දවුල් තම්මැට්ටම් හොරණෑ, වාදන ශිල්පින් සුදු වර්ණයෙන් සැරසිය යුතු අතර රැළි මන්ත හා ජටා සඳහා රතුපටි භාවිත කර සරසා ගනු ලබයි. මෙම හේතුව නිසා

1930 වර්ෂයේ පටන් මැතක් වන තුරුම දළදා මාළිගාවෙන් ශිල්පීන්ට සුදු රෙදි ලැබුණු බව පීටර් සූරසේන සහ ප්‍රේමසිරි මාලගම්මන යන ප්‍රවීන ශිල්පින් දෙදෙනා විසින් පවසන ලදි. තවද කන්ද උඩරට සුප්‍රසිද්ධ නැටුම් පරපුරක ප්‍රවීන ශිල්පියෙකු වෙස් නැටුම් සඳහා කහ වර්ණයෙන් යුතු ගඟුලකින් සැරසී පැමිණි අවස්ථාවක එවකට රාජකාරියෙහි නියුතු දියවඩන නිලමේ විසින් ඔහුට පෙරහැරට සහභාගි වීමට අවසර නොදී පිටමන් කළ බවද එම සාකච්ඡාවේදී හෙළි විය. නම්ගම් හෙළි කිරීම ආචාර ධර්මවලට පටහැණි බැවින් මෙහි ඔහුගේ නම් ගම් සඳහන් නොකෙරේ.

1829 වර්ෂයේ දළදා පෙරහැර ආරම්භ කළ දින පටන් 1980 දශකය දක්වාම රබන්, පන්තේරු, නයියඩි, ලී යන නැටුම් ඉදිරිපත් කළ ශිල්පීන් ඉනට සුදු රෙද්ද ඇඳ ඊට උඩින් රැළි මන්ත බැඳ ඒ මත පච්ච වඩම් බැඳ සැරසුණු අතර සුදු රෙදිවලින් උරමාල බැඳ සැරසුණු බවද වැඩි දුරටත් හෙළි විය.

පාරම්පරික ශිල්පීන්ට එදා ලැබුණු සැලකිලි සහ පිළිගැනීම් ක්‍රමයෙන් ගිලිහී යාමත් රාජකාරි ඉඩකඩම් පවුලේ සාමාජිකයන් අතරේ බෙදී යාම නිසා ආර්ථිකය පිරිහී යාමත්, නිසා ප්‍රවීන ශිල්පීන්ට, පෙරහැරට සහභාගී නොවී ඇත් වීමට සිදුවිය. තවද කොන්ත්‍රාත් පදනම මත නැටුම් සපයා ගැනීමද, පුහුණු නොවූ විවිධ නැටුම් කණ්ඩායම් කොන්ත්‍රාත් පදනම හේතුවෙන් සහභාගී වීමද, එසේම වෛවර්ණ ඇඳුම් පැළඳුම්වලින් සැරසුණු ළමා නැටුම් කණ්ඩායම් සහභාගි කරවීමෙන්ද, දළදා පෙරහැරට ආවේණික වූ නර්තන සම්ප්‍රදායට හානි වී වෛවර්ණ ඇඳුම් පැළඳුම්වලින් සැරසුණු සංදර්ශනයක් බවට පත්වී තිබෙන බවද, 1983.04.19 වන දින අමුණුගම සුරඹා මහතා සමඟ සහ 2001. 01. 04 දින රංගම ගුණදාස මහතා සමඟද කරන ලද සාකච්ඡාවලදී හෙළි විය. සයිමන් මාලගම්මන, තිත්තපජ්ජල සුරඹා, සිරිපිනා, ඉහළවෙල ආදි ප්‍රවීණ ශිල්පීන් සමඟ කරන ලද සාකච්ඡාවලදීද එම සිදුවීම්

පිළිබඳ ඔවුන්ගේ කනස්සල්ල පළ කරන ලදී.[1]

තවද අසූව දශකයේ පටන් අනූව දශකය අවසානය දක්වා අඛණ්ඩව ඇසළ පෙරහැරේ දක්ෂ ශිල්පීන් තෝරා ගැනීමේ පරීක්ෂණ කටයුතුවලට මට සහභාගී වීමට හැකි විය.[2] මෙම කාලය තුළ නිරීක්ෂකයෙකු ලෙසද ලබාගත් අත්දැකීම් අනුව වසරින් වසර විවිධ වර්ණයෙන් යුතු ඇඳුම් පැළඳුම්වලින් සැරසුණු ළමුන්ගේ නැටුම් කණ්ඩායම් එකතු වීමේ ප්‍රවණතාව වැඩි වූ බවද , නර්තන හා වාදන කලා ශිල්පයෙහි පරිණත නොවූ පාරම්පරික සිසුන්ගෙන් බාහිර උඩැක්කි, පන්තේරු, රබන් ආදී විවිධ නැටුම් කණ්ඩායම් විවිධ වර්ණයෙන් යුතු ඇඳුම් ආයිත්තම්වලින් සැරසී පැමිණෙනු දකින්නට ලැබුණු බව සඳහන් කළ හැකිය. කෙසේ හෝ පෙරහැර දීර්ඝ කරගැනීමේ පරමාර්ථයට ප්‍රමුඛස්ථානය ලබාදීමේ අභිලාෂය මෙම තත්වයට හේතු වූ බව අනාවරණය විය.

දළදා කරඬුව වැඩමවාගෙන ගජගා වන්නමේ ලාස්‍ය රිද්මයට මුළු පෙරහැරම වීථි සංචාරය කළ කාලය ගිලිහී ගොස් වේග රිද්මයට බොහෝ නැටුම් කණ්ඩායම් නර්තනයේ යෙදෙනු අද දක්නට ලැබේ. එහෙත් හේවිසි වාදනයද දළදා කරඬුව සහ දියවඩන නිළමේ ඉදිරිපස දක්නට ලැබෙන වෙස් නැටුම් හා නයියඩි නැටුම් කණ්ඩායම් ද එකී රිද්මයානුකූල නැටුම් සම්ප්‍රදාය රැකගෙන ගමන් කරනු බව දක්නට ලැබේ. එසේම අසූව දශකයට ඉහත කාලයන්හි පාරම්පරික ශිල්පීන් විසින් පෙරහැර නරඹන ජනතාව පිනවීමට ඔවුන්ගේ නර්තනය විලම්භලයෙන් පටන් ගෙන ක්‍රමයෙන් මධ්‍ය ලයට මාරුකර නර්තනයෙහි රිද්මය ක්‍රමයෙන් ධෘත ලයට ගෙන නැවතත් ක්‍රමයෙන්

1. රංගම ගුණදාස මයා සමඟ 1983.07.29 , නන්දන පලිපාලන මයා සමඟ 1986.02.17 සයිමන් මාලගම්මන මයා සමඟ 1995.05.03 සිරිපිනා ඉහළවෙල මයා සමගී 1984.03.20, ප්‍රේමසිරි මාලගම්මන මයා සමඟ 2009.07.06 යන දිනයන්හි සාකච්ඡා කරන ලදී. විවිධ අය තමන් සේවය කරනු ලබන පාසැල්වල සිසුන් කැඳවාගෙ එන බවද ඔවුන් විසින් හෙළි කරන ලදී.
2. මෙම පරීක්ෂණ කටයුතුවලට සහභාගී වූ තිත්තපජ්ජල සුරඹා, ගුණසේන රාජපක්ෂ, හඟුරන්කෙත සිරිසේන රාජපක්ෂ යන ප්‍රවීණ ආචාර්යවරුන්ගේ උපදෙස් අපගේ පරීක්ෂණවලට බෙහෙවින් ප්‍රයෝජනවත් විය.

විලම්භලයට ගෙන යනු ලබයි. තාණ්ඩව නැටුම් දළදා පෙරහැරෙහි ඉතා අඩුවෙන් දක්නට ලැබේ.

සුගතපාල මාලගම්මන, ප්‍රේමසිරි මාලගම්මන, පීටර් සුරසේන, රංගම ගුණදාස, අමුණුගම සුරඹා, සයිමන් මාලගම්මන, තිත්තපජ්ජල සුරඹා ආදී පාරම්පරික ශිල්පීන් විශාල පිරිසක් සමඟ විටින් විට කරන ලද සාකච්ඡා තුලින් ලිඛිත සාධක තුලින් උකහාගත නොහැකි ඉහත සඳහන් තොරතුරු අනාවරණය කරගන්නා ලදී.

## ආශ්‍රිත ග්‍රන්ථ

01. උඩරට පරාම්පරික නර්තන හා වාදන පරම්පරා, කේ.ඩී.ජී. සුමනදාස එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 675, මරදාන පාර, කොළඹ 10 (2007)
02. ඩේවි දුටු ලංකාව, අනුවාදක, එච්.එම්. සෝමරත්න 1967
03. දළදා සිරිත, වී.ඩී.එස්. ගුණවර්ධන සංස්කරණය
04. පූජාවලිය, සංස්කරණය පණ්ඩිත කිරිඇල්ලේ ඥාණවිමල ස්ථවිරයන් වහන්සේ (1965)
05. මධ්‍යම ලංකා පුරාවෘත්ත, පූජ්‍ය රාජකීය පණ්ඩිත නාවුල්ලේ ධම්මානන්ද හිමි. (1969)
06. විදේශීන් දුටු පුරාණ ලංකාව, ඩී.පී. පොන්නම්පෙරුම (1969)
07. සිරි දළදා පුවත, සරච්චන්ද්‍ර ජයකොඩි, සදීව පොත්හල මරදාන 20.
08. සිහල මහාවංශය, සිංහල පරිවර්තනය ශ්‍රී සුමංගල නාහිමි සහ ආචාර්යය බටුවන්තුඩාවේ දේවරක්ඛිත පඬිතුමන්
09. සෙංකඩගලපුර ඉතිහාසය, ඒ.ඩී.පී. කරුණාතිලක, ප්‍රකාශනය එච්.එම්.ඩබ්. රඹුක්වැල්ල සි.ස. කැන්ඩි ප්‍රින්ටර්ස්, මහනුවර. (1995)
10. Service Tenures Register 1870 - 1872 වර්ෂය අංක 4 ආඥා පනත, පිටු අංක 33 විහාර, දේවාලගම් හා නින්දගම් ඉඩම් භුක්තිය පිළිබඳ කොමිෂම. (1956 සැසි වාර්තා 1 -1056)

## තොරතුරු සාකච්ඡා කරන ලද ප්‍රවීණ ශිල්පීන්

# දළදා පෙරහැර හා සන්නිවේදනය

**මනෝජ් අලවතුකොටුව**
කථිකාචාර්ය
ලලිත කලා අධ්‍යයන අංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය.

සන්නිවේදනය වර්තමානයේ වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන් වන විෂය ක්ෂේත්‍රයක් වේ. සන්නිවේදනයෙන් තොරව සමාජයක් ඉදිරියට යා නොහැකිය. සන්නිවේදනයේ සරලම අර්ථය වන්නේ අදහස් හෝ හැඟීම් එකිනෙකා අතර හුවමාරු කරගැනීමත්, ප්‍රකාශ කිරීමත්ය. සන්නිවේදනය ප්‍රධාන වශයෙන්ම වාචික හා නිර්වාචික වශයෙන් ද්විතියික වේ. ප්‍රාථමික සමාජයේ සිට වර්තමාන සමාජය දක්වාම මෙම ක්‍රම දෙකෙහිම භාවිතයක් දක්නට ලැබේ. දළදා පෙරහැර මංගල්‍යය හා බැඳි සන්නිවේදනාංගයන් පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කිරීම මෙම ලිපියෙහි අරමුණයි.

පෙරහැර මංගල්‍යය හා සන්නිවේදනය අතර පවතින්නේ ද ඍජු සම්බන්ධතාවයකි. එක් අතකින් සංස්කෘතික මංගල්‍යයක් සේම අනෙක් අතින් කලාත්මක අංගයන්ගෙන් පෝෂණය වූ පෙරහැර තුළ බෙහෙවින්ම නිර්වාචික සන්නිවේදනයේ අංග ලක්ෂණ ගැබ්ව තිබේ. ඊට හේතුව වන්නේ එහි පවතින සංකේතාර්ථයන්ය. නිර්වාචික සන්නිවේදනයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ඉඳුරාම ප්‍රකාශ නොවන එහෙත් යම් සංකේතයක් හෝ වස්තුවක් කෙරෙන් ඉදිරිපත් වන්නාවූ සන්නිවේදනාත්මක ස්වරූපයකි. එහිදී ඊට ආවේණික වූ සංකේතමය භාෂාවක් සහ ව්‍යාකරණයකට අනුව අර්ථ නිෂ්පත්තිය සිදුවේ. එලෙසම එය අර්ථවත් වන්නේද පවතින සංස්කෘතිය තුළිනි.

ඇසළ පෙරහැර මංගල්‍යයේ පරමාර්ථය පිළිබඳව විවිධ මත ඉදිරිපත් වී ඇතත් ආසන්නම හේතුව ලෙස වර්ෂාව අපේක්ෂාවෙන් දෙවියන්ට පූජෝපහාර දක්වනු වස් කෙරෙන උත්සවයක් හෙවත් දේව පෙරහැරක් බව ජනප්‍රවාදයේ සඳහන් වේ. අවුරුද්දකට වතාවක් පෙරහැර, නුවර වීථි සංචාරයෙහි යෙදවීමෙන් වර්ෂාව ලබාදීමට රජතුමා කල්පනා කළේය. දළදා

වහන්සේට වැස්ස වැස්සවීමේ ප්‍රබල ශක්තියක් ඇතැයි යන විශ්වාසය පිළිබඳව තහවුරු වන ජනශ්‍රැතීන්ද වෙති. අතීතයේ සිටම සිංහල චාරිත්‍රවලට ගරු කරමින් සිදුකරගෙන ආ පෙරහැර මංගල්‍යය සිංහල දේශය ඉංග්‍රීසීන්ට යටත්වීම හේතුවෙන් නවතා දැමිණ. මේ කාලයෙහිදී අත්වූ දරුණු නියඟයට හේතු වූයේ පෙරහැර නැවැත්වීම බව සැමදෙනාගේම මතය විය.

මහා සංඝයා වහන්සේ, උඩරට රදළවරුන් එසමයෙහි රට පාලනය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාර **"එඩ්වඩ් බාන්ස්"** මහතාට කියා සිටියේ දළදා පෙරහැර පැවැත්වීමෙන් වර්ෂාව ලබාගත හැකි බවයි. මහා සංඝරත්නය හා උඩරට රදළවරුන්ගේ ඉල්ලීමට කන් දුන් ඔහු පෙරහැර පැවැත්වීමට අවසර දුන්නේය. 1829 වර්ෂයේදී නැවත නියමාකාරයෙන් පෙරහැර පවත්වා දිය කැපීමෙන් අනතුරුව ධාරාණිපාත වර්ෂාවක් ඇති වූ බව සඳහන් වේ. මෙය දළදා වතුර නමින් හැඳින්වූ බව පෙනේ.

"ඇළ දොළ ළිං පොකුණු වැව් විල් සැම උතුරා
ජල කඳ ගලන්නට වුනි සිරිලක සපුරා
බලයක මහිම දළදා සමිඳුගෙ ඉඳුරා
සැලකී සියලු දෙන මේ පෙළහරි නෙවරා"[1]

ඉහත උධෘතයෙන් ප්‍රකට වන්නේ දළදා පෙරහැර පැවැත්වීමේ මුඛ්‍යාර්ථය වැසි ලබාගැනීම බවයි. මෙම ලක්ෂණය පෙරහැර තුළින් ද සංකේතවත් වේ. පෙරහැරේ භාවිත වන කස හඬ වැයීම, ගිනි බෝල කරකැවීම, අලිඇතුන් භාවිතය තුළින් නිරූපනය වන්නේ ද වර්ෂාව නම් සංකල්පයයි.

කස හඬෙන් සහ ගිනි බෝල කරකැවීම තුළින් විදුලිය ද ඇතුගෙන් වළාකුළු ද සංකේතවත් වන බව ප්‍රකට මතයක් වේ. එබැවින් මෙවැනි සංකේතාර්ථ තුළින්ද පෙරහැරෙහි හා පෙරහැර පැවැත්වීමේ සංකල්පය පැහැදිලි වේ. මෙම මුඛ්‍ය තේමාව සන්නිවේදනය කිරීම සඳහා යොදාගනු ලැබ ඇත්තේ ද වර්තමානයේ භාවිත වන්නා සේම ශබ්දය සහ රූපයයි.

කෘෂිකර්මය මූලික ජීවනෝපාය මාර්ගය වූ ලාංකේය සංස්කෘතිය තුළ වර්ෂාව ලැබීමෙන් අපේක්ෂා කළේ භවබෝග සශ්‍රීකත්වයයි. එය පෙරහැර පුරාවටම සංකල්පීයමය වශයෙන් සංකේතාත්මකව ඉදිරිපත් වේ. ආගමික උත්සවයක් වුවද පෙරහැර තුළ මංගල්‍යයක ස්වරූපය පිළිබිඹු වන්නේ ඒ නිසා බව සිතිය හැකිය.

එක් අතකින් බලන විට පෙරහැර කර්මයේ ප්‍රාථමික ජන දෘෂ්ටියක් අන්තර්ගත වන බවද විද්‍යාමාන වේ. ප්‍රාථමික යුගලවලදී පවා මෙවැනි **"ඇනිමිස්ටික්"** (Animistic) ගනයේ අභිචාරයන් ලොව පුරාම පැවැත්වූ අතර වර්තමානයේ වෙසෙන ප්‍රාථමික හා ගෝත්‍රික ජනයා ද ඇතැම් විට මෙවැනි අභිචාරාංගයන්හි පිහිට අපේක්ෂා කරති.

මානව විද්‍යාඥයින්ගේ අදහස වන්නේ ස්වභාවික පරිසරය අනුකරණය කිරීම කිසියම් අර්ථවත් සිදුවීමක් කේන්ද්‍ර කොට ගෙනම කරනු ලබන බවයි. ප්‍රාථමික සමාජයන්හි මෙවැනි ලක්ෂණ බෙහෙවින්ම අන්තර්ගත වේ. ඔවුහු වර්ෂාව අපේක්ෂාවෙන් එවැනි අනුකරණ සිදුකළ අතර, ඉන් පසුව ඇදහැලෙන වර්ෂාවට හේතුව ලෙස සැලකුවේ පූර්වෝක්ත සංසිද්ධිය බව වටහා ගත්හ. වර්ෂාව සඳහා පමණක් නොව තමන්ගේ දඩයම් සාක්ෂාත් කරගැනීම වෙනුවෙන්ද ඔවුන් විසින් මෙවැනි අභිචාර ක්‍රමවල පිහිට අපේක්ෂා කරනු ලැබිණි.[2] දළදා පෙරහැරටද මෙම සංකල්පය පාදක වන්නට ඇති බව හැඟේ. පෙරහැරෙහි ප්‍රධාන සංකේතාර්ථය මෙය වුවද ඊට අමතරව පෙරහැර තුළ දී දැකිය හැකි සන්නිවේදන අවස්ථාවන් රැසක් වෙති.

අතීතයේ සිටම **"අණ බෙරය"** සන්නිවේදනය සඳහා භාවිතයට ගනු ලැබිණි. ඒ ජනයා එක්රැස් කිරීමටත්, රාජ ආඥා දැනුම්දීම සඳහාත්ය. මුල් කාලීනව පෙරහැර පිළිබඳව දැනුම්දීම සඳහා අණ බෙරය (අන්නි බෙර) වැයූ වග " පාහියනගේ ගමන් විස්තරයේ සඳහන් බව **"වරකාවේ ධම්මාලෝක හිමියෝ "** පවසති.[3]

පෙරහැර පැවැත්වීමට දින දහයකට පූර්වයෙන් අණ බෙර වයා මේ පිළිබඳව දැනුම් දුන් බව ද එකී විස්තරයේ තවදුරටත් සඳහන් වේ. අණබෙර වැයීම වර්තමානයේ සිදු නොවෙතත් පෙරහැර යන මාර්ගය සනිටුහන් කිරීම සඳහා පෙරහැර ගමනාරම්භයට පෙර **"පෙරමුණේ රාළ"** ඇතකු පිට නැගී පෙරහැර යන ගමන් මාර්ගය දැක්වීම සිරිතයි. නැකැත් චාරිත්‍රවලට අනුව වීථි සංචාරය කිරීම ඇරඹීම දැනුම්දීම ද ප්‍රධාන ලක්ෂණයක් වේ. "පෙරහැර පිටත්වීමට ආසන්නව දියවඩන නිළමේතුමා විසින් එවක ආණ්ඩුකාරතුමා දැතෙහි රන් කරඬුව තැන්පත් කරනවාත් සමඟම පංච තූර්ය නාදය පැවැත්වීම, කාල තුවක්කු හා කොඩිතුවක්කු වලින් වෙඩි හඬ නිකුත් කිරීමෙන් සංඥාවක් ඉදිරිපත් කරු ලැබිණි.[4] පෙරහැර වීථි සංචාරය කොට නැවත මාළිගාවට ගෙවැදුනු විටදීද කාලතුවක්කු හා කොඩිතුවක්කුවලින් වෙඩි පස් විටක් බැගින් තබන ලද බවද සඳහන් වේ.[5] වර්තමානයේ දී ද මෙම සංකේතමය සන්නිවේදනය ඒ ආකාරයෙන්ම සිදුකරනු ලබන බව පෙනේ.

මෙලෙස ආරම්භ වන පෙරහැර සංවිධානය වන්නේ ද විධිමත් වූ ආකෘතියකට අනුවය. මෙම ආකෘතිය :

1. සශ්‍රීකත්ව සංකල්පය මුල් කොටගත්
2. ජන ආගමික ධූරාවලිය කේන්ද්‍ර කොටගත් සහ
3. වැඩවසම් සමාජ ක්‍රමය කේන්ද්‍ර කොට ගත් යනාදි වශයෙන් තෙවැදෑරුම් වේ.

සශ්‍රීකත්වයට මුල්වූ වර්ෂාව හා ඉන් පසුව අපේක්ෂිත කාර්යයන් පෙරදැරි කොටගෙන පෙරහැර සංවිධානය වන බව එහි පෙළ ගැස්ම තුළින් පවා විද්‍යාමාන වේ. මෙයින් පෙනෙන්නේ සශ්‍රීකත්ව සංකල්පය මුල් කොටගත් ආකෘතියකි.

ජන ආගම කේන්ද්‍රීයව ගොඩ නැගුනු පෙරහැර ධූරාවලිය හේතුකොට ගෙන පෙරහැර සංවිධාන වීමේදී මුලින්ම දළදා පෙරහැරත් පසුව පිළිවෙළින් නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි දේවාල පෙරහැරත් තමන්ගේ බල පරාක්‍රමයේ මහිමය අනුව අදාළ ස්ථානයන්හි ස්ථානගත වේ.

ජනාගමේදී බුදුන් වහන්සේ කෙරෙහි අධි මානුෂිකත්වයක් ආරෝපිතය, එලෙසම බුදුන් වහන්සේ ජීවමානව නැතත් උන්වහන්සේ කෙරෙහි ජීවමානත්වයක් ආරෝපණය කොට ඒ වෙනුවෙන් පුරාණය කරනු ලබන වත්පිළිවෙත් රැසක් වෙති.[6] එනිසාම බුදුන් වහන්සේ බෞද්ධ ජන ආගමික ධූරාවලියෙහි ඉහළම ස්ථරය නියෝජනය කරති. ඉන් පසුව තමන්ගේ බල පරාක්‍රමය කේන්ද්‍ර කොටගෙන සතර වරම් දේව, ප්‍රධාන දේව, ප්‍රාදේශීය දේව, යක්ෂ, ප්‍රේත යන අධිමානුෂික කණ්ඩායම් ධූරාවලිය තුළ ස්ථාන ගතවේ.[7] පෙරහැර පෙළගැසීමේදී ප්‍රථමයෙන්ම දළදා පෙරහැර ද ඉන්පසුව සිව් දේවාලයන්හි පෙරහැරද ඔවුන්ගේ බල පරාක්‍රමය අනුව පිහිටුවනු ලැබේ. එහිදී ද සතර වරම් දේව සංකල්පය වැදගත් වේ. ඉන්දීය බ්‍රාහ්මණ ආගමට අනුකූලව **"ඉන්ද්‍ර, වරුණ, යම හා කුවේර"** යන දේවතාවුන් සතරවරම් දෙවිවරුන් ලෙස අදහනු ලැබිණි. එනමුත් බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන්නේ **"ධෘතරාෂ්ඨ, විරූඩ , විරූපාක්‍ෂ හ වෛශ්‍රවණ"** යන දේවතාවුන් සතර වරම් දෙවිවරුන් වශයෙනි. එනමුත් **"නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි"** යන දෙවි දේවතාවුන් ලංකා ශාසනය ආරක්ෂා කිරීමේ බල පරාක්‍රමයෙන් යුතු දෙවි දේවතාවුන් වශයෙන් පෙනී සිටිති.[8] නාථ දෙවියන් මතු බුදුවන බෝසතුන් ලෙසද විෂ්ණු දෙවියන් ගෙන් සහ කතරගම දෙවියන්ගෙන් ආරක්ෂාවද, පෙරහැර විෂයෙහි පිදුම් ලබන එකම දෙවඟන වන පත්තිනි දෙවියන්ගෙන් සශ්‍රීකත්වයද සංකේතවත් වේ. ජන ආගමට අනුව ද පෙරහැර පෙළගැසීම තුළ ප්‍රකට වන්නේ සශ්‍රීකත්ව සංකල්පයේ සංකේතාර්ථයම බව පෙනේ.

පෙරහැර සංවිධානය වීමේ ධූරාවලියක් තුළ වැඩවසම් සමාජයේ පිළිබිඹුවක් ද දක්නට ලැබේ. පෙරහැරෙහි මුලින්ම ගමන් ගන්නේ කසකරුවන්ය. කසය භාවිතයට ගනු ලැබුවේ හුදෙක් නාද නිපදවීමට පමණක් නොවේ. කස ගැසීමෙන් කරුණු කිහිපයක් අපේක්ෂා කළා යැයි සිතිය හැකිය. කස හඬ ඔස්සේ පෙරහැර ලඟ ලඟම එන බව ජනයා වෙත දැන්වීම මෙහි ප්‍රධානතම අර්ථය වෙතත්, වීථි දෙපස පෙළ ගැසී සිටින ජනයා දෙපසට කොට පෙරහැරට මාර්ගය මැනවින් හෙළි පෙහෙළි කරගැන්මද ඉන්

අපේක්ෂා කළ බව සිතිය හැකිය.

මෙම උත්සවය බෞද්ධ උත්සවයක් බව විදහා දක්වෙන්නේ කසකරුවන් පසුපසින් එන බෞද්ධ කොඩි රැගත් පිරිසෙනි. ඉන්පසුව පැමිණෙන ප්‍රාදේශීය කොඩි රැගත් පිරිසෙන් පෙරහැර පොදු ජනයාගේ උත්සවයක් බවත් සන්නිවේදනය කරයි. ඉන්පසුව ඇතෙකු පිට සුදුවතින් සැරසී ගමන් ගන්නේ "පෙරමුණේ රාළයි" ඔහු විසින් රැගෙන යන්නේ **"ලේකම් මිටිය"** වන අතර එහි මාළිගාව සතු ඉඩකඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. මෙලෙස හැඩගැසෙන පෙරහැරේ ඉන් පසුව මාළිගාවේ හේවිසි කණ්ඩායම ගමන් ගන්නා අතර ඔවුනට පසුපසින් දෙවෙනි ඇතා පිට ගමන් ගන්නේ **"ගජනායක නිළමේ"** තුමන්ය. ඔහු රනින් කළ අංකුසයක් අත දරණ අතර රජතුමාගේ ඇත් හමුදාවේ ප්‍රධානියා සංකේතවත් කෙරේ. මින් පසුව විවිධ නර්තනාංගවලින් සමන්විත නර්තන කණ්ඩායම් (පන්තේරු, ලී කෙලි, රබන්, සවරන්, උඩැක්කි නැටුම්) හා අලි ඇතුන් ද පිළිවෙලින් පෙරහැරේ ගමන් කරති. අනතුරුව **"කාරිය කෝරාළ"** ගමන් ගන්නා අතර මොහු සමඟ මාළිගාවේ රාජකාරියෙහි නියුතු පුද්ගල කණ්ඩායම් ගමන් ගනිති. දළදා කරඬුව රැගත් මංගල හස්තිරාජයා ගමන් ගන්නේ මින් අනුරුවය. දැලේ ඇතුන් මැදිකරගත් මංගල හස්තිරාජයා පාවඩ ඇතුරූ මාර්ගයෙහි අභිමානවත් අයුරින් තේජාන්විතව ගමන් ගනී. පාවඩ ඇතිරීමෙන් සංකේතවත් වන්නේ දළදා වහන්සේගේ පාරිශුද්ධත්වයයි.

ඉන්පසුව පිළිවෙළින් නාථ, විෂ්ණු, කතරගම සහ පත්තිනි යන දේවාලවල පෙරහැර ගමන්ගනී.

පෙරහැර සංවිධානය වීම තුළ රාජ්‍ය තන්ත්‍රයෙහි හරස් කඩක් විචිත්‍රනය වේ. බලය විමධ්‍යගත වී ඇති අයුරු පෙරහැර පෙළ ගැසී ඇති අයුරින් නිරූපනය වේ. එලෙසම දළදා මාළිගයේ භාරකරු වශයෙන් කටයුතු කරන දියවඩන නිලමේ තුමන්ගෙන් රජු සංකේතවත් කෙරේ. මෙලෙස හැඩගැන්වෙන පෙරහැරෙහි එන සෑම අවස්ථාවක්ම කිසියම් සන්නිවේදනයක් අරමුණකින්ම ඉදිරිපත් වී ඇති බව පෙනෙන අතර එය

නිරූපනය කරනු ලබන්නේ සංකේතාර්තමය භාෂාවකින් වීමද එහි ඇති සුවිශේෂත්වයක් වේ.

බෙර වාදනය සහ නර්තනය පෙරහැරක අතීතයේ සිටම පැවති ප්‍රධාන අංගයෝ වෙති. බෙර වාදනය මූලිකවම රිද්මය පවත්වා ගැනීම සඳහාද, ශබ්ද පූජා පැවැත්වීම සඳහාද යොදා ගැනේ. බෙරවාදනය ලෙස මෙහි සඳහන් වන්නේ හේවිසි වාදනයයි. හේවිසි වාදනය ද ජනප්‍රිය බුද්ධාගම සමඟ අත්‍යන්තයෙන්ම බැඳී පැවතුණි දැනට වුවද දළදා මන්දිරයේදී අළුයම්, මැදියම් සහ සන්ධ්‍යා ධූරය වශයෙන් හෝරා තුනකමට අදාලව පූජා කර්මයක් වශයෙන් හේවිසි වයනු ලැබේ. එනමුත් පෙරහැරේදී වාදනය වන්නේ ගමන් හේවිසි පදයන්ය. ඒ සඳහා පංච තූර්ය භාණ්ඩයන්ගෙන් ගැටබෙරය හැර හේවිසි වාදන භාණ්ඩ උපයෝගි කොට ගැනේ. එම වාදනය තුළ පවා පෙරහැරේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කෙරේ. ජන සංගීතවේදී පර්යේෂණයන්හි නියැලුණු "Curt Sache" ගේ අදහස් වන්නේ සුෂිර භාණ්ඩ වාදනයෙන් සශ්‍රීකත්වය ජනිත වන බවයි.[9] එලෙසම බෙර වාදනය ලිංග පූජාර්ථයේ සංකේතයක් බව සඳහන් වේ.[10] බෙරයේ මුහුණත් ස්ත්‍රී ලිංගයටද, කඩිප්පු වැනි ආධාර උපකරණ පුරුෂ ලිංගයටද සමාන කොට දක්වන ලද අතර මෙම වස්තු කම්පනයෙන් උපදින නාදය සශ්‍රීකත්වයේ ප්‍රතිමූර්තියක් වශයෙන් සැලකීය.[11] "පෙරහැර තුළද මෙම ලක්ෂණය විද්‍යාමාන වේ. එලෙසම වාදනයේ යෙදීමේදී කිසියම් රිද්මයානුකූල චලනයන් මාර්ගයෙන් එය විචිත්‍ර කිරීමටද බෙරවාදකයෝ වගබලා ගත්හ. දළදා මාළිගයේ පෙරහැරේ වාදනය වන ඇතැම් හේවසි පද සතර දේවාලයන්හි පෙරහැරේ හේවිසිය සඳහා වාදනය නොවේ. ඊට එක් හේතුවක් වන්නේ බුදුන් දේවාතිදේව වශයෙන් සැලකීමක් ධූරාවලිය තුළ උන්වහන්සේට හිමිවන මූලිකත්වයත්ය. එලෙසම මෙම කාර්යයට රාජකාරීමය වශයෙන් සම්බන්ධ වන ගුරු පරම්පරාවන්හි පවතින වෙනස්කම් හේතුවෙන් ඔවුනට ආවේණික බෙරපද වැයීමද දක්නට ලැබේ. මෙවැනි වාදන අවස්ථාවන්හිදී ගුරු පරම්පරාවන්හි ප්‍රධානියා පිළිබඳවද සංකේතාර්ථයන් ඉදිරිපත් වේ. විශේෂයෙන්ම ගුරු පරපුරේ ප්‍රධානීන් විසින් වයනු ලබන ඇතැම් අවනද්ධ වාද්‍ය භාණ්ඩවලට

**"සවරමක්"** පැළඳීම ප්‍රධාන ලක්ෂණයක් වේ. මෙමගින් ගුරු කුළය තුළ ජ්‍යෙෂ්ඨත්වය හුවා දැක්වීම ප්‍රධාන සන්නිවේදනාත්මක ලක්ෂණයක් වේ. වාදනය අතරතුර ඒ ඒ පරම්පරාශ්‍රිත වාදකයෝ විවිධ ආකාරයන් අනුව වාදන සංදර්ශනයන් පැවැත්වීමත් සුවිශේෂී වේ. සාමාන්‍යයෙන් අත්ලෙන් පමණක් වයනු ලබන බෙර පද, පිට අත්ල, වැළමිට වැනි ශරීරස්ථාන මුලිකව වාදනය කිරීමෙන් තමන්ගේ පරම්පරාවෙහි හැකියාව විදහා ලමින් ආත්මාභිමානයෙන් යුතුව පෙරහැරෙහි ගමන් කරයි. මෙවැනි පද වාදනය කිරීම සඳහා දවුල, තම්මැට්ටම වැනි සංගී භාණ්ඩ ප්‍රධාන වශයෙන් යොදා ගැනේ. බෙර වාදනය කරමින් ගමන් ගන්නා අතරතුර විවිධ මංසන්ධිවලදී පද වෙනස් කරමින් නිර්වාචික සන්නිවේදනයක් ඉදිරිපත් කරයි.

පෙරහැරේ භාවිත නර්තනයේදීද බොහෝ විටම සන්නිවේදන අවස්ථා විද්‍යාමාන වේ. එය වන්දනීය හා විනෝදාවාදන ආකෘතින්ගෙන් යුතුවීමද සුවිශේෂිත්වයක් ගනී. පෙරහැරෙහිදී භාවිතා වන නර්තනාංග අතර ජන නර්තනයන්ටත් ශාස්ත්‍රීය නර්තනාංගනයටත් ප්‍රධාන ස්ථානයක් හිමිවන අතර ශාස්ත්‍රීය නර්තනාංගයක් වශයෙන් ප්‍රමුඛතම ස්ථානනයක් හිමි වන්නේ වෙස් නර්තනයටයි. වෙස් නර්තනය කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ එන ප්‍රධාන නර්තනාංගය වන අතර පසු කාලීනව පෙරහැර සඳහාද යොදා ගන්නා ලදී. එහිදී නර්තන ශිල්පින් වන්දනීය ආකෘතියකින් යුතුව පෙරහැර තුලදී නර්තනයේ යෙදේ. වෙස් ඇඳුමෙන් සැරසුණු නර්තන ශිල්පීන්ට පෙරහැර තුළදී ලැබෙන්නේ අද්විතීය ස්ථානයකි. එලෙසම එමඟින් ඔවුනට ලැබෙන පෞරුෂයද ඉමහත්ය.

වෙස් නර්තනයේදී පළඳින ඇඳුමෙහි කොටස් පිළිබඳව ඉදිරිපත්ව ඇති මත අනුව ඒවා බොහොමයක් ස්වභාව ධර්මය හා බද්ධ වන බවට මත පළවී තිබේ. "වෙස් නැට්ටුවන්ගේ ඇඳුම් කට්ටලයෙන්ම හිරු සංකේතවත් කරන බව පිළිබඳ විශ්වාසයක් ද පවතී. වෙස් තට්ටුව සූර්යයා බවද , ඊට ඉහළින් ඇති පායිම්පත සූර්ය රශ්මිය බවද පිළිගැනේ. එසේම හඟලේ රැළි මගින් හිරු රශ්මිය සංකේතවත් වන බවටද මතකයක් පවතී. නැට්ටුවන් විසින් තම

පපුවේහි පළඳින අවුල් හරය මගින් හිරු ප්‍රමුඛ නව ග්‍රහයින් සංකේතවත් වන බවටද මතයක් ඇත. [12] මෙම සංකල්පයෙන් පවා විද්‍යාමාන වන්නේ ස්වභාව ධර්මය හා නර්තන අතර පවතින සම්බන්ධතාවයයි. එලෙසම ස්වභාව ධර්මයේ පැවැත්මට සූර්යයාගෙන් ඇතිවන බලපෑම් හා බව භෝගයයන්ගේ සශ්‍රීකත්වයටද ඇතිවන බලපෑම් මනා සේ විද්‍යාමාන වේ.

පෙරහැර කර්තව්‍යය අතරතුරදී නර්තන ශිල්පීන් විසින් එකිනෙකට කතා කිරීම හෙවත් නමස්කාර කිරීමද දක්නට ලැබෙන තවත් වැදගත් සන්නිවේදන අංගයකි. වැඩිහිටියනට ප්‍රථමයෙන්ම වන්දනා මාන කරනු ලබන්නේ ඊට වයසින් බාල පිරිසයි. වෙස් නැටුම දළදා පෙරහැරේදී දළදා කරඬුව රැගත් මංගල හස්තියා හා දියවඩන නිළමේතුමා ඉදිරියේදීත්, දේවාල පෙරහැර කර්මයන්හීදිත් අදාල දේවාලයේ ප්‍රධාන බස්නායක නිළමේවරුන් ඉදිරියේදීත් රඟ දක්වනු ලැබේ. එය සැමවිටම වන්දනීය ආකෘතියෙන් යුතුවීම පෙරහැරෙහිදි දක්නට ලැබෙන සුවිශේෂිත්වයකි.

මෙහිදී නර්තන ශිල්පීන් තමන් හැදෑරූ ශාස්ත්‍රය උපරිම අයුරින් විදහාලීමට සමත්වන අතරම පෙරහැර අවසානයෙහි හොඳම ශිල්පීන්ට පිරිනමනු ලබන ජය සකේත හා පදක්කම් ලබාගැනිමත් ප්‍රධාන අරමුණු අතර වේ. එලෙසම **"කුවින්ස් හෝටල් හන්දියේ"** තම ශිල්පයන් දක්වන්නේ අති උත්කර්ෂවත් අයුරිනි. ඊට හේතුව වන්නේ රටෙහි ජනාධිපති හා ප්‍රභූන් එම ස්ථානයෙහි සිට පෙරහැර නැරඹීමයි මෙම ලක්ෂණය වර්තමානයේදී ද දක්නට ලැබෙන අතර විවිධ විද්‍යුත් මාධ්‍යයන් මගින් මෙය සජීවීව විසුරුවා හරිනු ලබන්නේ මෙම ස්ථානයේ සිට බැවින් තමන්ගේ දක්ෂතා මනාසේ නිරූපනය කිරීම දක්නට ලැබෙන විශේෂත්වයක් වේ. ඒ අතරම හොඳම ශිල්පීන් තේරීම සඳහා විනිශ්චය මණ්ඩලය රැස්ව සිටින ස්ථානයන්හිදී මෙවන් ආකාරයේ නර්තන ලීලාවන් ප්‍රකට කරමින් රංගනයෙහි යෙදේ. වෙස් නර්තනයට අමතරව ලී කෙළි, උඩැක්කි, පන්තේරු ආදි විවිධ ගැමි නර්තනාංගයන්ද පෙරහැරේදී දක්නට ලැබෙන අතරම වෙනත් සංස්කෘතීන් හි සංස්කෘතිකාංගයන්ද ඉදිරිපත් කෙරේ. වර්තමානයේ නම් බොහෝමයක්

නර්තන හා අනෙකුත් කර්තව්‍යයන් වෙනුවෙන් සහභාගී වන්නේ පාසැල්වල හෝ කලායතනයන්හි සිසුන්ය. එක් අතකින් එය වැඩවසම් ක්‍රමයේ පරිහානිය පිළිබඳව කියාපෑමක් වැනිය.

සතර දේවාලයන්හි පෙරහැර තුළද ඒ ඒ දේවාලයට අදාල දේව ආභරණ වැඩමවනු ලැබේ. එලෙසම ඒ ඒක් එක් දෙවි දේවිතාවුන්ගේ වර්ණයන්ගේ පැහැයට අනුරූපී වු වර්ණ භාවිතයක් දක්නට ලැබේ. අදාල ඇඳුම් සකසා ගැනීමේදී විෂ්ණු දේවාල පෙරහැරේදී වැඩි වශයෙන් නිල් පැහැයත් කතරගම දේවාල පෙරහැරේදී රතු පැහැයත් පත්තිනි දේවිය සඳහා කහ පැහැයත් ප්‍රධාන වශයෙන් යොදා ගැනේ. එලෙසම දෙවි දේවතාවුන්ට අයත් යැයි සැලකෙන සත්ව කොට්ඨාසවලට අයත් නර්තනාංගයන්ගෙන්ද පෙරහැර අලංකෘත වේ. මෙම ලක්ෂණය බෙහෙවින්ම දක්නට ලැබෙන්නේ කතරගම දේවාලය පෙරහැරේදී ඉදිරිපත් කරනු ලබන මොණර නැටුමෙනි. මොණරා කතරගම දෙවිඳුගේ වාහනය විම මීට හේතුවයි. දේවාල පෙරහැර අභ්‍යන්තරයේ රඟ දක්වනු ලබන පන්තේරු වැනි නර්තනාංගවලදී විනෝදාත්මක ස්වරූපයන් යම්තාක් දුරට අන්තර්ගත වේ. පත්තිනි දේවාල නර්තනයේ කාන්තාවන්ගේ නර්තනාංගයන් වන කුළු නැටුම් වැනි නර්තනාංග ස්ත්‍රීන් විසින්ම රඟ දක්වනු ලැබේ. එලෙසම රන්දෝලි පෙරහැරේදී දක්නට ලැබෙන ප්‍රධාන ලක්‍ෂණය වන්නේ "රන්දෝලි" රැගෙන යෑමයි. මෙම සෑම අංගයකින්ම සන්නිවේදනාත්මක ලක්ෂණයන් ප්‍රකට කෙරේ. ඈත අතීතයේ සිටම මෙලෙස සංවිධානය වූ පෙරහැරෙහි සන්නිවේදනාත්මක කෘත්‍යයක් අන්තර්ගත වූ අතර එය නිර්වාචික විය. සමාජය වෙනස්වෙත්ම ඇතැම් විට වාචික සන්නිවේදනයේ අංග ලක්ෂණයද ඒ තුළට පිවිසී තිබෙන බව පෙනේ. එක් අතකින් එය නොවැළැක්විය හැකි හේතුවක් සේම එමගින් පාරම්පරිකත්වයට ද තර්ජනයක් විය හැකිය. බොහෝ විටම රාජකාරි ක්‍රමයේ අහෝසිවීමත් සමඟ පෙරහැර පවත්වා ගෙන යෑම පවා වර්තමානයේ තර්ජනයක්ව පවතී එබැවින් එකි කටයුතු වෙනත් ක්‍රමයක් මත පුරාණය කර ගැනීමට සිදුවේ. එහිදී විවිධ පෞද්ගලික ව්‍යාපාරිකයන්ගේ මැදිහත්වීම නිසා ඔවුන්ගේ ප්‍රචාරණයද පෙරහැර තුළින්

අපේක්ෂිත කෘත්‍යයක් වී ඇති බව පෙනේ. මෙම ලක්ෂණය පෙරහැරෙහි ගමන් ගන්නා අලි ඇතුන් දුටු සැනින් අවබෝධ වේ. ඊට හේතුව වන්නේ අලි ඇතුන්ගේ ඇඳුම් සැපයීම සඳහා අනුග්‍රහය ලබාදෙන්නේ පෞද්ගලික සමාගම් වීමත් එකී අනුග්‍රාහකත්වය ඇඳුම මත සඳහන් කොට තිබීමත්ය. එලෙසම පෙරහැර යන මාර්ගය පිළිබඳව දන්වීමටද ව්‍යාපාරික ආයතනයන්හි මැදිහත්වීම ලැබී ඇති බව පෙනේ. දැනටමත් පෙරමුණේ රාළ විසින් මාර්ගය පිළිබඳ හැඳින්වීමක් කරනු ලබන අතර ව්‍යාපාරිකයාගේ මැදිහත්වීම එක්ම අතකින්න පාරම්පාරික චාරිත්‍රයන්ගේ අභාවයටද හේතු වුවද එහි ප්‍රායෝගික වැදගත්කමක් ඇති බවද සඳහන් කළ යුතුය.

පූර්වෝක්ත කරුණු සලකා බැලීමේදී ප්‍රකට වන්නේ පෙරහැර මංගල්‍යය තුළ පවතින සංකේතාත්මක සන්නිවේදනයයි. එය පරම්පරික හා සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමයක් වුවද ඒ තුළ කලාත්මක හා අර්ථවත් භාවිතයක් දක්නට ලැබේ. මෙවැනි ක්‍රම වත්මන් සන්නිවේදනයේද දැකිය හැකි අතර එවැනි ක්‍රම තවදුරටත් භාවිතයට ගැනීමෙන් නූතන සන්නිවේදන නිර්මාණාත්මක වනු ඇත.

# මහනුවර දළදා මාළිගයේ බිතුසිතුවම් කලාව

**කථිකාචාර්ය, ඩබ්ලිව්. එම්.පි. සුදර්ශන බණ්ඩාර**
ලලිත කලා අධ්‍යයනාංශය
ශාස්ත්‍ර පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

ලාංකීය කලා ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී උඩරට රාජධානියට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එය දළදා වහන්සේ වැඩ සිටින පිංබිම වීමෙන් එහි වටිනාකම දෙගුණ වී ඇත. උඩරට කලාවේ බොහෝ අංගයන් දළදා වහන්සේත් සමග වර්ධනය වීමෙන් එයටම ආවේනික වූ සංස්කෘතියක් බිහි වී තිබීම විශ්මයට හේතුයකි. දළදා සාහිත්‍යයක්, ගෘහ නිර්මාණ සම්ප්‍රදායක්, මූර්ති කලාවක්, කැටයම් කලාවක් සහ සුවිශේෂී චිත්‍ර සම්ප්‍රදායක් මෙන්ම දළදා වහන්සේ වටා ගොඩනැගුනු අභිචාරාත්මක සංකල්ප පද්ධතියක් දැකිය හැකිය. එයින් දළදා පෙරහැරට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. දළදා පෙරහැර පිළිබඳව වර්තමානයේ බොහෝ උගතුන් ශාස්ත්‍රීය ලේඛන විශාල වශයෙන් රචනා කොට තිබෙනු දැකිය හැක. එහෙත් දළදාව හා බැදුනු සෙසු කලා ශිල්ප පිළිබඳවත් දළදා මාළිගයේ දක්නට ලැබෙන නිර්මාණ පිළිබඳවත් අවධානය යොමු වී තිබීම ඉතා මද බව පෙනේ. දේශීය චිත්‍ර කලා ඉතිහාසයේ නව යුගයක් සනිටුහන් කළ උඩරට චිත්‍ර කලාව සෙසු කාල පරාසයන්ගේ සිතුවම් කලාවට වඩා විප්ලවීය පරිවර්තන රැසකින් සංයුක්ත වූ නිර්මාණ සම්ප්‍රදායක් ලෙස හැඳින්විය හැක. විශේෂයෙන් එහි අන්තර්ගත ආකෘතිය සහ එය වර්ධනය කිරිම උදෙසා භාවිත කළ වර්ණ, රේඛා, හැඩතල රූප සංචරනය සඳහන් කළ හැකිය. මහනුවර දළදා මාළිගයේ චිත්තාකර්ශනීය බව වැඩි දියුණු කිරීම සඳහා භාවිත කොට ඇති සුවිශේෂී අලංකරණ අංගයක් ලෙස සිතුවම් කලාව දැක්විය හැක.. දුරාතීතයේ සිට සෑම දළදා ගෘහයක්ම විචිත්‍ර වූ සිත්තමින් අලංකාරව පැවති බවට ලිඛිත සාධක හමු වූවත් දෘශ්‍යමාන සාධකයත් හමුවන එකම ස්ථානය මහනුවර දළදා මාළිගයයි. මහනුවර රාජධානි සමයේදී විවිධ වූ රාජ්‍ය නායකයින් මෙම දළදා ගෘහය සිත්තමින් අලංකාර කළ බවට සාධක ගණනාවක් හමුවේ.

එහෙත් වර්තමානයේ දළදා මාළිගයේ දක්නට ලැබෙන සිතුවම් අධ්‍යයන කිරීමේදී කාල නීර්ණය පිළිබඳව මතවාද ගණනාවක් පවතින බව පෙනේ. විශේෂයෙන් වර්තමානයේ පවතින නිර්මාණවල ශෛලිය, වර්ණවල තීව්‍රතාව, රේඛා භාවිතය එවැනි මතවාදයන් පැන නැගීමට මූලිකවම හේතු වේ. එල්.ටී.පී. මංජු ශ්‍රී විසින් දළදා මැදුරේ සිතුවම් දෙවැනි විමලධර්මසූරිය රජුගේ සමයට (ක්‍රි.ව. 1687 - 1707) අයත් බව ප්‍රකාශ කරන බැවින් මෙම සිතුවම් යටත් පිරිසෙන් මහනුවර සම්ප්‍රදායේ සිතුවම්වල මුල්ම අවධියට අයත් බවද සඳහන් කරයි. දාහත් වැනි හෝ දහඅට වැනි සියවස් මුල් භාගයට අයත් විය හැකි බව මෙයින් උපකල්පනය කළ හැක. එහෙත් මෙම රජුගෙන් පසුව දළදා ගෘහය විවිධ වූ ප්‍රතිසංස්කරණයන් ගණනාවකට ලක් වූ බවට වංශ කතාවල තොරතුරු සඳහන් වන බැවින් ඒ මතය පිළිබඳව විවිධ ගැටළු රාශියක් පැන නැගී ඇත. වෙසෙසින් සෙනරත් රජුගේ කාලයේදී (ක්‍රි.ව. 1604 - 1635) රචනා කරන ලද විධුර ජාතක කාව්‍යයේ පළමු විමලධර්මසූරිය රාජ්‍ය සමයේ දළදා ගෘහය ඉදිකළ සැටිත් එය අලකාර කළ හංස රූප පිළිබඳවත් විස්තරයක් ඇත. එසේම පළමු විමලධර්මසූරිය රජුගේ සමයේදී නැවත දළදා ගෘහය තෙමහල් මන්දිරයක් ලෙස සැකසූ පුවතක් ද දළදා වංශයෙහි සඳහන් වේ. එමඟින් මෙම තොරතුරුවලින් ගම්‍ය වන්නේ දෙවන විමලධර්මසූරිය රජුට ප්‍රථම ද දළදා මාළිගය සිතුවමින් අලංකාර වූ බවත් විවිධ ප්‍රතිසංස්කරණවලට ලක් වූ බවත්ය. දෙවන විමලධර්මසූරිය රජුද දෙවැනි රාජසිංහ රජුගෙන් පසුව බලයට පැමිණ නැවත වරක් තෙමහල් ගෘහයක් ලෙස දළදා මන්දිරය ඉදිකළ පුවතක් සඳහන් වේ. නමුදු එම රජුගෙන් පසුව බලයට පැමිණෙන වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ (1706 - 1738) සමයේදී ද දළදා මන්දිරය දිරාපත් වී පැවති බවට සාධක චූලවංශයේ ද දළදා වංශයේ ද සඳහන් වේ. එබැවින් නරේන්ද්‍රසිංහ රජු දළදා දළදා මාළිගය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කළ පුවත් ද එහිම සඳහන් වන බැවින් දළදා ගෘහයේ ද චිත්‍ර නැවත අඳින්නට ඇතැයි විශ්වාස කළ හැක. තවද එම රාජ්‍ය සමයේ දළදා ගෘහයේ ඇඳ තිබූ ජාතක කතාවල නාමයන්ගෙන්ම සඳහන් වීම එහි විශ්වාසනීයත්වය තහවුරු කරන ප්‍රමුඛ සාධකයකි. මෙවැනි සාධකයන්ගෙන් තහවුරු වන්නේ මංජු ශ්‍රී මහතා ඉදිරිපත් කරන විස්තරය එතරම්ම තාර්කික නොවන බවයි. මහාචාර්ය සෝමතිලක මහතාගේ මතය අනුව පැරණි

අවධියකට අයත් සිතුවම් වර්තමානය වන විට දළදා මාළිගයේ හමුනොවන බවත් එය බෙහෙවින් මෑත අවධියකට අයත් බවත් සඳහන් කරයි. විශේෂයෙන් දෙවන විමලධර්මසූරිය රජුගෙන් පසුව සිදුවූ ප්‍රතිසංස්කරණ පිළිබඳව විමසිලිමත්ව අධ්‍යයනය කිරීමේදී පැරණි කිසිවක් පැවතිය නොහැකි බව ද ඔහු තව දුරටත් සඳහන් කරයි.

දේශීය මෙන්ම විදේශීය කලා ඉතිහාසඥයින් සහ කලාකරුවන් වන සිරිමා කිරිබමුණේ, සිහිල් ඇම්. සිරිසේන, මාරි ගැතලියෝ වැනි උගතුන්ගේ අදහස් ද දළදා මාළිගයේ චිත්‍ර කලාව පිළිබඳව අධ්‍යයනය කිරීමේදී විශේෂයෙන් වැදගත් වේ. ශ්‍රී වීරපරාක්‍රම රාජ්‍ය සමයේදී මෙම සිතුවම් නිම කරන්නට ඇති බව ඔවුන්ගේ අදහසය. එනමුදු මේ සමයට අයත් සිතුවම් වත්මන වනවිටත් දළඳා මැඳුරේ දැකිය හැකිය යන්න විශ්වාස කිරීමට තරම් ප්‍රමාණවත් සාධක හමු නොවේ. විශේෂයෙන් ශ්‍රී රාජසිංහ රජ දවස ද (1747 - 1781) දළදා මැඳුරේ සිදුකළ ප්‍රතිසංස්කරණ පිළිබඳව සුළු රාජාවලියේ සඳහන් වන බැවිනි.

දළදා මාළිගයේ වර්තමානයේ දක්නට ලැබෙන අලංකාර සිතුවම් ඊටත් පසුකාලීනව නිර්මාණය කළ බවට සාධක කිහිපයක් හමුවීම මෙම සිතුවම්වල පැරණිභාවය පිළිබඳව පවතින ගැටළු සහගත බව සනාථ කරන තවත් සාධකයකි. ක්‍රි.ව. 1765 - 1766 අතර කාලයේදී ලන්දේසි ආක්‍රමණයත් සමඟ මහනුවර දළදා මාළිගය ද පිළිස්සීමට ලක් වූ බව සුළු රාජාවලියේ දී සඳහන් වේ. එබැවින් කීර්තී ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ ද මෙම ගෘහයට යම් ආකාරයක හානියක් සිදුවූ බැවින් දළදා ගෘහයේ චිත්‍ර මෙම රාජ්‍ය සමයෙන් ඔබ්බට ගෙන නොගිය හැකි බව විශ්වාස කළ හැකිය. මෙලෙස කාල නිර්ණයය පිළිබඳව විවිධ වූ මතවාදයන් පවතින බැවින් දළදා මාළිගයේ වර්තමානයේ දක්නට ලැබෙන සිතුවම් මෑත භාගයේ නිර්මාණ වශයෙන් සඳහන් කිරීම යුක්තය. දළදා මාළිගයේ සිතුවම් දක්නට ලැබෙන ස්ථාන වශයෙන් දළදා වහන්සේ වැඩ සිටින ඉහල මාලය සහ පල්ලේමාලය දැක්විය හැකිය. එහි ඇතුළත හා පිටත බිත්ති පෘෂ්ටයන් තුළත් වියන්තලයෙහිත් පල්ලේමාලයේ පිටත දක්නට ලැබෙන ප්‍රදක්ෂිණා පථයේ සහ පේකඩ

කුලුණුවලත් බාල්කවලත් දක්නට ලැබේ.

පල්ලේමාලයේ බටහිරට මුහුණ ලා ඇති ප්‍රධාන පිවිසුම් දොරටුව දෙපස බිත්තිය හැරුණු විට අන් සියලුම බිත්ති පෘෂ්ඨයන්, බාල්ක, වියන්තල, පේකඩ කුලුණු යනාදී ස්ථානවල සිතුවමින් අලංකාර කොට ඇත. විශේෂයෙන් උතුරු පස බිත්තිය පනේල විසි එකක් ද දකුණු පස බිත්තිය පනේල විසිහතක් ද නැගෙනහිර බිත්තිය පනේල දොළහක් ද වශයෙන් බෙදා ඇති අතර ඒ සියලුම පනේල වෙන් කිරීම සිංහ රූප යුගලයන් යොදා ඇත. මෙම පනේල තුළ සූර්ය හා චන්ද්‍ර රූපයන්ගෙන් අලංකාර කර ඇති අතරම මාලා කර්ම ද ඒ සඳහා යොදා ගෙන ඇති බව පෙනේ. එසේම පහත මාලයේ වීදුරු කුටිය දෙපස නිර්මාණය කර ඇති සමන් හා නාථ දේව රූප යුගලය සඳහා විශාල ඉඩකඩක් ලබා දී ඇත. මෙම සිතුවම් යුගලය නරඹන්නන්ගේ නෙත් ඉක්මනින් ග්‍රහණය කර ගැනීමට සමත් අගනා නිර්මාණයන් ලෙස සඳහන් කළ හැකිය.

මෙහිම ඇඳ ඇති සත් සතිය තවත් විශේෂ නිර්මාණයකි. මහනුවර සාම්ප්‍රදායේ ජනප්‍රිය සිතුවම් මාතෘකාවක් වූ සත්සතිය උඩරට මෙන්ම පහතරට විහාරාරාම විශාල ප්‍රමාණයක දක්නට ලැබේ. මෙහි සත් සතිය සිතුවම්වල විශේෂත්වය වන්නේ ද ඒවා ද පනේලයක් තුළ නිර්මාණය කර තිබීමයි.

පල්ලේමාලයේ බටහිර දිශාවට මුහුණ ලා ඇති වියන්තලයේ සිතුවම් විශේෂ අවධානයක් දිනා ගන්නා නිර්මාණ රැසක් අන්තර්ගතය. එහි ප්‍රධාන දොරටුවට ඉහලින් තුන් මහල් විමානයක් තුළ මකර තොරණක් යට හිඳ සිටින මෛත්‍රී බෝධි සත්ව රූපය පරිවාර දේව රූප දොළහක් ද සමඟ නිරූපණය කර ඇත. මෙහි පවතින විශේෂත්වය වන්නේ සමමිතික ලෙස සිතුවම් නිමවා තිබීමත් ප්‍රධාන චරිතය සෙසු දේව රූපවලින් විශාල කොට දැක්වීමත් ය. බහුල අලංකරණ අංගයන්ගෙන් විමානය සහ ඒ සඳහා භාවිතා කළ කුලුණු අලංකාර කර තිබීම ද එහි තවත් විශේෂ ලක්ෂණයකි. ගල් බිංදුව, ලියවැල්, නෙළුම, කතිර මෝස්තර, ආරිම්බුව, පනාව වැනි මෝස්තර ඒ සඳහා

වෙසෙසින් භාවිතා කොට ඇත. මෙම සිතුවම් පවතින තවත් විශේෂත්වයක් වන්නේ "මෛත්‍රී බෝසතාණන් වහන්සේ" යනුවෙන් ලියා තිබීමයි. මෙය මහනුවර සම්ප්‍රදායේ බිතුසිතුවම කලාවේදී දැකිය හැකි ලක්ෂණයකි. අදාළ කථා ප්‍රවෘත්තියේ චිත්‍රණය කළ සිද්ධියට යටින් පනේලය තුළ අදාළ සිද්ධිය විස්තර කිරීමට වාක්‍ය කාණ්ඩයක් භාවිතා කිරීම සුලභ ලක්ෂණයකි. දෙගල්දොරුව, සූරියගොඩ වැනි විහාරවල චිත්‍රණය කළ ජාතක කථාවල එය හොඳින් දැකිය හැකිය. දළදා ගෘහයේ ඉදිරිපස වියන්තලයේ තව්තිසා දෙව්ලොව මහාබ්‍රහ්මයා, (1 රූපය) ශක්‍රයා ආදි සිතුවම් ද මෙලෙස දැකිය හැක. මෙහි ශක්‍රයාගේ රූප සටහන් ස්ථාන දෙකකදීම චිත්‍රණය කර ඇති අතර එක් අවස්ථාවක සතරවරම් දෙවියන් සමඟත් අනෙක් අවස්ථාවේ මල් තොරණක් යට වැඩ සිටින ආකාරයෙනුත් නිරූපිතය. මෙහිම විමලධර්මසූරිය රජ රූපයත් කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රූපයත් වෙස්සන්තර ජාතකයේ අවස්ථා කිහිපයකුත් දක්වෙන සිතුවම් ඇත. රජ රූපයන්වල ද අදාළ රජුගේ නාමය චිත්‍රයට පහලින් ලියා තිබීම විශේෂ ලක්ෂණයකි. මෙම රජ රූපයන් තත්කාලීන සමාජ පසුබිම සහ පුද්ගල ස්වරූපයන් පිළිබඳව අධ්‍යනය කිරීමේදී බෙහෙවින් වැදගත් වේ. රජෙකුගේ ඇඳුම් පැළඳුම් පිළිබඳවත් ඒවායේ නිමැවුම් සහ ඒ සඳහා භාවිත මෝස්තර රටා පිළිබඳවත් එමඟින් අවබෝධයක් ලබාගත හැක. මෙවැනි තත්කාලීන සමාජ වටපිටාව පිළිබඳව තොරතුරු හෙළිදරව් කරගත හැකි සිතුවම් රාශියක් දළදා ගෘහයේ වියන්තල සිතුවම් අතර දැකගත හැකිය. බටහිර වියන්තලයේ දක්නට ලැබෙන සෙසු සිතුවම් අතර හංසයන් හතර දෙනෙකු උපයෝගි කොට චමත්කාර ලෙස නිමවා ඇති හංස මෝස්තරය (2 රූපය) මහනුවර සිතුවම් කලාවේ දුර්ලභ නිර්මානයකි. වෘත්තයෙන් පරිබාහිරව ද තවත් හංස යුගල හතරක් භාවිත කරමින් මෙම මෝස්තරය අලංකාර කර ඇත. තවද නෙළුම් මලක් මැදි කොට සතර දිශා අභිමුඛව නිමවා ඇති නාරිලතා මල් සහිත මෝස්තරය ද ඉතා දුර්ලභ නිර්මාණයක් ලෙස සැලකිය හැකිය.

නැගෙනහිර දිශාවට අභිමුඛව පිහිටි වියන්තලයේ චිත්‍රණය කර ඇති මිනිස් සහ වලස් සටන, නවනාරි කුඤ්ජරය සහ හංස පූට්ටුව ද මෙබඳුම වැදගත්කමක් ඇති සිතුවම් කිහිපයකි. මහනුවර සිතුවම් කලාවේ දක්නට

ලැබෙන මොස්තර රටා අතර මනාව රූප උපයෝගී කොට නිර්මාණය කළ මෝස්තරවලට විශේෂ ස්ථානයක් හිමිවේ. කාන්තාවන් නව දෙනෙකුගේ රූප සටහන් භාවිතා කරමින් හස්තියෙකුගේ බාහිර රූප කාය නිර්මාණය කිරීම නවනාරී කුඤ්ජරයේ මූලික ලක්ෂණයකි. හංස පූට්ටුව ද මහනුවර සමයේ ජනප්‍රිය මෝස්තරයෙකි. විවිධාකාරයේ හංස රූපත්, ලියවැල් රටාත් උපයෝගි කොට කළ අලංකාර නිර්මාණයක් ලෙස මෙය සඳහන් කළ හැකිය. එසේම මෙම වියන්තලයෙහිම දළදා පෙරහැර දැක්වෙන සිතුවම ද විශේෂ වැදගත් කමකින් යුක්තය. පේකඩයක දෙපස චිත්‍රණය කර ඇති පෙරහැරින් එවකට පැවති පෙරෙහැරේ ස්වභාවය අවබෝධ කර ගැනීමට සාධක ගණනාවක් සපයයි. අලි ඇතුන්, කොඩි, කුඩ, සෙස්ත් ගෙන යන්නන්, බෙරකරුවන්, හොරණෑ පිඹින්නන් සහ තූර්යවාදකයින් ද නැට්ටුවක් නිලමෙවරුන් ද යනාදී වශයෙන් වර්තමාන පෙරහැර ඇති සියලුම අංගයන් එහිදී සංෂිප්තව චිත්‍රණය කොට  ඇති බව පෙනේ. මෙහි අලි ඇතුන් වර්තමානයේ මෙන් එක පේළියට ගමන් කර විලාසයත් මධ්‍යයෙහි ගමන් කරන ඇතුපිට දළදා වහන්සේ ගෙනයන ආකාරයත් සිතුවම් කර ඇත. දියවඩන නිලමේ මුතු කුඩයක යට ගාම්භීර විලාසයෙන් ගමන් කරන අයුරුත් ඔහුට පසු පසින් බොරු කකුල් කරුවෙක් ගමන් කරන ආකාරයත් චිත්‍රණය කර ඇත. මෙම වියන්තල සිතුවම් අතර දක්නට ලැබෙන තවත් වැදගත් නිර්මාණයක් ලෙස "නවග්‍රහ මණ්ඩලය" (3 රූපය) සඳහන් කළ හැක. විශාල ප්‍රමාණයේ පෙති අටකින් යුත් මලක පෙති මධ්‍යයෙහි මෙම නවග්‍රහ මණ්ඩල ඇඳ තිබේ. මලේ මධ්‍යයෙහි විශාල නෙළුමක් නිමවා ඇත. මල්පෙති තුළ එක් එක් ග්‍රහයින්ට අධිපති දෙවිවරු ඔවුනට හිමි සත්ව රථද සමඟ දක්වා ඇත. නවග්‍රහ මණ්ඩලයට අයත්වන ග්‍රහයින් අට දෙනාවන රවි, චන්ද්‍ර, කුජ, බුද, ගුරු, ශක්‍ර, ශනි හා රාහු චිත්‍රණය කර තිබෙන මුත් කෙහෙතා මෙහි ඇඳ නොමැත. ටී.කේ.එන්.පී. ද සිල්වා සඳහන් කරන ආකාරයට කෙහෙතා යනු අවාසනාවේ සංකේතයක් බැවින් එවැනි සලකුණු මෙවැනි පූජනීය ස්ථානයක චිත්‍රණය කිරීම එතරම් ම සුභ කටයුත්තක් නොවන නිසා මෙයින් ඉවත් කරන්නට ඇතැයි යන්න ඔහුගේ විශ්වාසයයි. මෙහිම සිතුවම් කර ඇති කිඳුරු රූප, හංසයින් සතර දෙනෙකු සහ අට දෙනෙකු යොදා කළ හංස චක්‍ර මෝස්තරය, නෙළුම් මල් සහ ලියවැල් රටා මොස්තරය, කල්ප වෘක්ෂය, මල්ලව පොරය, පංචනාරී සටය, නවනාරී

කුඤ්ජරය ද දක්නට ලැබේ. තවද මෙහිම පේකඩවල ඇඳ ඇති දායකයින්ගේ, මකරුන්ගේ, හංසයින්ගේ හා කිඳුරන්ගේ රූප සටහන් ද ගජසිංහ හා හංසපූට්ටුව, වෘෂභ කුඤ්ජරය වැනි රූප ද විශේෂ නිර්මාණ ලෙස සැලකිය හැකිය. මෙම සිතුවම් අතරින් "මල්ලව පොරය" (4 රූපය) ඉතා වටිනා නිර්මාණයකි. තත් අවධියේ අංගම්පොර සටන් කලාව පිළිබඳව යම් ආකාරයක ඉගියක් මෙමගින් ලබාගත හැක. විශේෂයෙන් ඒ සඳහා භාවිත කරන ඇඳුම්, පැළඳුම්, සටන් විලාසය යනාදිය මෙමගින් අවබෝධ කරගත හැක. "වෘෂභ කුඤ්ජරයද" මෙම නිර්මාණ අතර දුර්ලභ මෝස්තර රටාවකි. එය පැරණි කවියා මෙලෙස දක්වා ඇත.

ඇතුට පෙරට ගොනු අර ඇඳ සිටින්නා
මුකය පත් විදා මොල්ලිය අඳින්නා
ඇතුගේ දත් දෙකයි ගොනු ඇඟට වන්නා
වෘෂභ කුංජරය අඳු ලකුණු දන්නා

ගොනා සහ ඇතා මුහුණට මුහුණ ලා පොරටවන් අයුරු පෙනෙන සේ පිළියෙල කළ චිත්‍රයක් ලෙස මෙය හැඳින්විය හැක. මෙවැනි දුර්ලභ ගනයේ මෝස්තර ඇම්බැක්කේ ලී කැටයම් වලිනුත් රිදී විහාරයේ බිතුසිතුවම් අතරත් හාරිස්පත්තුවේ පල්කුඹුර විහාරයේ දිග්ගෙයි කැටයම් අතර සිත් ගන්නා සුළු වෘෂභ කුඤ්ජර කැටයම් දැකිය හැක. සමස්ත වියන්තලයෙහිම සිතුවම් අධ්‍යයනය කිරීමේදී තහවුරු වන්නේ හුදු අලංකරණ අංගයක් වශයෙන් ඒවා නිර්මාණය කළ ද චිත්‍ර ශිල්පියා මහත් පරිශ්‍රමයකින් අපූර්වවූත් දුර්ලභවූත් මෝස්තර රටා එයට ඇතුළත් කර ඇති බවයි. මහනුවර සම්ප්‍රදායේ විහාර බිතුසිතුවම් ශෛලිය මදකුඳු බැහැර නොකොට එම ශිල්පීය ක්‍රමවේදයන් මැනවින් භාවිත කළ නිර්මාණ එකතුවක් ලෙස මෙම වියන්තල චිත්‍ර සඳහන් කළ හැක. සෑම රූපයක් වටාම කළුවන් බාහිර රේඛාවක යෙදීමත්, පැතලි වර්ණ භාවිත කිරීමත් මෙම නිර්මාණවල ද පැහැදිලිව දැකගත හැකි ලක්ෂණයකි. මෙහි පහත මාලයේ වියන්තල සිතුවම්වල කාලනිර්ණය පිළිබඳව විවිධ මතවාද පැවති බවත් ඒ පිළිබඳව නිශ්චිත කාල වකවානුවක් සටහන් කර ගැනීමට නොහැකි වූ බවත් උක්ත සාකච්ඡා කරන ලදී. පහත

මාලයේ වියන්තලයේ පසෙක ලියා ඇති විස්තරයකින් සිතුවම් ප්‍රතිසංස්කරණය කළ කාලනිර්ණය පිළිබඳ යම් ආකාරයක අවබෝධයක් ලබාගැනීමට හැකියාව ඇති බව පෙනේ.

"ශ්‍රී බුද්ධ වර්ෂ 2450 ක්‍රිස්තු වර්ෂ 1907 ශකවර්ෂධි රජයම් යන වර්ෂයෙහි ශ්‍රී සෙඩ්ඛණ්ඩ ශෛලාභිධාන ශ්‍රී වර්ධන පුරවරයෙහි වූ ශ්‍රීමත් දන්තධාතු මන්දිරස්ථානය පාතමාලේ ජරාවාසව තිබූ වියන් සිතියම මහනුවර පෝයමළු විහාරාධිවාසි අමුණුගම ශ්‍රී නිවාස පියදස්සාභිධාන ලංකාතිලකේ නායක ස්ථවිරයන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් උඩපාත දෙරට රදළ මුදලි ආදි බොහෝ ශ්‍රද්ධාවන්ත මහතුන්ගේ ආධාර ඇතිව රුපියල් 1680 ක් පමණ වියදම් කොට ශ්‍රී බුද්ධ වර්ෂ 2450 වන්නෙහි පොසොන් මස මිථුන රවිපුර දවසක් තිරීයලත් කිවිදිණ සිතේ නැකතින් කරවා සිරීයන කරවා නිෂ්ඨාකරවන ලදී. සාධු සාධු සාධු පින් අනුමෝදන් විය යුතුයි. ඇඹලපුරේ කිරිහාමි මුහුන්දිරම වැඩ කළේ."

මෙම සටහනින් වර්ෂ 1907 පහත මාලය ජරාවාසව තිබීම නිසා ප්‍රතිසංස්කරණය කළ බව ඉතාමත් හොඳින් තහවුරු වේ. මෙම ප්‍රතිසංස්කරණයන් පිළිබඳව ආනන්ද කුමාරස්වාමි මහතාගේ මධ්‍යකාලීන සිංහල කලා ග්‍රන්ථයෙන් ද කරුණු ගණනාවක් තහවුරු කරගත හැක. ඔහු මෙම කෘතිය රචනා කරන අවධියේ දී (1907 සැප්තැම්බර්) දක්නට ලැබුණු සිතුවම් විවිධ ප්‍රතිසංස්කරණයන්ට ලක්වීම නිසා විනාශ වී ඇති බවත් සමහර සිතුවම් දැන් දක්නට නොලැබෙන බවත් සඳහන් කරයි. වර්තමානයේ දළදා මැදුරේ පහතමාලයේ වියන්තලවල පවතින දීප්තිමත් ස්වභාවය පිළිබඳව පැහැදිලි නිදර්ශනයක් එම ග්‍රන්ථයෙන් ලබාගත හැක. එහි සඳහන් වන විස්තරයට අනුව "දළදා මාළිගයේ සිත්තම් නුදුරු අතීතයේදී අතගා ඇත්තේය. මේ මෝස්තරය බෙහෙවින් පාරම්පරික වුවද වර්ණ ඉවසිය නොහැකි තරම් දීප්තිමත්ය. භූෂිතය හේතුව අති විශිෂ්ඨ චිත්‍ර කිහිපයෙන් එකක් ඉතා නුදුරු කාලයෙහි ප්‍රතිසංස්කරණය කරන ලදුව විකෘති කොට තිබෙයි" යනුවෙන් සඳහන් කොට ඇත.

එසේම ඔහු විසින්ම වර්ෂ 1905 දී උඩරට ප්‍රධානීන්ට ඉදිරිපත් කරන විවෘත සංදේශය (An open letter to the kandyan chiefs) නම් ලිපියේ ද බොහෝ තැන්වල උඩරට විහාර චිත්‍රවල සිදු කරන අක්‍රමවත් ප්‍රතිසංස්කරණ පිළිබඳ සඳහන් කරයි. නිදර්ශන ලෙස පාරම්පරික ශිල්ප ශ්‍රේණිවලින් පිට පහතරට චිත්‍ර ශිල්පීන් උඩරට චිත්‍ර ප්‍රතිසංස්කරණය සඳහා ගෙන්නවීම, ලාභ සායම් භාවිතය, පාරම්පරික හැඟීමක් නැති උදවිය මේ සඳහා යොදා ගැනීම සහ දළදා මාළිගයේ සිදුකරන ප්‍රතිසංස්කරණ කිසිදු වගකීමක් නැති ක්‍රියා මාර්ගයක් ලෙස ඔහු අවධාරණයෙන් ප්‍රකාශ කිරීම යනාදියෙන් ඒ බව ප්‍රත්‍යක්ෂ වේ. මෙවැනි සෙසු සාධකයන් මඟින් තහවුරු වන්නේ වර්තමානයේ දළදා ගෘහයේ පහත මාලයේ බොහෝ සිතුවම් විසිවන සියවසේ මුල් භාගයේ අවස්ථා කිහිපයකදී ම ප්‍රතිසංස්කරණවලට ලක්වී ඇති බවයි. දළදා මන්දිරයේ පහතමාලයේ සිතුවම් වර්ෂ 1961 දීත් ප්‍රතිසංස්කරණයන්ට ලක් වී ඇති බව එහි දොරටුව ඉහළින් ලියා ඇති කෙටි පාඨයෙන් තහවුරු වේ. එහෙත් කඹුරුගමුවේ වජිර හිමියන් පවසන්නේ නැගෙනහිර ආලින්දයේ වියන් තට්ටුවේ පේකඩක ඇඳ ඇති දළදා පෙරහැර නිරූපිත සිතුවම් කිසිදු ප්‍රතිසංස්කරණයකට ලක් නොවූ එකක් බවයි. විශේෂයෙන් ඒ සඳහා යොදාගෙන ඇති වර්ණවල පැරණිභාවය, රූප සම්පිණ්ඩය, රේඛා භාවිතය මේ සඳහා පාදක කොටගත බව පෙනේ.

දළදා ගෘහයේ ඉහළමාලය ද විවිධ වූ සිතුවම්වලින් අලංකාර කොට ඇති. දළදා වහන්සේ වැඩ සිටින මෙම මාලය "ගන්ධ කුටිය" නමින් හැඳින්වේ. මෙහි වියන්තලය, පේකඩ කුලුනු, බාල්ක අලංකාර කිරීම සඳහා මාලාකර්ම සහ ලතාකර්ම බෙහෙවින් උපයෝගි කොට ගෙන ඇත. මීට අමතරව හංසපූට්ටුව, ගවයින්, කොටියන්, අලියන් ද ඒ අතර දැකිය හැක. මෙම සිතුවම් අතර ඇත් රූප යුගලක් ඍජු දර්ශී ඉරියව්වෙන් නිමවා තිබෙනු දැකිය හැක. මෙය මහනුවර සම්ප්‍රදායේ සිතුවම් අතර ඉතා දුර්ලභ ඝනයේ නිර්මාණයක් ලෙස බොහෝ උගතුන් සඳහන් කරයි. බොහෝවිට පාර්ශව දර්ශී රීතිය පමණක් සතුන් නිර්මාණය කිරීම සඳහා මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර ශිල්පියා අනුගමනය කළ ද මෙහිදී ඍජු දර්ශී රීතිය යොදා ගැනීම විශේෂ

ලක්ෂණයකි. නලා පිඹින කිඳුරු රූප, නාරිලතා රූප, වෘක්ෂ රූප, විවිධ මල් මෝස්තර සහ සස ජාතකයේ සිද්ධි මෙම නිර්මාණවලට තවත් නිදහසුන් ය. මෙම සියලුම සිතුවම් දළදා ගෘහයේ ඉහළමාලයේ හඳුන්කූඩම නමින් හැඳින්වෙන කොටසේ වියන්තලයේ දැකිය හැක. හඳුන්කූඩමෙන් පසුව ඇති කවිකාර මඩුවේ වියන්තලය ද අගනා සිතුවම්වලින් අලංකාර කොට ඇත. එයින් එකක් ලෙස "චතුර්නාරි පල්ලැක්කිය" හැඳින්විය හැක. කාන්තාවන් හතර දෙනෙකුගේ රූප සටහන් භාවිතයට ගෙන පල්ලැක්කියක බාහිර හැඩය නිරූපනය වන අයුරින් මෙය ඇඳ තිබේ. මෙය මහනුවර සම්ප්‍රදායේ බිතුසිතුවම් කලාවේ ආවේණික මෝස්තර සටහනක් ලෙස සඳහන් කළ හැකිය. මෙහිම උතුරු පස වියන්තලය "සප්තනාරි රථය" (5 රූපය) නම් මෝස්තරයකින් අලංකාර කොට ඇත. මෙය ද කාන්තාවන්ගේ රූප හතක් උපයෝගි කොට රථයක බාහිර විලාසයක් නිරූපණය කරයි. මෙය ද මහනුවර සම්ප්‍රදායේ විහාර බිතුසිතුවම් කලාවේ දැකිය හැකි අගනා මොස්තර නිර්මාණයකි. මීට අමතරව භේරුණ්ඩ පක්ෂියා, නාරිලතා මල්, ඒකශීර්ෂි ද්විත්ව සිංහ රූප, හංස චක්‍රය සහ පාරම්පරික වියන්තල සැරසිලි රටා යනාදිය මෙහිදී දක්නට ලැබේ. මෙම සිතුවම් අතර විශේෂයෙන් දැකිය හැකි නිර්මාණ පෙළක් ලෙස සුවිසි විවරණ සඳහන් කළ හැකිය. මෙය බිත්ති වටා ඉහළ තීරුවක නිමවා තිබෙනු දැකිය හැක.

හඳුන්කූඩමට සහ වැඩසිටින මාළිගයට අතර ඇති ආයතාකාර ගෘහයකි. මෙයද හඳුන්කූඩම ලෙස හැඳින්වේ. මෙය බිත්ති මත නිර්මාණය කර ඇති මල් කළඹක් අතින්ගත් රහත් භික්ෂූන් පෙළද අලංකරණ අංගයක් වශයෙන් වැදගත්ය. මෙහි වියන්තලය ද මෝස්තරයන්ගෙන් නිමවා ඇත. මෙලෙස දළදා ගෘහයේ පහතමාලය සහ ඉහළමාලය විවිධාකාරයේ මෝස්තර රටාවන්ගෙන් අලංකාර කර තිබීම එහි සෞන්දර්යාත්මක අගය වැඩි දියුණු කරන්නක් බව පෙනේ. මෙය අතීතයේ දළදාව තැන්පත් කොට පැවති මාළිගයන්වල ද තිබූ බවට ලිඛිත සාධක හමුවේ. මෙම අලංකරණාත්මක සිතුවම්වල පවතින විශේෂත්වය වූයේ වැඩි අවධානයක් යොමුකර ඇත්තේ මෝස්තරයන්ට වීමය. ජාතක කථා හෝ වෙනත් බෞද්ධ ඓතිහාසික සිද්ධි දළදා ගෘහයේ චිත්‍රණය කිරීමට පෙළඹී නොමැති බව මහනුවර දළදා

මාළිගයෙන් පසක් වේ. ඒ සඳහා බොහෝවිට බෞද්ධාගමික හේතු බලපාන්නට ඇති බව උපකල්පනය කළ හැක. නිදර්ශනයක් ලෙස නවග්‍රහ මණ්ඩලයෙන් කෙහෙතා ඉවත් කිරීම යනාදිය දැක්විය හැක. කෙසේ වෙතත් දළදා ගෘහයේ අතිශය වෛවර්ණවත් ලෙස සැකසීමට එකල සිටි බොහෝ රජවරු උත්සුක වූ බව වර්තමානයේ පවතින සිතුවම් සහ සෙසු ගෘහ නිර්මාණාත්මක අලංකරණ අංගයන්ගෙන් පසක් වේ.

දළදා මාළිගයේ සිතුව ම් කලාව පිළිබඳව බොහෝ උගතුන්ගෙ අවධානයට ලක්වූ කරුණක් ලෙස කාලනිර්ණය දැක්විය හැකිය. ඒ පිළිබඳව තවත් විශේෂ අදහසක් මෙහිදී සඳහන් කිරීම වැදගත් යයි සිතමි. දළදා මැඳුරේ මෑත කාලීන ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී වර්ෂ 1936, 1956, 1987 ඉතා වැදගත් වේ. මෙම කාල පරාසයන් තුළදී දළදා මාළිගයට නව එකතු කිරීම් ගණනාවක් සිදුවූ බව පෙනෙන මේ කාලවකවානුවලදී දළදා මාළිගයේ සිතුවම් ද ප්‍රතිසංස්කරණය කළ බව විවිධ ලේඛනගත තොරතුරු සඳහන් වේ. නිදර්ශනයක් ලෙස ටී.බී. රත්වත්තේ දියවඩන නිලමේගේ ප්‍රධානත්වයෙන් දළදා ගෘහයේ චිත්‍ර හා සෙසු ගෘහ නිර්මාණයන් ප්‍රතිසංස්කරණය කොට වර්ෂ 1942 ජනවාරි 27 නැවත දළදා වහන්සේ වැඩ සිටින මාලයේ තැන්පත් කළ පුවතක් සඳහන් වේ. මෙමගින් පසක් වන්නේ දළදා මාළිගය විවිධ කාලවකවානුවල ප්‍රතිසංස්කරණය වූ බවයි. මෙම තොරතුරුවලින් ගම්‍යවන ප්‍රධාන ලක්ෂණය වන්නේ වර්තමානයේ පවතින දළදා ගෘහයේ සිතුවම්වල නිශ්චිත කලා නිර්මාණයක් පිළිබඳව සඳහන් කිරීමට නොහැකි බවයි. එසේම එම චිත්‍ර පැරණි ඒවා නැවත පිළිසකර කිරීමක් ද නැතිනම් පසු කාලීන නැවත අඳින ලද නිර්මාණයන් ද යනාදී ලෙස නිශ්චිත නිගමනයකට එළඹීමට තරම් පැහැදිලි සාධක ද එමගින් ලබාගත නොහැකි බවයි.

දළදා මාළිගයේ සිතුවම් කලාව පිළිබඳව පැවති මතවාදයන් ගණනාවකට පැහැදිලි විසඳුමක් ලබාදීමටත් පැහැදිලිව පැවති අදහස්වලට නව ව්‍යාකූලත්වයක් ආරෝපණය කිරීමටත් වර්ෂ 1998 ජනවාරි 25 දින කුරිරු ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරය බලපාන්නට විය. විශාල වශයෙන් දළදා මාළිගයට

සිදුවූ හානියත් සමඟ ස්ථර කිහිපයකටම අයත් සිතුවම් දිග්ගේ බිත්ති ඉරිතලා ගොස් මතුවිය. මෙහි ඇතුළත මෙන්ම පිටතින් ද යුග කිහිපයකට අයත් නිර්මාණ හමු වූ බව පෙනේ. දිග්ගේ ඇතුළත බිත්ති පෘෂ්ටයන් තුළින් යුග කිහිපයකටම අයත් සිතුවම් මතු වී ඇත. එයින් මතුපිට ස්ථරය වර්ෂ 1942 අඳින ලද සිතුවම් ස්ථරය වන අතර ඉන් පෙර කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේ සිතුවම් කළ ස්ථරයක් ද පසුව නරේන්ද්‍රසිංහ රාජ්‍ය සමයේ සිතුවම් ස්ථරයක් ද වශයෙන් දැක්විය හැක. මෙම සිතුවම් ස්ථරවලින් ගල් බිංදුව, මල් මෝස්තර රටාවන්, ඇතා සහ ඇත්ගොව්වාගේ රූපයකුත් නැට්ටුවෙකුගේ රූපයකුත් හමු වී ඇත. මෙහි මතු වී ඇති හස්ති රාජයාගේ රූපය (6 රූපය) අලංකාරාත්මක ආභරණයන්ගෙන් සරසා තිබීම විශේෂ ලක්ෂණයකි. එසේම සුවිසි විවරණ සිතුවම්වලට යටින් ජාතක කතා සිතුවම් ස්ථරයක් මතු වී ඇත. බොහෝ සිතුවම් ඉතාම දුර්වර්ණ වී ඇති බැවින් ඒවා නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකිව තිබේ. මෙවැනි සාධකයන් තුළින් ගම්‍ය වන්නේ වර්තමාන දළදා ගෘහයේ බිත්ති, බාල්ක සහ පේකඩ කුලුනු ආදියේ පෙර අවධීන් කිහිපයකට අයත් වූ නිර්මාණ සැඟවී තිබෙන බවයි. එබැවින් දළදා ගෘහයේ යුග ගණනාවකදී නවකම් සඳහා ලක්වී ඇති බව එමඟින් ප්‍රත්‍යක්ෂ වේ.

නව දළදා ගෘහයේ ද නූතන සමයට අයත් කැන්වස් සිතුවම් සමූහයක් දැකිය හැක. නව දළදා ගෘහයේ බුදු මැඳුරේ දෙපස එල්ලා ඇති සිතුවම් පෙළක් දැකිය හැක. සෝලියස් මෙන්දිස් මහතාගේ චිත්‍ර ශෛලිය අනුකරණය කරමින් ඇඳ ඇති මෙම සිතුවම් සමූහය දළදා මාළිගය නරඹන්නට එන බොහෝ පුද්ගලයන්ගේ සිත් රංජනය කිරීමට සමත් නිර්මාණ සමූහයකි. බුදුන්වහන්සේ සම්බන්ධ ඓතිහාසික සිද්ධි ප්‍රමුඛ කොට නිර්මාණය කළ මෙම සිතුවම් අතර දළදා වහන්සේ ලංකාවට රැගෙන ඒම, එය විවිධ අවස්ථාවල විදේශිකයන්ට අතට පත්වීම, ඒ සඳහා පවත්වන පූජා විධි යනාදී වශයෙන් චිත්‍ර ගණනාවක් ඇත. මෙම නිර්මාණ අතර බුද්ධ චරිත සම්බන්ධ සිද්ධි කිහිපයක් ද නිමවා තිබේ. නිදර්ශන වශයෙන් සිද්ධාර්ථ උප්පත්තිය, බුදුවීම, පරිනිර්වාණය යනාදිය දැක්විය හැකිය. රේඛාවට ප්‍රමුඛතැන ලබාදීමත්

දීප්තිමත් වර්ණමාලාවක් උපයෝගි කරගනිමින් මනාව රූපවලට ප්‍රමුඛ තැනක් ලබාදී සිතුවම් නිර්මාණය කිරීමත් මෙහි දැකිය හැකි විශේෂත්වයකි. සෝලියස් මෙන්දිස්ගේ කැලණි විහාර සිතුවම් ශෛලියේ අභාසය මෙම නිර්මාණ තුළින් දක්නට ලැබීම ලාංකීය සම්භව්‍ය චිත්‍ර කලාවේ විකාශනයේ තවත් අවස්ථාවක් ලෙස සටහන් කළ හැක.

මහනුවර බිතු සිතුවම් සම්ප්‍රදාය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී දළදා ගෘහයේ නිර්මාණවලට සුවිශේෂි ස්ථානයක් හිමිවේ. වෙසෙසින් සාම්ප්‍රදායික මහනුවර චිත්‍ර ශෛලියේ ස්වභාවය හොඳින් අවබෝධ කරගැනීමටත් එය කුමන අරමුණකින් භාවිත කළේ ද යන්න දැනගැනීමටත් ආදී වශයෙනි. එබැවින් මහනුවර දළදා මාළිගයේ බිතුසිතුවම් පුරාවිද්‍යාත්මක, ඓතිහාසික සහ සෞන්දර්යයාත්මක ආදී ක්ෂේත්‍ර ගණනාවකින් ම වැදගත්වන නිර්මාණ සමූහයක් ලෙස සඳහන් කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

01. අභයසිංහ දේවාරාජා සෝමරත්න, උඩරට රාජධානිය 1470 - 1818, සීමාසහිත ඉච්වෙස්ට්මන්ම් සමාගම, කොළඹ, 1977.

02. කුඹුරුගමුවේ වජිර ස්ථවිර, දළදා ඉතිහාසය සහ සංස්කෘතිය, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල, 1983.

03. අනුරාධ සෙනෙවිරත්න, කන්ද උඩරට මහනුවර, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කතික කටයුතු අමාත්‍යාංශය, කොළඹ 1989.

04. මහවංශය, ඒ.පී. බුද්ධදත්ත ස්ථවිර, ගුණසේන සහ සමාගම, 1939.

05. දළදා වංශය හෙවත් දංෂ්ට්‍රාධාතු කථා, ශ්‍රී භාරතී ශාස්ත්‍රාලය, කොළඹ, 1920.

06. Marie Gatellier, **Peintures Murales du Sri Lanka Ecol**

**Kandyenne XVII- IX Siecles**. Vol. I, Publication de I'Ecole FranÊise d'Extreme - Orient, Paris, 1991.

07. "ශ්‍රී දළදා මාළිගයේ ගෘහ නිර්මාණ ශිල්පය", සුජාතා වේරකේ සහ ඇලිස් වාසල්තිලක, **දළදා මහිම**, සංස්. ලීලා මැණිකේ කුලතුංග සහ තවත් අය, සර්වෝදය ග්‍රන්ථ ප්‍රකාශනය, කොළඹ, 1995.

08. P. Dolaphilla, **In the days of Sri Wickrama Raja Singhe,** Saman Publisher, Maharagama, 1960.

09. "උඩරට සමයේ මූර්ති ශිල්පය" ටී.බී. කරුණාරත්න, **සිංහල විශ්වකෝෂය**, හතරවැනි කාණ්ඩය, සංස්. ඩී.ඊ. හෙට්ටිආරච්චි, රජයේ මුද්‍රණ දෙපාර්මේන්තුව, කොළඹ, 1970.

10. ඩී.ටී. දේවේන්ද්‍ර, **සඳකඩ පහණ සහ වෙනත් ලිපි**, "සඳකඩ පහණ", සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1970.

11. ටී.යූ. ද සිල්වා, **පැරණි සිංහල සැරසිලි මෝස්තර**, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සභාගම, කොළඹ, 1957, බලන්න චිත්‍රවල තිබෙන නාරි රූප.

12. ඇස්.පී. චාල්ස්, **පාරම්පරික සිංහල සැරසිලි මෝස්තර**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1999.

13. **ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය**, (සිංහල - සිංහල ශබ්ද කෝෂය) දෙවන කාණ්ඩය, සංස්. වැලිවිටියේ පණ්ඩිත සෝරත ස්වාමීන් වහන්සේ, ලංකාණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රකාශනයකි, 1956.

14. චාල්ස් ගොඩකුඹුර, **සිංහල උළුවහු**, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

15. A.M. Hocart, **The Temple of the Tooth in Kandy,** Memoris of the Archeaological Survey of Ceylon, Vol: IV, Rajagiriya, 1931.

16. ඒ.කේ. කුමාරස්වාමි, **මධ්‍යකාලීන සිංහල කලා**, පරි. එච්.ඇම්.

සෝමරත්න, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ, 1962.

17. රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධාන**, සමන් මුද්‍රණාලය, මහරගම, 1964.

18. T.K.N. de Silva, **Temple of the Tooth Kandy (Architecture, Sculpure, Painting)** Central Cultural Fund, Ministry of Cultural Affairs, Sri Lanka.

19. **මහාවංසය**, (I), පරි. ඩබ්. ගෛගර්, පාලි ග්‍රන්ථ සමාගම, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය, ලන්ඩන්, 1912.

20. සුදර්ශන බණ්ඩාර, **සෝලියස් මෙන්දිස්ගේ බෞද්ධ බිතුසිතුවම් කලාව**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2004.

21. **ශ්‍රී ලංකාවේ පුරාණ රජමාළිගා**, සමන්ත ප්‍රකාශකයෝ. ජා ඇල. 2003.

22. Anuradha Senevirathna, **The Temple of the Sacred Tooth Relic,** The State Engineering Corporation, Government of Sri Lanka, 1987.

23. එල්.ටී.පී, මංජු, **ශ්‍රී ලංකා බිතුසිතුවම් සටහන**, ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය, කොළඹ, 1977.

24. **සුළු රාජාවලිය**, සංස්. ඩී.පී.ආර්. සමරනායක, ශ්‍රී පෙස් සමාගම, මරදාන, 1959.

25. එම්. සෝමතිලක, **පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2004.

26. Ananda Coomaraswamy, **An Open Letter to the Kandyan Chiefs,** Arts Council of Ceylon, Colombo. 1957.

27. ලීලානන්ද ප්‍රේමතිලක සහ ආනන්ද කොළඹගේ, **දළදා මාළිගාවේ නව සොයාගැනීම්, පැරණි බිතුසිතුවම්**, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, කොළඹ, 2000.

# සිත් සතන් නිවා සනහාලන හෙළයේ මහා සංස්කෘතික මංගල්‍යය

**ආචාර්ය නාමලී කුමාරි හඳගම**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දර්ශන හා මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කලාව වූ කලි එකම වේදිතයක් තුළින් මිනිසුන් සුසංයෝග කරන මාධ්‍යයක් පමණක් නොව පුද්ගලයන්ගේ හා මිනිස් සංහතියේම පැවැත්ම හා අභිවෘද්ධිය සඳහා අත්‍යවශ්‍ය වූවක්ද වේ. ශ්‍රී ලංකේය අභිමානය, පෞඪත්වය ලොව හමුවේ විදහා දක්වන හෙළයේ ඓතිහාසික මහා කලා මංගල්‍යය මහනුවර ඇසල පෙරහැරයි. දළදා වහන්සේ මෙරටට වැඩමවීමත් සමඟ ඇතිවුණ සිරිතක් ලෙස සැලකෙන දළදා පෙරහැර පැවැත්වීමේ සිරිත ලංකාව පුරා නොයෙක් අයුරින් පැවැත්වුවද, මහනුවර ඇසළ පෙරහැර වූ කලී හෙළයේ කිසිදු සංස්කෘතික මංගල්‍යයකට සමකළ නොහැකි අසිරිමත් මංගල්‍යයක් බව කිව හැකිය. එපමණකට මහනුවර ඇසළ පෙරහැර ජාතික, ආගමික ඓතිහාසික වටිනාකම්වලින් පරිපුර්ණ අසම සම වූ සිද්ධි දාමයක් වන නිසාය. මිනිස් සිත් සතන් නිවා සනසාලන මහානුභාව සම්පන්න මංගල්‍යක් සේ සැලකෙන මහනුවර ඇසළ පෙරහැර ආරම්භවන්නේ සාම්ප්‍රදායික සිරිත්විරිත් අකුරටම අනුගමනය කරමින් ඒ වෙනුවෙන්ම ඇප කැප වෙමිනි.

මහත්වූ ප්‍රීතියකින් සහ ගෞරවයකින් යුක්තව මහනුවර ජනයා මෙම මහා කලා මංගල්‍යය වෙනුවෙන් සූදානම් වන්නේ පෙරහැර පැවැත්වීමට බොහෝ කලකට පෙර සිටය. පෙරහැර සඳහා සූදානම් වීම පවා ආගමික වතාවත් ඉටුකරන්නා සේ ගෞරව පෙරදැරිව සම්ප්‍රදායානුකූලව සිදුකරන්නකි. ඒ සඳහා මූලික වශයෙන් මුළු මහනුවර නගරයම නවීකරණය කර අඩුපාඩු සකසා තීන්ත ආලේප පිරිසිදු කරන අතර පෙරහැර පවත්වන කාල වකවානුව තුළ මස් මාංශ හා මත්පැන් අලෙවියද නවතාලනු ලැබේ. පෙරහැරට සහභාගි

වන්නන් සිට නරඹන්නට එන ජනතාව දක්වා එක්තරා විනයකින් පිළිවෙලකින් යුක්ත විය. චාම්ව පිරිසිදු සුදු වතින් , සංවර ඇඳුමින් සැරසී මෙම අසිරිමත් මහා මංගල්‍යය දෑසින් බලා ගැනීමේ සතුටින් යුක්තව ජනතාව විදී දිගේ පෙළගැසෙනුයේ ආගමික උත්සවය පවත්වා නිවී සැනසුණ ස්වභාවයෙන්ය.

දළදා මාළිගය ආශ්‍රිතව පවතින සතර දේවාලයෙන්හි කප් සිටුවීමෙන් මහනුවර ඇසල උත්සවය ආරම්භ කෙරේ. ඒ වනාහි සශ්‍රීයකත්වය සංකේතයක් වශයෙන් සැලකෙන (කිරිගසක්) කොස් ගසකින් සාම්ප්‍රදායික පුද පූජා පවත්වා අනතුරුව කපා වෙන්කර ගන්නා ලද කැබලි හතරක් හතර දේවාලයන්හි නියමිත තැනක තාවකාලිකව සිටුවීමකි. (වර්තමානයේ එය දේවාලය තුළම තැන්පත් කරන බව සඳහන්ය.) අනතුරුව දින පහක් තිස්සේ සතර දේවාලවල කපු මහත්වරුන් ඒ ඒ දේවාලවල සිටුවන ලද කප වටා අදාල දෙවිවරුන්ගේ රන් ආයුධ පෙරහැරින් ගෙන යති. මෙසේ ගෙන යන පෙරහැර හඳුන්වන්නේ ඇතුල් පෙරහැර යන නමිනි. දින පහකට පසු හයවන දිනයේදී දේවාල හතරේම පෙරහැරවල් පැරණි රජමාළිගය ඉදිරිපිටදී (දේව සංහිදේදී) වෙන වෙනම පෙරහැරවල් හතරක් ලෙස පෙළ ගැසී සිට දළදා මාළිගයේ පෙරහැර පෙරටු කොටගෙන විදි සංචාරය කිරීමට නියමිතය. කප් සිටුවීමෙන් හයවන දින සිට පවත්වන මුල් පෙරහැර හඳුන්වන්නේ කුඹල් පෙරහැර නමිනි. නැතහොත් දේවාල පෙරහැර නමිනි. මෙම කුඹල් පෙරහැර දින පහක් පැවැත්වේ.

පෙරහැර මංගල්‍යය සඳහා ගමන් කිරීම සංවිධානය වන්නේද කිසියම් රටාවකටය. මුලින්ම දළදා කරඬුව පෙරටුකොටගත් දළදා පෙරහැර ගමන් කරන අතර අනතුරුව ඒ පසුපස නාථ, විෂ්ණු හා කතරගම දේවාලයන්හි පෙරහැර ගමන් කරයි. අවසානයට ගමන් කරන්නේ පත්තිනි දේවිය වෙනුවෙන් කැපකර ඇති පත්තිනි දේවාලයේ පෙරහැරයි. මහායානික සංකල්පයට අනුව නම් මේ පෙළ ගැස්මේ රටාව හැඩගැසී ඇත්තේ අනාගතයේදී සිව් දෙවිවරුන් මතු බුදුබවට පත්වන බුදුවරුන්ගේ

අනුපිළිවෙල අනුව බව විශ්වාස කෙරේ.

විදි සංචාරය කිරීමට පෙරහැර සූදානම් වන්නේද නියමිත චාරිත්‍ර අනුගමනය කිරීමෙනි. මුලින්ම සතර දේවාල පෙරහැර පෙළ සැදී දළදා මාළිගාව අසල පැමිණ රැඳී සිටි. ඒ සඳහා පෙරහැර සකස් කරනුයේ කිසියම් වෙඩි හඬක් මගින් ලබාදෙන සංඥාවකට අනුවය. පළමුවන වෙඩි හඬින් සතර දේවාල පෙරහැර පිටත්වීම ආරම්භ කෙරේ. දෙවන වෙඩි හඬින් සධාතුක කරඬුව මඟුල් ඇතුපිට තැන්පත් කිරීම සිදුවේ. තුන්වෙනි වෙඩි හඬත් සමඟ දළදා කරඬුව ප්‍රමුඛ පෙරහැර පෙරටු කරගත් සතර දේවාල පෙරහැර විදි සංචාරය කිරීමට ගමන් ආරම්භ කරයි.

පෙරහැරේ පළමුවෙන්ම ගමන් කරන්නේ කස ගසන්නෝය. දූන් දූන් පෙරහැර එතියි මඟ බලා සිටින ජනතාවගේ සිත් අවදි කරමින් තුන්වන වෙඩි හඬත් සමඟ නැවතුන අනේක විද ශබ්දයන්ට විරාමයක් දෙමින් කස ගසන්නන්ගේ ශබ්දය පරිසරය පුරා නැගෙන්නේ සංවර ශබ්ද රසයක් ජනයා තුළ ඇතිකරමින් පෙරහැර දූන් දූන් ඔබ හමුවට පැමිණෙනනවාය කියන බලාපොරොත්තුව පණිවුඩයත් සමඟය. අනතුරුව පැමිණෙන්නේ බෞද්ධ කොඩියක් අත දරා සිටින පුද්ගලයෙකු පිට උඩ තබා ගත් ඇතෙකි. එය බෞද්ධ කොඩිය, බෞද්ධ ආගමික සංකේතය වන අතර මෙම පෙරහැර බෞද්ධාගමික උත්සවයක් බව එමගින් රැස්ව සිටින දෙස් විදෙස් ජනතාව දැනුවත් කරන්නක්ද වේ. එය මේ පෙරහැරේ වැදගත්ම අංගයකි. මන්ද ආගමික උත්සවයක ඇති සංවරබව නිවි සැනසුණ බව, වීනිත බව මහනුවර ඇසළ පෙරහැර පුරාම දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි.

අනතුරුව පැමිණෙන්නේ කොඩි ගෙන යන්නෝය. විවිධ පළාත්වල සහ විහාර දේවාල වලට අයත් කොඩි එහිදි රැගෙන යති. ඉන් අනතුරුව පෙරහැරේ ගමන් කරන්නේ පෙරමුණේරාළය. ඇතකු පිට ගමන් කරන ඔහු දළදා මාලිගයට අයත් පුස්කොළ පොතක් අත දරා සිටී. ලේකම් මිටිය නමින් හඳුන්වන මෙම පුස්කොළ පොතෙහි මාළිගාවේ රාජකාරකාරයින්ගේ නම් ගම් හා ඔවුන් විසින් සිදු කළ යුතු සේවාවන් පිළිබඳ ඉපැරණි වාර්තාත්

මාළියට අයත් ඉඩකඩම් හා දේපල පිළිබඳ වාර්තාත් අන්තර්ගත බව සඳහන්ය.

ඊළඟට ගමන් කරන්නේ බෙරවාදකයින් ය. ඔවුන්ට ආවේණික සරල සාම්ප්‍රදායික ඇඳුම් පැළඳුම්වලින් ඔවුහු සැරසී සිටිති. ගැටබෙරය, දවුල් තම්මැට්ටම් හොරණෑ ආදි බොහෝ වාදන භාණ්ඩ එකට තාලයකට වාදනය කරමින් ගායනා කරමින් පැමිණෙන ඔවුන් නිසා පෙරහැරට ලැබෙන්නේ අපූරු චමත්කාරයකි. ශබ්ද රසය යන්න උපරිම මට්ටමින් රසවත්ව ගෙන එන දළදා පෙරහැර මෙම අංගය දනන් කන් පිනවීමටය, මනමෝහණීය තත්වයකට පත්කිරීමට සමත් වන්නක් බව කිව මනාය. එසේම මෙය පෙරහැරේ වැදගත්ම අංගයක් බව කිව යුතුමය. මාලිගාවේ හේවිසි කණ්ඩායම ලෙස සඳහන් වන මොවුන් විවිධ ගමන් පද, ගායනා කරමින් වාදනය කිරීම විශේෂත්වයකි. මේ මහා භේරි ඝෝෂාවෙන් නගරයේ හාත්පස සිසාරා චමත්කාරජනක ලෙස අපේ උරුමය පිළිබඳ පණිවිඩය ඈත කඳු වලලු පුරාද දෝංකාර දෙන බව පිළිගැනේ. සජීවීව මෙම අත්දැකීමට මුහුණ දෙන මිනිසුන්ට තමා වටා නිරන්තරව රැදෙන සියලු දුක්ඛ දෝමනස්සයන් මොහොතකට හෝ යටපත් කරන්නට, අමතක කරන්නට එම ශබ්ද මාධුර්‍යය අනිවාර්යයෙන්ම සමත්වනු නියතය.

වැව් දිය සිප හමා එන සීතල සුළඟත් පොල්කටු - කොප්පරා ගිනිපන්දවල උණුසුමත් නිසා අපූරු සුවදායි සනීපයකින් සැනසුන ගත ශබ්ද මාධූර්යෙන් පිනවන්නට පෙරහැරේ මෙම වාද්‍ය කණ්ඩායමේ සමත් වෙති. අනතුරුව ගමන් කරන්නේ තමාගේ රාජකාරි සලකුණ ලෙස රජතමය අංකුසයක් අතින් ගත් ගජනායක නිලමේ. පෙරහැරේ ඉතාම වැදගත් තැනක් හිමිවන ගජනායක නිලමේ තැන සාම්ප්‍රදායික වශයෙන් නම් රජතුමාගේ ඇත් හමුදාවේ ප්‍රධානියාය. අතීතයේදී නම් රජුට අමතරව මහනුවර සතර දිශාවේම ඇතෙකු පිට යාමේ පෞඪ වරප්‍රසාදය හිමිව තිබු එකම පුද්ගලයා වන්නේ ගජනායක නිලමේතුමා බව සඳහන්ය.

ගජනායක නිළමේ පිටුපසින් අලංකාරව සරසන ලද ඇතුන්

කිහිපදෙනෙක්ද බෙරකරුවෝද නැට්ටුවෝද ගයමින් වයමින් පෙරහැරේ ගමන් කිරීම සිදුවේ. එහිදි විශේෂයෙන්ම පන්තේරු ,උඩැක්කි, රබන් සහ ලී කෙළි නැටුම් කණ්ඩායම් අලංකාර ලෙස සැරසී තම නැටුම් අංගයන් ඉදිරිපත් කිරීම දැකබලා ගත හැකිය.

මුළු පෙරහැරට ඉදිරියට ඇදෙන්නේ ගජගා වන්නමේ තාලයටය. එයද එක්තරා ආකාරයක සංවර බවක්, අභිමානයක්, පෞඪත්වයක් පෙරහැරට එක්කරන්නාවු සිදුවීමකි. මක් නිසාද යත් අනන්තවත් වාද්‍ය භාණ්ඩ හා ගායකයින්, වාදකයින් සිටියත් ඒ සියළු භාණ්ඩ වැයෙන්නේ ගජගා වන්නමේ එන පෞඪ ගරු ගාම්භිර තනුව අනුව මිස සිත් අවුලුවන ඝෝෂාකාරි ස්වරූපයකින් නොවීමය.

ඊළඟට ගමන් කරන්නේ කාරිය කෝරාළය. ඔහු දළදා මාළිගාවේ දියවඩන නිලමේතුමන්ට පසුව සිටින බලධරයා වශයෙන් පිළිගැනේ. කාරිය කෝරාළ ගමන් කරන්නේ මාළිගාවේ රාජකාරයන් හේවිසිකාරයින් හා නැට්ටුවන් විසින් පිරිවරාගෙනය. මුතු පබළු ඇල්ලු සුන්දර දීප්තිමත් සම්ප්‍රදායික ඇඳුම් හිස් පළඳනා දරා සිටින නැට්ටුවන් පෙරහැරට ගෙන එන්නේ අපුරු චමත්කාරයකි.

මහනුවර ඇසළ පෙරහැරේ සම්භාවනීය වූත් පූජනීයවූත් අවස්ථාව අනතුරුව දැකබලා ගත හැකිය. අභිමානවත් රාජකීය පෙනුමක් ඇති දළදා මාළිගාවේ ඇතා සධාතුක කරඬුව වැඩමවාගෙන ඒම මෙහිදි සිදුවේ. රැස්ව සිටින සියලු ජනතාව නැගි සිටිමින්, මල් ඉසිමින් සාධුකාර දෙන මෙම අවස්ථාව ක්‍රමානුකූලව සිත් සතන් පහන් රසයෙන් පිරිසිදුකර, ප්‍රබෝධමත් කර එය ටිකෙන් ටික වර්ධනය කොට රසයෙන්, අභිමානයෙන් පුරවන ගෞරවයේ උච්චතම අවස්ථාවය.

විදුලි පහන්වලින්ද ගිනි පන්දම්වලින්ද ඒකාලෝක වු රජ විදිය දිගේ සියලු හස්ත්‍යාභරණයෙන් සරසවා විදුලි බුබුලින්ද ආලෝක කළ මංගල හස්තිරාජයා පැමිණෙන්නේ යන මගට අතුරන ලද සුදු පාවඩ මතිනි. සියලු

හස්ත්‍යාභරණවලින් සැරසූ විදුලි බුබුලින් ආලෝක කර ඇති සධාතුක කරඬුව දරා හස්තිරාජයා පැමිණෙන මඟට බැතිමතුන් සුදු මල්පියලි ඉසිමින් නමස්කාර කිරිම සිදුවේ.

ඉතාමත් අලංකාර ලෙස සැරසූ දෑලේ ඇතුන් විසින් පරිවරන මෙම මංගල හස්තියා ගමන් කරනුයේ මහත්වූ අභිමානයකින් හා සංවර ලීලාවකින් බව කිව යුතුමය. දෑලේ ඇතුන් පිට නැගි මාලිගාවේ අවාතේවකරුවෝ ඇතුපිට ඇති සධාතුක කරඬුවට සුවඳැති මල් ඉසිමන් උපහාර දක්වීම සිදු කරති. එසේම කරඬුව රැගත් ඇතාට ඉදිරියෙන් මාලිගාවේ කවිකාර මඩුව ගමන් කිරීම සිදුවන අතර ඔවුහු දළදා වහන්සේගේ ගුණ ගී ගායනා කිරිමත් ගෞරව දක්වීමත් සිදුකරති.

මිළගට නැවතත් නැටුම් කණ්ඩායම්ද බෙර කරුවෝද අලංකාර ලෙස නටමින් ගයමින් වයමින් පෙරහැරේ ගමන් කිරීම දැකිය හැකිය. ඒ සමඟම දූනට දළදා මාළිගය ආශ්‍රිත සියලු වගකීම් හා ගෞරව දරා සිටින දළදා මාළිගාවේ නිත්‍යානුකූල ගිහිභාරකරු වන දියවඩන නිළමේතුමත් ගමන් කිරීම සිදුවේ. පෞරාණික රාජකීය ඇඳුම් පැළඳුම්වලින් සැරසී සිටින දියවඩන නිළමේතුමා ගමන් කරන්නේ නැටුම් ගැයුම් වැයුම් හා දළදා මාළිගාවේ නොයෙක් නිළතල දරන භාරකාරයන්ද පිරිවරාගෙන මුතු කුඩයක් යටය. ඔටුනු, කඩුකස්ථාන හිස් පළඳනා ප්‍රමුඛ ඇඳුම් හා ආභරණද සුවඳ විහිදුවන විශාල පිච්චමල් මාලාවක් පැළඳ දියවඩන නිළමේතුමා අභිමානයෙන් යුතුව පෙරහැරේ ගමන් කරනුයේ අතීත සිංහල රජවරුන් සිහිපත් කරමිනි.

දළදා මාළිගාවේ රන්දෝලි පෙරහැර එතැනින් අවසන් වන අතර ඊළගට නාථ, විෂ්ණු, කතරගම දේවාලයන්හි පෙරහැර ගමන් කරනු දක්නට හැකිය. එය මාලිගාවේ පෙරහැර තරම්ම විශාල නැතත් බොහෝ විට මාලිගාවේ පෙරහැරට සමාන ලෙස සංස්කෘතික අංගයන්ගෙන් නැටමු, ගැයුම් , වැයුම් වලින් යුක්ත වීම විශේෂත්වයකි. සධාතුක කරඬුව වෙනුවට දේවාල පෙරහැරවල රැගෙන යන්නේ දෑලේ ඇතුන් සහිත ප්‍රධාන ඇතෙකු පිට තබාගත් අදාළ ඒ ඒ දේවාලයන්ට අයත් දිව්‍ය ආභාරණයන් හා ආයුධය,

දියවඩන නිලමේතුමා වෙනුවට පෙරහැරේ මූලිකත්වය හිමිවන්නේ අදාල දේවාලයේ බස්නායක නිලමේතුමන්ටය. මහනුවර ඇසළ පෙරහැරේ අවසානයට ගමන් කරන පෙරහැර වන්නේ පත්තිනි දේවාලයේ පෙරහැරයි. පත්තිනි දේවිය වෙනුවෙන් කැපවූ එය මහනුවර ඇසළ පෙරහැරේ සුවිශේෂම පෙරහැරක් වන අතර කාන්තා සහභාගීත්වයක් ඇති මහනුවර ඇසළ පෙරහැරේ ගමන් කරන එකම දේවාල පෙරහැරද වන්නේය. පත්තිනි දේවාලයේ පෙරහැර අවසන් වන්නේ රන්දෝලිය ගෙන යාමෙන් වන අතර එය මහනුවර ඇසළ පෙරහැරේ ගමන් කරන සාම්ප්‍රදායික වූත් ගෞරවණීය වූත් අවසන් අංගය වන්නේය.

ජනාකීර්ණ නගරයක් මධ්‍යයේ විෂ වායූන්ගෙන් පිරි කැලතුණ පරිසරයක් අසිරිමත් ලෙස සෝදා පිරිසිදු කලාක් වැනිව පෙරහැර මංගල්‍ය වෙනුවෙන් සැදී පැහැදි පේවීම සිදුවේ. උඩවත්ත කැලය හා ඒ ආශ්‍රිත ස්වභාවික තුරුලතා මල් සිප එන සුවදායි සුළඟක් සීතල වැව් දිය පිසගෙන එන පිනිමුදු සීතල සුළගත් එකට කැටිව ගෙනන සුවය විදගන්නට සෙංකඩගල පුරවරයට යා යුතුමය. මෙහි විශේෂත්වය වන්නේ ඇසළ සමයේ ආරම්භ වී නොකඩවා වැටෙන වැහි ඇළිය ජනයාගෙන් හා දූවිල්ලෙන් අපවිත්‍ර වන නගරය සෝදා පිරිසිදු කර හරින්නට මෙන් නොකඩවා වැටෙන වැහි ඇලි පරිසරයේ සවසට පවතින සීතල දෙගුණ කරවයි. මෙකී පරිසර හා කාලගුණ තත්වයන් හේතුවෙන් කෙතරම් සෙනග ගැවසුණත් පරිසරය නැවුම් හා ප්‍රබෝධමත්ව තිබීම සිදුවෙයි. එවන් ප්‍රබෝධමත් පරිසර පසුබිමක නන් දෙසින් පැමිණි ජනයා මහනුවර ප්‍රධාන විදී අවට රැස්ව සිටින්නේ පෙරහැර ආරම්භයටත් බොහෝ වේලාවකට පෙර සිටමය.

මේ සියල්ලම සමඟ පෙරහැර ආරම්භ වීම සිදුවන අතර ඒ සඳහා පවත්වන පළමු වෙඩි හඬ රැස්ව සිටින ජනතාවගේ කුතුහලයක් බලාපොරොත්තුවත් ඉහළ නංවන්නට සමත්වන අතර එතෙක් පැවති අනේක විඳ ශබ්ද නිහඬ කරවීමක්ද වන්නේය.

පෙරහැර ගමන් ආරම්භ කිරීමත් සමඟ මුළු පරිසරයම අමුතු

වෙනසක් ගනී. පොල්කටු, අඟුරු, කොප්පරා වැනි පරිසර හිතකාමී ස්වභාවික ද්‍රව්‍ය දහනයෙන් පිටවන ආලෝකය රැගෙන එන්නේ සුවදායි උණුසුමක් සහ සුවඳක්ය. කපුරු කට්ටකුමංජල් හා මල් සුවඳත් කැලතී මහපෙරහැර ගමන් කරන අවස්ථාවේ මේ ලබන උණුසුම් සුවය ඇසළ මාසයේ සීතල සමඟම විඳිය යුත්තකි. ලොකු, කුඩා, බාල, මහලු, කිරි දරුවාගේ සිට වයෝවෘද්ධ වැඩිහිටියාටද එක සේ සුව සදන මේ උණුසුමින් ශාරිරික වශයෙන් දරා සිටින්නා වූ බොහෝ අපහසුතා නිවා සනසා ගත හැකිය.

මෙසේ නිවී සැනසුන ගතින් යුතුව සිටින අවස්ථාවක පහන් සතුටකින් කන් පිනවමින්, ඇස් පිනවමින් සාඩම්බරයෙන් විදි දිගේ ඇදෙන මහ පෙරහැර ජාතික හා ආගමික අභිමානය පුබුදු කරමින් සියලු දුක් කරදර මදකට හෝ අමතක කර මිනිස් සිත් සතන් නිවා සනසාලූ ලාංකිකයන්ට පමණක් උරුම වු අමිල වු මහාර්ඝ වු ඖෂධයක්ම වන්නේය.

වසරක් පාසා සිදුකරන මෙම අසිරිමත් මහා මංගල්‍ය කන්ද උඩරට ජනතාව පමණක් නොව පෙරහැර නැරඹීමට නන් දෙසින් පැමිණෙන ලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ සිත් ආගමික, ජාතික හැඟිම්වලින් පුබුදු කරවා අනතුරුව සහනදායි ලෙස නිවා සනසාලන්නක් වන්නේය. එනම් මානසික සුව සහනයක් කිසියම් ආකාරයක සුවදායි බවක් ගෙන දෙන්නකි. ආගම තුලින්, කලාව තුළින් පමණක් ලද හැකි මෙම අපුරු සුව සහනය අතීතයේ සිටම දාර්ශනිකයන්ගේ පවා ඇගයුමට, ප්‍රශංසාවට ලක් වූවකි. කලාව වෙතින් මිනිසාට සහ මිනිස් සමාජයට ඉටුවිය යුතු කිසියම් සේවයක් පවතීදැයි විමසු අතීත දාර්ශනිකයන් නිසා කලාවේ වටිනාකම් පිළිබඳ නොයෙකුත් කතිකාවන් සංවාදයන් ගොඩනැගි ඇත. මේ පිළිබඳ මුල් වරට විමසන ලද්දේ ආදි ග්‍රීක දාර්ශනික ප්ලේටෝ විසිනි. පුද්ගලයා පහසුවෙන් යහපත කරා යොමුකරලීමේ කාර්යභාරයේ වගකීම් කලා නිර්මාණකරුවන් වෙත පැවරිම නිසා තම නිර්මාණකරණයන්හිදී කලා නිර්මාණකරුවා සදාචාරාත්මක වගකීමකින් කටයුතු කළ යුතු යැයි ප්ලෝටෝ අදහස් කර ඇත. දැඩි ආචාරවාදී ස්ථාවරයක සිටිමින් කලාව පිළිබඳ අදහස් දැක්වු මෙම දාර්ශනිකයා කලාවත්

සදාචාරයත් අතර අනිවාර්ය බැඳීමක් තිබිය යුතුයැයි අපේක්ෂා කළේය. කලා කෘතියක් වෙතින් අප ලබන සතුටෙහි ස්වභාවය පිළබඳ විමසූ ප්ලේටෝ සතුට සහ යහපත අතර සම්බන්ධයක් තිබෙන බවත් සතුටෙහි විවිධ ගුණාත්මක වෙනස්කම් පවතින බවත් පෙන්වා දී ඇත. කලා නිර්මාණයක් වෙතින් සැබෑ සතුටක් අධ්‍යාත්මික ආශ්වාදයක් ලැබිය හැකි බව කියූ ප්ලේටෝ වඩා යහපත් මිනිසුන් සතුටු කරන කලාව හොඳ කලාවක් යැයි පිළිගෙන ඇත. මිනිසුන්ගේ තදබල ආවේගාත්මක හැඟීම් මතු කරන, ප්‍රචණ්ඩ හැසිරීම් උත්සන්න කරන කලා නිර්මාණයන් ප්ලේටෝගේ තදබල විවේචනයට ලක්ව ඇත. එවන් කලාවන්ගෙන් ආත්ම දමනය හා සංයමය නැතිව මිනිසුන් ආවේග හරිත වන බවත් ආත්මයේ සංවර කර ගත යුතු අංශය අසංවර ලෙස වර්ධනය වීමෙන් ජීවිතයේ සතුට නැතිවන බවත් දාර්ශනිකයෙකු ලෙස ප්ලේටෝ පැහැදිලි කර ඇත. එසේ නම් කිසියම් කලා නිර්මාණයක් වෙතින් අප ලැබිය යුත්තේ කිසියම් සංවර සතුටකි. ආශ්වාදයකි. මෙය කලාව මගින් අප ලබන්නා වූ වටිනාම වින්දනයකි.

කලාවෙන් ඉමහත් ප්‍රයෝජන සැලසෙතැයි විශ්වාස කළ ඇරිස්ටෝටල් කලාවත් යහ ජීවිතයත් අතර අවියෝජනීය සම්බන්ධයක් ඇති බව පිළිගනී. එසේම සමස්ත මානව පෞරුෂය පාලනය කර ශික්ෂණය කිරීමේ හැකියාවද කලාව සතුවන බව ඇරිස්ටෝටල් පිළිගනී. ඔහු මෙසේ කලාව පිළිබඳ ඉදිරිපත් කළ බොහෝ අදහස් අඩංගු වන්නේ පොයෙටික්ස් (කාව්‍ය ශාස්ත්‍ර) නම් කෘතියේය. කලාවේ මනෝ විද්‍යාත්මක වටිනාකම පිළිබඳව අදහස් දැක්වූ ඇරිස්ටෝටල් කාව්‍ය සාහිත්‍ය යන්න ඒ සඳහා නිදසුන් ලෙස ඉදිරිපත් කර ඇත. සාහිත්‍ය ක්ෂේත්‍රය තුළ සත්‍යයත් ඥානයත් ඇති බව පිළිගන්නා ඔහු සාහිත්‍යකරුවා සත්‍ය ප්‍රකාශ කරන්නේ විශේෂ සිද්ධියක සත්‍යය වශයෙන් නොව කලාවක අන්තර්ගත සාමාන්‍ය මනෝවිද්‍යාත්මක නියමයන් (A theory of general psychology) ලෙස යැයි පෙන්වා දි ඇත.

ඇරිස්ටෝටල් ඉදිරිපත් කළ කලාවේ මනෝවිද්‍යාත්මක අගය පිළිබඳ අදහස බොහෝ දුරට මතු වන්නේ ඔහුගේ කැතාසිස් (Kathasis) සංකල්පය

විමසීමේදී ඉංග්‍රීසි පරිවර්තනයක් විසින් Purgation යි දක්වන මෙම අදහස විරේචනය, විමෝචනය , විශෝධනය යන ලෙස සිංහලයට එක්වී ඇත. මෙය සැහෙන මතභේදයට තුඩු දුන් අදහසකි. බොහො දෙනෙකු එය භාවිත කරනුයේ මානසික පිරිසිදු කිරීම, භාවයන්ගෙන් නිදහස්වීම යන අරුතිනි. ඇරිස්ටෝටල් විසින් ඛේදාන්ත නාමය පිළිබඳ අදහස් දක්වීමේදී භාවිත කළේ යැයි විශ්වාස කෙරෙන මෙම සංකල්පය, ප්ලේටෝ විසින් සෞන්දර්ය ක්ෂේත්‍රය පිළිබඳව මතු කරන ලද ඇතැම් විරෝධාකල්පයන්ට පිළිතුරක් ලෙස භාවිතා කළ බවද පිළිගැනේ.

ඛේදාන්ත නාට්‍යය නැරඹීම තුළින් මිනිසුන් තුළ මානසික වශයෙන් නිදහසක් මනෝභාව විරේචනයක් සිදුවන බව ඇරිස්ටෝටල් පිළිගනී. එනම් දයාව අනුකම්පාව බිය ඛේදාන්ත නාට්‍යවල නිපදවා ඒවාට හසුවන අය, නරඹන අය කිසියම් මනෝවිද්‍යාත්මක වශයෙන් පිරිසිදු බවකට සැනසිලිදායක තත්වයකට පත්කරන බවය. මෙයින් අදහස් වුයේ අප වෙත පවත්නා වු හැඟීම් හා ආශාවන්,. ආවේගයන් නිසි පරිදි ඉටුකර ගත නොහැකි විට අපේම සිත් තුළ පීඩාවන්, අසහනයන් ලෙස ඒවා රැඳි පවතින විට කාලව මගින් කාල්පනික තලයකට ගෙනැවිත් එම හැඟීම් සියල්ල නිදහසේ ගැටෙන්නට සැලැස්වීම මුදා හැරීම මගින් අප තුළ මානසික සහනයක් ඇති කරන බවය. කලාවෙන් පමණක් ලැබිය හැකි මෙම පහසුව, සුවය කලාවේ ඉතාමත් වටිනා අංශයක් ලෙස ඇරිස්ටෝටල් පෙන්වා දී ඇත. මේ පිළිබඳව විද්වතුන්ගේ අදහස වුයේ කාල්පනික ක්ෂේත්‍රයක් තුළ චිත්ත වේගයන් ක්‍රියාත්මක කර ඒ තුළම ඒවා මුදවා හැර චිත්ත පාරිශුද්ධියක් ලබනා දෙයක් ලෙසය. විශේෂයෙන්ම අධ්‍යාපනයේදී සංගීත කලාවට හිමි තැන ගැන කරුණු දක්වන ඇරිස්ටෝල් සංගීතයේ එක් ආනිසංසයක් ලෙස අනුහසක් ලෙස මිනිසා චිත්තවේගවලින් මුදවා හැරීම, භාවමය වශයෙන් කිසියම් සුවයක් ලැබීම එනම් කැතාසිස් යනුවෙන් යොදා ඇත්තේ මිනිසා චිත්ත වේගවලින් මුදවාලීම විය හැකිය. විශේෂයෙන්ම යම් මනෝවිද්‍යාත්මක බලපෑමක් ස්වර මාධුර්ය, සංගීතය වැනි කලාවන්ගේ මිනිසාට ලැබෙන බව මේ අනුව කිව හැකිය.

ඔහු පෙන්වා දෙන පරිදි සමහර මිනිසුන්ට ආගමික ස්වරූපයෙන් ඇති මධුර ශබ්ද රටාවලින් යම් බලපෑමක් ඇති වේ. එබඳු ශබ්ද මාධුර්යයේ බලපෑමට මිනිසුන් ලක් වූ විට ඔවුන්ගේ සිත් ආගමික හැඟීම්වලින් කුල්මත් වේ. යම් යම් උත්තේජන ඇති වේ. එවිට මිනිසුන්ගේ සිත් ශාන්තියකට පැමිණ වෛද්‍ය ප්‍රතිකාරකයට ලක්වූ අවස්ථාවක මෙන් සුවය ලබයි. ඇරිස්ටෝටල් දක්වන මෙම මානසික සුවය අංශ දෙකක් යටතේ දැක්විය හැකිය.

1. ක්ෂණිකව පහළ වන පීඩාකාරි දරුණු චිත්තවේගයන්ගෙන් නිදහස් වීම
2. කාලයක් පුරා එක් රැස් වූ පීඩාකාරි චිත්ත වේගයන් නිසා පත්ව ඇති අපහසුතාවයන්ගෙන් නිදහස් වීම.

මෙය ආත්මීය සුව සහනය, අධ්‍යාත්මිකව පිරිසිදු බව පිළිබඳ අදහසකි. සංගීතයෙන් ආත්මය පිරිසිදු වෙතැයිද කායික රෝගී පවා සුව කළ හැකි බලයක් ස්වර මාධුර්යෙහි ශබ්ද රසයෙන් ඇතිය යන්න ප්‍රකට මතයකි.

කලාව වෙතින් අප ලබන ආස්වාදය පිළිබඳව අපූරු අදහසක් ඉදිරිපත් කළ සෞන්දර්ය වේදයෙකි. ක්ලයිෆ් බෙල්, ඔහු මෙසේ සඳහන් කරයි.

"කලා කෘතියකින් ආස්වාදය ලැබීම පිණිස ජීවිතයෙන් අපට කිසිම දෙයක් ගෙන ආ යුතු නොවේ. ජීවිතයට අදාළ සංකල්ප හෝ ක්‍රියාකාරිත්වයන් ගැන දැනුම ඒ සඳහා අවශ්‍යද නැත. ජීවිතය හා සම්බන්ධ මනෝභාව හා හුරුපුරුදු සමග සම්බන්ධයක් ද නැත. කලාව මිනිස් ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ ලොවින් සෞන්දර්යය නැමැති උසස් තලයට මිනිසා නංවා තබයි. එහිදී එක් මොහොතකට අප මිනිස් වුවමනාවන්ගෙන් වසාතබයි. එහිදී අපේ අපේක්ෂාවන් හා මතකයන් හිර කර තබයි. ජීවිතය නැමැති ප්‍රවාහනයෙන් අපව ඔසවා තබයි.."

පෙරහැර නැරඹීමේදී සිදුවන්නේ මෙවැන්නකි. සුළු කාල

වේලාවකට හෝ එම අසිරිමත් කලා මංගල්‍යය තුළ අප දැහැන්ගත වීමකට ලක්විම සිදුවන අතර එමගින් කලා නිර්මාණය හා ඒකාත්මිකවීමටද හැකියාව ලැබේ. මෙවන් තත්වයක් තුළ අප වටා ඇති පීඩාකාරි මනෝභාවයන්ගෙන් ටික වේලාවකට හෝ නිදහස් වීමට අපට හැකියාව ලැබෙනු ඇත. මහා ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල් තම දාර්ශනික විමර්ශනයන්හීදි සඳහන් කර ඇති පරිදි කලාව තුලින් මිනිසා ලබන රසය මනෝවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත වූවකි. එමගින් සිදුවන මානසික සුව සහනය (භාව විශෝධනය) පිළිබඳව සඳහන් කරන ඇරිස්ටෝටල් "ඇතැම් පුද්ගලයන් කෙරෙහි බලපාන භාවයන් අඩුවැඩි ප්‍රමාණයන් සියලු දෙනා කෙරෙහිම දක්නට ලැබේ. උදාහරණ වශයෙන් කාරුණ්‍ය හා භයද ප්‍රහාර්ෂයද එවැනි භාවයෝ වෙති. අන්තිමට සඳහන් කළ ප්‍රහාර්ෂය නම් භාවය කෙරෙහි ඇතැම් අය තුල විශේෂ නැඹුරුවක් පවතී. පුද්ගලයා උන්මාද අවස්ථාවට පත්කරන ආකාරයේ ආගමික සංගීතයෙන් හා ගීතයන්ගෙන් බලපෑම නිසා ඔහු බෙහෙත් දීමෙන් විමෝචනය කරනු ලැබූ කලක් මෙන් නිශ්චල වන්නේය. කාරුණ්‍යට සහ භයට පත්වූ පුද්ගලයන් මෙන්ම සාමාන්‍ය භාවාත්මක පුද්ගලයෝද වෙනත් අයද එලෙසින්ම නිශ්චල වෙති. මේ සෑම දෙනාටම කිසියම් මානසික වශයෙන් විමෝචනයක්ද , සුඛ වේදනාවක්ද සහනයක්ද ලැබේ."

පෙරහැර නරඹන පිරිසද අඩු වැඩි වශයෙන් මෙවන් සුඛ ආශ්වාදයක් විඳින බව කිව හැකිය. මහනුවර ඇසළ පෙරහැර ඔවුන්ගේ සිත් සතන් නිවා සනසන බව, සුවදායි අත්දැකීමක් ගෙනදෙන බව කිව හැකිය. මක් නිසාද යත් ඇසළ පෙරහැර පුරාම ඇත්තේ සිත් නිවා සනසාලන සිදුවීම් සමූහයක් වන බැවිනි. සම්ප්‍රදායික ලෙස පෙරහැර ආරම්භ කරන බව දැනගැනීමේ සිට අවසාන රන්දෝලි පෙරැහැර විදි සංචාරය කර ගෙවදින අවස්ථාව දක්වාම ඇත්තේ ඉහතින් සඳහන් කළ ආකාරයේ ගරු ගාම්භීර වූත් සාම්ප්‍රදායික වූත් ආගමික වතාවතක් මෙන් ක්‍රමානුකූලව සංවිධානය කළ අපූරු සිදුවීම් මාලාවකි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:

1. සෝරත හිමි, වැලිවිටියේ, දළදා සිරිත, කොළඹ. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම (1970)

2. සුගතපාල ටී. දළදා පූජාවලිය ,කොළඹ (1929)

3. වජිර හිමි කඹුරුගමුවේ, දළදා ඉතිහාසය හා සංස්කෘතිය, තිසර ප්‍රකාශන , දෙහිවල (1983)

4. රෝහණධීර මෙන්ඩිස්, අස්ගිරි තල්පතින් එළිවන ඉතිහාසය ප්‍රදීප ප්‍රකාශකයෝ , ගංගොඩවිල (1970)

5. ජයකොඩි සරත්චන්ද්‍ර, සිරි දළදා පුවත, සදීප ප්‍රකාශකයෝ,කොස්වත්ත (2004)

6. අධිකාරම් ඊ. ඩබ්. පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය කේ. ජී. ජයවර්ධන සමාගම කොළඹ (1963)

7. Senevirathne A. Some Notes on Gaman Hevisi, Journal of the Sangeet Natak Academy Vol. 6 New Delhi (1981)

8. Commaraswami Ananda, Medieval Sinhalese , Art New York: (1956)

# උඩරට නර්තනයේ දේශපාලනය
## දළදා පෙරහැර ආශ්‍රයෙන් කෙරෙන විග්‍රහයක්

**කථිකාචාර්ය සුදේශ් මන්තිලක**
ලලිත කලා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය.

මෙම ලිපියේ අරමුණ වන්නේ උඩරට නර්තනයේ දේශපාලනය මහනුවර දළදා පෙරහැර ආශ්‍රයෙන් විග්‍රහ කිරීම බව මාතෘකාවෙන් අවබෝධ වනු ඇත. මෙහි **"දේශපාලනය"** යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක්දැයි සංක්ෂිප්තව හෝ පැහැදිලි කල යුතු බව හැඟෙයි. ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන ,ජදකසඑසජි, යන පදය සිංහලයට ගෙන ඇත්තේ **"දේශපාලනය"** ලෙසිනි. ඉංග්‍රීසියේ ,ජදකසඑසජි, යන පදයේ විවිධ අර්ථ ඇත. සිංහල භාෂාවේ එය **"දේශපාලනය"** යනුවෙන් හැඳින්වීමෙන් අර්ථ ලඝු කිරීමක් සිදුවී ඇත. "Politics" යන්නට භාවිත සිංහල පදය වන්නේ "දේශපාලනය" වන බැවින් මමද එය යොදමි. එහෙත් මෙම ලිපියේ දී මා **"දේශපාලනය"** ලෙසින් අදහස් කරන්නේ රටක්, දේශයක් පාලනය කිරීම යන හුදු අර්ථය නොව "පොදුවේ සමාජය තුළ **"බලය"** සංසරණය වන ආකාරය යන අර්ථය යි.

උඩරට නර්තනයේ දේශපාලනය යන්න ඉතා පුළුල් මාතෘකාවකි. මෙම ලිපියේදී සිදු කෙරෙන්නේ දළදා පෙරහැර ආශ්‍රයෙන් උඩරට නර්තනයේ දේශපාලනය හඳුන්වා දීමකි. එක් එක් දේශපාලන කරුණු පිළිබඳව ගැඹුරු විග්‍රහයකට යාම මෙවැනි ලිපියකින් කළ නොහැකි බව සඳහන් කළ යුතුය. එහෙත් මෙම ලිපියේ දී මා මතු කරන කරුණු, ගැටලු තත් විෂය ක්ෂේත්‍රය තුළ ගැඹුරු පර්යේෂණ සඳහා යොමු වන්නට පෙළඹවීමක් වන බව මාගේ විශ්වාසය යි.

උඩරට නර්තනයේ දේශපාලනය පිළිබඳවත් දළදා පෙරහැර පිළිබඳවත් වෙන් වෙන් වශයෙන් අධ්‍යයනයන් මීට පෙර සිදුවී ඇති බව පෙනෙයි. උඩරට නර්තනයේ දේශපාලනය සෘජුවම මාතෘකාව කර

නොගත්තත් ඇතැම් දේශීය හා විදේශීය විද්වතුන් මෙම විෂය ක්ෂේත්‍රය යම් දුරකට අධ්‍යයනය කොට ඇති බව පෙනෙයි. කෙසේ වෙතත් උඩරට නර්තනයේ දේශපාලනය දළදා පෙරහැර ආශ්‍රයෙන් විග්‍රහයට ලක් කළ අධ්‍යයනයන් නොමැති තරම් ය.

**හැඳින්වීම**

උඩරට නර්තනය ලෙසින් අද අප හඳුනා ගන්නා නර්තන ක්‍රමය ශාන්තිකර්ම තුළින් ප්‍රභවය ලද බව පෙනෙයි. බොහෝ විද්වත්තු හා නර්තන ශිල්පියෝ උඩරට නර්තනයේ අයිතිය කොහොඹා කංකාරිය නම් ශාන්ති කර්මයට පවරා දෙති. ආරම්භයේ කෙසේ සිදුවුවත්, උඩරට නර්තනය/ නැටුම ලෙසින් අද අප හඳුනා ගන්නා නර්තන ක්‍රමය අතීතයේ සිට අද දක්වා වර්ධනය වී ආ ගමන් මග දෙස හැරී බලනු වටියි. ඒ තුළින් උඩරට නර්තනය දළදා පෙරහැරට සම්බන්ධ වූයේ කුමන දේශපාලනික තත්වයක් යටතේ දැයි අපට අවබෝධ කොටගත හැකියි.

ශාන්තිකර්මවලට පමණක් සීමා වී තිබුණු උඩරට නර්තනය සතු පූජාර්ථ ලක්ෂණ හඳුනාගත් රාජ්‍ය පාලකයන්, ප්‍රභූන්, බෞද්ධ භික්ෂූන් විසින් මෙම නර්තන ක්‍රමය ආගමික පූජා සඳහා ද යොදා ගන්නා ලදි. මෙහිදී ශාන්තිකර්මාර්ථයෙන් මිදී උඩරට නර්තනය බෞද්ධ මුහුණුවරක් ගැනීම සිදුවී ඇත. එක් අතකින් උඩරට නර්තනය මෙසේ බෞද්ධාගමට සම්බන්ධවන අතර තවත් අතකින් එය විනෝදාස්වාදය සඳහා ද යොදා ගැනෙන්නට විය. උඩරට නර්තනයේ පූජාර්ථමය මෙන්ම ආස්වාදනීය ගතිලක්ෂණ ද ඇත. එහි ඇති ආස්වාදනීය ගුණ වටහා ගත් රාජ, අමාත්‍යාදී ප්‍රභූහු ශාන්තිකර්මවල දැකිය හැකි ආකර්ශණීය නර්තන අංග ශාන්ති කර්ම වලින් වෙන් කොට වෙන් වෙන් නර්තන අංග ලෙසින් රඟ දැක්වීමට නර්තකයන්/ යක්දෙස්සන් උනන්දු කළහ. ඇතැම් දේශීය ප්‍රභූන්ට තමන්ගේම නර්තන කණ්ඩායම් පවා සිටි බව කියැවේ. මහනුවර කවිකාර මඩුව හා ඒ හා සබැඳි වන්නම් ගායනා, වන්නම් නැටීම, උඩරට නර්තනය රාජමාළිගාවට සම්බන්ධ වුණු බවට සාක්ෂි සපයන්නට සමත් වේ. මුලදී ගායනය සඳහා නිර්මාණය වූ වන්නම්වලට

උඩරට නර්තන චලන, ලක්ෂණ එක්වී පසුව වන්නම් නැටීම ජනප්‍රියත්වයට පත්වී ඇත. බෞද්ධ විහාරස්ථානවලට **"සූවිසි නැටීම"** ලෙසින් උඩරට නර්තනය සම්බන්ධ වී ඇති බව අපට ඉතිහාස අධ්‍යයනයේදී පැහැදිලි වේ. මෙම තත්ත්වය යටතේ මෙසේ රාජ, අමාත්‍යාදීන්ගේ, බෞද්ධාගමික නායකයන්ගේත් ප්‍රසාදයට ලක්වූ උඩරට නැටුම දළදා පෙරහැරට යොදා ගැනීම පුදුමයට කාරුණයක් නොවන්නේය. අද වන විට උඩරට නර්තනය පෙරහැරක අත්‍යවශ්‍යම අංගයක් බවට පත්ව ඇති බව සඳහන් කළයුතුය.

මහනුවර දළදා පෙරහැර විවිධ දේශපාලනික තල නියෝජනය කරන ආගමික පූජා උත්සවයකි. එච්.එල්. සෙනෙවිරත්න මෙය තල දෙකක් ඔස්සේ සාකච්ඡා කරයි. ඒවා මෙසේ වෙන්කොට දැක්විය හැකිය.

1. සමාජයේ (දේශපාලනික) පරිපාලන ව්‍යුහය
2. සමාජයේ කුලය පදනම් කොට ගත් ධූරාවලිය[2]

එහෙත් මෙහි දෙවැනියට දක්වා ඇති සමාජයේ කුලය පදනම් කොට ගත් ධූරාවලිය යන්න, සෙනෙවිරත්න මහතා සිය අදහස ප්‍රකාශ කළ 1960 ගණන්වලට වඩා අද විශාල විපර්යාසයකට ලක් වී ඇත. එහෙත් මෙය නැත්තටම නැති වී ඇතැයි ද අපට කිව නොහැකිය. දළදා පෙරහැර සමාජයේ පරිපාලන ව්‍යුහය, කුල ධූරාවලිය නිරූපණය කොට දැක්වෙන සංකේතාත්මක උත්සවයක් ලෙස සමාජ විද්‍යාත්මකව විග්‍රහ කළ හැකි ය.

## දේශපාලනය තුළ නර්තනය

දළදා පෙරහැරේ ඉතිහාසය අනුරාධපුර යුගය තෙක් ඈතට දිවෙන බව පෙනෙයි. එහෙත් සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව දළදා පෙරහැරට නර්තනය සම්බන්ධ වූ බව පෙනෙන්නේ පොළොන්නරු යුගයේදීය. පොළොන්නරුවේ මහා පරාක්‍රමබාහු රජුගේ කාලයේ සිදු කළ දළදා පෙරහැර ගැන මහාවංශයේ 72 පරිච්ඡේදයේ පහත පාඨය සඳහන් වන බව කියැවේ.[3]

"... මෘදංග බෙර ගත් ජනයා ද රූමත් නළඟනෝ ද නැටුම් ගැයුම් ආදියෙන් යුක්තව ගමන් කළහ." පොළොන්නරු යුගයේ දී රඟ දක්වා ඇති මෙම නර්තන ක්‍රමය කුමක් වන්නට ඇත්ද? මහාවංශ කර්තෘගේ විස්තරයට අනුව මෙහි දී නර්තනයේ යෙදී ඇත්තේ නළඟනන් ය. වයා ඇත්තේ මෘදංග ය. මෙම නැටුම් ක්‍රමය නිසැක වශයෙන් ම අද අප **"උඩරට"** ලෙසින් හඳුන්වන නර්තන ක්‍රමය විය නොහැකි ය. උඩරට නර්තනයේ සහයට වාදනය කෙරෙන්නේ ගැට බෙරය යි. එය කිසිසේත් ම මෘදංගයට සමාන නොවන අතර මෘදංගයේ පරිනාමයක් ලෙස සිතීමට ද ඉඩක් නැත. එසේම උඩරට නර්තනය ශාන්තිකර්ම ආශ්‍රයෙන් ප්‍රභවය ලද්දක් බැවින් මුල් කාලයේ දී උඩරට නර්තනයට කාන්තා දායකත්වයක් ලබාගෙන නොමැති තරම් ය.[4] මහාවංශයේ විස්තර කෙරෙන මෙම නර්තන ක්‍රමය බොහෝ දුරට ඉන්දියානු **"භරත"** නැටුම් වීමට ඉඩ ඇත.

කෙසේ වෙතත් උඩරට වෙස් නැටුම මහනුවර දළදා පෙරහැරට සම්බන්ධ වූ ආකාරය පිළිබඳව නම් සාධක ඇත. මෙය නුගවෙල දිසාවේ දියවඩන නිළමේ ව සිටින කාලයේ දී සිදුවූවක් බව පිළිගැනේ. එහෙත් මෙය සිදුවූ වර්ෂය පිළිබඳව විවිධ අදහස් ඇති බව පෙනෙයි. දළදා පෙරහැරේ වෙස් නැටුම් යොදා ගැනෙන්නේ ප්‍රභූන්, කරඬුව, දේවාභරණ පිරිවරා ගමන් කිරීම සඳහා ය. මෙය ඈත අතීතය දක්වා දිවෙන සම්ප්‍රදායක් බව පෙනෙයි. දඹදෙණි යුගයේ පණ්ඩිත පරාක්‍රමබහු රජු විසින් පවත්වන ලද දළදා පෙරහැරේ නැටුම් ගැයුම් දක්වන්නන් රජතුමා පිරිවරා පෙරහැරේ ගමන් කළ වග මහාවංශයේ සඳහන් වන බව කියැවේ.[5] මෙසේ නර්තකයන් රජ, ප්‍රභූන් පිරිවරා යාමේ සංස්කෘතියක් ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඇති වී ඇති බව පෙනෙයි. මෙහි සංවිධානාත්මක අවස්ථාවක් ලෙස **"රාජකාරි ක්‍රමය"** හැඳින්විය හැකි ය. රාජකාරි ක්‍රමය පිළිබඳව සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණ නොවුවද එය නර්තන කලාවේ දේශපාලනයට බලපෑ ප්‍රධාන කරුණක් බැවින් සැකවින් දක්වනු වටියි.

රාජකාරී ක්‍රමයේ දී මූලික වශයෙන් සිදුවී ඇත්තේ එක් එක් පිරිස්වලට,

ඇතැම් විට ගම් වශයෙන් ග්‍රාමවාසීන්ට, විවිධ කාර්යයන් රජු විසින් පැවරීමයි. උදාහරණයක් ලෙස රජුට අවශ්‍ය මැටි භාණ්ඩ ආදී කුඹල් කටයුතු කිරීම සඳහා එක් ජන කොට්ඨාශයක් වෙන් කරනු ලැබ තිබුණු අතර රජුට අවශ්‍ය ලෝහමය නිර්මාණ කිරීම සඳහා තවත් ජන කොටසක් වෙන් වී තිබුණි. මෙසේ රජවාසලට, රජු අවශ්‍ය වාදන, නර්තන කටයුතු කිරීම සඳහා ද සමාජයේ විවිධ ජනකොටස්වලට භාර කරනු ලැබ තිබුණි.[6] රාජකාරී ක්‍රමය යටතේ ඔවුන්ගේ රාජකාරියන් වූයේ දළදා මාළිගාවේ තේවා හේවිසි වාදනය කිරීම, රාජ්‍ය උත්සව අවස්ථාවලදී භේරී වාදනය කිරීම, දළදා පෙරහැරේ නර්තනයේ යෙදීම වැනි ඒවාය. මෙම රාජකාරී ක්‍රමය රජුගෙන් පහළ බල අධිකාරියන් සඳහා ද ව්‍යාප්ත වී තිබුණි. මහනුවර යුගයේ දී බෞද්ධ විහාරවලට හා දේවාලවලට රජුට අමතරව ප්‍රබල බල අධිකාරියක් හිමිව තිබූ බව පෙනෙයි. මේ අනුව විහාරවලට හා දේවාලවලට තම සේවාව ලබාදීම ද ඉහත දැක්වූ ජන කොටස්වලට අයත් කාර්යයක් බවට පත් විය. මේ සඳහා එම ජනතාවත් විහාර දේවාල අතරත් ගනුදෙනුවක් ඇති විය. මෙම ගනුදෙනුව **"විහාරගම් ක්‍රමය"** හෝ **"දේවාලගම් ක්‍රමය"** ලෙසින් හැඳින්විය හැකිය. මෙහිදී නර්තකයන් විහාරස්ථානයකට හෝ දේවාලයකට තම සේවාව ලබා දිය යුතු අතර ඒ වෙනුවෙන් ඔවුන්ට හා ඔවුන්ගේ පවුල්වලට වාසය කිරීමට විහාරස්ථානය හෝ දේවාලය භාරයේ ඇති ඉඩම් ලබාදෙනු ලැබිණි.[7] නර්තකයන්ගේ පක්ෂයෙන් බැලූ බැල්මට ආකර්ෂණීය ගනුදෙනුවක් වුවත් මෙය ඉතාම සූක්ෂ්ම දේශපාලනික උපායකි. නර්තකයන් බොහෝවිට විහාරස්ථානයට, දේවාලයට නුදුරින් පදිංචි කොට ඇති බැවින් ඕනෑම විටෙක ඔවුන්ගේ සේවාව ලබා ගැනීමේ හැකියාව විහාරය, දේවාලය සතුය.

එසේම නර්තකයාගේ පවුල් සාමාජිකයන් ද ජීවත් වන්නේ මෙම පරිසරයේ ම බැවින් නර්තකයන්ගේ දරුවෝ ද පියාගේ කලාව ප්‍රගුණ කරන අතරේ ම විහාරයට, දේවාලයට කළ යුතු සේවාව ද නිරායාසයෙන් ම උගනිති. අනතුරුව පියාගෙන් පසුව දරුවන් විහාරයේ, දේවාලයේ සේවාවට යෙදවෙන ආකාරයෙන් දේශපාලනික ක්‍රමය සැලසී තිබුණි. මෙම ක්‍රමය නිසා උඩරට නර්තන කලාවට සිදුවූ ඉතා වටිනා සේවයක් ද ඇති බව මෙහිදී

සඳහන් කළ යුතුය. මේ පිළිබඳව ඉදිරියේදී වැඩි විස්තර සාකච්ඡා කෙරෙයි.

අප ඉහත දැක්වූ රාජකාරි ක්‍රමයත් සමඟ ම ප්‍රබලත්වයට පැමිණි තවත් දේශපාලනික ක්‍රමයක් ලෙස **"කුල ක්‍රමය"** හැඳින්විය හැකිය. සමාජයේ විවිධ ජන කොටස් තමන්ට හිමි රාජකාරිය අනුව වර්ගීකරණයකට ලක්වෙද්දී ඊට සමගාමීව ඔවුන් කුලවලට බෙදීමත් ද සිදු වී ඇත. මෙම කුල අතර ඉතාමත් කැපීපෙනෙන ධුරාවලියක් ඇතිවී ඇති බව පෙනෙයි. මෙම ධූරාවලියට අනුව නර්තකයන්ට ලැබී ඇත්තේ තරමක් පහත් ස්ථානයකි. මෙය උඩරට නර්තන ඉතිහාසයේ දේශපාලනය ඉතා දැඩිව බලපෑම් කළ කාරණාවක් ලෙස හැඳින්විය හැකිය. රාජකාරි ක්‍රමය, විහාරගම්, දේවාලගම් ක්‍රමය නිසාවෙන් දළදා පෙරහැරේ නැටුම් දැක්වීම බොහෝ සාම්ප්‍රදායික නර්තකයන්ට අතීතයේ අනිවාර්යය කාර්යයක් ව තිබුණි. අතීත දළදා පෙරෙහැරේ නර්තකයන්ට ප්‍රභූන්ට සාපේක්ෂව අඩු සැලකිලි ලැබුණු බව පැහැදිලිය. වර්තමාන දළදා පෙරහැරේ මේ තත්ත්වය මුළුමනින් ම දක්නට නැතැයි අපට කිව නොහැකිය. අතීතයේ දළදා පෙරෙහැරේ රාජ්‍යයේ සැබෑ පරිපාලන ව්‍යුහය නියෝජනය වුව ද අද පවතින දළදා පෙරහැරේ නියෝජනය වන්නේ සංස්කෘතිකමය වශයෙන් වැදගත්වන පරිපාලන ව්‍යුහයකි. එහෙත් මෙම සංස්කෘතිකමය පරිපාලනයට බලයක් නැතැයි මින් නො කියැවේ. දළදා මාළිගාව, දේවාල, විහාර ආශ්‍රිතව ඉහත දැක් වූ පරිපාලනයේ දී නිළමේවරුන්ගේ, විහාරාධිපතිවරුන්ගේ, කපුරාළලාගේ බලය අදටත් පවතියි. අදටත් ඇතැම් අවස්ථාවල නර්තකයන් පහත්කොට සලකනු ලබන අවස්ථා අපට හමු වේ. එහෙත් අද වන විට උඩරට නර්තනය සාම්ප්‍රදායික පවුල්වලට පමණක් සීමා වී නොමැත. සාම්ප්‍රදායික පවුල්වලට අයත් නොවන විවිධ තරාතිරම්වල පිරිස් උඩරට නර්තනය හැදෑරීමටත්, ප්‍රායෝගිකව නර්තනයේ යෙදීමටත් යොමු වී ඇත. මේ තත්ත්වය හමුවේ අද අපට හමුවන උඩරට නර්තකයකු අනිවාර්යෙන් ම සාම්ප්‍රදායික නර්තන පවුලක් නියෝජනය කරන්නකු ලෙස හඳුනා ගත නොහැකි ය. මේ නිසා දළදා පෙරහැරේ අද හමුවන නර්තන ශිල්පීහු සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන පවුල් දෙකොටස ම නියෝජනය කරති. අද වන විට රාජකාරි

ක්‍රමයෙහි පදනම වූ **"වැඩවසම් ක්‍රමය"** බිඳ වැටී ඇත. මෙය සිදු වූයේ 1815 ශ්‍රී ලංකාවට බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් බවට පත්වීමෙන් පසුව බව පැහැදිලි ය. එතෙක් තිබූ භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේ ආර්ථික ක්‍රමය වෙනුවට මුදල් හුවමාරු කිරීමේ ආර්ථික ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. අද වන විට ශ්‍රී ලංකාව මෙම මුදල් හුවමාරු ආර්ථික ක්‍රමයේ වර්ධිත අවස්ථාවකට පැමිණ ඇත. මෙවැනි තත්ත්වයක් තුළ සාම්ප්‍රදායික පවුල්වල තරුණ නර්තන ශිල්පීන්ගෙන් තමාගේ රාජකාරී කාර්යයක් ලෙස සලසා දළදා මාළිගාවට, දේවාලවලට, විහාරවලට සේවය සිදුකිරීමක් බලාපොරොත්තු විය නොහැකි ය. බොහෝ විට ඔවුන් එම සේවාව සිදු කරන්නේ දළදා මාළිගාව, දේවාල, විහාර කෙරෙහි ම තමා තුළ උපන් භක්තිය, බැඳීම නිසාවෙනි. වර්තමානයේ දළදා පෙරහැරේ නර්තනයේ යෙදීම වෙනුවෙන් නර්තකයන්ට යම් වේතනයක් ලබාදෙන බව සැබෑ ය. එහෙත් එයට වඩා ඔවුන් දළදා පෙරහැරේ නර්තනය සඳහා පැමිණෙන්නේ ඔවුන් තුළ ඇති භක්තිය, බැඳීම, පවුලේ උරුමය රැක ගැනීම වැනි හැඟීම නිසාවෙනි. අද සාම්ප්‍රදායික නොවන පවුල්වල නර්තකයන් ද දළදා පෙරහැරට එක්වන්නේ එය තමාට ලැබෙන ගෞරවයක් ලෙස සලකා ය. එහෙත් පෙරහැර පරිපාලනයට සම්බන්ධ වන ඇතැම් ප්‍රභූන් නර්තකයන්ට වැඩවසම් යුගයේ දැක් වූ සැලකිලි වර්තමානයේදී ක්‍රියාවට නැංවීමට උත්සාහ කළ අවස්ථා වාර්තා වේ. එච්.එල්. සෙනෙවිරත්න දක්වන පරිදි වරක් පෙරහැරේදී බස්නායක නිළමේ කෙනෙකුට නොවැඳීමේ හේතුව නිසා, නර්තකයන් පිරිසකට දඬුවමක් ලෙස පෙරහැරේ නැටීම සම්පූර්ණයෙන් වැළැක්වීමට උත්සාහ කරනු ලැබ ඇත.[8]

උඩරට නර්තනයේ දේශපාලනය පිළිබඳව සාකච්ඡා කිරීමේදී හමුවන තවත් වැදගත් කරුණක් වෙතටයි මීළඟට අපගේ අවධානය යොමුවන්නේ. ඒ උඩරට නර්තනයේ කාන්තා නියෝජනය පිළිබඳව යි. උඩරට නර්තනයේ කාන්තාවගේ භූමිකාව පිළිබඳව සාකච්ඡා කිරීමේදී මානව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක දෘෂ්ටීන්ට හසුවන කරුණු කාරණා රැසක් ඇත. එහෙත් මෙහිදී අපගේ අවධානයට ලක් වන්නේ උඩරට නර්තනයේ කාන්තාවන්ගේ භූමිකාව දළදා පෙරහැර ආශ්‍රයෙන් විග්‍රහ කිරීමටයි. අතීතයේදී උඩරට

නර්තනයට කාන්තාවන්ගේ දායකත්වය ලබාගෙන ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි. මෙයට හේතුව වන්නට ඇත්තේ උඩරට නර්තනය ශාන්තිකර්ම ආශ්‍රයේ වර්ධනය වූ නර්තන ක්‍රමයක් වූ බැවින් කාන්තාවන් බොහෝ විට ශාන්තිකර්ම සඳහා අඩුවෙන් සම්බන්ධ කර ගැනීම යැයි සිතිය හැකි ය. අතීත ගැමි පිළිගැනීම් විශ්වාසයන්ට අනුව කාන්තාව අපවිත්‍ර අයෙකු ලෙස සලකනු ලැබ ඇති බව පෙනෙයි. මේ හා සම්බන්ධව සාකච්ඡා කිරීමේදී හමුවන සංකල්පයක් වන්නේ "කිල්ල"[9] පිළිබඳව ඇති විශ්වාසය යි. අද වන විට දළදා පෙරහැරේ කාන්තා නර්තනයන් දැක ගත හැකි වන්නේ පත්තිනි දේවාල පෙරහැරේ පමණි.

මහනුවර ඇසළ පෙරහැරේ දළදා මාළිගාවේ පෙරහැරට කාන්තාවන් සම්බන්ධ වන්නේ නැතැයි යන විශ්වාසය අද ව්‍යාප්තව පවතී. එහෙත් ඉතිහාසය දෙස බැලීමේදී අතීත දළදා පෙරහැරවලට කාන්තාවන් සම්බන්ධ වූ අවස්ථා හඳුනා ගත හැකි ය. පොළොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු රජු පැවැත්වූ දළදා පෙරහැර පිළිබඳව විස්තර කෙරෙන අප ඉහත දැක්වූ මහාවංශ පාඨයේ .... රූමත් නළඟනෝ ද නැටුම් ගැයුම් ආදියෙන් යුක්තව ...[10] ගමන් කළ බව කියැවුණි. අතීතයේ දී දේවාල පෙරහැරවලින් පමණක් සැදුම්ලත් මහනුවර ඇසළ පෙරහැරට දළදා පෙරහැර එක් කරන ලද්දේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු යැයි කියැවේ. දළදා පෙරහැර එක්වීමට පෙර පැවැත්වුණු දේවාල පෙරහැර සඳහා ද කාන්තා නර්තන ශිල්පීන්ගේ දායකත්වය ලැබී ඇති බව නිගමනය කිරීම සඳහා සාධක රොබට් නොක්ස්ගේ වාර්තාවලින් හමුවේ. ඔහු දක්වන පරිදි දෙවැනි රාජසිංහ රජු දවස පැවැත්වුණු ඇසළ පෙරහැරේ කළගෙඩි ක්‍රීඩා කරන නළඟනන් ද, තිදෙනා බැගින් අති'නත අල්ලාගත් ස්ත්‍රීන් ද සහභාගී වී ඇත. මීට අමතරව දේවාල සේවයේ නියුතු විවිධ කුලවලට අයත් කාන්තාවන් ද, දහස් ගණනක් වංශවත් ස්ත්‍රීන් ද, ආලත්ති අම්මාවරුන්[11] දෙදෙනෙකු ද එම පෙරහැරේ ගමන් ගත් බව නොක්ස් සඳහන් කරයි.

මහනුවර දළදා පෙරහැරේ කාන්තා දායකත්වය පිළිබඳව ඉහත අප

දැක්වූ කරුණු විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන කරුණු කීපයක් ඇත.

- පොළොන්නරු යුගයේ ඇතැම් රජවරුන් පැවැත්වූ දළදා පෙරහැරවල කාන්තාවන් නර්තනයේ යෙදී ඇත.
- අතීතයේ මහනුවර දේවාලවල සහභාගීත්වයෙන් පමණක් පැවැත්වුණු ඇසළ පෙරහැරේ කාන්තාවන් නර්තනයේ යෙදී ඇත.

වර්තමාන මහනුවර ඇසළ පෙරහැරේ තත්වය ඉහත කරුණු හා සංසන්දනාත්මකව බැලීමේදී අපට පෙනී යන්නේ වර්තමාන ඇසළ පෙරහැරේ දළදා මාළිගාවට අයත් පෙරහැරේ කාන්තාවන් නර්තනයේ යෙදීමක් දැකගත නොහැකි බවයි. එහි කාන්තා නියෝජනයක්වත් දකින්නට නොහැකි ය. වර්තමාන දේවාල පෙරහැර සලකා බැලීමේ දී පෙනෙන්නේ පත්තිනි දේවාලයේ හැර අනෙක් දේවාල පෙරහැරවල (නාථ, කතරගම, විෂ්ණු) කාන්තා නර්තනයන් නොමැති බවයි. ඉහත කරුණු පිළිබඳව මාගේ විග්‍රහය මෙසේ ය.

අප දන්නා පරිදි පොළොන්නරු යුගයේදී ඉතා ප්‍රබල ලෙස ශ්‍රී ලාංකික සංස්කෘතියට හින්දු ආගමික බලපෑම් එල්ල වී ඇත. එම වකවානුවට අයත් කැටයම්, මූර්ති හා වාස්තු විද්‍යාත්මක නිර්මාණ ආශ්‍රයෙන් එය මනාව පැහැදිලි කොට ගත හැකිය. මෙසේ ප්‍රබලව ලැබුණු හින්දු බලපෑම එම වකවානුවේ පැවැත්වුණු දළදා පෙරහැරටත් බලපෑම් කරන්නට ඇත. දළදා පෙරහැරට කාන්තා නර්තන එකතුවීම එහි ප්‍රතිඵලයක් විය හැකි ය. මෙය සනාථ කිරීමට සාධකයක් අප ඉහත දැක්වූ මහාවංශ පාඨයෙන්ම සපයා ගත හැකිය. එයට අනුව පොළොන්නරුවේ මහා පරාක්‍රමබාහු රජු පැවැත්වූ දළදා පෙරහැරේ **"මාදංග බෙර ගත් ජනයා"**[12] ගමන් කොට ඇත. මෘදංග යනු ඉන්දියානු සංගීත භාණ්ඩයකි. එය දකුණු ඉන්දියානු නර්තනවලදීත් භාවිත කෙරේ. මෘදංගය දේශීය සාම්ප්‍රදායික නර්තනයන් සඳහා භාවිත වී නොමැත. මේ අනුව පොළොන්නරු යුගයේ දළදා පෙරහැරේ දක්නට ලැබුණු කාන්තා

නර්තනයන් දකුණු ඉන්දියානු සම්භවයක් සහිත නර්තන අංගයන් වීමට බොහෝ ඉඩ ඇත. හින්දු ආගමේදී කාන්තාවට හා කාන්තා නර්තනයන්ට විශේෂ තැනක් හිමිවේ. දෙවියන්ට පූජෝපහාර දැක්වීමේ මාර්ගයක් ලෙස නර්තනයන්, විශේෂයෙන් ම කාන්තාවන්[13] විසින් දක්වන ලද නර්තනයන් සලකන ලදී. එහෙත් කාන්තා නර්තනය පිළිබඳ මෙවැනි පිළිගැනීමක් හෝ විශ්වාසයක් සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ නැත.

මහනුවර ඇසළ පෙරහැරේ මුල් කාලයේ දේවාලවල පෙරහැර සඳහා කාන්තාවන් සම්බන්ධ වන්නට ඇත්තේ ද මෙවැනි පසුබිමක් තුළින් ම යයි අපට සැක කළ හැකි ය. මහනුවර යුගයේදීත් ඒ ආශ්‍රිත කාල වකවානුවේදීත් ශ්‍රී ලාංකික සංස්කෘතියට හින්දු ආගමික, සංස්කෘතික බලපෑම ප්‍රබලව ලැබුණු බව නොරහසකි. මේ තත්ත්වය යටතේ දේවාලවලට හා දේවාලවල පෙරහැරවලට කාන්තාවන්ගේ හා නර්තන ශිල්පිනියන්ගේ දායකත්වය ලබාගන්නට ඇත.

මහනුවර දළදා පෙරහැර දේවාල ආශ්‍රයේ පැවති ඇසළ පෙරහැර හා සම්බන්ධ වන කාලය වන විට ඉහත දැක්වූ තත්වය තරමක් වෙනස් වන්නට ඇත. හින්දු ආගමික ආචාර ධර්මවලට වඩා බෞද්ධ නොඑසේ නම් සිංහල බෞද්ධ ආචාරධර්මවලට වැඩි තැනක් ලබාදීමට පාලකයන් උත්සාහ ගත් බව පෙනෙයි. දේවාල පෙරහැර හා දළදා පෙරහැර එකතු කිරීමේ කාර්යයේදී රජුගේ උපදේශක වශයෙන් වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් කටයුතු කිරීම ම මෙයට නිදසුනකි. දෙවියන්ට පූජෝපහාර දැක්වීමේ දී නර්තන ශිල්පිනියන් විශේෂ කාර්යයක් සිදු කරනවා ය යන්න හින්දු ආගමික විශ්වාසය බව අපි ඉහත දී සඳහන් කළෙමු. එහෙත් සිංහල බෞද්ධාගමික හරයන් තුළ දෙවියන් වන්දනාමාන කිරීමක් නැත. එසේම දෙවියන්ට හෝ බුදුන්ට පූජෝපහාර දැක්වීම, කාන්තාවන්ට නර්තනය තුළින් කළ හැකි බවට විශ්වාසයක් ද සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ නැත. මේ හේතුව නිසා මහනුවර දළදා පෙරහැරෙන් කාන්තා නර්තනයන් ඇත් වන්නට ඇත.[14] මෙය හේතු කාරණා දෙකක් නිසාවෙන් සිදුවන්නට ඇත.

1. කාන්තා නර්තනයන්ට මහනුවර දළදා පෙරහැරේ කෘත්‍යයක් නොතිබීම.
2. කාන්තාවන්ගේ දායකත්වය ප්‍රසිද්ධියේ පැවැත්වෙන බෞද්ධාගමික උත්සවයකට ලබාගැනීමට සමාජයේ බලවතුන්ගේ තිබුණු අකමැත්ත

දළදා මාළිගාවේ වර්තමාන පරිපාලනය සබරගමු ප්‍රදේශයට නෑකම් කියන්නකි. මේ හේතුව නිසා වර්තමානයේ දළදා පෙරහැරේ නර්තනාංගවලට සබරගමු නැටුම් එකතුවීමක් දැකගත හැකිය. දේශපාලනය තුළ නර්තනය හැඩ ගැසෙන්නේ කුමන ආකාරයට දැයි අවබෝධ කර ගැනීමට මෙය තවත් නිදසුනකි.

**නර්තකයන්ගේ දේශපාලනය**

මීළඟට අපගේ අවධානය යොමු වන්නේ නර්තන ශිල්පීන් තුළ දේශපාලනය ක්‍රියාත්මක වන්නේ කුමන ආකාරයෙන්දැ යි සොයා බැලීමට ය.

සාම්ප්‍රදායිකව උඩරට නර්තනය නිශ්චිත වූ කුල කීපයකට පමණක් සීමා වී තිබී ඇත. එම වකවානුවේ සමාජයේ විවිධ පවුල්වලට නිශ්චිත කාර්යභාරයන් පැවරී තිබී ඇත. උදාහරණයක් ලෙස X ගේ මූලිකත්වයෙන් යුත් පවුල P නමැති විහාරයේ තේවා වාදන කටයුතු භාරව සිටින අතර Y ගේ මූලිකත්වයෙන් යුත් පවුල ,, නමැති දේවාලයේ නර්තන දැක්වීම භාරව සිටී. මෙසේ විවිධ වූ පවුල්වලට අයත් රාජකාරියක් ලෙස පැවති ක්‍රියාවන් කල්යත්ම **"පාරම්පරික රාජකාරියක්"** බවට පත් විය. මෙය සිදුවී ඇත්තේ පියාගෙන් පසුව පියා කළ රාජකාරිය ම පුත්‍රයා සිදු කිරීමත් ඔහුගෙන් පසුව එම රාජකාරිය ම ඔහුගේ පුත්‍රයා සිදු කිරීමත් නිසාවෙනි. මෙය රාජකාරි ක්‍රමය තුළ දැක ගත හැකි සුවිශේෂී ලක්ෂණයකි. P නමැති විහාරයේ තේවා වාදනය කළ X නමැත්තාගේ වියෝවෙන් පසු X ගේ පුත් A නමැත්තා P විහාරයේ

තේවා වාදනය භාර ගැනීමත් A ගේ වියෝවෙන් පසු A ගේ පුත් L O P විහාරයේ තේවා වාදනය භාරවීමත් මෙහිදී සිදුවී ඇත. එය පවුල් පදනම් කොට ගෙන පැවත ආ රාජකාරියක් හෙයින් එය පාරම්පරික රාජකාරියක් ලෙස සමාජය විසින් සලකන ලද බව පෙනෙයි.

අතීත දළදා පෙරහැරේත් විවිධ කාර්යයන් ඉටුකිරීම සඳහා විවිධ පවුල් පත්කොට තිබුණු අතර එම රාජකාරියන් ද පාරම්පරිකව පියාගෙන් පුතාට සම්ප්‍රේෂණය වී ඇත. දළදා පෙරහැරේ නර්තන කාර්යයද මෙසේ පාරම්පරිකව සිදු වී ඇත. නර්තන ශිල්පීන්ගේ පවුල්වලට හා පාර්ම්පරාවලට දළදා පෙරහැරේ විවිධ කාර්යයන් පැවරී තිබිණි.

මෙහි වර්තමාන තත්වය පිළිබඳව අප මීළඟට සලකා බලමු. අප ඉහත සාකච්ඡා කළ දළදා පෙරහැරේ විවිධ කාර්යයන් නිශ්චිත නර්තන පවුල්, පරම්පරා විසින් සිදුකරනු ලැබීමේ තත්ත්වය අදටත් ඇතැම් අවස්ථාවලදී දකගත හැකි ය. අද වන විට වැඩවසම් සමාජ ක්‍රමය බිඳ වැටී අවුරුදු සියයකටත් වඩා ගතවී ඇත. එහෙත් දළදා පෙරහැරේ ඇතැම් කාර්යයන් සඳහා පාරම්පරික නර්තන පවුල්වල ශිල්පීන් ම සහභාගී වීමේ රහස කුමක්දැයි දැන ගනු වටියි. මෙය අප ඉහත සඳහන් කළ කරුණක් හා බැඳේ. එනම් බොහෝවිට සාම්ප්‍රදායික පවුල්වල නර්තකයන් අද දළදා පෙරහැරේ නර්තන දක්වන්නේ ඔවුන්ට ලැබෙන සුළු වේතනයට වඩා දළදා පෙරහැරේ නර්තනය සඳහා ඔවුන් තුළ ඇති භක්තිය, බැඳීම, පවුලේ උරුමය රැක ගැනීම වැනි හැඟීම් නිසාවෙනි. නර්තකයාගේ දේශපාලනය පිළිබඳව සාකච්ඡා කිරීමේදී ඉහත දක්වූ පවුලේ උරුමය රැක ගැනීම පිළිබඳ හැඟීම ඉතාම වැදගත් බව පෙනෙයි. අදටත් ඇතැම් සම්ප්‍රදායික නර්තන ශිල්පීන් දළදා පෙරහැරේ නර්තනයේ යෙදෙන්නේ තම පවුල, පරම්පරාව නියෝජනය කිරීම සඳහා ය. ඒ තුළින් තම උරුමය රැක ගැනීම වෙනුවෙන් ඔවුහු පෙනී සිටිති. උදාහරණයක් සලකා බලමු. දළදා පෙරහැරේ දියවඩන නිළමේ කැඳවාගෙන යන්නේ වෙස් කැටුම් කණ්ඩායමක් වෙස් නැටුම් දක්වමිනි. ඔවුහු නිතරම දෙපෙල සෑදී නර්තනයේ යෙදෙති. බාහිරින් එය එක් නර්තන

කණ්ඩායමක් ලෙස පෙනනු ද අභ්‍යන්තර වශයෙන් එහි නර්තන කණ්ඩායම් දෙකක් ඇත. දෙපෙල සැදී නර්තනයේ යෙදෙන්නේ එම නර්තන කණ්ඩායම් දෙකයි. මෙම දෙපෙළ නොහොත් කණ්ඩායම් දෙක නියෝජනය කරන්නේ සම්ප්‍රදායික නර්තන පවුල් දෙකකි. දියවඩන නිළමේ ඉදිරියේ නර්තනයේ යෙදීම ඔවුහු තම උරුමයක් ලෙස සලකති. ඒ නිසාවෙන් ඔවුහු නොකඩවා දළදා පෙරහැරට සහභාගි වෙති. මහනුවර දළදා පෙරහැරේ සාම්ප්‍රදායික ස්වරූපය අඛණ්ඩව පැවැත්මට සාම්ප්‍රදායික උරුමය පිළිබඳ මෙම අදහස පිටිවහල් වන බව පෙනේ. පාරම්පරික නර්තන පවුල් දෙපලක් පිළිබඳව අප ඉහතදී සඳහන් කළෙමු. මෙම දෙපලේ නර්තන ශිල්පීන් ස්ථානගතවීම පිළිබඳව නර්තකයන්ගේ දේශපාලනයක් ඇත. නර්තකයන් පෙළෙහි ස්ථානගතවීම අත්තනෝමතිකව සිදුවන්නක් නොවේ. එකම පරම්පරාවකට අයිති වුවත් තමන්ට අභිමත තැන්වලට ගොස් ස්ථානගතවීමට නර්තකයන්ට ඉඩ නොලැබේ. අනිවාර්යයෙන් ම මෙම පෙළ සැදීම සිදුවන්නේ ධුරවලියකට අනුව ය. බොහෝවිට මෙම පෙළ ගැසීම සිදු කරන්නේ වයස සහ අත්දැකීම් නිර්ණායකයක් කොට ගෙනය.[15] පෙළෙහි මුලින්ම සිට ගන්නේ පරිණතම නැතහොත් වයසින් වැඩිමහල්ම නර්තන ශිල්පියා ය. පෙළෙහි මුලින්ම නැටීම **"මුල නැටීම"** ලෙසින් ව්‍යවහාර වේ. මේ අනුව අප ඉහත සඳහන් කළ දෙපෙළෙහිම මුල නටන්නේ එම පරම්පරා දෙකෙහි පරිණතම නැතහොත් වයසින් වැඩිමහල්ම දෙදෙනාය. දළදා පෙරහැරේ මෙසේ පාරම්පරික නර්තන ශිල්පීන්ගේ ප්‍රමුඛත්වයෙන් කෙරෙන නර්තන අංගයන්හිදී මුල නැටීමේ අවස්ථාව පරම්පරාවෙන් පිට අයෙකුට ලබා දෙනු නොලැබේ. මුල නටන නර්තන ශිල්පියා වෙහෙසට පත්වූ අවස්ථාවන්හිදී එම පෙළෙහි දෙවැනියට සිටින්නාටත් ඉන්පසු තුන්වැන්නාටත් ආදී වශයෙන් මුල නැටීමේ අවස්ථාව ලැබේ. ඇතැම්විට තම පරපුරේ මීළඟ මුල නටන්නා එම කාර්යය සඳහා පුහුණු කිරීමට ද මෙය අවස්ථාවක් කරගැනෙයි. වර්තමානයේ ඇතැම්විට මෙම පාරම්පරික, සම්ප්‍රදායික නර්තන කණ්ඩායම්වලට පාරම්පරික නොවන, සම්ප්‍රදායික නොවන නර්තකයන් ද සම්බන්ධ වී සිටින අවස්ථා දැක ගත හැකි ය. එහෙත් එවැනි නර්තන ශිල්පීන්ට මුල නැටීමට අවස්ථාවක් නම් මෙම කණ්ඩායම් තුළ නොලැබේ.

නර්තකයන්ගේ දේශපාලනය පිළිබඳව සාකච්ඡා කිරීමේදී අපට පෙනීගිය කරුණක් වූයේ වැඩවසම් ක්‍රමය පැවති සමයේ තිබුණු ගති ලක්ෂණ තවමත් නර්තන කලාව ආශ්‍රිතව ඉතිරි වී ඇති බවයි. මේ පිළිබඳව විවිධ විවේචන ද අප සතුව ඇත. එහෙත් වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ ඉතිරි වී තිබීම හේතුවෙන් නර්තනය වැනි සාම්ප්‍රදායික කලාවන්ට යහපතක් ද සිදුවී ඇති බව සඳහන් කළ යුතු ය. උඩරට නර්තනය පිළිබඳ **"දැනුම"** යනු සමාජ සම්මත පොදු දැනුමක් නොවේ. සමාජයේ ඕනෑම පුද්ගලයෙකුට විවෘත, ළඟාවිය හැකි ආකාරයේ දැනුම් කොටසක් ද උඩරට නර්තනය සතු වුවත් උඩරට නර්තනය පිළිබඳ සියලුම දැනුම සාමාන්‍යයෙන් ඕනෑම පුද්ගලයෙකුට ලබා ගැනීම අපහසුය.

එය එසේ වීමට විවිධ හේතු සාධක ඇත. නර්තනය යනු ප්‍රායෝගිකව කළ යුතු ප්‍රසංග කලා මාධ්‍යයකි. නර්තනය හැදෑරීම හා එහි ප්‍රාගුණ්‍යය ලැබීම සියලු දෙනාට එක හා සමානව කළ නොහැකි ය. උඩරට නර්තනය ශාන්තිකර්ම ආශ්‍රයෙන් වර්ධනය වූවක් බැවින් එය හැදෑරීම හා ප්‍රගුණ කිරීම සංකීර්ණ ය. එබැවින් එවැනි විශේෂ ප්‍රාගුණ්‍යයක් ලැබිය හැක්කේ සීමිත පිරිසකය. උඩරට නර්තනය පිළිබඳ සියලු දැනුම විවෘත නොවීමට තවත් හේතුවක් වන්නේ ඇතැම් ගුරුකුල පරම්පරාවන් එම දැනුම අවශ්‍ය අවස්ථාවකදී පාවිච්චි කිරීමට හස්තසාර ලෙස තබා ගැනීමයි. එසේම උඩරට නර්තනය ශාන්තිකර්ම ආශ්‍රයේ වර්ධනය වූවක් නිසාවෙන් එයට කාන්තා දායකත්වය ලැබී ඇත්තේ ඉතාම අඩුවෙන් බව අපි සඳහන් කළෙමු. මේ හේතුව නිසා උඩරට නර්තන ක්ෂේත්‍රයේ ඇතැම් දැනුම් සම්භාරයන්ට ළඟාවීමට කාන්තාවන්ට නොහැකිවී ඇත. මෙයද උඩරට නර්තනය සමාජයට සම්පූර්ණයෙන්ම විවෘත නොවීමට හේතුවකි. මීට අමතරව වැඩවසම් යුගයේදීත් ඊට තරමක් පසුකාලයේදීත් ඉහළ යැයි සම්මත කුලවල පිරිස් උඩරට නර්තනය පිළිබඳ දැනුම තමන් නූගතයුතු දැනුමක් ලෙස සැලකීමද උඩරට නර්තනය පිළිබඳ සියලු දැනුම සමාජගත නොවීමට හේතුවක් වී ඇත. උඩරට නර්තනය පිළිබඳ සාම්ප්‍රදායික දැනුම අද දක්වාම පැමිණ ඇත්තේ සාම්ප්‍රදායික පාරම්පරික නර්තන පවුල් ආශ්‍රයේය. මේ අනුව අපට

නර්තකයන්ගේ දේශපාලනය උඩරට නර්තනය කුමන ආකාරයට බලපාන්නේදැයි අවබෝධ කොට ගත හැකිය.

සමාජයේ පවතින කිසිම කලාවකට එම සමාජයේ පවතින දේශපාලනයෙන් මිදිය නොහැකිය. උඩරට නර්තනයේ දේශපාලනය දළදා පෙරහැර ආශ්‍රයෙන් විග්‍රහ කිරීමේදී එය මැනවින් පැහැදිලි වේ.

## අන්ත්‍ය සටහන් හා ආශ්‍රිත ග්‍රන්ථ


1. උඩරට නර්තනය යනුවෙන් හැඳින්වෙන නර්තන ක්‍රමය පිළිබඳ හැඳින්වීමක් සඳහා බලන්න. දිසානායක, මුදියන්සේ (1993) **සිංහල නර්තන කලාව** , කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ 40 පිටුව
   මන්තිලක, සුදේශ් (2004) **වෙස් නැටුම පිළිබඳ සංඥාවේදාත්මක අධ්‍යයනයක්** (අමුද්‍රිත ශාස්ත්‍රවේදී උපාධි නිබන්ධනය) ලලිත කලා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය 6 පිටුව)
2. Seneviratne H.L. (1963) **The Asala Perahara in Kandy** . In The Ceylon Journal of Historical and Social Studies. Vol. 6 July - December 1963 No. 2. Editor Ralph Pieris .The Ceylon Journal of Historical and Social Studies Publication board; Peradeniya P. 177
3. ධම්මාලෝක හිමි , වරකාවේ (1992) **ඇසළ පෙරහැර පෙළගැසුනු හැටි**; ලිපිය මහනුවර සැඟවුණු තොරතුරු, සංස්. ගොඩගම මංගල හිමි, මහනුවර: වාරියපොල ශ්‍රී සුමංගල විදුහල, 59 පිටුව.
4. උඩරට නර්තනයේදී කාන්තා දායකත්වයක් ලබා නොගැනීම පිළිබඳව ඉදිරියේ දී මෙම ලිපියේ සාකච්ඡාවට ගැනේ.
5. ධම්මලෝක හිමි, වරකාවේ (1992) 59 පිටුව
6. Coomaraswamy , A.K. (1956) **Mediaeval Sinhalese Art,** 2nd Edn . New York: Pantheon Books' PP.21 -22; Pieris, Ralph (1956)

**Sinhalese Social Orginization** - The Kandyan Period, Colombo. University Ceylon University Press Board. P. 180

7. Pieris, Ralph (1956) P. 44, 60-70, 73-77

8. Seneviratne, H. L. (1963) P. 179

9. දේශීය සමාජයේ දක්නට ලැබෙන කිල්ල සංකල්පය ඉතාමත් පුළුල් එකකි. මෙය මානව විද්‍යාත්මක අධ්‍යයනයක් සඳහා ඉතා වැදගත් සංකල්පයකි. එය පුද්ගල පවිත්‍රත්වය හා බද්ධ වූවකි.

10. ධම්මලෝක හිමි, වරකාවේ (1992) 59 පිටුව

11. ආලත්ති අම්මාවරුන් යනු විහාර හා දේවාල සේවාවට කැපවී සිටින කාන්තාවන් කොටසකි. ඔවුන්ගේ සේවාව වෙනුවෙන් ඔවුන්ට විහාරගම් දේවාලගම් ආදිය ලබා දී ඇත. රන්දෝලි පෙරහැරේ රන්දෝලි පිටුපසින් ගමන් කිරිම මොවුන්ගේ එක් කර්යයක් වේ. මීට අමතරව ඇසළ පෙරහැර අවසානයේ විෂ්ණු දේවාලයේදී පැවැත්වෙන වලියක් මංගල්ලය ශාන්තිකර්මයේ ආවැඩීම ද මොවුන්ට පැවරී තිබුණු රාජකාරියකි. අදටත් මෙම කාර්යයේ යෙදෙන ආලත්ති අම්මාවරුන් දැකගත හැකිය.

12. ධම්මාලෝක හිමි, වරකාවේ (1992) 59 පිටුව

13. හින්දු ආගමික ස්ථානවල දෙවියන් සඳහා කැපවූ කාන්තාවන් ජීවත් වී ඇත. ඔවුහු දේවදාසීන් නම් වෙති. දෙවියන් උදෙසා නර්තන දැක්වීම ද ඔවුන්ගේ එක් ප්‍රධාන කාර්ය භාරයකි.

14. මෙම ඇත්වීම් මහනුවර යුගයේදීම සිදුවූවක් යැයි මම නොකියමි. එය ඊට පෙර සිදුවූවක් විය හැකිය. කෙසේ වෙතත් කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමය අවසන් වන විට මෙම ඇත්වීම් සිදුවී හමාරය. මෙය විද්‍යාර්ථීන්ගේ පර්යේෂණයට ලක්විය යුත්තක් බව පෙනෙයි.

15. මෙසේ ධූරාවලියකට අනුව නර්තකයන් පෙළ ගැසීම දළදා පෙරහැරට පමණක් සුවිශේෂී වූවක් නොවේ. මෙය සාම්ප්‍රදායික නර්තන රඟ දැක්වෙන ඕනෑම අවස්ථාවක පාහේ දැකිය හැකිය.

# දළදා සංස්කෘතිය දළදා මන්දිර අලංකාර කිරීමේ ලාංකික සම්ප්‍රදාය

**මහාචාර්ය මහින්ද සෝමතිලක**
ඉතිහාස අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දළදා වහන්සේගේ භාරකාරත්වය ලබා ගැනීම සඳහා ඉන්දියාවේ කාලිංග දේශයේ සිටි ගුහාසීව නම් රජු සිය සතුරන් සමඟ සටන් කළ නමුත් ඉන් පරාජය වූ ඔහු[1] ආරක්ෂාව පතා එය ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද බව **දාඨාවංසය**, **දළදා සිරිත** සහ **දළදා පූජාවලිය** වැනි ග්‍රන්ථවල සඳහන් වී තිබේ.[2] ගුහාසීව රජුගේ උපදෙස් මත බ්‍රාහ්මණ වෙස්ගත් දන්ත සහ හේමමාලා නම් දෙදෙනෙකු ඉන්දියාවේ තාම්‍රලිප්ති තොටුපළින් නැව්නැග කීර්ති ශ්‍රී මේඝවණ්ණ (ක්‍රි.ව. 301 - 328) රජුගේ කාලයෙහිදී ලංකාපට්නයට ගොඩබැසීමෙන් මෙසේ දළදා වහන්සේ මෙරටට රැගෙන ආ බව ඒවායෙහි සඳහන් වේ.[3] ඔවුහු අනුරාධපුරයට පැමිණ මේඝගිරි විහාරයෙහි වාසය කරන විට[4] මේඝවණ්ණ රජු එහි විහාරයට ගොස් දළදා වහන්සේ තම රජ මාළිගාවට වැඩමවා, පසුව නගර මධ්‍යයේ පිහිටි විහාරයක තැන්පත් කරන ලද බව කියැවේ.[5] දේවානම්පියතිස්ස රජු (ක්‍රි.පූ. 250 - 210) විසින් ගොඩනැංවූ, මේඝවණ්ණ රජුගේ කාලය වන විටදීත් හොඳින් ආරක්ෂා වී පැවති ධම්මචක්ක නම් විහාරයෙහි වජ්‍රමය කරඬුවක් තුළ මෙසේ දළදා වහන්සේ තැන්පත් කළ බවත් එතැන් සිට මෙම ගොඩනැගිල්ල දළදා මාළිගය හෙවත් දාඨා ධාතුඝර හෝ දළදාගේ යන නමින් ප්‍රසිද්ධියට පත්වූ බවත් **චූලවංසයෙහි** සඳහන් වී තිබේ.[6]

මහානාම රජුගේ කාලයෙහිදී (ක්‍රි.ව. 406 - 428) අනුරාධපුරයට පැමිණි චීන ජාතික ෆාහියන් තෙරුන් වහන්සේ මේ දළදා මන්දිරය සහ එහි පැවති පුදපූජා පිළිබඳ අගනා විස්තරයක් ඉදිරිපත් කොට ඇති නමුත්[7] එම සියවසෙහිදීම විසූ ධාතුසේන රජුගේ කාලයේදී (455 - 473) මෙම දළදා මැඳුර

නටබුන්ව පැවති බැවින් එය ප්‍රතිසංස්කරණය කොට අගනා කරඬුවක් මේ රජු විසින් ඊට පූජා කරන ලද බව සඳහන් වී තිබේ.[8] මීට සියවසකට පමණ පසු කාලයක විසූ පළමුවැනි අග්‍රාබෝධි රජු (571 - 604) විසින් වටිනා මාණික්‍යවලින් දළදා මැදුර අලංකාර කොට ඊට ස්වර්ණමය ධාතු කරඬුවක් පූජාකරන ලද බව **චූලවංසයෙහි** සඳහන් වේ.[9] එතැන් සිට චෝළයින් විසින් විනාශ කරන ලද අනුරාධපුර නගර මාධ්‍යයේ පැවති දළදා මැදුර ක්‍රි.ව. දහවැනි සියවසේ මැද භාගයෙහිදී විසූ හතරවැනි මිහිඳු රජුගේ කාලයෙහිදී (956 - 972) ප්‍රතිසංස්කරණය කිරීමේ සිද්ධිය ගැන වාර්තා කරන තුරු[10] දළදා මැදුර ගැන තබා යටත් පිරිසෙයින් දළදා වහන්සේ ගැන පවා ලාංකික වංසකථාවල තොරතුරු කිසිවක් සඳහන් වන බව නොපෙනේ.

අනුරාධපුරයේ පිහිටි මෙම දළදා මැදුර කුමන ස්ථානයක ඉදිකොට තිබුණේ දැයි යන්න ගැන උගතුන් අතර විවිධ මතවාද පවත්නා නමුත් වර්තමාන සංඝමිත්තා මාවත ඔස්සේ අනුරාධපුර නගරයට දිවෙන මාර්ගයෙහි වම්පස පිහිටි ගෙඩිගේ නමැති පැරණි ගොඩනැගිල්ලට නුදුරින් දක්නට ඇති දැනට ගල්කණු පමණක් ශේෂව තිබෙන පැරණි ගොඩනැගිල්ල මෙම දළදා මාළිගය විය හැකි බවට ඇතැම් පුරාවිද්‍යාඥයින් විසින් හඳුනාගෙන තිබේ.[11] ඒ අසල තිබී සොයාගත් හතරවැනි මිහිඳු රජු විසින් නිකුත් කරන ලද සෙල්ලිපියේ සඳහන් වන කරුණුවලට අනුව එකල දළදා මැඳුරේ නඩත්තුව කෙසේ සිදුවේදැයි යන්න පිළිබඳ අගනා විස්තරයක් ලබාගත හැකිය.

අනුරාධපුර යුගයේ අවසන් භාගයෙහිදී සිදුවූ චෝළ ආක්‍රමණ නිසා ආරක්ෂාව පතා දළදා වහන්සේ රුහුණු දේශයෙහි සඟවා තිබූ බව කියැවෙන නමුත්[12] පළමුවැනි විජයබාහු රජුගේ කාලය වනතුරුම (1055 - 1110) මේ පිළිබඳව කිසිදු තොරතුරක් හමුවන බව නොපෙනේ. විජයබාහු රජතුමා සිය පාලන කේන්ද්‍රස්ථානය පොළොන්නරුවට මාරු කිරීමෙන් පසුව දළදා වහන්සේ එහි තැන්පත් කිරීම සඳහා සුදුසු ස්ථානයක් නොපැවති බැවිනි ඒ

සඳහා ඉතා අලංකාර මන්දිරයක් අලුතින් ඉදිකරන[13] ලද අතර එතුමාගේ අභාවයෙන් පසුව ද්‍රවිඩ සේනාංකයක් භාරයෙහි දළදා වහන්සේ තබා තිබුණු බව පොළොන්නරුවේ වේලෙයික්කාර සෙල්ලිපියෙහි සඳහන් වී තිබේ.[14] පොළොන්නරුවේ  පැරණි නගරයට උතුරින් හා තෝපා වැවට වම්පසින් පිහිටි දළදා චතුරශ්‍රය නමින් අද හැඳින්වෙන වේදිකාකාර භූමියෙහි දකුණු දෙසට මුහුණ ලා පිහිටුවා ඇති අටදාගෙය නමින් ප්‍රසිද්ධ ශෛලමය නටබුන් ගොඩනැගිල්ල එම පැරණි දළදා මැදුර ලෙසට හඳුනාගත හැකිය. පොළොන්නරුවේ පිහිටි නිශ්චිත ලෙස දින වකවානු ගෙනහැර දැක්විය හැකි පැරණිතම දළදා මැදුර මෙය වන බව පිළිගැනේ.[15]

පළමුවැනි විජයබාහු රජුගේ අභාවයෙන් පසුව බලයට පත්වන පළමුවැනි ජයබාහු (1110 - 1111) රජුගේ පාලන සමය දළදා වහන්සේට පමණක් නොව බුදුසසුනට ද කිසිසේත් යහපත් අවධියක් නොවූ බව පෙනේ. දළදා වහන්සේට පූජාකොට තිබූ මුතු, මැණික්, සඳුන්, අගිල් හා කපුරු වැනිදෑ පමණක් නොව ස්වර්ණමය හා වෙනත් ලෝහවලින් සෑදූ බුදුපිළිම ද මේ රජු විසින් කොල්ලකන ලද බව **චූලවංසයෙහි** වාර්තා කොට තිබේ.[16] එබැවින් පංශුකූලික භික්ෂූන් වහන්සේලා මෙකල දළදා වහන්සේ රුහුණු දේශයට රැගෙන ගොස් ආරක්ෂා කරන ලද බව කියැවේ.[17] මෙකල දළදා වහන්සේ රාජ්‍යත්වයේ සංකේතයක් බවට  හොඳින් පත්වී තිබුණු බැවින් මහා පරාක්‍රමබාහුරජු (1153 - 1186) එහි හිමිකම ලබාගැනීම සඳහා කොතරම් උනන්දු වූවේදැයි යන්න සමකාලීන වංසකථාවල එන විස්තරවලින් පැහැදිලි වේ.

පරාක්‍රමබාහු රජතුමාට එරෙහිව රුහුණේ මානාභරණ කුමරු දෙවන ගජබාහු (1132 - 1153) රජුට සහය දුන් අවස්ථාවෙහිදී මානාභරණ කුමරු දළදා වහන්සේ  පොළොන්නරුවට රැගෙන ආ නමුත් පරාක්‍රමබාහු රජුගේ බලය ඉදිරියේ ඔහුට පසුබැසීමට සිදුවන විට ආපසු රුහුණු දේශයට දළදාව රැගෙන ගිය බැවින් රුහුණු දේශයට පිටත් කොට හරින ලද පරාක්‍රමබාහු රජුගේ හමුදා නිලධාරීන්ට පැවරී තිබුණු ප්‍රධාන කාර්යය වූයේ කෙසේ හෝ දළදා වහන්සේ

ලබාගැනීම බව පෙනේ. එහෙත් රුහුණේ අධිපතීන් එම අරගලවලින් පරාජය වනවිට දළදා වහන්සේ රැගෙන විදේශ රටකට පළාගිය බව වාර්තා වන නමුත්[18] අවසාන භට්ටසූප නම් ස්ථානයෙහිදී කරන ලද බිහිසුණ සටනකින් පසුව රක්ඛ සහ කිත්ති නම් මහා පරාක්‍රමබාහු රජුගේ සෙන්පතියෝ දෙදෙනෙකු දළදා වහන්සේ අත්පත්කර ගැනීමට සමත් වූ බව පෙනේ.

විශේෂ ආරක්ෂක විධිවිධාන සහිතව පොළොන්නරුවට රැගෙන එන දළදා වහන්සේ පෙරමගට පැමිණි පරාක්‍රමබාහු රජු බොහෝ ගරු බුහුමණින් එය පිළිගෙන දළදා ප්‍රදර්ශනයක් සඳහා නගර මධ්‍යයෙහි අතිශය අලංකාර තාවකාලික මණ්ඩපයක් ඉදිකරන ලද බව කියැවේ.[19] ඒ හැරුණුවිට දළදා වහන්සේ ස්ථිර ලෙස තැන්පත් කිරීම සඳහා රජුගේ නියෝගය අනුව මෙකල මහින්ද නම් ඇමතිවරයෙකු විසින් තවත් ඉතා අලංකාර මන්දිරයක් ගොඩනංවන ලද බවද **චූලවංශයෙහි** සඳහන් වී ඇති නමුත්[20] එම දළදා මැදුර ඉදිකරන ලද ස්ථානය පිළිබඳව කිසිදු විස්තරයක් එහි ඇතුළත් කොට ඇති බව නොපෙනේ. මින් පසුව මේ රජතුමා විසින් තවත් අතිශය අලංකාර වෘත්තාකාර ශෛලමය දළදා මැදුරක් පොළොන්නරුවෙහි ම ඉදිකරන ලද බව **චූලවංසයේ** සඳහන් කොට තිබේ.[21] මහා පරාක්‍රමබාහු රජුගේ කාලයේදී පොළොන්නරුවේ දළදා මන්දිර තුනක් ඉදිකරවන ලද බව මෙම විස්තරවලින් පැහැදිලි වේ. ඒවායින් මහින්ද ඇමතිවරයා විසින් ඉදි කරන ලද පළමුවැනි මන්දිරය කුමන ස්ථානයක පිහිටා තිබුණේදැයි යන්න තවමත් නිශ්චිත ලෙස හඳුනාගෙන නැති නමුත් පොළොන්නරුවේ දළදා චතුරස්‍රයෙහි වම්පසින් දක්නට ඇති දැනට වටදාගේ නමින් හැඳින්වෙන මන්දිරය දෙවැනි ස්ථානය ලෙසට සැලකිය හැකිය. මේ රජු විසින්ම ඉදිකරන ලද වෘත්තාකාර ශෛලමය ගොඩනැගිල්ලක ඇතැම් කොටස් භාවිත කොට මෙය ඉදිකරන ලද බව පෙනේ. පැරණි නගරයට යොදුනක පමණ දුරකින් මේ රජු විසින් ඉදිකරන ලද තුන්වැනි මන්දිරය දළදා වහන්සේ ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිකළ තාවකාලික මණ්ඩපයක් පමණක් වියහැකිය. එම ස්ථානය හඳුනාගැනීම සඳහාද අද නිශ්චිත සාක්ෂි කිසිවක් හමුනොවේ.

මේ හැරුණුවිට නිශ්ශංකමල්ල රජතුමාත් (1187 - 1196) දළදා වහන්සේ වෙනුවෙන් පොළොන්නරුවේ ශෛලමය මන්දිරයක් ඉදිකරවන ලද බව **චූලවංසය, දළදා සිරිත, පූජාවලිය, රාජාවලිය හා රාජරත්නාකරය** වැනි ග්‍රන්ථවල[22] පමණක් නොව හැටදාගේ පුවරු ලිපිය, ගල්පොත ලිපිය සහ ප්‍රීතිදාන මණ්ඩපයේ ලිපිය වැනි අභිලේඛන කිහිපයක ද සඳහන් කොට තිබේ.[23] මෙම මන්දිරය එක් දිනකින් හෙවත් සිංහල පැය හැටක කාලයකින් නිමකළ ස්ථානයක් වූ බැවින් ඊට හැටදාගේ නමින් ව්‍යවහාර කරන ලද බව කියැවේ.[24] එහෙත් පරණවිතාන මහතාගේ විශ්වාසයට අනුව මෙය අලුතින් ඉදිකරන ලද මන්දිරයක් නොව මීට පෙර සිට පැවති ගොඩනැගිල්ලක් නැවත ප්‍රතිසංස්කරණය කිරීමක් පමණි.[25] මහා පරාක්‍රමබාහු රජු විසින් සාදන ලද අටදාගෙය ආසන්නයෙහි ඊට නැගෙනහිර දෙසින් ඉදිකරන ලද මෙම දළදා මන්දිරය දෙමහල් මැදුරක් ලෙසට නිමාකොට තිබුණු බව සිතිය හැකිය.[26]

මින් අනතුරුව දුර්වල පාලකයින් ගණනාවක්ම පොළොන්නරුවෙහි බලයට පත්වූ බැවින් කාලිංග දේශයෙන් පැමිණි මාඝ නම් ආක්‍රමණිකයෙකු (1215 - 1232) පහසුවෙන් මෙරට බලය අල්ලාගෙන බෙහෙවින් කෲර ලෙස පාලන කටයුතු මෙහෙය වූ බව ලාංකික වංශකථාවල සඳහන් වී තිබේ.[27] මෙකල වාචිස්සර තෙරුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂූන් දළදා වහන්සේ කොත්මලේ සගවා තබා ආරක්ෂාව පතා දකුණු ඉන්දියාවට පළාගිය බව වාර්තා වේ.[28] මින් පසුව ආක්‍රමණික මාඝට එරෙහිව සටන් කරමින්, දඹදෙණිය සිය අගනගරය ලෙසට ගෙන පාලන කටයුතු මෙහෙය වූ තුන්වැනි විජයබාහු රජු (1232 - 1236) එවකට ඉන්දියාවට පළාගොස් සිටි භික්ෂූන් වහන්සේලාගේ ආධාරයෙන් දළදා වහන්සේ කොත්මලේ සිට දඹදෙණියට රැගෙන ආ බව කියැවේ.[29] දළදා වහන්සේ සුරක්ෂිතභාවය ගැන සිතූ මේ රජු ඊට ඉතා යෝග්‍ය තැනෙකැයි සැලකූ කෑගලු දිස්ත්‍රික්කයෙහි පිහිටි බෙලිගල පර්වතය මත ඉතා අලංකාර මැදුරක් ඉදිකොට එහි දළදාව තැන්පත් කරවූ බව පෙනේ.[30] එහෙත් පෘතුගීසින්ගේ විනාශකාරී කටයුතු නිසා මෙම දළදා මැදුර තබා ඊට අදාළ වැදගත් නටබුන් කිසිවක් හෝ අද එහි

ශේෂව ඇති බව දක්නට නොලැබේ.[31]

ඉන් පසුව බලයට පත්වන දෙවන පරාක්‍රමබාහු රජු (1236 - 1270) මෙතෙක් බෙලිගල තැන්පත් කොට තිබූ දළදා වහන්සේ එහි සිට දඹදෙණියේ පිහිටි තම රජ මැදුර ආසන්නයෙහි ඉදිකළ මන්දිරයක් වෙත වැඩමවා තිබේ.[32] එම විස්තරය හැරුණුවිට මේ දළදා මාළිගය පිළිබඳව වෙනත් කිසිදු තොරතුරක් එහි සඳහන් නොවේ. එම දළදා මැදුරට අදාළ වැදගත් නටබුන් කිසිවක්ද අද එහි ශේෂව ඇති බව දක්නට නොලැබේ. මින් පසු තමා උපන් සිරිවඩ්ඩන නම් නගරයෙහි අතිමනෝහර සුවිසල් මහා විහාරයක් කොට, දළදා වහන්සේ එහි වැඩම කර මහජනයා වෙනුවෙන් මේ රජු විසින් දළදා ප්‍රදර්ශනයක් පැවැත් වු බවද සඳහන් වී[33] ඇති නමුත් එම දළදා මන්දිරය පවා මේ වනවිට ශේෂව ඇති බව නොපෙනේ. ඊට අමතරව තම පිය රජු විසින් දඹදෙණියේ ඉදිකොට තිබුණු තෙමහල් විජයසුන්දරාරාමයෙහිද මේ රජු විසින් දළදා වහන්සේ ප්‍රදර්ශනය කරවන ලද බව කියැවේ.[34] එහෙත් දඹදෙණියේ පිහිටි වර්තමාන විජයසුන්දරාරාමය තෙමහල් මන්දිරයක් ලෙස නොව දෙමහල් මැදුරක් ලෙසට නිමකොට ඇති බැවින් කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයෙහි දී මෙම පරිවර්තනය සිදුකරන ලදැයි විශ්වාස කෙරේ. මේ අනුව දඹදෙණි සමයෙහිදී දළදා වහන්සේ ස්ථිර ලෙස තැන්පත් කිරීම සඳහා දඹදෙණි පර්වතය මත ඉදිකරන ලද දළදා මැදුරත්, දන්තධාතු ප්‍රදර්ශනය කිරීම සඳහා භාවිත කරන ලද ශ්‍රී විජයසුන්දරාරාමයත්, සිරිවඩ්ඩනපුරයෙහි පිහිටි විහාරයත් යනුවෙන් දළදා වහන්සේ වෙනුවෙන් ඉදිකරන ලද මන්දිර තුනක් පැවති බව පෙනේ. පසුකාලීන ප්‍රතිසංස්කරණ නිසා මුල් ආකෘතිය මේ වනවිට මදක් වෙනසකට භාජනය වී ඇති නමුත් එයින් දඹදෙණියේ විජයසුන්දරාරාමය තවමත් හොඳින් ශේෂව ඇති මෙරට පැරණිතම දළදා ප්‍රදර්ශන මණ්ඩපය ලෙසට සැලකිය හැකිය.

මේ හැරුණුවිට දඹදෙණියෙහි විසූ පාලකයින් විසින් පැරණි පොළොන්නරු නගරය යළි අත්පත් කර ගැනීම සංකේතවත් කිරීම පිණිස හතරවැනි විජයබාහු රජුගේ කාලයෙහි දී (1270 - 1272) දළදා වහන්සේ

දඹදෙණියෙහි සිට පොළොන්නරුවට වැඩම කොට එහි පැරණි දළදා මැදුරේ තැන්පත් කරන ලද බව කියැවේ.[35] එහෙත් හතරවැනි විජයබාහු රජුගෙන් පසුව බලයට පත්වන පළමුවැනි බුවනෙකබාහු රජු (1272 - 1284) තම අගනගරය දඹදෙණියෙන් යාපහුවට (සුභ පබ්බතයට) රැගෙන ගොස් එහි පිහිටි ආරක්ෂිත පර්වතය මත සිය රජ මාළිගයත් දළදා වහන්සේ වෙනුවෙන් අතිශය අනර්ඝ මන්දිරයකුත් ඉදිකරවන ලද බව පෙනේ. දැනට ශේෂව ඇති නටබුන්වල අනුසාරයෙන් පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙන් පසුව ඉදිකරන ලද අලංකාරතම දළදා මැදුර මෙය වන බව සිතිය හැකිය.[36] වසර දහයකට නොඅඩු කාලයක් දළදා වහන්සේ එහි තැන්පත් කොට තිබුණු බවද පෙනේ.

බුවනෙකබාහු රජුගෙන් පසුව යාපනයේ ආර්යචක්‍රවර්තී රජු යටතේ සිදුවන පාණ්ඩ්‍ය ආක්‍රමණයේදී දළදා වහන්සේ හා තවත් වටිනා බොහෝ දෑ අල්ලාගත් පාණ්ඩ්‍යයෝ ඒවා තම රාජධානිය වෙත රැගෙන ගියහ.[37] එහෙත් දෙවැනි පරාක්‍රමබාහු රජුගේ මුණුබුරු තුන්වන පරාක්‍රමබාහු රජු (1287 - 1293) පාණ්ඩ්‍ය රාජ්‍යයේ පාලකයා වූ කුලසේකර රජු සමග කිහිප වරක් සාකච්ඡා කොට ආපසු දළදා වහන්සේ ලංකාවට රැගෙන ඒමට සමත් වූ බව පෙනේ. පැරණි පොළොන්නරු නගරයෙහි සිය රජ මාළිගය පිහිටුවා ගත් මේ රජු එහිම පිහිටි පැරණි දළදා මැදුරේ දළදා වහන්සේ තැන්පත් කරන ලද බව කියැවේ.[38] මින් පසුව බලයට පත්වන දෙවන බුවනෙකබාහු රජු (1293 - 1302) තම අලුත් අගනගරය වූ කුරුණෑගලට දළදා වහන්සේ වැඩමවීමට පෙර එය පොළොන්නරුවේ සුළු කාලයක් තැන්පත් කොට තිබුණු බව පෙනේ. මෙලෙස පොළොන්නරුවේ පිහිටි දළදා මැදුර පොළොන්නරු රාජධානි සමයෙන් පසුවත් අඛණ්ඩ ලෙස දීර්ඝ කාලයක් මුලුල්ලේ භාවිත කොට තිබීම විශේෂ සිද්ධියක් ලෙසට සැලකිය හැකි නමුත් මින් පසුව එය ලාංකික රජවරුන් විසින් නොසලකා හරින ලදබව දක්නට ලැබේ.

ඉන් අනතුරුව බලයට පත්වන හතරවැනි පරාක්‍රමබාහු රජු (1302 - 1326) දළදා වහන්සේ වෙනුවෙන් නව තෙමහල් මැදුරක් කුරුණෑගල ඉදිකරන[39] ලද

නමුත් අද වනවිට එය හඳුනාගත නොහැකි තරම් බෙහෙවින් නටබුන් වී ගොස් තිබේ. ඉන් පසුව හතරවැනි බුවනෙකබාහු රජු ( 1341 - 1351) තම අගනගරය කුරුණෑගල සිට ගම්පලට රැගෙන ගිය නමුත් ඒ සඳහා කවර හේතු බලපෑවේදැයි යන්න සමකාලීන මූලාශ්‍රවල සඳහන් වී ඇති බවක් නොපෙනේ. ඇතැම්විට උතුරේ ආර්යචක්‍රවර්තී රජුගේ බල ව්‍යාප්තිය නිසා මෙසේ සිදුකළ බව සිතිය හැකි වෙතත් මේ රජු කුරුණෑගල සිට ගම්පලට දළදා වහන්සේ වැඩම කළ බව නම් කිසිදු මූලාශ්‍රයක හෝ සඳහන් වී නොමැත. එහෙත් හතරවැනි බුවනෙකබාහුගෙන් පසුව ගම්පළ රජ වූ තුන්වන වික්‍රමබාහු (1357 - 1374) රජු 1360 වර්ෂයෙහි දී ගම්පළ පිහිටි කුඹුරු යායක අස්වැන්න දළදා වහන්සේට පූජාකළ බව විගුලවත්ත සෙල්ලිපියෙහි සඳහන් කොට ඇති බැවින්[40] මේ අවධියෙහි දී දළදා වහන්සේ ගම්පළ වැඩවිසුවේ යැයි සැකකළ හැකිය. මේ රජු ගම්පළ නියංගම්පාය රජමහා විහාරයෙහි ශෛලමය ප්‍රාසාදයක් කරවා මහා පූජෝත්සවයක් කළ බව **සිංහල දළදා වංසයෙහි** සඳහන් කොට ඇති නිසා[41] සමහර විට දළදා වහන්සේ මෙහි වැඩ වාසය කරන්නට ඇතැයි සිතිය හැකිය.

මින් පසුව පස්වන බුවනෙකබාහු (1372 - 1408) රජු රිදී හත්දහසක් වටිනා අනර්ඝ ධාතු කරඬුවක් කරවා දළදා වහන්සේ තැන්පත් කොට, මහා පූජෝත්සවයක් කළ බව **චූලවංසයෙහි** සඳහන් වී තිබේ.[42] ඔහු තම අගනගරය මෙකල ගම්පළ සිට කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර වෙතට රැගෙන ගොස් ඇති නමුත් එහි දළදා වහන්සේ වැඩම කළ බවක් නොපෙනේ. පස්වන බුවනෙකබාහු රජුගෙන් පසුව බලයට පත්වන වීරබාහු රජු විසින් දළදා වහන්සේ ගම්පළ සිට කෝට්ටේ නගරයට වැඩම කළ බව දහඅටවැනි සියවසේ දී රචිත **අස්ගිරි තල්පතෙහ** පමණක් සඳහන් කොට[43] ඇති නමත් සමකාලීන වෙනත් මූලාශ්‍රයක මේ පිළිබඳව වෙනත් කිසිදු තොරතුරක් ඇතුළත්ව ඇති බව නොපෙනේ. එහෙත් මින්පසුව බලයට පත්වන හයවැනි පරාක්‍රමබාහු රජු (1412 - 1467) අතිශය අලංකාර තෙමහල් ප්‍රාසාදයක් කෝට්ටේ නගරයෙහි ඉදිකොට, දළදා වහන්සේ එහි කරඬු කිහිපයක් තුළ තැන්පත් කරන ලද බව චූලවංසයෙහි සඳහන් වී තිබේ.[44] රජ මාළිගය

ආසන්නයෙහි ම ඉදිකොට තිබුණු මෙම අලංකාර දළදා මැදුර ගැන කෝට්ටේ යුගයෙහිදී රචිත සන්දේශ කාව්‍යය ගණනාවකදී ම බෙහෙවින් වර්ණනා කොට[45] ඇති නමුත් අදවන විට එහි නටබුන් කිසිවක් හෝ ශේෂව ඇති බව දක්නට නොලැබේ.

මින්පසුව මෙරට දේශපාලනික කටයුතු බෙහෙවින් අවුල් වියවුල් සහිත තත්ත්වයක් පත්වී ඇති අතර අටවැනි පරාක්‍රමබාහු (1484 - 1508) රජුගෙන් පසුව බලයට පත්වන ඔහුගේ පුත්‍රයින් දෙදෙනා වන නවවැනි ධර්ම පරාක්‍රමබාහු සහ හත්වැනි විජයබාහු බොහෝ දුෂ්කරතා මාධ්‍යයෙහි දළදා වහන්සේ ආරක්ෂා කළ නමුත්[46] මින් පසුව ඇති වන වියවුල් වලින් ප්‍රයෝජනගත් පෘතුගීසිහු ධර්මපාල කුමරු බලයට පත්කොට තම සිතැගි පරිදි පාලන කටයුතු මෙහෙයවා බෞද්ධ ශාසනයට විශාල හානියක් සිදුකළහ. එබැවින් කෝට්ටේ රාජධානිය තුළ සිටි භික්ෂූන් යාබද සීතාවක රාජ්‍යයට පළාගිය අතර හිරිපිටියේ රාළ නැමැත්තෙකු දළදා වහන්සේ ද එකල එහි රැගෙන ගිය බව වාර්තා වේ. එවකට සීතාවක රාජධානියෙහි පාලකයා වූ මායාදුන්නේ රජු මහත් හරසරින් දළදා වහන්සේ පිළිගෙන ආරක්ෂාව පතා දෙල්ගමු රජමහා විහාරයේ කුරහන් ගලක් යට තැන්පත් කොට තිබුණු බව කියැවේ.[47]

පාලකයින් විසින් දළදා වහන්සේ තැන්පත් කොට තිබූ මන්දිරයෙහි අලංකාරය පිළිබඳවත් නිතර උනන්දු වී ඇති බව දක්නට ලැබේ. කිසිවිටෙකත් එය ජරාවාසවීමට ඉඩනොදුන් ඔවුහු සුදුසු පරිදි මේ මන්දිර නිතර ප්‍රතිසංස්කරණය කිරීමට ද ඉමහත් පරිශ්‍රමයක් දැරූහ. ඊට අදාළ ගෘහනිර්මාණ ශිල්පයෙහිදී චිත්‍ර, මූර්ති සහ කැටයම් වැනි විවිධ සැරසිලි අංග භාවිත කොට තත් දළදා මැදුරු අලංකාර කිරීමෙන් එහි තිබෙන විශේෂත්වය හොඳින් හුවාදැක්වීමට ද මෙරට පාලකයින් ක්‍රියාකොට ඇති බව පෙනේ.[50] පැරණි අවධියට අයත් වන දැනට නටබුන්ව ගොස් ඇති ඉහත සඳහන් කරන ලද දළදා මැදුරුවලට වඩා මහනුවර යුගයේදී ඉදිකරන ලද දළදා මන්දිර පිළිබඳව හමුවන තොරතුරු මේ තත්වය තේරුම් ගැනීම සඳහා හොඳින් උපකාරී වන

බැවින් මෙතැන් සිට ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

මහනුවර රාජධානියෙහි ප්‍රථම ස්වාධීන පාලකයා වූ පළමුවැනි විමලධර්මසූරිය රජු (1592 - 1604) එතෙක් සබරගමු පළාතේ පිහිටි දෙල්ගමු විහාරයෙහි තැන්පත් කොට තිබුණු දන්තධාතූන් වහන්සේ[51] එතැනින් මහනුවරට වැඩමකර තම රජ මාළිගය අසලම ඉදිකළ සිත්කළු දෙමහල් මන්දිරයෙහි තැන්පත් කළ බව දළදා වංශයෙහි පමණක් නොව චූලවංසයෙහිද සඳහන් වී තිබේ.[52] පේරාදෙණියේ විජයකෝන් මැතිඳුගේ මුණුපුරෙකු වූ මාතලේ රට ඕවිල්ලේ අතපත්තු නැමැත්තෙකුගේ ආරාධනාවෙන්, වීදාගම තෙරුන්ගේ මුණුපුරෙකු ලෙසට සඳහන් වී ඇති කයිවැල්ලේ පණ්ඩිත නැමැත්තෙකු විසින් සෙනරත් රජුගේ කාලයෙහිදී (1604 - 1635) රචනා කරන ලදැයි සැලකෙන විදුර ජාතික කාව්‍යයෙහිදී පළමුවැනි විමලධර්සූරිය රජුගේ කාලයෙහිදී ඉදිකළ මෙම දළදා මැදුරේ ගොඩනැංවීම පිළිබඳ විස්තරයක් ඇතුළත් කොට ඇති අතර මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම්වලදී මැටි, දෙමැටි හා වැලිමැටි යොදා බිත්ති සකස් කොට, ඒවායෙහි සුණුද පිරියම්කර ඒ මත හංස හා සිංහ වැනි රූප සටහන් ඇඳ තිබුණු බව එහි කියැවේ.[53] එහෙත් පළමුවැනි විමලධර්මසූරිය රජුගේ කාලයෙහිදීම මෙම දෙමහල් දළදා මැදුර නැවත තෙමහල් මන්දිරයක් බවට පරිවර්තනය කළ බව ද දළදා වංශයෙහි සඳහන් වී ඇති බැවින්[54] තත් ගොඩනැගිල්ල මේ අවධියෙහිදීම වාස්තු විද්‍යාත්මක ලෙස විශාල වෙනසකට භාජනය වුණු බව හොඳින් පැහැදිලි වේ.

මින් අනතුරුව සෙනරත් රජුගේ කාලයෙහිදීත් (1604 - 1635) ඉන්පසුව දෙවැනි රාජසිංහ රජුගේ කාලයේදීත් (1635 - 1687) මහනුවර මහනුවර පැරණි දළදා මැඳුර පිහිටි ස්ථානයෙහි නැවත දෙමහල් දළදා මැඳුරක් ඉදිකරවූ බව **දළදා වංශයෙහිම** සඳහන් වී තිබේ.[55] මෙපරිද්දෙන් අඩ සියවසක් පමණ වුණු කෙටි කාලපරිච්ඡේදයක් තුළ මුලින් ඉදිකරන ලද දළදා මැදුර වෙනුවට එහිම නැවත අලුතින් දළදා මැදුරක් ඉදිකරවීමට හේතු වන්නට ඇත්තේ සමහර විට මේ කාලපරිච්ඡේදය තුළ දී සිදුවුණු පෘතුගීසි ආක්‍රමණයන්හිදී කරන ලද

විනාශකාරී කටයුතුවල ප්‍රතිඵලයක් නිසා විය හැකිය. විශේෂයෙන් ම මේ අතුරින් ක්‍රි.ව. 1611 දී පමණ ඔවුන් මහනුවරට එල්ල කළ ආක්‍රමණය ප්‍රධාන තැනෙක ලා සැලකිය හැකි අතර එම ආක්‍රමණයෙහිදී උඩරට රජු මහනුවරින් පළාගිය පසු සතුරන් නගරය අල්ලාගෙන එය විනාශ කරන ලද බව සඳහන් වී තිබේ.[56] මින් පසුව 1638 වසරෙහි දී ගන්නෝරුව සටන ඇරඹීමට පෙර මහනුවරට පැමිණ පෘතුගීසිහු සුපුරුදු පරිදි නගරය හා එහි පිහිටි සිද්ධස්ථාන විනාශ කරන ලද බව **රාජාවලියෙහි** සඳහන් කොට තිබේ.[57]

මින් පසුවත් මහනුවර දළදා මැදුර ගෘහනිර්මාණාත්මක වෙනස්කම්වලට භාජනය වූ අතර දෙවැනි රාජසිංහ රජුගෙන් පසුව බලයට පත්වන දෙවන විමලධර්මසූරිය රජුගේ කාලයෙහිදී (1687 - 1707) එහි තෙමහල් මැඳුරක් ඉදිකරන ලදැයි කියැවෙන විස්තරය මීට එක් නිදසුනක් ලෙසට සැලකිය හැකිය.[58] එහෙත් එම තෙමහල් දළදා මැදුර පවා මීට පසුව බලයට පත්වන ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයෙහිදී (1708 - 1738) මුළුමනින්ම වාගේ දිරාපත්ව පැවති බැවින් ආපසු දෙමහල් මන්දිරයක් ලෙසට ගොඩනැංවූ බව **චූලවංසයෙහි** මෙන්ම **දළදා වංසයෙහි** ද සඳහන් කොට තිබේ.[59] එම කෘතීන් දෙකෙන් **චූලවංශයෙහි** සඳහන් වන විස්තරවලට අනුව මේ රජුගේ කාලයෙහි දී "දළදා මැදුරේ සෑම අංශයක්ම පාහේ විවිධ සිතුවම් වලින් අලංකාර කොට තිබුණු අතර එහි ඉහළ හා පහළ යන දෙමාලයෙහි ම ජාතක කථා නිරූපිත චිත්‍රවලින් එකල ඇඳ තිබුණු බව පෙනේ. අනෙක් රජවරුන්ගේ කාලපරිච්ඡේදයන් ගැන මෙන් නොව තරමක් සවිස්තර ලෙසට මේ රජුගේ කාලයෙහිදී දළදා මැඳුරේ සිදුකළ ප්‍රතිසංස්කරණ ගැන තොරතුරු ඉදිරිපත් කොට ඇති **චූලවංස** කතුවරයා එකල දළදා මැඳුරෙහි ඇඳ තිබුණු ජාතක කථා ඒවායෙහි නම් වලින්ම ගෙනහැර දක්වා තිබේ. විදුර, ගුත්තිල, උම්මග්ග, දධීවාහ, මහාකණ්හ, සුතනු, ඡද්දන්ත, ධර්මද්වජ, ධර්මපාල, මහාජනක, පදමානවක, දහම්සොඩ, මහානාරද, කස්සප, මහාපදුම, තේලපත්ත, චුල්ලපදුම, සත්තුභත්ත, අන්ධභූත, වම්පෙය්‍ය, සස, විසයිහ, කුස, සුතසෝම, සිවි, තේම, චුල්ලධනුද්ධර, සච්චංකිර, දුම්මේද, කාලිංගබෝධි, ශීලව, මණ්ඩව්‍ය හා වෙස්සන්තර යන දෙතිසක් ජාතක කථා මෙහි චිත්‍රයට නඟා

තිබුණු බව එහි සඳහන් වේ.[60]

මහනුවර දළදා මැඳුර මෙලෙස පළමුවැනි විමලධර්මසූරිය රජුගේ කාලයෙහිදී මුල්වරට ගොඩනැංවීමෙන් පසුව, විවිධ අවධීන්හිදී විශාල පරිමාණයෙන් ප්‍රතිසංස්කරණ ගණනාවකටම එය භාජනය වී තිබෙන බව මෙම කෙටි විස්තරයෙන් පැහැදිලි වේ. එහෙයින් ඇතැම් විචාරකයින් විශ්වාස කොට ඇති පරිදි මහනුවර දළදා මැඳුරෙහි දැනට ශේෂව පවත්නා චිත්‍ර දෙවැනි විමලධර්මසූරිය රජුගේ කාලයට (1687 - 1707) හෙවත් ක්‍රි.ව. දාහත්වැනි සියවසේ අග භාගයට හෝ දහඅටවැනි සියවසේ මුල් භාගයට හෝ අයත්විය හැකි යැයි සිතීමට අසීරු බව පෙනේ. මෙලෙස සිදුකරන ලද නැවත ගොඩනැංවීම් හා ප්‍රතිසංස්කරණ රැස අතරතුරෙහිදී එහි ඇඳ තිබුණු පැරණි සිතුවම් සියල්ලම පාහේ ඒ සමඟ විනාශ වී යන්නට ඇතැයි හෝ එසේත් නොමැති නම් මෙබඳු නවකම්වලට ගොදුරුවීම නිසාම විශාල විපර්යාසයකට ලක්වූ බව හෝ සිතීමට පහසුවෙන් ම ඉඩකඩ සැලසේ. එහෙයින් මේ පරිසරය යටතේ එතරම් පැරණි අවධියක් නියෝජනය කරනු ලබන සිතුවම් කොටසක් දළදා මැඳුරෙහි තවමත් සුරැකිව තිබේදැයි යන්න ඉතාමත් ම අවිනිශ්චිත ය. **චූලවංශයෙහි** මෙන්ම **දළදා වංශයෙහි** සඳහන් වන තොරතුරුද පදනම් කොටගෙන මහනුවර දැනට දක්නට ලැබෙන දළදා මැඳුර දෙවැනි විමලධර්මසූරිය රජුගෙන් පසුව බලයට පත්වුණු ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේදී (1706 - 1739) ඉදිකළ මන්දිරය වන බවට ආනන්ද කුමාරස්වාමි හා කුඹුරුගමුවේ වජිර හිමියන් වැනි උගතුන් විසින් සහේතුක ලෙස කරුණු පෙන්වා දී තිබෙන බැවින් මේ තත්වය වඩාත් හොඳින් කුළුගැන්වේ.[61]

මීට මඳක් වෙනස් ප්‍රවේශයකින් මහනුවර දළදා මැඳුරෙහි දැනට ශේෂව ඇති පැරණි සිතුවම්වල කාලනීර්ණය පිළිබඳව අදහස් දැක්වූ ගුන්නෑපානේ වජිරඥාණ හිමි, සිහිල් ඇම් සිරිසේන, සිරිමා කිරිබමුණේ සහ මාරි ගැතලියේ වැනි උගතුන් කිහිප දෙනෙකු ඒවා ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයෙහිදී කරන ලද චිත්‍ර ලෙස සැලකීමට පෙළඹී තිබේ.[62] එහෙත් එම

අවධියට අයත් වන චිත්‍ර පවා වත්මන් දළදා මැඳුරෙහි ශේෂ වී තිබේදැයි යන්න බෙහෙවින් අවිනිශ්චිත බව තත් දළදා මැඳුර ගැන මෙන්ම දළදා වහන්සේට සම්බන්ධ පූජාවිධින් ගැනද අධ්‍යයනයක යෙදුණු කුඹුරුගමුවේ වජිර හිමියන්ගේ විශ්වාසය වී තිබේ.[63] ශ්‍රේෂ්ඨ කලා විචාරක ආනන්ද කුමාරස්වාමි මහතා විසින් මේ සියවස මුල් භාගයෙහිදී ගෙනහැර දක්වා ඇති අදහස්වලට අනුවත් නරේන්ද්‍රසිංහ රජුගේ කාලයෙහිදී එහි අඳින ලද චිත්‍රවල "සලකුණු පවා දැන් අවිද්‍යමානය"[64]

එහෙත් අනුරාධ සෙනෙවිරත්නයන්ගේ අදහස මීට බෙහෙවින් වෙනස් වන නමුත් එය ඉහත සඳහන් කළ අනෙකුත් විචාරකයින්ගේ අදහසම හොඳින් සනාථ කරලීමට සමත් වන බව පෙනේ. නරේන්ද්‍රසිංහ රජුගේ කාලයෙහිදී මෙම දළදා මැඳුර අවසන්වරට ගොඩනැංවීමෙන් පසුව වාස්තු විද්‍යාත්මක වෙනසකට හෝ වෙනත් ප්‍රධාන ප්‍රතිංස්සරණයකට හෝ භාජනය වී නොමැති බව ඔහු සඳහන් කොට ඇති[65] නමුත් මේ අදහසට වඩා කුඹුරුගමුවේ වජිර හිමි හා ආනන්ද කුමාරස්වාමි යන දෙදෙනා විසින් ඉදිරිපත් කොට ඇති අදහස වඩා නිවැරදි බව මීට පසුව බලයට පත්වන කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයෙහිදීත් (1747 - 1781) දළදා මැදුර ප්‍රතිසංස්කරණය කොට ඇති බව ඔවුන්ගේ අවධානයට හමුවී නැති බව පෙනෙන **සුළුරාජාවලියෙහි** සඳහන්ව ඇති විස්තරයකින්ද හොඳින් සනාථ වේ. "අභිනව දෙමහල් දළදා ගෙයකුදු කරවා සූරමන්දිර ප්‍රතිභාග වූ අභිනව කරවන ලද දළදා මන්දිරයෙහි ...." යනුවෙන් එහි ගෙනහැර දක්වන විස්තරය මෙහිදී ඉතා වැදගත් වේ.[66] මේ කරුණු චූලවංසයෙහි සඳහන් වන විස්තරයකිනුත් හොඳින් තහවුරු වන අතර මෙකළ දළදා මැඳුර විසිතුරු ලෙස අලංකාර කරන ලද බව එහි සඳහන් වී තිබේ.[67] එහෙත් ඒ කවර මාධ්‍යවලින් දැයි යන්න මෙහි පැහැදිලි ලෙස සඳහන් කොට නැති නමුත් චිත්‍ර මූර්ති කැටයම් වැනි කලා මාධ්‍යයන් පිළිබඳව මෙයින් හැඟවෙතැයි පහසුවෙන් අනුමාන කළ හැකිය.

එපමණක් නොව දැනට දළදා මාළිගයෙහි දක්නට ලැබෙන පැරණිතම අවධියට අයත් බව පෙනෙන බිතුසිතුවම් ස්වල්පය ද ගින්නකින් පිළිස්සී ගිය සලකුණු පළකරන බව පෙනේ. බොහෝදුරට මෙය කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ පාලන කාලයෙහිදී ක්‍රි.ව. 1765 - 1766 වර්ෂයෙහි පමණ සිදුවුණු ලන්දේසි ආක්‍රමණයෙහි දී කරන ලද විනාශකාරී ක්‍රියාවක ප්‍රතිඵලයක් වුවද විය හැකිය. "නැවතත් කිපී රෞද්‍ර වූ යක්‍ෂ සේනාවක් සේ ජාවකාදී නානා දේශවාසී වූ මහ පිරිස් ගෙන ගෙවැර්ණදොරුය යන නොතරම් වූවෙක් විහාර දේවාල අම්බලම් ගොනටු පොත්පත් සිඳ බිඳ දමමින් ක්‍රමයෙන් අවුත් ශ්‍රී වර්ධනපුරයට පැමිණි කල්හි"[68] යනුවෙන් **සුලුරාජාවලියෙහි** සඳහන් කොට තිබෙන කෙටි විස්තරයෙන් මෙකල සිදුකළ විනාශකාරී කටයුතු ගැන යථාවබෝධයක් ලබාගත හැකිය. එම විනාශකාරී අවස්ථාවෙහිදී සත්‍ය ලෙස ම දළදා මැඳුර ද ඊට ගොදුරු වූවේනම් එහි තිබුණු පැරණි අවධියට අයත් වන කලා නිර්මාණ රැස ද ඒ සමග විනාශ වී ගියේයැයි සිතීමට අසීරු නොවේ. එහෙයින් මේ කරුණුවලට අනුව දළදා මැඳුරෙහි දක්නට ලැබෙන පැරණිතම අවධියට අයත් වන සිතුවම් සියල්ලම පාහේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයෙන් ඔබ්බට නොදිවෙතැයි සැලකීම අසාධාරණයක් නොවේ.

වත්මන් දළදා මැඳුරේ මධ්‍යයෙහි පිහිටි ප්‍රධාන ගොඩනැගිල්ලේ ඇතුළත බිත්ති පෘෂ්ඨ හා වියන්තල වැනි ප්‍රධානාංග පමණක් නොව එහි ඇති බාල්ක හා පේකඩ වැනි කුඩා මහත් අංගෝපාංග සියල්ලම පාහේ හොඳින් සිතුවමින් විසිතුරු කොට තිබෙන මේ ගොඩනැගිල්ලෙහි අලංකාරය වැඩි කිරීමට යොදා ගන්නා ලද ප්‍රධානතම සැරසිලි අංගය සිතුවම් කලාව බව හොඳින් පැහැදිලිය. මෙබඳු චිත්‍ර සහිත දළදා වහන්සේ වැඩ සිටින මධ්‍යයේ පිහිටි ප්‍රධාන ගොඩනැගිල්ලේ නිර්මාණ ශිල්පය සැලකිල්ලට ගෙන බලන විට එය පල්ලේ මාලය සහ ඉහළ මාලය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වන බව පෙනේ. දළදා මැඳුරට ඇතුළුවන කවරෙකුගේ හෝ ක්ෂණික අවධානයට හසුවන්නේ මෙයින් පල්ලේ මාලය නමින් හඳුන්වනු ලබන බිම් මහලය. එහි ඇතුළත සැලසුම ආයත චතුරස්‍රාකාර හැඩයෙහි ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වන අතර එයින් ඉදිරිපසින් පිහිටි

කොටස "දිග්ගේ" යනුවෙන් සහ ඊට පිටුපසින් නිමකොට ඇති කොටස "මහඅරමුදල" යන නමින් හැඳින්වේ.

පල්ලේමාලයෙහි ප්‍රධාන දොරටුව පිහිටි ඉදිරිපස බිත්තියේ හැර සෙසු සියලුම බිත්තිවලදී මෙන්ම එහි ඇති වියන් තලයන්හි ද, එපමණක් නොව ඊට සම්බන්ධ බාල්ක හා පේකඩ සියල්ලෙහි ද අතිවිසිතුරු සිතුවම් රැසක් නිමකොට තිබෙනු දක්නට ලැබේ. මේ අතුරින් එහි වීදුරු කුටිය දෙපස ඇඳ ඇති සමන් සහ නාථ දේව රූප යුගලය කෙනෙකුගේ සෘජු දර්ශනයට ලක්වන අතර එහිම නිරූපිත සත්සතිය විදහා දැක්වෙන චිත්‍රාවලිය ද තවත් ඉතා වැදගත් සිතුවම් කිහිපයක් බව පෙනේ. මෙහි චිත්‍ර ඇඳීමෙහිදී බිත්ති පෘෂ්ඨය හරස් පනේල කීපයකට බෙදා වෙන්කර ගෙන තිබේ. නැගෙනහිර බිත්තියෙහිදී මෙබඳු පනේල දොළොහක්ද, දකුණුපස බිත්තියේදී පනේල විදි හතක් ද  තරු පස බිත්තියේ පනේල විසි එකක් ද යනුවෙන් මේ සඳහා තීර ගණනාවක් ම වෙන්කොට ගෙන ඇති බව පෙනේ. මේ බිත්තිවල ඇඳ ඇති සැරසිලි රූප අතරදී මාලාකර්ම හා ලතාකර්ම පමණක් නොව චන්ද්‍ර හා සූර්ය රූප සටහන් ද ඉතා සුලභ ලෙසට භාවිත කොට තිබෙනු දක්නට ලැබේ.

බිම් මහලේ "දිග්ගේ" නම් කොටසෙහි උඩුවියනේ හාත්පස ඇඳ තිබෙන චිත්‍ර සටහන් රැස මේ අතුරින් ඉතා වැදගත් තැනක් හිමිකරගන්නා අතර එහි ප්‍රධාන දොරටුවට ඉහළින් පිහිටි වියනෙහිදී තුන්මහල් විමානයක් තුළ, මකර තොරණක් යට හිඳ සිටින මෛත්‍රී බෝසතුන්ගේ රූප සටහනක් පරිවාර දේව රූප දොළහක් ද සමඟ නිරූපනය කොට දැක්වේ. තව්තිසා දොලොව, මහාබ්‍රහ්මයාගේ හා ශක්‍රයාගේ රූපසටහන් වැනි දෑ ද මෙහි චිත්‍රයට නඟා තිබේ. මේ අතුරින් සක්දෙව් රජුගේ රූපය ස්ථාන දෙකකදීම ඇඳ දැක්වෙන අතර එයින් එක් තැනෙකදී ඔහු සතරවරම් දෙවියන් සමඟ හිඳ සිටින ආකාරයෙන් ද, අනෙක් ස්ථානයෙහි දී මල් තොරණක් යට වැඩ හිඳින විලාශයකින් ද ඇඳ තිබේ. විමලධර්මසූරිය රජුගේ හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රූප දෙකද මෙහි ඇඳ දැක්වෙන අතර ඒවා නම් වශයෙන්ම සඳහන් කොට තිබෙනු පෙනේ. මෙහිම ඇඳ තිබෙන වෙස්සන්තර ජාතකය නිරූපිත

සිතුවම් පනේල කිහිපය ද ඉතා වැදගත් චිත්‍රාවලියකි. මේ හැරුණු විට නැගෙනහිර දිශාවෙහි පිහිටි වියන් තට්ටුවේ ඇඳ තිබෙන මිනිස් හා වලස් සටහන් විදහා දැක්වෙන චිත්‍රය ද තවත් වැදගත් සිතුවමකි.[69] එපමණක් නොව මෙහි ඇඳ ඇති මහනුවර සම්ප්‍රදායටම ආවේණික වුණු විශේෂ චිත්‍ර සටහන් දෙකක් බව පෙනෙන නවනාරි කුඤ්ජරය (කාන්තාවන් නවදෙනෙකුගේ රූප සටහන් භාවිතයට ගෙන හස්තියෙකුගේ බාහිර රූපකාරය විදහා දක්වන සිතුවම) හා හංස පූට්ටුව මෙබඳුම තවත් ඉතා වැදගත් වූ සිතුවම් දෙකකි.

එහිම පේකඩක දෙපැත්තේ ඇඳ ඇති දළදා පෙරහැර විදහා දක්වන චිත්‍රය ද මෙබඳුම ඉතාමත් වැදගත් තවත් අනගි සිතුවමක් වන අතර මෙහි දළදා පෙරහැරකදී අද පවා දක්නට ලැබෙන අලිඇතුන්, කොඩි, කුඩ, සේසත්, බෙර, තම්මැට්ටම් හා හොරණෑ වැනි සංගීත භාණ්ඩ වයන තූර්ය වාදකයින්, නැට්ටුවන් හා නිළමේවරුන් යන කුඩුමහත් අංගෝපාංග සියල්ලම පාහේ හොඳින් චිත්‍රයට නගා තිබෙනු දක්නට ලැබේ. මෙයින් අලි ඇතුන් අද මෙන්ම පේළියට තිදෙනෙකු බැගින් ගමන් කරන විලාශයකින්ද මධ්‍යයේ හිඳින හස්තියා කරඬුව වැඩමවන අයුරින්ද ගෙනහැර දක්වා තිබේ. දෙපස අලි ඇතුන් පිට මිනිසුන් හිඳ සිටී. දියවඩන නිළමේ මුතුකුඩයක සෙවන ලබමින් භාම්භීර ලෙස ගමන් කරන විලාශයක් පෙන්වන අතර පසෙකින් බොරු කකුල්කාරයෙකු ද පෙරහැරේ ඇවිදගෙන යනු ඇඳ තිබේ.

මෙහි තිබෙන සිතුවම් අතර නිරූපිත නවග්‍රහ මණ්ඩලය විදහා දැක්වෙන චිත්‍රයත් ඉතා වැදගත් වූ තවත් සිතුවමක් ලෙසට සැලකිය හැකි ය. විශාල පරිමාණයෙහි පෙති අටකින් යුක්ත පුෂ්පයක් තුළ මේ නවග්‍රහ මණ්ඩලය ඇඳ තිබේ. මලේ මධ්‍යයෙහි දී විශාල නෙළුම් මලක් නිරූපනය කොට ඇති මෙහි සුවිසල් මල්පෙති අට තුළ එක් එක් ග්‍රහයිනට අධිපතියැයි විශ්වාස කෙරෙන දෙවිවරුන්ගේ රූප, සත්වයින් විසින් අඳිනු ලබන ඔවුන්ගේ රථයන් ද සහිතව ඇඳ තිබේ. රවි, චන්ද්‍ර, කුජ, බුද, ගුරු, ශක්‍ර, ශනි හා රාහු යන ග්‍රහයින්ට අධිපති දෙවිවරුන් අටදෙනෙකු එම මල්පෙති අට තුළට යොදා ඔවුන් නම් වශයෙන් ම හඳුන්වාදී ඇති නමුත් නවග්‍රහ මණ්ඩලයේම සාමාජිකයෙකු වුණු කෙහෙතා

මෙහි චිත්‍රයට නැගීමෙන් වැලකී ඇති බව පෙනේ. සාමාන්‍ය ජන විශ්වාසයට අනුව කෙහෙතා යනු අවාසනාවෙහි සලකුණක් ලෙසට පිළිගැනෙන බැවින් මෙසේ සිදුවූවේ යැයි සිතිය හැකිය.[70] මේ හැරුණු විට වියනේම ඇඳ ඇති ලියවැල්, සිංහයින්, කුරුල්ලන් හා අලි ඇතුන් වැනි දෑ ඇතුළත් වන චිත්‍ර තීරයන් ද ඉතා වැදගත් වන අතර එයින් ඇත් රූප රැස පේළි වශයෙන් විවිධ ඉරියව්වලින් යුතුව ගෙනහැර දක්වා තිබේ. එපමණක් නොව හංසයින් සතර දෙනෙකු හා අට දෙනෙකු බැගින් යොදා සකසන ලද හංස චක්‍ර දෙක, නෙළුම් මල් හා වෙනත් මල් මෝස්තර, කිඳුරු රූප, කල්ප වෘක්ෂ, මල්ලවපොර ශූරයෝ, පංචනාරී ඝටය හා නවනාරී කුඤ්ජරය යනාදි වශයෙන් මෙහි දක්නට ලැබෙන තවත් චිත්‍ර රැසක් ම වැදගත්කම අතින් ඉතා ඉදිරියෙන් සිටින බව පෙනේ. මෙහි පේකඩවල ඇඳ ඇති දායකයින්ගේ, මකරුන්ගේ, හංසයින්ගේ හා කිඳුරන්ගේ රූප සටහන් මෙන් ම ගජසිංහ, හංසපූට්ටුව හා වෘෂභ කුඤ්ජරය වැනි රූප සටහන් ද හොඳින් කැපී පෙනේ.

එහෙත් පහත මාලයේ වියන් තලයෙහි ඇඳ තිබෙන මෙම සිතුවම් දළදා මැඳුර ගොඩනංවන ලෙස මුල්කාලීන අවධියට හෝ ඉන් මඳක් පසුකාලීන සමයකට හෝ අයත් ඒවා නොව, ඊට වඩා බෙහෙවින් මෑතකාලීන අවධියක් නියෝජනය කරන සිතුවම් කොටසක් බව එම වියන් තලයේ ම පසෙක ලියා ඇති මෙම පහත ගෙනහැර දක්වන කෙටි පාඨයෙන් හොඳින් සනාථ වේ. "ශ්‍රී බුද්ධ වර්ෂ 2450 ක්‍රිස්තු වර්ෂ 1907 ශක වර්ෂ රජයම් යන වර්ෂයෙහි ශ්‍රී සෙංකඩ ශෛලාභිධාන ශ්‍රී වර්ධනපුර ප්‍රවරයෙහි වූ ශ්‍රීමත් දන්තධාතු මන්දිරස්ථානය පාතමාලේ ජරාවාසව තිබූ වියන් සිතියම මහනුවර පෝයමළු විහාරවාසී අමුණුගම ශ්‍රී නිවාස පියදස්සයාභිධාන ලංකාතිලකේ නායක ස්ථවිරයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් උඩපාත දෙරට රදළ මුදලි ආදි බොහෝ ශ්‍රද්ධාවන්ත මහතුන්ගේ ආධාර ඇතිව රුපියල් 1680 ක් පමණ වියදම් කොට ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2450 වැන්නෙහි පොසොන් මස මිථුන රවි පුර දසවක් තිථියලත් කිවිදින සිත නැකතින් සිථියන් කරවා නිෂ්ඨා කරවන ලදී. සාධු ! සාධු! සාධු! පින් අනුමෝදන් වියයුතුය. ඇඹලපුරේ කිරිහාමි මුහන්දිරම් වැඩ කළේ....[71]

මෙම විස්තරයට අනුව පහත මාලයෙහි වියන් තලයේ ඇඳ තිබුණු පැරණි චිත්‍ර එවකට ජරාවාස වී තිබුණු බැවින් ක්‍රි.ව. 1907 වර්ෂයෙහිදී ඇඹලපුරේ කිරිහාමි මුහන්දිරම් නම් ශිල්පියෙකු විසින් ප්‍රතිසංස්කරණය කොට ඇති බව ඉතාමත් ම හොඳින් තහවුරු වේ. මේ පාඨයටම සම්බන්ධ කොටගත හැකි තවත් වැදගත් විස්තරයක් ආනන්ද කුමාරස්වාමි මහතාගේ **මධ්‍යකාලීන සිංහල කලා** ග්‍රන්ථයෙන් ද හමුවේ. ආනන්ද කුමාරස්වාමි මහතා මෙම ග්‍රන්ථය සඳහා අවශ්‍ය තොරතුරු එක්රැස් කරන ලද්දේ 1907 වර්ෂයෙහි සැප්තැම්බර් මාසයේ දී සිට බව කියැවෙන අතර අවම වශයෙන් 1908 වසරෙහි දෙසැම්බර් මාසය වන විටදීවත් එම කෘතිය මුද්‍රණද්වාරයෙන් නිකුත් කරන ලද බව පෙනේ.[72] (එහෙත් මෙහි සඳහන් වන 1908 වර්ෂයෙහි දෙසැම්බර් මාසය යනු එම කෘතියේ අත්පිටපත ලියා අවසන් කළ දිනය ලෙසට වුවද කෙනෙකුට සැකකළ හැකි බැවින් එම දින වකවානු මේ කෘතිය පළකළ වර්ෂය නොවීමට ද ඉඩකඩ තිබේ.) මේ කෘතිය සඳහා අවශ්‍ය තොරතුරු එක්රැස් කර ගැනීමට ඔහු විවිධ තැන්වලට ගිය අතර එයින් එක් අවස්ථාවක දළදා මැඳුරෙහිදී එකල පැවති පැරණි චිත්‍ර කිහිපයක් ද ඔහු විසින් දැක තිබේ. මෙහිදී ගත් ඡායාරූපයක් ප්‍රයෝජනයට ගෙන ඊ.ඇම්. කුමාරස්වාමි මහත්මිය විසින් අඳින ලදුව, **මධ්‍යකාලීන සිංහල කලා** ග්‍රන්ථයට ඇතුළත් කොට ඇති දළදා මැඳුරේ බරාඳයෙහි වියන් තට්ටුවේ ඇඳ තිබුණු කුරුල්ලන් හා සතුන් දඩයම් කරන විලාශයෙන් යුතු මිනිසකු විදහා දැක්වෙන දර්ශනයක් සහිත සිතුවම මීට එක් කදිම නිදසුනකි. එහි මුල් සිතුවම දුඹුරු සහ පච්ච (කොළ) වර්ණ ප්‍රභේදවලින් ඇඳ තිබුණු වනයක දර්ශනයක් විදහා දැක්වෙන චිත්‍රයක් බව ද කුමාරස්වාමි මහතා සඳහන් කොට තිබීමෙන්[73] කෙනෙකුට එහි පැරණි වර්ණ රටාව පිළිබඳව ද දළ අවබෝධයක් ලබාගැනීමට ඉඩකඩ සැලසී තිබේ.

මෙපරිද්දෙන් දළදා මැඳුරේ ඇඳ තිබුණු බවට ආනන්ද කුමාරස්වාමි මහතා විසින් කලින් දැක තිබූ සමහර සිතුවම් පසු කලෙකදී දක්නට නොලැබුණු බව 1908 වර්ෂයෙහි අගභාගයේදී පළකල බව පෙනෙන සමාන කෘතියේ සඳහන් කොට තිබීමෙන් මීට ඉහතදී සඳහන් කරන ලද කිරිහාමි මුහන්දිරම්ගේ ප්‍රතිසංස්කරණය සිදුකළ 1907 වර්ෂය අවට කාලයම එයින් නියෝජනය

කෙරෙන බවක් හැඟවේ. එපමණක් නොව දහනවවැනි සියවසට අයත් වන "එම චිත්‍රය දැන් විනාශ කොට ඇති බව" කුමාරස්වාමි මහතාම තවත් තැනෙකදී පැහැදිලි ලෙස සඳහන් කොට තිබීමෙන්[74] එය ස්වභාවික හේතුවක් නිසා නොව ප්‍රතිසංස්කරණයක් වැන්නක් මගින්ම සිදුවුණු විනාශයක් බවට සඟවා තිබීම මෙහිදී ඉතා වැදගත් වේ. කුමාරස්වාමි මහතා මෙම කෘතියෙහිදීම මහනුවර සමයේ ගෘහනිර්මාණ ශිල්පය ගැන කථාකරන තවත් අවස්ථාවක, දළදා මැඳුරේ තිබුණු වියන් තලය ගැන ඉහත චිත්‍ර පුවරු ද සැලකිල්ලට ගෙන කරන විස්තරයකදී "එය වෙනස් කිරීමට යාමෙන් වඩාත් නරක්වී තිබෙතැයි" සඳහන් කොට ඇති බැවින්[75] මෙයින් හඟවා ඇත්තේ පසුකාලීන ප්‍රතිසංස්කරණයක් ගැනම බව හොඳින් පැහැදිලි වේ.

මීටත් වඩා එම ග්‍රන්ථයෙහි ම ඇතුළත් කොට තිබෙන තවත් ප්‍රකාශනයක් මේ කරුණෙහි දී ඉතා හොඳින් අදාළ වන්නේ "දළදා මාළිගයේ සිත්තම් සියල්ලම නුදුරු අතීතයේදී අතගා ඇත්තේ ය. මේ මෝස්තර බෙහෙවින් පාරම්පරික වුවද වර්ණ ඉවසිය නොහැකි තරම් දීප්තිමත්ය, භූෂිතය ශේෂව ඇති විශිෂ්ඨ චිත්‍ර කිහිපයෙන් එකක් ඉතා නුදුරු කාලයෙහි ප්‍රතිසංස්කරණය කරන ලදුව විකෘති කොට තිබෙතැයි"සඳහන් කොට ඇති බැවිනි.[76] එහෙත් මේ තත්වය 1907 වසරෙහි අග භාගයෙහි දී පමණක් නොව, ඊට වසර දෙක හමාරකට පමණ ඉහතදීත් එපරිද්දෙන්ම ඇතිවී තිබුණු බව, කුමාරස්වාමි මහතා විසින් 1905 වර්ෂයෙහි පෙබරවාරි මස මැද භාගයේදී පළකළ **උඩරට ප්‍රධානීනට ඉදිරිපත් කරන විවෘත සංදේශය (An Open letter to the Kandyan Chiefs)** නම් ලිපියෙහි[77] ඇතුළත් කොට ඇති මෙහි පහත ගෙනහැර දක්වා තිබෙන පාඨයෙන් හොඳින් පැහැදිලි වේ. "නවකම්වලදීද පරම්පරාගත ශෛලීය දන්නා උඩරට කලාකරුවන්ට ඒවා භාරනොදී නගරවලින් හෝ පහතරටින් හෝ ගෙන්වාගත් අයට ඒවා භාරදී තිබෙත්. මොවුනට බිතුසිතුවම් වලට අවශ්‍ය උසස් විසිතුරු ඇඳීම් ක්‍රම ගැන දැනුමක් නැතිවා මෙන් ම ඒ ගැන පරම්පරානුගත හැඟීමක් ද කොහෙත්ම නැත. මොවුන්ට ඇත්තේ ප්‍රක්ෂේපණ චිත්‍ර සම්බන්ධයෙන් අහුලා ගත් සුළු දැනීමක් පමණෙකි. උඩරට සිත්තරෙක්ම හෝ වේවා ඔවුහු සුදුසු වර්ණයක් සුදුසු

අන්දමින් යොදත්දැයි කවරෙක් පරීක්‍ෂාකර බලත්ද? මේ අතින් දැන් කෙරීගෙන යන දළදා මාළිගාවේ නව සායම් ගෑම අන්ත වගකීමක් නැතිකමට දොස් කියයි. පරම්පරාවලින් පැවත එන නමුත් වර්ණයෙන් පරිපූර්ණ තමන් විසින්ම සාදාගත් සායම් වෙනුවට සාප්පුවලින් ගන්නා ලද ලාභ සායම් පාවිච්චි කරන අතරම ඒවා යොදන්නේද කිසි පරීක්ෂාවකින් හෝ හැඟීමක් නොමැතිවය. විශේෂයෙන් අළුතින් පැමිණ ඇති නිල් සහ කොළ පාට ගැන සලකා බලන්න. සෑම තැනකම මෙය සිදුවී යයි"[78]

ආනන්ද කුමාරස්වාමි මහතාගේ ප්‍රකාශවලින් උපුටාගත් ඉහත ගෙනහැර දක්වන ලද කෙටි පාඨ සියල්ලෙන්ම ඉතා හොඳින් පැහැදිලි වන්නේ පැරණි අවධීන්හිදී පමණක් නොව පසුගිය සියවස මුල් භාගයෙහිදී ද දළදා මැඳුර විටින් විට කරන ලද ප්‍රතිසංස්කරණ කිහිපයකටම ලක්වී ඇති ආකාරයයි. එපමණක් නොව පසුගිය සියවස (විසිවැනි සියවස) මුල් භාගයෙහිදී සිය **මධ්‍යකාලීන සිංහල කලා** කෘතිය නිමකළ ආනන්ද කුමාරස්වාමි මහතා මේ චිත්‍ර ඊට පෙර සියවසට හෙවත් දහනවවැනි සියවසට අයත් බවද සඳහන් කොට තිබෙන බැවින් ඒවා එතරම් පැරණි සිතුවම් කොටසක් නොවන බව හඟවා තිබෙනු දක්නට ලැබේ.[79] එහෙයින් දළදා මැඳුරේ චිත්‍ර ගැන අවධානය යොමු කරන්නෙකුට මේ පිළිබඳව ද මඳක් තම සිත යොමු කිරීමට සිදුවන අතර විටින් විට එහි සිදුකරන ලද විවිධ ප්‍රතිසංස්කරණ මගින් තත් චිත්‍රවල නව්‍යභාවය ආරක්ෂා කිරීමට ගෙන ඇති උත්සාහය නිසා ඒවායෙහි තිබුණු ඓතිහාසික වටිනාකම අද වනවිට බෙහෙවින් ඉවත්ව ගොස් ඇති ආකාරය මෙයින් හොඳින් වටහාගත හැකිය.

පසුගිය සියවස මුල් භාගයේදී පමණක් නොව ඉන් පසුවත් මෙබඳුම බලපෑමකට මේවා ලක්වී ඇති බව 1961 වසරෙහිද දළදා මැඳුරේ පල්ලේ මාලයෙහි ප්‍රතිසංස්කරණ රැසක් සිදුකොට තිබෙන බව දොරටුවට ඉහළින් සඳහන් කොට තිබෙන කෙටි පාඨයකින් හොඳින් සනාථ වන බැවින් පැහැදිලි වේ.[80] එහෙත් එම ප්‍රතිසංස්කරණවලින් එහි පැවති සමහර චිත්‍රවල පෞරාණික වටිනාකමට එතරම් හානියක් සිදුවී නැති බවද පෙනේ. ඉහත

සඳහන් කළ නැගෙනහිර ආලින්දයේ වියන් තට්ටුවෙහි පේකඩක ඇඳ ඇති දළදා පෙරහැර නිරූපිත සිතුවම මේ සඳහා එක් වැදගත් නිදසුනක් ලෙසට සැලකිය හැකිය. මේ චිත්‍රය ප්‍රතිසංස්කරණය නොකරන ලද පැරණි සම්ප්‍රදායට අයත් එකක් විය හැකි බව කඹුරුගමුවේ වජිර හිමියන්ගේද විශ්වාසය වී ඇති අතර[81] තත් චිත්‍රයෙහි දක්නට ලැබෙන වර්ණ වින්‍යාශය, රේඛාකරණ සම්ප්‍රදාය මෙන්ම රූප සම්පිණ්ඩනය වැනි මූලික ලක්ෂණවලට අනුවද මේ තීරණය බෙහෙවින් නිවැරදි එකක් විය හැකි හැකි බව පෙනේ.

මෙතෙක් විස්තර කළ චිත්‍ර සහිත දළදා මැඳුරේ පල්ලේමාලය මත ඉදිකොට ඇති දන්තධාතූන් වහන්සේ තැන්පත් කොට තිබෙන ඉහළ මාලය වැඩසිටින මාළිගය නොහොත් ගන්ධකුටිය යන නමින් අද හැඳින්වේ.[82] මෙහිද උඩු වියනේ ඇඳ ඇති චිත්‍ර ඉතා වැදගත් වන  අතර එහි බාල්ක සහ පේකඩ සැරසීමෙහිදී ලතාකර්ම, මාලාකර්ම සහ බෝපත් රටාවට මුල් තැනක් දී ඇති බව පෙනේ. එහිම පසෙක ඇඳ ඇති හංස පූට්ටුව ගෙනහැර දැක්වෙන සිතුවමද ඉතා වැදගත් එකක් වන අතර මේ ගණයේ චිත්‍ර සොයා ගැනීම මඳක් අසීරු බවද පෙනේ. මේ හැරුණුවිට ගවයින්, කොටියන් හා අලියන් වැනි සතුන්ගේ රූප සටහන්ද නිතර ඇඳ දැක්වෙන අතර එයින් හස්ති රූපය විවිධ ඉරියව්වලින් යුතුව ගෙනහැර දක්වා තිබෙනු පෙනේ. මෙහි එක් හස්ති රූප යුගලයක් ඍජු දර්ශී රීතියෙන් (ඉදිරියට හැරී සිටින විලාශයෙන්) නිමකොට තිබීම ඉතා වැදගත් වන අතර මෙබඳු ඉරියව්වකින් සත්ව රූප නිරූපණය තොට තිබෙන සිතුවමක් මේ සම්ප්‍රදායේ විහාර චිත්‍ර සහිත කවර තැනෙකින් හෝ සොයා ගැනීම කිසිසේත් පහසු කරුණක් නොවේ. එපමණක් නොව නලා පිඹින ඉරියව්වෙන් ගෙනහැර දක්වා ඇති කිඳුරන්ගේ රූප, නාරිලතා, වෘක්ෂ රූප හා විවිධ මල් මෝස්තර මෙහි තිබෙන තවත් කැපී පෙනෙන චිත්‍ර කිහිපයක් වන අතර එහිම ගෙනහැර දක්වන සස ජාතකය ද මෙබඳුම වැදගත්කමක් හිමිකර ගන්නා තවත් විශේෂ චිත්‍රාවලියකි.

බිත්තිවල ඇඳ ඇති බුද්ධ රූප, රහත් රූප, නිල් පැහැයෙන් වර්ණ කරන ලද විෂ්ණු දෙව් රුව, සමන් දේව රූපය සහ සූවිසි විවරණය ගෙනහැර

දැක්වෙන චිත්‍රාවලිය පමණක් නොව විවිධ සැරසිලි රූප රැස මෙහි ඇති ඉතා හොඳින් කැපී පෙනෙන තවත් වැදගත් සිතුවම් කිහිපයකි. මෙහි ආලින්දයේ ඇති වියත් තට්ටුව සැරසීම සඳහා යොදාගෙන තිබෙන්නේ සංයුක්ත රූප සටහන් ගණනාවකි. චතුර්නාරී පල්ලැක්කිය නමින් හඳුන්වනු ලබන රූපය මින් එකකි. කාන්තාවන් සතර දෙනෙකුගේ රූප සටහන් භාවිතයට ගෙන පල්ලැක්කියක බාහිර රූපකාරය විදහා දැක්වෙන පරිදි මෙය ඇඳ තිබේ. එහි උතුරුපස වියනේ ඇඳ තිබෙන සප්තනාරී රථය තවත් මෙවැනිම වැදගත් චිත්‍රයක් වන අතර එයින් කාන්තා රූප සතක් ප්‍රයෝජනයට ගෙන රථයක බාහිර හැඩය ගෙනහැර දක්වා තිබෙනු දක්නට ලැබේ. ඒ හැරුණු විට භේරුණ්ඩ පක්ෂියා, නාරිලතා හා ඒකශීර්ෂ ද්විත්ව සිංහ රූපය වැනි වැදගත් රූප සටහන් කිහිපයක්ම දක්නට ලැබෙන අතර හංසයින් සතර දෙනෙකු යොදා කරන ලද හංස චක්‍රය, මල් මොස්තර හා ලියවැල් රටා වැනි තවත් විශේෂ ගණයේ සිතුවම්ද ඒ අතර දිටිය හැකිය. මේවායින් ඇතැමක් ඊට ආසන්නයෙහි යොදන ලද කෙටි පාඨයක් මගින් ඒ කවර .චිත්‍රයක්දැයි යන්න සිත්තරුන් විසින් හඳුන්වා දීමටද උත්සාහ ගෙන තිබෙනු පෙනේ.

ඉහත සඳහන් කොට ඇති පරිදි දළදා මැඳුර ආගමික අතින් පමණක් නොව රාජ්‍යත්වයේ හිමිකම පිළිබඳ සංකේතයක් ලෙසටද සැලකුණු, ඉතාමත්ම වැදගත් ආයතනයක් වුණු බැවින් මේ ස්ථානය නඩත්තු කිරීම සෑම කලකදීම වාගේ ඉතා හොඳින් නොපිරිහෙලා ඉටුකොට ඇති බවට සාක්ෂි රැසක් හමුවේ. මේ නිසා මෙම ගොඩනැගිල්ල විටින් විට අලුත්වැඩියා කිරීමට පමණක් නොව ඊට මෑත අවධියෙහි දී පවා අවස්ථා ගණනාවක අලුතින් කොටස් කිහිපයක් එකතු කිරීමටද එහි භාරකාරත්වය ඉසිළූ තැනැත්තන් කටයුතු කොට ඇති බව දළදා මැඳුරෙහි මෑත ඉතිහාසය ගැන කරුණු සොයා බලන්නෙකුට දත හැකිය. 1936, 1956 හා 1987 යන වර්ෂයන්හිදී ඊට එකතුකොට ඇති නව්‍ය ගෘහනිර්මාණාංගවලින් මේ තත්වය හොඳින් තහවුරු වේ.[83] මෙබඳු ප්‍රතිසංස්කරණයන්හි හා අලුත් නිර්මාණ සැකසීමේ බලපෑම දළදා මැඳුරේ පහළ මාලයේ මෙන්ම එහි ඉහළ මාලයේ ඇඳ තිබුණු චිත්‍ර කෙරෙහිද එකසේ බලපා ඇති බව ඒවායේ ඇඳ තිබුණු චිත්‍ර මෑත කාලයේදී

පවා අළුත්වැඩියාවකට ලක්වී ඇති බවට සාක්ෂි හමුවීමෙන් පැහැදිලි වේ. එහි දකුණුපස බිත්තියේ ලියා ඇති මෙහි පහත ගෙනහැර දක්වන විස්තරයෙන් මේ තත්වය ඉතා හොඳින් වටහාගත හැකිය. "දිසාපති විජයවර්ධන සෙනවිරත්න පණ්ඩිත අභයකෝන් බණ්ඩාරනායක වාසල මුදියන්සේලාගේ ටී.බී. රත්වත්තේ දියවඩන නිළමේතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම දළදා මාළිගාවේ චිත්‍ර කර්මාන්තය හා අනෙකුත් සියළුම වැඩ අවසාන කරවන ලද්දේ ශ්‍රී බුද්ධ වර්ෂ 2485 ක් වූ දුරුතු මස 12 දින නොහොත් ක්‍රිස්තු වර්ෂයෙන් 1942 ක් වූ ජනවාරි මස 27 වැනි දින රාත්‍රී 2.35 ට යෙදුණු ශුභ මුහුර්තයෙන් ශ්‍රී දළදා වහන්සේගේ නැවත වැඩ සිටි මාළිගාවේ තැන්පත් කළ බවයි ....[84]

එහෙත් මීට පෙර ප්‍රතිසංස්කරණයන්හිදී මෙන් නොව, ඊට සහභාගි වූ ශිල්පියාගේ පෞද්ගලික සංඥා නාමය මෙහි සඳහන් කොට නොමැති නමුත් පසුගිය සියවස මුල් භාගයෙහිදී දළදා මැඳුරේ ප්‍රතිසංස්කරණ කටයුතුවලට සම්බන්ධ වුණු ඇඹලපුරේ කිරිහාමි මුහන්දිරම්ගේ පරපුරෙහි තැනැත්තන් ඊට සහභාගී වී නොමැති බවට නම් තත් පරපුරෙහිම වත්මන් සාමාජිකයින්ගෙන් තොරතුරු අසා දැනගත හැකිය. මෙපරිද්දෙන් දළදා මැඳුරේ ඉහළ හා පහළ යන දෙමාලයම විටින් විට ප්‍රතිසංස්කරණයට ලක්වී ඇති අතර එයින් පල්ලේමාලයේ 1961 වර්ෂයෙහිදී කළ නවකම්වලින් අනතුරුව 1973 හා 1987 යන වර්ෂයන්හිදීත් එහි පැවති සමහර චිත්‍ර මත අළුතින් සායම් ආලේප කිරීමට හෝ එසේත් නොමැති නම් අළුතින් චිත්‍ර ඇඳීමටම හෝ ලක්වී ඇති බවට ලිඛිත සාක්ෂි හමුවන බව මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුතුය.[85]

දළදා මැඳුරේ සෑම කොටසක්ම පාහේ සිතුවම් ඇඳීම සඳහා හොඳින් ප්‍රයෝජනයට ගෙන ඇති ආකාරය මේ විස්තරයෙන් පැහැදිලි වේ. එපමණක් නොව ඒ සියල්ල පාහේ අදාළ ස්ථානයෙහි පිහිටීමද හොඳින් සැලකිල්ලට ගෙන ඇඳ ඇති රූප සටහන් රැසක් බව පැහැදිලි වේ. මෙහි තිබෙන ජාතක කථා, රහත් රූප හා සූවිසි විවරණය වැනි සිතුවම් අතලොස්සක් හැරුණු විට අනෙකුත් තේමාවන් සියල්ලම පාහේ සැරසිලි කලාවක අංග ලක්ෂණ රැසක්

බව පෙනේ. මේ තත්වය කෙබඳු මට්ටමක පවතීද යත් විසිතුරු සැරසිලි අංග, චිත්‍ර මාධ්‍ය තුළින් ඉදිරිපත් කරන මෙබඳු තැනක් ලක්දිව වෙනත් කිසිදු තැනෙකින් හෝ දැකගත නොහැකි වෙතැයි කෙනෙකු කිවහොත් එය අතිශයෝක්තියක් නොවිය හැකිය. මූලික ලෙස සැරසිලි කලාවට බරවූ මෙහි තිබෙන චිත්‍ර රැස සම්ප්‍රදායික රූප සටහන්වලින්ම සැදුම් ලද ඒවා බව පෙනේ. මෙහි දක්නට ලැබෙන එම සිතුවම් රැස සත්ව රූප, කල්පිත රූප, සැරසිලි අංග හා සංයුක්ත රූප යනුවෙන් ප්‍රධාන කොටස් කිහිපයකට බෙදා වෙන්කර ගතහැකි අතර එයින් සත්ව රූප රැස අතරෙහිදී සිංහයින්, ගවයින්, හාවුන්, අලි ඇතුන්, අශ්වයින් හා හංසයින් වැන්නන්ගේ රූප ඉතා ඉදිරියෙන් සිටින බව පෙනේ. කල්පිත රූප සටහන් අතරදී මිථ්‍යා සතුන් ගණයෙහිලා සැලකිය හැකි සෙරපෙන්දියා, භේරුණ්ඩ පක්ෂියා හා ඇත්කඳ ලිහිණියා වැනි පක්ෂීන් මෙන්ම ගජසිංහ හා කින්නර වැනි සත්ව රූප කිහිපයකුත් එපමණක් නොව නාරිලතා වැනි අර්ධ මානව හා අර්ධ උද්භිදමය රූප සටහනුත් දක්නට ලැබේ. මෙහි නිරූපිත සැරසිලි අංග රැස අතරෙහිදී ඉතාමත්ම වැදගත් තැන හිමිවී ඇත්තේ විවිධ මල් වර්ග රැසකට බව පෙනේ. නෙළුම්, සීන, සපු, නා හා පිච්ච වැනි මල් වර්ග කිහිපය ඒ අතුරින් ඉතා ඉදිරියෙන්ම සිටින අතර මල් පෙත්තක් ලෙසට ඇඳ ඇති පලාපෙති හා ලියවැල් වැනි සැරසිලි අංග ද මෙහි සුලභ ලෙසට භාවිතකර තිබෙනු දක්නට ලැබේ. ඒ හැරුණු විට මේ චිත්‍ර අතරදී හමුවන චතුර්නාරී පල්ලැක්කිය, පංචනාරී ඝටය, සප්තනාරී රථය, නවනාරී කුඤ්ජරය හා වෘෂභ කුඤ්ජරය වැනි සංයුක්ත රූප සටහන් කිහිපයද ඉතා ප්‍රමුඛ තැනක් හිමිකර ගන්නා බව පෙනේ. මේවා ඉතා වැදගත් වුණු පැරණි සිංහල සැරසිලි විචිත්‍රාංග කිහිපයක් වුවද මෙබඳු රූප සටහන් පිළිබඳ ව තොරතුරු හමුවන්නේ ඉතා කලාතුරකින් වන බැවින් මේ චිත්‍රවලට හිමිවන විශේෂත්වය කෙබඳු මට්ටමක පවතින්නේ දැයි වටහාගත හැකිය.

මෙතෙක් දැක්වූ විස්තරවලට අනුව ක්‍රි.ව. හතරවැනි සියවසේ අග භාගයේදී අනුරාධපුරයේ සිට රාජ්‍ය විචාළ සිරිමේඝවණ්ණ රජුගේ කාලයෙහිදී (362 - 409) ශ්‍රී ලංකාවට දන්තධාතුන් වහන්සේ වැඩමවීමේ සිද්ධියෙන් අනතරුව, මහනුවර සමය තෙක් වුණු දළ ලෙස සියවස්

පහළොවකට පමණ අසන්න අතිදීර්ඝ කාලපරිච්ඡේදය පුරා මෙරට පැවති සෑම අගනගරයකදීම වාගේ ඒවායෙහි අත්‍යවශ්‍ය විශේෂාංගයක් ලෙසට දළදා මැඳුරට ඉතා වැදගත් තැනක් හිමිවී තිබුණු බව හොඳින් පැහැදිලි වේ. බුදුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේ නමක් වීම හේතුකොට ගෙන එහි තිබෙන මහානර්ඝ පූජාර්හ බව පිළිබඳ සැදැහැවත් බෞද්ධයින් තුළ පවත්නා ගෞරවාන්විතභාවය නිසා පමණක් නොව දළදා වහන්සේගේ හිමිකම දරන්නාට ලක් රජය හිමිවෙතැයි යන දුරාතීතයෙහිදී සිට පැවතුණු සංකල්පයද මේ තත්වය සඳහා හොඳින් බලපාන ලද බව පෙනේ. එහෙයින් විවිධ අවධීන්හි සිටි පාලකයින් දළදා වහන්සේ තැන්පත් කොට තිබුණු මන්දිරයන්හි ආරක්ෂාව කෙරෙහි පමණක් නොව ඒවා ජරාජීර්ණ වී යාමට ඉඩනොදී සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කිරීමට ද, ඉමහත් පරිශ්‍රමයක් දරා ඒවා සැරසිලි කිරීමට ද නිතර උත්සුක වූ බව පැරණි අවධීනට අයත් වන දළදා මැඳුරු පිළිබඳව කියැවෙන විස්තරවලින් වටහාගත හැකිය. මෙබඳු සැරසිලි අංග සුලභ ලෙසට භාවිත කිරීමෙන් එම ස්ථානයෙහි පවත්නා සුවිශේෂී බව හොඳින් හැඟවීමටද පැරැණ්නන් සමත් වූ බව පෙනේ. පුරාතන අවධියෙහිදී සිටම මෙබඳු තත්වයක් පැවති බව පැරණි දළදා මැඳුරු ගැන කියැවෙන විස්තර කෙරෙහි අවධානය යොමු කරන්නෙකුට හොඳින් අවබෝධ කොටගත හැකි වෙතත් එම අවධීනට අයත් වන, ස්ථාවර ලෙස සකසා තිබුණු ප්‍රධාන දළදා මැඳුරුවලින් මහනුවර පිහිටා ඇති අවසන් නිර්මාණය හැරුණු විට සෙසු සියල්ලෙහිම අද වන විට නටබුන් රැසක් පමණක්ම දක්නට ලැබේ. මේ තත්වය නිසා දැනට ඉතාමත්ම අනර්ඝ ලෙසින් සුරැකී තිබෙන, පැරණි අවධියට අයත් මහනුවර පිහිටි ශ්‍රී දළදා මන්දිරයට හිමිවන්නේ අතිවිශේෂ වැදගත් තැනක් බව අමුතුවෙන් සඳහන් කළයුතු නොවේ. පුරාතන සමයට අයත් ලක්දිව අන්‍ය අගනගරයන්හි පිහිටි පැරණි දළදා මැඳුරු මෙන් නොව මෙය ඊට වඩා මෑත කාලීන අවධියකට අයත් නිර්මාණයක් වීම එලෙස හොඳින් සුරක්ෂිත වී තිබීමට බලපා ඇති එක් ප්‍රධාන හේතුවක් විය හැකිය.

මහනුවර නගරයට නැගෙනහිර දිගින් ගොඩනගා ඇති, රජ මාළිගයට යාබද භූමි භාගයේ ඊටම සම්බන්ධ කොට මෙන් ඉදිකොට ඇති මෙම දළදා

මැඳුරෙහි විචිත්‍රත්වය ආරක්ෂා කිරීමට මහනුවර යුගයේ දී සිටි සෑම පාලකයෙකුටම පාහේ නිතරම උත්සාහ කොට ඇති බව එම අවධීනට අයත් වන මූලාශ්‍රවල සඳහන් වන කෙටි විස්තරවලින් වුවද පැහැදිලි වේ. ඉතාමත්ම විසිතුරු ලෙසට ගෘහනිර්මාණ ශිල්පය හොඳින් ප්‍රයෝජනයට ගෙන ඇති ආකාරයත්, කැටයම් හා චිත්‍ර වැනි අනෙකුත් කලාංගයන් එහි ප්‍රධාන සැරසිලි මාධ්‍යයන් ලෙසට භාවිතයට ගෙන ඇති ආකාරයත් මෙහිදී හොඳින් කැපී පෙනේ. අද වන විට මෙහි ශේෂවී තිබෙන මෙබඳු පැරණි කලංගයන් දෙස අවධානය යොමු කරන බොදු සැදැහැවතෙකුගේ හෝ අන්‍යාගමික විදේශිකයෙකුගේ හෝ යන කවරෙකුගේ වුවද සෘජු දර්ශනයට එක්වරම හසුවන්නේ අනෙකුත් කලාංගයන්ට වඩා එහි ඇඳ තිබෙන සිතුවම් රැසම බව පෙනේ. සෙසු කලා මාධ්‍යයන් අතුරින් සිතුවම් කලාවට මෙහිදී ප්‍රමුඛස්ථානයක් ලබාදී තිබීම ඒ තත්වයට මඟපාදා දී තිබේ. මේ හැරුණු විට දළදා මන්දිරයට සම්බන්ධ හේවිසි පූජා සහ ඇසළ පෙරහැර වැනි තවත් කලාංග රැසක්ම භාවිතයේ පවත්නා බවට තොරතුරු හමුවන නමුත් ඒවා පිළිබඳව මෙහිදී අවධානය යොමු කිරීමට අපේක්ෂා නොකෙරේ.

## පාදක සටහන්

1. **දාඨාවංසය**, සංස්. සීලාලංකාර හිමි, අලුත්ගම, 1914, 297 -300, පද්‍ය; **දළදා සිරිත**, වැලිවිටියේ සෝරත හිමි, ගුණසේන සමාගම, කොළඹ, 1970,පි. 30 -31, **දළදා පූජාවලිය**, සංස්. බන්දුසේන ගුණසේකර, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළම, 1997, 265 - 267 පද්‍ය.
2. **Culavamsa,** tr.W.Geiger, Ceylon Government Information Department, Colombo,. Vol. I, 1953, 37; 92 - 93.
3. **දාඨාවංසය,** සංස්. සීලාලංකාර හිමි, 339 - 340 පද්‍ය.
4. S Paranavitana, "The sculpture of man and horse near Tisavewa at Anuradhapura Ceylon," **Artibus Asia**, Ascona, Switzerland, Vol. XVI, No.3, 1953, pp.181-182.
5. **දාඨාවංසය,** සංස්. සීලාලංකාර හිමි, 374 -375 පද්‍ය.
6. **Culavamsa,** tr. W. Geiger, 37; 94 - 96.
7. Fa-Hsien, **Record of the Buddhistic kingdoms: Being an account of Fa- Hsien**, tr. James Legge, Oxford University Press, London, 1886, P.47.
8. **Culavamsa,** tr. W. Geiger, 38; 70 - 72.
9. Ibid, 42; 33.
10. Ibid, 54; 45.
11. AM Hocart, **Memoris of the Archaeological Survery of Ceylon**, Government Printer, Colombo, Vol. I, 1924, pp 49-53; **Epigraphia Zeylanica**, ed. DM de Z Wickramasingha, Vol. I, p.114.
12. **Culavamsa,** tr. W. Geiger, 57; 22.
13. Ibid, 60; 16.

14. **Epigraphia Zeylanica**, ed. DM de Z Wickramasinghe, Oxford University Press , London, Vil. II, 1928, pp. 242-255.
15. S Paranavitana, **University of Ceylon History of Ceylon**, Ceylon University Press, Colombo, Vol.I, part II, 1960, pp.591, 608; **Archaeological Survey of Ceylon Annual Report 1903**, Government Printer, Colombo, 1908, pp.6-11.
16. **Culavamsa,** tr. W. Geiger, 61; 56-58
17. Ibid, 61; 59-61.
18. **Culavamsa,** tr. W. Geiger, Ceylon Government Information Department, Colombo, Vol. II, 1953, 74; 100-107.
19. Ibid, 74; 198.
20. Ibid, 73; 127-135.
21. Ibid, 78; 40-41.
22. Ibod, 80; 19; **දළදා සිරිත,** වැලිවිටියේ සෝරත හිමි, ගුණසේන සමාගම, කොළඹ, 1970, පි. 43; **පූජාවලිය**, සංස්. බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය, කළුතර, 1930, පි. 734, **රාජාවලිය**, සංස්. වතුවත්තේ පේමානන්ද හිමි, කොළඹ, 1959, පි.68; **රාජරත්නාකරය**, සංස්. සයිමන් ද සිල්වා, කොළඹ, 1907, පි. 36.
23 **Epigraphia Zeylanica** , ed. DM de Z Wickramasinghe, Vol. II, pp. 84-98, 98-123, 123-137.
24. **පූජාවලිය,** සංස්. බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය, පි. 734.
25. S Paranavitana, **The Stupas in Ceylon**, Government Press Colombo, 1946, P.82; **Ceylon Journal of Science Section G**, ed, AM Hocart & S Paranavitana, Governmet Press, Colombo. Vol. II, 1928-33, p.166.
26. මේ පිළිබඳ වැඩි විස්තර සඳහා බලන්න HCP Bell, **Archaeological Survey of Ceylon Annual Report 1903**, Government Printer,

Colombo, 1908, pp.11-13; SM Burrows, **The buried cities of Ceylon**, Observer Printing Works, Colombo, 1899, pp.89-100.

27. Culavamsa, tr. W. Geiger, 80; 57-78.
28. Ibid, 81; 20-21.
29. Ibid, 81; 20-29.
30. Ibid, 81; 34-38.
31. RW Levers, "Beligala, **"Journal of the Royal Asiatic Society (Ceylon Branch**), Vol. VIII, No. 29, 1884, P.352; HCP Bell, The Report on the Kegalla District of the **Province of Sabaragamuwa**, Government Printer, Colombo, 1904, pp.25-28.
32. **Calavamsa**, tr, W. Geiger, 82; 6-9.
33. Ibid, 85; 1,24-42.
34. Ibid, 85; 90-93.
35. Ibid, 89; 39-46.
36. HCP Bell, **Archaeological Survey of Ceylon Annual Report 1910-11.** Government Printer, Colombo, 1914, pp. 55.56; S. Paranavitana, **University of Ceylon** History of Ceylon, Vol.I, pt II, Colombo, 1960, p. 781.
37. **Calavamsa**, tr, W, Geiger, 90; 43-46.
38. Ibid, 90; 48-56.
39. Ibid, 90; 66-67.
40. HCP Bell, <u>The Report on the Kegalla District of the Province of Sabaragamuva, pp. 78-79.</u>
41. **සිංහල දළදා වංසය,** සංස්. එච් සාරානන්ද හිමි, කොළඹ, 1916, පි. 43 සහ 67.
42. **Calavamsa**, tr, W, Geiger, 91; 12.

43. මැන්දිස් රෝහණධීර, **අස්ගිරියේ තල්පත**, විද්‍යෝදය විශ්වවිද්‍යාලය මුද්‍රණාලය, කොළඹ, 1669, පි.9.

44. **Calavamsa**, tr, W. Geiger, 91; 17-19.

45. **සැළලිහිණි සංදේශය**, සංස්. කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර හිමි, කැලණිය, 1957, 5 පද්‍යය; **හංස සංදේශය**, සංස්. රත්මලානේ ශ්‍රී ධර්මාරාම, කැලණිය, 1955, 46 පද්‍යය; **ගිරා සංදේශය**, සංස්. මකුළුදූවේ පියරතන හිමි, කොළඹ, 1948, 50 පද්‍ය; **පරෙවි සංදේශය**, සංස්. කුමාරතුංග මුණිදාස, කොළඹ, 1958, 43 පද්‍යය.

46. **සිංහල දළදා වංසය**, සංස්. එච්. සාරානන්ද හිමි, පි. 73.

47ග එම, පි.74.

48. Fernao De Queyroz, **The Temporal and Spiritual Conquest of Ceylon**, tr. SG Perera, Government Printer, Colombo, Vol. II, 1930. pp.364-365.

49. කුඹුරුගමුවේ වජිර හිමි, දළදා ඉතිහාසය හා සංස්කෘතිය, පි.88; Dhararatana Herath, **The Tooth relic and the crown,** Gunarathna Offset, Colombo, 1994, pp.90-112.

50. එම්. සෝමතිලක, "මහනුවර දළදා මැදුරෙහි පැරණි ප්‍රතිසංස්කරණ සහ එහි චිත්‍රවල කාලනිර්ණය", **මහනුවර නගරය**, සංස්. ගොඩගම මංගල හිමි, බ්‍රාවී මුද්‍රණාලය, මහනුවර 1988, පි.40-63.

51. කුඹුරුගමුවේ වජිර හිමි, **දළදා ඉතිහාසය හා සංස්කෘතිය**, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල, 1983, පි. 147.

52. **දළදා වංසය**, සංස්. මිණිගමුවේ ඉන්දරතන හිමි, ගුණසේන සමාගම, කොළඹ, 1957, පි.77; Calavamsa, tr, W. Geiger, 93; 11-14 vv.

53. දෙගම්මැද සුමනජෝති හිමි, "විදුර ජාතකය" **සිංහල සඟරාව**, 3 වන කලාපය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය සිංහල සංගමයේ ප්‍රකාශනය, 1962/63, පි.330 - 333; **විදුර ජාතක කාව්‍යය**, 9-20 පද්‍යයන් බලන්න. තවද මේ සඳහා බලන්න පුංචිබණ්ඩාර සන්නස්ගල, **සිංහල සාහිත්‍ය**

**වංශය,** ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ, 1967, පි. 329-330 මේ ග්‍රන්ථයේ මුල් පද්‍යවලින් මහනුවර රාජධානියෙහි රජු සහ ඔහුගේ සෙන්පති ගැන වර්ණිතය. ජාතක කථාවට සම්බන්ධ කොටසින් එය වෙන් වූවත් කාව්‍යයෙහි සම්පූර්ණත්වයට එයින් හානියක් සිදුවී නොමැත. ඒ.එච්. මිරන්ඩෝ, **17-18 සියවස්හි සිංහල සාහිත්‍යය**, ඇස්. ගොඩගේ සමාගම, කොළඹ, 1986, පි.48-49ග

54. **දළදාවංසය**, සංස්. මිණිගමුවේ ඉන්දරතන හිමි, පි.78.
55. එම. පි. 80.
56. S.G. Perera, **A History of Ceylon**, The Associated News Papers of Ceylon, Lake House, Colombo, p. 99; **කොටගම වාචිස්සර හිමි, සරණංකර සංඝරාජ සමය,** වයි. දොන් ඇඩ්වින් සමාගම, කොළඹ 1960, පි. 24.
57. **රාජාවලිය,** සංස්. ඒ.වී. සුරවීර, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස්, කොළඹ, 1978, පි. 239-240.
58. **දළදාවංසය,** සංස්. මිණිගමුවේ ඉන්දරතන හිමි. පි.81; **Calavamsa**, tr, W, Geiger, Billing and sons, Great Britain, 1953, 95; 5 v
59. **දළදාවංසය,** සංස්. මිණිගමුවේ ඉන්දරතන හිමි, පි.82-83; **Calavamsa**, tr, W, Geiger, 95; 25-28 vv.
60. **Culavamsa**, tr, W, Geiger, 96; 40-46 vv.
61. ආනන්ද කුමාරස්වාමි, **මධ්‍යකාලීන සිංහල කලා,** පරි. එච්.ඇම්. සෝමරත්න, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ, 1962, පි. 11; කුඹුරුගමුවේ වජිර හිමි, **දළදා ඉතිහාසය හා සංස්කෘතිය,** පි.296.
62. ගුන්නෑපානේ වජිරඤාණ හිමි, **විහාර වග විත්ති,** ගුණසේන සමාගම, කොළඹ, 1961,පි.132; සිහිල් ඇම්. සිරිසේන, "ශ්‍රී ලංකාවේ බිතුසිතුවම්" සතර, 1985 සැප්. 18 බදාදා පි. 15; Sirima Kiribamune. "Sri Lankan Art and Architecture during the sixteenth, seventeenth and eighteenth centureies, **"University of Peradeniya History of**

**Sri Lanka**, ed.K.M. de Silva, Sri Devi, Dehivala, Vol. II. 1995,p. 519; Marie Gatallier, Pentures murales du Sri Lanka ecole Kandyenne VII-XIX siecles, Publication de I Ecole Francaised Extreme orient. Paris Vol. I. I. 1991, p.33.

63. කුඹුරුගමුවේ වජිර හිමි, **ලක්දිව දන්තධාතූන් වහන්සේගේ ඉතිහාසය හා තදාශ්‍රිත පූජාවිධි**, දර්ශන විශාරද උපාධි නිබන්ධය, 1974, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ප්‍රධාන පුස්තකාලය, පි. 345; කුඹුරුගමුවේ වජිර හිමි, **දළදා ඉතිහාසය හා සංස්කෘතිය**, පි. 286.

64. ආනන්ද කුමාරස්වාමි, **මධ්‍යකාලීන සිංහල කලා**, පි.11.

65. අනුරාධ සෙනෙවිරත්න, **දළදා මැඳුර**, පරි. වරකාවේ ධම්මාලෝක හිමි, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ, 1990, පි.70; Anuradha Senavirathna, **The Temple of the Sacread Tooth Relic**, Aitken Spence Printing Ltd, Colombo, 1987. p.11.

66. **සුළු රාජාවලිය**, සංස්. ඩී.පී.ආර්. සමරනායක, ෆ්‍රි ප්‍රෙස් සමාගම, මරදාන, 1959. පි.46.

67. **Culavamsa**, tr, W, Geiger, 99; 142.

68. **සුළු රාජාවලිය**, සංස්. ඩී.පී.ආර්. සමරනායක. පි.44.

69. කුඹුරුගමුවේ වජිර හිමි, **ලක්දිව දන්තධාතූන් වහන්සේගේ ඉතිහාසය හා තදාශ්‍රිත පූජාවිධි**, පි. 357.

70. T.K.N.P. de Silva, **Temple of the Tooth Kandy Architecture sculpture Painting**, Conservation Project UNESCO Sri Lanka Cultural Triangle Project Kandy, State Printing Corporation, Colombo, Publication No.26. p.17.

71. කුඹුරුගමුවේ වජිර හිමි, **ලක්දිව දන්තධාතූන් වහන්සේගේ ඉතිහාසය හා තදාශ්‍රිත පූජාවිධි**, පි. 357.

72. Ananda Coomaraswamy, **Mediaval Sinhalese Art**, Pantheon Books, New York, Second edition, 1956. 9.ii.

73. ආනන්ද කුමාරස්වාමි, මධ්‍යකාලීන සිංහල කලා, පි.322.
74. එම, මෙහි තිබෙන XVI චිත්‍ර පුවරුව බලන්න.
75. එම, පි. 118.
76. එම, පි. 167.
77. Ananda Coomaraswamy, An open letter to the kandyan chiefs, Arts council of Ceylon, Colombo, 1957. See Preface 1905 පෙබරවාරි මස 17 වැනි දින **සිලෝන් ඔබ්සවර්** පත්‍රයෙහි මේ ලිපිය පළකොට තිබේ.
78. Ibid, p.4.
79. ආනන්ද කුමාරස්වාමි, **මධ්‍යකාලීන සිංහල කලා,** XVI චිත්‍ර පුවරුව බලන්න.
80. කුඹුරුගමුවේ වජිර හිමි, **ලක්දිව දන්තධාතූන් වහන්සේගේ ඉතිහාසය හා තදාශ්‍රිත පූජාවිධි**, පි.35.
81. එම. පි.357; කුඹුරුගමුවේ වජිර හිමි, **දළදා ඉතිහාසය හා සංස්කෘතිය**, පි. 278.
82. කුඹුරුගමුවේ වජිර හිමි, **ලක්දිව දන්තධාතූන් වහන්සේගේ ඉතිහාසය හා තදාශ්‍රිත පූජාවිධි**, පි. 358.
83. අනුරාධ සෙනෙවිරත්න, **දළදා මැඳුර**, පරි. වරකාවේ ධම්මාලෝක හිමි, පි.68-74.
84. T.K.N.P. de Silva, **Temple of the Tooth Kandy Architecture sculpture Painting**, p.17.
85. Anuradha Seneviratne, **The Temple of the Sacread tooth relic**, p.108.

# දළදා පෙරහැර හා සංගීතය

**කථිකාචාර්ය, මනෝජ් අලවතුකොටුව**
ලලිත කලා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

දළදා මාළිගය හා කලාව අතර පවතින්නේ අවියෝජනීය සබඳතාවයකි. ඒ අතරින්ද නර්තනය හා සංගීතයට සුවිශේෂී ස්ථානයක් ලැබේ. දළදා මාළිගය හා බැඳි දෛනික පුද පූජා රටාවන් පිළිබඳව සලකා බැලීමේදී පවා ප්‍රකට වන්නේ සංගීතයට ඒ අතරින්ද ප්‍රමුඛතම කාර්යයක් හිමි වී ඇති බවයි. දළදා මාළිගය කේන්ද්‍ර කොටගෙන ආගම හා බද්ධ වූ සංගීත සංස්කෘතියක් ගොඩනැගී තිබේ. ඒ අතරින් "කවිකාර මඩුවේ" ගායනයන් හා දේශීය පංචතූර්ය වාද්‍ය සංගීතයෙන් හැඩගැන්වුණු වාද්‍ය සංගීතයට ලැබී ඇත්තේ ඉහළ තැනකි.

මෙම ලිපියෙහි ප්‍රධාන අරමුණ වන්නේ සෑම වර්ෂයකදිම ඇසළ උත්සවය නිමිතිකොට ගෙන පවත්වනු ලබන දළදා පෙරහැරෙහි භාවිත සංගීතය සහ එයින් අපේක්ෂිත කාර්යය පිළිබඳව විග්‍රහ කර බැලීමයි.

සංගීතය නාදය කේන්ද්‍ර කොටගෙන මිනිස් සිතේ හැඟීම් ප්‍රකාශ කිරීමේ කලා මාධ්‍යයක් වශයෙන් හැඳින්විය හැකිය. සකල කලාවන් අතරින් ද සංගීතයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මාධ්‍යයේ සුවිශේෂී බව අනුව ජන, ශාස්ත්‍රීය හා ව්‍යවහාරික වශයෙන් වර්ගීකරණය කළ හැකිය. සංගීතයෙහි මූලික අභිප්‍රාය වන්නේ කලා මාධ්‍යයක් වශයෙන් මිනිස් හැඟීම්වලට ආමන්ත්‍රණය කිරීම වුව ද සමහර අවස්ථාවලදී, නාද මූලික කොටගෙන අදහස් සන්නිවේදනය කිරීමේ ප්‍රබලතාවයක් ද පවතින බව පෙනේ. එහෙත් එවැනි සන්නිවේදනාත්මක අවස්ථා අදාළ සන්දර්භය අනුව වෙනස් වේ.

ලොවෙහි විවිධ සංස්කෘතීන් හා සලකා බලන කල නාද හා මානව ක්‍රියාකාරකම් අතර පවතින්නේ පුළුල් සබඳතාවයක් බව පෙනේ. අතීතයේ

සිටම ලාංකේය ජන සංස්කෘතිය හා සංගීතය අතරත් සමීප ඇසුරක් පැවති බවට සාධක හමුවේ. දේශීය වශයෙන් ලාංකේය සංස්කෘතිය කෙරෙහි උරුමකම් කියන්නේ ජන සංගීතය වුවද වෙනත් සංස්කෘතීන්ගේ සංස්පර්ශයන් හේතුවෙන් භාරතීය හා බටහිර සංගීත ක්‍රමවල ආභාසය මෙරටට ලැබී තිබේ.

ලංකාව බෞද්ධාගමික රටක් වූ බැවින් බුදුසමය හා සංගීතය අතර පැවති සබඳතාවය එතරම් ප්‍රබල නොවීය. බුදුන් වහන්සේ තමන්ගේ දේශනාවලදීම වදාරා ඇත්තේ සූත්‍ර පාඨ ගැයීම පවා ගීත ස්වරයෙන් ඉදිරිපත් නොකරන ලෙසිනි. එසේම දීඝ නිකායෙහි බ්‍රහ්මජාල සූත්‍රයට අනුව ශ්‍රමණ ගෞතමයින් ගී කීම, වීණා වාදනය, නැටීම, රංගනය, අත් තාලම් ගැයීම් ආදියෙන් වැළකුණු බව දන්වන අතරම[1] සිඛ වළඳ විණිස සඳහන් කරන්නේ නැටුම්, ගැයුම්, වැයුම් සංඝයා විෂයෙහි තහනම් කොට තිබූ කලාංගයන් බවයි.[2]

ත්‍රිපිටකගත බුදුසමය අනුව මෙවැනි තත්වයක් තිබුණ ද ජන සංස්කෘතිය හා බැඳී ජන ආගම් හා සංගීතය අතර පවතින්නේ ඉතා සමීප සබඳතාවයකි.

පෙරහැර ද ජන ආගම ඇසුරෙහි බිහිවී වර්ධනය වූ සංකල්පයක් බැවින් ඒ හා සම්බන්ධ සංගීතය පිළිබඳව විග්‍රහ කොට බැලීම යෝග්‍යය. ඉහතින් සඳහන් කළ පරිදි සංගීතය යනු නාද මාධ්‍යයෙන් මිනිස් හැඟීම් ප්‍රකාශ කිරීමේ කලාවක් වුවද පෙරහැර වැනි මාධ්‍යයකදී සංගීතයෙහි කාර්යය ඊට වඩා වෙනස් මඟක දිවේ. එහිදී මිනිස් හැඟීම් ප්‍රකාශ කිරීම වෙනුවට අදාළ අවස්ථාව සඳහා ප්‍රසාංගික බවක් ලබාදීම භාවිත සංගීතයේ මුඛ්‍යාර්ථය වූ බව පෙනේ. ඊට අමතරව සන්නිවේදනාත්මක හා පූජාර්ථමය කෘත්‍යයක් ද දක්නට ලැබේ.

පෙරහැර හා බැඳි සංගීතය දේශීය ජන සංගීතයෙන් හා වෙනත් සංස්කෘතීන්ගේ සංගීතයෙන් පෝෂණය විය. මහනුවර රාජ්‍ය සමයේ දී දකුණු

ඉන්දියාව සමඟ පැවති රාජ්‍යමය සමාජ හා දේශපාලනික සම්බන්ධතා හේතුවෙන් දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයෙහි ආභාසයද එතුළින් විද්‍යාමාන වේ. දක්ෂිණ භාරතීය සංගිතය එකළ පැවති රාජසභා සංගීතය සඳහා යොදා ගැණුනු අතර වර්තමානයේදී පවා දළදා වහන්සේ වෙනුවෙන් ගැයෙන ප්‍රශස්ථිවල කර්ණාටක සංගීත ලක්ෂණ විද්‍යාමාන වේ. මෙම ලක්ෂණ නිරායාසයෙන්ම පෙරහැර කෙරෙහි ද බලපා ඇති බව පෙනේ.

ඒ අතරම බටහිර සංස්කෘතීන්හි සංගීත රටාවන් ද පෙරහැරෙහි වාදනය වූ බවට සාධක ලැබේ. බ්‍රිතාන්‍යයින් විසින් පෙරහැර කරවූ සමයෙහි දී බටහිර සංගීතාංග යොදාගෙන තිබේ. "ජෝන් ඩොයිලි (John D'oyly') දුටු පෙරහැර පිළිබඳව කෙරෙන විස්තරය මේ පිළිබඳව සාධක සපයා ගත හැකි හොඳම මූලාශ්‍රය වේ. ඔහුගේ විස්තරයට අනුව එවක පෙරහැරේදී ට්‍රම්පට් (Trumpet) සහ තම්මැට්ටම වැයූ බවත්, ලංකා රයිෆල් රෙජිමේන්තුව (Ceylon Rifle Regiment) බටහිර ස්වර ලිපි අනුව ඔවුන්ගේ බෙර වැයු බවත් විස්තර කොට තිබේ.[3] සාමාන්‍යයෙන් ස්වර ලිපි බලා බෙර වාදනයන් ඉදිරිපත් නොකරනු ලබන අතර එයින් ද ප්‍රකට වන්නේ ස්වර වාද්‍ය භාණ්ඩ වාදනය කොට ඇති බවයි. ඒ අතරම පශ්චාත් මහනුවර සමයට අයත් පහතරට විහාර බිතුසිතුවම්වලද බටහිර අවනද්ධ වාද්‍ය භාණ්ඩ (Drums) සමඟ ට්‍රම්පට් (Trumpet) වයන අවස්ථා ඇතුළත් සිතුවම් හමුවේ. ඒ අතරින් කරගම්පිටිය විහාර සිතුවමක සහ පානදුර රන්කොත් විහාරයේ සිතුවමක පෙරහැර නිරූපණය කරන අවස්ථාවලදී යුරෝපීය හමුදා ඇඳුමින් සැරසුණු නිලධාරීන් ට්‍රම්පට් (Trumpet) ට්‍රම්බෝන් (Trumbone) සහ බටහිර බේස් ඩ්‍රම් (Base Drum) වයන ආකාරය නිරූපණය කොට තිබේ.

මහනුවර යුගයේ රාජ සභාවට අයත් සංගීත හා නැටුම් පිළිබඳ ආයතන පහක් වූ අතර "තඹරු හා පුරප්පෙට්ටු" කාරාංශයෙහි කාර්යය ලෙස හඳුන්වා ඇත්තේ ගන්නෝරුවේ සිට රාජ සභාව තෙක් විදේශීය තානාපතිවරුන් රැගෙන ඒමයි.[4] මෙහිදීද පුරම්පෙට්ටුව යනුවෙන් හඳුන්වා ඇත්තේ "ට්‍රම්පට්" නම් සංගීත භාණ්ඩයයි. එවකට පෘතුගීසි හමුදාවල භාවිත

වූ ප්‍රධාන සංගීත භාණ්ඩයක් වූ හෙයින් "ට්‍රම්පට්" නම් සංගීත භාණ්ඩය පෙරහැරේදී වාදනය කළා යැයි ඩේවි සඳහන් කරන ප්‍රකාශය සත්‍යයැයි ඉහත උධෘතවලින් ද සඳහන් වේ.

විදේශීය හමුදාවන් පරාජය කරමින් ඔවුන්ගෙන් පැහැර ගත් සංගීත භාණ්ඩ ද පෙරහැරේ ගෙනයෑම සිරිතක් වී තිබුණු බව පෙනේ.[5] ඒ අතරින්,

1. 1529 දී විමලධර්මසූරිය රජු ගන්නෝරුවේදී පෘතුගීසි හමුදාව පරාජය කොට ලබාගත් යුධ බෙරය.
2. 1750 දී රාජසිංහ රජු ඕලන්ද හමුදාව දන්තුරේදී පරාජය කොට ලබාගත් යුධ බෙරය.
3. 1803 දී බ්‍රිතාන්‍ය හමුදාව වාගොල්ලේදී පැරදවූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් දිනාගත් යුධ බෙර දෙකක් එලෙස ගෙනගිය සංගීත භාණ්ඩ වේ.

ඉහත සඳහන් සාධකවලින් පිළිබිඹු වන්නේ දේශීය ජන සංගිතයට අමතරව භාරතීය හා බටහිර සංගීතය ද පෙරහැරේදී වාදනය කොට ඇති බවයි. ඒ අතරම වර්තමානය වන විට ජපන් සංගීතයට ද මහනුවර දළදා පෙරහැර තුළ යම් ස්ථානයක් ලැබී ඇති බව පෙනේ. ජපන් හිමිනමක විසින් වයනු ලබන සාම්ප්‍රදායික බෙරයක් ඒ අතර සුවිශේෂි වේ.

මේ ආදී වශයෙන් සංගිතමය සංස්කෘතීන් කිහිපයක එකතුවක් ලෙස ද මහනුවර පෙරහැරේ සංගිතයෙහි විශේෂත්වයක් තිබේ.

දළදා පෙරහැරේදි භාවිත වන සංගීතය පෙරහැරට ප්‍රථමව දළදා මාළිගයේ දී සිදුවන චාරිත්‍ර වාරිත්‍ර සමඟ බැඳී ඇති ගායන වාදන අංග සේම වීථි සංචාරය කොට නැවත මාළිගයට ගෙවදින අවස්ථාව තෙක් ඉදිරිපත් කෙරෙන ගායන වාදන අංගයන්ගෙන් සමන්විත වේ. දළදා පෙරහැරට අමතරව නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි යන සිව් දේවාල පෙරහැරවලද ගායන හා වාදනාංග අන්තර්ගත වන අතරම එමඟින් සමස්ත පෙරහැරටම විචිත්‍රත්වයක් ලැබේ. එහෙත් මෙම ලිපියේදී මාගේ අවධානය යොමුවන්නේ

දළදා මාළිගයෙහි පෙරහැරේ භාවිත සංගීතය පිළිබඳ විග්‍රහ කිරීම කෙරෙහිය. එහිදී වුවද කැපී පෙනෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ දළදා පෙරහැරෙහි සහ සිව් දේවාල පෙරහැරෙහි භාවිත ගායන වාදන අංගයන්හි පවතින විශේෂ වෙනස්කම්ය. දළදා මාළිගයෙහි පෙරහැරෙහි වාදන අංග හා වාදනයෙහි ලය (තාලයේ වේගය) සාමාන්‍යයෙන් විලම්බිත සහ මාධ්‍යලය අතර පවතී. ඊට හේතුව වන්නේ එය බුදුන් උදෙසා ඉදිරිපත් කෙරෙන පූජා කර්මයක් වීමය. එහෙත් දේවාල පෙරහැර සහ වාදනාංග අතර පවතින රිද්මයන්හි භාවිත ලයෙහි වේගවත් බවත් දිටිය හැකිය. ඊට හේතුව වන්නේ හින්දු සංස්කෘතියේ අංග ලක්ෂණ බලපා ඇති බැවිනි. ඒ අතරම හේවිසි වාදනයන්හිදී වයනු ලබන බෙර පදවලද විවිධත්වයක් පවතී. සාමාන්‍යයෙන් ආගමික ධූරාවලිය තුළ "දේවාතිදේව" වශයෙන් වැඩසිටින්නේ බුදුන්වහන්සේය. උන්වහන්සේ වෙනුවෙන් මාළිගයේදී වයනු ලබන බෙර පද අන්‍ය කිසිදු සිද්ධස්ථානයකදී වයනු නොලැබේ යන්නද මතයක් වී තිබේ. ඒ අතරම ඊට බලපා ඇති තවත් එක් හේතුවක් වන්නේ සම්බන්ධවන වාදන ගුරු කුලයන්හි විවිධත්වයයි. ගුරුකුල හා ගුරු පරම්පරාවලට අනුව බෙර පද හා වාදන ශිල්ප විධින්හී ද වෙනසක් දිටිය හැකිය.

පෙරහැරෙහිදී වාදනය සහ ගායනය සම්බන්ධවන ප්‍රධානම අවස්ථාව වන්නේ දළදා පෙරහැරේ වැඩමවීම සඳහා ධාතු කරඬුව , වැඩ සිටින මාලයේ සිට ඇතා පිට තැබීම සඳහා වඩමවනු ලබන මොහොතයි. එහිදී හේවිසි මණ්ඩපයේ සිටින හේවිසි වාදකයින් තූර්ය ඝෝෂා පවත්වයි. අදාළ නැකතට අනුව දළදා කරඬුව වඩම්මනු ලබන විටදී ජය සංඛ නාදය වැයෙන අතරම කවිකාර මඩුවේ ගායකයින් දළදා ස්තෝත්‍ර ගායනය කරයි. දළදාව ඇතු පිට තබනු ලබන අතරම පෙරහැර ගමන් ගත යුතු බවට සංඥා කරලීමේ අටියෙන් ගමන් හේවිසි පද වාදනය කිරීම ඇරඹේ.[6]

පෙරහැරේදී ප්‍රධාන වශයෙන්ම පංචතූර්ය වාදන භාණ්ඩවලින් ඉදිරිපත් කෙරෙන වාද්‍ය සංගීතයට වැදගත් ස්ථානයක් හිමිවේ. ඒ සඳහා ආතත, විතත, විතතාතත, ඝන සහ සුෂිර යන සංගීත වර්ගීකරණයට අයත් සංගීත භාණ්ඩ යොදා ගැනේ. මෙම සංගීත භාණ්ඩ සැම විටම එකම

අවස්ථාවක වාදනය වීම දක්නට නොලැබෙතත් අදාළ අවස්ථාවන්වලදී භාණ්ඩ කිහිපයක් හෝ එකට වාදනය කිරීම දක්නට ලැබේ. ඒ අතරම සමහර සංගීත භාණ්ඩ වාදනයට වඩා ඒ ආශ්‍රයෙන් ඉදිරිපත් කෙරෙන නර්තනාංගවලට ප්‍රමුඛතාවයක් ලැබේ.

සාමාන්‍යයෙන් පෙරහැරකදී අත්‍යාවශ්‍යම අංගයක් ලෙස සැලකිය හැක්කේ හේවිසියයි. එමගින් පෙරහැර තුළට රිද්මයක් සහ සජීවී බවක් එකතු කරලයි. හේවිසි වාදනයේදී දවුල, තම්මැට්ටම, හොරණෑව වැනි සංගිත භාණ්ඩ යොදා ගැනේ. මෙම වාද්‍ය භාණ්ඩ මගින් ගමන් තාල පද, වයනු ලබන ශිල්පීන් කිසියම් රිද්මයකට අනුව ගමන් කිරීම ද පෙරහැරට ලබාදෙන්නේ සෞන්දර්යාත්මක මුහුණුවරකි.

දළදා මාළිගාවේ පෙරහැරේදී හේවිසි වාදන ශිල්පීන් විසින් වයනු ලබන පද අතර "ජේංග ..... ජෙනක්කිට..... තක්කිට.....තරිකිට.... " යන පදයෙන් පූර්වෝක්ත රිද්මයට අනුබලයක් ලැබෙන බවද පෙනේ.

හේවිසි වාදනයේදී හොරණෑවෙන් වාදනය වන්නේ ගජගා වන්නමේ නාද රටාවයි. දළදා පෙරහැරේ වාදනය වන ගජගා වන්නමේ නාද රටාවට වැදගත් ස්ථානයක් හිමිවන බව පෙනේ. හේවිසි වාදකයින්ගේ ගමන්තාල පදයේ රිද්මයට අනුව හොරණෑවෙන් ගජගා වන්නමේ නාදය වැයෙද්දී පෙරහැරට ජීවයක් ලැබේ. දළදා මාළිගයේදී නම් දෛනික තේවා කර්මයන්හිදී හොරණෑවෙන් වාදනය කෙරෙන්නේ දළදා වහන්සේ නැමදීමේ ගාථාව සහ ජයමංගල ගාථාවන්හී නාදරටාවන්ය. මෙම ගාථාවල නාද රටාවෙහි නාදාත්මක විවිධතාවයන් දක්නට නොලැබේ. දළදා මාළිගයේ පෙරහැර පුරාවටම අසන්නට ලැබෙන්නේ නාද තනුවක් වශයෙන් ගජගා වන්නමේ නාද රටාව පමණි. .

හේවිසි වාදනයට අමතරව උඩැක්කි, තාලම්පොට, පන්තේරු වැනි සංගීත භාණ්ඩ අත දරා ඉදිරිපත් කරනු ලබන නර්තනාංග ද අන්තර්ගත වන

අතර එහිදී ඉදිරිපත් කෙරෙන ගායනාංගත් සමහර අවස්ථාවලදී ඉදිරිපත් කෙරෙන වාදනාංගවල හඬත් නාද ලාලිත්‍යයක් එකතු කරලයි.

සංගීත භාණ්ඩ අතර "උඩැක්කිය" ආතත භාණ්ඩ සණයට අයත් වේ. උඩැක්කියේ වයනු ලබන ප්‍රධාන බෙර පද කිහිපයක් ඇති අතර ඒවා "දොංත පහ" යන නමින් හැඳින්වේ. උඩැක්කි නර්තනයේදී නර්තන ශිල්පියාගේ නිර්මාණ ශිල්පීයත්වය මනාව විදහා දක්වේ. එහිදී නර්තනය, ගායනය හා උඩැක්කිය වාදනය යන කාර්යයන් ත්‍රිත්වයෙහි එකවිට යෙදීමට ශිල්පියාට හැකිවිය යුතුය. එහෙත් වර්තමානයේදී උඩැක්කි නැටුමකදී උඩැක්කිය ප්‍රදර්ශිත භාණ්ඩයක් වශයෙන් පමණක් නර්තනයට යොදාගෙන ඇති බව පෙනේ. ඉහත දී සඳහන් කරනු ලැබූ උඩැක්කි පද වැයීම වෙනුවට ඒ සඳහා ද පසුබිමින් "ගැටබෙරය" වාදනය කෙරේ. පන්තේරු, තාලම්පට වැනි නර්තන අවස්ථාවන්හිදී ද එවැනි තත්වයන් දක්නට ලැබෙන අතර බොහෝ විට තාලම්පොට වාදනයෙහිදී නම් එහි ආඝාත දෙකහි (තිත් හා තෙයි) හඬ වෙන වෙනම ශ්‍රවණය කළ හැකිවේ. එක් එක් වාද්‍ය භාණ්ඩ රැගෙන ඉදිරිපත් කරනු ලබන නර්තනාංගවලදී ගැයෙන කවි ගායනාවන්හීද සංගිත ලක්ෂණ ඇතුළත් වන අතර ඒ සැම නාද රටාවක්ම සිව්පද ගායනාවන් වශයෙන් හැඳින්විය හැකිය. මෙම කවිවලින් ඉදිරිපත් කෙරෙන්නේ ද වාද්‍ය භාණ්ඩ පිළිබඳවයි. සංගීත භාණ්ඩයේ උපත පිළිබඳව බොහෝමයක් කවිවල සඳහන් වේ. එවැනි කවි ගායනාවල පවා නාදරටාවෙහි සංගීතාත්මක වශයෙන් විවිධත්වයක් දක්නට නොලැබේ. ඊට හේතුව වන්නේ ප්‍රමාණය අතින් පටු ස්වර පරාසයක පමණක් ස්වර විහිදී තිබීමයි.

දළදා පෙරහැරේ දළදා කරඬුව වඩම්මවනු ලබන ඇතාට ප්‍රථමයෙන් නොගේස්වරම් " වාදකයින් ගමන් ගනී."[8] මෙය "නාගසින්නම්, නාගේස්වරම්" යන නම්වලින්ද හැඳින්වෙන අතර දක්ෂිණ භාරතීය වාදන ශෛලියක් ද වේ. හින්දු කෝවිල් ආශ්‍රිතව අනිවාර්යයෙන් වාදනය කරන නාගේස්වරම් වාදනය දළදා මාළිගයේ පමණක් බෞද්ධ සිද්ධස්ථානයක වාදනය කරනු ලබන අයුරු දකින්නට ලැබේ. නානුමුර මංගල්‍යයේදී

අනිවාර්යයෙන්ම වාදනය කෙරේ. නාගසින්නම් වාදනය සඳහා නාගසින්නම් නලාව, කයිතාලම සහ තව්ල් බෙරය යොදාගැනේ. එහෙත් දළදා පෙරහැරේදී නාගසින්නම් නලාව හැර කයිතාලම සහ තව්ල් බෙරය පමණක් යොදා ගැනීම ද විශේෂත්වයක් වේ. ඊට හේතුව වන්නේ නාගසින්නම් නලාව දළදා වහන්සේ උදෙසා පමණක් වැයීමයි. එය තේවා කර්මවලදි (නානුමුරය) පමණක් වාදනය කෙරේ.

දළදා කරඬුව පිටුපසින් ගමන් ගන්නා "කවිකාර මඩුවේ" ශිල්පීහු දළදා ගුණ ගයමින් පෙරහැරේ ගමන් කරති. මෙලෙස ගමන් ගන්නා පෙරහැර නැවත මාළිගාවට ගෙවදීමේ දී ගෙවදුම් පදය ආලත්ති හේවිසිය වාදනය කරනු ලැබේ.

මේ ආදි වශයෙන් ගායන හා වාදනාංග සම්මිශ්‍රණයෙන් හැඩ ගැන්වෙන දළදා පෙරහැරෙහි භාවිත සංගීතයෙහි ප්‍රසංගාත්මක කාර්යයන්ට අමතරව සන්නිවේදනාත්මක හා ආගමික කෘත්‍යයක් ද පවතින බව පෙනේ. පෙරහැර පිළිබඳව කෙරෙන සන්නිවේදනය පෙරහැර පැවැත්වීමට දින කිහිපයකට පෙර සිටම කරනු ලැබූ බව අසන්නට ලැබේ. එහිදී යොදා ගනු ලැබුයේ "අණ බෙරයයි" ඈත අතීතයේ සිටම රාජාඥා දැනුම්දීම සඳහාත්, ජනයා ඒකරාශි කිරීම සඳහාත් අණබෙර වාදනය කරනු ලැබුණි. පෙරහැර පැවැත්වීමට දින දහයකට මත්තෙන් අණ බෙර වයා ප්‍රදේශයේ ජනයාට දැනුම් දුන්බව පාහියන් ගමන් විස්තරයේ සඳහන් වේ.[9] පෙරහැර පැවැත්වෙන දිනයේදී "කස ගැසීමෙන් ද" ඉදිරිපත් කරනු ලැබුයේ එවැනි සන්නිවේදනයකි. කස පිපිරවීම මගින් රජතුමා පෙරහැරේ ගමන් ගත් බව ද සන්නිවේදනය කළ බවට මතයක් පවතී.[10]

පෙරහැරේදී හේවිසි වාදකයින් ද යම් යම් අවස්ථාවලදී බෙර පද මාරු කිරීම මගින් විවිධ සන්නිවේදනයන් ඉදිරිපත් කරනු ලැබේ. සාමාන්‍යයෙන් හේවිසි කණ්ඩායම වාදනය කරනු ලබන්නේ ගමන් හේවිසි පදයන්ය. එහෙත් මං සන්ධියක් ලං වූ විට ගමන් හේවිසි පද වැයීම වෙනුවට වෙනම තාල

පදයක් වැයීම ආරම්භ කරයි. ඒ අතරම පෙරහැර ගමන් ගන්නා මාර්ගයේ පූජනීය ස්ථානයක් පිහිටියේ නම් ඒ අසලදී ද ගමන් නතර කොට "ආචාර බෙර පද" වයා නැවත ගමන් ඇරඹීම විශේෂත්වයක් වේ. අවමංගල්‍ය තූර්ය වාදන අවස්ථාවන්හිදී ද මෙවැනි ලක්ෂණ දක්නට ලැබේ. අවමංගල්‍ය පෙරහැරේදී නම්, පෙරහැර ගමන් ගන්නා මාර්ගය අසල ආගමික ස්ථානයක් හමුවන විට අවමංගල හේවිසි වාදනය සම්පූර්ණයෙන්ම නවතාලයි.

සංගිතය පූජ්‍යාර්ථයක් දැනවීම පිණිස ද යොදා ගනු ලබන බව ප්‍රකටව පෙනෙන ලක්ෂණයක් වේ. ශබ්ද හා නාද මගින් පුජා පැවැත්වීමේ ක්‍රමයක් ඈත අතීතයේ සිටම ජන ආගම හා සම්බන්ධ වුණි. අතිතයේ සිටම අද දක්වා ශ්‍රී මහා බෝධින් වහන්සේ සහ දළදා වහන්සේ වෙනුවෙන් සෑම දිනකම තුන්වරක් අලුයම් දූරය, මධ්‍යහ්න දූරය හා සැන්දෑ දූරය වශයෙන් තේවා කර්මයන් සිදුකෙරේ. මෙවැනි වාදනයන්හි මූලික අරමුණ වූයේ ද ශබ්ද මගින් පූජා පැවැත්වීමය. එබැවින් එහි ආගමික අර්ථයක් දිටිය හැකිය.

පෙරහැරේ ගමන් ගන්නා සෑම ශිල්පියෙකුගේම මූලික ප්‍රාර්ථනය වන්නේ දළදා වහන්සේ වෙනුවෙන් තමන්ගේ කාර්යය ඉටුකරලීම බව ඔවුන් සමඟ කළ අදහස් හුවමාරුවේදී පසක් වුණි. ඒ අතරම හේවිසි කණ්ඩායම් පැවසුවේ ද තමන්ගේ වාදනය බුදුන් වහන්සේ වෙනුවෙන් පවත්වනු ලබන ශබ්ද පූජාවක් යන්නයි.

කස ගැසීම සඳහා පෙරහැරට සම්බන්ධවන කණ්ඩායම පවා සඳහන් කරන්නේ එයින් ද, ශබ්ද පූජාවක් ඉදිරිපත් කරන බවයි. ඒ අතරම විවිධ නර්තන ක්‍රම හා සමඟ ගැයෙන කවිවල පවා බුදුගුණ අන්තර්ගතවීම ද විශේෂත්වයක් වේ.

මේ ආදි වශයෙන් දළදා පෙරහැර හා සංගීතය අතර පවතින්නේ දැඩි සබඳතාවයක් බව පෙනේ. හුදෙක්ම නාද නිපදවීමෙන් ප්‍රසංගාත්මක බවක් පෙරහැරට ලබාදෙනවා වෙනුවට එයින් ද යම් කිසි කෘත්‍යයක් අපේක්ෂා කළ බව ප්‍රකට වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. කුලතිලක සී.ද.එස්. (1974) ලංකාවේ සංගීත සම්භවය කොළඹ: එස් ගොඩගේ සහෝදරයෝ, 75 පිටුව

2. එම (1974) 75 පිටුව

3. Dassanayake, M.B.C (?) **The Kandy Esala Perahara.** Kandy : Offset Priter Ltd. P. 22

4. කුලතිලක සී. ද එස් (1996) ලංකාවේ සංගීත සම්භවය කොළඹ : එස්. ගොඩගේ සහෝදරයෝ. 194 පිටුව

5. පණ්ඩිත නාගිත හිමි නෙලුවේ (1956) දළදා වහන්සේ හා ඇසළ පෙරහැර, මහනුවර : යුනියන් යන්ත්‍රාලය 27 - 28 පිටු

6. දිසානායක මුදියන්සේ (1993) සිංහල නර්තන කලාව, කොළඹ : එස්. ගොඩගේ සහෝදරයෝ 118 පිටුව

7. Senevirathna. Anuradha (?) The Kandy Asala Perahara. Colombo : Ceylon Tourist Board

8. ධම්මාලෝක හිමි වරකාවේ (1992) "ඇසළ පෙරහැර පෙළගැසුනු හැටි" මහනුවර සැඟවුණු තොරතුරු. සංස්. ගොඩගම මංගල හිමි. මහනුවර මහ/වාරියපොළ ශ්‍රී සුමංගල විදුහල. 58 පිටුව

9. පණ්ඩිත නාගිත හිමි, නෙලුවේ (1956) 24 පිටුව.

# මහනුවර දළදා සංස්කෘතිය සහ කාර්තික උත්සවය

**මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්**
සමාජ විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය

දළදා සංස්කෘතිය තුළ වාර්ෂිකව ඉටු කෙරෙන ප්‍රධාන චාරිත්‍ර හතරක් දක්නට ලැබෙයි. මෙම චාරිත්‍ර හතර සිව් මහා මංගල්‍යයන් වශයෙන් හඳුන්වනු ලැබේ. ඒවා නම්,

1. දුරුතු මාසයේ පවත්වන අලුත් සහල් මංගල්‍යය
2. බක් මාසයේදී පවත්වන අලුත් අවුරුදු මංගල්‍යය
3. ඇසළ මාසයේදී පවත්වනු ලබන දළදා පෙරහැර මංගල්‍යය
4. ඉල් මාසයේදී පවත්වනු ලබන කාර්තික මංගල්‍යය යන සතරකි.

මෙම මංගල්‍යයන් සතරේ අන්තර්ගත චාරිත්‍රමය වටිනාකමට අමතරව රජු ස්වකීය පුරවැසියන් හා සම්බන්ධවන ප්‍රධාන අවස්ථා හතරක් ලෙස මෙය හැඳින්විය හැකිය. මෙම කෙටි ලිපියේ අරමුණ වන්නේ ඉල් මාසයේදී පවත්වනු ලබන කාර්තික මංගල්‍යයේ සංස්කෘතික වැදගත්කම පිළිබඳව සාකච්ඡා කිරීමයි.

කාර්තික යනුවෙන් දෙමළ බසින් හැඳින්වෙන්නේ ඉල් මාසය යන්නයි. මේ මාසයේදී ආසියානු මහාද්වීපයේ සමහර රටවල දීපවාලී උත්සවය හෙවත් හින්දු ආගමිකයන්ගේ ඉතා වටිනා උත්සවයක් වූ ලෝකය ආලෝකවත් කළ උත්සවය ලෙස දීපවාලී මෙවත් දීවාලී උත්සවය සමරනු ලැබේ. මෙම අලෝකමත් රාත්‍රිය මියගිය ඥාතීන්ගේ පැමිණීම පිළිබඳ විශ්වාසයත්, ගෙදර සියල්ලොම නව ඇඳුම් පැළඳුම්වලින් සැරසී විවිධාකාර චාරිත්‍ර ඉටුකිරීමත් සිදුකරයි. (South Asian Folklore 2003: 92)

මීට අමතරව මෙම අලෝකමත් දිනයේදී සශ්‍රීකත්වයේ දෙවඟන වූ ලක්ෂ්මිගේ පැමිණීම බලාපොරොත්තු වන අතර සමාජයේ සශ්‍රීකත්වය, සමෘධිය හා ව්‍යාපාරික දියුණුවත් සඳහා වාර්ෂිකව යෙදෙන සුභ නව වසර චන්ද්‍ර මාස ක්‍රමයට අනුව සිදුකෙරේ. (South Asian Folklore 2003:159-160) කෙසේ වුවද සමහර ලේඛකයින් මෙම උත්සවය දීපවාලි උත්සවයේම කොටසක් ලෙස හැඳින්වීමට උත්සාහ දරණ බව පෙනේ.

## කාර්තික උත්සවයේ ආරම්භය

කාර්තික උත්සවයේ ආරම්භය නරේන්ද්‍රසිංහ රජතුමාගේ රාජ්‍ය සමය දක්වා දිවයයි. මෙම ප්‍රදීප උත්සවය සම්පූර්ණයෙන්ම දළදා වහන්සේ ප්‍රමුඛ රජුගේ අණසක පවතින ප්‍රදේශයේ නිශ්චිත විහාරවල සහ දේවාලවල පවත්වන ආලෝක පූජාවකි. මෙම ආලෝක පූජාව සාමාන්‍ය වශයෙන් කෙරෙන්නක් නොව මහරජතුමාගේ දළදා මාළිගාවේ අවට සහ ඊට සමීප මෙන්ම දළදා පෙරහැරට සම්බන්ධ වූ ප්‍රධාන විහාර හා දේවාලවල පවත්වන උත්සවයකි. දළදා පෙරහැර ඇසළ මස පවත්වනු ලබන අතර ඊට මාස තුනකට පසුව එළඹෙන ඉල් පුර පසළොස්වක පෝය වෙනුවෙන් කාර්තික උත්සවය හෙවත් ආලෝක පූජා උත්සවය සංවිධානය කෙරේ. රජුගේ නියෝගය පරිදි ඉල්මස පුර පසළොස්වක පොහොය දිනය පෙර දින මෙම උත්සවය පැවැත්වේ. පහන් දැල්විය යුතු සුභ මුහුර්තිය කල්තියාම සාදාගන්නා රාජකීය දෛවඥයෝ එය නැකැත් වට්ටෝරුවල සඳහන් කර තබති. නැකත යෙදී තිබුණු පෙරවරු කාලයේදී පහන් හා තෙල් රාජකීය ගබඩාවෙන් නාථ දේවාලයට යවනු ලැබේ. ප්‍රධානිහූ නාථ දේවාල භූමියට රැස්වෙති. සතර දේවාලයේ කපුරාලවරු මංගල අෂ්ටක ගායනා කිරීමෙන් අනතුරුව උවදුරු දුරුකර රට යස ඉසුරෙන් උතුරුවන ලෙසට දෙවියන්ට යාතිකා කරති. (පිරිස් 1964: 139)

## පහන් දැල්වීම සඳහා තෙල් බෙදාදීම

කාර්තික උත්සවය රටේ සියලුම පුරවැසියන් විසින් පවත්වන ආලෝක පූජාවක් නොවන බව වටහාගත යුතුය. ඊට හේතුව වන්නේ රජු ස්වකීය ගබඩාවෙන් පහන් දැල්වීම සඳහා තෙල් නිකුත් කරන්නේ සුවිශේෂ විහාරවලට හා දේවාලවලට පමණක් බැවිනි. එම සැපයීම ලබන විහාර සහ දේවාල රජුගේ ඍජු පාලනය යටතේ පවතියි. රජුගේ පාලනය කන්ද උඩරට සෙංකඩගල නුවර සිට පස්රට දක්වා වූ පිටිසර බඳ ප්‍රදේශවල පිහිටි පන්සල් හා දේවාල දක්වා පැතිර පවතියි. රජුගේ ඍජු පාලනය යටතේ රටේ මහත්වරුන් විසින් පාලනය කළ ප්‍රධාන ප්‍රදේශ නමයක් දක්නට ලැබේ. මේවා අගනුවරට ඉතාම සමීප මෙන්ම රජුගේ බොහෝ අවශ්‍යතා ඉටුකළ ප්‍රදේශයන් ද වේ. ඒවා නම්,

උඩුනුවර
යටිනුවර
තුම්පනේ
හාරිස්පත්තුව
කොත්මලේ
උඩ බුලත්ගම
පාත බුලත්ගම
පාත බුලත්ගම
දුම්බර (ඩොයිලි 1966 : 7)
හේවාහැට

ඉහත සඳහන් කන්ද උඩරට පස්රට තුළ පිහිටි කොට්ඨාශ නවය තුළ ඇති ප්‍රධාන විහාර සහ දේවාලවල සංයුතියක් ඒවාට තෙල් ලැබුණු ප්‍රමාණ සහ ප්‍රමුඛත්වයක් සම්මතයක් ලෙස ලේඛනගතව පැවති අතර එය පහත සඳහන් පරිදි වේ.

## කාර්තික උත්සවය සඳහා තෙල් බෙදා දුන් විහාර දේවාල සහ බෙදාදුන් ප්‍රමාණයන්

| විහාරය/දේවාලය | ප්‍රමාණය තෙල් හැඳි |
|---|---|
| 1. ශ්‍රී දළදා මාළිගාවේ උඩුමාලයට | 6 |
| 2. එම බරාඳයට | 6 |
| 3. එම තොරණට | 6 |
| 4. එම පල්ලේමාලයට | 2 |
| 5. ගංගාරාම විහාරයට | 3 |
| 6. කුණ්ඩසාලේ විහාරය | 2 |
| 7. දෙගල්දොරුවේ විහාරය | 2 |
| 8. අස්ගිරියේ අලුත් විහාරය | 2 |
| 9. අස්ගිරියේ පරණ විහාරය | 1 |
| 10. ගෙඩිගේ විහාරය | 1 |
| 11. සුදුහුම්පොල විහාරය | 2 |
| 12. මල්වත්තේ විහාරය | 2 |
| 13. පෝයමළුවේ විහාරය | 2 |
| 14. අස්ගිරි විහාරය | 2 |
| 15. ගොනවත්තේ විහාරය | 1 |
| 16. අම්පිටියේ විහාරය | 2 |
| 17. උඩුවෙල විහාරය | 1 |
| 18. සගම විහාරය | 1 |
| 19. ලංකාතිලක විහාරය | 1 |
| 20. ගඩලාදෙණි විහාරය | 1 |
| 21. හිඳගල විහාරය | 1 |
| 22. නාථ දේවාලයේ බෝමැඩ | 1 |
| 23. නාථ දේවාලය | 3 |
| 24. නාථ දේවාලයේ පල්ලේ දේවාලය | 3 |
| 25. මහ දේවාලයට | 1 |

| | |
|---|---|
| 26. එම පල්ලේ දේවාලයට | 1 |
| 27. අලුත් නුවර දේවාලයට | 2 |
| 28. කතරගම දේවාලයට | 3 |
| 29. එම පල්ලේ දේවාලය | 1 |
| 30. ගණදෙවි කෝවිල | 1 |
| 31. පත්තිනි දේවාලයේ පිළිමගේ | 1 |
| 32. පත්තිනි දේවාලය | 3 |
| 33. හඟුරන්කෙත මහා දේවාලය | 2 |
| 34. එම පත්තින දේවාලය | 1 |
| 35. ඇම්බැක්කේ පිළිම ගෙය | 1 |
| 36. ඇම්බැක්කේ දේවාලය | 2 |
| 37. එම පල්ලේ දේවාලය | 1 |
| 38. පස්ගම දේවාලය | 1 |
| 39. දොඩම්වල දේවාලය | 2 |
| 40. එම පත්තිනි දේවාලය | 1 |
| 41. ගඩලාදෙණියේ දේවාලය | 2 |
| 42. එම පල්ලේ දේවාලය | 1 |
| 43. ලංකාතිලක දේවාලේ | 2 |
| 44. වේගිරියේ දේවාලය | 1 |
| 45. අලවතුගොඩ දේවාලය | 1 |
| 46. ගනේගොඩ දේවාලය | 1 |
| 47. එම පල්ලේ දේවාලය | 1 |
| 48. මොරපේ පිළිමගේ | 1 |
| 49. ගුරුදෙණිය දේවාලය | 1 |
| 50. වල්ලහගොඩ දේවාලය | 1 |
| 51. පිලවල පිටියේ දේවාලය | 1 |
| 52. නාථ දේවාලයේ පිළිම ගේ | 1 |
| 53. මහා දේවාලයේ පිළිම ගේ | 1 |
| 54. සූරියගොඩ විහාරය | 1 |

| | |
|---|---|
| 55. දළුකේ විහාරය | 1 |
| 56. මාලගම්මන විහාරය | 1 |
| 57. දළුකේ දේවාලය | 1 |
| 58. කොබ්බෑකඩුව විහාරය | 1 |

ඉහත සඳහන් සටහනට අනුව පැහැදිලි වන කරුණක් නම් කාර්තික උත්සවයේදී ආලෝක පූජාව පැවැත්වීම නිශ්චිත විධිමත් රටාවක් ඔස්සේ සිදුකරන බවයි. ගබඩාවෙන් තෙල් බෙදාදෙන ප්‍රමාණය විහාරයේ/ දේවාලයේ වටිනාකම අනුව වෙනස්වන අතර එය මහනගරයේ සිට පිටිසර දේවාල/ විහාර දක්වා ගමන් කිරීමේදී ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ලැබේ. එමෙන්ම රාජ්‍යත්වය හා සම්බන්ධ සිද්ධස්ථානවලට ලබාදෙන තෙල් ප්‍රමාණයේ වැඩි බව ඉතා හොඳින් ප්‍රකට වේ. එමෙන්ම ඉහත සඳහන් රූප සටහනට අනුව කේන්ද්‍රයේ සිට පර්යන්තය දක්වා ගමන් ගන්නා සිද්ධස්ථාන 58 කට මෙම තෙල් බෙදාදීම සිදුවේ.

## රජුගේ ආධිපත්‍යයේ ඒකීයත්වය සහ බලය ප්‍රකට කිරීම

දළදා සංස්කෘතිය හා සම්බන්ධ වූ සතර මහා මංගල්‍යය මගින් සිංහලයේ රජු ස්වකීය පුරවැසියන් හා සම්බන්ධ වන අවස්ථා සතරක් පිළිබඳව සාකච්ඡා කළෙමු. මෙම කාර්තික උත්සවය නොහොත් ආලෝක පූජා උත්සවයේදී ද රජුගේ සෘජු පාලනය යටතේ පවතින ප්‍රදේශ නවයට රජුගේ ගබඩාවෙන් තෙල් බෙදා දීමත්, ඒවා නිසි පරිදි එම ප්‍රදේශයේ ප්‍රධාන සිද්ධස්ථානවලට ගෙනයාමත් සිදුකෙරේ. එපමණක් ද නොව එදින සැන්දෑ කාලයේ අලංකාර ලෙස දළදා මාළිගාවේ සහ සතර දේවාලයේ පෙරහැර පවත්වන අයුරින් විශාල පරිවාර ජනතාවක් සමඟ සර්වඥ ධාතු සහ දේව ප්‍රතිමා ඇතුන් පිට තැන්පත් කොට පෙරහැරක් පවත්වනු ලබයි. මේ අවස්ථාව වන විට බෙදාදුන් තෙල්වලින් නියමිත සිද්ධස්ථාන සියල්ල පහන් පත්තු කරයි. (හේරත් 2006 : 106)

මෙහිදී රජු දළදා වහන්සේ වෙනුවෙන් සහ සෙසු පර්යන්තයීය සිද්ධස්ථාන වෙනුවෙන් පහන් දැල්වීමට තෙල් පරිත්‍යාග කිරීම යනු රජුගේ අණසක ක්‍රියාත්මක වීම පිළිබඳ ප්‍රධාන සංකේතයයි. රජුගේ මූලස්ථානයේ (දළදා මාළිගාවේ) පහන් දැල්වෙන විට සෙසු සිද්ධස්ථාන සියල්ලෙහි පහන් 58 ක් දැල්වෙන්නේ රජුගේ අණසක, බුදුන්ගේ සරණ සහ දෙවියන්ගේ බලය ප්‍රකට කරමිනි. එමෙන් ම රජුගේ ඒකීය ශක්තිය ස්වකීය සෘජු පරිපාලන කලාපය පුරා විහිදීයාමේ යාන්ත්‍රණය කාර්තික උත්සවය මගින් තවදුරටත් ක්‍රියාත්මක වේ. මේ සමඟම රජුගේ ඒකීය ආධිපත්‍ය පිළිගන්නා යටහත් වැසියෝ රජුගේ ආලෝකය ලබමින් එම ආලෝකය පැතිරවීමටත්, එම ආලෝකය පුරා අන්තර් ග්‍රහණය වී ඇති රජුගේ අණසක ක්‍රියාත්මක කිරීමටත් බැඳී සිටිති.

## නාථ දේවාල භූමියේ සුවිශේෂත්වය සහ කාර්තික මංගල්‍යය

සිව්මහා දේවාල වලින් මහා දේවාලය ලෙස සලකනු ලබන්නේ විෂ්ණු දේවාලයයි. විෂ්ණු දෙවිඳුන් ශ්‍රී ලංකාව සහ බුදු සසුන් ආරක්ෂක දෙවියා ලෙස සලකනු ලැබේ. නමුත් බුදුන් අභියසදී විෂ්ණු දෙවියන්ගේ ශක්තිය ප්‍රහීන වන අතර වඩා වැදගත් වන්නේ මතු බුදුවීමට පාරමිතා පූරණ නාථ දෙවියන්ය. නාථ දේවාල පෙරහැර දළදා පෙරහැර දෙවනුව ගමන් ගන්නා අතර එහි වර්ණය ස්වර්ණ වර්ණ හා බැඳි කහ වර්ණයයි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රාප්තිය යනු දශරාජ ධර්මයෙන් රජට කරවීමට ප්‍රතිඥා දීම වන අතර එම මතු බුද්ධත්වය ලබා ගැනීමට කරන ප්‍රාර්ථනයකි. මේ නිසා ශ්‍රී ලාංකික පාලකයින් අනිවාර්යයෙන්ම ප්‍රථමයෙන් දිවුරුම් දෙනු ලබන්නේ නාථ දේවාල භූමියේය. මේ අනුව කාර්තික මංගල්‍යය සඳහා තෙල් බෙදාදීමේ ස්ථානය සහ රජුගේ බලය ගලායාමේ ස්ථානයත් එකම වේ.

මේ අනුව ශ්‍රී ලංකාවේ භූපති වර්ෂයේ අවසානයේ තමන්ගේ පුරවැසියන් සමඟ සම්බන්ධවන ආලෝකය පැතිරවීමේ උත්සවය හෙවත් කාර්තික උත්සවය මගින් සිදුකරනු ලබන්නේ රාජ්‍යයේ එකම ශක්තිය වන රජුගේ

බලය ප්‍රදර්ශනය කිරීමට එකම පහනක් තුළින් එකම වේලාවට තමන්ගේ බලප්‍රදේශය ප්‍රධාන ආගමික සිද්ධස්ථානවල දැල්වීමෙන් වෙන කිසිදු අධිකාරී බලයකට ඉඩ නොතබන බවත්, රටේ එකම රජතුමා තමා බවත් එහි අණසක ස්වකීය පාලන බලය පැවැත්වෙන ප්‍රදේශවල සපුරා තිබෙන බවත් ප්‍රකට කරයි. රජු විසින් සපයන තෙල්වල ශක්තියෙන් නගරයේ සිට පර්යන්තය දක්වා ඔහුගේ බලය විහිදී යන ආකාරයත් ප්‍රකට කරනු ලබයි. මේ අනුව කාර්තික මංගල්‍යය යනු ඉන්දියාවේ පවත්වන ප්‍රකට දීපවාලී උත්සවය මෙන් කෙරෙන උත්සවයක් නොවන බව සඳහන් කළ හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ

1952 Aluwihare, Richard, **The Kandy Esala Perehara,** Colombo: M.D. Gunasena & Co.

1964 පීරිස්, රැල්ෆ්, සිංහල සමාජ සංවිධානය, කොළඹ: සීමාසහිත සමන් ප්‍රකාශකයෝ

1966 ඩොයිලි, ජෝන් සිංහලේ ආණ්ඩු ක්‍රමය (එච්.එම්.සෝමරත්න පරිවර්තනය) කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම

2000 දිසානායක ජේ.බී. **සිරි දළදා මාළිගාව**, කොළඹ: ගොඩගේ සහ සමාගම

2003 **South Asian Folklore:** An Encyclopedia. M.A. Mills, P.J. Claus and S. Diamond (eds) New York: Routledge.

2007 හේරත් එච්.එම්.ඩී.ආර්. "දළදා සතර මහා මංගල්‍යයය දළදා සංස්කෘතිය සහ ජන සමාජය" **පූජනීය දළදා සංස්කෘතිය** මහනුවර: මධ්‍යම පළාත් පරිසර අමාත්‍යාංශය.

# විදේශිකයන් ගෞරවාදරයට පාත්‍ර වූ ශ්‍රී දළදා වහන්සේ

**ආචාර්ය රෝහිත දසනායක**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දළදා වහන්සේ ශ්‍රී ලංකේය ඉතිහාසය තුළ මහත් සම්භාවනාවට ලක් වූ පූජාර්හ සංකේතයක් ලෙස සමාජ, දේශපාලන, සංස්කෘතික සංදර්භය තුළ සිදු කළ බලපෑම අතිමහත්ය. ශුද්ධ වස්තුවක් මෙන්ම පූජනීය වස්තුවක් ලෙස දළදා වහන්සේ පූජාර්හ වී ඇති ආකාරය කොතරම් ද යත් දළදා වහන්සේ පිළිබඳව ලිය වී ඇති දෙස් විදෙස් වාර්තාවලින් සහ පුරාවිද්‍යාත්මක තොරතුරුවලින් මෙන්ම වර්තමානයේ පවා සිදු කරන ලද පූජෝපහාරයන්ගෙන් මොනවට පැහැදිලි වේ. පුරාතනයේ සිටම ලංකාවට පැමිණි විදේශීය සංචාරකයින්, වන්දනාකරුවන් දළදා වහන්සේ පිළිබඳ විවිධ අර්ථකථනයන් වාර්තා කොට තිබේ. එම තොරතුරු බොහෝ විට පදනම් වී ඇත්තේ දළදා වහන්සේ වෙනුවෙන් කරන ලද දළදා පෙරහැර මූලික කරගෙනය. ක්‍රි.ව.428 දී මහානාම රජු විසින් චීන අධිරාජයා වෙත යවන ලද දූතයා සමඟ දළදා මාළිගාවේ අනුරුවක්[1] යවන ලද බව සඳහන් වුවත් දළදා පෙරහැර පිළිබඳව ප්‍රථම වරට සඳහන් කරනුයේ ක්‍රි.ව. 5 වන සියවසේ ලංකාවට පැමිණි පාහියන් හිමි විසින්ය.

---

1. Sri James Emerson Tennet, ***Ceylon : An Account of Island Physical Historical, and Topographical with Notices of Its natural History, Antiquities and Productions,*** Green Longman and Roberts (London, 1859), pp.514-529; M. Sylvain Levi, "Chino Sinhalese Relations", Translated from French by johan, M. Senaviratna, ***Journal of the Royal Asiatic Society Ceylon Branch,*** Vol. XXIV, No. 68, 1915/166, pp.74-105; Mahinda Werake, "Sino Sri Lanka Relations During the Pre-Colonial Times", **Sri Lanka and the Silk Road of Sea,** in Senake Bandaranayake et, al., (eds.) , **Sri Lanka and the Silk Road of the Sea,** The Sri Lanka National Commission for UNESCO and the Central Cultural Fund, Colombo, 1999, pp. 221-132

චූලවංශයට අනුව දළදා වහන්සේ ලංකාවට වැඩම වීමෙන් අනතුරුව කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු (ක්‍රි.ව. 301 - 328) දළදා වහන්සේ රාජකීය මන්දිරයේ සිට අභයගිරි විහාරයට පෙරහැරින් වැඩමවා ප්‍රදර්ශනය කළ අතර, ඒ සඳහා අවශ්‍ය නොයෙකුත් පූජාවිධි පවත්වන ලෙසට විධාන කරන ලදි.[2] පාහියන් හිමියන්ගේ තොරතුරු අනුව එම පූජා අඛණ්ඩවම පවත්වාගෙනැවිත් තිබේ. එහිදී නගරයේ දළදා වහන්සේ තැන්පත් කර තැබීම උදෙසා සත්රුවනින් විසිතුරු මන්දිරයක් තනා තිබුණ බැව් පවසන අතර, සිරිත් පරිදි දළදා උත්සවය තුන්වන මස මැද හරියේ පවත්වන ලදි. දළදා වහන්සේගේ පිටතට වැඩමවා පෙරහැර උත්සවය පැවැත්වීමට දින දහයකට පෙර හස්ත්‍යාභරණයෙන් සරසන ලද ඇතෙකු මත දක්ෂ කථිකයන් නංවා බුදුන්ගේ ගුණ ගායනා කරමින් භේරීනාද පවත්වමින් අද සිට දස දිනකින් බුදුපියාණන්ගේ දන්ත ධාතූන් වහන්සේ පිටතට වැඩමකර අභයගිරි විහාරය වෙත වැඩම කරවන ලද බවත් දන්වන බවත්, නුවර හැම වීථියක්ම, අතුරු වීථියක්ම සරසා මල් පහන් සුවඳ දුම් ආදි පූජාභාණ්ඩ තිබූ බවත් සඳහන් කරයි. පෙරහැර යන දෙපස ජාතක කථා සිතුවම් කර ප්‍රදර්ශනය කර තබූ අතර, ඒවා ජීවමාන විලාසයෙන් තිබූ බවත් පාහියන් භික්ෂුව සඳහන් කරයි.[3] පසුව දළදා වහන්සේ මහන්දිරයෙන් පිටතට වැඩමවා ප්‍රධාන මාර්ග දිගේ නොයෙකුත් පුද පූජා මැද අභයගිරි විහාරයේ ප්‍රදර්ශන මන්දිරයට වැඩම කරවීමෙන් අනතුරුව ගිහි පැවදි හැම එක්ව මල් පහන් සුවඳ හා වෙනත් පූජා රෑ නොනවත්වා අනූ දිනක් පවත්වා දන්ත ධාතු මන්දිරය කරා ආපසු වැඩමකරවන ලද බවත්, පාහියන් හිමි වැඩිදුරටත් සඳහන් කරයි.[4] මෙම විස්තරයට අනුව පෙනී යනුයේ ක්‍රි.ව. 5 වන සියවස වන විටත් දළදා

2. චූලවංශය
3. **A Record of Buddhist Kingdoms: Being Account by The Chinese Monk Fa-Hien Travels in India and Ceylon A.D. 399-414** (trans.), And Annotated with Corean Recension of the Chinese Text by James Legge, Oriental Publisher, (Delhi, 1971), pp.62-63 and **The Travels of Fa-Hien,** (trans.), James Legge, Oxford University Press, (Oxford, 1886), p. 104; **Travels of Fah- Hian and Sung-Yun-Buddhist Pilgrims from China to India 400 A.D.,** Translated from the Cginese Samuel Beal, Trubner and Co., (London, 1869), pp. 149-64; K.A. Nilankanta Sastri, **Foreign Notices of South India from Megasthenes to Mahuan,** University of Madras, 1942, pp.68-75
4. **Ibid.**

වහන්සේ පිළිබඳව කීර්තිය චීනය වැනි ඈත පෙරදිග රටවලට පැතිර තිබූ බවය. එපමණක් නොව කීර්ති ශ්‍රී මේඝවර්ණ රජු විසින් නියත කරන ලද සිරිත් පරිදිම දළදා වහන්සේට අඛණ්ඩව පෙරහැරින් ගෞරව ලබාදුන් බව ද ඔප්පු වේ.

මින් අනතුරුව හියුං සාං හෙවත් යූවන් චිවං (ක්‍රි.ව. 596 - 664) නම් චීන හිමි නම විසින් දළදා පෙරහැර පිළිබඳව සඳහන් නොකළද රජ මැඳුර අසල පිහිටි දළදා මන්දිරයක් ගැන දක්වයි. එහි කොත මුදුනේ වූ විශාල රක්ත මාණික්‍යයෙන් දිවා රෑ දෙකෙහිම රශ්මිය විහිදෙන අයුරු වර්ණනාත්මකව සටහන් කර තිබේ. එසේම රජු විසින් දිනකට තෙවරක් දන්ත ධාතුව වන්දනා කළ අතර එහිදී මැණික් ඔබ්බවන ලද රත්තරන් භාජනවලින් සුවඳ පැණින් හා සුවඳ සුණින් දළදා වහන්සේ නාවනු ලැබීය.[5]

ක්‍රි.ව. 7 වන සියවසේ ඉන්දියාවට පැමිණි ඉත්සිං (I- tsing ක්‍රි.ව. 671-695) ලංකාවට නොපැමිණිය ද දළදා වහන්සේ වන්දනා කිරීමට ලංකාවට පැමිණි චීන ජාතිකයන් කිහිප දෙනෙකු පිළිබඳ සටහන් කර තිබේ. එහිදී මිං යුවාන් (Min Yuen) නම් පුද්ගලයෙකු ලංකාවේ රජුගේ ගෞරවාදරය ලබා ගනිමින් සිටි අතර, එම නිසා දන්ත ධාතුව සොරා ගැනීමට ගත් උත්සාහයක් අසාර්ථක වීමෙන් දකුණු ඉන්දියාවට පැන ගොස් තිබේ. කෙසේ නමුදු ඔහුගෙන් දන්ත ධාතූන් වහන්සේ පිළිබඳ ලබාගත් තොරතුරු මෙසේ ඉත්සිං සඳහන් කරයි.

"ලංකා වාසීහු ඉතාමත් ප්‍රවේශමින් දන්ත ධාතූන් වහන්සේ ආරක්ෂා කරති. එය ඉතා උස් ගොඩනැගිල්ලක තබා ඇත. එහි වූ දොරවල් විශේෂ අගුළු ලා වසා තිබේ. මේ අගුළුවලට මුද්‍රා තබා නිලධාරීන් පස් දෙනෙකු සියහන් යොදා ඇත. දොර විවෘත කරන කල්හි එයින් නිකුත්වන ශබ්දය මුළු නගරයෙහි පැතිරේ. දිනපතාම මෙම ධාතුවට ඔවුහු පූජා පවත්වති. හදපිරි

5. S. Beal, **Buddhist Records of the Western World,** Kegan Paul, Trench Trench & Co., London, 1869, pp. 235-236.

භක්තියෙන් යුතුව වඳින අයට දන්ත ධාතුව මල් මත දිස් වේ. නැතහොත් සෑම දෙනාටම පෙනෙන පරිදි දිව්‍යමය ආලෝකයක් ඉන් පැතිරේ. යම් හෙයකින් මෙම ධාතුව ලංකාවෙන් නැති වී ගියහොත් එරට රකුසන්ට අයත් වෙතැයි විශ්වාසයක් පවතී. එය චීන දේශයට සම්ප්‍රාප්ත විය යුතු යැයි විශ්වාසයක් ද පවතී. භක්තිය ඇතොත් සෘද්ධිමය බලයෙන් එය එරටට වඩිනු ඇත."[6]

මීට අමතරව ඉලෑං (I-Lang) භික්ෂුවක් සිය සහෝදරයා සමඟ ද තා-චොං-තෙං (Ta - tch 'eng - teng) මහායාන භික්ෂුවක් ද අවුහිං (Ou - hing) නම් පුද්ගලයෙක් ද දළදා වහන්සේ වන්දනා කළ බව ඉත්සිං සඳහන් කර තිබේ.[7]

ලංකාවේ සියලු සම්පත් සහ ශ්‍රීපාදය පිළිබඳව දීර්ඝ විස්තර ඉදිරිපත් කරන පර්සියානුවන් සහ අරාබින් දළදා වහන්සේ පිළිබඳව කිසිදු සඳහනක් නොකිරීම පුදුම සහගතය. නමුදු විශාල ධනයක් වියදම් කර අලංකාරව නිර්මාණය කරන ලද මෙන්ම වැසියන්ගේ නිති පූජාවට ලක්වන්නා වූ විහාරයක් පිළිබඳව දහවන සියවසේ ලංකාවට පැමිණි අබු සෙයිද් හසන් සඳහන් කර තිබේ.[8] ඇතැම්විට මෙම සඳහන දළදා මන්දිරය පිළිබඳ කරනු

6. ***A Record of the Buddhist as Religion as Practical in India and the Malay Archipelago A.D. 671 - 695 by I-Tsing,*** (trans.) J. Takakusu, Munshiram Manoharlal, Delhi, 1966. (reprint), pp.58-59
7. K.A. Nilakanta Sastri, ***Foreign Notices of South India from Megasthenes to Mahuan,*** University of Madras, 1942, pp.114-115; D.P. Ponnamperuma, ***"Videseen Dutu Purana Lankawa"*** , (The Ancient Ceylon viewed by Foreigners), Arya Publisher, (Kandy, 1961) p. 88
8. **Kitab Muruj al - Dhahab wa ma" iawhar** (French trans.), Le Prairies d. or et lesmines de pierres precieuses, (eds.), c. Barbier de Maeynard and Pavet De Courteille, Tome. O, (Paris, 1861)p. 365; **Mas"udi, Muruj al -Shahab (Meadows of Gold and Mines of** Precious), (ed), A. Sprenger, W.H. Allen and Co., Printed for the Oriental Translation Found of Great Britain and Ireland, (London, 1841); Voyage du Marchand Arabe Sulayman en Inde et en China -Redign en 851 Suivi de remarques Par Abu Zayd Hassan Vers 916, (trans.) Gabria Ferrand, Librairie Ernest Leroux, (Paris, 1922) pp. 31-33; Salsilatutu-t Tawarika" of the Merchant Sulyman with editions by Abu Zaidu - I Hasan of Siraf, The History of India, as Told by its own Historians; The Muhammadan Period, (eds.), H.M. Elliot and Jhon Dowson, Vol. I, Trubner and Co., London, 1867, pp.6-8; Rifles, Ceylon : A General Description of the Island, Historical Physical, Statistical, 2 Cols., Chapman & Hall, London,1867, p.240; Sir James Emerson Tennent, Ceylon: An Account of Island Physical, Historical, and Topographical with Notices of Its Natural history, Antiguities and Productions, Green Longman and Roberts, (London, 1859), p.512.

ලබන සඳහනක් යැයි අනුමාන කළ හැකිය.

පොළොන්නරු රාජධානි සමයේ නිශ්චිත ලෙසම දළදා වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ රාජ්‍යයේ සංකේතය බවට පත්වේ.[9] එම නිසාම විදේශ රටවල පවා දළදා වහන්සේගේ කීර්තිය පැතිරීම දක්නට ලැබේ. පළමුවන විජයබාහු රාජ්‍ය සමයේ බුරුමයේ අනුරුද්ධ රජු විසින් දන්ත ධාතුව ඉල්ලා එවූ බැව් කියවෙන සඳහනක් බුරුම මූලාශ්‍රවල සඳහන් වේ.[10] මේ කාලයේ ලංකාව සහ බුරුමය අතර පැවති සමීප සබඳතාව මෙම ඉල්ලීමට හේතු වූවා විය හැකිය. දන්ත ධාතුව එවන ලෙස බුරුම රජු කළ ඉල්ලීම නිසා, විජයබාහු රජු මහත් ගැටලුවකට මුහුණපෑවා නිසැකය. එසේම මෙම දළදා වහන්සේ ලංකාවේ රජුට හිමිවීම නිසා ධාතුසේන නමින් පවා විජයබාහු රජු හැඳින්වීමට පෙළඹී තිබෙන බව බුරුම මූලාශ්‍රවලින් පැහැදිලිය. දළදා වහන්සේ පිටරටකට යැවීමට සිතීමට පවා සිංහල රජෙකුට නොහැකි වූ බැවින් විජයබාහු රජු දළදා වහන්සේගේ අනුරුවක් සාදා එය අනුරුද්ධ රජුට තෑගි කර යැවූ බවත්, එම දන්ත ධාතූන් වහන්සේ බුරුම රජු පිළිගෙන තවත් එබඳු අනුරූ කිහිපයක් තනවා ඒවා ස්වේසගොන් චෛත්‍යයේ නිදන් කළ බවත් බුරුම වංශකතා තවදුරටත් වාර්තා කරයි.[11] මෙම දළදා අනුරුව ලංකාවේ වැඩ සිටි දළදා වහන්සේගෙන්ම සෘද්ධියෙන් නිර්මිත වූ බැව් සහ එම අනුරුවෙන් තවත් අනුරූ සතරක් සෘද්ධියෙන් නිර්මිත වූයේ යැයි බුරුම මූලාශ්‍රවල සඳහන් වේ. ලංකාවේ සිට රැගෙන ගිය දළදා අනුරුව සහිත නෞකාව මුලින්ම සැපත් වූ ලෝකානන්ද නම් ස්ථානයේද අනුරුද්ධ රජු චෛත්‍යයක් ඉදි කළ බව බුරුම මූලාශ්‍රවල වැඩිදුරටත් සඳහන්ය.[12] මෙම තොරතුරුවලින් පෙනී යන්නේ ඔවුන් දළදා වහන්සේට කොතරම් ගෞරව කළේද යත් දළදා වහන්සේගේ අනුරුවට දක්වන ලද මහත්ව සැලකිල්ලෙන්ම පැහැදිලි වේ. එසේම මෙයින් පැහැදිලි වන තවත් වැදගත්

9. විස්තර සඳහා බලන්න. රෝහිත දසනායක, පාත්‍රා ධාතුව සහ රාජ්‍යත්වය, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල, 2001.

10. Glass Palace Chroniclenof the king of Burma. (trans.) Pe Moung Tin & G.H. Luce, 1923, p.89

11. G.H. Luce, **Old Burma - Early Pagan,** Vol. I. Ascona, New York, 1969, p. 260.

12. Ibid. p. 260, මූර්ති, ලංකාව සහ බුරුමය, මියුරෝ පොත් ප්‍රකාශකයෝ, 2005, පි.95.

කරුණක් නම් දළදා වහන්සේගේ අනුරුවට ගෞරව කිරීමේ සම්ප්‍රදාය අග්නිදිග ආසියානු කලාපයේ රටවල වර්ධනය වීමයි. එපමණක් නොව එය ලබාගැනීමට ශෛනික ක්‍රියා මාර්ග ගැනීමට පෙළඹීමට පවා පසුබට නොවීමට මෙම තත්ත්වය බලපා තිබෙන මෙම තත්ත්වය බලා තිබෙන බව පසුකාලීනව දක්නට ලැබෙන සාධකවලින් පැහැදිලි වේ.

15 වන සියවසේ මුල් භාගයේ චීනයේ යුං ලෝ (Yung - LO ක්‍රි.ව. 1368 - 1644) නම් චීන අධිරාජයාගේ නෞකාධිපති වූ චෙං හෝ (Cheng - Ho or Cheng -tsu[13]) යටතේ ගමන් කළ චීන මුස්ලිම් ජාතික භාෂා පරිවර්තකයා වූ මා හුවාන්ද (Ma Huan) ලංකාවේ දළදා වහන්සේ පිළිබඳ සියැසින් දුටු සාක්ෂි සටහන් කර තිබේ. ලීයෙන් තනා සෑම වර්ගයෙන්ම අගනා ද්‍රව්‍යවලින් අලංකාර කරන ලද මන්දිරයේ බුදුන් වහන්සේගේ දළදාව ද අනෙකුත් ධාතුන්ද තැන්පත් කර තිබූ බවත්, එය සම්බුද්ධ පරිනිර්වාණ විහාරය (නීපන් විහාරය) නමින් හැඳින් වූ බවත් හෙතෙම සඳහන් කර තිබේ. එසේම විහාරය තුළ විශාල ඔත් පිළිමයක් ද වූ බව වැඩිදුරටත් සඳහන් කරයි.[14]

---

13. විස්තර සඳහා බලන්න G.P.V. Somaratna, "Grand Eunuch Ho and Ceylon", **Journal of the Ceylon Branch of the Royal Asiatic Society, (New Series),** Vol. XV, 1971, pp. 3-47; T"ien Ju- Kang, Cheng Ho" s Voyages and the Distribution of Pepper in China", **Journal of Royal Asiatic Society of Great Britain & Ireland,** 1981, pp. 186-196; Haraprasad Ray, "An Enquiry into the Presence of the Chinese in South and South - East Asia After the Voyages of Zheng He in Early Fifteenth Century", in K.S. Mathew, (ed.), **Mariners, Merchants and Oceans: Studies in Maritime History,** Manohar, 9New Delhi, 1995). pp. 96-109; Tissa Kariyawasam, "T" shing Ho nam Cheena Senpatiyage Sumudra Charica saha Lankagamanaya", **Vodyodaya, Journal of Social Science,** Vol7, Nos. 1 & 2. University of Sri Jayawardhanapura, 1996, 56; Haraprasad Ray, Trade and **rade Routes between India and China c. 140 B.C.- A.D. 1500,** Progressive Publishers, (Kolkata, 2003), pp.177-182
13. K.M.M. Werake, "A Re-examination of Chines Relations with Sri Lanka during the 15th Century A.D." in C.R. de Silva and Sirima Kiribamune, (eds.) **K.W. Goonewardena Felicitation Volume,** Modern Sri Lankan Studies, Special Issue, Volume II-1987, (Peradeniya, 1989). pp. 89-102.
14. K.A. Nilakanta Sastri, **Foreign Notices of South India from Megsthenes to Mahuan,** University of Madras, 1942, p.29

ක්‍රි.ව. 1478 ට අයත් බුරුමයේ කල්‍යාණි ශිලා ලිපිවල සඳහන් පරිදි ලංකාවට පැමිණි බුරුම දූත පිරිසට ශ්‍රී ජයවර්ධනපුර තැන්පත් කර තිබූ දළදා වහන්සේ වන්දනා කිරීමට ලංකාවේ රජු පහසුකම් සපයා තිබීම ප්‍රශංසා කොට තිබේ. එසේම එම දූත මණ්ඩලය සමඟ බුරුමයට ලංකාවේ රජුගෙන් දළදා වහන්සේගේ අනුරුවක්ද ලැබුණු ව එම ලිපිවල වැඩිදුරටත් සඳහන්ය.[15]

15 වන සියවසට අයත් ජිනකාලමාලි නම් සියම් කෘතියෙහි ලංකාවෙන් උපසම්පදා ලබා ගැනීම පිණිස පැමිණි සියම භික්ෂූන් දළදා වහන්සේ වන්දනා මාන කළ බව, වාර්තා වේ.[16] සියම් සහ බුරුම වංශකතාවල බොහෝ විට ලංකාවේ දළදා වහන්සේ බෙහෙවින් ගෞරවාදරයට පාත්‍ර වී තිබීම මේ කාලයේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයක් ය.

ක්‍රි.ව. 1551 - 1581 කාලයේ බුරුමය පාලනය කළ බයින්නාවුන් රජු ලංකාවේ දළදා වහන්සේ පිළිබඳව විශේෂ ඇල්මක් දක් වූ බවට තොරතුරු හමුවේ. මේ කාලයේ දළදා වහන්සේ කෝට්ටේ ඇතුල් නුවර මාළිගයේ තැන්පත් කර තිබූ අතර එම මැඳුර අසලින් බුරුම රජු ඉඩමක් මිලදී ගෙන නිරන්තරයෙන් දැල්වෙන පරිදි කැටයමින් අලංකෘත පහනක් ඉදි කළ බව සඳහන් වන අතර බුරුම රජු තම දේවියගේ හිසකෙසින් මුස්නක් සාදා මිණි මුතුවලින් අලංකාර කරන ලද ඒ මුස්න දළදා මැඳුර ඇමදීම සඳහා එවන ලද බවක් කියැවෙන රසවත් සිද්ධියක් එම බුරුම වංශ කතාවල සඳහන්ය.[17]

මීට පෙර මෙවැනි සිදුවීමක් පිළිබඳව බුරුමයේ නරපති නම් රජුගේ කාලයේ වාර්තා වේ. එනම් නරපති රජු ක්‍රි.ව. 1456 දී දළදා වහන්සේට පිදීම සඳහා රන් මිණි මුතු රැගත් දූත පිරිසක් ලංකාවට එවා තිබේ. තවද ඒ රජු දළදා වැඳීම සඳහා පැමිණෙන බැතිමතුන්ගේ ප්‍රයෝජනය සඳහා කෝට්ටේ ඉඩමක් මිලදී ගත් බැව් සඳහන් වේ. එම නරපති රජුගේ පුත්‍රයා වූ තිහතුර (ක්‍රි.ව. 1469

15. D.P. Ponnamperuma, **"Videseen Dutu Purana Lamkawa",** (The Ancient Ceylon Viewed by Foreigners), Arya Publisher, (Kandy, 1961), pp.158 -162.
17. G.E. Harvey, History of Burma, London, 1950, p.172; මූර්ති ලංකාව සහ බුරුමය, මියුරෝ පොත් ප්‍රකාශකයෝ, 2005 පි. 95.

- 1481) රජු ස්වකීය සිට රජු අනුව යමින් දළදා වහන්සේ කෙරෙහි කොතරම් බැතිමතුන් වීද යත් තමාගේ සහ තම මෙහෙසියගේ හිසකෙසින් මුස්නක් සාදා එහි මැණික් එබ්බවූ මිටක් සිවි කර එය දළදා මන්දිරයෙහි බිම ඇමදීම සඳහා පූජා කර එවීය. මෙවැනි පූජාවන් ගැන සැලකිය යුත්තේ ඒවා සංකේතමය භක්ති පූජාවන් වශයෙනි. විහාර සහ චෛත්‍ය භූමි ඇමදීම සඳහා තම හිසකෙසින් සැකසූ මුසුන් පූජා කිරීම අදත් බුරුම බැතිමතුන්ගේ සිරිතකි.[18] මහාචාර්ය හේරත් දිසානායක මහතා පෙන්වා දෙන පරිදි අදත් බුරුම කාන්තාවන් බිම දණ නමා තම හිසකෙස් විහිදුවා ඒ මත භික්ෂූන්ට වැඩමවීමට සැලැස්වීමෙන් උන්වහන්සේලාට ගෞරව කරන ලද බව දැක්වේ. එම නිසා මෙම හිසකෙස්වලින් ගෞරවය පිදීම බුරුම සම්ප්‍රදායක් බව පෙන්වා දිය හැකිය. දළදා මැඳුර ඇමදීමට මුස්නක් සඳහා තම හිසකෙස් කපා පරිත්‍යාග කිරීම වැනි සංකේතමය සහ දානමය භක්ති ප්‍රකාශයක් ලංකාවේ බෞද්ධ රාජකීයන් හෝ සාමාන්‍ය ජනයා බුරුමයෙන් ආදර්ශයට ගත් බවක් නොපෙනෙන බව මූර්ති මහතා පෙන්වා දෙනු ලැබුවද[19] මහනුවර රාජධානි සමයේ ලංකාවේ රජුන් එවැනි පූජාවන්ට පෙළඹී තිබෙන බව පෙන්වා දිය හැකිය.

පොළොන්නරු සමයේ සිටම දළදා වහන්සේ ලබා ගැනීමට බුරුමය දැක්වූ උනන්දුව කෝට්ටේ රජු සමයේදී එලෙසම පැවතියේ යැයි බුරුම සහ පෘතුගීසි මූලාශ්‍රවලින් හෙළිදරුව් වේ. ඉහත සඳහන් කළ බයින්නාවුන් රජු සමයේ කෝට්ටේ රජ කළ දොන් ජුවාන් ධර්මපාල (1551 - 1581) රජු විසින් 1567 දී බුරුමයට යවන ලද එක් නැවක දන්ත ධාතුව එවන ලද බවක් බුරුම මූලාශ්‍රවල එයි.[20] එහෙත් මෙම කාලයේ දන්ත ධාතුව පැවතියේ සබරගමුවේ විහාරස්ථානයක බව මහාවංශය සඳහන් කරන [21] බැවින් බුරුම මූලාශ්‍රවල සඳහන් විශ්වාස කිරීම අපහසුය. එහෙත් පෘතුගීසි මූලාශ්‍රයක් වන දියෝගු දෙ

18. Ibid. p.66
19. Ibid. p.95
20. Ibid. p.97
21. ***CulaÊmsa,*** (ed.) W. Geiger, Part II, Pali Text Society (P.T.S.). London, 1927, V. xciv.

කුටෝ්ගේ විස්තරයට අනුව ලංකාවේ දන්ත ධාතුව ගෝවේ පාලකයාගෙන් ලබා ගැනීමක් පිළිබඳව සඳහන් වේ.[22] ලංකාවේ මූලාශ්‍ර ඉතා සුපරික්ෂාකාරීව විමසීමේදී පෙනී යන්නේ සටන මෙහෙය වූ වීදියේ බංඩාර අත පැවති දළදා අනුරුව පෘතුගීසින් අතට පත්වීමෙන් එය ගෝවට ගෙන යන ලද අතර එහිදී ගෝවෙන් එය ලබා ගැනීමට බුරුම පාලකයා සමත්වීම පිළිබඳවය. එම නිසා කුටෝ  සහ බුරුම වාර්තා එය දළදාව ලෙස සඳහන් කළද ලංකාවේ වංශකතා විග්‍රහ කිරීමේදී පෙනී යන්නේ එය ලංකාවේ අනුරුවක් බවය. එම නිසා මේ කාලයේ දළදාව බුරුමයට හිමිවීම පිළිබඳව සිද්ධිය පිළිගැනීම අපහසුය. කෙසේ නමුදු මෙම බුරුම සහ පෘතුගීසි මූලාශ්‍ර අනුව පෙනී යන වැදගත් කරුණ වන්නේ දළදා වහන්සේට ගෞරව කිරීමට බුරුමය දක්වූ උනන්දුව සහ දළදා අනුරුවක් වෙනුවෙන් හෝ ඔවුන් දරූ මහඟු උත්සාහයත්ය.

අනෙක් අතට දළදා වහන්සේට පෙරහැර පැවැත්වීමෙන් හා ප්‍රදර්ශනය කිරීමෙන් වැසි ලබා ගැනීම ලංකාවේ ජනතාව අතීතයේ සිටම උනන්දු වූ බව ප්‍රකට කරුණකි. ඇතැම් විට දළදාව ලබා ගැනීමට හෝ අවම වශයෙන් දළදා අනුරුවක් හෝ ලබා ගැනීමට බුරුම පාලකයින්ගේ උත්සාහයෙන් පෙනී  යන්නේ ද ඔවුන්ට ද එය හිමිවීමෙන් එසේ වැසි ලබා ගැනීමේ අවශ්‍යතාවය ද වන්නට පුළුවන. කෙසේ නමුදු දළදා වහන්සේ ලංකාවේ තැන්පත් වී තිබීමෙන් විදේශිකයන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ බව මෙම තොරතුරුවලින් මනාව පැහැදිලි වේ.

22. "The History of Ceylon from the Earliest Time  to 1600 A.D. as related by Joao de Barros and Diogo de Couto" **Journal of Royal Asiatic Society (Ceylon Branch), Vol. xx,** p. 212; මූර්ති, ලංකාව සහ බුරුමය, මියුරෝ පොත් ප්‍රකාශයෝ, 2005, පි. 95.

# "විදේශීය නර්තනවේදිනියක දුටු දළදා පෙරහැර"

**Beryl de Zoete ගේ සටහනක් ඇසුරෙන් කෙරෙන පරිවර්තනයකි.**

**සුදේශ් මන්තිලක**
කථිකාචාර්ය, ලලිත කලා අධ්‍යයනාංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**පරිවර්තකගේ සටහන**

Beryl de Zoete යනු පෙරදිග රංග කලාව පිළිබඳව විචාරාත්මක රචනාවන් ගණනාවක් සිදුකොට ඇති ඉංග්‍රීසි ජාතික නර්තනවේදිනියකි.

ඇගේ රචනාවලදී ඇය තමාට ක්ෂණිකව මතකයට නැගෙන කාරණා අව්‍යාජත්වයකින් ඉදිරිපත් කොට ඇති බව හැඟේ. ඇය ඉතා සියුම් හැඟීම්, මනෝභාවයන් රචනාවට එක්කොට ඇත. මේ හේතුවෙන් ඇගේ රචනා තත්කාලීන සමාජ, සංස්කෘතික තත්වයන් පිළිබඳව අතිශයෝක්තීන් නොවන අතරම අගතිගාමී ප්‍රකාශයන් ද නොවන බව පෙනේ.

එබැවින් දේශීය කලාව සහ සංස්කෘතිය මධ්‍යස්ථ ස්ථානයක සිට විග්‍රහ කරන්නෙකුට Zoete ගේ රචනා වැදගත් යැයි සිතමි. එසේ හෙයින් සිංහලයෙන් කියවීමට රුචියක් දක්වන එවන් පාඨකයන් සඳහා Zoete ගේ රචනාවක කුඩා කොටසක් හෝ පරිවර්තනය කිරීම උචිත බව හැඟුණි.

මෙහි පරිවර්තනය කොට ඇත්තේ ලන්ඩන් නුවර Faber and Faber සමාගම 1957 දී ප්‍රකාශයට පත් කළ Beryl de Zoete ගේ "Dance and Magic Drama in Ceylon" නමැති කෘතියේ 8 වැනි පරිච්ඡේදයෙන් කොටසකි. මෙම ග්‍රන්ථය ඇය රචනා කොට ඇත්තේ දින පොතක යොදන දීර්ඝ සටහන් ලෙසිනි. මාගේ ගණන් බැලීමට අනුව 8 වැනි පරිච්ඡේදයේදී ඇය ඉදිරිපත් කොට ඇත්තේ 1948 දී ඇය විඳි අත්දැකීම්ය. එම වර්ෂයේ අගෝස්තු 1,2,3 සහ 4 යන දිනයන් පිළිබඳව ඇය තබා ඇති සටහන් මෙහිදී පරිවර්තනය කොට ඇත. මෙම දිනයන් තෝරා ගැනීමට හේතුව වූයේ එම දිනයන්හි දී ඇය

මහනුවර දළදා පෙරහැර සහ ඒ හා බැඳි සංස්කෘතිය නිරීක්ෂණය කොට ඇයගේ පෞද්ගලික හැඟීම් ද එක්කොට සටහන් කර තිබීමයි.

Zoete ගේ භාෂා ව්‍යවහාරය සුවිශේෂිය. ඇය සිද්ධියකින් පසු තවත් සිද්ධියක් විස්තර කිරීමට යාමේදී, බොහෝ විට එම සිද්ධි දෙක අතර අවස්ථා සම්බන්ධයක් ඇති කිරීමට උත්සහ නොගන්නීය. සාහිත්‍යමය යෙදුම් නිරතුරු යොදන්නීය. ඒවා යථාර්ථයෙන් නොව සාහිත්‍යර්ථයෙන් අවබෝධ කොට ගත යුතුය. ඇය අතීත කාලය සහ වර්තමාන කාලය මිශ්‍රකොට යෙදීම මෙම රචනාවේ තවත් විශේෂයකි.

**අගෝස්තු 1 වැනිදා**

මම මහනුවර බලා යාමට බස් රථයක් බලාපොරොත්තුවෙන් සිටියෙමි. කිසිදිනක බසයකින් ගමනක් ගොස් නැත්තා සේ පෙනෙන මුරකරුවා කියා සිටියේ, සෑම පැය භාගයකට වරක්ම බස් රථයක් ධාවනය වන බවයි. අපි එය විශ්වාස කළෙමු. එහෙත් සත්‍ය වශයෙන්ම ධාවනය වූයේ පැය දෙකකටම එක් බස් රථයකි. එය සුන්දර ලඳු කැළෑවක් මැදින් ඉතා අපහසුවෙන් සහ සෙමෙන් ආ ගමනක්වූ අතර කඳුකර දර්ශන දැක ගැනීමට නොහැකි විය. 'රැජිණ' හෝටලය සමීපයේ සිට 'ශාන්ත ජෝර්ජ්' පෙදෙස දක්වා මා කැඳවාගෙන එන ලද්දේ ද සිල්වාගේ[1] මෝටර් රථයෙනි. Minnette[2] සිය නිවස වාස්තු විද්‍යාත්මකව කොටස්වලට වෙන් කරමින් සහ නැවත ගොඩනගමින් සිටි බැවින්, එය අසාමාන්‍ය ලෙස අපිළිවෙළට පත්වී තිබුණි. මෙය බලාපොරොත්තු විය යුතු තත්වයකි. කෙසේ වෙතත්, දොරක් නොමැති වුවද මා හට වඩා හොඳ කාමරයක් ලැබුණි. කෑම කාමරයේ බිත්තිය බිඳ දමා තිබුණේ නෙළුම් පොකුණක් සෑදීම සඳහාය. සීතල වර්ෂාව මාගේ අපහසුව තවත් වැඩි කළේය.

ද සිල්වා මහත්මියගෙන් ඉඳහිට ඇසෙන මැසිවිලි හැරුණු කොට, ද සිල්වා මහතා නිවුණු සහ ප්‍රීතිමත් බවක් පළ කළේය. ඒ දැන් ඔහුගේ නීතිමය

ගැටළුව විසඳී ඇති බැවිනි.[3] කවුරුන් කෙසේ හරස් වූවත්, ඔහු සිතන්නේ කුමක්ද එය ඔහුට එවේලේම කළ යුතුය. ඔහු මෝටර් රථයෙන් යන්නේ කොහේද, කොපමණ වේලා ගත කරනවාද, කිසිවිටක නොකියයි. සියලුදෙනා ඔහුට යටත්ව සිටින අතර ඔවුන් ඒ සඳහා හැඩගැසිය යුතුවිය. ඔහුට උස් හඬක් ඇත. කෝපවූ විට කෑ මොර දෙයි. එහෙත් ඔහු තම දරුවන් වෙනුවෙන් ස්වභාව සෞන්දර්යයට කැපවුණු ආදරණීය මිනිසෙකි. ඔහු තම පුතාට හිමි තේ වතුයායේ ඇති උද්‍යානයේ ඉඳගෙන ද සිල්වා මහත්මියගේ අතින් අල්ලාගෙන, පරම සුන්දර භූමි දර්ශනය දෙස පැය ගණන්, නිහඬව බලා සිටින ආකාරය මට කිසි දිනක අමතක කළ නොහැකිය.

වැස්ස විසින් විනාශ කර දැමුවත්, උද්‍යානය මල්වලින් පිරී ඇත. පෙරහැරට පෙර ඇති වී ඇති මෙම තත්වය බැලූ බැල්මට අසාමාන්‍ය එකකි. මෙම මාසයේ මෙසේ වැසි ඇතිවීම අසාමාන්‍යයයි. මන්ද මේ යුරෝපයේ ග්‍රීෂ්ම කාලයයි. අහෝ එය විඳීමට මා එහි නැති සැටියක් !

## අගෝස්තු 2 වැනිදා

අද සන්ධ්‍යාවේ මම පෙරහැර බැලීමට මහනුවරට ගියෙමි. එය අඳුරු සන්ධ්‍යාවකි. ප.ව. 8.30 වනතෙක් පෙරහැර (මාළිගාවෙන්) එළියට පැමිණියේ නැත. අද පෙරහැරේ පළමු දිනය හේතුවෙන් අටවිසි පූජා විධීන් සිදු කෙරෙන්නට ඇත. පළමු දිනය හේතුවෙන් පෙරහැරේ අඩු පිරිසකි දක්නට ලැබුණේ. අලියන් හය හත් දෙනෙක් පෙළට සිට කාර්ය බහුල ලෙස කෙසෙල් කොට සහ විශාල කිතුල් කොළ අතු තළු මරමින්ද, විශාල කඳන් ඉරා, පරෙස්සමෙන් පය තබා, මදය ගෙන ගිල දමමින් ද, සිටියෝය. අලංකරණ වලින් තොරව තිබූ උන්ගේ කන් නිදහසේ වැණුනු මුත්, උන් සියලුදෙනාට හිස් වැසුම් තිබුණි. ඒවා වෛවර්ණ විය. දේවාලයේ තාප්පය දිගට තවත් අලියන් සතර දෙනෙක් අවිවේකීව තළු මරමින් සිටියෝය. මොවුහු සත්‍යවශයෙන් ම ඉතාමත් අපිරිසිදු ලෙස ආහාර බුදින්නෝ වෙති. ඔවුහු බුදිනවාට වඩා වැඩි ආහාර ප්‍රමාණයක් පිඟන්වල[4] ඉතිරි කරති.

නොකඩවා වැයුණු බෙරවල ආකර්ෂණය නිසාවෙන් මම දළදා මාළිගය ඇතුළට ගියෙමි. කරඬුව ගෙන යන විශේෂ ඇතා (කඩිසරව ආහාර බුදිමින් සිටි) රන්හිලිගෙයකින් සහ වියනකින් අලංකාර කොට තිබුණි. ඔහුගේ හිස් වැසුම උත්කෘෂ්ටාලංකාර එකකි. එය රතු වර්ණ වූ අතර පිත්තල (සමහර විට රත්‍රං) බුබුළුවලින් අලංකාර කොට ඇත. හිස් වැසුමෙහි ආකාරයට ම අලංකාර කරන ලද ඇඳුමකින් ඔහුගේ කන් ද ආවරණය කොට ඇත. ඔහුගේ නළලෙහි මැණික් ගල් ඇති අතර එහි ඇති රතුවන් ගල සමහර විට රතුමැණික් විය හැකිය. පඩිපෙළෙහි ඇති මුළු ඉඩ ප්‍රමාණයම ඔහු ආක්‍රමණය කොට තිබූ නිසාවෙන් මා හට දළදා මාළිගය සඳහා දුර පාරකින් යාමට සිදුවිය. මාළිගය තුළ බෙර වාදකයන් ජව සම්පන්න ලෙස බෙර වැයූ අතර නර්තකයන් ඇඳුම් අඳින ආකාරය බැලීමට එන්නැයි කෙනෙකුගෙන් මට ඉඟියක් ලැබුණි. සෑම මුල්ලකම ඔවුහු ඇඳුම් අඳිමින් සිටියෝය. කීපදෙනෙක් මා හඳුනාගත් අතර මා හට සිනාවක් පා පිළිගත්තෝය. දේවාලයේ තාප්පය මත මිනිසුන් සිටිනවා මම දුටු අතර ඔවුහු මඩ කඩිත්තක් මතින් විශේෂයෙන් පනවා ඇති ආසන[5] පරීක්ෂාකොට බැලීමට ගියෝය. මේ අතර හින්දු ආගමික පූජනීය වස්තූන් සහිත කරඬුව රැගත් ඇතා සෙමෙන් පය තබමින් පැමිණියා. අනෙක් දේවාලයට ඇති මාර්ගය දිගේ ඔහුව කැඳවාගෙන ගිය අතර තවත් අලි ඇතුන් එහි කැඳවාගෙන යන්නට ඇත. පන්දම් පත්තු කෙරෙමින් තිබුණි. පිරිමින් අලි, ඇතුන්ගේ පිටට නගිමින් සිටි අතර ඔවුහු ලෝකඩ ඡත්‍ර හෝ පැරණි තාලයේ ආයුධ අත දරා සිටියහ. මාළිගාවේ අලි, ඇතුන් සඳහා වූ වැසිකිළියට එබී බැලීමට ද අවස්ථාවක් මම ලදිමි. සම්පූර්ණයෙන් ම සුදු වර්ණයෙන්, පැරණි සිංහල වංශාධිපතියකු මෙන් සැරසීගත් නුගවෙල (නිලමේ) පඩි පෙළේ ඉහළටම පැමිණියේය. ඔහු පිත්තල බොත්තම් එබ්බ වූ කළු පාවහන් පැළඳ සිටි අතර රැළි සහිත සුදු සායක් වැනි ඇඳුම නිසා ඔහුව තරබාරුවට පෙනුණි. ඔහු සුදු තොප්පියක් පැළඳ සිටි අතර මාළිගාවේ අනෙකුත් නිලධාරිහු රතු පැතලි තොප්පි පැළඳ සිටියහ. වෙඩිල්ල පත්තු විය. කුඩා ඇටවලින් පිරි, නර්තකයන්ගේ පාද සළඹවල ගිගිරි නාදය රැස්වී සිටි අනෙකුත් නර්තකයන්ට පණිවුඩ යැවීමක් විය. ඔවුහු මාළිගාවේ සිට බැස පැමිණ මාර්ගය දිගේ සිටගෙන සිටි අලිඇතුන් අතර හිස් තැන්වල පෙළ ගැසුණාහ. ඔවුහු එසේ ගොස් වැව පාර දිගේ ස්ථානගත වූහ. එහි උඩැක්කි, පන්තේරු නර්තන

කණ්ඩායම් හා බෙරවාදන කණ්ඩායම් වූහ.

පන්දම්වල ආලෝකයෙන් අඳුර මකා දැමූ අතර උතුම් දළදාව රැගත් හස්තියා පියගැට පෙළ දෙපස ඇති ගලින් කළ හස්ති රූප දෙක අතරින් සෙමෙන්, තේජාන්විත ස්වරූපයකින් බැස ආවේය. ඔහු සැම විටම අලුතින් පාදයක් තබන්නට පෙර පිටුපස පාදය ඉදිරියට ගනී. දේවාලවලට දිවෙන මාර්ග දූන් පන්දම්වලින් සහ මද අඳුරෙහි පෙනෙන අලියන්ගෙන් පිරී ඇත. නුගවෙල (නිලමේ) ධවල ඡත්‍රයක් යටින් පැමිණ, පෙරහැරේ ඔහුගේ ස්ථානයට ගොස්, ඇවිද ගියේය. පන්තේරු, නර්තකයන් කණ්ඩායමක් ඔහුට ගරු සරු ඇතිව නමස්කාර කොට, වේගවත් බවින් අඩු ගායනයක් (සමහරවිට වර්ණනාවක්) කරමින් අඩු වේගයකින් යුත් නර්තනයක් ඔහු ඉදිරියේ දැක්වූහ.

අලි, ඇතුන් හතළිහකින්, විවිධ නැටුම් කණ්ඩායම් වලින් (හොඳම නැටුම් කණ්ඩායම නොවේ) බෙර සහ නළා වාදකයන්ගෙන් සමන්විත වූ පෙරහැර ඉදිරියට යමින් තිබුණි. අලි, ඇතුන් සහ පන්දම් පැද්දෙමින් සෙමෙන් ඉදිරියට යන දර්ශනය ඉතාමත් රමණීය විය. එය ඉදහිට නතර වූයේ අලි, ඇතුන් මූත්‍රාකරන විටදීත්, නර්තකයන් නැටුම් දක්වන විටදීත් ය. ඇතැම් පන්තෙරු සහ උඩැක්කි නර්තකයන් ඉතා කුඩා පිරිමි ළමුන් වූ අතර ඇතැමුන් උඩැක්කි හො පන්තේරු නොමැතිවම නර්තනයේ යෙදුනි. පෙරහැර ගමන් කරත්ම එහි තාලයේ වේගය වැඩිවූ අතර කරකැවීම් සහිත චලන වැඩිවිය. පැරණි මාළිගය පෙරහැර ගෙවදින ආකාරය මැනවින් දැක ගැනීමට හොඳ ස්ථානයක් බව පොලිස් නිලධාරියෙකුගෙන් දැන ගතිමි.

අලි, ඇතුන් සහ නර්තකයන් රජවීදිය දිගේ පැමිණ දේවාලයට ගිය අතර දළදා කරඬුව රැගත් හස්තියා, නර්තකයෝ සහ බෙර වාදකයෝ නැවත මාළිගයට පැමිණියහ. තම නිවෙස් බලා යන අලි ඇතුන්ගේ සීනුවල ගිගිරි රාවය නොයෙක් දෙසට විහිදී ගියේය. අනතුරුව වලාකුළුවලින් වැසුණු සඳ එළියේ මම ද නිවස බලා ගියෙමි.

## අගෝස්තු 3 වැනිදා

ළමුන් දෝෂාරෝපණයන්ගෙන් හා ළදරුවන්ගේ කෑ මොරදීම්වලින් දවස ආරම්භ විය. කෑ මොර දෙන්නෙකු මා සමග මිත්‍ර වූ අතර ඇයව යෝග ව්‍යායාමවලින් නිශ්ශබ්ද කොට ඇවිදින්නට කැටුව ගියෙමි.

අද රාත්‍රියේ මම පෙරහැර බැලීමට ගියේ Minnette සමගය. බොහෝ පිරිසක් පදික වේදිකාවේ කෙලවරකට වී හිඳගෙන සිටි නමුත් එහි අලි ඇතුන් හතළිහක්වත් සිටියේ නැත. අපි දියවඩන නිළමේ (නුගවෙල නිළමේ) පෙරහැරට සැරසෙමින් සිටිනු දුටුවෙමු. ඔහු සිටියේ රත්‍රං බොත්තම් සහ සුදු රැළිපටි සහිත කමිසය අඳින අවස්ථාවේ වු අතර රතු රෙදි විශාල ප්‍රමාණයක් ඔහු වටා ඇද, බැඳ රැළි කොට තිබුණි. පැරණි ප්‍රවීණයෙකු විසින් එය නැවත විශාල පිරිසිදු රෙද්දකින්, ඉතාමත් විද්‍යාත්මකව ආවරණය කරන ලදි. අනතුරුව පුළුල් ඉන පටියක් තදට බඳින ලදි. මේ සියල්ල සිදුකළේ උඩරට වංශාධිපතියකුගේ උදාරත්වයෙන් අත්‍යවශ්‍ය ලක්ෂණයක් වූ මහත් වූ උදරය නිර්මාණය කිරීමටය. ඔහු අපට විශිෂ්ට සාරි කිහිපයක් පෙන්වීය. ඒවා දකුණු ඉන්දියානු, මුද්‍රිත සාරි විය. රමණීය වර්ණවලින් යුත් එම සාරි ආකර්ෂණීය විය. ඔහුගේ අනෙකුත් ඇඳුම්වලට ඉහළින් පැළඳීමට ඔහු අප්‍රමාණ අලංකාරයෙන් පොහොසත් මිශ්‍ර වර්ණයේ යුත්, විචක්ෂණ නිමැවුමක් වූ, පැරණි වූ විශේෂ අලංකාරයකින් යුත් සාරියක් තෝරා ගත්තේ ය. එය ඉතාමත් කලාත්මක ලෙස, ඔහුගේ දෙපා අතරින් යවමින් පසුබිමින් එක් පොටක් එල්ලෙන සේ අන්දවනු ලැබීය. කපුවලින් නිර්මාණය කොට රන් නූල්වලින් වැඩදමා තිබූ එම ඇඳුම මා දක ඇති රමණීය ඇඳුම් අතරින් එකකි. රටාවල විවිධත්වය හා වර්ණ සුසංයෝගය අපූරුය. එය හරියට ජාවා දේශයේ 'බතික්' මෙන් විය. සේද මෙන් මෘදුය විල්ලුද මතුපිටක් ඇත. ඔහුට (නිළමේට) ඔහුගේ ශරීර කෘත්‍යයන් කර ගැනීමට ඉඩ දී ඇති පිටවුණු අතර ඔහුගේ යෝජනාව පරිදි මාළිගාවේ එළිපත්තේ තබා තිබූ අපගේ පාවහන් ඔහුගේ කාර්යාලයේ දැමීය. පසුව ඒවා ලබා ගැනීම ඉමහත් දුෂ්කර කාර්යයක් වු බැවින් ඔහුගේ කාර්යාලයේ පාවහන් තැබීමට අප ගත් තීරණය ඉතාමත් කරදරකාරී එකක් විය.

වැවට ඉහළින් දර්ශනයත් සියලු මාර්ග එක්වන තැනත් මැනවින් පෙනෙන, දළදා මාළිගාවේ පුස්තකාලය ද ඇතුළත් පත්තිරිප්පුවට යාමට අපට නුගවෙල (නිලමේ)ගෙන් අවසර ලැබිණි. පෙරහැර ගමන් කරමින් තිබුණි.

මහා දේවාලයේ අලි, ඇතුන් කැටුව ඒමට පන්දම් සමඟින් යන නාථ දේවාලයේ ඇතා අපි ගස් අතරින් දුටුවෙමු. ඉතා ඉක්මණින් පැරණි මාළිගය පහළ මාර්ගය පන්දම්වල ආලෝකයෙන් මහත් සේ දීප්තිමත් වූ අතර කෙනෙක් එහා මෙහා පැද්දෙන අලියන් දුටුහ. බබළන සුදු සායවල් (වැනි ඇඳුම් ද), දිදුලන ශීර්ෂාභරණ ද සහිත නර්තකයන්ගේ කණ්ඩායම් අපි දුටුවෙමු. සුළු වේලාවකින් මාළිගාවේ පැරණි තුවක්කුව පත්තු වනවාත් සමඟම මහත් ශබ්දයකින් බෙර වාදකයන් වෙඩි මුරයක් බඳු බෙර මුරයක් පැවැත්වීය. බෙර වාදකයෝ වෘත්තාකාර හිස්වැසුම් ද නිලධාරීහු වෘත්තාකාර රතු හිස්වැසුම් ද පැළඳ ලහි ලහියේ පඩිපෙළ පහළට බැස්සෝ ය. මොහොතකින් විනිවිද පෙනෙන රේන්දවලින් නිමැවුණු වියන යටින් උදාර ලීලාවෙන් රන් කරඬුව රැගෙන එන නුගවෙල (නිළමේ) දක්නට හැකි විය. කරඬුව ඇතාගේ පිටේ බැඳීමෙන් අනතුරුව ඔහු (ඇතා) පැත්තෙන් පැත්තට පඩිපෙළ බැස ප්‍රධාන වාහල්කඩ පසු කළේය. ආරුක්කුව යටින් යනවිට කරඬුවේ රන්වියන දිලිසුණු අතර දියවඩන නිලමේ කරඬුව පිටුපසින් මල්පෙති මතින් ඇවිද ගියේය. ඔහු ධවල ඡත්‍රය යටින් මාර්ගය මැදට පැමිණෙත්ම බෙරවලින් නැඟුණු විශාල ගිගුම් දීමකින් ඔහුට ආචාර කරන ලදී. පහත් වී ආචාර කළ නර්තකයෝ ගායනා කරමින් නටා ශෛලිගත ආකාරයකට ඇවිදගොස් නැටුම අවසන් කළහ. එක කාරණාවක් හැරෙන්නට පෙරහැර සෑම අතින්ම ඊයේ රාත්‍රියේ පෙරහැරට සමානය. එය ඊයේ දිනයෙන් වෙනස් වන්නේ අපට අපේ පාවහන් සොයා ගැනීමට සිදුවූ අපහසුවෙනි. එය කිසිම සරණක් නොමැතිව මාළිගාවේ අපිව රඳවා තැබීමට හේතුවිය. දළදා මාළිගයට සම්බන්ධ යැයි පෙනෙන තරුණයෙකු කලිසම් ඇඳ, පාවහන් දමා (සෙරෙප්පුවත් නොව) සිටිනු දුටු මා මවිතයටත්, කම්පනයටත් පත්විය. අවසානයේ යතුර ලැබී පාවහන් ලබා ගැනීමට හැකිවූ අතර පෙරහැර ගෙවදින ආකාරය බලා ගැනීම සඳහා නටඹුන් මැදින් සියුම් ලෙස පය තබමින් පැරණි මාළිගාවට ගියෙමු.

**අගෝස්තු 4 වෙනිදා**

දොලපිහිල්ල සතුව කතාන්දර බොහෝමයක් ඇත. ඔහු උඩරට පැරණි රදලයන්ගෙන් පැවත එන්නෙක් බව පෙනෙයි. 1915 දී වයස අවුරුදු 18 ක්ව සිටියදී ඔහු පොලිස් අත් අඩංගුවට පත් වී ඇත. පෙරහැර මුස්ලිම් පල්ලියක් පසුකර යාමේදී ඇති වූ කෝලහාලයේදී මුස්ලිම් ආගමික හැඟීම්වලට ගරු නොකිරීම සහ පොලිස් අණට කීකරු නොවීම හේතුවෙන් ඔහු අත් අඩංගුවට පත්විය. දොලපිහිල්ලව විභාග කළ බ්‍රිතාන්‍ය නිලධාරියා කියා සිටියේ කෝලහලයට පෙළඹීමක් ඇති කිරීම ඔහු කළ වරද බවයි. මක් නිසාද යත් දොලාපිහිල්ල ලියන ලද ලිපියක 'මහනුවර කලබල ඇතිවීමට ඉඩ ඇති බව' ට අනාවැකි පළ කොට ඇත. මෙම සිද්ධියෙන් පොලිසියට දැඩි විවේචන එල්ල වී ඇති බව පෙනේ. එම අවස්ථාවේදී දුර්වල ලෙස ක්‍රියා කිරීම හේතුවෙන් බොහෝ ඉංග්‍රීසි ජාතිකයන්ට තම නිලතල අහිමිවිය. සිද්ධියෙන් දොලපිහිල්ල කැපී පෙනෙන චරිතයක් බවට පත්විය. කතාන්දර ගොඩක් මැදින් මා දොලපිහිල්ලගෙන් සමුගෙන එන විට රාත්‍රි උදාවී තිබුණි.

දොලපිහිල්ල සිතන ආකාරයට කොහොඹා කංකාරිය වනාහි යක්ෂ රජෙකු වූ රාවණාගෙන් පැවත එන නැටුම් ක්‍රමයක් වන අතර කිසිසේත් ම ඉන්දියාවේ සම්භවය වූවත් නොවේය. ඒ අනුව එය දේශීය එකක් බව නිගමනය කළ හැකිය. ඔහු (දොලපිහිල්ල) උඩරට නර්තනයේ පවතින දැඩි පුරුෂත්වය කෙරෙහි සහ එය පාලනය කරනා නිශ්චිත නීති රීති කෙරෙහි මාගේ අවධානය යොමු කළේය. වර්තමානයේ අලියෙකුගේ හොඬවැල දැක්වීමේදීත්, සර්පයෙකු නම්‍යශීලි චලන දැක්වීමේදීත් හැරුණුකොට[6] උඩරට නර්තනයේදී නම්‍යශීලි, වැනෙන සුළු චලනවලට ඉඩක් නොලැබේ. හෝ අතීතයේ ඉඩක් නොලැබී ඇත. ඇත්තෙන්ම, වෙස් නැටීමේදී භාවිත කෙරෙන ශිල්පක්‍රම, නීතිරීති, වන්නම් නැටීමේදී මදක් වෙනස් කොට නොගන්නේ මන්දැයි මට ගැටළුවකි. එසේ කිරීමට කිසිදු හේතුවක් මට නොපෙනේ.

පෙරහැරේ සයවැනි දිනයේදී දැකිය හැකිවන 'රන්දෝලි' වනාහි ප්‍රධාන බිසෝවරුන්ට අයත් (හිස්) දෝලවන්ය. 'රන්දෝලි' යන්නෙහි මුල් අර්ථය

වන්නේ 'රජ බිසෝවරු' හෝ 'ප්‍රධාන බිසෝවරු' නැතහොත් 'රන් බිසෝවරු' යන්නයි. පෙරහැර යනු දේශජ/ ආදිවාසී දෙවිවරුන් උදෙසා කෙරෙන උත්සවයකි. දළදාව හෝ බෞද්ධාගම සම්බන්ධ වන්නේ ද්විතීයික වශයෙනි.

රජ බිසෝවරුන්ගේ දෝලාවන් වර්තමානයේ රැගෙන යන්නේ සංකේතාත්මකවය. කොළඹ නගරයට අසන්නයේ පිහිටි කෝට්ටේ දී දැකගත හැකි පෙරහැර (ආරම්භයේදී) කෝට්ටේ රාජ ප්‍රධානීන්ගේ පෙරට්ටුවකි. කන්ද උඩරට පෙරහැර, මහනුවර ප්‍රදේශයේ ඇදහීමට ලක්වන දෙවිකෙනෙකු වන නාථ දෙවින්ගේ උත්සවයකි. එහෙත් එම දෙවියන්ගේ ස්වභාවය සහ ලක්ෂණ අප්‍රචලිතය.

අලුත් නුවර උත්සවය පැවැත්වෙන්නේ, මහනුවර ප්‍රදේශයේ දී ඇදහීමට ලක්වන, සුළුකොට තැකිය නොහැකි දෙවි කෙනෙකු වන දැඩිමුණ්ඩ දෙවියන්ගේ දේවාලයේය.

එසේම ගඩලාදෙණියේ සහ ගම්පොල ද පෙරහැර පැවැත්වේ. ගම්පොල පෙරහැර නැවැත්වීමට ගොස් 1915 දී මහා කැළඹීමක් ඇතවී ඇත. දොලපිල්ලට අනුව, පොලීසිය මුස්ලිම්වරුන්ගෙන් අල්ලස් ලබාගෙන, මුස්ලිම් පල්ලිය අසලින් පෙරහැර යන විට බෙර වාදකයන්ට වාදන නවත්වන්නැයි අණ කොට ඇත. කෝලාහලකරුවන් සහ ඔවුන්ට සහය වූ රටපුරා කෝලාහල කළ පිරිස් මූලධර්මවාදයට පක්ෂවූවන් ලෙස සැක කරනු ලැබිනි. ඉංග්‍රීසින්ට ඔවුන්ගේ ප්‍රධානීන් ගණනාවක් අහිමි විය. දොලපිහිල්ලට සමුදී බස් රථයෙන් මා නැවත පැමිණෙන විට අඳුර වැටී තිබුණි. රාත්‍රී ආහාර ගැනීම එතරම් ප්‍රසන්න නොවීය. මේසය තිබූ තැනට ජනේලයෙන් ප්‍රමාණවත් ලෙස ආලෝකය නොලැබීම නිසා ආහාර ගැනීම ඉතා අපහසු වුණා. Minnette ගේ නිවසේ ව්‍යුහාත්මක විකල්ප සැම විටම ඇතට දිවෙන සෙවනැලි නිර්මාණය කළේය. ඇය යෙදීමට බලාපොරොත්තුව සිටින ස්ථාවර ලාම්පු තවමත් සිවි වී නැත. එසේම ඉටිපන්දම් දැල්වීමෙන් මෙවන් අවස්ථාවක් මඟහරවා ගත හැකි බව කිසිවෙකුගේ අවධානයට ලක් නොවීය. වත්තෙන් කැඳවාගෙන විත් තිබූ කොළුවා මගේ උණුවතුර බෝතලය පුරවා නාන කාමරයේ ඇණයක එල්ලීය.

පෙර කළ අත් වැරදීම් ඔහුගේ මතකයේ ඇති බව මෙයින් පැහැදිලි විය. නොඑසේ නම් ඇඳ තුළට උණුවතුර බෝතලයක් දමන කෙනෙකු සිටිය හැකිද?

නිවස මා පැමිණිදා සිට යම් යම් වෙනස්මවලට ලක්විය. ගෙබිමේ සහ සීලිමේ දක්නට තිබුණු සිදුරු වැසී තිබුණි. මුළු මහා සාගරයේම ජලය තිබුණත් සෝදා පිරිසිදු කළ නොහැකි යැයි හැඟුණු ගෙබිම ඉතා ඉක්මනින් අවිදීමට හැකි තත්ත්වයට පත්විය. අනෙකුත් මූලිකාංග නොමැති වූවත්, දින ගණනක් ඒ මේ අත පාවෙමින් තිබුණු වැසිකිළි අසුන දැන් නිසි තැන නැංගුරම්ලා ඇත. උළුවහු ඇත. එහෙත් දොරවල් (වැඩකට ඇති) නැත. කෙසේ වෙතත් දොරවල් සවිකළත් එයින් වෙනසක් සිදුවේවිද යන්න සැක සහිතය. එහෙත් දිව්‍යලෝකයට යන්න සැරසෙන්නියක් වගේ Minnette ඇඳුම් අඳින කාමරයෙන් සැමවිටම දීප්තියක් විහිදේ. එසේම ඇය කොළඹ දී සිදුවන රුපියල් මිලියනයක කොන්ත්‍රාත්තුවක් පිළිබඳව සැමවිටම ස්ථාවර විශ්වාසයකින් සිටින්නීය.

Raven Hart ජීවත් වූ සැවෝයි හෝටලයට මම ඇවිද ගියෙමි. එය වැවට ඉහළින් භූමියක පිහිටා තිබූ රමණීය නිවසකි. විශේෂයෙන් ම එහි ආහාර රසවත් යැයි ප්‍රචලිතය. අපි ඔහුගේ Torres Straits පොත පිළිබඳව කතා කළෙමු. මහනුවර නොදුරු ස්ථානයක පිහිටි කතෝලික පල්ලියක දේව මෙහෙයේ යෙදුණු උඩරට නැටුම් කණ්ඩායමක් පිළිබඳව කරුණු ඔහු මට හෙළි කළේය.

ඉතාම හොඳ කාලගුණයක් පැවතුන ද දැන් කරමක් වලාකුළු සහිතය. (මා එය භයානක තත්ත්වයක් ලෙස නොසිතුවෙමි. මෙම වලාකුළු හිරු වටා විශාල ආවරණයක් ගොඩනැඟීය. ලොකු කුඩා ප්‍රමාණවලින් අලියන් වැව පාර දිගේ පෙරහැර සඳහා ඇදෙමින් සිටියෝය. මනරම් පොල් ගස්වල කඳන් වක්ව තිබූ පාර දිගේ දමා තිබුණි. මම කදිම පැරණි චිත්‍රිත තිර බිත්තිවල එල්ලා තිබුණු විෂ්ණු දේවාලයටත්, එසේම නාථ දේවාලටයත් ගියෙමි. මම රැජිණ

හෝටලයේ කෝපි කෝප්පයක සුව විඳින විට දැඩි වර්ෂාවක් ආරම්භ වී තිබුණි. මාළිගාව තුළ මම වැස්සෙන් ආරක්ෂා වී සිටියෙමි. පත්තිරිප්පුවේ සිට පෙරහැර නැරඹීම සඳහා නුගවෙල (නිළමේ) ගෙන් අවසර ගැනීමට මට නොහැකි විය. ඇතැම්විට ප්‍රධාන භික්ෂුවගෙන් අවසරයක් ඉල්ලා ගැනීමට හැකියාව තිබුණා විය හැකිය. එහෙත් පැරණි මාළිගය අසල ඇති බංගලාවේ සිටින රාජ්‍ය නියෝජිතයාගේ අනුමැතියක් නොමැතිව ඔහු එසේ නොකරනු ඇත. එබැවින් මම පොලිස් නිලධාරියෙකු ද සමග බංගලාව වෙත දිවෙන අඳුරු පාර සොයා අඳුරේම ඇඳුනෙමි. මම කිසිදු ආකාරයක පන්දමක්/ විදුලි පන්දමක් නොමැතිව පැරණි මාළිගාව සහ නටඹුන් මැදින් ගියෙමි. රාජ්‍ය නියෝජිතයා එහි නොසිටි අතර අපි නැවත පැමිණියෙමු. මේ වන විට නර්තකයන් සහ විවිධ සලකුණු රැගත් පිරිස ඉදිරියට ඒම ආරම්භ කොට තිබුණි. ඒ වන විටත් බලාපොරොත්තු සුන් කරමින් වැසි වසිමින් තිබුණි. නාථ (දෙවියන්)ගේ හස්තියා (ඔහුගේ තද රතුවන් ඇඳුම පන්දම් එළියෙන් ආලෝකමත්ව තිබුණි) දේවාලයේ පඩිපෙළ ඉතාමත් ප්‍රවේශමෙන් බැස ඉදිරියට පැමිණ, විෂ්ණු (දෙවියන්)ගේ හස්තීන් සිටින මාර්ගය දිගේ ඇදෙන්නට විය. මම මීට පෙර විෂ්ණු දේවාලයේ පන්දම්කරුවන් විශාල පිරිසක් සිටිනවා දුටිමි. මාළිගාව තුළ පිරිමි ළමෝ පිරිසක් මුහුණ සුදු පැහැගන්වාගෙන, කඩදාසි ඔටුණු පැළඳ වෙස් නැට්ටුවකුගේ විකෘතියක් ලෙස පෙනෙන ආකාරයේ ඇඳුම් පැළඳුම්වලින් සැරසෙමින් සිටියෝය. පුරුෂයෙකු සැරසෙන ආකාරය මම දුටුවෙමි. රතුවන් වූ පුළුල් ඉන පටියක් ශරීරයට තද වන සේ ඉනවටා එතීය. ඔහුගේ ඉන පටියට පහළින් වළලුමෙන් සිටින ආකාරයට යාර ගණනක් වූ සුදු රෙද්දකින් රැළි සැදීය.[7]

වර්ෂාව බලාපොරොත්තු සුන් කළේය. වෝඩ් වීථියේ තිබුණු ලී තට්ටුව මත ටික වේලාවක් සිටි මම පසුව රැජිණ හෝටලයට සේන්දුවීමි. එහි අඳුරු සීතල වාතාවරණයක් පැවතුණි. ඔවුන් සත්‍යවශයෙන් ම දැන සිටියා (මම නොදැන සිටි දේ) එනම්, හෝටලය පසුකොට යාමට පෙරහැරට අවසර නොලැබෙන බව.

නවය පසුවනවාත් සමගම වෙඩිල්ල පත්තු විය. පෙරහැර ගමන්

කරමින් තිබුණි. ඊට බොහෝ වේලාවකට පෙර, පෙරහැර සෙමෙන් වෝඩ් වීථිය දිගේ පැමිණ, රැජිණ හෝටලයට යොමුවන වීථි හුදකලා කොට දමමින්, වෙනතකට ගමන් කළේය. මෙසේ රැජිණ හෝටලය වර්ජනය කිරීමට හේතුව මට කිසිසේත් වැටහුණේ නැත. විවිධ මත, නොපැහැදිලි ආරංචි අසන්නට ලැබුණි. එහෙත් සත්‍යය කුමක්ද? කවුරු දනීද? පෙරහැර පැමිණි විට එය වැස්ස නොතකමින් උද්යෝගයෙන් ඉපිදවීමට සමත්විය. ඇතැම් අලි, ඇතුන් පවා දක්කනු ලැබුවේ කුඩ යට සිටය. ලොකු, කුඩා අලි, ඇතුන් 72 ක්, ජව සම්පන්න නැටුම් සහ බෙර වාදන ගණනාවක් පෙරහැරේ දැක ගන්නට හැකි විය. නිලමේවරුන් තුන්දෙනෙක් ඡත්‍ර යටින් ගමන් කළෝය. මෙම පිරිසට දියවඩන නිලමේ සහ තවත් දෙදෙනෙකු අයත් වූ අතර එක් අයෙක් අතිශය දීප්තිමත් වූ අලංකාර ලෙස මැහුම් කළ (එම්බ්‍රොයිඩර්) සුදු ඇඳුමකින් ද, තවත් නිලමේ කෙනෙක් රන් එබ්බවූ, රක්ත වර්ණ විල්ලුද හැට්ටයකින් ද සැරසී සිටියහ. ඔවුහු සියලු දෙනාම පිත්තල හෝ රිදී බොත්තම් එබ්බ වූ, පැහැදිලිව පෙනෙන කාල වර්ණ පාවහන් පැළඳ සිටියහ. අවසාන වශයෙන් රන්දොලි හෙවත් රන් බිසෝවරුන්ගේ දෝලාවන් රැගෙන එන ලදී. ඒ නිලමේවරුන් සමඟම පිටුපසිනි. රන්දොලි එතැනින් පිටවනවාත් සමඟම ප්‍රේක්ෂකයන් අතර තදබදයක් ඇති වූ අතර රැජිණ හෝටලයට පසෙකින් ජන ගංගාවක් නිර්මාණය විය. එහෙත් පෙරහැර ගමන් කිරීමට නියමිත වෝඩ් වීදියේ පහළට ගමන් කිරීමට අපට අවසර නොලැබුණි. කෙසේ වෙතත් මා හට ජන ගඟෙන් එළියට යාමට විශාල තෙරපුමක් කරන්නට සිදුවිය. මම තෙත බරිතව නිවස බලා පිය නැඟුවෙමි. තෙත් වූ සඳ වලාකුළු බිඳ මතුවෙමින් තිබුණි. කඳුකරය පැහැදිලි විය. තරුවක් බැබළුණි.

## සටහන් (පරිවතකගේ)

1. ද සිල්වා යනු මහනුවරදී නවාතැන් ලබාදුන් අයෙකි.

2. ස්ත්‍රියකගේ නමකි.

3. ද සිල්වා මහතාට තම නිවස වෙනස් කොට ගොඩනැඟීමට යම් නීතිමය ප්‍රශ්න තිබුණා විය හැකිය.

4. 'පිඟන්වල ඉතිරි කරනවා' යන්න යථාර්ථයෙන් නොව සාහිත්‍යාර්ථයෙන් ගත යුතුය.

5. රචකයා විශේෂයෙන් පනවා ඇති ආසන ලෙසින් දක්වා ඇත්තේ කුමක්දැයි පැහැදිලි නැත. මෙය ඇතුන් පිට යාම සඳහා භාවිත කළ ආසන හෝ පෙරහැර බැලීමට පනවා තිබූ ආසන විය හැකිය.

6. ගජගා සහ නෛයඩි යන වන්නම් නව නිර්මාණ නර්තනයක් ලෙස ඉදිරිපත් වීමේදී මෙවැනි චලන දැකගත හැකිය. මයුරා වන්නමත් මෙයට නිදසුන් කොට දැක්විය හැකිය.

7. කර්තෘ මෙසේ විස්තර කරන්නේ, උඩරට නර්තනයේ හඟල නමැති ඇඳුම් කොටස අඳින සාම්ප්‍රදායික ක්‍රමය විය යුතුය.

# පුරාතන ශ්‍රී ලංකාවේ නීතිය සහ සදාචාරය තහවුරු කළ සිරි දළදා වහන්සේ

**මහාචාර්ය හඟුරන්කෙත ධීරානන්ද හිමි**
ඉතිහාස අධ්‍යයන අංශය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ පාලක පන්තියේ සිට සාමාන්‍ය ජනතාව දක්වා විහිදි යන සමාජගත චරිතයන්හි හැසිරීම් රටාව මෙන්ම ඔවුන්ගේ චර්යාත්මක භූමිකාව වඩාත් අර්ථ ගැන්වීමට මෙන්ම සදාචාරාත්මක හැඩ තලයක් වෙත ගෙන යාම පිණිසත් බෞද්ධ දර්ශනය තුළින් මෙන්ම බෞද්ධ සංස්කෘතියත් ඒ හා සැබැඳි පූජා වස්තූන් ආශ්‍රිතයෙන් ලැබුණු පිටිවහලත් සුළු කොට තැකිය නොහැකිය. ශ්‍රී ලාංකේය පාලක චරිත හැඩ ගැස්වීම කෙරෙහි බලපෑ" ධම්ම සංකල්පය" ට දිගු ඉතිහාසයක් ඇත. ථේරවාදී සම්ප්‍රදාය මෙන්ම මහායාන සම්ප්‍රදාය ක්‍රියාත්මක වීම මත කාලීන වශයෙන් වර්ධනයක් ඇති වූ "ධම්ම සංකල්පය" පසුව විශ්වීය නීතියක් ලෙසත් ධර්මය රාජ්‍යයත්වයට අදාල නීති සකස් කිරීමේ මූලාශ්‍රයන් ලෙසින් සැලකිණි. [1] රජුගේ අණ ධර්මය වන අතර ධර්මය මුල් කොට ලොව පාලනය කරන බවත් දැහැමි පාලනයක් තුළින් පාලක මඬුල්ල හා රට වැසියා දැහැමි වන අතරම රටේ සමෘද්ධිය ද එමගින් ඇති වන ආකාරයක් ත්‍රිපිටකය තුළ පෙන්වාදි තිබේ. [2]

දැහැමි බව වඩාත් අර්ථගැන්වීම් වස් රජු බෝධිසත්වයකු ද විය යුතු යන අදහස පශ්චාත් අනුරාධපුර අවධියේ සිට වර්ධනය විය. හතරවැනි මහින්ද රජුගේ (ක්‍රි.ව. 956-972) ශිලා ලේඛනයක රජු බෞද්ධයකු පමණක් නොව බෝධි සත්ත්වයකු බවටද පත්විය යුතුය යන්න දැක්වීමෙන් ඒ බව සනාථ වේ. බෝධි සත්වයෙකු නොවන කෙනෙක් මෙම රාජ්‍යයෙහි රජෙකු නොවිය යුතු බව බුදුන් වහන්සේ විසින් විවරණ ලබා දී ඇති බවද එහි සඳහන් කරයි[3]. පළමුවැනි විජයබාහු රජුගේ අඹගමුව සෙල් ලිපියේ බෝධිසත්ව ගුණාංග ඇතුළත් දසරාජ ධර්මයට අන්තර්ගත චර්යා රැසක් පෙන්වාදී තිබේ[4].

වේලෙක්කාර සෙල්ලිපියේ පළමුවැනි විජයබාහු රජු දශරාජ ධර්මයෙන් යුතුව පාලන කටයුතු ගෙනගිය බව දක්වේ[5]. එමෙන්ම දෙවැනි විජයබාහු ද සියළු සදාචාරාත්මක දැහැමි චර්යා රටාවන් අනුගමනය කළ බව මහාවංශ කියයි[6]. නිශ්ශංකමල්ල සහ ලීලාවතී බිසවද දසරාජ ධර්මයට අනුකූලව පාලන කටයුතු ගෙනගිය බව ශිලාලේඛනයන්හි දක්වා ඇත. [7] මෙම මගින් එළිවනුයේ රජුගේ දැහැමි බව සමාජය කොතෙක් ගරු කළේ ද යන්න මෙන්ම දැහැමිකම සමාජය තුළ ඇගැයුමට ලක්ව පැවැතියේ කෙසේද යන්නයි.

දසරාජ ධර්මයනට අනුගතව සතර සංග්‍රහ වස්තුවෙන් ජනයාට අනුග්‍රහ දක්වමින් සතර අගතියෙන් තොරව දස පින්කිරිය වත් පුරමින් [8] ආදර්ශමත් පාලන නායකත්වයක් වෙත යාමට ලක්දිව පාලක පිරිස් කටයුතු කළ අතර ප්‍රදර්ශනාත්මක ආගමික කටයුතු වලදී පාලකයා මුලිකත්වය ගත්තේය. මෙහිදි බුදුරදුන්ගේ ශාරීරික , පාරිභෝගික හා උද්දේසික යන ත්‍රිවිධ පූජා වස්තු ප්‍රමුඛත්වයට පත් වු අතර ඒ කෙරෙහි පැවැත් වු මහා පූජෝත්සවයන්හිදි පාලකයා මුලිකත්වය ගැනීම, එක් පැත්තකින් ආගම හා රාජ්‍යය අතර පැවැති අන්‍යෝන්‍ය සම්බන්ධය ඉස්මතු කළ අතරම අනෙක් පසින් රජුගේ දැහැමි බව වඩාත් ප්‍රකට කළේය.

ක්‍රිස්තු වර්ෂ සිව්වැනි සියවසේදී ලක්දිවට ශ්‍රී දළදා වහන්සේ වැඩම කිරීමත් සමඟ මෙතෙක් පැවැති පූජ්‍ය වස්තු ගණයට දළදාව එක් වු අතර එතැන් පටන් ලක්දිව ඇති බුදුරදුන්ගේ මහර්ඝනීය පූජ්‍ය වස්තුව බවටද පත්විය. පාලකයා හා පූජ්‍ය වස්තුන් අතර පැවැති සම්බන්ධය නව දිශානතියක් ඔස්සේ වර්ධනය වීමටටත් දළදාව පදනම් කොට දළදා සංස්කෘතියක් නිර්මාණය වීම කෙරෙහිත් බලපෑ බව ඇති සාක්ෂි විභාග කර බලන කල්හි පෙනීයන කරුණකි. ආගමික හා සංස්කෘතික භූමිකාව තුළද ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ දින සිටම සුවිශේෂිත පූජ්‍ය වස්තුවක් ලෙසින් සනිටුහන් වේ. බුදුරදුන්ගේ ඇති උත්තම ශාරීරික ධාතුන් වහන්සේ ලෙසින් සැලකෙන ශ්‍රී දළදාව ශ්‍රී ලාංකේය බෞද්ධ ප්‍රජාව අතට පත්වීම මහත් භාග්‍යයක් ලෙසින් පුරාතන අවධියේ සිටම පාලක පක්ෂය මෙන්ම ජනතාව ද සැලකූ අතර

දළදාව හා සම්බන්ධ පූජා, අභිචාරවිධි හා චින්තන සම්ප්‍රදායක් මෙන්ම සංස්කෘතිකාංග රැසක් ද කලින් කලට ශ්‍රී ලාංකේය බෞද්ධ ජන ජීවන පැවැත්ම හා නිරන්තරයෙන් ඒකබද්ධ වෙමින් පෝෂණය විය. නිසි කලට වැසි ලැබ රට සශ්‍රීකවීම ද කාල විපත්වලින් තොර සෞභාග්‍ය ලැබීමේ බල මහිමයක් ද නීතිගරු හා සදාචාරාත්මක වර්ධනයක් ද ශ්‍රී දළදාව කෙරෙහි නිසි පූද පූජා සත්කාර දැක්වීම තුළින් ලැබෙන බව ලක්වැසියෝ අතීතයේ සිටම බැතිබර සිතින් යුතුව විශ්වාස කළහ.

එමෙන්ම පාලකයාගේ දැහැමි බවේ මෙන්ම පාලනයට ඇති නිත්‍යානුකූල අයිතියේ සංකේතයක් ලෙසින් දළදාව හිමිකර ගැනීමද තුළින් මෙන්ම පාලකයාගේ ක්‍රියාකාරිත්වය හා ඔහුගේ දායකත්වය මෙන්ම පැවැති අභිචාර විධි ඔස්සේ අතීතයේ සිටම ලක්වැසියාගේ ජනවිඥානයට බද්ධව පවතියි. දළදා වහන්සේගේ අයිතිය හෝ හිමිකම සිය දේශපාලන අයිතිය තහවුරු කළා පමණක් නොව දළදා වහන්සේ තමා සතුකර ගැනීම හා දළදා සෙවනේ විසීමද සිය රාජත්වයේ අභිමානනීයත්වය තීව්‍ර කිරීමට හේතු කාරකයක් ලෙසින්ද ශ්‍රී ලාංකේය පාලන ස්තරායනය තුළ මුල් බැස ගනිමින් දොළොස්වැනි සියවසින් පසු දශක ගණනාවක් මුළුල්ලේ ක්‍රියාත්මක මට්ටමින් පැවැති බව ඓතිහාසික තොරතුරු විමර්ශනය කරන විට ඉස්මතුවන වැදගත් කරුණකි.

ක්‍රිස්තු වර්ෂ සිව්වැනි සියවසේදී බුදුරදුන්ගේ වාම ශ්‍රී දළදාව ශ්‍රී ලංකාවවට වැඩිම විමත් සමඟ දේශීය සංස්කෘතියේ ප්‍රධාන පූජ්‍ය වස්තුවක් බවට දළදා වහන්සේ පත්වන අතර රාජ්‍යයේ පාලකයාගේ දැහැමි බිමේ සංකේතය ලෙසින් මෙන්ම රාජ්‍යත්වයේ උරුමයේ හා ඔහුගේ නීති ගරුක බවේ මෙන්ම පාලන හිමිකමේ එක් ප්‍රධාන සංකේතයක් බවටද පත්වේ.

මුල් අවධිවල දළදා පෙරහැර පාලකයාගේ දැහැමි බව හා සිය අනන්‍යතාව ඉස්මතු කළ ප්‍රදර්ශනාත්මක අවස්ථාවක් විය. කිත්සිරිමෙවන් රජු වාර්ෂිකව මෙලෙසින් දළදා පෙරහැර පවත්වා මතුවට ද දළදා වහන්සේ වෙත මෙබඳු ආකාරයෙන් නව ලක්ෂයක් වියදම් කොට වාර්ෂික පූජා පෙරහැර කළ

යුතුයැයි සිරිත් ලිවීමක්ද (චාරිත්ත ලෙඛං ) ද කළ බව දැක්වේ.[9]. පාලක පක්ෂය එම සිරිත් එලෙසින්ම ඉදිරියට ගෙනිය බව පස්වැනි සියවසෙදී ෆාහියන් හිමියන් දක්වන තොරතුරු තුළින් සනාථ වේ. උන්වහන්සේ ඒ ගැන මෙලෙසින් දක්වයි. දින දහයකට කලින් හස්තියෙකු හස්ත්‍යාභරණයෙන් සරසවා රාජකීය සළු පිළියෙන් සරසවන ලද පුද්ගලයෙකු හස්තියා මත නංවා දළදා ප්‍රදර්ශනය ගැන ජනතාව දැනුවත් කරන බවත් දළදා ප්‍රදර්ශනයෙන් අනතුරුව දන්ත ධාතුන් වහන්සේ මන්දිරයෙන් පිටතට ගෙන ප්‍රධාන මාර්ගය දිගේ වැඩම කරවනු ලබන අතර එම මාර්ගය දෙපස බුදුරදුන්ගේ අතීත කථා පුවත් රැගත් ජාතක සිතුවම් පන්සියක් පමණ ප්‍රදර්ශණය කරනු ලබන බවත් එතැන් සිය අභයගිරි විහාරය දක්වා වැඩමවනු ලබන දළදා වහන්සේට මඟ දෙපස දී මහත් පූජාවන් ජනතාව විසින් පවත්වනු ලබන බවද ෆාහියන් හිමියෝ සඳහන් කරති.[10] ක්‍රි. ව. සිවුවැනි සියවසේ සිටම ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ දළදාවේ අයිතිය හේවත් උරුමය රාජත්වය හිමිකම මෙන්ම රාජත්වය ඔපවත් කළ සංකේතය යන ආකල්පය මෙවැනි පුදපූජාවන් ඔස්සේ ක්‍රමයෙන් වර්ධනය වීමක් දැකිය හැකිය.

අනුරාධපුර යුගයට වඩා මෙම තත්ත්වය පාලන ක්ෂේත්‍රය තුළ ඉස්මතු වනුයේ පොළොන්නරු යුගයෙන් පසුවය. අනුරාධපුර යුගයේ අවසන් භාගයේ එල්ලවන දකුණු ඉන්දීය ආක්‍රමණ හමුවේ උත්තරෝළ මූළයේ භික්ෂූන් විසින් සතුරන් අතට දළදාව පත්නොවීම පිණිස හා ඊට නිසි ගරුත්වය ලබාදෙනු පිණිස රෝහණ දේශයට වැඩම කරවා එහි එක් ස්ථානයක සඟවනු ලැබූ අතර පළමුවැනි විජයබාහු රජු (ක්‍රි.ව. 1055-1110) නායකත්වයට පත්වීමත් සමඟ රජුගේ අනුග්‍රහය මතින් දළදා වහන්සේ පෙරළා පොළොන්නරුවට වැඩම කරවා ඇත.[11] විජයබාහු රජුගේ නායකත්වයේ නිත්‍යානුකූල බව වඩාත් ඉස්මතු වූයේ දකුණු ඉන්දියානුවන් පරාජයට පත්කිරීමෙන් පමණක් නොවන අතර දළදා වහන්සේ පොළොන්නරුවට වැඩමවා අටදාගෙය සදා එහි තැම්පත් කිරිමෙන් පසුවය. දෙවැනි ගජබාහු දවස මාණාභරණයන් සටන් කොට පොළොන්නරුව පැමිණ දළදාව හා පාදාව හා සිය මෑණියන් ද පොළොන්නරුවට ගෙන්වා ගනිමින් තමා රටේ අගරජ බව ප්‍රකාශ කිරීමට තරම් ශක්තියක් මෙන්ම නිත්‍යානුකූල බවක් හිමිකරගනු ලැබුවේ ද දළදා

වහන්සේ හා පාත්‍රා ධාතුව තමන් සතුව පැවතීම මතය. [12]. එමෙන්ම සුගලා බිසව සතුව පැවති දළදා වහන්සේ ලබා ගැනීමට යන සෙන්පතීන් අමතා පරාක්‍රමබාහු විසින් දෙන උපදේශයක් මහාවංසය දක්වයි. මෙම ප්‍රකාශය තුළින්ද දළදා වහන්සේට එවකට හිමිව තිබූ ගෞරවණීයත්වය මෙන්ම ඒ කෙරෙහි වූ රජුගේ අපේක්ෂාව මෙන්ම එම පූජ්‍ය වස්තුව තමා සතු කර ගැනීමෙන් ලැබෙන නිත්‍යානුකූල භාවය කුමක්ද යන්න නිශ්චය කර ගැනීමට අදාල කර ගත හැකිය. එනම් "යුද්ධයෙන් පරජිතව පලා යන පිරිස් දළදා වහන්සේ හා පාත්‍රා ධාතුව ද රැගෙන එතෙරට පලායාමේ සුදානමක් ඇති බව තමාට ආරංචි වී ඇති බවත් එසේ වුවහොත් මේ ලක්දිව හිස්වන බවත් අසදෘශ රත්නය නම් දළදා වහන්සේ හා පාත්‍රා ධාතුව බවත් සියලු යුද ආයුධ සන්නද්ධව යෝධ ජනයා රැස්කොට උතුම් ලක්දිව නිරවුල් කොට කළ ව්‍යායාමය ද නිශ්ඵල වන බවත් සියළු රත්නයන්ගේ රශ්මියෙන් මාගේ කිරිටය බබළවන නමුදු මහර්ෂි වූ දළදා පාදා ස්වාමීන් වහන්සේලාගේ උත්තම වූ ස්පර්ශයෙන් එය පවිත්‍ර කරන ලද්දේ වේ." [13] මෙලෙසින් ඔහු විසින් ප්‍රකාශ කරනු ලබන්නේද පොළොන්නරුවේ නායකත්වයට පත්වුව ද දළදාව හා පාදාව නොමැතිව එහි නිත්‍යානුකූල බවක් හිමි නොවන බැවින්ය.

එමෙන්ම දළදාව සුගලා බිසවගෙන් ලබාගෙන පෙරලා පොළොන්නරුවට වැඩම වීමෙන් පසු පළමුවැනි පරාක්‍රමබාහු රජු සිය දෙඅතින් පිළිගෙන හිසමත තබා දළදා වහන්සේ පෙරහැරකින් විදි ඔස්සේ සංචාරය කරමින් සැදූහැ සිතින් ගෙනයනු ලබන්නේ ද සිය දැහැමි බව මෙන්ම රාජ්‍යත්වයේ නිත්‍යානුකූලත්වය මහජනයා වෙත ප්‍රදර්ශනාත්මකව පෙන්වීමක් ලෙසටය. [14]. නිශ්ශංකමල්ල රජු සිය පුතනුවන් හා දියණිය ද දළදා වහන්සේ වෙත පූජා කරනුයේද සිය දරුවනට අයත්වන රටේ අනාගත නායකත්වයට නිත්‍යානුකූල බවක් ලබාදීමේ එක් අපේක්ෂාවක් මත බව පැහැදිලිය.[15]

තෙවැනි විජයබාහු රජු දඹදෙණියේ නායකත්වටය පත්ව සිය පාලනය තහවුරු කර ගැනීම සඳහා කොත්මලේ සඟවා තිබූ දළදා වහන්සේ

ගම් නියම්ගම් මැදින් සිය සේනා පිරිවර කොට දඹදෙණියට වැඩමවා බෙලිගල තැම්පත් කළේය. [16] එමෙන්ම දෙවැනි පරාක්‍රමබාහු රජු බෙලිගලින් සිය උපන් භූමිය වන සිරිවඩ්ඪන පුරයට දළදා වහන්සේ වැඩමවා එහි ඉදිකළ විජයසුන්දරාරාමයේ තැම්පත් කොට පුදපූජා පවත්වා ඇත. [17] එමගින් දෙවැනි පැරකුම් රජු උත්සාහ කරනුයේ සිය දේශපාලන අයිතියේ නිත්‍යානුකූළ බව තහවුරු කර ගැනීමට බව පැහැදිලිය. එමෙන්ම සිවුවැනි විජයබා රජු දිව්‍ය රථයකට සමාන වූ මහ රථයක දළදාව හා පාදාව තැන්පත් කොට පොළොන්නරුව පුරවරයට වැඩම කරවා පෙර කල්හි පොළොන්නරුවේ පැවැති ශ්‍රී විභූතිය නැවත මතු කරමින් රජු විසින් ධාතු යුග්මය විෂයෙහි පුදපූජා පවත්වනු ලැබීය. [18] අභිෂේකය කේන්ද්‍රකර ගනිමින් පුලස්ති පුරවරයේදීම දළදා වහන්සේගේ ආශිර්වාදය ලබාගැනීම පිණිස මෙන්ම දළදා වහන්සේට සහ පාත්‍රා ධාතුන් වහන්සේට තමාගේ ඇති භක්තිය ප්‍රදර්ශනාත්මකව පෙන්වීම පිණිසත් පොළොන්නරුව සමාන තත්වයකින් රාජත්වයට ඇති නිත්‍යානුකූල බව දක්වීමටත් මෙලෙසින් දඹදෙණියේ සිට පොළොන්නරුවට දළදා වහන්සේ වැඩම වන්නට ඇතැයි සිතිය හැකිය.

පළමුවැනි බුවනෙකබාහු (ක්‍රී.වත 1277:1284) සමයේ සිය අගනගරය යාපහුවට මාරු කිරීමෙන් පසු දළදාව හා පාදාව යාපහුවට ගෙන යමින් දළදා වහන්සේගේ ආශිර්වාදය හා එමගින් ලබන ලද රාජ්‍යය උරුමය මත එහි සිට පාලන කටයුතු ගෙන ගොස් තිබේ. [19] දෙවැනි බුවනෙකබාහු රජු විසින් සිය පාලන මධ්‍යස්ථානය කුරුණෑගල ගෙනායාමත් සමඟ දළදා වහන්සේද එහි වැඩමවා මාළිගයක් ගොඩනංවා එහි තැම්පත් කොට දළදා වහන්සේ ඔස්සේ පාලනයට ඇති ස්වකීය අයිතිය ඔහු විසින් තහවුරු කර ගෙන තිබේ. [20] මෙම අවධිය තුළ ලියවෙන දළදා සිරිත මගින්ද පාලකයෙකු ලෙසින් දළදා වහන්සේගේ කටයුතුවලට මැදිහත්වීමට ඇති අයිතිය මෙන්ම ඔහු සතු වගකීම කවරේද යන්න තීරණය කර ඇති බව එහි ඇති ව්‍යවස්ථාව කියන විට පෙනීයන කරුණකි. [21]. සිවුවැනි බුවනෙකබාහු (ක්‍රි.ව. 1341:1351) විසින් ගම්පලට සිය පාලන මධ්‍යස්ථානය මාරු කිරීමත් සමඟ ගම්පල නියම්ගම්පාය විහාරස්ථානය වෙත දළදා වහන්සේ වැඩමවා ගෙන ගොස් ඇති බව

සාහිත්‍යගත තොරතුරුද හපුගස්තැන්න හා විගුලවත්ත සෙල්ලිපි දක්වන තොරතුරුවලින්ද සනාථ වේ. [22] අලගක්කෝණාරයන් විසින් ගොඩනගන ලද කෝට්ටේ අගනගරය වෙත වීරබාහු කුමරු විසින් දළදා වහන්සේ ගම්පල සිට කෝට්ටේ රාජධානිය වෙත වැඩමවමින් එහි තැන්පත් කොට එම නගරයද පාලන කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට සුදුසු නගරයක් බව සනාථ කරණු ලැබීය.[23] සවැනි පරාක්‍රමබාහු රජු විසින් තෙමහල් ප්‍රසාදයක් කරවා නව රත්නයන්ගෙන් බඳනා ලද රන්මුවා කරඬුවක් ද එය වසා නානාප්‍රකාර කාන්තියෙන් බබළන මාණික්‍යය සහිත රන් කරඬුවක්ද බැගින් රන් කරඬු හතරක් සකසා ඒ තුළ දළදා වහන්සේ තැන්පත් කොට උතුම් ජුජාවන් රැසක් කළ බව වංශකථා කියයි.[24] සිය මාළිගයට නුදුරු ස්ථානයක දළදා මැඳුර ඉදිකර කරලමින් කළ අපමණ පූජාවන් පවත්වමින් දළදා වහන්සේගේ ආශිර්වාදයද ලබා ගනිමින් කෝට්ටේ නගරය අග නගරයක් බවට පත් කළා පමණක් නොව දැහැමි පාලකයෙකු ලෙසින් පාලන කටයුතු ගෙනයාමට ඇති අයිතියද එමගින් රජු ප්‍රදර්ශනය කරලීය.

පෘතුගීසින් ලක්දිවට පැමිණ මෙරටේ පලනයට ප්‍රවේශ වීමත් සමගම දළදා වහන්සේ දෙල්ගමුවට වැඩමකරවීම තුළින් ඔවුනට මෙරටේ පාලන කටයුතු ගෙනයාමට අයිතියක් නැති බව ව්‍යංගාර්ථවත්ව හඟවා තිබේ. එමෙන්ම පළමුවැනි රාජසිංහයන් ආගමට විරුද්ධව වැඩ කටයුතු ගෙනයන අවස්ථාවේ දෙවනගල රතනාලංකාර වැනි හිමිවරු දළදා වහන්සේ තමා භාරයට ගෙන කටයුතු කරනුයේද එබඳු පාලකයෙකුට දළදාව අයිතිවීම වැළැක්වීම පිණිස බව පැහැදිලිය. ජන කතාවකට අනුව දෙවනගල රතනාලංකාර හිමියන් භික්ෂූන් විසින් මැදමහනුවරට වැඩම කරවා උන්වහන්සේගේ උදවුවෙන් දළදා වහන්සේ දෙල්ගමුව වෙහෙරින් මැදමහනුවරට වැඩමාගෙන එන ලද බවත් දැක්වීම තුළින් පෙනීයන්නේ රජ උරුමයක් නොමැති පුද්ගලයෙක් වෙත එම උරුමය ලබා නොදීමට භික්ෂූන් එබඳු පියවරක් ගත් බවය. පෘතුග්‍රීසින් යටතේ හැදුණු වැඩුණු ඔවුන්ගේ සේවාකම් කළ කොණප්පු බණ්ඩාරයන් වෙත පූර්ණ සහාය ලබා ගැනීමටත් ඔහු කෙරෙහි ජනතාවගේ පැවැති අප්‍රසාදය දුරුකරලීමටත් දළදා වහන්සේ

ඔහුගේ හිස මතින් මැදමහනුවරට වැඩමවීම උපක්‍රමයක් ලෙසින් භික්ෂූන් විසින් කරන්නට ඇතැයි සිතිය හැකිය.[25]

වර්ෂ 1592 දී දන්තුරේ සටනින් කොණප්පු බණ්ඩාරයන් ජයගෙන දෝන කතරිනා කුමාරිය සරණපාවා ගනිමින් පළමුවැනි විමලධර්මසූරිය නමින් කන්ද උඩරට නායකත්වයට පත්ව දිනපතා තමනට පුද පූජාවන් පැවැත්වීමේ අරමුණෙන් නගරයේ සුන්දර භූමි භාගයක දෙමහල් දළදා මැදුරක් කරවා දළදා වහන්සේ වැඩම කරවා එහි වඩා හිඳුවා නිති පුදපූජා පවත්වූන ලැබූ බව වංශකථාව සඳහන් කරයි. [26] මෙමඟින් ද පැහැදිලිවන්නේ තමාගේ රාජත්වය නිත්‍යානුකූල බව සනිටුහන් කරලීමට දළදා වහන්සේ තමාගේ අණසක යටතේ තබා ගැනීමට රජු ක්‍රියාකළ බවය. කන්ද උඩරට නායකත්වයට පත් නායක්කාර වංශික පාලක පිරිස් ද සිය අනන්‍යතාවය ශක්තිමත් කර ගැනීම පිණිස දළදා වහන්සේ එක් පාර්ශවයකින් තබාගත් බව මූලාශ්‍ර පරිශීලනය කරන පැහැදිලි වේ. විශේෂයෙන් වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේගේ උපදෙස් මත වාර්ෂිකව දළදා වහන්සේ වෙනුවෙන් සෙංකඩගල නුවර පෙරහැරක් පළමුවෙන් පැවැත්වීමේ ගෞරවයද හිමිවනුයේ නායක්කාර වංශික කීර්ති ශ්‍රී රාජසිංහ රජුට. ඒ වෙනුවෙන් රනින් නිමවන ලද රන්සිවි ගෙයක්ද නිමවා රජුද පෙරටු කොට එම මහා පූජාව දළදා වහන්සේ වෙත කරුනු ලැබූ අතර එමගින් භික්ෂූන්ගේ මෙන්ම ජනතවාගේ ද මහත් ප්‍රසාදයක් රජු වෙත ලැබිණි.[27]

උඩරට අල්වාගත් ඉංග්‍රීසින් ද දළදා වහන්සේගේ භාරකාරත්වය ලබාගැනීම තමාට ශ්‍රී ලංකාවේ බලය නිත්‍යානුකූලව ලබා ගැනීමක් ලෙසින් කල්පනා කළ බව ඔවුන්ගේ ලිපි ලේඛණ විමසන විට පෙනී යන කරුණකි.[28] 1818 කැරලි සමයේදී දොරේසාමි තමාගේ කන්ද උඩරට නායකත්වය තහවුරු කර ගැනීමට හඟුරන්කෙත දී ජනතාවට ඉදිරියේ දළදා වහන්සේ ප්‍රදර්ශනය කළ බව බ්‍රවුන්රි ආණ්ඩුකරුගේ ලිපි තුළින් සනාථ වේ. [29] දළදා වහන්සේ ඉංග්‍රීසින් අතට පත් වූ පසු ඔවුන් දුරු ආකල්ප කුමක්ද යන්නත් එහි ඇති නෛතික බලය කුමක්ද යන්නත් ජෝන් ඩේවි සඳහන් කරන්නේ මෙසේය.

"දැන් ඉංග්‍රීසි හු ඇත්ත වශයෙන්ම රටේ ප්‍රධානීහුය. "මක් නිසාද යත් ධාතුව හිමි තැතැන්තාට රාජ්‍ය සතර පාලනය කිරීමේ අයිතිවාසිකම් සතු වන බැවිනි.[30] මෙමඟින් ද පැහැදිලි වනුයේ ද රටේ අයිතිය යුද බලයෙන් හෝ ගිවිසුම් මගින් ලබාගත්ත ද නිත්‍යානුකුල බවක් හෝ නෛතික බලයක් ලබා ගැනීමට දළදා වහන්සේ ලබා ගැනීම හෝ දළදා වහන්සේගේ නිත්‍යානුකුල අයිතිය තමන් සතු කර ගැනීම වැදගත් වූ බවයි.

එමෙන්ම දළදා වහන්සේ අති පූජනීය වස්තුවක් ලෙසින් උපහාර ලද අතර නීතිමය තත්ත්වය තහවුරු කරමින් ඒ තුළින් සදාචාරාත්මක බව වර්ධනයට අදාල කරගත් බවට සක්ෂි තිබේ. "නිරිඳුන් බිහි වූ මඟුල්හි ද වනුවක් මඟුලෙහිද දළදා පමුණුවක් දෙනු ඉසා.[31] යනුවෙන් දළදා සිරිතෙන් දක්වනුයේ රජෙකු සිය උපන් දවසද අභිෂේක ලද දිනයද සමරමින් වාර්ෂිකව පමුණු ඉඩම් දෙකක් දළදා මාලිගයට පිදිය යුතු බව මෙමඟින් නියම කර තිබේ. ඒ ඔස්සේ රජෙකුගේ දැහැමි බව නිති ගරුක බව මෙන්ම ඔහු කොතෙක් දුරට සදාචාරාත්මක ආචාර ධර්මවලට ගරු කරනු ලබන පුද්ගලයෙකු ද යන්න ආදර්ශමත්ව ප්‍රදර්ශනය කිරීමක් බව පැහැදිලිය. බෞද්ධාගමට අනුව තම පාලන තන්ත්‍රනය මෙහෙය වන්නේය යන අදහසක් ද ව්‍යංගාර්ථවත්ව මෙන්ම දළදා වහන්සේගේ අණසක ක්‍රියාකාරන්නෙකු වේ යන පණිවිඩය ද මෙම ප්‍රදානයන් ඔස්සේ ජනතාව වෙත ලබාදීමක් මෙමඟින් අදහස් කෙරේ.

එමෙන්ම දළදා වහන්සේ සාක්ෂියට තබා යම් නිත්‍යානුකුල පැවරීම් කළ බවට ඓතිහාසික සාක්ෂි තිබේ. තෙවැනි විජයබාහු රජු තමා ජීවමාන අවධියේදී ම රාජ්‍යත්වය සිය පුත් පරාක්‍රමබාහු කුමරුට පැවරීමේදී දළදා වහන්සේ හා පාත්‍රා ධාතුවද ඉදිරියෙන් තබා එම කාර්යය ඉටු කොට ඇත.[32] දෙවැනි පරාක්‍රමබාහු රජු තමගේ අවසාන භාගයේදී භික්ෂූන් සහ සිය පුත් කුමරුන් සැම කැඳවා භික්ෂූන්ගේ අවවාද අනුශාසනය පරිදි සිය පියා මෙන්ම විජයබාහු කුමරුට රාජ්‍යය මෙන්ම දළදා පාදා ධාතු යුග්මයේ භාරකාරිත්වයද පැවරීය.[33] පළමුවැනි විමලධර්මසූරිය රජු ද සිය පුත් කුමරු තිදෙනාට

පාලනය භාර කරන අවස්ථාවේ තමන්ට අයත් රට බෙදා පත්‍ර තුනක ලියා දළදා වහන්සේ ඉදිරිපිට දී ගන්නට සලස්වා ඇත.[34] භික්ෂූන් ඉදිරියේ දළදාව හා පාත්‍ර ධාතුවේ භාරකාරීත්වය පැවරීම තුළින් රාජත්වයේ නියම හිමිකාරිත්වයට සාක්ෂියක් ලෙසින් මෙම පූජා වස්තූන් දෙක මුල්තැන්හිලා සැලකූ බව එම කාර්යය දළදා වහන්සේගේ ආශිර්වාදය මැද මෙන්ම දළදා වහන්සේ සාක්ෂියට තබා එම තීරණය කිසිවකුටත් වෙනස් කළ නොහැකි මට්ටමින් කළ බවත් මෙම සිද්ධීන් එකිනෙක විමසා බලන විට පෙනීයන කරුණකි.

එමෙන්ම පාලකයන් යම් ප්‍රදානයන් කිරීමේදී දළදා වහන්සේ සාක්ෂියට තබා එම කාර්යයේ නිරත වූ බව ගඩලාදෙණිය සෙල් ලිපියෙන් සනාථ වේ. එහි එක් සෙල්ලිපියක සේනාසම්මත වික්‍රමබාහු රජු විසින් කළ ප්‍රදානයන්හි " දළදා වහන්සේගේ ආඥාය " යනුවෙන් දක්වමින් දළදා වහන්සේ අණසක නැතහොත් දළදා වහන්සේ සාක්ෂි වශයෙන් තබා ගනිමින් එම ප්‍රදානය කර ඇති බවක් පෙනේ.[35] දළදා වහන්සේ සාක්ෂි වශයෙන් තබාගත් කළ එම නියමයනට යමෙකුට උද්ධරණයක් කිරීමට හෝ පැහැර හැරීමට හා නැති කරලීමට නොහැකි බවක් එමගින් හැඟ වේ.

සදාචාරාත්මක බවේ සංකේතය බවට ද දළදා වහන්සේ අතීතයේ සිටම පත්වූ බවට සක්ෂි තිබේ. පළමුවෙන් කළිඟුරට බ්‍රහ්මදත්ත රජුට දළදා වහන්සේ හිමිවන විට ඔහු සම්‍යදෘෂ්ටිකයෙකු නොවීය. ඛේම රහතන් වහන්සේ දළදා වහන්සේ රජුට ලබාදීමෙන් අනතුරුව මිසදුටු අදහස් බිඳ එම රජ තෙමේ රත්නත්‍රය කෙරෙහි පැහැදිනි.[36] කලිඟු පරපුරට අයත් ගුහසීව රජු මිථ්‍යාදෘෂ්ටික මතධාරියෙකු වූ අතර රටවැසි ජනයා විසින් දළදා වහන්සේ විෂයෙහි මහත් පූජා පැවැත්වීම අරබයා තොරණ බැඳ ධජ පතාකාදිය එල්වා රන්රිදී මලින් ද නානාවිධ සුගන්ධයන් ගෙන්ද ස්තුති පූර්වකව ගී ගයමින්ද නෘත්‍ය ගීතාදිය තුළින් ද පූජාවන් පවත්වනු ලැබූ අයුරු දැක ඒ ගැන අමැතියන් අතින් විචාර දළදා වහන්සේගේ ඇති තෙදවත් බව දැන ඔහු ද තුනුරුවන් විෂයෙහි භක්තියක් ඇති පුද්ගලයෙකු වූ අතර දැහැමි පාලකයෙකු බවටද පත්

වූ ආකාරය දාඨාවංශය පෙන්වා දෙයි.[37] දැහැමි පාලකයන් පිළිබඳව කරන ලද කථාවෙන් සිත් පහදවා ගනු ලබන මිසදුටු පණ්ඩු රජු ද තිර්ථක සමාගමෙන් මිදී රතනත්‍රය සරණ ගිය පුද්ගලයෙකු මෙන්ම සුචරිතවත් පුද්ගලයෙකු බවට පත්විය.[38]

ලක් පාලකයන් බොහෝ දෙනෙකු බෞද්ධාගම තුළින් දැහැමි පාලකයන් බවට පත්ව සිටි බැවින් ඔවුන් සැම දෙන තමා දැහැමි බව වඩාත් අර්ථවත් කර ගැනීමට මෙන්ම තම සුචරිතවත් බව මතු කරලීම පිණිස දළදා වහන්සේ වෙත පූජෝපහාරයන් දැක්වීමට නිරතුරුව ඉතිරිපත් වූහ. මෙහි එක් අංගයක් වූයේ රට ව්‍යසන අවස්ථාවලදී තමාගේ දැහැමි බව වඩාත් අර්ථවත් කරලීම පිණිස දළදා ප්‍රදර්ශනයක් පවත්වමින් සත්‍ය ක්‍රියා කරමින් නියං සාය වැනි උවදුරුවලින් රට මුදවා ගැනීමට ක්‍රියා කිරීමයි.

පොළොන්නරු හා දඹදෙණි යුගවල දී දළදා ප්‍රදර්ශනවලින් අනතුරුව වර්ෂාව ලැබුණු අවස්ථා කීපයක් ම සාහිත්‍ය මූලාශ්‍ර වාර්තා කර ඇත.[39] දළදා ප්‍රදර්ශනය යනු හුදෙක් දළදා වහන්සේ නැරඹීමට පමණක් ජනතාවට අවස්ථාව සලසාදීමකට පමණක් සීමා වූවක් නොවීය. රජුගේ පටන් සාමාන්‍ය වැසියා දක්වා සියළු දෙනාම සීලවන්තව සදාචාරාත්මක ගුණාංගවල නියැලෙමින් ඇති වූ ව්‍යසනයෙන් රටත් ජනතාවත් මුදවා ගන්නා ලෙස දළදා වහන්සේ ගෙන් සැම දෙනා එක්ව අයැද සිටීමක් වේ. ඒ තුළ පාලකයාගේ සිට ජනතාව දක්වා තමාගේ සදාචාරවත් බව ඇගයීමට ලක් කරමින් සහ දළදා වහන්සේ ඉදිරි පිට වන්දනය කරමින් තමා දැහැමි පුද්ගලයෙකු බව ඔප්පු කරමින් වර්ෂාව ලබාදෙන ලෙස ඉල්ලීමක් කිරීමක්ද වේ. දළදා වහන්සේගේ පිහිටාධාරය ලබා ගැනීමට තමා දැහැමි සුචරිතවත් පුද්ගලයෙකු විය යුතුය යන ආකල්පයක් මෙමඟින් ජන සමාජය වෙත ඒත්තු ගැන්වීමක් ද සිදුවූ බව කරුණු විමසන විට අනාවරණය වේ. 1829 වර්ෂයේ එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරයා හට දළදා ප්‍රදර්ශනයක් පැවැත්වීමට සිදුවූයේ එය වැසි ලබා ගැනීමේ මගක් බවට ජනතාව තුළ වූ දැඩි විශ්වාසය මත කෙරුණු ඉල්ලීම හේතුවෙනි.[40]

දළදා මැඳුර ආශ්‍රිතව පවත්වනු ලබන වාර්ෂික උත්සව හතරකි. එනම් අලුත් සහල් මංගල්‍යය, අවුරුදු මංගල්‍යය, ඇසළ මංගල්‍යය හා කාර්තික සංගල්‍යයකි. මෙහි "අවුරුද්දේ" යන්නෙන් අලුත් අවුරුදු උත්සවය ද "කාත්තියේ" යන්නෙන් කාර්තික උත්සවය ද (ප්‍රදීපෝත්සවය) හැඟවේ. මෙකී අවස්ථා දෙකෙහි දී ම ඒ ඒ නිලධාරීන් දළදාවට හා රජුට පඬුරු පිරිනැමිය යුතු බවටත් පළමුව පිරිනැමිය යුත්තේ දළදා වහන්සේට බවත් ඉන් නියම කර තිබේ.[41] මෙම මංගල්‍ය අවස්ථාවන්හි කරනු ලබන ක්‍රියාදාමයන් සමස්තයක් ලෙසින් ගෙන සලකා බලන විට එම උත්සව තුළින් දළලා වහන්සේට මූලිකත්වය තබා ගනිමින් රටේ සශ්‍රීකත්වය හා ජන සාමූහිකත්වය මෙන් ම නීති ගරුක බව සාම්ප්‍රදායිකත්වයට නිසි තැන ලබාදීම යන ගුණාංග එමඟින් මතු කරලීමට උත්සහ ගෙන තිබේ.

මුල් කාලයට වඩා පසුකාලය වන විට දළදා වහන්සේට කිරි දරුවන් භාර කිරීමේ සම්ප්‍රදායක් ද දළදා වහන්සේ මුල් කොට ගෙන ඇති වේ. කිරි දරුවන් දළදා වහන්සේට බාර කිරීමේ චාරිත්‍රයක් වර්තමානයේ දී ද ජනතාව අතර පවතී. දරුවා දළදා කරඬුව අසල තේවාවේ යෙදී සිටින වට්ටෝරුරාල අතට දුන් විට ඔහු බිළිඳා කරඬුව ඉදිරිපිට තබා දළදා හිමියන්ගේ රැකවරණයත් ආශිර්වාදයත් පතයි. මෙහිදී මව්වරුන් පෙරළා බිළින්ඳන්ව ලබාගන්නේ කිසියම් පඬුරක් පූජා කිරීමෙන් පසුව බව හෝර්කාර්ට් ද සඳහන් කර තිබේ.[42] පූජා කරන්නාගේත් පූජාවට බඳුන්වන්නාගෙත් අපරිමිත භක්තිය මෙහි දී ප්‍රකාශ වන අතරම, පෙරළා ආරක්ෂාව හා ආශිර්වාදය ලබාගැනීම ද ඉන් සිදුවෙයි. එසේම ආගමික ආයතනයකට ඍජුව වස්තු සම්පත් ප්‍රදානය නොකොට වක්‍රව පිදීම, ඇපයක් ලෙස ධන සම්පත් පවරා පූජාවට ලක්වූ තැනැත්තා ගලවා ගැනීමේ දී සිදුවන බව හැකිය. එමෙන්ම සිය දරුවා දළදා සමිඳුන්ට බාරදීමක් ද මෙම අවස්ථාවේ සිදුවන අතර එමඟින් දරුවාට උපද්‍රවයක් ඇතිවීම ද වළකාලයි. තව ද සදාචාරවත් දරුවකු බවට සිය දරුවා පත් කිරීමේ අරමුණක් ද දෙමාපියන්ට මෙම අවස්ථාවේ ඇති වීම නොවැළැක්විය හැකි කරුණකි. සිය දරුවා දළදා සමිඳුගේ පිහිට ලබන බැවින් ඔහු හෝ ඇය සුචරිතවත්ව හැදිය යුතුය යන ආකල්පයක් ද

නිතැතින්ම දෙමාපියන්ට ඇතිවීම හා ඒ ඔස්සේ දරුවා හදාවඩා ගැනීම තුළින් සමාජයට යහපත් දරුවකු ලබාදීමට හැකිවේ.

තවද දළදා සමිඳුන් කේන්ද්‍ර කොට දිවිරිල්ලක් ද සමාජය තුළ ඇතිවීම ඔස්සේ සත්‍ය අසත්‍ය විනිශ්චයේ දී එහි නිරවද්‍යතාවය පසක් කරලීමට දී ද වැදගත් වේ. ගැමි සමාජය තුළ "දළදා හාමුදුරුවන් පල්ල" යන්න හා "දළදාව පල්ල" යන්නෙන් ඔවුන් දිවුරුම් ක්‍රම වේදය සකස් කොට ඇති අතර තමා කළ හෝ කී දෙය සත්‍ය බව පසක් කරලීමට මෙම වදන් භාවිත කිරීම වත්මන දක්වා ම සමාජගතව පවතියි. සමාජයේ සත්‍ය අසත්‍ය බව මෙන්ම පුද්ලයින් නීති ගරුක බව මෙන්ම සදාචාරත්වය යන්න පසක් කරලීමට ද මෙලෙසින් සමාජය තුළ ගොඩනැගි ඇති ආකල්ප වැදගත් වන බව පැහැදිලි කරුණකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. B.G. Cokhale, "Early Buddhist Kinship", **Journal of Asian Studies**, Vol. XXVI, No.1, .1966, pp.15-33. B.G. Gokhale, "Dhamma as a Political Concept in Early Buddhism", The **Journal of the Indian History (Trivendrum),** Vol. XLVI, part.1, 1968 pp.249-261; B.G. Gokhale, "The Buddhist View of the State," **The Journal of the American Oriental Society,** Vol. VIII (4), 1969, pp. 731-738; M.B. Ariyapala, **Society in Medieval Ceylon, Colombo,** 1968, pp. 48-49.
2. S.J. Tambiah, **World Conqueror and World Renounces,** Cambridge University Press, 1976, p.40.
3. **EZ**, Vol. I, p.237.
4. **EZ**, Vol. II, p. 216, **EZ**, Vol. III, p. 71.
5. **EZ**, Vol. IV, p. 71.
6. උභය පූර්ණ සහිතො මහාවංසො, (උපූම), සංස්. පී බුද්ධ දත්ත හිමි කොළඹ: ඇම්.ජී. ගුණසේන සහ සමාගම, 1959 පරි.80, ගා. 13-14.
7. **EZ**, Vol. I, p. 180-181; **EZ**, Vol. II, p. 118,163,193, **EZ**, Vol. III, p. 71.
8. B.G. Gokhale, "Dhammiko Dhammaraja, **Indika: The Indian Historical Research Institute Silver Jubilee Commemoration Volume,** Bombay: B.G. Gokhale, "Early Buddhist Kingship, **The Journal of Asian Studies,** Vol. XXVI, No.1, 1966, pp. 15-33. B.G. Gokhale, "Dhamma as a Political Concept in Early Buddhism," **The Journal oof the Indian History,** (Trivendrum), Vol. XLVI, part. 1, 1968 pp.249-251, **EZ**, Vol. II, p. 106, 154,171 උපූම, ගා. 187, 199
9. උපූම පරි. 37, ගා.92-97, දාඨාවංස, ගා. 379-409, පිටු.99-107.

10. බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ ෆාහියන්ගේ දේශාටන වාර්තාව, පරි. බලගල්ලේ විමල්, ජී. බොරලැස්ගසමුව: විසිදුනු ප්‍රකාශකයෝ, 1999, පි.33 -34; James, Leggs, **A Record of the Buddhist Kingdoms: Being an Account by the Chinese Monk Fa- Hien and his Travels, in Indian and Ceylon,** Delhi: Orient Publishers, 1983, (re print). pp.105-107.
11. උෟපූම, පරි. 58, ගා. 15-17.
12. එම, පරි. 68, ගා. 300-315.
13. උෟපූම, පරි. 72, ගා. 103-113.
14. එම, පරි. 72, ගා. 227-250.
15. EZ, Vol. II, p. 93. රාජාව, sh" පs' 68.
16. උෟපූම, පරි 79, ගාථා. 10-16, 31-40; පූජාවලිය, පි. 734.
17. එම, පරි.80, ගා. 11-14, එම, ගා. 36-43, දළදා සිරිත, පි.44.
18. එම, පරි 87, ගා. 17-38.
19. උෟපූම, පරි. 88, ගා. 42. දළදා සිරිත, පි.70, දළදා පූජාවලිය, පි.61.
20. දළදා සිරිත, පි.74.
21. එම
22. **JRAS (CB),** Vol. XXII, 1912. pp. 362-363, **ASCAR,** Vol. XIX, 1892, p.97, සිංහල දළදා වංශය, සංස්. එච්. සාරානන්ද හිමි, අළුත්ගම, 1911, පි.43.
23. අස්ගිරි තල්පත, පි.21.
24. එම, පරි. 87, ගා. 17-20.
25. එච්.එම්.එස්. තුන්දෙණිය, එච්. ගුණවංශ හිමි, මැදරට ජනකතා 1, නුගේගොඩ: තරංජි ප්‍රින්ටර්ස්, 1998, පි. 119-120.
26. උෟපූම, පරි 82, ගා. 11-14.
27. එම, පරි. 97, ගා. 57-62, පරි. 98, ගා. 1-56.
28. Jhon Doily, **An Account of the Illustrated Survey of Ancient Monuments in that Island,** London, 1821, pp. 368-369.

29. විමලානන්ද තෙන්නකෝන්, උඩරට කැරැල්ල II, කොළඹ: 1962, පි.140.

30. ජෝන් ඩේවි, ඩේවි දුටු ලංකාව, පරි ඇල්ලේපොළ එච්.එම්. සෝමරත්න, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සමාගම, 1967, පි. 192-193.

31. දළදා සිරිත, පි. 52.

32. 'තස්ස' පි මුනිනො දාඨාපත්තධාතුද්වයං තථා මහාසඞසඞ්ඝව සබ්බම්පි ලඞ්කාවාසි ජනාම්පිච',
එම, පරි. 79, ගා. 77 - 78.

33. එම, පරි 86, ගා. 8-19.

34. එම, පරි 93, ගා. 20 - 21.

35. ".... තුනුරුවන්ගේ ආඥාය දළදා පාත්‍ර ඡාතුන් වහන්සේගේ ආඥාය තිස්තුන් කෝටියක් දෙවියන්ගේ ආඥාය ..." **EZ,** Vol. IV, p. 14, 23.

36. දාඨාවංස, ගා. 119-125.

37. එම, ගා. 142- 143.

38. එම, ගා. 1-250, පිටු. 44-64.

39. උෟපූම, පරි.72, ගා. 227-250, පරි.85, ගා. 4-12.

40. බලයක මහිම දළදා සමිඳුගේ ඉඳුරා සැලකී සියලු දෙන මේ පෙළහරිනෙවරා ජේ.බී. දිසානායක, සිරි දළදා මාලිගාව, කොළඹ: ඇස්. ගොඩගේ සහෝදරයෝ, 2000, පි.78.

41. H.L. Seneviratne, **Rituals of the Kandyan State,** London: Cambridge University Press, 1978, pp. 61-68.

42. A.M. Hocart, **The Temple of the Tooth in Kandy,** LOndon: 1931, p.24.

# පාරම්පරික ශුද්ධත්වය, පූජනියත්වය සහ දළදා පෙරහැර

**මහාචාර්ය එච්. එම්. ඩී. ආර්. හේරත්**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවගේ මෙන්ම අබෞද්ධ අනිකුත් ශ්‍රී ලාංකිකයන්ගේත් අතිශය වැදගත් සංස්කෘතිය උරුමයේ ප්‍රශස්ථ වාර්ෂික උත්සවයක්, පූජාවක් සහ මංගල්‍යයක් වශයෙන් දළදා පෙරහැර හැඳින්විය හැකිය. එයට හේතුව ශ්‍රී ලාංකිකයන්ගේ අනන්‍යතාවයේ සුවිශේෂ සංස්කෘතික පැතිකඩ වාර්ෂික දළදා පෙරහැර මඟින් නිරූපනය කරන හෙයිනි. මෙම ලිපියේ අරමුණ වන්නේ මෙම සංස්කෘතික මංගල්‍යය කෙතරම් පාරිසරික වශයෙන් වැදගත් වන්නේද, එමෙන්ම එම පාරිසරික ශුද්ධත්වය තුළින් සමාජය ගොනු කිරීමට අවශ්‍ය යාන්ත්‍රණය පෙරහැර නමැති ජාතික මහෝත්සවය මඟින් නිරූපනය වන්නේද යන්න විමසා බැලීමයි.

සෑම ආගමක්ම නිර්මාණය වී පවතින්නේ වස්තුවක්, පුද්ගලයෙක් හෝ අධිභෞතික ශක්තීන් පිළිබඳව පවතින විශ්වාසයන් මතය (Durkhiem 1915) . මේ අනුව ශ්‍රී ලාංකික සංස්කෘතියේ ශුද්ධත්වයෙන් සලකන වස්තූන් අතර, බුදුරජාණන් වහන්සේගේ ශාරිරික ධාතු, පාරිභෝගික ධාතූන් සහ උද්දේශික ධාතූන් උපරිම පවිත්‍රත්වයෙන් යුක්තව වන්දනාමාන කිරීමටත් පරිහරණය කිරීමටත් ජනතාව පුරුදු වී සිටිති. මේ නිසා සෑම වන්දනීය ක්‍රියාවක් පිටුපසම සුවිශේෂ වත් පිළිවෙත් මාලාවක් නිර්මාණය වී ඇති අතර එම වත් පිළිවෙත් සියල්ලම ශුද්ධ වූ වුත් පිළිවෙත් වෙති. එම වත් පිළිවෙත් සිදුකරන්නවත් ශුද්ධ වූ පුද්ගලයන් ලෙස වත් පිළිවෙත් කරන වකවානුවේදී හඳුන්වනු ලැබේ. එම වත් පිළිවෙත් සිදුකිරීමට ස්ථාපිත ආගමික සංස්ථාව සාමාන්‍ය මහජනතාව (Laymen) ගෙන් වෙනස් වු ශුද්ධ හා පවිත්‍ර වු ස්ථාන ලෙස සමාජය විසින් විශ්වාස කරනු ලබයි. මේ අනුව පවිත්‍රත්වය මත දළදා වහන්සේ සහ දළදා

පෙරහැර හා සම්බන්ධ වස්තූන්, පුද්ගලයන් සහ ස්ථාන පහත සඳහන් පරිදි ශුද්ධ වූ ධූරාවලියක් ලෙස සකස් වී ඇත. මෙහි මූලික අරමුණ ශුද්ධ වූ සංස්කෘතික පරිසරයක් නිර්මාණය කිරීමයි.

**ශුද්ධ වූ වස්තූන් සහ පුද්ගලයින්**

1) දන්ත ධාතූන් වහන්සේ

2) දන්ත ධාතූන් වහන්සේට තේවාව කරන ස්වාමීන් වහන්සේ

3) දන්ත ධාතූන් වහන්සේට තේවාව ඉෂ්ට කරන ගිහි භාරකාරයා වූ දියවඩන නිළමේ සහ සෙසු නිලධාරිනීන්

දළදා වහන්සේ ශුද්ධ වූ වස්තුව වශයෙන් සලකනු ලබන අතර උන්වහන්සේ බුදුන් වහන්සේට සමානව සලකනු ලබන හෙයින් **"දළදා වහන්සේ"** යන ගෞරවණීය නාමය භාවිතා කරනු ලබයි. උන්වහන්සේට තේවාවන් ඉටු කිරීම සඳහා වාර්ෂිකව අස්ගිරි සහ මල්වතු පාර්ශ්වයන්ගෙන් මාරුවෙන් මාරුවට පත් කෙරෙන හිමිපාණන් වහන්සේ නායක හිමිපාණන් කෙනෙකු වශයෙන් තේවාව කෙරෙන සමයේදී සලකනු ලබන අතර උන්වහන්සේට කිසිම ආකාරයක අපවිත්‍රතාවයකට පත්වන සිද්ධියකට සම්බන්ධ විය නොහැකිය. මළ ගෙවල් වැනි අශුද්ධ ස්ථානවලට සහභාගි වීම තේවා කාලසීමාවේදී කළ නොහැකිය. මෙම නායක හිමිපාණන් දළදා වහන්සේගේ නිල කටයුතු සහ රැකවරණය සඳහා සම්පූර්ණ කාලය වෙන් කොට ඇති අතර උන්වහන්සේගේ ගමන, සිවුරු පෙරවීම මෙන්ම සියලුම චර්යා රටාවන් දළදා වහන්සේට පූජා සත්කාර කිරිමට යෝග්‍ය පරිදි සකස් වී තිබේ.

මහාචාර්ය වරකාවේ ධම්මාලෝක හිමියන් ඒ බව මෙසේ සඳහන් කරති. තුරිත හෙවත් ඉක්මන් රිද්මයකට අනුව වාදනය කෙරෙන අලුයම් ධූරයේ හේවිසි වාදනය ඇරඹෙත්ම තේවාකාරක භික්ෂූන් වහන්සේ දෙපට සිවුර මැනවින් පොරවා වම් උරය මතින් සඟල සිවුරක් දමා පළල සිවුරු පටියකින් බැඳ ගනිති. එසේ සූදානම් වීම දළදා තේවා කාරක භික්ෂූන්

වහන්සේලා අනිවාර්යෙන්ම කළයුතු වේ (ධම්මාලෝක හිමි 2006:61)

බුදුන් වහන්සේ වෙනුවෙන් කරනු ලබන රාජකාරියේ ශුද්ධත්වය වඩාත් වැදගත් වන්නේ වඩා සුවිශේෂ වූ රාජකාරි ඒ ඒ ගිහි භවතුන් සඳහා පවරා ඇති හෙයිනි. උදේ තේවාව සඳහා නායක හිමිපාණන් වෙත ඇතුල් කට්ටලයේ ගිහි පිරිස පැමිණෙති. මෙහිදී ඇතුල් කට්ටලයේ ගිහි පිරිසේ සුදු තුප්පොට්ටියකින් , සුදු රවුම් තොප්පියකින් , සුදු කංචුකයකින් සැරසී වට්ටෝරු රාළ දකුණු උරහිසින් මාළිගාවේ යතුරු මිටිය රැගෙන ගමන් කරයි. මෙහිදී සුදු පැහැති වස්ත්‍ර ඇඳීම ශුද්ධත්වයේ සංකේතය වන අතර දකුණු උරහිසින් යතුරු කැරැල්ල රැගෙන යාමද ශුද්ධත්වය විදහා දැක්වීමේ සංකේතයකි. ශ්‍රී ලංකාවේ කේන්ද්‍රීය සාරධර්ම පද්ධතියට අනුව කිසිම සුභ කටයුත්තක් සඳහා වම් අත පාවිච්චි කරනු නොලැබේ. (හේරත් 1989:163-174) දළදා මාළිගාවේ තේවාව කෙරෙන මේ පිරිස ශුද්ධ වු පුද්ගලයින් වන අතර තේවාව ඉටුකරන තුරු වඩා පැහැදිලි ධූරාවලියක් දක්නට ලැබේ.

වට්ටෝරුරාළ යතුරු රැගෙන ඉදිරියෙන් යාම
නායක හිමිපාණන් වහන්සේ (තේවාව භාර)
සහයක හිමිවරුන් දෙපල
ගෙපරාළ
කත්තියන රාළල තිදෙනා
හක්ගෙඩි අප්පුගෙන් සමන්විතව

සාමාන්‍ය තේවාවත්, බුද්ධ තේවාවට අවතීර්ණ වන්නේ හේවිසි මණ්ඩපයට අවතීර්ණ වීමත් සමඟය. හේවිසි මණ්ඩපයට පැමිණෙන සියලු දෙනා දෙපා සෝදා ඇත්දත් වාහල්කඩට පැමිණි පසු , වට්ටෝරුරාළ පල්ලේ මාලේ තේවා කාරක ස්ථවිරයන් සමඟ ගොස් වැඩ සිටින මාළිගාවේ දොරවල් විවෘත කොට තේවාව ආරම්භ කිරීමට සැරසේ. දොරවල් විවෘත කිරිමේ සැකැස්ම ශුද්ධ වු ධූරාවලියක් නිර්මාණය කරනු ලැබේ. එනම්,

1. ඇත්දත් වාහල්කඩ
2. අරමුදලේ දොරටුව
3. ඉහළ මාලයේ රිදී දොර
4. වැඩ සිටින මාලයේ රත්රන් දොරටුව

ශ්‍රී ලාංකික සමාජයේ අතිශය, සම්භාවනීය වස්තුව සම කෙරෙනුයේ රන්වලිනි. මළ නොබැඳෙන, දිගුකල් පවතින ,අපවිත්‍ර නොවන ආරක්ෂා වීමේ ගුණය රත්රන්වල තිබේ. මේ නිසා ශුද්ධත්වය සහ සුරක්ෂිත භාවය උපරිම වශයෙන් දළදා වහන්සේට හිමිකර දී තිබේ. මෙහි තේවාව සිදුකරන වට්ටෝරුරාළ, ගෙපරාල, කත්තියන රාළලා සහ හක්ගෙඩි අප්පු යන සෑම කෙනෙක්ම තමන් තේවාවේ යෙදන සෑම මොහොතකම පරමාදර්ශී වශයෙන් ඔවුන්ට නියමිත ඇඳුම් ආයිත්තම්වලින් සැරසීමත්, අවශ්‍ය අවස්ථාවලදී මුකවාඩම්වලින් මුව වසා ගැනීමත්, කිසිම ආකාරයකින් දළදා වහන්සේට පුද සත්කාර කරන අවස්ථා සහ දේවල් සඳහා කිලුටු නොවීමටත් වගබලා ගනිති. තවද ඔවුන් තේවාව කරන සමයේ කුමන ආකාරයක හෝ උපත්, වැඩිවියට පත්වීම් හෝ මරණ කිල්ලට හසු නොවීමට වග බලා ගනිති.

රන් දොරටුව විවෘත වූ විට තේවාව භාර නාහිමියන් සහ අවශේෂ භික්ෂූන් දෙනම ස්වකීය පත්කඩය එළා දළදා වහන්සේට නමස්කාර කරනු ලැබේ. පත්කඩය ඇල්ලූ නිසාම නැවත අත් සෝදා ගන්නා උන්වහන්සේලා උදේ තේවාව සඳහා ආසනයේ පරමල් ඉවත් කොට පිරිසිදු වතුරින් මල් ආසනය සෝදා තේවාව ඉටු කරයි. මෙහිදී බුදුන් වහන්සේට කෙරෙන සියලු සත්කාරයන් වූ සිවුරු කට්ටලය, රන් අවාන, රන් මිට සහිත චාමරය, කපුරු මල් අත්ත, දෑහැටි කූර, මිණිගෙඩිය, තෙතමාත්තුව යන දේවල් මෙම ශුද්ධ වූ පූජාවට අයත් වේ. මෙහිදී බුදුන් වහන්සේට ඉටු කරනු ලබන උපස්ථාන සොළසක් දක්නට ලැබෙන අතර මෙම සොළස ම ශුද්ධ වූ උපස්ථාන නමින් හඳුන්වනු ලැබේ. (ධම්මාලෝක හිමි 2006:62)

මෙම වතාවත් සියල්ල නොකඩවා පවත්වනු ලබන අතර ඒවා තුළ

අලුයම මුළුතැන් පූජාව, දවල් ආහාර පූජාව, සවස ගිලන්පස පූජාව, බදාදාට කෙරෙන නානුමුර පූජාව යන සියල්ලම ඉතා පිරිසිදු සහ ශුද්ධ චාරිත්‍ර වශයෙන් කෙරෙන අතර ගිහි පිරිස් නිරන්තරයෙන්ම යෝග්‍ය පිරුවටවලින් සහ පාරිශුද්ධ ඇඳුමින් සැරසී ඉටු කරනු ලබයි. එමෙන්ම සතියකට වතාවක් බුද දිනයෙහි සිදුකෙරන නානුමුර මංගල්‍යයද අති සුවිශේෂ වූවක් වන අතර බුදුන් වහන්සේ ස්නානය කරවීම වෙනුවෙන් සංකේතාත්මකව සුවඳ පැනින් නැහැවීම සිදුකරනු ලබයි. (සෙනෙවිරත්න 2006:21) මේ සියලුම වත් පිළිවෙත් ශුද්ධත්වය පදනම් කොටගෙන සිදුකරනු ලබයි. දළදා වහන්සේට මල් පූජා කරන සෑම භක්තිවන්තයෙක්ම මල් දෝවනය කොට, එමෙන්ම දෑත් දෝවනය කොට ශුද්ධත්වයෙන් පිරිසිදු වූ අත්වලින් වන්දනාමාන කරනු ලැබේ. එමෙන්ම නිතිපතා තේවා මුරයන්වලදී පවා සම්ප්‍රදායික සමාජයේ පැවති කුල ධූරාවලියේ ක්‍රියාත්මක වීමට අනුව උඩමාලයේ බෙර වාදනය උසස් කුලයේ අය විසිනුත් පහත මාලයේ බෙර වාදනය බෙරිවාදක කුලයේ අය විසිනුත් ඉටු කරනු ලබන අතර මෙය ශුද්ධත්වය මත යන අදහස උඩ වැඩවසම් සමාජයේ නිර්මාණය කරන ලද්දකි. බුදුන් වහන්සේ වෙනුවෙන් කෙරෙන මෙම ශුද්ධත්ව ක්‍රියාවලිය ආරක්ෂා කරනු පිණිස නිතිපතා කෙරෙන චාරිත්‍ර සහ වත් පිළිවෙත් බොහෝමයක් ගොඩනගා තිබේ. මෙහිදී සිදුවන ශුද්ධ වූ කාර්යභාරයන් ඇතුල් කට්ටලයේ සහ පිට කට්ටලයේ වශයෙන් නම් කොට තිබෙන අතර ඇතුලු කට්ටලයේ නිලධාරීන් අස්ගිරි මල්වතු උභය විහාරයේ මහානායක ස්වාමීන් වහන්සේලාගේ මඟපෙන්වීම යටතේ කටයුතු කරන අතර පිට කට්ටලය දියවඩන නිළමේ යටතේ පාලනය වේ. (සෙනෙවිරත්න 2006)

දළදා මාළිගාවේ පිටත ඇති පරිශ්‍රයේ ශුද්ධ පවිත්‍ර කිරීම සහ නඩත්තු කිරීම අතිශය වැදගත් වන අතර ඒවාට නියමිත නිල පංගුවට රාජකාරිය වන අතර එය සාම්ප්‍රදායිකව පැවත එන්නකි. උදාහරණ වශයෙන් ගතහොත් වළාකුළු බැම්මේ තිබෙන පහන් කවුලුවලට තෙල් සැපයීම තෙල් පංගුව විසින් ඉටු කරනු ලබති. මේ අනුව ශුද්ධත්වය සහ සුරක්ෂිතභාවය පවත්වා ගැනීමට අවශ්‍ය තේවාවන් පාරිසරික ශුද්ධත්වය පවත්වාගෙන යාම මඟින් සිදුවේ.

## සිව්මහා දේවාල සහ පාරිශුද්ධත්වය

දළදා වහන්සේ වැඩ සිටින මාළිගාවත්, පල්ලේ මාළිගාවත් ඒ අවටත් ශුද්ධත්වය වෙනුවෙන් කැපවුනු ස්ථානයන් වූ අතර ඒ අවට ප්‍රදේශය මහා අලංකරණයෙන් යුක්තව පවත්වාගෙන යාම දියවඩන නිළමේගේ රාජකාරියේ කොටසක් විය. එමෙන්ම සිව් මහා දේවාලයේද ශුද්ධත්වයෙන් යුක්ත විය. ශුද්ධ වු පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සිව්මහා දේවාල විධිමත් ලෙස පවත්වාගෙන යාමත්, ඊට අදාළ චාරිත්‍ර ඉටු කිරීමත් බස්නායක නිළමේවරු, කපුවන් සහ සෙසු පංගුකාරයින් යොදවා තිබේ. මුල් යුගයේදී දේවාල පෙරහැරක් පමණක් වූ මහනුවර ඇසළ පෙරහැර කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසු උපාලි මාහිමිපාණන් වහන්සේගේ මඟපෙන්වීම යටතේ දළදා මාළිගාවේ පෙරහැර පෙරටු කොටගත් පෙරහැරක් බවට පත්විය. (Aluwihare 1952) මේ නිසා වර්තමානයේදී පවා දළදා වහන්සේගේ මහනුවර පෙරහැරට පෙර විෂ්ණු දෙවියන්ගේ දේවස්ථානයක් වූ අලුත් නුවර පෙරහැර අවසන් වූ වහාම මහනුවර සිව්මහා දේවාලවල කප් සිටුවීම ආරම්භ වේ. මෙයට හේතුව බුදු සසුනත්, ශ්‍රී ලංකාවත් ආරක්ෂා කිරීමේ වගකීම විෂ්ණු දෙවියන්ට පැවරී ඇති හෙයිනි.

මේ නිසා පාරිසරික ශුද්ධත්වයෙන්, පඬුරු - පාක්කුඩම් ඔප්පු දීමත්, අලුත් නුවර පෙරහැරින් ඇරඹී සතර මහා දේවාල කරා ගමන් කරයි. මේ කාලසීමාවේදී නාථ, විෂ්ණු, කතරගම සහ පත්තිනි දේවාලවල ශුද්ධ වූ කප් සිටුවීමේ කාර්ය භාරයෙන් පසු වඩාත් ශුද්ධත්වයෙන් සහ මනා පිළියෙල වීමකින් යුක්තව දෛනිකව සතර මහා දේවාලවල පවත්වන අභ්‍යන්තර දේවාල පෙරහැර ආරම්භ වී පසුව කුඹල් පෙරහැර දක්වා ක්‍රියාත්මක වේ. මේ කාල සීමාවන් තුළ සහ සියලුම රන්දෝලි පෙරහැරවල් අවසන් වනතුරු, සියලුම දේවාලවල පාරිශුද්ධතාවයෙන් යුක්ත පරිසරයක් නිර්මාණය වන අතර නිරන්තර දේව මෙහෙයෙන් හා බදාදා සහ සෙනසුරාදා සුවිශේෂ පූජා චාරිත්‍ර ක්‍රියාත්මක වේ. මේ සඳහා ඒ ඒ දේවාලවල හිමි නිළ පංගු වෙන්වී තිබුණ අතර මෙහි ප්‍රධාන පරමාර්ථය වූයේ ශුද්ධත්වයට පත්වූ දේවාල

වශයෙන් ඒවා සුරක්ෂිත කරමින් පාරිසරික ශුද්ධත්වය ආරක්ෂා කිරීමයි.

## පිටිසර බඳ දේවාලවල පෙරහැරවල් ක්‍රියාත්මක වීම

දළදා මාළිගාවේ වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යය හා සතර මහා දේවාලයන්ගේ පෙරහැරවල් රන්දෝලි පෙරහැරින් අවසන් වනවාත් සමඟම පිටිසරබඳ දේවාල පෙරහැර කිරීම සඳහා කප් සිටුවනු ලැබේ. විශේෂයෙන්

ඇම්බැක්කේ
වල්ලහගොඩ
ගනේගොඩ
පස්ගම
ලංකාතිලක
මොරපේ
දොඩන්වල

මේ ආදි සියල්ලම සතර මහා දේවාලවල ග්‍රාමීය - පිටිසර නියෝජිත දේවාලයන් වන අතර මේවායේ කප් සිටුවීමෙන් පසු පෙරහැරවල් ආරම්භ කරනු ලැබේ. මෙම පෙරහැරවල් පැවැත්වීමට අදාළ කටයුතු ඒ ඒ බස්නායක නිළමේවරුන් විසින් සම්පාදනය කරනු ලබන අතර මේ වකවානුව වන විට සෑම දේවාලයකම අවට පරිසරය ශුද්ධ - පවිත්‍ර කළයුතු වන අතර පෙරහැරට අදාළ සියලු භෞතික අංගෝපාංගයන් අලුත් කොට දේවාභරණ වැඩම වීමටත් අභ්‍යන්තර පෙරහැරේ සිට රන්දෝලි පෙරහැර දක්වා පෙරහැරවල් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලැබේ.

පරිසරය පිරිසිදු කිරීම, ඇතුල්ගේ, දිග්ගේ පිරිසිදු කිරීම, පහන් ආලෝකය දැල්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරිම, කුනම් සහ දෝලි පිරිසිදු කිරීම, සේසත්, අවිඅතු, මුරායුධ ආදී සෑම භාණ්ඩයක්ම පිරිසිදු කළයුතු අතර පෙරහැරවල් ගමන් ගන්නා ඒ ඒ වීදීන් පිළිසකර කිරීමටත් අලංකාර

කිරීමටත් නිලපංගු හිමියන්ට අනිවාර්යෙන්ම පැවරේ. මේ නිසා පිටිසර බද දේවාලවල අභ්‍යන්තර පවිත්‍රත්වය සහ පාරිශුද්ධත්වයත් අලංකරණය කිරීමත් වාර්ෂිකව සිදුවේ. විශේෂයෙන් මහනුවර ඇසළ පෙරහැර අවසන් වනවාත් සමඟම ආරම්භ වන පිටිසර බඳ දේවාලවල ශුද්ධත්වය හා පාරිසරික කළමනාකරණය පිළිබඳ වැඩසටහන් සෑහෙන කාලයක් තුළ ක්‍රියාත්මක වේ. මීට අමතරව මේ සෑම දේවාලයක්ම ආලෝකමත් කරමින් දෛනිකව පවත්වාගෙන යාම ගම්වැසියන්ගේ මෙන්ම නිලපංගුකාරයිනගේද වගකීමක් විය.

## ප්‍රාදේශීය විහාර – දේවාල 80 සහ එහි ක්‍රියාකාරීත්වය

දළදා පෙරහැරේ සංයුතිය ගතහොත් මහනුවර යුගයේ රජු යටතේ පවතින සෘජු පාලන ප්‍රදේශවල රටේ මහත්වරුන් විසින් ඒ ඒ ප්‍රදේශවලට අයත් කොඩි - කුඩ සමඟ ප්‍රධාන දිසාවනීන් 12 සමඟ ගමන් කරනු ලබයි. මෙම රටේ මහත්වරුන් නව දෙනාගේ කලාප රට වසම ලෙස හඳුන්වනු ලබන අතර මේ තුළ රටේ මහත්වරුන් නව දෙනාගේ කලාප රට වසම ලෙස හඳුන්වනු ලබන අතර මේ තුළ රටේ මහත්වරුන් විසින් පාලනය කරනු ලබන කලාප පහත සඳහන් ඒවා වේ.

උඩුනුවර
යටිනුවර
තුම්පනේ
හාරිස්පත්තුව
දුම්බර
හේවාහැට
කොත්මලේ
උඩ බුලත්ගම
පල්ලේ බුලත්ගම

මෙම රට කලාපයන් හා සම්බන්ධ රජුගේ සෘජු පාලනය යටතේ පවතින ප්‍රදේශ තුළ පිටිසර දේවාල සහ විහාර පවතින අතර සමහර ඒවා

පිළිම ගෙවල් හෝ බෝධීන් වහන්සේලා ඇතුලුව ස්ථාන 80 ක් පවතින අතර ඒ ඒ ස්ථාන සඳහා රජුගේ අලුත් සහල් මංගල්‍යයේදී සහල් බෙදා දෙනු ලැබේ. මේ නිසා මෙම ප්‍රදේශ රජුගේ සෘජු අණසකට මෙන්ම සතර මහා දේවාල වලින් ගලාගෙන යන්නා වූ දේව අණසකටද, දළදා වහන්සේ සහ අස්ගිරි මල්වතු දෙපාර්ශවයෙන් ගලාගෙන යන්නා වූ සංඝ අණසකටද යන ත්‍රිවිධාකාර වූ බල ධූරාවලියකට යටත් වේ.

මෙම ඉහතින් සඳහන් කළ සෑම දේවාලයකම සිව්මහා දේවාලවල දක්නට ලැබෙන අංගයන් අඩංගු වේ. උදාහරණ වශයෙන් ගතහොත් දිග්ගේ, මාළිගාව, උඩුමහල්ගේ, මුලුතැන්ගේ, ගබඩාගේ, රිටිටාගේ, ආභරණගේ යන අංගයන් මෙයට අන්තර්ගත වේ. (Bell 1990 : 19) දළදා පෙරහැර සමයේදී මෙම විහාර දේවාල 80 ඉතා පවිත්‍රව පවත්වාගෙන යා යුතු අතර නිරන්තරයෙන් ප්‍රධාන තේවාවන් තුන සහ අතිරේක තේවාවන් පවත්වාගෙන යා යුතු අතර මේ සඳහා සාම්ප්‍රදායික නිල ගම්වර ප්‍රදානය කර තිබේ.

මේ අනුව ශ්‍රී දළදා මාළිගාවේ වාර්ෂික ඇසළ පෙරහැර යනුවෙන් හඳුන්වනු ලබන්නේ එක් අතකින් ශ්‍රී ලාංකික අනන්‍යතාවය ප්‍රකට කරන ජාතික උත්සවයක් මෙන්ම රජුගේ සෘජු පාලනය යටතේ පවතින ප්‍රදේශවල පාරිශුද්ධත්වය පිළිබඳ මංගල්‍යයක්ද වන්නේය. ශුද්ධ වූ දළදා වහන්සේ සහ දේවත්වයෙන් ශුද්ධ වූ සතර මහා දේවාලවල මංගල්‍යයන් සඳහා සූදානම් වීමේදී අලුත් නුවර විෂ්ණු දේවාලයෙන් ඇරඹී මහනුවර අග නගරය ලෙස කේන්ද්‍රගතව පිබිදී වර්ධනය වී ගම් දනව් කරා මෙන්ම ගම් දනව්වල පර්යන්තයීය පෙදෙස්වලට පැතිරී යන ශුද්ධත්ව සහ පාරිශුද්ධත්වය පිළිබඳ මංගල්‍යයක් ලෙස ද දළදා පෙරහැර හැඳින්විය හැකිය. ශුද්ධත්වය බුක්ති විඳීම සඳහා ජනතාව සහභාගි වන ආකාරයන් තුනක් දක්නට ලැබේ. එනම් විශේෂයෙන්ම සතර දේවාලවල ඇතුල් පෙරහැර සුවිශේෂ වශයෙන් දරුවන් සඳහා ද, කුඹල් පෙරහැර ගැබිණි මව්වරුන් සඳහා ද රන්දෝලි පෙරහැර සියලු ජන කොටස් සඳහා ද වශයෙනි.

මේ අනුව දළදා මාළිගාව අවට ප්‍රදේශවල ගම්වැසියන් අවම වශයෙන් පෙරහැර හතක් නැරඹීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස සලකනු ලබන අතර පෙරහැර අවසානයේ දවල් පෙරහැර නැරඹීමද, සිදුකළ යුතු වන්නේය. එමෙන්ම පසු දින දවල් පෙරහැරේදී වැස්සට තෙමීම පෙරහැර චාරිත්‍රවල සුවිශේෂ අංගයක් සේ සලකනු ලබන අතර මේ තුළින් නගරයේ කිළිටි සෝදාගෙන යාමක්ද සිදුවන බැව් ගැමියන්ගේ විශ්වාසයයි.

## ආශ්‍රිත ග්‍රන්ථ

1915 Durkheiun, Emile The Elementary Forms of Religioñ Life. London : George Allen & Unvin

2006 ධම්මාලෝක හිමි, වරකාවේ **පූජනීය දළදා සංස්කෘතිය**, මහනුවර : මධ්‍යම පළාත් පරිසර අමාත්‍යංශය.

1989 හේරත් එච්. එම්. ඩී. ආර්. "සිංහල සමාජයේ දකුණ - වම සංකල්පය : සංකේත මානව විද්‍යාත්මක විමර්ශනයක්, **"සමාජ විමසුම,** මහනුවර, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනය

1964 පීරිස්, රැල්ෆ්, **සිංහල සමාජ සංවිධානය, කොළඹ.** සීමාසහිත සමන් ප්‍රකාශකයෝ

2006 සෙනෙවිරත්න, අනුරාධ **ඥාන දර්ශන,** කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ

1990 Aluwihare, Richard. **The Kandy Perehera**, Colombo : M.D. Guasena & Co.

1990 Bell H.C.P. **Report on the Kegalle District**, Colombo : (Reprint) Government Press.

# දළදා පෙරහැර සහ එහි ගමන්ගන්නා දිසාවනීන්ට අයත් කොඩි සහ රට සභාවට අයත් කොඩි

**මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්**
සමාජ විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

දළදා පෙරහැර හේතූන් කිහිපයක් පදනම් කොටගෙන පවත්වනු ලබන ජාතියේ අති උත්කර්ෂවත් සංස්කෘතික උත්සවය මෙන්ම ජාතික අනන්‍යතාව පෙන්වනු ලබන විශිෂ්ට මංගල්‍යයද වේ. ඒ වටා සුවිශේෂ සංස්කෘතියක් ගොඩනැඟී තිබෙන අතර අනුරාධපුරයේ සිට මහනුවර දක්වා යුග ගණනාවක සමුච්ඡය කරන ලද භෞතික නොවූ සංස්කෘතියක්ද මෙහි අන්තර්ගත වේ. සම්ප්‍රදායිකව ඇසළ මාසයේදී පැවැත්වෙන මෙම සංස්කෘතික මංගල්‍යය හතරවන සියවසේදී ආරම්භ වී සමහර අංග එකතුවෙමින්ද සමහර අංග අඩුවෙමින්ද වර්තමානය දක්වා විකාශනය වූ බව පෙනේ. කෙසේ වුවත් දළදා පෙරහැර පැවැත්වීමට හේතු සාධක වන කරුණු රාශියක් ඓතිහාසික සාධකවලින් පෙනී යයි. මෙම කරුණු පහත සඳහන් පරිදි පෙළ ගැස්විය හැකිය.

i. ඉන්දු ආර්ය සංස්කෘතිය ප්‍රතිමූර්තිමත් කරමින් ඉන්දියාවේ පැවැත්වෙන ආෂාඪ උත්සවය මෙහි ආරම්භය වියැයි පවතින මතය (වජිර හිමි 1938 : 302)

ii. සුරා - සුර යුද්ධයෙන් ජයගෙන අසුරයන් සිහි කිරීම සඳහා කෙරෙන උත්සවයක් ලෙස (පීරිස් 1964 : 127)

iii. කෘෂිකාර්මික රටක වැස්ස ලබාගැනීම සඳහා දෙවියන්ගෙන් සහ බුදුන්ගෙන් කෙරෙන ඉල්ලීම උදෙසා කෙරෙන වාර්ෂික ඇසළ පූජාව
(සෙනෙවිරත්න 2001 : 168)

iv. සිංහල රාජ්‍ය මෙතෙක් විදේශ රටවල් සමඟ සිදුකළ යුද්ධවලින් ලැබූ විජයග්‍රහණයන් ප්‍රදර්ශනය කරමින් රජුගේ ප්‍රෞඪත්වය,

ජනතාව තුළ පවතින එඩිතර බව නැංවීම සඳහා කෙරෙන උත්සවයක් බව

(වජිර හිමි 1983 : 302)

v. වර්ෂයේ දෙවන වතාවට ස්වකීය රාජ්‍යයේ මහජනතාවට දැකගැනීම සඳහා රජතුමා ප්‍රදර්ශනය, විදී සැරිසැරීම ඔහුට හිමි බල පරාක්‍රමය ප්‍රකට කිරීම සහ ස්වකීය පුරවැසියන් හමුවීම (Heath)

ඉහතින් සඳහන් කරනු ලැබූ බොහෝ පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා සංවිධානය වූ මෙම සුවිශේෂ සංස්කෘතික මංගල්‍යය දඹදෙණිය යුගයෙන් මහනුවරට පැමිණ ක්‍රියාත්මක වූයේ සතර දේවාල පෙරහැරක් වශයෙනි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස ශ්‍රී ලංකාවට සියම් දේශයෙන් වැඩම කළ උපාලි මහ තෙරුන් වහන්සේගේ මඟ පෙන්වීම පරිදි දේව පෙරහැරකට වඩා දළදා වහන්සේ වෙනුවෙන් වෙන්වුණ බෞද්ධ මුහුණුවරක් ගත් දළදා පෙරහැර බවට පත් වූ බව පෙනේ. මෙහිදී ක්‍රියාත්මක වූ නීතිරීති පදනම් කොට ගෙන රාජ්‍යයේ පුරවැසියන් නියෝජනය කරන නිල ලාංඡන සහිත කොඩිවලින් යුක්ත වීම පෙරහැරේ අංගයක් බවට පත්විය. මෙම ලිපියේ අරමුණු වන්නේ දළදා පෙරහැරේ ගමන් ගනු ලබන ඒ ඒ දිසාවනීන්ට සහ රට වසමට අයත් කොඩි පිළිබඳ කෙටි සාකච්ඡාවක් ඉදිරිපත් කිරීමය.

වඩා ප්‍රායෝගික මෙන්ම සැබෑ භක්තිමත් රජ කෙනෙකු වශයෙන් ක්‍රියා කළ කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් සංවිධානය කළ දළදා පෙරහැර සියලුම ලංකාවාසී ජනතාවට ඔවුන්ගේ අනන්‍යතාව ප්‍රකාශ වන අයුරු සහභාගිවීමට ඉඩ ප්‍රස්තා සලසා දෙනු ලැබිණි. ඒ අනුව ඒ ප්‍රදේශවල නිලයන් දරන්නා වූ ජනයන් වෙන් කොට හඳුනා ගැනීම පිණිස කොඩි නංවන ලදි. (වජිර හිමි 1983: 308)

## ප්‍රාදේශිය අනන්‍යතාව සහ උපසංස්කෘතික සංකේත

ඕනෑම සමාජයක මිනිසුන්ගේ සංස්කෘතිය යනු ජීව විද්‍යාත්මක අනන්‍යතාව පරයා දිවෙන විශිෂ්ටම මානව නිර්මාණයකි. මෙම සංස්කෘතිය

තුළ ඔවුන්ගේ ප්‍රභවය, පැවැත්ම මෙන්ම ඔහු විසින් සමාජයට දායක කරනු ලබන භෞතික හා භෞතික නොවන සංස්කෘතියේ හැඩය ද අන්තර්ගතවී තිබීම නිසා එය ඔවුන්ගේ සාමූහික අනන්‍යතාව වන්නේය. මෙය ඉතා සරල සමාජයක පවා තෝටමික ලාංඡනවල භාවිතයන් තුළින් දක්නට ලැබෙන්නකි. (Durkhein 1915 )

දළදා සංස්කෘතිය තුළ රජුගේ කිරීටය අණසකත් දේව මණ්ඩලයේ අනන්‍යතාවය මල්වතු අස්ගිරි උභය විහාරයේ මහා සංඝරත්නය සමාජ ව්‍යුහයට අනුගත වී ඇති ස්වරූපයක්, පදනම් කොටගෙන ප්‍රාදේශීය අනන්‍ය නිර්මාණය වීමේ ස්වරූපයක් දක්නට ලැබේ. (Heath)

මේ නිසා කන්ද උඩරට ප්‍රාදේශීය කොඩි සකස්වීමේදී බොහෝ දුරට විවිධ වකවානුවල ජීවත් වූ මුල් පදිංචිකරුවන්ගෙන් හිමි වූ තෝටමික ලාංඡනයන්, එසේත් නැතහොත් ඒ ඒ ජනකොටස්වල වංශ අනන්‍යතාවන් හා සම්බන්ධ සත්ව රූප සම්බන්ධවීම නොවැළැක්විය හැකි කරුණකි. මෙයට අමතරව මෙම ප්‍රාදේශීය කොඩි ලාංඡනවල බොහෝදුරට එම ප්‍රදේශය හා බැඳුණු දේව විශ්වාස පද්ධතිය හා සම්බන්ධ ලාංඡන අනිවාර්යයෙන්ම දක්නට ලැබුණි. තවත් සමහර විට එම දේව විශ්වාස පද්ධතියෙන් බැහැරව වෙනත් ආකාර ලාංඡනයක්ද දක්නට ලැබුණි. උදාහරණයක් වශයෙන් ගතහොත් ඌව දිසාව කොඩියේ ලාංඡනය වූයේ හංසයාය. මෙය ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසින් අංගම්මන දිසාවට දෙන ලද්දකි. (Perera- 1916 : 10) කෙසේ වුවද මහනුවර ඇසළ පෙරහැරේ රාජ්‍ය පක්ෂපාතීත්වය සහ රජුගේ අණසක සහ බල පරාක්‍රමයත් දළදා වහන්සේ පිළිබඳ භක්තියත් තුළින් නිර්මාණය වූවක් වන අතර, පෙරහැරේ ගමන් කරන කොඩි පිළිබඳ විමසීමේදී දිසාවනීන් 12 ක් සහ රජුගේ ඍජු පාලනය යටතේ පාලනය වූ රට වසමේ ප්‍රදේශ නවයක්ද ඔවුන්ගේ අනන්‍යතාවද නිරූපණය වේ.

## මහනුවර රාජ්‍යයේ පාලන ප්‍රදේශ සහ ඒවායේ අනන්‍යතාව

1815 උඩරට රාජ්‍ය ඉංග්‍රීසි විසින් අල්ලා ගන්නා විට එය ප්‍රධාන පාලන කලාප 21 කින් සමන්විත විය. මෙය කලාප 21 තුළ දිසාවනීන් 12 කින් සහ රජුගේ සෘජු පාලනය යටතේ රටේ මහත්වරුන් නවදෙනෙකු මඟින් පාලනය වූ රට සභාවකින් යුක්ත විය.

## දිසාපතිවරුන් යටතේ පාලන වූ ප්‍රදේශ

| | | | |
|---|---|---|---|
| සතර කෝරළේ | වලපනේ | මාතලේ | වෙල්ලස්ස |
| සත් කෝරළේ | උඩපළාත | සබරගමුව | බින්තැන්න |
| ඌව | නුවර කලාවිය | තුන්කෝරළේ | තමන්කඩුව |

රටේ මහත්වරු මඟින් රජු සෘජු ලෙස පාලනයට සම්බන්ධ වූ සෙංකඩගල පුරයට සමීප ප්‍රදේශ

| | | | |
|---|---|---|---|
| උඩුනුවර | හේවාහැට | හාරිස්පත්තුව | පාත බුලත්ගම |
| යටිනුවර | කොත්මලේ | දුම්බර | උඩ බුලත්ගම |
| තුම්පනේ | | | |

**(ඩොයිලි 1966 : 7)**

## දළදා පෙරහැරේ පෙළගැස්ම සහ කොඩිවලින් නිර්මාණය වන්නා වූ ප්‍රාදේශිය අනන්‍යතාව

1817 සැප්තැම්බර් මස 13 දරණ ලංකා රජයේ ගැසට් පත්‍රිකාවේ සඳහන් පරිදි (පීරිස් 1964:127) මහනුවර ඇසළ පෙරහැර ගැන වෙල්ලස්සේ දිසාව විසින් කරන විස්තරයට අනුව පෙරහැරේ මූලික සැකැස්ම මෙසේය.


1. ගජනායක නිළමේ රැගත් රාජකීය හස්තියා
2. කොඩිතුවක්කු ලේකම් හා ඔහු පිරිවරාගත් කොඩිතුවක්කු රැගත් කණ්ඩායම

3. කොඩිතුවක්කු අත්තුවක්කු හා කොඩි රැගත් හතර කෝරළයට අයත් වැසියන් පිරිවරාගත්, එම දිසාව සහ සෙසු සුළු ප්‍රධානීහු.
4. හත් කෝරළයේ වැසියෝ
5. ඌවේ වැසියෝ
6. මාතලේ වැසියෝ
7. සබරගමුවේ වැසියෝ
8. වලපනේ වැසියෝ
9. උඩ පළාතේ වැසියෝ
10. යක්ෂයන් නිරූපණය කරන සංකේත වශයෙන් රෙදිවලින් ආවරණය කර රැගෙන යන ලද බම්බු කැබලි හෝ රූප
11. කරඬුව රැගත් මාළිගාවේ ඇතා මාළිගාවේ සෙසු ඇතුන් හා පිරිවර ජනයා අනතුරුව එති. දියවඩන නිළමේට සහ නානායක්කාර ලේකම්ට පෙරටුව යන මොවුහු කුඩ, කොඩි, සේසත්, ධජ පතාක, පලිස් යනාදිය රැගෙන යති. පංචතූර්යනාදය පැවැත්වෙන අතර නැට්ටුවෝ නටමින් යති.
12. දුන්න හා ඊතල රැගත් දේවාලයට අයත් ස්ත්‍රීන් විසින් පිරිවරන ලස නාථ දේවාලයේ හස්තියා, පූර්ව අංගයේදී මෙන් පරිවාර ජනයා පිරිවරාගත් බස්නායක නිළමේ ඉක්බිතිව ගමන් ගනී.
13. මහ විෂ්ණු දේවාලයේ හස්තිය, දුන්න හා ඊතල සහ පරිවාර ජනයා
14. කතරගම දේවාලයේ හස්තියා, දුන්න හා ඊතල පරිවාර ජනයා
15. පත්තිනි දේවාලයේ හස්තියා, දුන්න හා ඊතල සහ පරිවාර ජනයා
16. තම ප්‍රධානීන්ට පෙරටුව තුවක්කු, ධජ පතාක යනාදිය රැගෙන ගිය මහ ලේකම් බද්දේ ජනයා
17. පෙර පරිදි උපකරණ රැගත් අතපත්තු කාර්යාංශයේ ජනයා, අතපත්තු ලේකම් හා උඩුනුවර, යටිනුවර, තුම්පනේ, හාරිස්පත්තුව, දුම්බර, හේවාහැට යන මේ ප්‍රදේශවල රටේ මහත්වරු අනතුරුව ගමන් ගනිති.
18. වෙඩික්කාර කාර්යාංශයේ ජනයා හා ඉක්බිති එහි ලේකම්
19. තම ලේකම් කැටුව වඩන තුවක්කු කාර්යාංශයේ ජනයා

20. තම ලේකම්වරු සමඟ පඩිකාර කාර්යාංශයේ ජනයා (පීරිස් 1964: 127)

ඉහත සඳහන් විස්තරයට අනුව රජුගේ අණසක බල පරාක්‍රමය විදහා දැක්වීමේ ප්‍රබල වගකීම් සිව්රඟ සේනාවේ ප්‍රධානියා වූ ගජනායක නිළමේට හිමිවන අතර හස්ති ලාංඡනය සහිත කොඩිය පෙරටු කොටගෙන සෙස කොඩි ගමන් ගනී. මෙය රජයේ බලපරාක්‍රමය පිළිබඳ පුරවැසියන්ට කෙරෙන සන්නිවේදනයකි.

**ගජනායක කොඩිය**



ඉනික්බිති කොඩිතුවක්ක ලේකම් ස්වකීය රාජ්‍යයේ ඇති මහ කොඩිය හෙවත් රාජකීය කොඩිය (කසයක් අතින් ගත් සිංහයෙක් මෙහි දක්නට ලැබේ.) යටතේ කොඩිතුවක්කු සහ සෙසු නිල තනතුරු සහ ඊට අදාළ පඩිකාර හමුදාව ගමන් ගනී. මෙම නිල පිරිස තුළ

කොඩිතුවක්කු ලේකම් | කොඩිතුවක්කු ගමරාළ
කොඩිතුවක්කු මුදියන්සේ රාළ | කොඩිතුවක්කු කංකානම
කොඩිතුවක්කු මුහන්දිරම් රාළ | කොඩිතුවක්කු විදානේ
කොඩිතුවක්කු ආරච්චිල | කොඩිතුවක්කු දූරයා

යන ධුරාවලිගත කණ්ඩායම ගමන් ගනී.

අනතුරුව එළඹෙන්නේ උඩරට රාජ්‍යයේ ප්‍රධාන දිසාවනීන්ට හිමි කොඩි සහ ඒ හා සම්බන්ධ නිලධාරීන්ය. මෙහිදී උඩරට රාජ්‍යයන් දළදා වහන්සේත් ආරක්ෂා කිරීම පිළිබඳ වගකීම හතර කෝරළයට හිමි වේ. ප්‍රධාන දිසාව ලෙස හතර කෝරළයට එම ස්ථානය හිමි වන්නේ කෝට්ටේ යුගයේ සිටය. (Perera 1916 : 12)

"හතර කෝරළේ මහදිසාව යුද්ධයට නායකත්වය ලබාදෙනු ලබන අතර, දළදා පෙරහැරේ පෙරමුණෙන් ගමන් කිරීමත් මාන පසක් ලබමින් රජුන්ගෙන් පුදනු ලැබූ ගෞරවනීය තනතුරට ඉරහඳ මහ කොඩියේ අයිතිය පැවරී තිබේ." (Bell 1990: 03)

මෙය මහනුවර රාජ්‍ය ඉරහඳ පවතින තුරු සුරක්ෂිත කිරීම සඳහාත්, එයට හේතු වූ අතිශය නිර්භීත පුද්ගලයන් බිහිකළාවූත්, නිසා මෙම ගෞරවනීය ස්ථානය ලැබී තිබේ. මේ නිසා දිසා කොඩිවලින් ප්‍රථම ස්ථානය සතර කෝරළයට හිමිවන අතර, එම කොඩිය සුදු පසුබිමේ ඉර - හඳ සහ තරු පිහිටා තිබෙන අතර, සතර කෝරළයේ මහා දේවාලය වූ අලුත් නුවර දැඩිමුණ්ඩ දේවාලයේ කොඩියේ ලක්ෂණයන්ද ඉර - හඳ සහ තාරකා පිහිටා ඇත්තේ වෙනස් ආකාරයකටය. එනම් ඉර මැදිකොටගෙන සඳවල් දෙකක් සහ බෝපත් සතරකින් අනාවරණය වූ හතරස් කොටු මොස්තරයකිනි.


**සතර කෝරළය**

**ඉර - හඳ මහ කොඩිය**



කන්ද උඩරට රාජධානියේ දිසාවනීන්වල ධුරාවලියට අනුව දෙවන ස්ථානය හිමි වන්නේ සත් කෝරළයට ය. සත්කෝරළයේ දිසාවේ අනන්‍යතාව ගෙන එන කොඩියේ ලාංඡනය වන්නේ සිංහරූපයයි. එයට හේතුව කුරුණෑගල සහ යාපහුව රාජධානිය තිබුණ සමයේ සත්කෝරළයේ රාජ්‍ය ලාංඡනය සිංහ කොඩිය වූ නිසාම අද දත්වා ඔවුන්ගේ පෙරහැර ලාංඡනයද එම කොඩියම වේ. නමුත් අන්‍ය සිංහ කොඩිවලින් මෙම සිංහ කොඩිය වෙනස් වන්නේ රතුසිංහ රූපය සුදු පසුබිමක බෝපත් සතරක රැකවරණය ලබමින් ලියවැල් මෝස්තරයකින් රාමුව සකස් වූ රටාවකිනි. මේ අනුව පෙරහැර මංගල්‍යයේ දිසා කොඩියට පෙරමුණ කරගත් සත් කෝරළේ දිසාපති සහ සෙසු නිලධාරින් පෙරහැරේ ගමන්ගත් ආකාරය තුළින් දිස්වන්නේ ඔවුන්ගේ රාජ්‍ය ලාංඡනය සහිතව දළදා මංගල්‍යයට සහභාගි වන බවයි.

## සත් කෝරළයේ දිසා කොඩිය



## ඌවේ වැසියන්ගේ සහභාගීත්වය

අනිකුත් දිසාවනීන්ගේ සහභාගීත්වයට අනුවම ඌවේ දිසාපති ප්‍රමුඛව ඌවේ වැසියන් පෙරහැර මංගල්‍යයට සහභාගි වන අතර, ඔවුන්ගේ කොඩියේ ලාංඡනය වන්නේ හංසයාය. (Perera 1916: 10) නමුත් මෙම හංස ලාංඡනය කල්පිත එකක් වන අතර, නියපොතු සුනඛයෙකුගේ මෙන්ද ඇස් සැවුලකුගේ මෙන්ද මාළුවකුගේ හැඩය ගත් මුහුණකින්ද තද රතු හොටකින්ද

සමන්විතය.

(Coomaraswamy 1979: 86)

**ඌවේ දිසාවේ හංස කොඩිය**



**මාතලේ දිසාවේ සුදු කොඩිය**

දළදා පෙරහැරේ දිසා අනුපිළිවෙල අනුව සතර වැනි ස්ථානයේ ගමන් කරන්නේ මාතලේ දිසාපති ප්‍රමුඛ එම දිසාවේ තනතුරු හොබවන පිරිස් සහ වැසියෝය. මාතලේ දිසාවේ කොඩිය කිසිම ලාංඡනයක් නොමැති සුදු කොඩියකි.

**හේරුණ්ඩ පක්ෂි ලාංඡනය**

උඩරට රාජ්‍යයේ සතර කෝරළ දීසාවනියට ආසන්නම දිසාවනිය හඳුන්වන ලද්දේ තුන් කෝරළය නමිනි. රාජපක්ෂිභාවය සහිතව ඔවුන් පෙරමුණ ගන්නේ හේරුණ්ඩ පක්ෂියාගේ රූප ලාංඡනය සහිත කොඩිය සමඟය. පෙරහැරේ පස්වෙනි දිසාවනිය ලෙස නියෝජනය කරන තුන් කෝරළේ පක්ෂි ලාංඡනය ශ්‍රී ලංකාවේ උකුස්සා හිස් දෙකක් සහිතව කල්පිත ලෙස නිරූපණය කොට තිබේ. ඉතාම තියුණු හොටයක්, තියුණු ඇස් දෙකක් සහ තියුණු නිය සහිත පාද යුවලක් මෙම උකුස්සාට හිමි වේ.

## තුන් කෝරළේ හේරුණ්ඩ පක්ෂි කොඩිය



## සබරගමුවේ කොඩිය

මෙය හඳුන්වන්නේ සබරගමුවේ කහ පැහැති මහ කොඩිය වශයෙනි. මෙය පෙරහැරේ අටවන ස්ථානයේ සබරගමුවේ දිසාව පෙරටුකොට ගත් නිලධාරින් සමඟ ගමන් ගනී.

## වලපනේ දිසාවේ සහභාගීත්වය

සෙංකඩගල පෙරහැර මංගල්‍යය සඳහා වලපනේ දිසාවේ සහභාගීත්වය සිදුවන්නේ හයවෙනි ස්ථානයටය. වලපනේ දිසා කොඩියේ ලාංඡනය වන්නේ මොනර පක්ෂියාය. බෝපත් සතරක සෙවණ ලබමින් සිව් කොකේ බෝපත් ලාංඡනය සහිත මයුර කොඩිය වලපනේ ජනතාව නියෝජනය කරමින් ඔවුන්ගේ දිසාපතිවරයා සමඟ දළදා පෙරහැරේ ගමන් කළ බව පෙනේ. එහෙත් බෝපත් රහිතව මහා විෂ්ණු දේවාලයේද මෙවැනිම කොඩියක් දක්නට ලැබේ.

(Perera - 1916 : 11)


## වලපනේ දිසාවේ මයුර කොඩිය



## උඩපළාතේ දිසාවේ කොඩිය

උඩපළාත දිසාවේ කොඩියේ ලාංඡනය යූයේ නෙළුම් මලයි. සමහර අවස්ථාවලදී මෙහි හැඩය සූර්යයාගේ ආකාරයට පෙති සකස් කළ ස්වරූපයක්ද දක්නට ලැබේ.

## උඩපළාතේ නෙළුම් මල කොඩිය



1817 දී වෙල්ලස්ස දිසාව විසින් ඉදිරිපත් කරන ලද පෙරහැර විස්තරයේ පෙරහැර පෙළගැස්ම තුළ ඔහු සඳහන් කර ඇත්තේ දිසාවනීන් අටක් පමණි. නමුත් මහනුවර රාජ්‍යයේ තවත් දිසාපති කොට්ඨාසය හතරක් අඩංගු වේ. ඒවා නම් වෙල්ලස්ස, බින්තැන්න, තමන්කඩුව සහ නුවර කලාවිය. මේවා

වෙනම දිසාපතීන් විසින් පාලනය කරනු ලැබූ අතර, අත්‍යන්තයෙන්ම මහනුවර රාජ්‍යයේ කොටස් වූහ. (පීරිස් 1964, ඩොයිලි 1996 පෙරේරා 1619)

මේ අනුව ඔවුන් මහනුවර රාජ්‍යයේ පාලනය සහ සංස්කෘතිය බෙදාහදාගත් අතර, අනිවාර්යයෙන්ම මහනුවර රාජ්‍යයේ අණසක බ්‍රිතාන්‍ය යුගයේදී පවා පැතිරී තිබූ අන්දම වවුනියාවේ සිංහල පත්තුවේ රටේ සමත්මයා විසින් සභාව හමුවේ විසඳනු ලැබූ නඩු වාර්තාවකින් ඔප්පු වේ.

"රන්මැණිකාට පුංචිරාළ විසින් අඬ ගසා කියා තිබුණ කුල දූස්සිය වචනේ ගැන අද දවසේ මොහොට්ටාල ප්‍රදාන මූලාදෑනිවරු ඇහුම් - බැලුම් කර බලා නිසි දඬ - මුඩ අය කර ඒක බොරු වචනයක් හැටියට ඔප්පු වූ නියාවට, මුලින් රන්මැණිකාටද ඒ ඇත්තිගේ ලේ නෑදෑයින්ටද දී තිබුණ අණ තහනම් උඩ අසා අහක්කර තිබෙන වගයි. එනම් සෙංකඩගල පුර රංකොත් පත්තිරුප්පු පවතින තුරු තහනම් නැත. අද පටන් ඒ ඇත්තීට මේ වචනය පිරිමියෙකු හරි ගෑනියෙකු හරි කොල්ලකු හරි දර දබරයකින්වත්, දිය දබරයකින්වත්, අඬ දබරයකින්වත් කෙළි පොලකදිවත්, අඬ ගහා කියන්ට තහනම්, සිංහලයේ මහ රජ්ජුරුවන්ගේ රන්කඩුවේ රන් ඔටුන්නේ අණදන්නවානම් තහනම් ...." (JRASCB VOLXXXVIII No. 106 1948: 55)

මෙයින් පෙනී යන්නේ වෙල්ලස්ස, බින්තැන්න, තමන් කඩුව සහ නුවර කලාවිය මහනුවර රාජ්‍යයේ කොටස් වශයෙන් අනිවාර්යයෙන්ම පැවති බවටත් 1815 ඉංග්‍රීසින්ට යටත් රාජ්‍යයක් බවට පත්වන විටත් - පැවති බවයි. මේ නිසා 1817 ට පෙර දළදා පෙරහැර නියෝජනයේදී අනිවාර්යයෙන්ම මෙම දිසාවනීන් පහත සඳහන් ලාංඡනය රැගත් කොඩි භාවිත කොට තිබේ.

**වෙල්ලස්සේ කොඩිය**

ඌව පළාතට අයත් වූවත් ඌව සහ වෙල්ලස්ස දිසාවේ කොඩිය එකින් එක වෙනස් වේ. වෙල්ලස්සේ කොඩිය සඳහා භාවිතකොට ඇත්තේ

කොටියාගේ ලාංඡනය සහිත කොඩියයි. වෙල්ලස්සේ දිසාව විසින්ම 1917 දී ඉදිරිපත් කරන ලද පෙරහැර විස්තරයේ වෙල්ලස්ස දිසාවට අයත් කොඩි සහ එම වැසියන්ගේ සහභාගීත්වය නොඅඩුව ලැබෙන්නට ඇති බවට සාධක වේ. මෙම කොටියාගේ ලාංඡනය සහිතව වෙල්ලස්සේ කොඩිය මල්වත්ත විහාරයේ දක්නට තිබෙන බව ඊ.ඩබ්. පෙරේරා මහතා සඳහන් කරයි. (Perera - 1916: 11) මෙම කොටියාගේ ලාංඡනය සහිත කොඩියේ සිංහලයෙකුගේ උසින් සහ නිර්භීතභාවයකින් යුක්තව කොටියාගේ මුඛයෙන් ගමන් ගන්නා ලියවැලක් චතුරස්‍රාකාරව සිරුර වටා ගමන් කොට නැවත ආරම්භක ස්ථානයට මඳක් ඉදිරියෙන් කොඩියේ සීමාවන් වශයෙන්ද දක්නට ලැබේ. කොටියාගේ වලිගය ද ලියවැලකින් නිරූපණය කොට තිබේ.

**වෙල්ලස්සේ කොටියා ලාංඡනය සහිත කොඩිය**



**බින්තැන්න දිසාවේ කොඩිය**

බින්තැන්නේ ගිරවා ලකුණ දරන කොඩියේ ලාංඡනයක් මෙතෙක් හමුවී නැත.

**තමන්කඩුව දිසාවේ කොඩිය**

මෙම කොඩියේ ලාංඡනය වූයේ වලස් ලකුණයි. නමුත් මෙතෙක් එවැනි

කොඩියක පිටපතක් හමුවී නොමැත.

## නුවර කලාවිය ගජසිංහ කොඩිය

නුවර කලාවිය දිසාව නියෝජනය කළ ලාංඡනය වූයේ ගජසිංහයා සහිත කොඩියයි. සිංහයෙකුගේ කඳක්ද හස්තියෙකුගේ හිසක්ද අන්තර්ගත මෙම කොඩියේ සංකේත කල්පිත නිර්මාණයකි. නුවරවැව, කලා වැව සහ පදවිය වැව යන ප්‍රදේශ ආවරණය කරමින් පැතිර ඇති නුවර කලාවියේ දිසාවගේ මෙම කොඩිය නිර්භයභාවය මෙන්ම මිහිපිට ඇති ශක්තිමත්භාවයක්ද උද්දීපනය වන සේ නිර්මාණය වී තිබේ. බොහෝ විට අනුරාධපුරයේ සුවිශේෂ ගල් කැටයම් අතර, ගජසිංහ රූපයට හිමි වන්නේ වැදගත් ස්ථානයකි.

## නුවර කලාපිය දිසාවේ ගජසිංහ කොඩිය



ඉහත සඳහන් සාකච්ඡාව මඟින් ඉදිරිපත් කරනු ලැබුවේ මහනුවර රාජ්‍යයේ ප්‍රධාන දිසාවනීන් විසින් ඔවුන්ගේ අනන්‍යතාව ප්‍රකට කිරීම මෙන්ම ස්වකීය ප්‍රදේශයේ ජනතාව නියෝජනය කරමින් මහනුවර ඇසළ පෙරහැරේදී ගමන් ගන්නා ලද අනුපිළිවෙලට අදාළ කොඩි පිළිබඳ විස්තරයි. මෙයට අමතරව රජුගේ සෘජු පාලනය යටතේ පාලනය වූ මහනුවර අවට ප්‍රදේශවල රටේ මහත්වරුන්ගේ කුඩා රට සීමාවන් නියෝජන කළ කොඩිද

නුවර පෙරහැරේ දක්නට ලැබුණි.

## මහනුවර රාජ්‍යයේ රටවසම සහ ඊට අදාළ කොඩි

මහනුවර රාජ්‍යයේ රටවසම තුළ ප්‍රධාන කොට්ඨාස 09 ක් අඩංගු වූ අතර මේවා රජු විසින් පත් කළ රටේ මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ පාලනය විය.

## උඩුනුවර රට වසම කිඳුරු කොඩිය

උඩුනුවර කොඩියේ ලාංඡනය වූයේ කිඳුරු රූපයයි. මෙය මනඃ කල්පිත වූවක් වන අතර, සිරුරේ උඩකොටස මිනිස් ලක්ෂණවලින්ද සිරුරේ යට කොටස මත්ස්‍ය ලක්ෂණවලින් ද යුක්ත වේ. නමුත් උඩුනුවර කිඳුරු ලාංඡනයේ සිරුරේ උඩ කොටස මිනිස් රුවක් හක් ගෙඩියක් හෝ නලාවක් පිඹිනා ආකාරයක්, සිරුරේ යට කොටස පක්ෂියෙකුගේ හැඩය ගත් ලක්ෂණවලින් පෙද සහ පාදවලිනුත් යුක්තය.

## උඩුනුවර කිඳුරු කොඩිය



ඉතිරි ප්‍රදේශ අටේ කොඩි ලාංඡන පිළිබඳව තොරතුරු පර්යේෂණාත්මකව සෙවිය යුතු අතර, පෙරහැර පෙළගැස්සීමේදී රට වසමේ නියෝජනය 17 වන ස්ථානයට අයත් වන අතර, අතපත්තු කාර්යාංශයේ සහ

මෙම රටේමහත්වරුන්ගේ නියෝජනය ඒ සමඟම දක්නට ඇත.

## සාමාලෝචනය

මහනුවර රාජ්‍යයේ වාර්ෂිකව පැවැත්වෙන ඇසළ මහා පෙරහැර ආගමික මංගල්‍යයක් මෙන්ම එය තුළ වැඩවසම් සමාජ ලක්ෂණ අන්තර්ගත කොට ගත් දේශපාලන සහභාගීත්වයක්ද දක්නට ලැබේ. ඒ ඒ දිසාවනින් සහ මහනුවර ආසන්නයේම තිබෙන රටවල්වල නායක ප්‍රභූන් ස්වකීය නිල ලාංඡන පෙරටුකොටගෙන මෙම ඇසළ උත්සවයට සහභාගී වේ. පෙරහැරේ විධිමත් සහභාගීත්වයට අමතරව ඒ ඒ කොඩි යටතේ සංවිධානය වන නායකත්වයට සුවිශේෂ රාජ්‍ය කාර්යයන්ද රජු විසින් පවරා තිබේ. මේ නිසා ප්‍රාදේශීය නායකත්වය ප්‍රදේශයේ ජනතාවගේ අනන්‍යතාව ප්‍රකට කරමින් රාජකාරිය ඉටුකරනවා පමණක් නොව එය සමස්ත ශ්‍රී ලාංකික ජනතාවට ප්‍රකට කරනු ලබන්නේ ඇසළ මහා සැණකෙළිය මඟිනි.

ඉහත සඳහන් ලෙස රාජකාරිය සඳහා සාමූහික නියෝජනයක් ඉදිරිපත් කරන මෙම කලාප 21 ජනතාවගේ බොහෝ ප්‍රාදේශීය ලාංඡනවල දක්නට ලැබෙන්නේ සත්ව ලෝකය තුළ විශිෂ්ටත්වයට පත් සතුන් හෝ ස්වභාව ධර්මයේ උත්කෘෂ්ඨ නිර්මාණයන් වූ නෙළුම් මල් වැනි ලාංඡනයන්ය. තවද 18 සියවසේ තිබූ සමහර පෙරහැර ලක්ෂණ 21 සියවස වන විට ක්‍රමයෙන් වියැකෙමින් නව ලක්ෂණයන් එකතු වෙමින් තිබෙනු දැකිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. පීරිස්, රැල්ෆ්, සිංහල සමාජ සංවිධානය, සමන් ප්‍රකාශකයෝ, කොළඹ, 1964
2. වජිර හිමි කඹුරුගමුවේ, දළදා ඉතිහාසය සහ සංස්කෘතිය, තිසර ප්‍රකාශකයෝ, කොළඹ, 1983
3. ඩොයිලි ජෝන්, සිංහලේ ආණ්ඩුක්‍රමය, එම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1960
4. හේරත් එච්.එම්.ඩී.ආර්. පූජනීය දළදා සංස්කෘතිය, මධ්‍යම පළාත් ප්‍රධාන හා පරිසර අමාත්‍යාංශයේ ප්‍රකාශනය, මහනුවර, 2008
5. Coomaraswami Ananda K, Medival Sinhalsese Art, State Printing Corporation, Colombo, Sri Lanka, 1979
6. Bell H.C.P. Report on the Kegalla District, Government Press, Colombo. 1990
7. Perera, E.W. Momories of the Colombo Museum Series No. 2 Sinhalese Banners Standards, Government Press, Colombo
8. Durkhein, E. The Elementary Forms of the Religious Life, George Allenzunvin, London,
   JRASCB VOLXXXVIII No. 106, 1948

# ආසියානු පෙරහැර සංකල්පයේ සෞන්දර්යාත්මක වටිනාකම

## (දේශාටන වාර්තා දෙකක් ඇසුරෙනි)

**ආචාර්ය ලීනා සෙනෙහෙවීර**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා අංශාධිපති, ලලිත කලා අධ්‍යයන අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

දළදා පෙරහැරෙහි සෞන්දර්යාත්මක වටිනාකම කොතෙක්දැයි කිව නොහැක්කේ එය එතරම් චමත්කාරජනකය. විශ්මය දනවන සුළුය. සෞන්දර්ය විද්‍යාව න්‍යායක් ලෙස ලොව පහළ වන්නටත් ප්‍රථම මිනිස් චින්තනය සෞන්දර්ය සොයා ගිය බවට සාධක ඇත. එහි වටිනාකම තේරුම් ගත්තාක් මෙන්ම එය අගයන්නටත් පෙළඹුනේය. ඒවාට අවශ්‍ය සාධක පැරණි මිසර ග්‍රීක රෝම සංස්කෘතියෙන් විශද කෙරෙන්නේය. කෙසේ නමුත් ලොව පහළ වූ දාර්ශනිකයන් අතර බටහිර දාර්ශනිකයෙක් වූ ප්ලේටෝ පළමු වරට ග්‍රීක සංස්කෘතිය ඇසුරෙන් සෞන්දර්යාත්මක විමර්ශනයක් කරන්නට පෙළඹී ඇත. මෙහිදී සිදු කෙරෙනුයේ කලාකෘතියක් පිළිබඳ බුද්ධිමය සංවාදයකට එළඹීමය.

කලාකරුවෙකුට මෙන්ම දාර්ශනිකයෙකුට තම දේශීය සංස්කෘතිය විමර්ශනය කිරීමෙන් සෞන්දර්යාත්මක චින්තනය ඔප් නැංවිය හැකිය. මෙම අධ්‍යයනයෙන් මා ප්‍රයත්න දරන්නේද එම චින්තාව ආසියාවේ බෞද්ධ පෙරහැර සංකල්පයෙන් ඉස්මතු කෙරෙන්නේ කෙසේ ද යන්න විග්‍රහ කිරීමටය. ඒ සඳහා ආසියාවේම දේශගවේෂයෙකු මෙන්ම බෞද්ධාගම පතුරවන්නට යත්න දරූ චීන ජාතික ෆාහියන්ගේ (Fa - Hsian) (ක්‍රි.ව. 413) දේශාටන වාර්තාවලින් උපුටාගත් දත්ත හා සියම් ශ්‍රී ලංකා මිත්‍ර සබඳතාවය ගොඩනැංවීමට යත්න දරූ සිංහල තානාපතිවරයකු වූ විල්බාගෙදර මුහන්දිරම්ගේ වාර්තා උපයෝගී කොටගෙන ඇත. මෙම දත්ත තෝරාගැනීමට පාදක වූ තර්කානුකූල හේතුවක් වූයේ විදේශිකයෙක් ලෙස ෆාහියන් පෙරහැර පිළිබඳ දරූ දෘෂ්ඨියත් සිංහල බෞද්ධයෙකු වූ විල්බාගෙදර

ගේ දෘෂ්ඨියත් අතර සාම්‍යයක් දක්නට ලැබීමය. ඔවුන් ලද අත්දැකීම් ඔවුන් විසින්ම සටහන් කර ඇති හෙයින් ඒවා හොඳම සාධක ලෙස විද්‍යාමාන වීම තවත් හේතුවක් ය.

කිසියම් සංසිද්ධියක් සුන්දර වන්නේ එය ඇසීමෙන් හෝ දැකීමෙන් ලබන අප්‍රතිහත ප්‍රීතිය පාදක කොටගෙනය. දළදා පෙරහැර සිංහල බෞද්ධ බැතිමතාට ගෙන දුන්නේද එවැනි අත්දැකීමක්ය. මා ඉහතින් සඳහන් කළ සියමයේද ලංකාවේ දළදා පෙරහැරට සමාන බෞද්ධ පෙරහැර පවත්වා ඇත. ඒවා නැරඹීමෙන් එරට හා ලාංකීය ජනතාව එකම ආකාරයේ ප්‍රීතියක් බුක්ති විඳි බව විල්බාගෙදර මුහන්දිරම්ගේ අදහස් වලින් මෙන්ම ෆාහියන් භික්ෂුවගේ අදහස් වලින් මොනවට පැහැදිලි වන්නේය. ෆාහියන් භික්ෂූන් වහන්සේගේ සටහන් වල සියමය පමණක් නොව ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශවලද මෙවැනි පෙරහැර පිළිබඳ සටහන් ඇත්තේය.

ඔවුන්ගේ සටහන්වලට අනුව පෙරහැරෙහි සෞන්දර්යය ඔප්නැංවූයේ ප්‍රසංග කලා අංග මෙන්ම දෘෂ්‍ය කලා අංග වලින් බව පැහැදිලිය. ඒවා විමර්ශනයේදී මතුවන ගැටළු කීපයක් ඇත්තේය. දළදා පෙරහැර හා අනෙකුත් බෞද්ධ පෙරහැර ප්‍රේක්ෂකයාට කවර අන්දමේ ප්‍රතිඵල ජනිත කරයිද? එය සෞන්දර්ය පමණක්මද? නැතහොත් ඉන් ඔබ්බට ගමන් කළ හැකි බුද්ධිමය සංවාදයකට තුඩු දෙන්නේද? යන්නත් එහි පැවැත්ම කුමක් මත රඳා පවතීද යන්නත් එම ගැටළුවලින් කිහිපයකි. මේ සියලු පැනයන්ට පිළිතුරු සැපයීමට යාමේදී පෙරදිග සංස්කෘතියේ පෙරහැර සංකල්ප එම දේශයට අයත් සාරධර්ම පද්ධතිය සමග එකිනෙක ස්පර්ශවෙමින් දෝලනය වන ප්‍රපංචයක් ලෙස පෙනේ. මෙකී කාරණාව චීන ජාතික ෆාහියන් භික්ෂුව විසින් රචිත "A Record of Buddist Kingdoms or The Tranels of Fa-Hsien" කෘතියෙන් පැහැදිලි වෙයි.1

මෙයින් පෙනී යන්නේ ෆාහියන් භික්ෂුව පෙරහැර දැකීම පිළිබඳ අත්වීදිම බහුල පුද්ගලයෙක් බවය. ඔහු දුටුවේ දන්ත ධාතුන් වහන්සේ අරබයා පැවැත්වූ දළදා පෙරහැර පමණක් නොව බෞද්ධ පෙරහැර කිහිපයක

සෞන්දර්යාත්මක වටිනාකම සනිටුහන් කරමින් තමන්වහන්සේ අත්විඳි පිළිම පෙරහැර, කඨින උත්සව සඳහා කළ පෙරහැර හා දන්තධාතූන් වහන්සේ අරබයා කළ දළදා පෙරහැර පිළිබඳ සටහන් වලින් ආසියාවේ පෙරහැර සංකල්පයේ සෞන්දර්යාත්මක චින්තාව පැහැදිලි කිරීමක් බවද හැඟේ.

උන්වහන්සේගේ සටහනකට අනුව යූ- ටීන් (බෝටාන්) දේශයේ පිහිටි ගෝමතී සංඝාරාමයේ [2] පැවැත්වූ පිළිම පෙරහැර පිළිබඳ විමර්ශනයෙන් දළදා සංස්කෘතියට අනුව සැකසුණු සිරිත් විරිත් හා පෙරහැරේ ක්‍රියාපිළිවෙත් විද්‍යාමාන වන්නේය. පෙරහැරට කලින් එය පැවැත්වීමට අවශ්‍ය පරිසරය පළමුව සකසා ගනී. බාහිර පරිසරයේ උත්තේජක මගින් මානසික එනම් උද්දීපන විභාව  සකසා ගනී. උන්වහන්සේ පළමුවෙන්ම හඳහන් කරනුයේ එම රටේ සුඛිත මුදිත ජනතාවක් වෙසෙන බවත් එහි පිහිටි සමෘද්ධිමත් සමාජ සංස්ථාවන් නිරූපනය කිරීමය. එම රටේ මහායාන බෞද්ධාගමට අනුකූල වන පරිදි පෙරහැර පැවැත්වුවද එය ථෙරවාදී සංකල්ප හා අන්‍යෝන්‍ය සබඳතාවක් ඇති බව පෙනේ.

කෙසේ නමුත් උක්ත සඳහන් ආකාරයට ගෝමතී සංඝාරාමයේ පිළිම පෙරහැර පිළිබඳ සඳහනේදී පළමුව ප්‍රධාන නගරය වීථි පිරිසිදු කිරීමටත් සැරසීමටත් පටන් ගනී. වීථි සැරසීමෙන් පෙරහැරට පෙර සූදානමක් මෙන්ම බැතිමතාගේ සිත් ඒකාග්‍රතාවකට පමුණුවන්නට රුකුල් වන්නේය. සෑම සංජානනයක්ම ක්‍රියාත්මක වන්නේ ඊට අයත්වන වස්තුව අරමුණු කොටගෙනය.[3] ග්‍රීක දාර්ශිනකයකු වූ ඇරිස්ටෝටල්ගේ මෙම ප්‍රකාශයට අනුව සෑම සංජානනයක්ම ක්‍රියාත්මක වන්නට වස්තුව අරමුණු විය යුතු අතර එම වස්තුව ඉතාම හොඳ එකක් විය යුතුය. ඔහුගේ මේ තර්කය ආසියාවේ පෙරහැර සංකල්පය විග්‍රහ කිරීමට කෙතරම් උචිතවේද? ෆාහියන් භික්ෂුව දුටු ගෝමති සංඝාරාමයේ පෙරහැරත් අද පවතින දළදා පෙරහැරත් යන සංසිද්ධීන් එකම අරමුණකින් කරන ලද්දකි. ඒ සඳහා පළමුව වීථි සැකසීම ඇරිස්ටෝටල් පැවසූ ආකාරයට පාදක කොටගන්නා සංසිද්ධිය වඩාත් හොඳ

සංකල්පයක් බවට පත්කිරීමට සූදානම් වීමක් ලෙස මෙසේ වීථි සකසා ගන්නට ඇත. අනතුරුව මෙම සංඝාරාමයේ වැඩවසන 3000 පමණ භික්ෂූන්වහන්සේලා පිළිම රැගෙන පෙරමුණේ ගමන් අරඹති. උන්වහන්සේලාගේ පැමිණීම අපේක්ෂාවෙන් රජතුමා, මෙහෙසියන් හා පරිවාර ස්ත්‍රීන් සමග නගරයේ වාසල් දොර මත්තේ අලංකාර සුවිසල් මැදුරක සිටිති. අභිනව වස්ත්‍රාභරණ වලින් සැරසී නගරද්වාරයෙන් පිටතට ගොස් ප්‍රතිමා වහන්සේලා හරසරින් පිළිගනී.

එවැනිම පිළිම පෙරහැරක් පිළිබඳ මගධ දේශයේ පාටලී පුත්‍ර නගරයේදී දුටු බව සනිටුහන් කරන අතර එය අවුරුද්දේ දෙවන මස අටවක දිනයේ ආරම්භ කරයි. මෙම නගරයේ මිනිසුන්ද ධනවත්ය. ඔවුන් එකිනෙකා පරදවමින් තරගයට මෙන් කුශල ක්‍රියාවේ යෙදෙති. පෙරහැර පැවැත්වූ සමාජ සංස්ථාව නිරන්තරයෙන්ම සටහන්වන්නේ ධනවත් සමාජයක් සංස්කෘතික අංගයක් ලෙසය. පිළිම පෙරහැර සඳහා මාලක රාශියකින් (5) කින් සමන්විත රෝද හතරක රථයක් උපයෝගී කරගනී. මෙම රථය සරසන ලද්දේ විවිධ වර්ණවලින් අඳින ලද දේවතා රූපවලිනි. සතර පැතිවලින් නිම වූ චෛත්‍ය ගෘහ හතරක බෝසත්වරුන් පිරිවරන ලද බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිමාවක තැන්පත් කර ඇත. මෙම ආකාරයට නිමකරන ලද රථ 20 ක් පෙළට ගමන් කරන පෙරහැරකින් මෙය ප්‍රදර්ශනය කළ බව සඳහන් වේ. රථ 20 සරසනු ලැබුවේ විවිධාකාර ලෙසය. ඒකාකාරී බව අප මනස නිරන්තරයෙන් ප්‍රතික්ෂේප කරන්නකි. එම නිසාවෙන්දෝ රථ 20 විවිධ ආකාරයට සරසන්නට ඇත. පෙරහැර නැරඹීමට මුළු රටේම ගිහි පැවිදි සියලුදෙනාම පැමිණෙති. නැටුම්, ගැයුම්, වැයුම් ද පවත්වති. බුද්ධප්‍රතිමාවන් පිළිගනු ලබන්නේ බ්‍රාහ්මණයෝ විසිනි. එහි අර්ථය වන්නේ බුදුවරුන්හට නගරයට පිවිසෙන්නට කෙරෙන ආරාධනයයි.[4] හින්දුවරුන්ගේ දායකත්වයෙන් හා දෙවියන් උදෙසා නැටුම් ගැයුම් වැයුම් එදින රාත්‍රියේ ඉදිරිපත් කෙරෙයි.

ලංකාද්වීපයෙන් බැහැර වූ මෙම බෞද්ධ පෙරහැරවලින් හා දේශීය

පෙරහැර නැරඹීමෙන් ෆාහියන් භික්ෂුව අත්විඳින ලද්දේ එක හා සමාන සංතෘප්තියකි. මෙම උත්සව සියලුම බෞද්ධ රටවල ඒකාකාර යැයි පැවසීම එම තර්කය තහවුරු කරන්නකි.

උන්වහන්සේ ක්‍රි.ව. 04 සියවසේ ශ්‍රී ලාංකීය සමාජ පසුතලය අරබයා අනුරාධපුර නගරයේ අභයගිරි විහාරයට වැඩම වූ දළදා වහන්සේට කළ පෙරහැර පිළිබඳ සටහනින් එවකට ආසියාවේ බෞද්ධ පෙරහැර අංග ලක්ෂණ මොනවට පැහැදිලි කරති.

උන්වහන්සේ දුටු පෙරහැර වීථි සංචාරය කරන්නට දින 10කට මත්තෙන් නගර වැසියෝ සූදානම් කරන්නට රජතුමා වග බලාගත් බව පෙනේ. මේ සඳහා සරසන ලද අතෙකු පිට දක්ෂ කථිකයකු තබා බෙරයක් වයමින් ජනතාවට පෙරහැර පවත්වන්නට පෙර ඉඟියක් සන්නිවේදනය කරයි. එහිදී තේමාකොට ගනු ලැබුවේ බෝධිසත්වයන් වහන්සේ පූර්ව ජන්මයන්හි කළ පරිත්‍යාග පිළිබඳවත් උන්වහන්සේගේ මුළු ජීවිත කාලයම ධර්මය දෙසමින් සැනසීම ලබාදුන් බවත් මිනිසුන්ට විමුක්තිය පසක් කර දුන් පසු පිරිනිවන් පෑ බවත්ය. රජතුමා විසින් මෙවැනි පූර්වාරම්භයක් සිදු කළේ මන්දැයි යන පැනයට පිළිතුරු ලෙස කිවහැක්කේ බෞද්ධ බැතිමතාගේ චිත්ත සංකල්පනා බෞද්ධ පරිසරයට උචිත ආකාරයට සැකසීම සඳහා යොදාගත් තර්කානුකූල ප්‍රයෝගයක් ලෙසය. කලාකෘතිය රසවිඳීමට අවශ්‍ය උත්තේජක මෙලෙසින් පිළියෙල කොට ඇත.

ආසියානු පෙරහැර සංකල්පයේ වැදගත් ස්ථානයක් රජතුමාට හිමි වූ වග පෙනේ. පෙරහැර සංවිධාන කටයුතු සිදුකළේ රජතුමාගේ මූලිකත්වයෙන්ය. රාජ්‍යත්වයේ පෞඪත්වය පෙරහැරෙන් නිරූපණය විය. එය උත්කර්ෂවත් වූ තරමට එහි සෞන්දර්යාත්මක වටිනාකම වැඩි වූ තරමට ජනතාව සතුටු කිරීමේ ප්‍රීතියෙන් යුතුව ඔහුද පෙරහැරේ සෞන්දර්යය වින්දේය.

ඒ බව සනාථ කරන්නට ඇති එක් සාධකයක් ලෙස රජු විසින් මග දෙපස තැන්පත් කර ඇති ජාතක කථා චිත්‍ර ප්‍රදර්ශනයෙන් පැහැදිලි වේ. මුළු පරිසරයම ඒකාලෝක වන්නට මෙම චිත්‍ර පලක උත්තේජක වූ බව නිසැකය. උන්වහන්සේගේ සටහනට අනුව මේවා විචිත්‍ර වර්ණයන්ගෙන් හෙබි වූ අතර ජීවමාන රූප මෙන් නිරූපණය කර ඇත. සිතුවම් අතර වෙස්සන්තර ජාතකය, සාම ජාතකය හස්ති ජාතකය, වානර ජාතකය නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය.

මෙසේ සරසන ලද වීථිය දිගේ දළදා වහන්සේ වඩමවති. ගමන් ගන්නා මාර්ගයේ මල් හා සුවඳ දුම්වලින් පූජා පැවැත්විණි. ෆාහියන් භික්ෂුව මෙම අවස්ථාවට සම්බන්ධ වූ තූර්යඝෝෂ පිළිබඳ කිසිවක් සඳහන් නොකරයි. එය එසේ වූයේ මන්දැයි ගැටළුවකි. එම අවධිය වනවිටත් ශ්‍රී ලාංකේය බෞද්ධ වතාවත්වලදී තූර්යඝෝෂා පැවැත්විණි. නමුදු දළදා පෙරහැරක් පිළිබඳ ශ්‍රී ලාංකේය වාර්තා අතර මෙය පැරණිම වාර්තාව ලෙස ආසියානු බෞද්ධ ඉතිහාසයට එක්වී ඇත.

දෙවනුව මා සඳහන් කරන්නට අදිටන් කරගනුයේ ආසියාවේ බෞද්ධාගම ස්ථාපිතව පවතින සියමේ බෞද්ධ පෙරහැර පිළිබඳ සංකල්පනාවන්ය. මෙහිදී ලබාගෙන ඇති දත්ත 18 වන සියවසට අයත් වන අතර ෆාහියන්ගේ සටහන් හා සංසන්දනය කරන විට කාල අන්තරය දීර්ඝ බව පෙනේ. නමුදු මෙම ලිපිය ආසියාවේ පෙරහැර සංකල්පය පිළිබඳ දේශාටන වාර්තා ඇසුරින් ලියවීමට අදිටන් කර ඇති බැවින් එසේ දත්ත තෝරාගැනීමට සිදුවිය.

එම දත්ත ලබාගනුයේ විල්බාගෙදර මුහන්දිරම් නැමැත්තෙක් කළ සටහන් ඇසුරෙනි. මොහු භික්ෂූන් වැඩමවීම සඳහා දෙවරක් හෝ තුන්වරක් සියමය බලා ගොස් ඇත. මෙම ගමන් විස්තරයේ අන්තර්ගත කරුණු 1750 - 53 කාලයට අයත් වන්නකි.

සියම් භික්ෂූන් වැඩමවීම සඳහා ලංකාවෙන් පිටත්ව යන දූත පිරිස

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ (ක්‍රි.ව. 1747 - 1760) ප්‍රධානත්වයෙන් සිදුවිය. එහිදී සියම් භික්ෂූන් වහන්සේලා වැඩමවීම අරබයා සියමයේදී පෙරහැරවල් සහ උන්වහන්සේලා ලංකාවට වැඩමවීමේ දී ලංකාවේ සිදුකළ බෞද්ධ පෙරහැරවල් හා දළදා පෙරහැර පිළිබඳ කරුණු රාශියක් අන්තර්ගත වේ. එම සටහන් ආසියාවේ පෙරහැර පිළිබඳ සෞන්දර්යාත්මක වටිනාකම සනිටුහන් කරයි.

පළමුවරට සියම් භික්ෂූන් වහන්සේලා වැඩම කරවීම උදෙසා සියමය බලා ගිය දූත පිරිස තානාපතිවරු පස්දෙනා (5) හැරුණුවිට අවශේෂ පිරිස හැට හතක් (67) පමණ විය. එම දූත පිරිස පෙරහැර සඳහාම සූදානම් ව ගිය බවක් පහත නම් සඳහන් පිළිවෙලින් පැහැදිලි වන්නේය.

ප්‍රධාන තානාපතිවරු 5, අතපත්තුවේ ලේකම් හමුදාව 12, වෙඩික්කාර හමුදාව 10, පඩික්කාර ලේකම්5, නානායක්කාර ලේකම් 7, වෙඩික්කාර ලේකම් 4, කලා ශිල්පීන් 13, වැඩකාරයන් 11 වශයෙන් මෙම පිරිස සමන්විත විය.[5] මේ අතරින් හමුදාව පෙරහැරේ ගමන් කළ වගටත්, දිසාව, කෝරළය බාර නායකයින් පෙරහැරේ ගමන් කළ වගටත්, ඒ අතර සිටි තූර්යවාදකයෝ හා මෙහෙකරුවෝ යන මෙකී සියලු අංග පෙරහැරක අන්තර්ගත පිරිස් වෙති. මොවුන් පෙර සූදානමකින් යුතුව සියමයේදී පෙරහැර හා උත්සව පැවැත්වීමට අවශ්‍ය වූ විට ඒ සඳහා තූර්යවාදක මණ්ඩලය රැගෙන ගිය බව උපකල්පනය කළ හැක.

මෙකී පිරිස අතරින් සංඛ්‍යාත්මක වශයෙන් වැඩි පිරිසක් සහභාගී වී ඇත්තේ කලා ශිල්පීන් ලෙසය. වාදනය සඳහා භාවිතා කළ භාණ්ඩ හා ශිල්පීන් ප්‍රමාණය එහි සඳහන් කරයි.

> "කම්බෝරා කාරයන් තිදෙනයි. (කම්බෝරුව යනු බෙරයකි ෘ දවුල)
> පුරංපෙත්තු කාරයන් තිදෙනයි (ක්ලැරිනට් වැනි ලෝහමය නලයකි)
> සිංගාරක්කාර පස්දෙනයි (දවුල වැනි බෙරයකි), හොරණෑකාර දෙන්නයි."

අවනද්ධ හා සුෂිර භාණ්ඩවලට පෙරහැරක හිමිවූයේ අද්විතීය ස්ථානයකි. මෙම නාදය කිසිම දිනයක අමතක නොකළ හැකි වගට විදේශීන් කළ සටහන් එමටය. ඉහත ලැයිස්තුව ද එවැන්නක් සිහිපත් කරන්නකි. මේවා එවකට ලාංකේය පූජා හා උත්සව සඳහා භාවිත සංගීත භාණ්ඩවලින් කිහිපයකි.

සියමයේ එවකට පැවති රාජකීය කඨින පිංකමක් පිළිබඳව විල්බාගෙදර සඳහන් කරයි. එය පැවැත්වූයේ කූජයොත් රත්නාරාමය නම් විහාරයකය. රජවාසල සිට එකී විහාරයට ගමන් කළ චමත්කාරජනක පෙරහැර දළදා පෙරහැර මෙන්ම ආසියාවේ බෞද්ධ පෙරහැර පිළිබඳ කදිම නිදසුනක් ලෙස පෙනේ. මෙම පෙරහැරේ ලාංකීය පෙරහැරේ මෙන්ම ෆාහියන් භික්ෂුව සඳහන් කළ යූ-ටීන් දේශයේ පෙරහැරට සමාන මෙන්ම අසමාන අංග ලක්ෂණ අන්තර්ගත වී ඇත. පෙළට ගමන් කරන මෙම පූජනීය උත්සවය පෙරමුණේ ගමන් කළේ අලි ඇතුන් කණ්ඩායමය. ආසියාවේ අලි ඇතුන්ට බෞද්ධ සමාජයෙන් ලැබුණේ අති පූජනීය මෙන්ම ගෞරවාදරයකි. බෞද්ධ පෙරහැරක අලි ඇතුන් විශේෂිතය. මොවුන්ගේ පෞඪත්වය, පූජනීයත්වය, අලංකාරය ඔප්නංවන අතර මෙකී සියල්ල පෙරහැර ශෝභමාන කරන්නට සමත් වූහ.

ඉහත උත්සවය සඳහා පැවැත්වූ පෙරහැරේ ඇතුන් පිට ගමන්ගත් හමුදාව රන්වතින් සැරසී සුදු සියම් තොප්පි ලා ගෙන සිටියේය. පෙරහැරට සහභාගි වන සියලු දෙනාම සැරසී සිටින්නේය. ඒ සඳහා ඇඳුම් ආයිත්තම්වලින් ලබා දෙන්නේ සුවිශේෂි දායකත්වයකි. පෙරහැරක සෞන්දර්යාත්මක ගුණය තීව්‍ර කරන්නට ඇඳුම් ආයිත්තම් භාවිත කරයි. රාජ්‍යත්වයේ පෞඪත්වය විදහා දක්වීමට හමුදාව සහභාගී වූ නමුදු ඔවුන් පෙරහැරට සහභාගී වීම කරන කොටගෙන මෙකී ඇඳුම් පැළඳුම් වලින් සැරසෙන්නට ඇත්තේ නිතැතින්ම පෙරහැරේ සෞන්දර්යාත්මක ගුණය ඔප දමන්නටම යැයි උපකල්පනය කළ හැකිය. විල්බාගෙදර සඳහන් කරන ආකාරයට පෙරහැරේ පළමු අංගයේ සිට දහවන අංගය දක්වා ගමන් කළ

හමුදාවෝ සැරසී ගමන් කළ බව අවධාරණයෙන් සටහන් කර ඇත.[6].

ඉන් අනතුරුව ගමන් කළෝ තූර්ය වාදන කණ්ඩායම වූහ. සමස්ත පෙරහැරම ඒකාලෝක කළේ මෙම කණ්ඩායමයි. ඔවුන්ද, රන්වනින් සැරසී සිටි අතර නලා හා අවනද්ධ භාණ්ඩ වැඩි වශයෙන් භාවිත කරමින් තන්තිරි වීණා වැයූ බව සඳහන් කරයි. මෙම කණ්ඩායම පිරික්සීමෙන් ඒ බව සනාථ කරගත හැක.

"එසේම සැරසී නාගසිත්තම්, පුරම්පේත්තු, කොම්බු, හොරණෑ, තන්තිරි වීණා, අයොම තාලම්, ඩැක්කි, උඩැක්කි, බෙර, තලි වයමින් ගිය සේනාව"[7]

තන්තිරි වීණා භාවිතා කළ බවට ශ්‍රී ලාංකීය බෞද්ධ පෙරහැරක හෝ දළදා පෙරහැරක් සම්බන්ධව සාධක ඉතා අල්පය. මෙම සටහන් ආසියාවේ පෙරහැර සම්බන්ධව විශේෂ සටහනක් ලෙස හැඳින්විය හැකිය. අලි ඇතුන් විශාල පිරිසක් සහභාගී වී ඇති මෙම පෙරහැර ඉතා අලංකාර වූවක් බව ඔහුගේ සටහන් වලින් විද්‍යාමාන වේ. පෙරහැරක සිරි නරඹන ප්‍රේක්ෂකයාට එහි සෞන්දර්ය විඳින්නට හැකි වන්නේ එහි සමමිතිය එමෙන්ම පිළිවෙල හේතුකොටගෙනය. විශාල සෙනඟක් පාරේ ගමන් කරන ආකාරයට ගමන් කළහොත් එය අශෝභනය. පෙළට ගමන් කිරීම යනු පිළිවෙලට ගමන් කිරීම බව ගැබ් වී ඇත. විල්බාගෙදර මෙම පෙරහැර සටහනේ 20 වන අංගය සඳහන් කර ඇත්තේ " පේළි ඇද නොවන සේ ලනු අල්වා ගමන් කළ කොඩි සේනාව" යනුවෙනි. ඔවුන් එතරම් සැලකිලිමත්ව පෙළට ගමන් කිරීම අගය කොට ඇත. පිළිවෙල නිසා හටගන්නා තුලනය සෞන්දර්යාත්මක වින්දනයට කෙතරම් උචිත වන්නේ දැයි මෙයින් මොනවට පැහැදිලි වන්නේය.

ඉන් අනතුරුව මන්ත්‍රීවරු, ඇමතිවරු හා යුවරජ දෙවෙනි යුවරජ බලවතුන් ලවා ඔසවාගෙන යනු ලබන අනර්ඝ ආසනයක හිඳ ගමන් කළ

අතර අවසානයේ මංගල හස්තිරාජයා අලංකාර ඇඳුම් ආයිත්තම් වලින් සැරසී පෙරහැරේ ගමන් කළ අතර අලි පිට නැඟි හමුදාවක් ගමන් කළෝය. පෙරහැරේ පළමු අංගය හා අවසාන අංගය වූයේ අලිපිට ගමන් ගත් හමුදාවෝය.

සියම් භික්ෂූන් රැගෙන ලංකා දූත පිරිස පෙරලා එන ගමනේ දී පෙරහැරක් සංවිධානය කර ඇත. පූජනීය වස්තුවක් මෙන්ම සංඝයාවහන්සේලා නිතැනින්ම වඩමවා ඇත්තේ පෙරහැරක් පෙරටුකොට ගෙනය. මෙහිදී ද භික්ෂූන් වහන්සේ වඩින මග දෙපස රන්කම් කළ වස්ත්‍ර, කොඩි වලින් මෙන්ම පහන් ආලෝකයෙන්, මල්පල ආදී නොයෙක් සැරසිලි වලින් අලංකාර කර තිබුණි. මග දෙපස පළමුව පසඟතුරු වාදන කණ්ඩායම ගමන් කළෝය. ඉන් අනතුරුව රන්සිවිගෙයක නැංවූ රාජයන්දේශය ගත් පිරිස, රන් පිළිමයක් රැගත් පිරිස අතර නැවත තූර්ය වාදන පිරිස ගමන් ගත් අතර ලංකාවට ගෙන යන සංදේශ, පඬුරු, තානාපතිවරුන්, මහරජ යුවරජු, ආදිය පෙරහැරේ ගමන් ගත්හ.

කෙසේ නමුත් පෙරහැර නැරඹීමට අලංකාර ලෙස සැරසුනු ගිහි හා පැවිදි පිරිස රැස්ව සිටියහ. ගඟ දෙපස ද ඉතා අලංකාර සත්ව රූප, මල්කම්, ලියකම්, ආදියෙන් සරසා තිබුණි. ශ්‍රී ලංකාවට පැමිණෙන භික්ෂූන් ඇතුළු දූත පිරිස මහවාසල් දොර සිට ගඟ දක්වා ගමන් කළේය. එහෙයින් මෙම දූත පිරිස නැවට නංවන තෙක්ම පෙරහැරේ ගමන් කර ඇත. පෙරහැරේ පැමිණි සේනාව ඔරුවලට නැගෙමින් නටමින්, වයමින් ගමන් කළෝය.[8]

ශ්‍රී ලංකාවේදී පැවැත් වූ මෙවැනිම කඨින පූජාවක් පිළිබඳව සටහනක් විල්බාගෙදර ඉදිරිපත් කරයි. සියමයේ පැවැත්වූ කඨින පූජෝත්සවය හා සමාන අංග ලක්ෂණ මෙන්ම එක හා සමාන සෞන්දර්යාත්මක චින්තාවන් මොනවට පැහැදිලි කරයි. මෙම උත්සවය නරඹන්නට පැමිණෙන ප්‍රේක්ෂකයාට හැකි පමණින් සැරසී පැමිණෙන ලෙස අණ කරයි. පෙරහැරේ ගමන් කරන පිරිස පමණක් නොව ප්‍රේක්ෂකයාද

මෙයට සහභාගි කරගන්නාක් මෙන් අදහසක් මෙයින් ජනිත කරයි. සෞන්දර්ය විද්‍යාවේ ප්‍රසංග කලාවේදී මෙවැනි අංග වැදගත් ස්ථානයක් ගනී. එහිදි ප්‍රේක්ෂාව ඉතා වැදගත් අංගයකි. මෙකී ලක්ෂණ හේතුවෙන් පෙරහැර සාමූහික කලාවක් වශයෙන් ගොඩනැගී ඇති ප්‍රපංචයක් බව පෙනේ. කඨින උත්සවය සඳහා පිළියෙල කළ සිවුරු දහසක් එක් දිනක් ඇතුළදී නිමකරමින් මෙම පිරිස රජතුමා කැටුව මහා පෙරහැරකින් සිවුරු පූජා කළේය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් සියළු භික්ෂූන් වහන්සේලාට පුදපූජා කිරීම පිණිස විශේෂ දළදා ප්‍රදර්ශනයක් පැවැත්වීය. මෙම ප්‍රදර්ශනය නැරඹීමටද අටදහසක් පමණ පිරිසක් පැමිණි බව සඳහන් වේ.[9] රජතුමා එදින නිල ඇඳුමින් සැරසී සිටියේය. කෙසේ නමුත් දළදා වහන්සේ වැඩමවූයේ පෙරහැරක සිරි ඉසිලූ හොරණෑ, බෙර, සංඛ ආදියෙන් යුක්ත තූර්ය ඝෝෂා මධ්‍යයේය. රිදී ඡත්‍ර දෙකක්, රිදී සේසත් දෙකක් හා වල්විදුනා  දෙකක් ධාතූන් වැඩමවන පෙරහැරේ ගෙන ගිය බව සඳහන් කරයි. පෙරහැර සඳහා භාවිත කළ කොඩි, ඡත්‍ර, කඩු මේ සියල්ල රනින් හෝ රිදීයෙන් නිමකරන්නට උත්සහ ගෙන ඇත.

මෙයින් ජනිත වන්නේ ධනවාදී පන්ති සමාජයක ලක්ෂණ මෙන්ම පෙරහැර සංස්කෘතිය වටා ගොඩනැගී ඇති සමෘද්ධිමත් සමාජයක්ය. මෙම සමාජයේ මිනිස් චින්තන ද පොහොසත්ය. මඳකට හෝ තම දුක වේදනාවන් සියල්ල අමතක කර දමා කලාකෘතියක් ලෙස රසවිඳින්නට හැකි ප්‍රපංචයක් වශයෙන් පෙරහැර නිරූපණය වී ඇත. ප්ලේටෝ පැවසූ ආකාරයට තම දේශීය සංස්කෘතිය විමර්ශනයෙන් සෞන්දර්ය චින්තනය ඔප්නැංවිය හැකිය යන ප්‍රකාශය පෙරහැර නැරඹීමෙන් මෙන්ම එයට දායකවීමෙන් මනාව ප්‍රත්‍යක්ෂ වේ. උක්ත සඳහන් කළ ආකාරයට ආසියාවේ රටවල් කිහිපයක තම දේශීය සංස්කෘතිය ඔප්නංවමින් සෞන්දර්යාත්මක වින්දනයක් මෙන්ම සෞන්දර්යාත්මක වටිනාකම විදහා දක්වමින් ඉදිරිපත් කෙරෙන දළදා පෙරහැර හා බෞද්ධ පෙරහැර එකී සමාජය ප්‍රතිමූර්තිමත් කරනු ලබන විශිෂ්ඨ කලාකෘතියක් බව නිරූපනය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. ෆාහියන් (Fa - Hisan) බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ ෆාහියන්ගේ දේශාටන වාර්තාව. (පරි.) විමල් ජී. බලගල්ලේ, බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ, 1999
2. එම පිටුව 39,
3. සුචරිත ගම්ලත්, සෞන්දර්ය විද්‍යා ඉතිහාසය, කොළඹ. ගොඩගේ 1997, පි. 44
4. ෆාහියන් බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ ෆාහියන්ගේ දේශානට වාර්තාව, (පරි.) විමල් ජී. බලගල්ලේ, බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ, 1999. පි. 76 (පාඨාන්තර හා ලුහුඬු සටහන් 195 බලන්න)
5. ජී. හේමපාල විජයවර්ධන, පී.බී. මීගස්කුඹුර, සියම් - ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා, 18 වන සියවස, කොළඹ. ප්‍රදීප ප්‍රකාශකයෝ, පිට 14, 15, 16
6. එම පිටුව 28
7. එම
8. එම පිටු 37, 38
9. එම පිටුව 77

# රාජකාරියේ සේවය හා සම්බන්ධව ශ්‍රී දළදා මන්දිරයේ කටයුතුවලින් බිඳක්

**වයි.කේ. තිස්ස බණ්ඩාර**
වැඩ බලන පුස්තකාලයාධිපති, බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය,
ආරාධිත කථිකාචාර්ය, රජරට විශ්වවිද්‍යාලය

රජයට කරන සේවය රාජකාරියයි. දළදා මන්දිරය, සතර දේවාල රජමහා විහාරය යන මේ ආයතනයන් වැඩවසම් ක්‍රමය අනුව රාජකාරියට යටත් කර තිබේ. මේ ස්ථානයන්හි ප්‍රධාන නිලධාරීන්ට ඇතුල් කට්ටලයේ නිලධාරියෝ යයිද සුළුසේවකයින්ට නිලකාරයෝ යයිද ව්‍යවහාර කරන ලදි. මේ දෙපක්ෂය විසින්ම රාජ මන්දිරය, දළදා මාළිගාව, සතර දේවාලය, රජමහා විහාර යන ආයතනයන්හි ඒ ඒ ආයතනයන් සතු දේපල භුක්ති විඳිමින් ඒ ඒ අයට නියමිත රාජකාරිය කළ යුතු වන්නේය. මේ සේවය රාජකාරිය නමින් හඳුන්වනු ලැබේ. ඒ ඒ නිලධාරීන් විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් කොටස්වලට නිල රාජකාරි පංගු යයි නම් කළහ. යට දක්වූ ආයතනයන්ගේ සේවය සංවිධානය කරන්නේ අගමැති හෙවත් අදිකාරම් විසින් තෝරා රජු විසින් පත් කරන ලද බස්නායකවරුන් විසිනි. (අභයසිංහ, පී.ඇම්.ජී. 1998, පි.63).

අභයසිංහ මහතාගේ උඩරට විත්ති ග්‍රන්ථයේ ඉහත කියමනට අමතරව මෙකී රාජකාරී නිලපංගු ක්‍රමය ඇතැම් පිටිසර බද දේවාල වෙනුවෙන් ද පැවතිණි. අලවතුගොඩ දේවාලය, හපුගොඩ පිටියේ දේවාලය, ඉන් දෙකක් පමණි. නිල පංගු ක්‍රමය බෙහෙවින්ම ක්‍රියාත්මකව ඇත්තේ ශ්‍රී දළදා මාළිගාව සම්බන්ධයෙනි. ඒ වෙනුවෙන් විවිධ පුද්ගලයින් වෙත විවිධ සේවාවන් කරණ කොට ගෙන දේපල, භුක්තිය සඳහා ලබාදී තිබේ. එකී දේපල වතු හා කුඹුරු යන දෙයාකාරයෙන්ම යුක්ත විය. ඇතැම් නිල පංගු, සේවය අවසන් වීමත් සමඟ අවසන්ව ඇත. ඇතැම් ඒවා දිගින් දිගටම පාරම්පරික උරුමක්කාරයන් විසින් විඳිනු ලැබ ඇත. විවිධ ගම්වල පිහිටා ඇති එකී පංගුවල ප්‍රමාණ සහ ස්වභාවයත් ඒවා ලත් අය සහ ඒ වෙනුවෙන්

උරුමකම් ලබන්නෝද සඳහන් කරමින් සන්නස් හෝ තුඩපත් ප්‍රදානය කෙරෙන්නට ඇත. කුමන ආකාරයකින් හෝ පොදු සම්මතයේ ව්‍යවහාරව සහ පවත්වා ගෙන එනු ලැබූ එකී පංගු ක්‍රමයට අයත් පංගුවත්, ලැබූ අයත්, රාජකාරියේ අන්දමත් පසුව ලේඛනගත කෙරිණි.

මෙම කෙටි ලිපියේ අරමුණ වන්නේ දළදා වහන්සේ වෙනුවෙන් ඉටු කළ රාජකාරි චාරිත්‍ර රටාව තුළ ශ්‍රම විභජනය හා විශේෂ ප්‍රාගුණ්‍යය බැඳී සිටි ආකාරය සාකච්ඡා කිරීමයි. එමෙන්ම වැඩවසම් සමාජ ක්‍රමයක පුද්ගලයා භූමිය හා සම්බන්ධ කර ගනිමින් සරල වගකීම් භාරයක් වාර්ෂිකව ඉටු කිරීමටත් ඒ මඟින් ඔහුගේ සමාජ වගකීම ප්‍රකාශ කිරීමත් මෙම උදාහරණවලින් පෙනේ.

1872 වර්ෂයේදී ලේඛනගත කරනු ලැබ ඇති දූනට මහනුවර රාජ්‍ය ලේඛනාගාර දෙපාර්තමේන්තුව සතු SERVICE TENURES REGISTER KANDY 1872- ලේඛනයේ වෙළුම් දෙකක මෙම විස්තර සඳහන්ය. ඉන් ශ්‍රී දළදා මාළිගයේ රජකාරී පංගු ක්‍රමය වෙනුවෙන් එකී ලේඛනාගාරයේ අවසරය පරිදි ලබාගත් තොරතුරු අනුව සුළු ප්‍රමාණයක් මෙහි සඳහන් කරමු.

| | | |
|---|---|---|
| පංගුව | : | අගුරු දෙන පංගුව |
| ගම | : | වටගොඩ |
| ලැබූ අය | : | අපුල්ලන්නලාගේ ටිකිරි කොල්ල එම, කිරි පුංච, එම, මැනික එම, ආදිකි එම උක්කුවා |
| ඉඩම් | : | පරකනුවෙලදෙනියේ කුඹුර, එම වත්ත |
| රාජකාරියේ අන්දම | : | පංගුවේ කොට්ඨාස එතිනෙකින් අඟුර කදක්ද යහකට නොවැඩිව මාලිගාවේ වැඩට දීමද සෑම අලුත් අවුරුද්ද දාම දිව (දියවඩන) නිලමේට එලවළු කත් හතරකුත් බුලත් හතලිහකුත් දී පෙනී සිටීමය. (මේ ලේඛනයේ දියවඩන නිලමේ යන තැන දිව නිලමේ යන්න බොහෝ තැනක යොදා තිබේ.) |

| | | |
|---|---|---|
| පංගුව | : | ආවතේව සිදු කරන පංගුව |
| ගම | : | උල්ලඳුපිටිය |
| ලැබූ අය | : | උඹරාපොලගෙදර අප්පුහාමි. එම, ඩිංගිරි අම්මා. එම, ටිකිරි මැනිකා |
| ඉඩම් | : | නුගඅන්ගේ ගොඩ කුඹුර, හිටිනා වත්ත |
| රාජකාරියේ අන්දම | : | මාලිගාවේ ආවතේව කරන භාජන මැදීම ද අවුරුද්දකට වරක් රිදී මුදු දෙකක් ද දී දිව නිලමෙට පෙනී සිටීමද, මාලිගාවේත් දිව නිලමේගේත් වැඩ කෑම ලැබ අවුරුද්දකට දවස් පහළොවක් කිරීමය. |

| | | |
|---|---|---|
| පංගුව | : | කාරියකරවනමුරේ පංගුව |
| ගම | : | නියංගොඩ |
| ලැබූ අය | : | හේරත් මුදියන්සේලාගේ අප්පුහාමිගේ බූදලේ උරුමක්කාරයෝ, කුලතුංග මුදියන්සේලාගේ උක්කුරාලගේ බූදලේ උරුමක්කාරයෝ |
| ඉඩම් | : | කන්දේ කුඹුර |
| රාජකාරියේ අන්දම | : | කාරිය කරන මුරය කිරීමද අවුරුද්දකට වරක් දිව නිලමෙට කැවිලි පෙට්ටියක්දී පෙනී සිටීමද, සතර මංගල්‍යයටත් පෙරහැරටත් පැමිණ වැඩ රාජකාරි කිරීමද කාරියකරවන මුරේට පත්වෙන විට දිව නිලමෙට පවුං තිහක බුලත් හුරුල්ලක් දීමද ය. |

| | | |
|---|---|---|
| පංගුව | : | දුර පංගුව |
| ගම | : | වල්ගම, අලදෙණිය, හැදෙණිය, විගුම්පොල |
| ලැබූ අය | : | ගලපිටගෙදර පුලිඟුවා. එම, ගිරංගි. එම, ගරූ. එම, දන්ත. එගොඩගෙදර පොන්නම්මා. නාගහදෙණියේ අබ්දුල් රහිමාන් ලෙබ්බේ. මෙරිඤ්ඤගේ ජානිස් අප්පු (සහ තවත් බොහෝ අය වෙති) |

ඉඩම් : කුඹුරු, වතු, හේන් (ප්‍රමාණවලින් බොහෝය. විස්තර සඳහා එකී ලේඛනයේ පිට 636 සිට බලන්න)

රාජකාරියේ අන්දම : හේමකත් දෙකකට අයිති සෑම දෙය නම් හෝ එලවළු ජාති විස්සකුත් ඉදිච්ච කෙසෙල් කැන් තුනකුත් තෙල් හුණ්ඩුවක් නොහොත් ඒ වෙනුවට එක කදකට පැන්ෂ තුනකුත් බැගින් දීමද, මංගල්‍යයේ සතර එකිනෙකට හකුරු පෙට්ටියකුත් ඉදිච්ච කෙසෙල් කැන් තුනකුත් බැඳි කදක් බැගින් දීමද, සතර මංගල්‍යටත් පෙරහැරේ දවස් පහකටත් වෙසක් පූජා දෙකකටත් මාලිගාවට පැමිණ තනියම කරන්ට යෙදෙන වැඩ රාජකාරි කිරීමද, දූව දඬු කප්පවා ඇද්දවීම සහ ඒවා මාලිගාවේ වැඩට සැහැලා දීමද බංඩාර අටුව පිදුරු වැහීමටත් අලුත්වැඩියාවල් වල වැඩටත් උදව් වීමද, දිව නිලමේ වෙනයම් මාලිගාවේ පයිංඩකාරයෝ ගමට පැමිණි විටක පැහැදුම් දීමද මුත්තෙට්ටුවේ කොල පැගීමේ වැඩට මී ගොන් බානක් දීමද අලුත් අවුරුදු මංගල්‍යයට එළවළු පස් වර්ගයක් සහ කෙසෙල් කැනක් බැඳි කදකුත් අලුත් බුලත් හතලිහකුත්දී දිව නිලමෙට පෙනී සිටීමද, අවුරුද්දකට දවස් දෙකකට නොවැඩිව විදානේගේ වැඩ කිරීමද, මාළිගාවේ සැරසිලිවලට අවුරුද්දකට දෙවරක් කැනුත් සමඟ කෙසෙල් ගස් දෙකකුත් කුරුම්බා ගෙඩි හතරකුත් බැගින් දීමද (මේ දුර පංගුවේ ස්වභාවය හා ලැබූ අයද, ඉඩම්වල ප්‍රමාණද, කළයුතු වැඩ වල අන්දමද විවිධ වේ)

පංගුව : නවන් පංගුව

ගම : බටුගොඩ

ලැබූ අය : අලකොලඅංගේ ටිකිරි නයිදේ, එම මැනිකා
ඉඩම් : අලකොලදෙණියේ කුඹුර හා එම වත්ත
රාජකාරියේ අන්දම : අලුත් අවුරුදු මංගල්‍යයට ප්‍රථම හොඳ අලුත් හිරමනේකුත් මාලිගාවට දීමද මාලිගාවේ ආවුධ හරිගස්සීමත්ය. යකඩ වැඩත් අවුරුද්දකට දෙමාසයකට නොවැඩි කිරීමත්ය. ඒ වැඩ කරන විට හොඳට බත් මාළුත් වේලක් බැගින් ලැබීමද, අලුත් අවුරුදු මංගල්‍යයට පසු දිව නිලමේට ගිරයකුත් බුලත් හතළිහකුත් පංගුවෙන් දීමද පයිංඩේ කරන කාරියකරනරාළටත් එමාකාර පෙනුමක් දීමත්ය.

පංගුව : පැනිදෙන පංගුව
ගම : බටගල්ල
ලැබූ අය : දොඩංතැන්නේ පුසුඹා. එම, නන්දුවා. එම, කිරියා. එම, කිරිඋන්නා. අම්බලන්තැන්නේගෙදර කිරා
ඉඩම් : දොඩංතැන්නේවත්ත
රාජකාරියේ අන්දම : මාසයකට වරක් කිතුල් පැනි බෝතල් දෙක බැගින් මාළිගාවට ගෙන ගොස් දීමද, අලුත් අවුරුද්දේ මංගල්‍යයට පසු දා කඩිනමින් එලවලු කත් දෙකක්ද අතකට බුලත් හතලිහක් වූ බුලත් අත් දෙකක් දිව නිලමෙට දීමය.

පංගුව : පිදිවිලි පංගුව
ගම : වල්ගම, අලදෙනිය, හැදෙනිය
ලැබූ අය : පට්ටඩිගෙදර බාවා ශෛබු. සට්ටම්බි ලෙබ්බිගේ ටිකිරි තම්බි. එගොඩ ගෙදර සදුක්කු ලෙබ්බෙගේ බූදල්කාරයො (සහ තවත් අය).
රාජකාරියේ අන්දම : අවුරුදදකට වරක් මාලිගාවේ මලුවේ අතුරන්ඩ සෑහෙන තරම් වැලි මාවිලි ගඟෙන් මාලිගාවට ඇද

එහි පහසු ආකාර ගොඩ කිරීමද, නියම කල විටක තුන් මාසයකට වරක් බැගින් මාලිගාවේ පඬුරු මිල ගණන් කිරීමට විශ්වාස කළ හැකි හොඳ මිනිස්සු පස් දෙනෙක් දීමද, අවුරුද්දකට වරක් දස දවසක් වී ඇදීමට ගොන් තිස් දෙනෙක් නොහොත් හතලිස් දෙනෙකුගේ තවලමක් දීමද දිව නිලමේටත් කාරියකරන රාළටත් අවුරුද්දකට වරක් පෙනුම් වට්ටියක් බැගින් දී පෙනී සිටීම ද, මාලිගාව අලුත්වැඩියා කරන විට වැලි කරත්ත පහක් දීමය.

| | | |
|---|---|---|
| පංගුව | : | බඩල් පංගුව |
| ගම | : | ඇඹුල්පුරේ |
| ලැබූ අය | : | විජේන්ද්‍ර ගෙදර පුංචි නයිදා |
| ඉඩම් | : | කන්දේපල්ලේ කුඹුර, එම වත්ත |
| රාජකාරියේ අන්දම | : | මාලිගාවට පැමිණ එහි රන් රිදී බඩුත් ආයුධත් අවුරුද්දකට දවස් හයකට නොවැඩිව මැදීමද, අලුත් මංගල්‍යයට පසුව පෙනුම් පිණිස ගිරා කැත්තකුත් හොඳ මුදු දෙකක් ද දිව නිලමේට දීමද, මාලිගාවේ වැඩ රාජකාරි කරන විට උදයට කැඳත් දවාලට බත් මාලුත් සවසට හාල් හුණ්ඩුවකුත් ලැබීමත්ය. |

| | | |
|---|---|---|
| පංගුව | : | මිනුම් පංගුව |
| ගම | : | විගුම්පොල. වල්ගම, අලදෙණිය |
| ලැබූ අය | : | මනන්නලැගෙදර කිරිසොදා. එම, මැනිකි. නයිදෙ බඩතුරු කලු අප්පු, කිරිහටනා, කිරිහොදා, පිනා (සහ තවත් බොහෝ අය එකී ලේඛනයේ 629 පිටුව සිට දක්වේ) |
| රාජකාරියේ අන්දම | : | මුත්තෙට්ටු කුඹුරු වල අසවනු කමතෙදීත් අටුවේදීත් මැනීම ද, නිල පංගුවලට කෙටීමට දෙන විට |

මාසෙකට තුනමුනක් බැගින් මැනීමද, ඒ හාල් මාලිගාවට ගෙනත් බාරදීමට පණිවිඩ කීමද, මංගල්‍යයේදීත් පෙරහැර දවසේත් වෙසක් පූජා දෙකකදීත් මාලිගාවට පැමිණ නියම කරන්ඩ යෙදෙන වැඩ රාජකාරි කිරීමද අලුත් අවුරුදු මංගල්‍යයට දිව නිලමේට බුලත් හතලිහකුත් එලවළු කෙරවලකුත් දී පෙනී සිටීමද, සතර මංගල්‍යයකටත් කෙරවලක් බැගින් දිව නිලමේට දීමද, දුරයා ලෙඩින් සිටින විට පයිංඩකාරකමේ වැඩ රාජකාරි කිරීමද (මිනුම් පංගුව සඳහා පිරිස බොහෝ වෙති)

| | | |
|---|---|---|
| පංගුව | : | මුර පංගුව |
| ගම | : | වටගොඩ |
| ලැබූ අය | : | ගලපිට ගෙදර මැනිකා |
| ඉඩම් | : | අස්වැද්දුම් කුඹුර |
| රාජකාරියේ අන්දම | : | එක මුරයකට දවස් පහලොව බැගින් මුර දෙකක් වෙසක් මාසයේදී කිරීමද මුරය කරන විට උදේ තේවාවට ප්‍රථමත් පසුවත් උදෑසනත් මාලිගාවේ මිදුල පිහදැමීමද මහ දානේ තේවාවට පසුව පරවූ මල් ඇදීමද, පහන් පිසදමා පත්තු කිරීමට සුදානම් කිරීමද, ගල් ඔරුවේ වතුර පිරවීමද, දිව නිලමේ විසින් නියම කරන්ට යෙදෙන තමුන්ගේ ජාතියට විරුද්ධ නොවෙන්නටත්, ඌලියම් වැඩ කිරීමටද, පණිවිඩ වල සැමද, මුරේ සිටින විට දවාලට හොඳට බත් මාලු දෙවේලකුත් සවසට හාලුත් ගමන් යන විට හොඳට බත් මාලු තුන් වේලකුත් ලැබීමද, මුර කරන විට රෑ දවල් දෙකේම සිටීමද, දිව නිලමෙට අලුත් අවුරුද්දේ පෙනුමට එලවළු කදකුත් බුලත් හතලිහකුත් දීමය. වැඩ රාජකාරී වෙනුට |

අවුරුද්දකට සිලිං හතරක් ගෙවනවාය (මාලිගාවට මුර පංගු යටතේ ගම් කිහිපයකින්ම සේවා සැපයේ. මාරතුගොඩ, දොලපිහිල්ල ගම් ඒ අතර වේ.)

| | | |
|---|---|---|
| පංගුව | : | නිල පංගුව |

දළදා මාළිගයට නිල පංගු බොහෝ ඇත. ලැබූ අයද ඒ ඒ නිල පංගුද විවිධය. එමෙන්ම එකී එකී සේවයන් සඳහා ගම් කිපයක්ම නියෝජනය වන අතර ඒ වෙනුවෙන් දෙනු ලැබ ඇති දේපල ප්‍රමාණද විවිධය. නිල පංගු ලබා ඇති ගම් අතරින් විගුම්පොල, වල්ගම හා අලදෙණිය නිදසුන්ය. මේ විස්තර වැඩි වශයෙන් බැලීම සඳහා අදාල ලේඛන පරීක්ෂා කරනු මැනවි.

| | | |
|---|---|---|
| පංගුව | : | රදා පංගුව |
| ගම | : | පලිපාන |
| ලැබූ අය | : | වරකාදෙණියේ පුසුඹා |
| ඉඩම් | : | දළදාගේ කුඹුර |
| රාජකාරියේ අන්දම | : | දිව නිලමෙටත් මාලිගාවේ කාරියකරනරාලටත් සිංහල අලුත් අවුරුදු මංගල්‍යය පසු වූ කඩිනමින් එකිනෙක තැනැත්තාට තොප්පියක් බැගින් දීමද පෙරහැරට පැනිදොඩමක් පමණ මහත අත් පන්දම් උන්ඩි පනහක් දීම ද ය. |

| | | |
|---|---|---|
| පංගුව | : | ලුනු දෙන පංගුව |
| ගම | : | කහවත්ත |
| ලැබූ අය | : | මහම්මදු ලෙබ්බේ, උෟමලෙබ්බේ |
| ඉඩම් | : | උඩදාහත්තේ කුඹුර, උඩඅන්ගේ කුඹුර |

රාජකාරියේ අන්දම : සිංහල අලුත් අවුරුද්දට ප්‍රථම කුඹුරු බිම් පැලකට ලුනු සේරු දහයක් බැගින් හොඳ පිරිසිදු ලුනු සේරු විස්සක් දීම ද, පංගුවෙන් පෙනුම් පිණිස කරවලයකුත් බුලත් හතලිහකුත් දීම ද ය.

පංගුව : ලේකම් මුරේ පංගුව

ගම : අලදෙණිය

ලැබූ අය : වාසල හේරත් මුදියන්සේලෑ අප්පුහාමි කෝරාලගේ බූදලේ උරුමක්කාරයෝ

ඉඩම් : බෝගහකුඹුර, ගල්මුනේ කුඹුර, උඟරකොට අංග, වෑකඩේ කුඹුර, බෝගහකුඹුර වත්ත (සහ තවත්)

රාජකාරියේ අන්දම : අවුරුද්දක් අවුරුද්දක් බැගින් මාලිගාවේ ලේකම් ධුරය කරමින් ලේකම් මිටි බාර ගැනීම ද, මංගල්‍ය සතරටත් සතර පෙරහැර දවසකටත් වෙසක් පූජා දෙකකටත් මාලිගාවට අවුරුදු පතා පැමිණ රාජකාරි කිරීම ද අලුත් අවුරුදු මංගල්‍යයට කැවිලි පෙට්ටිටකුත් බුලත් හතලිහකුත් දීම නිලමේට අවුරුදු පතා දී පෙනී සිටීම ද, දිව නිලමේට ගමට පැමිණි විටෙක අඩුක්කු දීම ද ය. (මෙම රාජකාරියට ඉඩම් ලැබූ අය බොහෝ වෙති. අදාළ ලේඛණයේ පිටු අංක 681 සිට බලන්න.)

පංගුව : වට්ටෝරු පංගුව

ගම : කොණ්ඩදෙණිය

ලැබූ අය : කුඹුරේගෙදර අප්පුහාමි

ඉඩම් : කරාලියද්දේඅන්ගේ කුඹුර, ගජනැකේඅන්ගේ කුඹුර

රාජකාරි අන්දම : මංගල්‍යය සතරේදීත් පෙරහැර දවසටදීත් පෙරහැරේ යෑම ද අලුත් අවුරුදු මංගල්‍යය දා කඩිනමින් කැවිලි පෙට්ටියක් සහ බුලත් හතලිහක

පෙනුමක් දිව නිලමේට දීම ද ය. දියවඩන නිලමේ විසින් පංගුකාරයා වට්ටෝරු රාළකමේ පයිංඩ තෝරාගනු ලැබීමට සුදුස්සෙකි.

| | | |
|---|---|---|
| පංගුව | : | සුදු හකුරු දෙන පංගුව |
| ගම | : | යටිහලගල |
| ලැබූ අය | : | ලබුකොලතැන්නේ උක්කුවා. එම, කලුවා. එම. සුන්දරා |
| රාජකාරියේ අන්දම | : | අවුරුද්දකට සුදු හකුරු කැට දෙසීයක් බැගින් මාලිගාවට දීම ද අලුත් අවුරුද්දේ මංගල්‍යයට පසු දා කඩිනමින් දිව නිලමේට පෙනුම් පිණිස සුදු හකුරු කැට පනහක් බුලත් හතලිහකුත් දීම ද ය. |

| | | |
|---|---|---|
| පංගුව | : | හක්ගෙඩි පංගුව |
| ගම | : | යටිවාවල |
| ලැබූ අය | : | මඩමේ ගෙදර සිරිමල්හාමි. එම, පුංචිහාමි |
| ඉඩම | : | හපුකොටේ කුඹුර, කහටලහවත්ත, මුදුනේ වත්ත |
| රාජකාරියේ අන්දම | : | මංගල්‍යය සතරේදීත් පෙරහැර දවස් දහයේදීත් මාලිගාවට මිනිසෙක් පැමිණ මාලිගාවේ හක්ගෙඩි පිඹීමය. |

| | | |
|---|---|---|
| පංගුව | : | හිත්තර පංගුව |
| ගම | : | උල්ලදුපිටිය |
| ලැබූ අය | : | වත්තේගෙදරලාගේ පුසුඹා, ගලේවත්තේ පුංචි නයිදා |
| ඉඩම් | : | කින්නරපොළ කුඹුර, පැල් 1. හීන්තැන්නවත්ත ගලේවත්තේගෙදර වත්ත |
| රාජකාරියේ අන්දම | : | අවුරුදු දහයක් ඇතුළත අවුරුද්දක් මාළිගාවේ සිත්තර සහ සැරසිලි වැඩ කිරීම ද, ඒ වැඩ රාජකාරි |

කරන විට මාළිගාව විසින් ඔහුට ඉඳුම් හිටුම් කෑම සහ ඇඳුම් පැලඳුම්ද වැඩට උවමනා සෑම සායම් ජාති දීම ද ය.

| | | |
|---|---|---|
| පංගුව | : | හේවිසි පංගුව |
| ගම | : | දිප්පිටිය |
| ලැබූ අය | : | ශෙල්මා ලෙබ්බේ, ඉසුබුලෙබ්බේ. ඉස්මායිල් ලෙබ්බේ, මීතරාමන් ඔමරුපුල්ලේ පනික්කලැගෙදර උන්ගු |
| ඉඩම් | : | උඩදෙණියේ කුඹුර, වැවේ වත්ත, උග්ගලේහේන, උඩදෙණිය කුඹුර, ගලගාව වත්ත, ඉදිරිගොඩ වත්ත, ගල්බැම්මේ කුඹුර හා එම වත්ත, පිල්ලෑව වත්ත, ඇටි කෙසෙල් අංගේ කුඹුර, පිහිල්ල ගාව වත්ත, ගල්කොටුවේ වත්ත, දෙල්ගහමුල්ල වත්ත, පොකොටුවේ වත්ත |
| රාජකාරියේ අන්දම | : | රාජකාරිය වෙනුවට මරක්කල පංගුකාරයන් විසින් කුඹුරු බිම්පෑලක සිලිං හතර බැගින් දෙනවාය. මුදල් නොදෙන නොම්මර දෙකේ කොට්ඨාශය විසින් කරන රාජකාරි නම් මංගල්‍යය සතර දවස් වල මාළිගාවට පැමිණ එතන සිට ගුරුදෙණියට යන පෙරහැරේ හේවිසි ගැසීමද, එලෙසම වෙසක් පුජා මංගල්‍යය දවසේ මාලිගාවේ සිට අදාහන මලුවට යන පෙහැරේ හේවිසි ගැසීමද අලුත් අවුරුදු මංගල්‍යය දාට පසු දිව නිලමේට පෙනුම් පිණිස එලවලු කදකුත් බුලත් හතලිහකුත් දීම ය. (මෙහි මුදල් නො ගෙවන නොම්මර දෙකේ කොට්ඨාසය යනු, ඉහත වූ පනික්කියලැගෙදර උන්ගු යන අයයි). |

ඉහත දක්වන ලද රාජකාරි පංගු වෙනුවෙන් අදාළ ස්ථානයෙන් එකී ලැබීම් ලද සේවාකරුවන් වෙත මුදල් ප්‍රමාණ ද නිකුත් කොට තිබේ. එම මුදල් රුපියල්, පැංස, සිලිං, පවුං යන ඒකක වලින් සටහන්ව තිබේ. සෑම සේවයකම මිල අගයන් වාර්ෂිකව ගෙවනු ලැබ තිබේ.

නිදසුන්:

| | | |
|---|---|---|
| මුර පංගුව | : | වටගොඩ - සිලිං 04 යි. |
| නවපංගුව | : | බටුගොඩ - රුපියල් 17.65 යි. |
| හිත්තර පංගුව | : | උල්ලඳුපිටිය - රුපියල් 14.70 යි වශයෙනි. |

ඉහත සඳහන් කෙටි සාකච්ඡාවෙන් පැහැදිලි වන්නේ සෙංකඩගලපුර රාජධානියේ රජු වෙනුවෙන් ඉටුකළ යුතු රාජකාරි කටයුතු දළදා වහන්සේ වෙනුවෙන් ඉටු කිරීමටද එසේ ඉටු කිරීමෙන් රාජ්‍ය පක්ෂපාතීභාවය මෙන්ම දළදා වහන්සේට ඉටු කරන ගෞරවණීය සේවය වෙනුවෙන් අභිමානවත් පුරවැසියෙකු ලෙස පුද්ගලයාගේ වගකීම ඉටු කිරීමෙන් ලබන වින්දනය කර ගැනීමයි.

තවද විස්තර සඳහා බලන්න.

1. SERVICE TENURES REGISTER KANDY - 1872
2. A GAZETTEER OF THE CENTRAL PROVINCE OF CEYLON A.C. LAWRIE. 1896, COLOMBO.

විශේෂ ස්තුති, රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සහ මහනුවර ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සුචිගත කිරීමේ සෞම්‍යා සෙනරත් මිය ඇතුළු කාර්ය මණ්ඩලයට.

# දළදා පෙරහැර ග්‍රන්ථ නාමාවලිය

**දයා රත්නායක**
සභාපතිනිය - මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලය
මහනුවර.

1. අදිකාරම්, ඊ. ඩබ්ලිව්

පූජා විධි හටගැනීම, පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය හෙවත් පාලි අට්ඨකථාවලින් අනාවරණය වන ලංකාවේ බුදු සමයේ තත්වය, කොළඹ,
පී.කේ.ජී. ජයවර්ධන සහ සමාගම, 1963.9 පරි., පි. 308 - 309

2. අරුක්ගොඩ, මු.

සියවසකට පෙර දළදා පෙරහැර, <u>නවයුගය</u>, 9 (2) 1964.8.12: 10 - 11, චිත්‍ර × 1863 වසරේ පැවැත්වූ දළදා පෙරහැර පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

3. අරුණතිලක, අහුන්ගල්ලේ

ගැහැනිය ඇතුළු ගැබින් දොරට එන ඇසළ සැණකෙළිය. <u>දිනදින</u> 1954.8.10 : 25 - 27, චිත්‍ර

4. ආනන්ද හිමි, පන්නිල

දළදා ඉතිහාසය, පොළොන්නරුව, ඩබ්ලිව්.ඒ. දිසානායක, 1967. පි. 72

5. ආරියපාල, ඇම්.බී.

<u>මධ්‍යකාලීන ලංකා සමාජය</u> : 13 වැනි ශතවර්ෂයට අයත් සද්ධර්ම රත්නාවලියෙහි හා වෙනත් සාහිත්‍ය කෘතිවල නිරූපණය වන ලංකා සමාජයේ තත්ත්වය, කොළඹ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1962. 236 වැනි පිටුවේ දෙවන ඡේදයේ සිට

239 වැනි පිටුව දක්වා

ඇහැළ මහේ පෙරහැර පවත්වමු. ශ්‍රී ලංකා 5(8) 1953 ජූලි : 3

කරුණාරත්න, දසනායක
එදා උඩරට පෙරහැර, කැස්බෑව, ඇස්. ගොඩගේ, 2005 පි. 72 - 73

8. කුමාරපේලි, කරුණාරත්න
ඉංග්‍රීසින් පැවැත්වූ ප්‍රථම දළදා පෙරහැර, නවයුගය. 14(1) 1969.7.26: 18 - 21 චිත්‍ර

9. කුමාරස්වාමි, ආනන්ද කේ.
අටළොස්වැනි සියවසේ උඩරට සිංහල සමාජයේ අර්ථ සංවිධාන : වාර්ෂික මංගල්‍ය සතර : පෙරහැර. මධ්‍යකාලීන සිංහල කලා : මධ්‍යකාලීන කලා හා ශිල්ප ප්‍රධාන වශයෙන් අටළොස්වැනි සියවසේ පැවති ආකාරය පිළිබඳ නිබන්ධයකි. සමාජ සංස්ථාව හා ශිල්පීන්ගේ තත්ත්වය සම්බන්ධ විස්තරයක්ද ඇතුළත් වේ. පරි. එච්.ඇම්. සෝමරත්න. කොළඹ සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1962.2.2 පරි., පිටු. 37 -39

× 18 වැනි සියවසේ මහනුවර පෙරහැරෙහි ගමන් පිළිවෙල පිළිබඳ විස්තර අඩංගු ඉතා වැදගත් ඓතිහාසික තොරතුරු ඇතුළත්ය.

10. කේව්, හෙන්රි ඩබ්ලිව්
ලංකාවේ නටබුන් නගර, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව, 1956. 4 පරි., පි. 72

11. චන්ද්‍රජොති හිමි, මාපොටේ
ස්කන්ධ හා මහනුවර පෙරහැර, ලාංකික දෙවිවරු, මාපොටේ චන්ද්‍රජෝති සහ ගොඩගම විපුලසාර හිමිවරු විසිනි.

ඇහැලියගොඩ, ගුණතිලක මුද්‍රණාලය, 1954 පි. 110.

12. ජයවර්ධන, එස්.කේ.

මහනුවර ඇසළ පෙරහැර විකාශය, <u>පැරණි ලංකාවේ ආගම් හා පුද පූජා,</u> කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1967. 27 පරි., පි. 154 - 162.

13. ජයසේකර, විනීතා ග්‍රෙස්

සිංහල රජ දරුවන් දළදා වහන්සේට දැක්වූ පූජෝපහාර, <u>නවයුගය</u>. 9(1) 1964.7.26 : 6 - 9

14. ඥාණවිමල හිමි, කිරිඇල්ලේ

දළදා පෙරහැර. <u>සපරගමුවේ පැරණි ලියවිලි</u>. කොළඹ ලෝකෝ මුද්‍රණාලය, 1964. පි. 37 - 39

× සීතාවක පළවැනි රාජසිංහ රාජසිංහ රජු සමයේ දෙල්ගමුවේ පැවති දළදා පෙරහැර පිළිබඳ විස්තරයකි.

15. ----

දෙල්ගමුවේ දළදා මැඳුර හා දළදා වැඩහිටි කුරහන්ගල, <u>සපරගමුවේ දර්ශන</u>, රත්නපුර ශාස්ත්‍රෝදය 1967. පි. 111

----

සීතාවක රාජසිංහගේ දළදා පෙරහැර. <u>සපරගමු දර්ශන</u>, රත්නපුර ශාස්ත්‍රෝදය, 1967. පි. 112

---

දෙල්ගමු විහාරය ඇතිවීම හා නැතිවීම, <u>සපරගමු දර්ශන</u>, රත්නපුර ශාස්ත්‍රෝදය, 1967. පි. 114

16. ඩේවි ජෝන්

ඩේවි දුටු ලංකාව. <u>පරි</u>. එච්.ඇම්. සෝමරත්න, <u>සංස්.</u> තෙන්නකෝන්

විමලානන්ද. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1967. 85 පිටුවේ අවසාන ඡේදයේ සිට 88 පිටුවේ හතරවැනි ඡේදය දක්වා.

× ජෝන් ඩේවි විසින් එක් රැස්කරගත් කරුණු අනුව දේවාල පෙරහැර සහ මහනුවර දළදා මාළිගාවේ පෙරහැර පිළිබඳ විස්තර කිරීමට උත්සාහ කර ඇත. මෙම කෘතියේ දළදා පෙරහැර හඳුන්වා ඇත්තේ "බුද්ධ ධාතු පෙරහැර" යනුවෙනි.

17. තෙන්නකෝන්, ටිකිරිබණ්ඩා
ශ්‍රී ගෞතම වාම දළදා වන්දනාව, මහනුවර, හොඳහිත මුද්‍රණාලය, (1965). පි.8

18. දළදා පූජාවලිය
දළදා පූජාවලිය, සම්පා. කනදුල්ලේ රතනරංශි හිමි. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1954, පි. xxii, (2), 167.

19. දළදා පෙරහැර පේළිගස්වන අන්දම, <u>මහනුවර ශ්‍රී පුෂ්පදාන ස්වර්ණ ජයන්ති සංග්‍රහය, බු.ව. 2452 - 2502,</u> මහනුවර පුෂ්පදාන සමාගම, පි. 53 - 27

× ගම්පල බෝවල පොත්ගුල් විහාරයට අයත් පුස්කොළ පිටපතෙන් පිටපත් කරන ලද්දකි.

20. දළදා මහිම
දළදා සිරිත හා ඇසළ පෙරහැර, රත්මලාන : සර්වෝදය, 1995. පි. 39 - 43

21. දළදා සිරිත
දළදා සිරිත, <u>සම්පා.</u> වැලිවිටියේ සෝරත හිමි, 2 වැනි <u>සංස්.</u>

කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1970
පි. xviii, 144

22. ද ලැනරෝල්, වී.ඩී.
දළදා විත්ති, <u>ලංකා පුරාවෘත්ත</u>, කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1960.13 පරි., පි. 61 - 64

× දළදා සම්බන්ධයෙන් පැවැත්විය යුතු ව්‍යවස්ථා පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇතුළත් වේ.

----

දළදා පෙරහැර, <u>ලංකා පුරාවෘත්ත</u>, කොළඹ, ඇම්.ඩී. ගුණසේන 1960.14 පරි., 65 - 69

× ඉංග්‍රීසින් විසින් පවත්වන ලද පළමුවන පෙරහැර පිළිබඳව එකල විසූ ගත්කරුවෙකු විසින් රචිත වාර්තාවක් අඩංගු වේ. එකල පෙරහැර සහ වර්තමාන පෙරහැර සන්සන්දනය කිරීමට ප්‍රයෝජනවත් වේ.

----

1828 පෙරහැර, ලංකා පුරාවෘත්ත, කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1960, පරි., පි. 70 - 75

----

පෙරහැර විසිතුරු, <u>ලංකා පුරාවෘත්ත</u>, කොළඹ. ඇම්.ඩී. ගුණසේන, 1960. 18 පරි., පි. 87 - 91.

× 1828 අග්‍රාණ්ඩුකාර සර් රොබට් බ්‍රවුන්රිග්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද පෙරහැර පිළිබඳ විසිතර සඳහන් වූ පුරාණ ගත්කතුවරයෙකුගේ වාර්තාව පොතක් වශයෙන් 1888 දී

ඇම්.ඩී. සිල්වා නැමති කෙනෙකු විසින් මුද්‍රණය කරන ලද අතර, එම පොතට ඇතුළත් කර ඇති පුරාණ රජකාලේ කළ දළදා පෙරහැර විස්තරයක් මේ ලිපියෙහි අඩංගු වේ.

----

රජකාලේ පෙරහැර. ලංකා පුරාවෘත්ත, කොළඹ, ඇම්.ඩී. ගුණසේන,

1960. 19 පරි., පි. 92 - 95

× "දළදා පෙරහැර අලංකාරය" නම් පොතෙහි ඇතුළත් පෙරහැර විස්තරය පිළිබඳව සඳහන් කර ඇත.

23. දිසානායක, ජේ.බී.

සිරි දළදා මාළිගාව. සෙංකඩගල නුවර - ඇසළට කරන පෙරහර. කොළඹ : ගොඩගේ, 2000 පි. 54 - 55

24. ධම්මසිරි හිමි, දොඩම්ගොඩ

අනුරාධපුර යුගයේ උත්සව. අනුරපුර ලිපි. බොරලැස්ගමුව ගාමිණී ප්‍රකාශකයෝ, (1965). 6 පරි., පි. 102 - 103

25. ධම්මක්ඛන්ධ හිමි, මඩිහේ සිරිසුමිත්ත

දළදා පුද. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1964. පි. (×) 107.

× කපුගම සුමනවංශ හිමි විසින් සපයා ඇති පි. 1 - 68 දක්වා ඇති ලිපියෙහි දළදා පිළිබඳව වැදගත් ඓතිහාසික තොරතුරු රැසක් ඇත.

26. ධම්මානන්ද හිමි, නාවුල්ලේ

දළදා පුවත, මධ්‍යම ලංකා පුරාවෘත්ත, කොළඹ, ඇම්.ඩී. ගුණසේන,

1969.7 පරි., පි. 11 - 37

× කෙවුලුගම තල්පත මගින් රාජාධිරාජසිංහ කාලයේදී දළදා ආරක්ෂා කළ ආකාරය දක්වා ඇත.

× 1928 ඉංග්‍රීසින් විසින් පළමුවන පවත්වන ලද දළදා පෙරහැර පිළිබඳ විස්තර ඇතුළත් "දළදා පෙරහැර වරුණ" නම් පැරණි ලිපිය මගින් දළදා පෙරහැර පැවැත්වීමේ දී කෙරෙන සියලු චාරිත්‍ර විධි, දළදා මණ්ඩපය සැදූ හැටි, එක් රැස් වූ ප්‍රධානීන්ගේ නම්, පෙරහැරේ අවයව, ගමන් කළ ආකාරය ආදිය පිළිබඳ සියලු විස්තර ඇතුළත් වේ.

27. ධීරානන්ද හිමි, කහටපිටියේ ශ්‍රී

ගම්පල යුගයේ ආගමික තොරතුරු : දළදා වහන්සේ

ගම්පල යුගය. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1965. 4 පරි., පි. 109

28. නාගිත හිමි, නෙලුවේ

දළදා වහන්සේ හා ඇසළ පෙරහැර, මහනුවර, යුනියන් මුද්‍රණාලය (1956). පි. (vi), 34 චිත්‍ර.

× දළදා සහ මහනුවර ඇසළ පෙරහැර පිළිබඳව සහ දැනට පවත්වන පෙරහැර පිළිබඳව අංග සම්පූර්ණ විස්තරයක් ඇතුළත් වේ.

29. නිශ්සංක, එච්.ඇස්.ඇස්.

රූමතියන් ගිය ඇසළ පෙරහැර, නුවර යක්කු. කොළඹ, ඇම්.ඩී. ගුණසේන (?) 5 පරි., පි. 25 - 28

× මේජර් ඩේවි, ඩොයිලි, නොක්ස් ආදී විදේශීන් මහනුවර පෙරහැර දුටු හැටි ඔවුන්ගේ පොත පත ඇසුරෙන් දක්වා ඇත.

----

මහනුවර බිහිවූ හැටි. නුවර යක්කු, කොළඹ. ඇම්.ඩී. ගුණසේන (?) 9 පරි., පි. 43 - 47.

----

නැටුම් කලා පරපුරවල්. නුවර යක්කු. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, (?) 11 පරි., පි. 57 - 61.

× නුවර පෙරහැරේ නැටුම් හා තූර්ය භාණ්ඩ පිළිබඳව විස්තර අඩංගු වේ.

----

දළදා මාළිගාවේ රහස් පුදපූජා. නුවර යක්කු. කෙළඹ, ඇම්.ඩී. ගුණසේන (?) 25 පරි., පි. 144 - 150.

----

දියවඩන නිලමේ තේරීම. නුවර යක්කු කොළඹ, ඇම්.ඩී. ගුණසේන (?) 45 පරි., පි. 151 - 152.

----

නුවර පෙරහැර සංකරවේ. නුවර යක්කු කොළඹ ඇම්.ඩී. ගුණසේන (?) 45 පරි., පි. 242 - 246

× මහනුවර දළදා පෙරහැරේ පිරිහුණු සංස්කෘතික ලක්ෂණ දක්වේ.

30. නොක්ස්, රොබට්

එදා හෙළදිව, පරි. ඩේවිඩ් කරුණාරත්න. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1972. පි. 235 තුන්වැනි ඡේදයේ සිට පි. 237 තුන්වැනි ඡේදයේ අවසානය දක්වා.

31. පතිරත්න, බී.ඒ.

පෙරහැර විසිතුර. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1973. පි. xiv., 52, මුඛ චිත්‍ර, චිත්‍ර.

32. පරණවිතාන, සෙනරත්

බුද්ධාගමඃ ආගමික පූජා විධි සහ උත්සව. ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, i හා ii භාගය. කැළණිය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පර්යේෂණාංශය, 1972.8 පරි., පි. 714 - 718

33. පාහියන්

දළදා මාළිගාව සහ ධනවක් විහාරාරාම. පාහියන් තෙරුන්ගේ ජීවන චරිතය : බෞද්ධ රාජධානි පිළිබඳව තොරතුරු පාහියන්ගේ දේශාටන වාර්තාව : නිස්තරාත්මක ලුහුඬු සටහනින් යුක්තයි. පරි. බලගල්ලේ බුද්ධි හිමි. 2 සංස්. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1960. 47 පරි. පි. 112 - 113.

----

දන්ත ධාතු ප්‍රදර්ශනය. පාහියන් තෙරුන්ගේ ජීවන චර්තය : බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ පාහියන්ගේ දේශාටන වාර්තාව : විස්තරාත්මක ලුහුඬු සටහනින් යුක්තයි. පරි. බලගල්ලේ විමල බුද්ධි හිමි. 2 සංස්. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1960. 48 පරි. පි. 114 - 115.

34. පිරිස්, රැල්ප්

මහනුවර ඇසළ පෙරහැර ගැන වෙල්ලස්සේ දිසාව විසින් කරන ලද විස්තරය. සිංහල සමාජ සංවිධානය : මහනුවර යුගය. කොළඹ, සමන් 1964. උපලේඛනය 11 (ආ 1), පි. 127 - 130.

× මෙය බ්‍රිතාන්‍යයන් විසින් උඩරට අත්පත් කරගත් පසු 1817 දී පැවැත්වූ පෙරහැර ගැන වූ සඳහනකි.

----

මහනුවර ඇසළ පෙරහැර ගැන වෙල්ලස්සේ දිසාව විසින් කරන ලද විස්තරය. සිංහල සමාජ සංවිධානය : මහනුවර යුගය. කොළඹ, සමන් 1964. උපලේඛනය 11 (ආ 1), පි. 131 - 138

මෙය දළදා පෙරහැර වර්ණනාව 1828 දී ලියන ලද පුස්කොළ පිටපතක අඩංගු විස්තරයකි.

35. පොන්නම්පෙරුම ඩී.පී.

පූර්ව අනුරාධපුර යුගය : පාහියන් : දන්ත ධාතූන් වහන්සේ සහ දළදා පූජාව. විදේශීන් දුටු පුරාණ ලංකාව. මහනුවර, ආර්ය මුද්‍රණාලය, 1961 1 පරි., පි. 61 - 63.

36. මුණසිංහ, ගුණතිලක

මහනුවර පුරවරයේ උපත. මහනුවර ඇසළ පෙරහැරේ හෙවත් දෙවි කෙළියේ ආරම්භය. මහනුවර, ඩී. ජයවික්‍රම සහෝදරයෝ, 1998. පි. 23 - 24

37. රාහුල හිමි, වල්පොල

ලංකාවේ බුදු සමයේ ඉතිහාසය : අනුරාධපුර යුගය, ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 10 වන සියවස දක්වා. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1962. 27 පිටුවේ අවසාන ඡේදයේ සිට 28 වැනි පිටුවේ පළවැනි ඡේදය දක්වා, 130 පිටුවේ පළවැනි සහ දෙවැනි ඡේදය සහ 164 පිටුවේ පළවැනි ඡේදය.

----

පුද සිරිත් සහ උත්සව : දන්ත ධාතු උත්සවය. ලංකාවේ බුදු සමයෙහි ඉතාහාසයඃ අනුරාධපුර යුගය : ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 10 වන සියවස දක්වා. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1962. 16 පරි., පි. 332 - 334.

38. වජිර හිමි, කඹුරුගමුවේ

දළදා ඉතිහාසය සහ සංස්කෘතිය. ඇසළ පෙරහැරේ ප්‍රභවය. දෙහිවල, තිසර ප්‍රකාශකයෝ, 1983 පි. 301 - 328

39. වාචිස්සර හිමි, කොටගම

පූජෝත්සව : මහනුවර ඇසළ පෙරහැර, සරණංකර සංඝරාජ සමය. කොළඹ, වයි.දොන් ඇඩ්වින්, 1964.10. පරි., පි. 16 - 117.

40. වික්‍රමසිංහ, ඇස්.ඒ.

හෙළ කලා ඉතිහාසය නොහොත් චිත්‍ර මූර්ති හා ගෘහ නිර්මාණ ශිල්පය. මහනුවර ගාමිණී මුද්‍රණාලය, 1962. 14 පරිච්ඡේදය 247 වැනි පිටුවේ දෙවැනි ඡේදයේ සිට 248 වැනි පිටුවේ පළමුවැනි ඡේදයේ අවසානය දක්වා

41. විමලවංශ හිමි, බද්දේගම

බෞද්ධ ශුද්ධ වස්තු. අපේ සංස්කෘතිය. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1964. 13 පරි., පි. 308 - 309.

----

උත්සව, අපේ සංස්කෘතිය. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1964. 16 පරි., පි. 605 - 623.

42. විමලසිරි. පෙ.

ආගමික තත්ත්වය. කුරුණෑගල රාජධානි සමය. කුරුණෑගල.

වයඹදිග (?) 5 පරි., පි. 56 - 63.

43. විමලානන්ද, තෙන්නකෝන්
සංඥානාම සහ පාරිභාෂික වචන : පෙරහර. උඩරට මහ කැරැල්ල : 1818 වැන්නේ මහ කැරැල්ල නමින් ඉතිහාසයේ හඳුන්වනු ලබන සිංහලයේ නිදහස් සටන පිළිබඳ රහස්‍ය ලේඛන, 3 කාණ්ඩය. කොළඹ. ඇම්.ඩී. ගුණසේන, 1963.
4 පරි., පි. 347 - 350.

44. ----
මහනුවර දළදා පෙරහැර. පුරා විද්‍යාව හා ඉතිහාසය. කොළඹ, ඇම්.ඩී. ගුණසේන, 1964. පි. 59 - 63.

45. විජේසිංහ, එච්.ආර්.එච්. සංස්.
ඇසළ පෙරහැර කොළඹ, ඩබ්ලිව්.ඊ. බැස්ටියන් සහ සමාගම, (?) පි. viii. 17 චිත්‍ර.

46. සිල්වා. ග්‍රැන්විල්
හෙළදිව සංස්කෘතික සංදර්ශනයක්. නවයුගය. 12 (2) 1967.8.12 : 6 - 7.

47. සුමනජෝති හිමි, දෙම්මැද
උත්සව. දඹදෙණි යුගය : ද්විතීය භාගය.
වක්කුණුවල, ශ්‍රී සුගත ග්‍රන්ථාකරය, 1960.14 පරි., පි. 182 - 188.

48. සෙනෙවිරත්න, අනුරාධ
කන්ද උඩරට. කොළඹ, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, 1989. පි. 69 - 71

49. ----

ලක්දිව දළදා ඉතිහාසය හා දළදා මැදුරු සතර මහා මංගල්ලය - කොළඹ, ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, 1990. පි. 123 - 137

50. සෙනෙවිරත්න, එච්.ඇම්.

ගෙඩිගේ විහාරය හා පෙරහැර කරඬුව. මහනුවර ශ්‍රී පුෂ්පදාන ස්වර්ණ ජයන්ති සංග්‍රහය, බු.ව. 2452 - 2502. මහනුවර ශ්‍රී පුෂ්පදාන සමාගම, 1958. පි. 101.

51. සෙනෙවිරත්න, එච්.ඇල්.

මහනුවර ඇසළ පෙරහැර. සංස්කෘති. 11 (4) 1963 ඔක්. - 1964 අගොස්. නාට්‍ය අංකයඃ 16 - 26.

52. සෙනෙවිරත්න, චන්ද්‍රසිරි

සෙංකඩගල පෙරහැර. නවයුගය. 13(2) 1968.8.12 : 32 - 33

53. සේනානායක, ඒ.ඩබ්ලිව්.ඇම්.ඇස්.

නුවර පෙරහැර ගෙනෙන සංස්කෘතික දැක්ම. නවයුගය. 143(3) 1969ඃ පි. 26ඃ 4-5

54. සේනාධීර, වෝල්ටර්

අපට සිරි දළදා වහන්සේ ලැබුණේ මෙහෙමයි. නවයුගය. 11(2) 1966.8.12 : 3 - 4

55. සංස්කෘතික පුරාණය

ක්‍රි.ව. 1828 දී පැවැත්වුණ මහනුවර දළදා පෙරහැර, දළදා පූජාවලිය. 1 වෙ. 10 කලාපය, 1994 ජූලි - සැප්. පි. 7- 10

56. හෙට්ටිමුල්ල, රන්ජිත් ටී.

දළදා පුවත. මහනුවර, ඩී.ඒ. තෙවරප්පෙරුම, 1960 පි. v, 11, 11, 11

138. චිත්‍ර.

57. හෙට්ටිආරච්චි, ඩී.ඊ.

ඇසළ පෙරහැර. සිංහල විශ්ව කෝෂය, කාණ්ඩ 2, ඉන්දු - උර, කොළඹ, සංස්කෘතික දෙපාර්තමේන්තුව, 1970.පි. 474.1

58. Aliwihare, Richard

The Kandy Esala Perahera, Colombo. Gunasena, 1981'

59. Coomarswamy, Ananda K.

Medieval Sinhalese Art, New York, Pantheon Books, 1979. p.6,25,37,38,39

60. Davy, Jhon

An Account of the Interior of Ceylon and of its Inhabitants with Travels in that Island. Dehiwala, Tisara, 1983.

9.128 - 130

61. Devendra, Tissa

Esala Perahera, On Harsehoe street : more tales from the Provinces. Colombo, Wijitha Yapa, 2005.

P. 36 -39

62. Dhanapala, Rathi

The Kandy Esala Perahera, Colombo, M.D. Gunasena, 1977

63. Forbes, Major

Kandian Festivals, Eleven Years in Ceylon. New Delhi, Richard Bentley, 1994.
P. 316-317

64. Gibson, Ashley
Cinnamon & Frangipanni. London, Chapman and Dodd, 1923.
p. 194 - 199

65. A Kandyan Damsel and the Kandy Pherahera. Ran Kumari: a Golden Princess of the Kandyan Hills (?).
p. 62 -70

66. Knox, Robert
Concerning their worship and festival, An Historical Relation of the Island Ceylon. Vol. 11. Colombo, Tisara, 1989.
p. 233 - 236

67. Nanayakkara, Vesak
Perahera. A Return to Kandy. Colombo, Arasan, 1971.
p. 47 - 56

68. Pieris, P.E.
Sinhale and the Patriots - 1815 - 1818. Colombo, Apothecaries Company, 1950.
p. 176 -177

69. Pieris, Ralph

Sinhalese Social Organization: The Kandyan Period. Colombo, Ceylon University Press. 1956.

p. 65, 75, 102, 120, 135, 139

70. Rathnavale, Victor

Sri Lanka - the Kandy Pherahera. (?), West Pacific Associates, 1978.

p. 3 - 111

71. Seneviratna, Anuradha

Kandy. Sri Lanka, Central Cultural Fund, 1983.

p. 88

72. Seneviratna, H.L.

Perahera and Modern Society. Rituals of the Kandyan State. London, Cambridge University Press, 1978.

p. 88